# පාතිමොක්ඛදීපිකා.

සම්පාදක

පණ්ඩිත

විගොඩ ගුණාලඞ්කාර ස්ථවිර.

ත්‍රිපිටක [illegible]
[illegible] - සබරගමුව

ප්‍රකාශක

විගොඩ බී. ඩී. ජයකොඩි මහතා.

මුද්‍රණය

සමයවර්ධන මුද්‍රණාලය

2503.

1959.

මේ ග්‍රන්ථය බලගල්ලේ සරස්වතී පිරිවෙන්
මහාවිහාරාධිපති ත්‍රිපිටක වාගීශ්වරාචාර්‍ය්‍ය
අග්‍ග මහා පණ්ඩිත අතිගරු

## හිස්සැල්ලේ

## ධම්මකීර්ති ශ්‍රී ඤාණොදයාභිධාන

සිරි ලංකා රාමඤ්ඤ නිකායයේ මහා
නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට
සාදර ප්‍රණති පූර්වක වැ පිළිගන්වන ලදී.

පරලොව සැපත්
ජේ. ඒ. වින්ඩසර් මැතිතුමාට
නිවන් සැප පතා ධර්ම දාන වශයෙන්
එම මැතිණිය විසින් පූජා කරණ ලදී.

196[illegible]-11-[illegible]

# ප්‍රස්තාවනා.

ප්‍රාතිමොක්ෂය වනාහි අඩමසක් පාසා පොහොය කිරීම් වශයෙන් භික්ෂූන් විසින් උදෙසිය යුතු වූ ද, නිස්සය මුච්චනක බහුශ්‍රැත බව ලබනු පිණිස උගත යුතු වූ ද, උභය විභඞ්ගාගත ශික්ෂාවන් එක් තැන් කොට දක්ක හැකි ග්‍රන්ථයෙකි. එහෙයින් සියලු ම උපසම්පන්න භික්ෂූන් විසින් මේ ග්‍රන්ථය උද්ග්‍රහණ ධාරණාදි විසින් පරිශීලනය කටයුතු වේ.

**පරිවාර ග්‍රන්ථ.**

සෙසු විනය ග්‍රන්ථයන් පිළිබඳ ව මෙන් ම ප්‍රාතිමොක්ෂය පිළිබඳ ව ද පුරාතනාචාර්‍ය්‍යවරයන් විසින් බොහෝ පරිවාර ග්‍රන්ථයන් සම්පාදිත බව ශේෂව ඇති නාම මාත්‍රයන්ගෙන් දත හැකි වෙයි. එයින් ප්‍රථමය සේ සැලකිය හැක්කේ කඞ්ඛාවිතරණියෙහි[1] ද **"අයමෙව හි අත්ථො සීහළමාතිකට්ඨකථායං වුත්තො"** යනුවෙන් ප්‍රකාශිත **හෙළ මාතිකට්ඨකථාවයි**. එය බුද්ධඝොෂ හිමියන්ගේ කඞ්ඛාවිතරණියට මූලාශ්‍රය විය.

ලීනත්ථප්පකාසනියක් වන විනයත්ථමඤ්ජූසා යන නමින් ප්‍රකට **කඞ්ඛාවිතරණී ටීකාව** ශාරිපුත්‍ර මහාස්වාමීන්ගේ ශිෂ්‍යභූත බුද්ධනාග තෙරුන් විසින් සම්පාදිතයි. සාරත්ථදීපනී[2] උදකුක්ඛෙපසීමාකථාවෙහි ප්‍රකාශිත මාතිකට්ඨකථාව සම්බන්ධී **ලීනත්ථප්පකාසනිය** විනයත්ථමඤ්ජූසාව නොව අන් ග්‍රන්ථයක් විය හැකියි. භාෂාස්වරූපය අනුව බෙහෙවින් පුරාතනයයි සැලකිය හැකි **"කඞ්ඛාවිතරණී ගැටපද"** නම් පොතක් ගැන කුදුසික සන්නයෙහි[3] කියවේ. මතු දක්වන වැකිය එහි තත්ත්වය විදහා පෙන්වයි.

> "මේ මැසි පුටු ඈ සඟහට දෙමි කළ ගුරුබඩු වෙයි නොබෙජිය යුතු, සගිනි පිරිමැජිනි බැවිනි. මෙ සජි (? හිමියනට වසෙගිනි ගණිතට දෙමියි කළ ගුරුබඩු හොතුජ් කෙපෙ වත බෙජෙයි වසෙගිනි ගණිතට වටියි, දවා කී සෙයිනි කරනි දෙස නැත, අයප වත බෙජෙයි ගත නොලැබෙයි. මේ මැසි පුටු වසෙගිනි ගණිතට සඟහට දෙමියි කී දෙස නැති. පළමි සගිහි පෙරෙමිජ් කියා කළ ගුරුබඩ වෙයි."

විනය විනිච්ඡය ටීකාවේ[4] ද මේ ගැටපදය ගැන සඳහන් වේ. පාළියට නඟාලූ ..ට කී වැකිය ම එක් තැනෙක දක්නා ලැබෙන

---

1 161 පිටුව. 2. iv - 372. 3 339-365 ගාථා. 4. 2864 - 2902 ගාථා.

බැවින් පාඨශොධනයට ද අර්ථාවබොධයට ද එය මහොපකාරී වේ (පාළිවාක්‍යය මේ පොතේ 269 පිටුවෙහි දැක්ක හැකියි.) වජිරබුද්ධියෙහි[1] ද **මාතිකාට්ඨකථා ගණ්ඨි පදයක්** ගැන ප්‍රකාශිතයි.

'පාද නම් මගධ රටැති ලාදුයෙනි ලහසුම්ත් ගතියි යනු කඞ්ඛාවිතරණී සන්‍නයයි''

''සූචි පත්හිදය යනු හෙළු කඞ්ඛාවිතරණී යි''

යනුවෙන් භාෂාස්වරූපය අනුව කඞ්ඛාවිතරණී ගැටපදයට වඩා නූතන බව දක්වන **කඞ්ඛාවිතරණී සන්‍නය, හෙළු කඞ්ඛාවිතරණීය** යන පොත් දෙකක් ගැන කඞ්ඛාවිතරණී පිටපොතෙහි[2] කිය වෙයි. ඇතැම් විට මේ දෙපොත ම එකක් වන්නට ද බැරි නැත.

''මෙ ම කිහ ගැටපදයෙහි වීතික්කමෙනාපන්නාපත්ති නාමං තස්ස නාමං යි''[3]

මෙසේ විශෙෂණයක් නොමැති ගැටපදයක් ගැන ද එහි ප්‍රකාශිතයි. මෙය වජිරබුද්ධියට කරුණු උපුටා ගත් ගැටපදයන් අතුරින් එකක් විය හැකියි.

**වජිරබුද්ධියෙහි:** [4]

''නාමංචෙව ආපත්තිචාති-තෙන තෙන වීතික්කමෙනාපන්නා පත්ති ආපත්ති. නාමනන්ති තස්සා ආපත්තියා නාමනන්ති ලිඛිතං'' යනු දක්නා ලැබේ.

මේ පාඨය අනුව පිටපොතෙහි දැක්වූ වැකියේ ඌනතාව ද සම්පූර්ණ කොට ගත හැකියි. **''ලිඛිතං''** යන්නෙන් වජිරබුද්ධියෙහි[5] ප්‍රකාශ වන්නේ පුරාතන ගැටපදයන්හි ලියන ලද බවයි.

**වජිරබුද්ධි ටීකා** යන නමින් ප්‍රකට ග්‍රන්ථය වනාහි පසු කල රචිත සියලු විනය ග්‍රන්ථයන්හි නම සටහන් වන සමන්තපාසාදිකාව පිළිබඳ ගණ්ඨිපදත්ථප්පකාසනය කරන පැරණි ග්‍රන්ථයෙකි. **''එතරහි පන භික්ඛුනියො චාතුද්දසියංයෙව ගන්ත්වා කාදු අයා උපොසථොති පුච්ඡන්ති**[6]**''** යන වැකියෙන් හැඟෙන්නේ එය මෙහෙණි සස්න පැවති සමයේ ම ලියූ බවයි. එ මතු නොව **''ඤතරෙති සාමණෙරෙයෙවාති නිස්සන්දෙහෙ ලිඛිතං, එතස්සෙව අත්ථස්ස වජිරබුද්ධිනාපි වුත්තභාවො දස්සිතො''** යන විනිවජය ටීකා[7] පාඨය අනුව නිස්සන්දෙහ නම් වන විනිස සන්නයෙහි ද වජිරබුද්ධි නාමය සටහන් වූ බව පැනෙයි. කඞ්ඛාපිටපොතෙහි[1] **විනය අටුවා ගැටපද විවරණය** යන නමින් හඳුන්වන්නේත් වජිරබුද්ධි ටීකාව මැයි [2]

1 ii - 51. 2. 97 - 106 - 107. 3. 40. 4. ii - 177
5. i - 122. 6. වජිරබුද්ධි ii - 16 7. 1544 ගාථාව.



සමන්තපාසාදිකා අත්ථයොජනාව ලියූ ආචාර්‍යවරයා විසින් ලියන ලදැයි සලකන **පාතිමොක්ඛගණ්ඨිදීපනී** නම් පොත ලඞ්කාවේ සුලභ වූවෙකි. **කඞ්ඛායොජනා මහාටීකා** යන නමින් හඳුන් වන පිටු 1500 කින් අධික මහාග්‍රන්ථය ද **පාතිමොක්ඛපදත්ථ අනුවණ්ණනා** නම් ග්‍රන්ථය ද මුරම්මදෙශීය ආචාර්‍යවරයන් විසින් ලියන ලද පොත් දෙකෙකි.

ප්‍රාතිමොක්ෂයට ලියූ සන්න කිහිපයෙක් මෙකල විද්‍යමාන වෙයි. කෝට්ටේ සමයයෙන් පෙර ලියූ බව පැනෙන පැරණි සන්නය ප්‍රශස්තතම ග්‍රන්ථයෙකි. කඞ්ඛාවිතරණියේ කොටසකට ලියූ නූතන සන්නයෙක් ද මුද්‍රිත ව ඇත. පණ්ඩිගල ජිනරතන, රත්ගම ප්‍රඥාශෙඛර යන මහාස්ථවිරයන් වහන්සේලා විසින් ප්‍රකාශිත **රත්නාවසූදනිය** ආධුනිකයනට බෙහෙවින් වැඩ සලසා දෙන දූනට ඇති සිංහලභාෂාමය එකම විස්තර වර්ණනාවයි.

ප්‍රාතිමොක්ෂය උගන්නා සමයෙහි ම සිංහලයෙන් විස්තර දත හැකි පොතක් වතොත් මහත් පහසුවක් සැලසෙන බව කල්පනා කොළෙමි. මෙය සඳහා මා මෙහෙයුණේත් **පාතිමොක්ඛදීපිකා.** මෙයින් වසි කිහිපයකට පෙර මේ පොත ලියා අවසන් කරන ලද්දේත් ඒ අදහස එලවත් කරනු සඳහාය. වජිරබුද්ධි සාරත්ථදීපනී ආදී ග්‍රන්ථ සම්පාදනයට පූර්වතම ටීකා ගැටපද ආදිය සමාශ්‍රිත වූවා සේ ම මේ කෘතියට ද සොයා ගත හැකි වූ සියලු ම විනය ග්‍රන්ථයන් උපකාරී වූ බව පළ කළ යුතුය. මුද්‍රණය පහසු වන පිණිස නාතිවිස්තෘත ව ලියන්නට සැලකිලිමත් වූ නමුදු ආවශ්‍යක හැම කරුණක් ම මෙහි ඇතුළත් වැ ඇතැයි ද සිතමි. මෙහි ඇතැම් තැන් මාතිකාට්ඨකථාව පරිශීලනය කරන විට ප්‍රයෝජනවත් වන සේ ලියා ඇත. ධර්ම විනය පිළිබඳ වචන ව්‍යාඛ්‍යා මාර්ගයෙන් පැහැදිලි කිරීමෙන් අවැඩක් නොවන බැවින් පෙළත් සමඟ සන්නය ද පොතේ මුලට යා කොළෙමි. පෙළ සකස් කිරීමේ දී බුරුම ඡට්ඨසඞ්ගායනාවෙන් ප්‍රකාශිත පොත් ද සමාශ්‍රය කරන ලදි. භාවිතයෙහි නොපවත්නා බැවින් භික්ඛුනී පාතිමොක්ඛය මෙහි නොදැක්විණ.

1. 33 පිටුව. 2. වජිරබුද්ධි i-181

ධම්මවිනය ද ශාස්ත්‍රාන්තරයන් ද පිළිබඳ ලඞ්කාවේ අද්විතීය මහාපණ්ඩිතයකු වන අතුරුගිරියේ බොධිරුක්ඛාරාමාධිපති පූජ්‍ය පණ්ඩිත **මුල්ලේගම සිරි සීලාලඞ්කාර**

**උපකාරානුස්මෘති.** රාමඤ්ඤ නිකායයේ අධිකරණ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෘද්ධාවස්ථාවෙහි වෙසෙමිනුදු මෙහි මුල් කොපියේ බොහෝ තැන් කියවා ග්‍රන්ථිස්ථාන විසඳා දීම ආදියෙන් කළ උපකාරය කෘතවෙදිත්වයෙන් සිහිපත් කරමි. මුද්‍රණ කාර්‍ය්‍යාවසානය දක්වා සියලු අවස්ථාවන්හි මේ පොතේ කටයුතුවලට ස්විය සහාය දුන් නිට්ටඹුවේ විද්‍යානන්ද පරිවෙණාධිපති **දිජේගොඩ ශ්‍රී චන්ද්‍රවිමල** මහා ස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ ද මා පැවිදි කොට මෙවැන්නක් කිරීමෙහි ලා ශක්තිය ලබා දුන් මගේ ආචාර්‍ය්‍ය විගොඩ ධර්මයුක්තිකාරාමාධිපති **කළුගමුවේ ඉන්දසාර** මහා ස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ ද බැති සිතින් අනුස්මරණය කරමි.

නිදෙස් කොට පොතක් ලිවීම මෙන් ම මුද්‍රණයට ධනය යොදවන්නන් සෙවීමත් අතිශය දුෂ්කරයි. මේ පොතේ මුද්‍රණය සඳහා ධනය යොදවන ලද්දේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ

**මුද්‍රාපණය.** සේවය කරන **විගොඩ බී. ඩී. ජයකොඩි** මහතා විසිනි. ඒ මහතා ඉදිරිපත් නොවී නම් මේ පොත මෙසේ මුද්‍රණයෙන් ප්‍රකාශයට පත් නොවන්නේය. ඒ මහතාට ශාස්ත්‍රසෙවින්ගේ කෘතඥතාව අයත් වේ. මෙහි මුද්‍රණය සැලකිල්ලෙන් කර දුන් මාලිගාකන්ද පාරේ **සමයවර්ධන** මුද්‍රණාලයීය කාර්‍ය්‍යමණ්ඩලයට ද ස්තුති කෙරෙමින් ප්‍රමාදයෙන් හෝ භ්‍රමයෙන් හෝ වන වරද මෙහි විය හැකි නිසා ‘දක්නා සුධීහු දන්වත්වා’ යි සමාරාධනය ද කරමි.

## විනයො දීපපතු.

**විගොඩ ගුණාලඞ්කාර ස්ථවිර.**

ධර්මයුක්තිකාරාමය,
විගොඩ - බෙම්මුල්ල.

2503.

1959, 10, 5.

# පටුන.


| | | පිටුව. |
|---|---|---|
| | **පාතිමොක්ඛ පාළි ව්‍යාඛ්‍යා** ... | **1 - 70** |
| | **පාතිමොක්ඛ දීපිකා** ... ... | **71 - 285** |
| | පූර්වකෘත්‍ය ... ... | 71 - |
| | **නිදාන දීපිකා** ... ... | **71 - 89** |
| | බද්ධසීමා ... ... | 75 - 81 |
| | අබද්ධසීමා ... ... | 81 - 82 |
| | **පාරාජිකදීපිකා** ... | **90 - 125** |
| 1. | පඨම පාරාජිකා ... ... | 90 - 99 |
| | අෂ්ටාකාරඋපසම්පද ... ... | 90 - 91 |
| | අභව්‍ය පුද්ගලයෝ ... ... | 91 - 94 |
| | සප්තදශාකාරය ... ... | 99 - 106 |
| 2. | දුතිය පාරාජිකා ... ... | 106 - 115 |
| | පස්විසි අවහාර ... ... | 107 - 112 |
| 3. | තතිය පාරාජිකා ... ... | 116 - 121 |
| 4. | චතුත්ථ පාරාජිකා ... ... | 121 - 123 |
| | සූවිසි පරිජි ... ... | 124 - 125 |
| | **සඞ්ඝාදිසෙසදීපිකා** ... | **125 - 152** |
| 1. | සුක්කවිස්සට්ඨි සික්ඛා ... ... | 125 - 128 |
| | එකාදශරාග ... ... | 126 - 127 |
| 2. | කායසංසග්ග සික්ඛා ... | 128 - 131 |
| 3. | දුට්ඨුල්ලභාසන ,, ... | 131 - 133 |
| 4. | අත්තකාමපාරිචරිය ,, ... | 133 - 134 |
| 5. | සඤ්චරිත්ත ,, ... | 134 - 137 |
| 6. | කුටිකාර ,, ... | 137 - 139 |
| 7. | විහාරකාර ,, ... | 140 - |
| 8. | දුට්ඨදොස ,, ... | 140 - 143 |
| 9. | දුතිය දුට්ඨදොස ,, ... | 143 - 144 |
| 10. | පඨම සඞ්ඝභෙද ,, ... | 144 - 146 |
| 11. | දුතිය සඞ්ඝභෙද ,, ... | 146 - |
| 12. | දුබ්බච ,, ... | 146 - 147 |
| 13 | කුලදූසක ,, ... | 147 - 149 |
| | පරිවාස මානත්ත ... | 150 - 152 |

| | | | | පිටුව |
|---|---|---|---|---|
| | **අනියතදීපිකා** | | ... | **153 - 156** |
| 1. | පඨම අනියත | ... | ... | 153 - 154 |
| 2. | දුතිය අනියත | ... | ... | 155 - |
| | අනියතවල ප්‍රයෝජන | | ... | 155 - 156 |
| | **නිස්සග්ගියදීපිකා** | | ... | **156 - 203** |
| 1. | පඨම කඨින සික්ඛා | ... | ... | 156 - 168 |
| | ඊස් විදුම | ... | ... | 156 - 157 |
| | කඨිනය | ... | ... | 157 - 158 |
| | කඨිනානිසංස | ... | ... | 158 - 159 |
| | කඨිනුද්ධාර | ... | ... | 159 161 |
| | අධිෂ්ඨානයොග්‍ය චීවර | ... | ... | 161 - 164 |
| | ඉටන් බිදීම | ... | ... | 164 - 165 |
| | විකප්පනය | ... | ... | 165 - 166 |
| | සුගත් වියත | ... | ... | 166 - 167 |
| 2. | දුතිය කඨින | සික්ඛා | ... | 168 - 170 |
| 3 | තතිය කඨින | ,, | ... | 170 - 172 |
| 4. | පුරාණ චීවර | ,, | ... | 173 - |
| 5. | චීවර පටිග්ගහණ | ,, | ... | 174 - |
| 6. | අඤ්ඤාතක විඤ්ඤත්ති | ,, | ... | 175 - |
| 7. | තතුත්තරි | ,, | ... | 176 - |
| 8 | පඨම උපක්ඛට | ,, | .. | 177 - |
| 9. | දුතිය උපක්ඛට | ,, | ... | 178 - |
| 10. | රාජ | ,, | ... | 178 - 181 |
| | කැපකරුවෝ දසදෙන | | ... | 179 - 180 |


**1. චීවර වග්ගයයි.**


| | | | | |
|---|---|---|---|---|
| 11. | කොසිය | සික්ඛා | ... | 181 - 182 |
| 12. | සුද්ධකාළක | ,, | ... | 182 - |
| 13. | ද්වෙභාග | ,, | ... | 182 - 183 |
| 14. | ඡබ්බස්ස | ,, | ... | 183 - |
| 15. | නිසීදන සන්ථත | ,, | ... | 183 - 184 |
| 16. | එළකලොම | ,, | ... | 184 - 185 |
| 17. | එළකලොම ධොවාපන | ,, | ... | 185 - |
| 18. | රූපිය | ,, | ... | 186 - 187 |
| 19. | රූපිය සංවොහාර | ,, | ... | 188 - 190 |
| | පාත්‍රචතුෂ්ටය | | ... | 189 - 190 |
| 20. | කයවික්කය | ,, | ... | 190 - 191 |


**2 එළකලොම වග්ගයයි.**




| | | | | පිටුව. |
|---|---|---|---|---|
| 21. | පත්ත | සික්ඛා | ... | 191 - 192 |
| 22. | ඌනපඤ්චබන්ධන | ,, | ... | 192 - 193 |
| 23. | භෙසජ්ජ | ,, | ... | 193 - 195 |
| 24. | වස්සිකසාටික | ,, | ... | 195 - 197 |
| 25. | චීවර අච්ඡින්දන | ,, | ... | 197 - 198 |
| 26. | සුත්තවිඤ්ඤත්තිකථා | ,, | ... | 198 - 199 |
| 27. | පෙසකාර | ,, | ... | 199 - |
| 28. | අච්චෙකචීවර | ,, | ... | 199 - 201 |
| 29. | සාසඞ්ක | ,, | ... | 201 - 202 |
| 30. | පරිණත | ,, | ... | 203 - |


**3. පත්ත වග්ගයයි.**


| | | | | |
|---|---|---|---|---|
| | **පාචිත්තියදීපිකා** | | ... | **203 - 274** |
| 1. | මුසාවාද | සික්ඛා | ... | 203 - 204 |
| 2. | ඔමසවාද | ,, | ... | 204 - 205 |
| 3. | පෙසුඤ්ඤ | ,, | ... | 205 - 206 |
| 4. | පදසොධම්ම | ,, | ... | 206 - 207 |
| 5. | සහසෙය්‍ය | ,, | ... | 207 - 208 |
| 6. | දුතියසහසෙය්‍ය | ,, | .. | 208 - 209 |
| 7. | ධම්මදෙසන | ,, | ... | 209 - 210 |
| 8. | භූතාරොචන | ,, | ... | 210 - |
| 9. | දුට්ඨුල්ලාරොචන | ,, | ... | 210 - 211 |
| 10. | පඨවිඛණන | ,, | ... | 211 - 212 |


**1. මුසාවාද වග්ගයයි.**


| | | | | |
|---|---|---|---|---|
| 11. | භූතගාම | සික්ඛා | ... | 212 - 214 |
| 12. | අඤ්ඤවාදක | ,, | ... | 214 - 215 |
| 13. | උජ්ඣාපනක | ,, | ... | 215 - 216 |
| 14. | පඨමසෙනාසන | ,, | ... | 216 - 217 |
| 15. | දුතියසෙනාසන | ,, | ... | 217 - 218 |
| 16. | අනුපඛජ්ජ | ,, | ... | 219 - |
| 17. | නික්කඩ්ඪන | ,, | ... | 219 - 220 |
| 18. | වෙහාසකුටි | ,, | ... | 220 - 221 |
| 19. | මහල්ලකවිහාර | ,, | ... | 221 - 222 |
| 20. | සප්පාණක | ,, | ... | 222 - 223 |


**2. භූතගාම වග්ගයයි**


| | | | | |
|---|---|---|---|---|
| 21. | ඔවාද | සික්ඛා | ... | 223 - 224 |
| 22. | අත්ථඞ්ගත | ,, | ... | 224 - |

පිටුව.
23. භික්ඛුනූපස්සය සික්ඛා ... 224 –
24. ආමිස ,, ... 225 –
25. චීවරදාන ,, ... 225 –
26. චීවරසිබ්බන ,, ... 225 – 226
27. සංවිධාන ,, ... 226 –
28. නාවාභිරුහන ,, ... 227 –
29. පරිපාචිත ,, ... 2:7 – 228
30. රහොනිසජ්ජ ,, ... 228 –

3. ඔවාද වග්ගයයි

31. ආවසථපිණ්ඩ සික්ඛා ... 228 –
32. ගණභොජන ,, ... 229 – 230
33. පරම්පරභොජන ,, ... 230 – 231
34. කාණමාතු ,, ... 231 –
35. පඨම පවාරණ ,, ... 232 – 235
36. දුතිය පවාරණ ,, ... 235 – 236
37. විකාලභොජන ,, ... 236 –
38. සන්නිධිකාර ,, ... 236 – 237
39. පණීතභොජන ,, ... 238 –
40. දන්තපොන ,, ... 238 – 241
සිවුකැලි ... ... 239 – 240
දුකුළා අ ... ... 240 – 241

4. භොජන වග්ගයයි.

41. අචෙලක සික්ඛා ... 242 –
42. උය්‍යොජන ,, ... 242 –
43. සභොජන ,, ... 243 –
44. රහොනිසජ්ජ ,, ... 243 –
45. රහොනිසජ්ජ ,, ... 243 –
46. චාරිත්ත ,, ... 243 – 244
47. මහානාම ,, ... 244 – 245
48. උය්‍යුත්තසෙනා ,, ... 245 –
49. සෙනාවාස ,, ... 245 – 246
50. උය්‍යොධික ,, ... 246 –

5. අචෙලක වග්ගයයි.

51. සුරාපාන සික්ඛා ... 246 – 247
52 අඞ්ගුලිපතොදක ,, ... 247 – 248



පිටුව.
53. හස්සධම්ම සික්ඛා ... 248 –
54. අනාදරිය ,, ... 248 –
55. භිංසාපන ,, ... 249 –
56. ජොති ,, ... 249 –
57. නහාන ,, ... 250 –
58. දුබ්බණ්ණකරණ ,, ... 250 – 251
59. විකප්පන ,, ... 251 –
60. චීවරාපනිධාන ,, ... 251 – 252

6. සුරාපාන වග්ගයයි.

61. සඤ්චිච්චපාණ සික්ඛා ... 252 –
62. සප්පාණක ,, ... 252 –
63 උක්කොටන ,, ... 252 – 253
64. දුට්ඨුල්ල ,, ... 253 –
65. ඌනවීසතිවස්ස ,, ... 254 –
66. ථෙය්‍යසත්ථ ,, ... 254 – 255
67. සංවිධාන ,, ... 255 –
68 අරිට්ඨ ,, ... 255 – 258
ඇවැත් දෙසීම ... 256 – 257
69 උක්ඛිත්ත සම්භොග ,, ... 258 – 259
70. කණ්ටක ,, ... 259 – 260
නාසනා ... ... 259 – 260

7. සප්පාණක වග්ගයයි.

71. සහධම්මික සික්ඛා ... 260 –
72. විලෙඛන ,, ... 261 –
73. මොහන ,, ... 261 – 262
74. පහාර ,, ... 262 –
75. තලසත්තික ,, ... 262 – 263
76. අමූලක ,, ... 263 –
77. සඤ්චිච්ච ,, ... 263 – 264
78. උපස්සුති ,, ... 264 –
79. කම්මපටිබාහන ,, ... 265 – 267
චතුර්විධ කර්ම ... ... 265 – 266
80. ඡන්දං අදත්වා ගමන සික්ඛා ... 267 –
81. දුබ්බල ,, ... 268 – 269
ගරුභණ්ඩ ... ... 268 – 269
82. පරිණාමන ,, ... 269 –

8. සහධම්මික වග්ගය. .

| | | | පිටුව. |
|---|---|---|---|
| 83. රාජන්තෙපුර | සික්ඛා | ... | 269 - 270 |
| 84. රතන | ,, | ... | 270 - 271 |
| 85. විකාලගාමප්පවෙසන | ,, | ... | 271 - |
| 86. සූචිඝර | ,, | ... | 271 - 272 |
| 87. මඤ්ච | ,, | ... | 272 - |
| 88. තූලොනද්ධ | ,, | ... | 272 - 273 |
| 89. නිසීදන | ,, | ... | 273 - |
| 90. කණ්ඩුපටිච්ඡාදි | ,, | ... | **273 - 274** |
| 91. වස්සිකසාටික | , | ... | **274 -** |
| 92. නන්දත්ථෙර | ,, | ... | 274 - |
| **9. රතන වග්ගස්ස** | | | |
| **පාටිදෙසනියදීපිකා** | | ... | **274 - 276** |
| 1. පඨම පාටිදෙසනිය | සික්ඛා | ... | 274 - |
| 2. දුතිය පාටිදෙසනිය | ,, | ... | 275 - |
| 3. තතිය පාටිදෙසනිය | ,, | ... | 275 - 276 |
| 4. චතුත්ථ පාටිදෙසනිය | ,, | ... | 276 - |
| **සෙඛිය දීපිකා** | | ... | **276 - 283** |
| සුපටිච්ඡන්න පාරුපනය | | ... | 278 - 279 |
| චීවර ප්‍රමාණය | ... | ... | 279 - 281 |
| බාහන්තය | ... | ... | 281 - |
| අධිකරණ සමථ | ... | ... | 283 - 285 |
| අනුක්‍රමණිකා | ... | ... | 286 - 291 |
| කතානුසන්දස්සනං | ... | ... | 292 - |
| ශුද්ධිපත්‍රය | | | |


# භික්ඛු ප්‍රාතිමොක්ෂ ව්‍යාඛ්‍යා.

---

## උපොසථ කම්මස්ස පුබ්බකරණ පුබ්බකිච්චානි.

a සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං ආයස්මන්තං (ඉත්ථන්නාමං) විනයං පුච්ඡෙය්‍යං.

සුණාතු මෙ භන්තෙ සඞ්ඝො, යදි සඞ්ඝස්ස පත්තකල්ලං, අහං (ඉත්ථන්නාමෙන) විනයං පුට්ඨො විස්සජ්ජෙය්‍යං.

b **සම්මජ්ජනී පදීපො ච - උදකං ආසනෙන ච,**
**උපොසථස්ස එතානි - පුබ්බකරණන්ති වුච්චති.**

ඔකාස, සම්මජ්ජනී=සම්මජ්ජන කරණඤ්ච; පදීපො ච=පදීපුජ්ජලනඤ්ච; (ඉදානි සුරියාලොකස්ස අත්ථිතාය පදීපකිච්චං නත්ථි.) උදකං ආසනෙන ච=ආසනෙන සහ පානීය පරිභොජනීය උදකට්ඨපනඤ්ච; උපොසථස්ස එතානි පුබ්බකරණන්ති වුච්චති= එතානි චත්තාරි වත්තානි සම්මජ්ජන කරණාදීනි සඞ්ඝ සන්නිපාතතො පඨමං කාතබ්බත්තා උපොසථස්ස=උපොසථකම්මස්ස; පුබ්බකරණන්ති වුච්චති=පුබ්බකරණානීති අක්ඛාතානි.

---

a භන්තෙ= වහන්ස; සඞ්ඝො= සඞ්ඝ තෙම; මෙ=මාගේ (වචනය;) සුණාතු= අසා වා; යදි=ඉදින්; සඞ්ඝස්ස=සඞ්ඝයා ගේ (උපොසථ කර්මය); පත්තකල්ලං=පැමිණිකල් ඇත්තේ වී නම්; අහං=මම; (ඉත්ථන්නාමං=මෙ නම් ඇත්තහු ගෙන්) විනයං පුච්ඡෙය්‍යං=විනය විචාරන්නෙමි.

(ඉත්ථන්නාමෙන=මෙ නම් ඇත්තහු විසින්) විනයං පුට්ඨො= විනය විචාරන ලද්දෙම්; විස්සජ්ජෙය්‍යං=විසඳන්නෙමි.

b සම්මජ්ජනී (ච)=පොහෝ ගෙය හැමදීම (ද;) පදීපො ච= (පාමොක් දෙසුම රාත්‍රියෙහි වේ නම්) පහන් දැල්වීම ද; ආසනෙන= හිඳිනා අසුන් පැනවීම සමඟ; උදකං ච=(අමුතු මහණුන් පිණිස) පානීය පරිභොජනීය දිය එළවීම ද යන; එතානි (චත්තාරි කම්මානි) =මේ සිවු කම්හු; උපොසථස්ස=උපොසථයා ගේ; පුබ්බකරණං ඉති වුච්චති (වුච්චන්ති)=පුබ්බකරණයයි කියනු ලැබෙති.

ඔකාස=අවසර; සම්මජ්ජනී-සම්මජ්ජනී යි සේයි, සම්මජ්ජන කරණඤ්ච=හැමඳුම් කිරීම ද; පදීපො ච යි සේයි, පදීපුජ්ජලනං ච= පහන් දැල්වීම ද; (දැන් හිරු එළිය ඇති බැවින් පහන් දැල්වීම් කිස

a **ඡන්දපාරිසුද්ධි උතුක්ඛානං-භික්ඛුගණනා ච ඕවාදො,**
**උපොසථස්ස එතානි-පුබ්බකිච්චන්ති වුච්චති.**

b ඡන්දපාරිසුද්ධි= ඡන්දාරහානං භික්ඛූනං ඡන්දපාරිසුද්ධි ආහරණඤ්ච; උතුක්ඛානං=හෙමන්තාදීනං තිණ්ණං උතූනං එත්තකං අතික්කන්තං එත්තකං අවසිට්ඨන්ති එවං උතුආචික්ඛනං; (උතූනීධ පන සාසනෙ හෙමන්ත ගිම්හවස්සානානං වසෙන තීණි හොන්ති, අයං හෙමන්ත උතු, අස්මිං උතුම්හි අට්ඨ උපොසථා, ඉමිනා පක්ඛෙන එකො උපොසථො සම්පත්තො, එකො උපොසථො අතික්කන්තො ඡ උපොසථා අවසිට්ඨා.) භික්ඛුගණනා ච=ඉමස්මිං උපොසථග්ගෙ සන්නිපතිතානං භික්ඛූනං ගණනා, (එත්තකා භික්ඛූ හොන්ති.) ඕවාදො=භික්ඛුනීනං ඕවාදො දාතබ්බො. (ඉදානි පන තාසං නත්ථිතාය සො ච ඕවාදො ඉධ නත්ථි.) උපොසථස්ස එතානි පුබ්බකිච්චන්ති වුච්චති=එතානි පඤ්චකම්මානි ඡන්දාහරණාදීනි පාතිමොක්ඛුද්දෙසතො පඨමං කත්තබ්බත්තා උපොසථස්ස=උපොසථකම්මස්ස, පුබ්බකිච්ච'න්ති වුච්චති=පුබ්බකිච්චානීති අක්ඛාතානි.

---

නැත) උදකං ආසනෙන ච යි සේයි. ආසනෙන සහ=අසුන් පැනවුම සමඟ; පානීය පරිභොජනීය උදකට්ඨපනං ච=පියයුතු පරිභොග කටයුතු දිය එළවා තැබුම ද; උපොසථස්ස එතානි පුබ්බකරණන්ති වුච්චති යන්නෙහි අර්ථ නම්, සම්මජ්ජනකරණාදීනි එතානි චත්තාරි වත්තානි=හැමදුම ආදි මේ සිවු වත්හු; සඞ්ඝසන්නිපාතතො පඨමං කත්තබ්බත්තා=සඞ්ඝයා සීමාවට රැස්වන්නට පෙර කළ යුතු බැවින්; උපොසථස්ස යි සේයි, උපොසථකම්මස්ස=උපොසථකර්මයා පිළිබඳ; පුබ්බකරණ'න්ති වුච්චති යි සේයි, පුබ්බකරණානි ඉති අක්ඛාතානි= පූර්වකරණයහයි ප්‍රකාශිත වෙත්.

a ඡන්ද පාරිසුද්ධි උතුක්ඛානං=ඡන්දපාරිසුද්ධිඍතූන් ප්‍රකාශ කිරීම ද; භික්ඛුගණනා=සීමාගත භික්ෂූන් ගණන් කිරීම ද; ඕවාදො ච=මෙහෙණියන් අවවාද ඉල්ලන ලද බව ඇස්වීම ද; (ඉති) එතානි (පඤ්ච කම්මානි)=යන මේ පස් කම්හු; උපොසථස්ස=පෞෂථකර්මය පිළිබඳ; පුබ්බකිච්චං ඉති වුච්චති (වුච්චන්ති)=පූර්වකෘත්‍යයයි කියනු ලැබෙති.

b ඡන්දපාරිසුද්ධි යි සේ යි, ඡන්දාරහානං භික්ඛූනං=ඡන්දය දීමට සුදුසු මහණුන් ගේ; ඡන්දපාරිසුද්ධි ආහරණං ච=ඡන්දය හා පිරිසුදු බව හා ගෙන ඊම ද; උතුක්ඛානං යන්නෙහි අර්ථ නම්; හෙමන්තාදීනං තිණ්ණං උතූනං=හෙමන්තාදි තුන් ඍතූන් පිළිබඳ ව; එත්තකං අතික්කන්තං=මෙපමණ ඉක්ම ගියේ ය; එත්තකං අවසිට්ඨං ඉති=



a **උපොසථො යාවතිකා ච භික්ඛූ**
**කම්මප්පත්තා, සභාගාපත්තියො ච,**
**න විජ්ජන්ති වජ්ජනීයා ච පුග්ගලා**
**තස්මිං න හොන්ති පත්තකල්ලන්ති වුච්චති.**

---

මෙපමණ ඉතිරි ව ඇතැයි; එවං උතුආචික්ඛනං=මෙ සේ ඍතුව කීම යි; (ඉධ සාසනෙ පන=මේ සස්නෙහි වනාහි; හෙමන්ත ගිම්හ වස්සානානං වසෙන=හිමන් ගිම්න් වසන් විසින්; තීණි උතූනි හොන්ති= ඍතුහු තිදෙනෙක් වෙති; අයං හෙමන්ත උතු=මේ හිමත් ඍතුවයි; අස්මිං උතුම්හි අට්ඨ උපොසථා=මේ ඍතුවෙහි පොහෝ අට දෙනෙක් වෙති; ඉමිනා පක්ඛෙන එකො උපොසථො සම්පත්තො=මේ පක්ෂයෙන් එක් පොහොයෙක් පැමිණියේ ය; එකො උපොසථො අතික්කන්තො=එක් පොහොයෙක් ඉක්ම ගියේය; ඡ උපොසථා අවසිට්ඨා=ස පොහෝ කෙනෙක් අවශිෂ්ට වෙති.) භික්ඛුගණනා ච යන්නෙහි අර්ථ නම්, ඉමස්මිං උපොසථග්ගෙ=මේ පොහෝකරන තන්හි; (එත්තකා භික්ඛූ හොන්ති=මෙ පමණ භික්ෂූහු වෙති යි) සන්නිපතිතානං භික්ඛූනං ගණනා=එක් වූ මහණුන් ගිණීම යනුයි. ඕවාදො යි සේයි, භික්ඛුනීනං ඕවාදො දාතබ්බො=මෙහෙණියනට ඔවා දිය යුත්තේ ය; (ඉදානි පන=දැන් වනාහි; තාසං නත්ථිතාය= ඔවුන් නැති බැවින්; සො ච ඕවාදො=ඒ ඔවා ඇස්වීම ද; ඉධ නත්ථි= මෙ තැන නැත.) උපොසථස්ස එතානි පුබ්බකිච්චන්ති වුච්චති යන්නෙහි අර්ථ නම්, ඡන්දාහරණාදීනි එතානි පඤ්චකම්මානි=ඡන්දය ගෙන ඊම ආදි මේ පස් ක්‍රියාවෝ; පාතිමොක්ඛුද්දෙසතො පඨමං කත්තබ්බත්තා=පාමොක් උදෙසුමට පෙර කළ යුතු වන හෙයින්; උපොසථස්ස යි සේයි, උපොසථකම්මස්ස=පොහෝ කිරීම පිළිබඳ; පුබ්බකිච්චන්ති වුච්චති යි සේයි, පුබ්බකිච්චානීති අක්ඛාතානි=පූර්වකෘත්‍ය යහ යි කියන ලදහ යනුයි.

a උපොසථො (ච හොති)=තුදුස්වක් ඈ පොහෝ දිනයෙක් වේ ද; යාවතිකා ච භික්ඛූ=යටත් පිරිසෙයින් සිවු නමක් පමණ වූ පුවතත් මහණහු; කම්මප්පත්තා=සඟ පොහොයට සුදුසු වූවෝ වෙත් ද; (තාවතිකා හත්ථපාසෙ ඨිතා හොන්ති=එපමණ භික්ෂූහු අත් පසැ සිටියාහු වෙත් ද) සභාගාපත්තියො ච න විජ්ජන්ති=වස්තුසභාග ඇවැත්හු නො වෙත් ද; තස්මිං=ඒ සීමාව තුළ අත්පසැ; වජ්ජනීයා ච පුග්ගලා=අත්පසින් දුරු කළ යුතු පුඟුලෝ ද; න හොන්ති=නො වෙත් ද; පත්තකල්ලං ඉති වුච්චති=මේ සතරගින් යුත් පෞෂථ කර්මය සුදුසු කල් ඇති කර්මයයි පැවසේ.

a උපොසථො=තීසු උපොසථ දිවසෙසු චාතුද්දසී පන්නරසී සාමග්ගීසු අජ්ජුපොසථො පන්නරසො; යාවතිකා ච භික්ඛූ කම්මප්පත්තා=යත්තකා භික්ඛූ තස්ස උපොසථ කම්මස්ස පත්තා යුත්තා අනුරූපා සබ්බන්තිමෙන පරිච්ඡෙදෙන චත්තාරො භික්ඛූ පකතත්තා සඞ්ඝෙන අනුක්ඛිත්තා තෙ ච ඛො හත්ථපාසං අවිජහිත්වා එකසීමායං ඨිතා; සභාගාපත්තියො ච න විජ්ජන්ති=විකාලභොජනාදි වත්ථු-සභාගාපත්තියො ච න විජ්ජන්ති; වජ්ජනීයා ච පුග්ගලා තස්මිං න හොන්ති=ගහට්ඨ පණ්ඩකාදයො එකවීසති වජ්ජනීය පුග්ගලා හත්ථපාසතො බහිකරණ වසෙන වජ්ජෙතබ්බා, තස්මිං න හොන්ති; පත්තකල්ලන්ති වුච්චති=සඞ්ඝස්ස උපොසථ කම්මං ඉමෙහි චතුහි ලක්ඛණෙහි සඞ්ගහිතං පත්තකාලවත්තංති අක්ඛාතං.

---

a උපොසථො සි සේසි, චාතුද්දසී පන්නරසී සාමග්ගීසු=තුදුස් වක් පනුරුසි සමඟපොහෝ නම් වූ; තීසු උපොසථ දිවසෙසු=තුන් පොහෝදින අතුරෙහි; අජ්ජුපොසථො=අද පොහෝ දිනය; පන්නරසො=පනුරුස සි; යාවතිකා ච භික්ඛූ කම්මප්පත්තා සි සේසි, යත්තකා භික්ඛූ=යම් පමණ භික්ෂූහු; තස්ස උපොසථ කම්මස්ස=ඒ පොහෝ කම්ට; පත්තා සි සේසි; යුත්තා සි සේසි; අනුරූපා=සුදුසු වූවාහු ද; (තත්තකා=එපමණ වූ) සබ්බන්තිමෙන පරිච්ඡෙදෙන=යටත් පිරිසෙයින්; සඞ්ඝෙන අනුක්ඛිත්තා=සඞ්ඝයා විසින් උකෙවිනි කම් නොකරන ලද; පකතත්තා චත්තාරො භික්ඛූ=පුවතත් මහණහු සිවුදෙනෙක් වෙත් ද; තෙ ච ඛො=ඔවුහු ද; හත්ථපාසං අවිජහිත්වා=අත් පස නොහැර; එකසීමායං ඨිතා (හොන්ති)=එක් සිමෙක සිටියාහු වෙත් ද; සභාගාපත්තියො ච න විජ්ජන්ති සි සේසි, විකාල භොජනාදි වත්ථුසභාගාපත්තියො ච=විකල් බොජුන් ඈ සභාග වස්තු වෙකින් පත් ඇවැත්හු ද; න විජ්ජන්ති=නො වෙත් නම්; වජ්ජනීයා ච පුග්ගලා තස්මිං න හොන්ති සි සේසි. ගහට්ඨපණ්ඩකාදයො=ගෘහස්ථ පණ්ඩකාදි වූ; එකවීසති වජ්ජනීය පුග්ගලා=දුරු කළ යුතු එක්විසි පුහුලෝ; හත්ථපාසතො බහිකරණවසෙන=අත්පසින් බැහැර කිරීම් විසින්; වජ්ජෙතබ්බා=දුරු කළ යුත්තාහ; (තෙ=ඔහු) තස්මිං න හොන්ති=ඒ අත්පසැ නොවෙත් නම්; පත්තකල්ල'න්ති වුච්චති සි සේසි. සඞ්ඝස්ස උපොසථකම්මං=සඞ්ඝයා ගේ පොහෝ කිස; ඉමෙහි චතුහි ලක්ඛණෙහි සඞ්ගහිතං=මේ සිවු ලකුණින් සඞ්ගෘහිත වූයේ; පත්තකාලවන්තං ඉති අක්ඛාතං=පැමිණිකල් ඇත්තේයයි කියන ලදී.



a පුබ්බකරණ පුබ්බකිච්චානි සමාපෙත්වා දෙසිතාපත්තිකස්ස සමග්ගස්ස භික්ඛුසඞ්ඝස්ස අනුමතියා පාතිමොක්ඛං උද්දිසිතුං ආරාධනං කරොමි.

---

a පුබ්බකරණ පුබ්බකිච්චානි=පූර්වකරණ පූර්වකෘත්‍ය නව දෙන; සමාපෙත්වා=සම්පූර්ණ කොට; දෙසිතාපත්තිකස්ස=ආරොචනය කළ ඇවැත් ඇති; සමග්ගස්ස භික්ඛු සඞ්ඝස්ස අනුමතියා=සමග භික්ෂු සඞ්ඝයා ගේ කැමැත්තෙන්; පාතිමොක්ඛං උද්දිසිතුං= ආණා-ප්‍රාතිමොක්ෂය ප්‍රකාශ කරන්නට; ආරාධනං කරොමි=ආරාධනය කෙරෙමි.

('ආරාධනං කරොමි' යන්න වෙනුවට "පාතිමොක්ඛං උද්දිසිස්සාමි" යන පාඨය වඩා මැනැවැයි ඇතැම් ටීකාවෙක ප්‍රකාශිතයි.)

## ඉමෙ ඛො පනා'යස්මන්තො තෙරස සඞ්ඝාදිසෙසා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති

1 සඤ්චෙතනිකා සුක්කවිස්සට්ඨි අඤ්ඤත්‍ර සුපිනන්තා **සඞ්ඝාදිසෙසො**.

2 යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන මාතුගාමෙන සද්ධිං කායසංසග්ගං සමාපජ්ජෙය්‍ය, හත්ථග්ගාහං වා වෙණිග්ගාහං වා අඤ්ඤතරස්ස වා අඤ්ඤතරස්ස වා අඞ්ගස්ස පරාමසනං, **සඞ්ඝාදිසෙසො**.

3 යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසෙය්‍ය යථා තං යුවා යුවතිං මෙථුනූපසංහිතාහි, **සඞ්ඝාදිසෙසො**.

---

ආයස්මන්තො=ආයුෂ්මත්නි; ඉමෙ තෙරස සඞ්ඝාදිසෙසා ධම්මා=මේ තෙළෙස් සඟවෙසෙස් ඇවැත්හු; උද්දෙසං ආගච්ඡන්ති=උදෙසිය සුතු බවට පැමිණෙත්.

1 සුපිනන්තා අඤ්ඤත්‍ර=ස්වප්නයෙහි වන ශුක්‍රමොචනය හැර; සඤ්චෙතනිකා=මුදනු කැමැති චෙතනාව ඇති; සුක්කවිස්සට්ඨි=සුකුරු මිදීම; සඞ්ඝාදිසෙසො=සඞ්ඝාදිසෙස නම් ආපත්තිනිකායයෙක් වේ.

2 යො පන භික්ඛු=යම් මහණෙක්; ඔතිණ්ණො=කා පහස් විඳුනා රාගයට බටුයේ; විපරිණතෙන චිත්තෙන=කා පහස් විඳුනා රාග විසින් පෙරළී සිතින්; මාතුගාමෙන සද්ධිං=මිනිස් මාගමක් හා; කායසංසග්ගං=කා සසගට; (කෙසේ වූ කාසසගයෙක් ද යත්?) හත්ථග්ගාහං වා=අත් ගැනීමට හෝ; වෙණිග්ගාහං වා=කෙශය ගැනීමට හෝ; අඤ්ඤතරස්ස වා අඤ්ඤතරස්ස වා අඞ්ගස්ස පරාමසනං=අවශෙෂ ශරීරාඞ්ග පරාමර්ශයට හෝ; සමාපජ්ජෙය්‍ය=පැමිණේ නම්; සඞ්ඝාදිසෙසො=(ඒ භික්ෂුහට) සඟවෙසෙස් ඇවැත් වේ.

3 යො පන භික්ඛු; ඔතිණ්ණො=දුට්ඨුල්ලවාචස්සාදරාගයට බටුයේ; විපරිණතෙන චිත්තෙන=එම රාගය නිසා පෙරළී සිතින්; යථා=යම් සේ; (තං යනු නිපාතමාත්‍ර යි.) යුවා=තරුණයෙක්; යුවතිං=තරුණියකට; මෙථුනූපසංහිතාහි=මෙවුන් දම් පිළිබඳ වචනයෙන්; (ඔභාසෙය්‍ය=කියන්නේ වේ ද; තථා=එ සේ) මාතුගාමං=මාගමකට; දුට්ඨුල්ලාහි වාචාහි=වසමඟ පසමඟ පිළිබඳ තුළුල්වදනින්; ඔභාසෙය්‍ය=අසභ්‍ය තෙපුල් බෙණේ නම්;



4 යො පන භික්ඛු ඔතිණ්ණො විපරිණතෙන චිත්තෙන මාතුගාමස්ස සන්තිකෙ අත්තකාමපාරිචරියාය වණ්ණං භාසෙය්‍ය, “එතද'ග්ගං භගිනි පාරිචරියානං යා මාදිසං සීලවන්තං කල්‍යාණධම්මං බ්‍රහ්මචාරිං එතෙන ධම්මෙන පරිචරෙය්‍යා”ති මෙථුනූපසංහිතෙන, **සඞ්ඝාදිසෙසො**.

5 යො පන භික්ඛු සඤ්චරිත්තං සමාපජ්ජෙය්‍ය ඉත්ථියා වා පුරිසමතිං පුරිසස්ස වා ඉත්ථිමතිං ජායත්තනෙ වා ජාරත්තනෙ වා, අන්තමසො තඞ්ඛණිකාය'පි, **සඞ්ඝාදිසෙසො**.

6 සඤ්ඤාචිකාය පන භික්ඛුනා කුටිං කාරයමානෙන අස්සාමිකං අත්තුද්දෙසං පමාණිකා කාරෙතබ්බා, තත්‍රිදං පමාණං, දීඝසො ද්වාදස විදත්ථියො සුගතවිදත්ථියා, තිරියං සත්තන්තරා, භික්ඛූ

---

4 යො පන භික්ඛු; ඔතිණ්ණො=අත්තකාම පාරිචරියා රාගයට බටුයේ; විපරිණතෙන චිත්තෙන=එම රාග වශයෙන් පෙරළුණු සිතින්; මාතුගාමස්ස සන්තිකෙ=මාගමක් සමීපයෙහි සිට; භගිනි=නැඟෙණියෙනි; යා=යම් ස්ත්‍රියක් තොමෝ; සීලවන්තං=සිල්වත්; බ්‍රහ්මචාරිං=බ්‍රහ්මචාරි වූ; කල්‍යාණධම්මං=(එ දෙකින් ම යුතු බැවින්) කලණ දහම් ඇති; මාදිසං=මා වැනියකුට; එතෙන ධම්මෙන=මේ මෛථුන ධර්මයෙන්; පරිචරෙය්‍ය=උපස්ථාන කරන්නී නම්; පාරිචරියානං=මෙහෙ කිරීම් අතුරින්; එතදග්ගං (-එසා අග්ගා)= මේ මෛථුනයෙන් මෙහෙ කිරීම අග්‍රයි; ඉති=මෙ සේ; අත්තකාමපාරිචරියාය වණ්ණං=තමහට මෙවුන්දමින් මෙහෙ කිරීමෙහි අනුසස්; මෙථුනූපසංහිතෙන=මෛථුනය නිඃශ්‍රිත වචනයෙන්; · භාසෙය්‍ය=බෙණේ නම්;

5. යො පන භික්ඛු; සඤ්චරිත්තං=ස්ත්‍රී පුරුෂයන් අතර සඤ්චරණයට; සමාපජ්ජෙය්‍ය=පැමිණියේ වේ ද; (කෙ සේ ද යත්?) පුරිසමතිං=පුරුෂයා ගේ කැමැත්ත; ඉත්ථියා වා=ස්ත්‍රියට හෝ; ඉත්ථිමතිං=ස්ත්‍රිය ගේ කැමැත්ත; පුරිසස්ස වා=පුරුෂයාට හෝ; ජායත්තනෙ වා ජාරත්තනෙ වා=අඹුවක සොර අඹුවක වීම නිමිති කොට හෝ සැමියකු සොර සැමියකු වීම නිමිති කොට හෝ; (ආරොචෙය්‍ය=කියා නම්;) අන්තමසො=යටත් පිරිසෙයින්; තඞ්ඛණිකාය'පි=මුහුත්තිකාවකට නමුදු ඇරොජා නම්;

6. සංයාචිකාය පන=තමා ඉල්ලා ගත් වැ පොරෝ ආදි උපකරණයෙන්; අස්සාමිකං=කරවා දෙන දායකයකු නැති හෙයින් අස්වාමික වූ; අත්තුද්දෙසං=තමා උදෙසීම් කොට ඇති; කුටිං කාරය-මානෙන භික්ඛුනා=කිළියක් කරවන මහණහු විසින්; පමාණිකා

අභිනෙතබ්බා වත්ථුදෙසනාය, තෙහි භික්ඛූහි වත්ථු දෙසෙතබ්බං අනාරම්භං සපරික්කමණං, සාරම්භෙ චෙ භික්ඛු වත්ථුස්මිං අපරික්කමණෙ සඤ්ඤාචිකාය කුටිං කාරෙය්‍ය, භික්ඛූ වා අනභිනෙය්‍ය වත්ථුදෙසනාය, පමාණං වා අතික්කාමෙය්‍ය, **සඞ්ඝාදිසෙසො.**

7 මහල්ලකං පන භික්ඛුනා විහාරං කාරයමානෙන සස්සාමිකං අත්තුද්දෙසං භික්ඛූ අභිනෙතබ්බා වත්ථුදෙසනාය, තෙහි භික්ඛූහි වත්ථු දෙසෙතබ්බං අනාරම්භං සපරික්කමණං, සාරම්භෙ චෙ භික්ඛු වත්ථුස්මිං අපරික්කමණෙ මහල්ලකං විහාරං කාරෙය්‍ය, භික්ඛූ වා අනභිනෙය්‍ය වත්ථු දෙසනාය, **සඞ්ඝාදිසෙසො.**

8 යො පන භික්ඛු භික්ඛුං දුට්ඨො දොසො අප්පතීතො අමූලකෙන පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙය්‍ය "අප්පෙව නාම නං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍ය"න්ති, තතො අපරෙන සමයෙන සමනුග්ගාහියමානො වා අසමනුග්ගාහියමානො වා අමූලකඤ්චෙ'ව තං අධිකරණං හොති, භික්ඛු ච දොසං පතිට්ඨාති, **සඞ්ඝාදිසෙසො**

---

කාරෙතබ්බා=ප්‍රමාණ යුක්ත ව කරවිය යුත්තී ය; තත්‍ර=ඒ කුටිය ගේ; ඉදං පමාණං=මේ ප්‍රමාණය යි; සුගතවිදත්ථියා=සුගත් වියතින්; දීඝසො=නිතනිය පිටත දිගින්; ද්වාදස විදත්ථියො=දොළොස් වියතෙක; තිරියං=පුළුල; අන්තරා=ඇතුළත; සත්ත=සත් වියතෙක; වත්ථුදෙසනාය=කිළිය කරන බිම දෙසනු පිණිස; භික්ඛූ අභිනෙතබ්බා=භික්ෂූහු පැමිණවිය යුත්තාහ; තෙහි භික්ඛූහි=ඒ භික්ෂූන් විසින්; අනාරම්භං=නිරුපද්‍රව වූ; සපරික්කමණං=උපචාර සහිත වූ; වත්ථු දෙසෙතබ්බං= කුටි වස්තුව දෙසිය යුතු; භික්ඛු= මහණ තෙම; සාරම්භෙ=උවදුරු සහිත වූ; අපරික්කමණෙ=උපචාර රහිත වූ; වත්ථුස්මිං=බිමෙක; සඤ්ඤාචිකාය කුටිං=ස්වයං යාචිත උපකරණයෙන් කිළියක්; කාරෙය්‍ය චෙ=ඉදින් කරවා නම්; වත්ථු දෙසනාය=ගෙ බිම දෙසනු පිණිස; භික්ඛූ වා අනභිනෙය්‍ය=භික්ෂූන් හෝ නො එළවා නම්; පමාණං වා අතික්කාමෙය්‍ය=ප්‍රමාණය හෝ ඉක්මවා නම්;

7 සස්සාමිකං=කරවා දෙන දායකයකු ඇති බැවින් සස්වාමික වූ; අත්තුද්දෙසං=තමා ගේ වාසය සඳහා කරවන බැවින් තමා උද්දෙස කොට ඇති; මහල්ලකං=ප්‍රමාණ මහත්ත්වයෙන් මහල්ලක නම් වූ; විහාරං කාරයමානෙන භික්ඛුනා=විහාරයක් කරවන මහණහු විසින්; වත්ථුදෙසනාය=විහාරවත් දෙසනු පිණිස; භික්ඛූ අභිනෙතබ්බා=භික්ෂූහු පැමිණවිය යුත්තාහ. (සෙස්සෙහි අර්ථ පෙර සිකයෙහි මෙනි.)

8 යො පන භික්ඛු; දුට්ඨො=ද්වෙෂයෙන් දූෂිත වූයේ; දොසො=මෙරමා ද්වෙෂයෙන් දූෂණය කරන්නේ; අප්පතීතො=ප්‍රීතිසුඛයෙන්



9 යො පන භික්ඛු භික්ඛුං දුට්ඨො දොසො අප්පතීතො අඤ්ඤභාගියස්ස අධිකරණස්ස කිඤ්චිදෙසං ලෙසමත්තං උපාදාය පාරාජිකෙන ධම්මෙන අනුද්ධංසෙය්‍ය "අප්පෙව නාම නං ඉමම්හා බ්‍රහ්මචරියා චාවෙය්‍ය"න්ති. තතො අපරෙන සමයෙන සමනුග්ගාහියමානො වා අසමනුග්ගාහියමානො වා අඤ්ඤභාගියඤ්චෙව තං අධිකරණං හොති කොචි දෙසො ලෙසමත්තො උපාදින්නො, භික්ඛු ච දොසං පතිට්ඨාති, **සඞ්ඝාදිසෙසො.**

10 යො පන භික්ඛු සමග්ගස්ස සඞ්ඝස්ස භෙදාය පරක්කමෙය්‍ය, භෙදනසංවත්තනිකං වා අධිකරණං සමාදාය පග්ගය්හ තිට්ඨෙය්‍ය, සො භික්ඛු භික්ඛූහි එවම'ස්ස වචනීයො "මා ආයස්මා සමග්ගස්ස සඞ්ඝස්ස භෙදාය පරක්කමි, භෙදනසංවත්තනිකං වා

---

පහවූයේ; නං=ඒ භික්ෂුව; ඉමම්හා බ්‍රහ්මචරියා=මේ ශාසන පිළිවෙතින්, චාවෙය්‍යං=පහ කෙරෙම් නම්; අප්පෙව නාම ඉති=ඉතා යෙහෙකැයි; භික්ඛුං=මහණකුට; අමූලකෙන පාරාජිකෙන ධම්මෙන=දිට්ඨාදි මූල් නැති හෙයින් අමූලක වූ පරිජි ඇවැතෙකින්; අනුද්ධංසෙය්‍ය=චොදනා කෙරේ ද; තතො=ඒ චොදනා කළ සමයයෙන්; අපරෙන සමයෙන=අන් කලෙක්හි; සමනුග්ගාහියමානො වා=විනිශ්චය කරනු ලබන්නා වූ හෝ; අසමනුග්ගාහියමානො වා=විචාරනු නොලබන්නා වූ හෝ; භික්ඛු ච=චොදක මහණ ද; දොසං පතිට්ඨාති=දොෂයෙහි පිහිටා ද හෙවත් වරද පිළිත කෙරේ ද; තං අධිකරණං ච=ඒ ආපත්තාධිකරණය ද; අමූලකං ච එව හොති=අමූලක වේ ද;

9 යො පන භික්ඛු—පෙ—අප්පතීතො=ප්‍රීතිසුඛාදියෙන් පහ වූයේ; අඤ්ඤභාගියස්ස=තිරිසන් ජාති ආදි අන් කොටස් ඇති; අධිකරණස්ස=දබ්බමල්ලපුත්තාදි නම් තැබුමට වස්තු වූ ඡගලකාදිහු ගේ; කිංචි දෙසං ලෙසමත්තං=ජාත්‍යාදි කිසියම් දෙශ ලෙශ මාත්‍ර යක්; උපාදාය=චොදනා කරනු පිණිස ගෙන; (නං ඉමම්හා බ්‍රහ්ම චරියා—පෙ—දොසං පතිට්ඨාති=මෙහි අර්ථ යට සිකයෙහි මෙනි.) තං අධිකරණං ච; ඡගලකාදි වූ ඒ අධිකරණය ද; අඤ්ඤභාගියඤ්චෙව හොති=ඡගලකාදි අන්‍ය කොට්ඨාස ඇත්තේම වේ ද; කොචි දෙසො ලෙසමත්තො=ජාත්‍යාදි දෙශ ලෙශ මාත්‍රයෙක්; උපාදින්නො=චොදනා කරනු පිණිස ගන්නා ලද්දේ වේ ද;

10 යො පන භික්ඛු; සමග්ගස්ස සඞ්ඝස්ස=සමඟ සඞ්ඝයා ගේ; භෙදාය පරක්කමෙය්‍ය=බිඳීම පිණිස උත්සාහ කෙරේ ද; භෙදනසංවත්තනිකං=භෙදය පිණිස පවත්නා; අධිකරණං වා=කාරණයක් හෝ; සමාදාය=ගෙන; පග්ගය්හ තිට්ඨෙය්‍ය=හුවා නොහැර සිටී ද; සො භික්ඛු=ඒ භෙදක මහණ තෙම; භික්ඛූහි=සෙසු භික්ෂූන් විසින්;

අධිකරණං සමාදාය පග්ගය්හ අට්ඨාසි, සමෙතා'යස්මා සඞ්ඝෙන, සමග්ගො හි සඞ්ඝො සම්මොදමානො අවිවදමානො එකුද්දෙසො ඵාසු විහරතී'ති. එවං ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙ'ව පග්ගණ්හෙය්‍ය, සො භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය, යාව තතියඤ්චෙ සමනුභාසියමානො තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චෙ'තං කුසලං, නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය, **සඞ්ඝාදිසෙසො.**

11. තස්සෙ'ව ඛො පන භික්ඛුස්ස භික්ඛූ හොන්ති අනුවත්තකා වග්ගවාදකා එකො වා ද්වෙ වා තයො වා, තෙ එවං වදෙය්‍යුං "මා ආයස්මන්තො එතං භික්ඛුං කිඤ්චි අවචුත්ථ, ධම්මවාදී චෙසො භික්ඛු, විනයවාදී චෙ'සො භික්ඛු, අම්හාකං චෙ'සො භික්ඛු ඡන්දං ච රුචිං ච ආදාය වොහරති, ජානාති නො, භාසති, අම්හාකං පෙ'තං

---

ආයස්මා=ඇවැත; සමග්ගස්ස සඞ්ඝස්ස භෙදාය මා පරක්කමි=සමඟ සඞ්ඝයා ගේ බිඳීම පිණිස උත්සාහ නො කරව; භෙදනසංවත්තනිකං අධිකරණං වා=සඞ්ඝභෙදය පිණිස පවත්නා කරුණක් හෝ; සමාදාය පග්ගය්හ මා අට්ඨාසි=ගෙන හුවා නො හැර නො සිටුව; ආයස්මා සඞ්ඝෙන සමෙතු=ආයුෂ්මත් තෙම සඞ්ඝයා සමඟ එක් අදහස් ඇති වේ වා; හි=යම් හෙයෙකින්; සමග්ගො සඞ්ඝො=සමඟ සඞ්ඝයා; සම්මොදමානො=සීලාදි සැපතින් තුටු වන්නේ; අවිවදමානො=විවාද නො කරන්නේ; එකුද්දෙසො=එක් ව පවත්නා පාමොක් උදෙසීම් ඇත්තේ; ඵාසු විහරති=සුව සේ වෙසේ ද; ඉති=එහෙයිනැයි; එවං වචනීයො අස්ස=මෙසේ කිව යුතු වන්නේය; සො භික්ඛු=ඒ භෙදක මහණ; භික්ඛූහි=සෙසු ඇසූ දුටු මහණුන් විසින්; එවං ච වුච්චමානො=මෙ සේ ද කියනු ලබන්නේ; තථෙ'ව පග්ගණ්හෙය්‍ය=එ සේ ම දැඩි ව ගෙන සිටී නම්; සො භික්ඛු=ඒ මහණ; භික්ඛූහි=භික්ෂූන් විසින්; තස්ස පටිනිස්සග්ගාය=ඒ උත්සාහය හා අධිකරණ සමාදානය හා හරනා සඳහා; යාවතතියං සමනුභාසිතබ්බො=තෙවනවර දක්වා; සමනුභාෂණ කම් කටයුත්තේ ය; යාව තතියං සමනුභාසියමානො=තෙ යළක් සමනුභාෂණ කම් කරනු ලබන්නේ; තං පටිනිස්සජ්ජෙය්‍ය චෙ=ඒ උත්සාහය හා අධිකරණ සමාදානය හා හරී නම්; ඉච්චෙතං=එ සේ මෙය හැරපීම; කුසලං=යහපති; නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය=ඉදින් නො හරනේ නම්;

11. තස්සෙ'ව ඛො පන භික්ඛුස්ස=සඞ්ඝබෙදයට උත්සාහ දරන ඒ මහණහට ම; අනුවත්තකා=අනුව පිළිපදින්නා වූ; වග්ගවාදකා=කලහකාර වදන් කියන; එකො වා ද්වෙ වා තයො වා=එක් නමක් හෝ දෙනමක් හෝ තෙනමක් හෝ; භික්ඛූ හොන්ති=භික්ෂූහු වෙත් ද;



ඛමති" ති. තෙ භික්ඛූ භික්ඛූහි එවම'ස්සු වචනීයා "මා ආයස්මන්තො එවං අවචුත්ථ, න චෙ සො භික්ඛු ධම්මවාදී, න චෙ'සො භික්ඛු විනයවාදී, මා ආයස්මන්තානම්පි සඞ්ඝභෙදො රුච්චිත්ථ. සමෙතා'යස්මන්තානං සඞ්ඝෙන, සමග්ගො හි සඞ්ඝො සම්මොදමානො අවිවදමානො එකුද්දෙසො ඵාසු විහරතී" ති.

a එවං ච තෙ භික්ඛූ භික්ඛූහි වුච්චමානා තථෙ'ව පග්ගණ්හෙය්‍යුං, තෙ භික්ඛූ භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බා තස්ස පටිනිස්සග්ගාය, යාවතතියං චෙ සමනුභාසියමානා තං පටිනිස්සජ්ජෙය්‍යුං, ඉච්චෙ'තං කුසලං, නො චෙ පටිනිස්සජ්ජෙය්‍යුං, **සඞ්ඝාදිසෙසො.**

---

තෙ=ඒ භික්ෂූහු; ආයස්මන්තො=ආයුෂ්මත්නි; එතං භික්ඛුං කිඤ්චි මා, අවචුත්ථ=මේ භික්ෂුවට කිසිවක් නො කියවු; එසො භික්ඛු ධම්මවාදී ච=මෙ භික්ෂුව ධර්මය කියන්නේ ද වෙයි; එසො භික්ඛු විනයවාදී ච=මේ භික්ෂුව විනය කියන සුලු ද වෙයි; එසො භික්ඛු=මේ මහණ; අම්හාකං ච=අප ගේත්; ඡන්දං ච රුචිං ච ආදාය=කැමැත්ත ද සතුට ද ගෙන; වොහරති=බෙණෙයි; නො ජානාති=අප ගේ කැමැත්ත අභිලාෂය දනී; භාසති=මෙසේ කරම්හ යි අප සමඟ කථා ද කෙරෙයි; අම්හාකං අපි එතං ඛමති ඉති=අපට ද ඔහු කැරෙන මෙය රුචිය යි; එවං වදෙය්‍යුං=මෙ සේ කියත් නම්; තෙ භික්ඛූ=ඒ භෙදානුවර්තක භික්ෂූහු; භික්ඛූහි=සෙසු ලජ්ජී මහණුන් විසින්; ආයස්මන්තො එවං මා අවචුත්ථ=ඇවැත්නි මේසේ නොකියවු; එසො භික්ඛු න ච ධම්මවාදී=මේ මහණ ධර්මවාදී ද නො වේ; එසො භික්ඛු න ච විනයවාදී=මේ මහණ විනයවාදී ද නො වේ; ආයස්මන්තානම්පි=ආයුෂ්මතුන් හට ද; සඞ්ඝභෙදො මා රුච්චිත්ථ=සඞ්ඝභෙදය රුචි නොවේ වා; ආයස්මන්තානං (චිත්තා) සඞ්ඝෙන සමෙතු=ආයුෂ්මත්හු ගේ සිත සඞ්ඝයා හා එක් බවට යේ වා; හි=යම් හෙයකින්; සමග්ගො සඞ්ඝො—පෙ—ඵාසු විහරති ඉති=සුව සේ වෙසේ ද එහෙයිනැයි; එවං වචනීයා අස්සු=මෙ සේ කිවයුතු වන්නාහ,

a තෙ භික්ඛූ=ඒ භික්ෂූහු; භික්ඛූහි එවං ච වුච්චමානා=භික්ෂූන් විසින් මෙසේ ද කියනු ලබන්නාහු; තථෙව පග්ගණ්හෙය්‍යුං=එ සේ ම ගෙන සිටිත් නම්; තෙ භික්ඛූ=ඒ භික්ෂූහු; භික්ඛූහි=ලජ්ජී භික්ෂූන් විසින්; තස්ස පටිනිස්සග්ගාය=ඒ භෙදානුවර්තක බව හරනා පිණිස; යාව තතියං සමනුභාසිතබ්බා=තුන් යළක් සමනුභාසනකම් කට යුත්තාහ; යාවතතියං සමනුභාසියමානා; තං පටිනිස්සජ්ජෙය්‍යුං; චෙ=ඒ භෙදානුවර්තක බව හරිත් නම්; ඉති එතං=එ සේ මේ හැරපීමං

12 භික්ඛු පනෙ'ව දුබ්බචජාතිකො හොති, උද්දෙසපරියාපන්නෙසු සික්ඛාපදෙසු භික්ඛූහි සහධම්මිකං වුච්චමානො අත්තානං අවචනීයං කරොති "මා මං ආයස්මන්තො කිඤ්චි අවචුත්ථ කල්‍යාණං වා පාපකං වා, අහම්පායස්මන්තෙ න කිඤ්චි වක්ඛාමි කල්‍යාණං වා පාපකං වා, විරමථා'යස්මන්තො මම වචනායා"ති. සො භික්ඛු භික්ඛූහි එවම'ස්ස වචනීයො "මා ආයස්මා අත්තානං අවචනීයං අකාසි, වචනීයමෙ'ව ආයස්මා අත්තානං කරොතු, ආයස්මා'පි භික්ඛූ වදෙතු සහධම්මෙන, භික්ඛූ'පි ආයස්මන්තං වක්ඛන්ති සහධම්මෙන, එවං සංවද්ධා හි තස්ස භගවතො පරිසා යදිදං අඤ්ඤමඤ්ඤවචනෙන අඤ්ඤමඤ්ඤවුට්ඨාපනෙනා"ති.

---

12 භික්ඛු පන=මහණෙක් වනාහි; දුබ්බච ජාතිකො එව හොති=අකීකරු ස්වභාව ඇත්තේ ම වේ ද; උද්දෙසපරියාපන්නෙසු=ප්‍රාතිමොක්ෂ සඞ්ඛ්‍යාත උද්දෙසයෙහි ඇතුළත් වූ; සික්ඛාපදෙසු=සික පදයෙහි ලා; භික්ඛූහි=මහණුන් විසින්; සහධම්මිකං වුච්චමානො=පැනවූ සිකපදයෙන් කියනු ලබන්නේ; ආයස්මන්තො=ආයුෂ්මත්නි; කිඤ්චි කල්‍යාණං වා පාපකං වා=කිසි යහපතක් හෝ අයහපතක් හෝ; මං මා අවචුත්ථ=මට නොකියව්; අහං පි=මම ද; ආයස්මන්තෙ=ආයුෂ්මතුනට; කිඤ්චි කල්‍යාණං වා පාපකං වා න වක්ඛාමි=කිසි යහපතක් අයහපතක් හෝ නො කියන්නෙමි; ආයස්මන්තො=ආයුෂ්මතුනි; මම වචනාය විරමථ ඉති=මට කියන වචනයෙන් වැළකෙව යි; අත්තානං අවචනීයං කරොති=තමා නො කියයුත්තකු කෙරේ ද; සො භික්ඛු=ඒ අකීකරු මහණ තෙම; භික්ඛූහි=සෙසු භික්ෂූන් විසින්; ආයස්මා=ඇවැත; අත්තානං අවචනීයං මා අකාසි=තමා නොකියයුත්තකු නො කරව; ආයස්මා=ආයුෂ්මත් තෙමේ; අත්තානං වචනීයං එව කරොතු=තමා කිවයුත්තකු ම කෙරේ වා; ආයස්මා පි=ආයුෂ්මත් තෙමේ ද; භික්ඛූ=මහණුන්; සහධම්මෙන වදෙතු=පැනවූ ශික්ෂාවෙන් කියා වා; භික්ඛූ'පි=භික්ෂූහුත්; ආයස්මන්තං=ආයුෂ්මතුනට; සහධම්මෙන වක්ඛන්ති=ශික්ෂාපදයෙන් කියන්නාහ; යදිදං=යම් මේ හිත වචනයෙක් ඇවැතින් නඟා සිටුවීමෙක් වේ ද; අඤ්ඤමඤ්ඤවචනෙන=ඒ අන්‍යොන්‍ය හිතවචනයෙන්; අඤ්ඤමඤ්ඤවුට්ඨාපනෙන=අන්‍යොන්‍යයන් ඇවැතින් නඟා සිටුවීමෙන්; තස්ස භගවතො පරිසා=ඒ භගවත්හු ගේ පිරිස; සංවද්ධා හි ඉති=අභිවෘද්ධියට පත් වේ යයි; එවං වචනීයො අස්ස=මෙ සේ කිව යුතු වන්නේය;



a එවං ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙ'ව පග්ගණ්හෙය්‍ය, සො භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය; යාවතතියං චෙ සමනුභාසියමානො තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය; **සඞ්ඝාදිසෙසො.**

13 භික්ඛු පනෙ'ව අඤ්ඤතරං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරති කුලදූසකො පාපසමාචාරො, තස්ස ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙ'ව සුය්‍යන්ති ච, කුලානි ච තෙන දුට්ඨානි දිස්සන්ති චෙ'ව සුය්‍යන්ති ච, සො භික්ඛු භික්ඛූහි එවම'ස්ස වචනීයො "ආයස්මා ඛො කුලදූසකො පාපසමාචාරො, ආයස්මතො ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙ'ව සුය්‍යන්ති ච, කුලානි චායස්මතා දුට්ඨානි දිස්සන්ති චෙ'ව සුය්‍යන්ති ච, පක්කමතා'යස්මා ඉමම්හා ආවාසා, අලන්තෙ ඉධ වාසෙනා"ති.

---

a සො භික්ඛු=ඒ මහණ; භික්ඛූහි=භික්ෂූන් විසින්; එවං ච වුච්චමානො=මෙ සේ ද කියනු ලබන්නේ; තථා එව පග්ගණ්හෙය්‍ය=එ සේ ම දැඩි ව ගනී නම්; සො භික්ඛු=ඒ මහණ; තස්ස පටිනිස්සග්ගාය=ඒ අවචනීය බව හරනා පිණිස; යාව තතියං=තෙ වරක්; සමනුභාසිතබ්බො=කම්වදන් කියා සමනුභාසන කම් කටයුත්තේය; චෙ=ඉදින්; යාවතතියං සමනුභාසියමානො=තෙවරක් සමනුභාසන කම් කරනු ලබන්නේ; තං=ඒ අවචනීය කාරණය; පටිනිස්සජ්ජෙය්‍ය=හරතේ නම්; ඉච්චෙතං=එසේ මේ හැරජීම; කුසලං=මැනැවි; චෙ=ඉදින්; නො පටිනිස්සජ්ජෙය්‍ය=නොහරතේ නම්; සඞ්ඝාදිසෙසො=සඟවෙසෙස් වේ.

13 භික්ඛු පන=භික්ෂුවක් වනාහි; කුලදූසකො එව=කුලයන්ගේ සැදැහැ නසන්නේ ම; පාපසමාචාරො=ලාමක සමාචාර ඇත්තේ ම; අඤ්ඤතරං=එක්තරා; ගාමං වා නිගමං වා උපනිස්සාය=ගමක් හෝ නියම් ගමක් හෝ ඇසුරු කොට; විහරති=වෙසේ ද; තස්ස=ඒ භික්ෂුව ගේ; පාපකා සමාචාරා=ලාමික ආචාරයෝ; දිස්සන්ති චෙ'ව=සෙසු මහණුන් විසින් දක්නා ලබන්නාහුත් වෙත් ද; සුය්‍යන්ති ච=අසනු ලබන්නාහුත් වෙත් ද; තෙන දුට්ඨානි කුලානි=ඒ මහණහු විසින් දූෂිත කුලයෝ; දිස්සන්ති චෙ'ව=දක්නා ලබන්නාහුත් වෙත් ද; සුය්‍යන්ති ච=අසනු ලබන්නාහුත් වෙත් ද; සො භික්ඛු=ඒ මහණ; භික්ඛූහි=සෙසු භික්ෂූන් විසින්; ආයස්මා ඛො=ආයුෂ්මත් තෙම වනාහි; කුලදූසකො=කුලදූෂකය; පාපසමාචාරො=පාපසමාචාර ඇත්තේය; ආයස්මතො ඛො=ආයුෂ්මත්හු ගේ; පාපකා සමාචාරා=ලාමක ක්‍රියාවෝ; දිස්සන්ති චෙ'ව සුය්‍යන්ති ච=දක්නා ලබන්නාහුත් වෙති

a එවං ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තෙ භික්ඛූ එවං වදෙය්‍ය “ඡන්දගාමිනො ච භික්ඛූ, දොසගාමිනො ච භික්ඛූ, මොහගාමිනොච භික්ඛූ, භයගාමිනො ච භික්ඛූ, තාදිසිකාය ආපත්තියා එකච්චං පබ්බාජෙන්ති එකච්චං න පබ්බාජෙන්තී”ති. සො භික්ඛු භික්ඛූහි එවම'ස්ස වචනීයො “මා ආයස්මා එවං අවච, න ච භික්ඛූ ඡන්දගාමිනො න ච භික්ඛූ දොසගාමිනො න ච භික්ඛූ මොහගාමිනො න ච භික්ඛූ භයගාමිනො, ආයස්මා ඛො කුලදූසකො පාපසමාචාරො, ආයස්මතො ඛො පාපකා සමාචාරා දිස්සන්ති චෙ'ව සුය්‍යන්ති ච, කුලානි චා'යස්මතා දුට්ඨානි දිස්සන්තිචෙ'ව සුය්‍යන්ති ච, පක්කමතා'යස්මා ඉමම්හා ආවාසා, අලං තෙ ඉධ වාසෙනා” ති.

---

අසනු ලබන්නාහුත් වෙති; ආයස්මතා දුට්ඨානි කුලානි=ආයුෂ්මතුන් විසින් දූෂිත කුලයෝ; දිස්සන්ති චෙ'ව සුය්‍යන්ති ච; ආයස්මා=ආයුෂ්මත් තෙම; ඉමම්හා ආවාසා=මේ සඟරමින්; පක්කමතු=ඉවත් ව යේ වා; තෙ ඉධ වාසෙන=තා ගේ මෙ වෙහෙර වාසයෙන්; අලං ඉති=කම් නැතැයි; එවං වචනීයො අස්ස=මෙ සේ කිවයුතු වන්නේ ය;

a භික්ඛූහි=භික්ෂූන් විසින්; එවං ච වුච්චමානො සො භික්ඛු=මෙ සේ ද කියනු ලබන්නා වූ ඒ මහණ; තෙ භික්ඛූ=ඒ මහණුනට; භික්ඛූ=භික්ෂූහු; ඡන්දගාමිනො ච=ඡන්දයෙනුදු අගතියට යන්නාහු වෙති; භික්ඛූ දොසගාමිනො ච=භික්ෂූහු ද්වෙෂයෙනුදු අගතියට යන්නාහු වෙති; භික්ඛූ මොහගාමිනො ච=භික්ෂූහු මෝහයෙනුදු අගතියට යන්නාහු වෙති; භික්ඛූ භයගාමිනො ච භික්ෂූහු භයිනුදු අගතියට යන්නාහු වෙති; තාදිසිකාය ආපත්තියා=එබඳු වූ ඇවැතින්; එකච්චං පබ්බාජෙන්ති=ඇතැමකු බැහැර ලති; එකච්චං න පබ්බාජෙන්ති ඉති=ඇතැමකු බැහැර නො ලති යි, එවං වදෙය්‍ය=මෙ සේ කියා නම්; සො භික්ඛු; භික්ඛූහි; ආයස්මා එවං මා අවච=ඇවැත්නි මෙ සේ නො කියව; භික්ඛූ න ච ඡන්දගාමිනො=භික්ෂූහු ඡන්දගාමීහු ද නො වෙති; භික්ඛූ න ච දොසගාමිනො —පෙ— භික්ඛූ න ච භයගාමිනො=භික්ෂූහු භයගාමීහු ද නො වෙති; ආයස්මා ඛො කුලදූසකො=ආයුෂ්මත් තෙම වනාහි කුලදූෂකයෙකි; පාපසමාචාරො=ලාමක ක්‍රියා ඇත්තෙකි; ආයස්මතො ඛො —පෙ— තෙ ඉධ වාසෙන අලං ඉති=තා ගේ මෙහි වාසයෙන් කම් නැතැයි; එවං වචනීයො අස්ස=මෙ සේ කිවයුතු වන්නේ ය;



a එවං ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙ'ව පග්ගණ්හෙය්‍ය, සො භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය, යාවතතියඤ්චෙ සමනුභාසියමානො තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය, **සඞ්ඝාදිසෙසො**.

b උද්දිට්ඨා ඛො ආයස්මන්තො තෙරස සඞ්ඝාදිසෙසා ධම්මා නව පඨමාපත්තිකා චත්තාරො යාවතතියකා, යෙසං භික්ඛු අඤ්ඤතරං වා අඤ්ඤතරං වා ආපජ්ජිත්වා යාවතිහං ජානං පටිච්ඡාදෙති, තාවතිහං තෙන භික්ඛුනා අකාමා පරිවත්ථබ්බං; පරිවුත්ථපරිවාසෙන භික්ඛුනා උත්තරිං[1] ඡාරත්තං භික්ඛුමානත්තාය පටිපජ්ජිතබ්බං, චිණ්ණමානත්තො භික්ඛු, යත්ථ සියා වීසතිගණො භික්ඛුසඞ්ඝො, තත්ථ සො භික්ඛු අබ්භෙතබ්බො; එකෙන'පි චෙ ඌනො වීසතිගණො භික්ඛුසඞ්ඝො තං භික්ඛුං අබ්භෙය්‍ය, සො ච භික්ඛු අනබ්භිතො, තෙ ච භික්ඛූ ගාරය්හා, අයං තත්ථ සාමීචි.

---

a භික්ඛූහි=මහණුන් විසින්; එවං ච වුච්චමානො=මෙ සේ ද කියනු ලබන්නා වූ; සො භික්ඛු=ඒ මහණ; තථෙ'ව පග්ගණ්හෙය්‍ය=එ සේ ම දැඩි ව ගනී නම්; භික්ඛූහි සො භික්ඛු **—පෙ— තස්ස** පටිනිස්සග්ගාය=ඡන්දගාමිනො යනාදි වදන් හරනා පිණිස; යාවතතියං=තෙවරක්; සමනුභාසිතබ්බො=සමනුභාෂණකම් කටයුත්තේය.

b ආයස්මන්තො=ආයුෂ්මතුනි; පඨමාපත්තිකා නව=පළමු ඇවැත් වන නව දෙනෙක් ද; යාවතතියකා චත්තාරො=තෙවන කම්වැකි අවසනැ වන සතර දෙනෙක්දු යි; තෙරස සඞ්ඝාදිසෙසා ධම්මා=තෙළෙස් සඟවෙසෙස් ඇවැත්හු; උද්දිට්ඨා ඛො=උදෙසන ලදහ; යො භික්ඛු=යම් මහණෙක්; එසං=මේ සඟවෙසෙස් අතුරින්; අඤ්ඤතරං වා අඤ්ඤතරං වා ආපජ්ජිත්වා=එක්තරා එක්තරා ඇවැතකට හෝ පැමිණ; යාවතිහං=යම්තාක් දවස්; ජානං=දන්නේ; පටිච්ඡාදෙති=නො කියා පිළිසන් කෙරේ ද; තාවතිහං=එපමණ දවස්; තෙන භික්ඛුනා=ඒ මහණහු විසින්; අකාමා=නො කැමැත්තහු විසිනුදු; පරිවත්ථබ්බං=පිරිවෙස් විසිය යුතු; පරිවුත්ථපරිවාසෙන භික්ඛුනා=විසූ පිරිවෙස් ඇති මහණහු විසින්; උත්තරිං=පරිවාසයෙන් මත්තෙහි; භික්ඛුමානත්තාය=භික්ෂූනට බුහුමන් පිණිස; ඡාරත්තං=සරයක් මුළුල්ලෙහි, පටිපජ්ජිතබ්බං=පිළිපැද්ද යුතු; චිණ්ණමානත්තො භික්ඛු=(යම්)පිරූ මානත ඇති භික්ෂුවක් වේ ද; සො භික්ඛු=ඒ මහණ තෙමෙ; වීසතිගණො භික්ඛුසඞ්ඝො යත්ථ සියා=විසිනමකින්

---

1 “උත්තරි” ඉති මරම්ම පොත්ථකෙසු සබ්බත්ථ දිස්සතෙ.

a තත්‍රා'යස්මන්තෙ පුච්ඡාමි කච්චි'ත්‍ථ පරිසුද්ධා, දුතියම්පි පුච්ඡාමි කච්චි'ත්‍ථ පරිසුද්ධා, තතියම්පි පුච්ඡාමි කච්චි'ත්‍ථ පරිසුද්ධා, පරිසුද්ධෙ'ත්‍ථා'යස්මන්තො, තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමීති.

**සඞ්ඝාදිසෙසුද්දෙසො තතියො**

——:o:——

**b ඉමෙ ඛො පනා'යස්මන්තො ද්වෙ අනියතා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.**

1 යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො පටිච්ඡන්නෙ ආසනෙ අලං කම්මනියෙ නිසජ්ජං කප්පෙය්‍ය, තමෙ'නං සද්ධෙය්‍යවචසා උපාසිකා දිස්වා තිණ්ණං ධම්මානං අඤ්ඤතරෙන වදෙය්‍ය පාරාජිකෙන වා සඞ්ඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා, නිසජ්ජං භික්ඛු පටිජානමානො තිණ්ණං ධම්මානං අඤ්ඤතරෙන කාරෙතබ්බො පාරාජිකෙන වා සඞ්ඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා යෙන වා සා සද්ධෙය්‍යවචසා උපාසිකා වදෙය්‍ය, තෙන සො භික්ඛු කාරෙතබ්බො, **අයං ධම්මො අනියතො.**

---

සූත් ගණයා ඇති භික්‍ෂුසඞ්ඝයා යම් සීමාවෙක වේ ද; තත්‍ර=එහි දී; අබ්භෙතබ්බො=සඞ්ඝයාට ඇතුළත් කොට ගත යුත්තේය; එකෙන'පි ඌනො=එක් නමක් විසිනුදු අඩු වූ; වීසතිගණො භික්ඛුසඞ්ඝො=විංශතිවර්ගී භික්‍ෂුසඞ්ඝ තෙම; තං භික්ඛුං=ඒ භික්‍ෂුව; අබ්භෙය්‍ය චෙ=අබ්භිත කෙරේ නම්; සො ච භික්ඛු=ඒ මහණ ද; අනබ්භිතො=අබ්භාන කම් නො කරන ලද්දේ ය; තෙ ච භික්ඛූ=ඒ මහණහු ද; ගාරය්හා=ගර්හා කටයුත්තෝය; අයං=මේ විධිය; තත්‍ථ=ඒ සඟවෙසෙස්හි ලා; සාමීචි=පිළිවෙත යි;

a තත්‍ථ-ඒ තෙළෙස් සඟවෙසෙස්හි ලා, ආයස්මන්තෙ පුච්ඡාමි=ආයුෂ්මතුන් විචාරමි; එත්‍ථ=මේ සඟවෙසෙස්හි ලා; කච්චි පරිසුද්ධා=කිම පිරිසිදුවහු ද; දුතියම්පි පුච්ඡාමි —පෙ— එත්‍ථ=මෙහි ලා; ආයස්මන්තො=ආයුෂ්මත්හු; පරිසුද්ධා=පිරිසිදුය හ; තස්මා තුණ්හී=එහෙයින් නිශ්ශබ්දය හ; එතං=මේ නිහඬ බව; එවං ධාරයාමි=මෙසේ පිරිසිදු හෙයිනැ යි සලකමි;

**තෙවනසඞ්ඝාදිසෙසුද්දෙසයයි**

——:o:——

b ආයස්මන්තො=ආයුෂ්මත්නි; අනියතා=අනියත නම් වූ; ඉමෙ ඛො පන ද්වෙ ධම්මා=මේ ධර්මයෝ දෙදෙනෙක් වනාහි; උද්දෙසං ආගච්ඡන්ති=උදෙසීමට පැමිණෙත්.

1 යො පන භික්ඛු=යම් මහණෙක්; එකො=හුදෙකලා වූයේ; එකාය=හුදෙකලා වූ; මාතුගාමෙන සද්ධිං=මාගමක් සමඟ; රහො=



2 නහෙ'ව ඛො පන පටිච්ඡන්නං ආසනං හොති නාලං කම්මනියං, අලඤ්ච ඛො හොති මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසිතුං, යො පන භික්ඛු තථාරූපෙ ආසනෙ මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙය්‍ය, තමෙ'නං සද්ධෙය්‍යවචසා උපාසිකා දිස්වා ද්වින්නං ධම්මානං අඤ්ඤතරෙන වදෙය්‍ය සඞ්ඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා, නිසජ්ජං භික්ඛු පටිජානමානො ද්වින්නං ධම්මානං අඤ්ඤතරෙන කාරෙතබ්බො සඞ්ඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා, යෙන වා සා සද්ධෙය්‍යවචසා උපාසිකා වදෙය්‍ය, තෙන සො භික්ඛු කාරෙතබ්බො, **අයම්පි ධම්මො අනියතො.**

උද්දිට්ඨා ඛො ආයස්මන්තො ද්වෙ අනියතා ධම්මා, තත්‍ථා'යස්මන්තෙ පුච්ඡාමි කච්චි'ත්‍ථ පරිසුද්ධා, දුතියම්පි පුච්ඡාමි කච්චි'ත්‍ථ පරිසුද්ධා, තතියම්පි පුච්ඡාමි කච්චි'ත්‍ථ පරිසුද්ධා, පරිසුද්ධෙ'ත්‍ථා'යස්මන්තො, තස්මා තුණ්හී, එවමෙ'තං ධාරයාමී'ති.

**අනියතුද්දෙසො චතුත්‍ථො.**

---

නො පෙනෙන තන්හි වූ; පටිච්ඡන්නෙ=භිත්ති ආදියෙන් මුවහ වූ; අලං කම්මනියෙ=මෛථුනකර්මයට යොග්‍ය වූ; ආසනෙ=අස්නෙක්හි; නිසජ්ජං කප්පෙය්‍ය=හිඳීම කෙරේ ද; තමෙ'නං=ඒ භික්‍ෂුව; සද්ධෙය්‍ය වචසා=ඇදහිය යුතු වචන ඇති; උපාසිකා=ආර්‍ය්‍යශ්‍රාවිකාවක්; දිස්වා=දැක; තිණ්ණං ධම්මානං=තුන් ආපත්තීන් අතුරෙන්; අඤ්ඤතරෙන=අන්‍යතර වූ; පාරාජිකෙන වා=මෛථුනධර්ම පරිජියෙන් හෝ; සඞ්ඝාදිසෙසෙන වා=කායසංසග සඟවෙසෙසින් හෝ; පාචිත්තියෙන වා=රහොනිසජ්ජාමූලක පචිතියෙන් හෝ; වදෙය්‍ය=කියා නම්; භික්ඛු=මහණ තෙම; නිසජ්ජං=(මෛථුන සෙවන කායසංසග්ගස්සාදරාග රහොනිසජ්ජස්සාදරාග හෝ වශයෙන්) හිඳීම; පටිජානමානො=පිළිගන්නේ ම; තිණ්ණං ධම්මානං=ත්‍රිවිධ ආපත්තීන් අතුරින්; අඤ්ඤතරෙන=අන්‍යතර වූ; පාරාජිකෙන වා=පරිජියෙන් හෝ; සඞ්ඝාදිසෙසෙන වා=සඟවෙසෙසින් හෝ; පාචිත්තියෙන වා=පචිතියෙන් හෝ; කාරෙතබ්බො=කරවිය යුත්තේ ය; සද්ධෙය්‍යවචසා=ඇදහිය යුතු වචන ඇති; සා උපාසිකා=ඒ උවැසිය; යෙන වා=නිෂද්‍යාදි යම් ආකාරයක් සමඟ හෝ; වදෙය්‍ය=මෛථුනාදිය ආරොපණය කොට කියා ද; සො භික්ඛු=(ප්‍රතිඥකරන්නා වූ) ඒ මහණ තෙම; තෙන=එයින්; කාරෙතබ්බො=කරවිය යුත්තේ ය; අයං ධම්මො=මේ ඇවැත; අනියතො=ප්‍රතිඥ පරිදි කටයුතු බැවින් අනියත නම්;

2 ආසනං=ආසනය; පටිච්ඡන්නං න හෙ'ව ඛො පන හොති=කවාට භිත්ති ආදියෙන් පිළිසන් නොවූයේ ම වේ ද; නා'ලංකම්මනියං=මෛථුන සේවනයට ද නුසුදුසු වේ ද; මාතුගාමං=මාගමකට;

## a ඉමෙ ඛො පනා'යස්මන්තො තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.

1 නිට්ඨිත චීවරස්මිං පන[1] භික්ඛුනා උබ්භතස්මිං කඨිනෙ දසාහපරමං අතිරෙකචීවරං ධාරෙතබ්බං, තං අතික්කාමයතො **නිස්සග්ගියං පාචිත්තියං.**

---

දුට්ඨුල්ලාහි වාචාහි=දුට්ඨුල්ලවාචාවෙන්; ඔභාසිතුං=කියන්නට; අලං ච ඛො හොති=යොග්‍ය වේ ද; යො පන භික්ඛු=යම් මහණෙක්; තථා රූපෙ=එ වැනි; රහො=පියෙවි කථා නො ඇසෙන තන්හි වූ; ආසනෙ=අස්නෙක; එකො=හුදෙකලා වූයේ; එකාය=එකලා වූ; මාතුගාමෙන සද්ධිං=මාගමක් සමඟ; නිසජ්ජං කප්පෙය්‍ය=හිඳීම කෙරේ ද; සද්ධෙය්‍යවචසා උපාසිකා=අරිසැවියක්; තමෙ'නං දිස්වා=ඒ මහණහු දැක; ද්වින්නං ධම්මානං අඤ්ඤතරෙන=ද්විවිධ ආපත්තීන් අතුරින් අන්‍යතර වූ; සඞ්ඝාදිසෙසෙන වා=සඞ්ඝාදිසෙසයෙන් හෝ; පාචිත්තියෙන වා=හිඳීමෙන් සිදු වන පචිතියෙන් හෝ; වදෙය්‍ය=කියා නම්; භික්ඛු=මහණ; නිසජ්ජං=හිඳීම; පටිජානමානො=පිළිත කරන්නේ ම; ද්වින්නං ධම්මානං —පෙ— පාචිත්තියෙන වා කාරෙතබ්බො=පචිතියෙන් හො කරවිය යුත්තේය; සද්ධෙය්‍යවචසා සා උපාසිකා; යෙන වා=නිසජ්ජාදි ආකාරයක් සමඟ හෝ; වදෙය්‍ය=සඞ්ඝාදිසෙසාදිය ආරොපණය කොට කියා ද; සො භික්ඛු=(ප්‍රතිඥා කරන්නා වූ) ඒ මහණ; තෙන කාරෙතබ්බො=එයින් කරවිය යුත්තේය; අයංපි ධම්මො=මේ ඇවැත ද; අනියතො=ප්‍රතිඥාවෙන් ම නියම කළ යුතු බැවින් අනියත නම්.

### සිවුවැනි අනියතුද්දෙසයයි.

a ආයස්මන්තො=ආයුෂ්මත්නි; ඉමෙ ඛො තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා=මේ තිස් නිසගි පචිති ඇවැත්හු; උද්දෙසං ආගච්ඡන්ති=උදෙසිය යුතු බවට පැමිණෙත්.

1 නිට්ඨිතචීවරස්මිං පන=කිරීම් ආදි කිසියම් නිෂ්ඨානයෙකින් සිවුර නිමි කල්හි ද; කඨිනෙ උබ්භතස්මිං=කඨිනානිසංසය උදුළු කල්හි ද; භික්ඛුනා=භික්ෂුව විසින්; දසාහපරමං=දස දිනක් පරමකොට ඇති කාලයක්; අතිරෙකචීවරං=නො ඉටු නො විකැපූ සිවුරු; ධාරෙතබ්බං=දැරිය යුතු; තං=ඒ චීවරය තෙම; අතික්කාමයතො=දසාහ පරම කාලය ඉක්මත්වන්නහුට; නිස්සග්ගියං=නිසජිය යුත්තේ වෙයි; පාචිත්තියං=පචිති ඇවැතෙක් ද වෙ; නොහොත්-තං=ඒ දසාහපරම

---

1 "පන" ඉච්චයං මරම්ම පොත්ථකෙසු න දිස්සති



2. නිට්ඨිතචීවරස්මිං පන[1] භික්ඛුනා උබ්භතස්මිං කඨිනෙ එකරත්තම්පි චෙ භික්ඛු තිචීවරෙන විප්පවසෙය්‍ය, අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා **නිස්සග්ගියං පාචිත්තියං.**

3. නිට්ඨිතචීවරස්මිං පන[1] භික්ඛුනා උබ්භතස්මිං කඨිනෙ භික්ඛුනො පනෙ'ව අකාලචීවරං උප්පජ්ජෙය්‍ය, ආකඞ්ඛමානෙන භික්ඛුනා පටිග්ගහෙතබ්බං, පටිග්ගහෙත්වා ඛිප්පමෙ'ව කාරෙතබ්බං, නො ච'ස්ස පාරිපූරි, මාසපරමං තෙන භික්ඛුනා තං චීවරං නික්ඛිපිතබ්බං ඌනස්ස පාරිපූරියා සතියා පච්චාසාය, තතො චෙ උත්තරිං නික්ඛිපෙය්‍ය සතියාපි පච්චාසාය, **නිස්සග්ගියං පාචිත්තියං.**

4. යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා පුරාණචීවරං ධොවාපෙය්‍ය වා රජාපෙය්‍ය වා ආකොටාපෙය්‍ය වා, **නිස්සග්ගියං පාචිත්තියං.**

---

කාලය; අතික්කාමයතො=ඉක්මවන්නහුට; නිස්සග්ගියං පාචිත්තියං=නිසජීම නම් විනය කර්මය ඇති පචිති ඇවැතෙක් වේ;

2 භික්ඛුනා (-භික්ඛුනො=භික්ෂුව) ගේ; නිට්ඨිතචීවරස්මිං පන=චීවර පළිබොධය සිඳුණු කල්හි ද; උබ්භතස්මිං කඨිනෙ=කෙළින් උදුළු කල්හි ද (-ආවාස පළිබොධය සිඳුණු කල්හි ද); භික්ඛු=මහණ තෙමෙ; භික්ඛුසම්මුතියා අඤ්ඤත්‍ර=සඞ්ඝසම්මුතිය නැතිව; එකරත්තම්පි=එක් රැයකුදු; තිචීවරෙන=ත්‍රිචීවරාධිෂ්ඨාන වශයෙන් ඉටූ සිවුරෙකින්; විප්පවසෙය්‍ය=වෙන්ව වෙසේ නම්;

3. භික්ඛුනා=භික්ෂුව ගේ; නිට්ඨිතචීවරස්මිං පන=චීවරපළිබොධය නිමි කල්හි ද; කඨිනෙ උබ්භතස්මිං=කඨිනානිසංසය උදුළු කල්හි ද; භික්ඛුනො පනෙ'ව=භික්ෂුහට ම; අකාලචීවරං උප්පජ්ජෙය්‍ය=අකාලචීවරයෙක් උපදනේ නම්; ආකඞ්ඛමානෙන භික්ඛුනා=කැමැති මහණහු විසින්; පටිග්ගහෙතබ්බං=පිළිගත යුතු; පටිග්ගහෙත්වා=පිළිගෙන; ඛිප්පමෙ'ව කාරෙතබ්බං=වහා ම කරවිය යුතු; නො චෙ පාරිපූරි අස්ස=ඉදින් නො පොහොනේ වේ නම්; ඌනස්ස පාරිපූරියා=ඌන වස්ත්‍රයේ පූරණය පිණිස; සතියා පච්චාසාය=වස්ත්‍රයක් පසුව ලැබේයයි ආසාව ඇති කල්හි; තං චීවරං=ඒ වස්ත්‍රය; මාසපරමං=මසක් හිමි කොට; නික්ඛිපිතබ්බං=නො ඉටා නො විකපා තැබිය යුතු; සතියා'පි පච්චාසාය=චීවරාසාවක් ඇති කල්හි දු; චෙ=ඉදින්; තතො උත්තරිං=මාසයෙකින් මතු; නික්ඛිපෙය්‍ය=නො ඉටා නො විකපා තබා නම්;

4 යො පන භික්ඛු=යම් මහණෙක්; අඤ්ඤාතිකාය භික්ඛුනියා=නො නෑ මෙහෙණක ලවා; පුරාණචීවරං=පරණ සිවුරක්; ධොවාපෙය්‍ය වා=සෝදවන්නේ නම් හෝ; රජාපෙය්‍ය වා=රදන් කරවන්නේ නම් හෝ; ආකොටාපෙය්‍ය වා=අපුළවන්නේ නම් හෝ;

---

1 'පන' ඉච්චයං මරම්ම පොත්ථකෙසු න දිස්සතෙ.

5 යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො චීවරං පටිග්ගණ්හෙය්‍ය, අඤ්ඤත්‍ර පාරිවට්ටකා, **නිස්සග්ගියං පාචිත්තියං.**

6 යො පන භික්ඛු අඤ්ඤාතකං ගහපතිං වා ගහපතානිං වා චීවරං විඤ්ඤාපෙය්‍ය අඤ්ඤත්‍ර සමයා, **නිස්සග්ගියං පාචිත්තියං.** තත්ථා'යං සමයො, අච්ඡින්නචීවරො වා හොති භික්ඛු නට්ඨචීවරො වා, අයං තත්ථ සමයො.

7 තඤ්චෙ අඤ්ඤාතකො ගහපති වා ගහපතානී වා බහූහි චීවරෙහි අභිහට්ඨුං පවාරෙය්‍ය, සන්තරුත්තරපරමං තෙන භික්ඛුනා තතො චීවරං සාදිතබ්බං, තතො චෙ උත්තරිං සාදියෙය්‍ය, **නිස්සග්ගියං පාචිත්තියං**

8 භික්ඛුං පනෙ'ව උද්දිස්ස අඤ්ඤාතකස්ස ගහපතිස්ස වා ගහපතානියා වා චීවරචෙතාපන්නං උපක්ඛටං හොති 'ඉමිනා චීවරචෙතාපන්නෙන චීවරං චෙතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුං චීවරෙන

---

5 යො පන භික්ඛු; අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො=නො නෑ මෙහෙණක අතින්; පාරිවට්ටකා අඤ්ඤත්‍ර=අරළු කඩකුඩු දී ගැන් ම තබා; චීවරං=විකපුම් පොහොනා චීවරයක්; පටිග්ගණ්හෙය්‍ය=පිළිගනී නම්;

6 යො පන භික්ඛු; අඤ්ඤාතකං ගහපතිං වා පහපතානිං වා=නො නෑ ගැහැවියකුගෙන් හෝ ගැහැවිනියකගෙන් හෝ; සමයා අඤ්ඤත්‍ර=කාලය හැර; චීවරං විඤ්ඤාපෙය්‍ය=සිවුරක් ඉල්වා නම්; **නිස්සග්ගියං පාචිත්තියං**=නිසගි පචිති වේ; අයං=මේ මතු කියවෙන්නේ; සමයො=කාලයයි; භික්ඛු=මහණ තෙම; අච්ඡින්නචීවරො වා හොති=අසිඳුනා ලද සිවුරු ඇත්තේ හෝ වේ ද; නට්ඨචීවරො වා=නැසුණු සිවුරු ඇත්තේ හෝ වේ ද; අයං තත්ථ සමයො=මේ එහි සමයයි.

7 තං භික්ඛුං=ඒ අච්ඡින්නාදි සිවුරු ඇති භික්ෂුව; අඤ්ඤාතකො ගහපති වා ගහපතානී වා= නො නෑ ගැහැවියෙක් හෝ ගැහැවිනියක් හෝ; අභිහට්ඨුං=කසින් වදනින් එළවා; බහූහි චීවරෙහි=බොහෝ වස්ත්‍රයෙන්; පවාරෙය්‍ය චෙ=ඉදින් පවරා නම්; තෙන භික්ඛුනා=ඒ මහණහු විසින්; සන්තරුත්තරපරමං=හඳනයට හා පොරෝනයට හා පමණ වූ; චීවරං=වස්ත්‍රයක්; සාදිතබ්බං=ඉවසිය යුතු; තතො උත්තරිං=එ පමණින් වැඩියක්; සාදියෙය්‍ය=ඉවසා නම්.

8 අඤ්ඤාතකස්ස ගහපතිස්ස වා ගහපතානියා වා=නො නෑ ගැහැවියකු විසින් හෝ ගැහැවිනියක විසින් හෝ; භික්ඛුං පනෙ'ව උද්දිස්ස=භික්ෂුවක් උදෙසාම; ඉමිනා චීවරචෙතාපන්නෙන=මේ සිවුරු



අච්ඡාදෙස්සාමී'ති, තත්‍ර චෙ සො භික්ඛු පුබ්බෙ අප්පවාරිතො උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය 'සාධු වත මං ආයස්මා ඉමිනා චීවරචෙතාපන්නෙන එවරූපං වා එවරූපං වා චීවරං චෙතාපෙත්වා අච්ඡාදෙහී'ති කල්‍යාණකම්‍යතං උපාදාය, **නිස්සග්ගියං පාචිත්තියං.**

9 භික්ඛුං පනෙ'ව උද්දිස්ස උභින්නං අඤ්ඤාතකානං ගහපතීනං වා ගහපතානීනං වා පච්චෙකචීවරචෙතාපන්නා උපක්ඛටා[1] හොන්ති "ඉමෙහි මයං පච්චෙකචීවරචෙතාපන්නෙහි පච්චෙකචීවරානි චෙතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුං චීවරෙහි අච්ඡාදෙස්සාමා"ති. තත්‍ර චෙ සො භික්ඛු පුබ්බෙ අප්පවාරිතො උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය "සාධු වත මං ආයස්මන්තො ඉමෙහි පච්චෙකචීවරචෙතාපන්නෙහි එවරූපං වා එවරූපං වා චීවරං චෙතාපෙත්වා අච්ඡාදෙථ උභො'ව සන්තා එකෙනා'ති කල්‍යාණකම්‍යතං උපාදාය, **නිස්සග්ගියං පාචිත්තියං.**

---

මිලයෙන්; චීවරං චෙතාපෙත්වා=සිවුරක් මිල දී ගෙන; ඉත්ථන්නාමං භික්ඛුං=මෙ නම් ඇති භික්ෂුව; චීවරෙන අච්ඡාදෙස්සාමි ඉති=සිවුරෙකින් වසන්නෙමි යි හෙවත්-පුදන්නෙමි යි; චීවරචෙතාපන්නං=සිවුරු මිලයක්; උපක්ඛටං හොති=රැස් කොට තබන ලද්දේ වේ ද; සො භික්ඛු=ඒ මහණ; පුබ්බෙ අප්පවාරිතො=පෙර නොපවරන ලද්දේ; තත්‍ර උපසඞ්කමිත්වා=එහි එළඹ; ආයස්මා=ඇවැත; ඉමිනා චීවරචෙතාපන්නෙන=මේ සිවුරුමිලයෙන්; එවරූපං වා එවරූපං වා චීවරං=මෙ බඳු හෝ මෙ බඳු හෝ සිවුරක්; චෙතාපෙත්වා=මිල දී ගෙන; මං අච්ඡාදෙහි=මා වළඳ ගන්ව හෙවත්-පුදව; සාධු වත ඉති=එ සේ වී නම් මැනවැයි; කල්‍යාණකම්‍යතං උපාදාය=යහපතක් කැමැති බව සිතින් ගෙන; චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය චෙ=සිවුරෙහි අධික විධානයට ඉදින් පැමිණේ නම්;

9 අඤ්ඤාතකානං=නො නෑ වූ; උභින්නං ගහපතීනං වා=ගැහැවියන් දෙදෙනකුන් විසින් හෝ; ගහපතානීනං වා=ගැහැවිනියන් දෙදෙනකුන් විසින් හෝ; මයං=අපි; ඉමෙහි පච්චෙකචීවර චෙතාපන්නෙහි=මේ වෙන් වෙන් වූ සිවුරු මිලයෙන්; පච්චෙකචීවරානි චෙතාපෙත්වා=වෙනවෙන වස්ත්‍ර මිල දී ගෙන; ඉත්ථන්නාමං භික්ඛුං=මෙ නම් ඇති භික්ෂුව; චීවරෙහි අච්ඡාදෙස්සාම ඉති=සිවුරින් වසන්නමු යි හෙවත්-පුදන්නෙමු යි; පච්චෙකචීවර චෙතාපන්නා=වෙන් වෙන් සිවුරු මිල කොනෙක්; උපක්ඛටා හොන්ති=රැස් කරන ලද්දේ වෙත් ද; සො භික්ඛු පුබ්බෙ අප්පවාරිතො —පෙ— ආයස්මන්තො=

---

1 "පච්චෙකචීවරචෙතාපන්නානි උපක්ඛටානි" මරම්ම.

10 භික්ඛුං පනේ'ව උද්දිස්ස රාජා වා රාජභොග්ගො වා බ්‍රාහ්මණො වා ගහපතිකො වා දූතෙන චීවරචෙතාපන්නං පහිණෙය්‍ය "ඉමිනා චීවරචෙතාපන්නෙන චීවරං චෙතාපෙත්වා ඉත්ථන්නාමං භික්ඛුං චීවරෙන අච්ඡාදෙහී"ති. සො චෙ දූතො තං භික්ඛුං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය "ඉදං ඛො භන්තෙ ආයස්මන්තං උද්දිස්ස චීවරචෙතාපන්නං ආභතං, පතිගණ්හාතු ආයස්මා චීවරචෙතාපන්න"න්ති.

a තෙන භික්ඛුනා සො දූතො එවම'ස්ස වචනීයො "න ඛො මයං ආවුසො චීවරචෙතාපන්නං පතිගණ්හාම, චීවරං ච ඛො මයං පතිගණ්හාම කාලෙන කප්පිය"න්ති". සො චෙ දූතො තං භික්ඛුං එවං වදෙය්‍ය "අත්ථි පනා'යස්මතො කොචි වෙය්‍යාවච්චකරො"ති". චීවරත්ථිකෙන භික්ඛවෙ භික්ඛුනා වෙය්‍යාවච්චකරො නිද්දිසිතබ්බො ආරාමිකො වා උපාසකො වා "එසො ඛො ආවුසො භික්ඛූනං වෙය්‍යාවච්චකරො"ති.

ආයුෂ්මතුනි; උභො එව සන්තා=තෙපි දෙදෙන ම එක් ව; ඉමෙහි පච්චෙකචීවරචෙතාපන්නෙහි=මේ වෙන වෙන සිවුරු මිලයෙන්; එවරූපං වා එවරූපං වා චීවරං චෙතාපෙත්වා=මෙ බඳු හෝ මෙ බඳු හෝ සිවුරක් මිල දී ගෙන; මං එකෙන අච්ඡාදෙථ=මා එක් සිවුරෙකින් ම ආච්ඡාදනය කරව්; සාධු වත ඉති=එ සේ වී නම් මැනවැ යි;

10 භික්ඛුං එව පන උද්දිස්ස=මහණක්හු ම උදෙසා; රාජා වා=රජෙක් හෝ; රාජභොග්ගො වා= රාජාමාත්‍යයෙක් හෝ; බ්‍රාහ්මණො වා=බමුණෙක් හෝ; ගහපතිකො වා=ගැහැවියෙක් හෝ; ඉමිනා -පෙ- අච්ඡාදෙහි ඉති=පුදවයි; දූතෙන=දූතයකු අත; චීවරචෙතාපන්නං= අකැප වූ සිවුරු මිලයක්; පහිණෙය්‍ය=යවන්නේ නම්; සො දූතො= ඒ දූතයා; තං භික්ඛුං උපසඞ්කමිත්වා=ඒ භික්ෂුව වෙත එළඹ; භන්තෙ= වහන්ස; ආයස්මන්තං උද්දිස්ස=ආයුෂ්මතුන් උදෙසා; ඉදං ඛො චීවර චෙතාපන්නං=මේ සිවුරු මිලක්; ආභතං=ගෙනෙන ලදි; ආයස්මා= ආයුෂ්මත් තෙම; චීවරචෙතාපන්නං=සිවුරු මිලය; පතිගණ්හාතු ඉති=පිළිගනීව යි; එවං වදෙය්‍ය චෙ=ඉදින් මෙසේ කියා නම්;

a තෙන භික්ඛුනා=ඒ මහණහු විසින්; සො දූතො=ඒ දූත තෙම; ආවුසො=ඇවැත; මයං; චීවරචෙතාපන්නං=අකැප සිවුරු මිල; න ඛො පතිගණ්හාම=නො පිළිගනුම් හ; මයං; කාලෙන=සුදුසු කල්හි හෙවත්-ප්‍රයෝජන ඇති කල්හි; කප්පියං චීවරං ච ඛො=කැප සිවුරක් ම; පතිගණ්හාම ඉති=පිළිගනුම්හයි; එවං වචනීයො අස්ස=මෙසේ කිවයුතු වන්නේ ය; සො දූතො; තං භික්ඛුං=ඒ මහණහට; ආයස්ම-



a සො චෙ දූතො තං වෙය්‍යාවච්චකරං සඤ්ඤාපෙත්වා තං භික්ඛුං උපසඞ්කමිත්වා එවං වදෙය්‍ය "යං ඛො භන්තෙ ආයස්මා වෙය්‍යාවච්චකරං නිද්දිසි, සඤ්ඤත්තො සො මයා, උපසඞ්කමතු ආයස්මා කාලෙන, චීවරෙන තං අච්ඡාදෙස්සතී" ති. චීවරත්ථිකෙන භික්ඛවෙ භික්ඛුනා වෙය්‍යාවච්චකරො උපසඞ්කමිත්වා ද්වත්තික්ඛත්තුං චොදෙතබ්බො සාරෙතබ්බො "අත්ථො මෙ ආවුසො චීවරෙනා" ති. ද්වත්තික්ඛත්තුං චොදයමානො සාරයමානො තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය, ඉච්චෙ'තං කුසලං, නො චෙ අභිනිප්ඵාදෙය්‍ය, චතුක්ඛත්තුං පඤ්චක්ඛත්තුං ඡක්ඛත්තුපරමං තුණ්හීභූතෙන උද්දිස්ස ඨාතබ්බං, චතුක්ඛත්තුං පඤ්චක්ඛත්තුං ඡක්ඛත්තුපරමං තුණ්හීභූතො උද්දිස්ස තිට්ඨමානො තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය, ඉච්චෙ'තං කුසලං, (නො චෙ අභිනිප්ඵාදෙය්‍ය[1]) තතො චෙ උත්තරිං වායමමානො තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය, **නිස්සග්ගියං පාචිත්තියං.**

තො=ආයුෂ්මත්හු ගේ; කොචි වෙය්‍යාවච්චකරො=කිසියම් කැපකරුවෙක්; අත්ථි පන ඉති=ඇත්දැයි; එවං වදෙය්‍ය චෙ=මෙ සේ කියා නම්; භික්ඛවෙ=මහණෙනි; චීවරත්ථිකෙන භික්ඛුනා=සිවුරු කැමැති වන මහණහු විසින්; වෙය්‍යාවච්චකරො=කැපකරු වූ; ආරාමිකො වා= ආරාමිකයෙක් හෝ; උපාසකො වා=උවසුවෙක් හෝ; ආවුසො= ඇවැත; එසො=මේ තෙම; භික්ඛූනං වෙය්‍යවච්චකරො ඉති=භික්ෂූන් ගේ කැපකරුවෙකැයි; නිද්දිසිතබ්බො=දක්විය යුතු;

a සො දූතො, තං වෙය්‍යාවච්චකරං=ඒ කැපකරුවා; සඤ්ඤාපෙත්වා=ගිවිස්වා; (-සිවුරු ගෙන දෙන සේ නියම කොට) තං භික්ඛුං උපසඞ්කමිත්වා=ඒ මහණහු වෙත එළඹ; භන්තෙ=වහන්ස; ආයස්මා= ආයුෂ්මත් තෙම; යං ඛො වෙය්‍යාවච්චකරං=යම් කැපකරුවකු; නිද්දිසි=දක්වී ද; සො=හේ; මයා=මා විසින්; සඤ්ඤත්තො=වස්ත්‍රයක් ගෙන දෙන සේ ගිවිස්වන ලදි; ආයස්මා=ආයුෂ්මත්තෙම; කාලෙන=වස්ත්‍ර කැමැති වන කලෙක; උපසඞ්කමතු=එළඹේ වා; තං =ඔබ; චීවරෙන අච්ඡාදෙස්සති ඉති=සිවුරෙකින් පුදන්නේයයි; එවං වදෙය්‍ය=මෙසේ කියා නම්; භික්ඛවෙ=මහණෙනි; චීවරත්ථිකෙන භික්ඛුනා=සිවුරු කැමැති මහණහු විසින්; වෙය්‍යාවච්චකරො=කැපකරු තෙම; උපසඞ්කමිත්වා=එළඹ; ආවුසො=ඇවැත; මෙ=මට; චීවරෙන අත්ථො ඉති=වස්ත්‍රයෙකින් ප්‍රයෝජන ඇතැයි, ද්වත්තික්ඛත්තුං =දෙතුන් වරෙක; චොදෙතබ්බො=ඉල්විය යුත්තේ ය; සාරෙතබ්බො =සිහි කරවිය යුත්තේය; ද්වත්තික්ඛත්තුං=දෙතුන් වරෙක; චොදයමානො=ඉල්වන්නේ; සාරයමානො=සිහිකරවන්නේ; තං චීවරං=ඒ

1 රෙඛනාරිත පාඨො මරම්මපොත්ථකෙසු න දිස්සති.

a නො චෙ අභිනිප්ඵාදෙය්‍ය, යත'ස්ස චීවරචෙතාපන්නං ආභතං, තත්‍ථ සාමං වා ගන්තබ්බං දූතො වා පාහෙතබ්බො "යං ඛො තුම්හෙ ආයස්මන්තො භික්ඛුං උද්දිස්ස චීවරචෙතාපන්නං පහිණිත්‍ථ, න තං තස්ස භික්ඛුනො කිඤ්චි අත්‍ථං අනුභොති, යුඤ්ජන්තා' යස්මන්තො සකං, මා වො සකං විනස්සා"ති, අයං තත්‍ථ සාමීචි.

**චීවරවග්ගො පඨමො.**

---

වස්ත්‍රය; අභිනිප්ඵාදෙය්‍ය=නිපදවා නම්; ඉච්චෙතං=එසේ මේ නිපදවීම; කුසලං=මැනවි; චෙ=ඉදින්; නො අභිනිප්ඵාදෙය්‍ය=නො නිපදවා නම්; චතුක්ඛත්තුං=සිවු වරක් හෝ; පඤ්චක්ඛත්තුං=පස් වරක් හෝ; ඡක්ඛත්තුපරමං=සවරක් පරම කොට හෝ; තුණ්හීභූතෙන=නිශ්ශබ්දවූවහු විසින්; උද්දිස්ස ඨාතබ්බං=උදෙසා සිටිය යුතු යි; චතුක්ඛත්තුං=සිවුවරෙක; පඤ්චක්ඛත්තුං=පස් වරෙක; ඡක්ඛත්තුපරමං=ස වරක් පරම කොට; තුණ්හීභූතො=නිශ්ශබ්දවූයේ; උද්දිස්ස තිට්ඨමානො=සිවුරක් උදෙසා (මිදුලෙහි පිණ්ඩචාරිකාකාරයෙන්) සිටින්නේ; තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය=ඒ සිවුර නිපදවා නම්; ඉච්ච'තං කුසලං=එසේ මේ නිපැදවීම මැනවි; (නො චෙ අභිනිප්ඵාදෙය්‍ය=ඉදින් නො නිපදවා නම්) තතො උත්තරිං=ඒ චොදනා ඨාන ප්‍රමාණයෙන් මතු; වායමමානො=උත්සාහ කරන්නේ; තං චීවරං අභිනිප්ඵාදෙය්‍ය=ඒ සිවුර නිපදවා නම්; නිස්සග්ගියං පාචිත්තියං.

a නො චෙ අභිනිප්ඵාදෙය්‍ය=ඉදින් සිවුර නෙ නිපදවා නම්; යතො=රාජාදි යමකුගෙන්; අස්ස=ඒ මහණහට; චීවරචෙතාපන්නං=සිවුරු මිල; ආභතං=ගෙනෙන ලද ද; තත්‍ථ=ඔහු වෙත; ආයස්මන්තො=ආයුෂ්මතුනි; තුම්හෙ=තෙපි; යං ඛො භික්ඛුං උද්දිස්ස=යම් මහණකු උදෙසා; චීවරචෙතාපන්නං පහිණිත්‍ථ=සිවුරු මිලයක් යැවූහු ද; තං=ඒ මිලය; තස්ස භික්ඛුනො=ඒ මහණහට; කිඤ්චි අත්‍ථං=කිසි ප්‍රයෝජනයක්. න අනුභොති=නො නිපයයි; ආයස්මන්තො=ආයුෂ්මත්හු; සකං=තමා අයත් වස්තුව; යුඤ්ජන්තු=යෙදෙත් වා; හෙවත්-ඉල්වත් වා; වො=තොප ගේ; සකං=වස්තුව; මා විනස්ස ඉති=නො නැසේව යි; සාමං වා ගන්තබ්බං=තමා හෝ යා යුතු ය; දූතො වා පාහෙතබ්බො=දූතයෙක් හෝ යැවිය යුත්තේ ය; තත්‍ථ=එහි ලා; අයං=මේ විධිය; සාමීචි=පිළිවෙතයි.

**චීවර වග්ගයි. 1.**

---



1 යො පන භික්ඛු කොසියමිස්සකං සන්ථතං කාරාපෙය්‍ය, **නිස්සග්ගියං පාචිත්තියං**, (11)

2 යො පන භික්ඛු සුද්ධකාළකානං එළකලොමානං සන්ථතං කාරාපෙය්‍ය, **නිස්සග්ගියං පාචිත්තියං**. (12)

3 නවං පන භික්ඛුනා සන්ථතං කාරයමානෙන ද්වෙභාගා සුද්ධකාළකානං එළකලොමානං ආදාතබ්බා, තතියං ඔදාතානං චතුත්‍ථං ගොචරියානං. අනාදා චෙ භික්ඛු ද්වෙ භාගෙ සුද්ධකාළකානං එළකලොමානං තතියං ඔදාතානං චතුත්‍ථං ගොචරියානං නවං සන්ථතං කාරාපෙය්‍ය, **නිස්සග්ගියං පාචිත්තියං**. (13)

4 නවං පන භික්ඛුනා සන්ථතං කාරාපෙත්වා ඡබ්බස්සානි ධාරෙතබ්බං, ඔරෙන චෙ [1]භික්ඛු ඡන්නං වස්සානං තං සන්ථතං විස්සජ්ජෙත්වා වා අවිස්සජ්ජෙත්වා වා අඤ්ඤං නවං සන්ථතං කාරාපෙය්‍ය අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා, **නිස්සග්ගියං පාචිත්තියං**. (14)

---

1 යො පන භික්ඛු=යම් මහණෙක්; කොසියමිස්සකං=කොසෙය්‍ය නූල් මිශ්‍ර කරන ලද; සන්ථතං=එළලොම් මුවා සන්ථතයක්; කාරාපෙය්‍ය=කරවා නම්; නිස්සග්ගියං පාචිත්තියං=නිසගි පචිති වේ.

2 යො පන භික්ඛු; සුද්ධකාළකානං=හුදු කාලවණ් වූ; එළකලොමානං=එළ ලොම් පිළිබඳ; සන්ථතං කාරාපෙය්‍ය=ඇතිරියක් කරවා නම්;

3 නවං පන සන්ථතං=අලුත් සන්ථයක්; කාරයමානෙන භික්ඛුනා=කරවන මහණහු විසින්; සුද්ධකාළකානං එළකලොමානං=හුදු කාලවණ් එළලොම් පිළිබඳ; ද්වෙ භාගා=දෙ කොටස් කෙනෙක්; ආදාතබ්බා=ගතයුත්තාහ; ඔදාතානං=සුදු එළලොම් පිළිබඳ; තතියං=තෙවන කොටසක් ගත යුතුය; ගොචරියානං=කිඹුල්වන් එළලොම් පිළිබඳ; චතුත්‍ථං=සිවුවැනි කොටසක් ගත යුතුය; භික්ඛු=මහණ තෙම; සුද්ධකාළකානං එළකලොමානං=හුදු කළු එළලොම් පිළිබඳ; ද්වෙභාගෙ=දෙකොටසක් ද; ඔදාතානං=සුදු ලොම් පිළිබඳ; තතියං=තෙවන කොටසක් ද; ගොචරියානං=කිඹුල් වන් එළලොම් පිළිබඳ; චතුත්‍ථං=සිවුවැනි භාගයක් ද; අනාදාය=නොගෙන; නවං සන්ථතං=අලුත් ඇතිරියක්; කාරාපෙය්‍ය චෙ=ඉදින් කරවා නම්;

4 භික්ඛුනා පන=මහණහු විසින් වනාහි; නවං සන්ථතං කාරාපෙත්වා=අලුත් ඇතිරියක් කොට නිමවා; ඡබ්බස්සානි=සයවසක්; ධාරෙතබ්බං=දැරිය යුතුයි; තං සන්ථතං=ඒ ඇතිරිය; විස්සජ්ජෙත්වා වා

---

1 'භික්ඛු' ඉති මරම්ම පොත්‍ථකෙසු න දිස්සතෙ.

5 නිසීදනසන්ථතං පන භික්ඛුනා කාරයමානෙන පුරාණ සන්ථතස්ස සාමන්තා සුගතවිදත්ථි ආදාතබ්බා දුබ්බණ්ණකරණාය, අනාදා චෙ භික්ඛු පුරාණසන්ථතස්ස සාමන්තා සුගතවිදත්ථිං නවං නිසීදනසන්ථතං කාරාපෙය්‍ය, **නිස්සග්ගියං පාචිත්තියං.** (15)

6 භික්ඛුනො පනෙ'ව අද්ධානමග්ගපටිපන්නස්ස එළකලොමානි උප්පජ්ජෙය්‍යුං, ආකඞ්ඛමානෙන භික්ඛුනා පටිග්ගහෙතබ්බානි, පටිග්ගහෙත්වා තියොජනපරමං සහත්ථා හරිතබ්බානි අසන්තෙ හාරකෙ, තතො චෙ උත්තරිං හරෙය්‍ය අසන්තෙ'පි හාරකෙ, **නිස්සග්ගියං පාචිත්තියං.** (16)

7 යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා එළකලොමානි ධොවාපෙය්‍ය වා රජාපෙය්‍ය වා විජටාපෙය්‍ය වා **නිස්සග්ගියං පාචිත්තියං.** (17)

---

=අනෙකකුට දී හෝ; අවිස්සජ්ජෙත්වා වා=නො දී හෝ; භික්ඛුසම්මුතියා අඤ්ඤත්‍ර=සඞ්ඝසම්මුතිය නැතිව; ඡන්නං වස්සානං ඔරෙන=සාවුරුද්දක් ඇතුළත; අඤ්ඤං නවං සන්ථතං කාරාපෙය්‍ය=අන් අලුත් ඇතිරියක් කරවා නම්;

5 නිසීදනසන්ථතං=හිඳිනා සන්ථතයක්; කාරයමානෙන භික්ඛුනා පන=කරවන මහණහු විසින් වනාහි; දුබ්බණ්ණකරණාය=අලුත් සන්ථතය දුර්වණ්ණ කරනු පිණිස; පුරාණසන්ථතස්ස=පැරැණි සන්ථතයේ; සාමන්තා=එක් පසෙකින්; සුගතවිදත්ථි=සුගත් වියත් පමණ පෙදෙසක්; ආදාතබ්බා=කපා ගත යුතුය; භික්ඛු=මහණතෙම; පුරාණසන්ථතස්ස සාමන්තා=පැරැණි සන්ථතයේ පසෙකින්; සුගතවිදත්ථිං අනාදාය=සුගත් වියත් පමණ පෙදෙසක් කපා නො ගෙන; නවං නිසීදනසන්ථතං=අලුත් නිසීදන සන්ථතයක්; කාරාපෙය්‍ය=කරවා නම්;

6 අද්ධානමග්ගපටිපන්නස්ස=දීර්ඝමාර්ගයට පිළිපන් හෙවත්-දික් මඟ යන; භික්ඛුනො පනෙ'ව=මහණහට; එළකලොමානි=එළකලෝමයෝ; චෙ උප්පජ්ජෙය්‍යුං=ඉදින් උපදනාහු නම්; ආකඞ්ඛමානෙන භික්ඛුනා=කැමැති මහණහු විසින්; පටිග්ගහෙතබ්බානි=පිළිගත යුත්තාහ, පටිග්ගහෙත්වා=පිළිගෙන; අසන්තෙ හාරකෙ=අත් ගත්වා ගෙන යන්නකු නැති කල්හි; තියොජනපරමං=තෙ යොදනක් තැන්; සහත්ථා හරිතබ්බානි=සියතින් ගෙන යා යුත්තාහ; තතො උත්තරිං=ඒ තෙ යොත්නෙන් මතු; හාරකෙ අසන්තෙ'පි=හාරකයකු නැති කල්හි ද; හරෙය්‍ය චෙ=තෙමේ ගෙන ගේ නම්;

7 යො පන භික්ඛු; අඤ්ඤාතිකාය භික්ඛුනියා=නො නෑ මෙහෙණක ලවා; එළකලොමානි=එළු ලොම්, ධොවාපෙය්‍ය වා=සෝදවා නම් හෝ; රජාපෙය්‍ය වා=රඳන් කරවා නම් හෝ; විජටාපෙය්‍ය වා පීරවා නම් හෝ;



8 යො පන භික්ඛු ජාතරූපරජතං උග්ගණ්හෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා උපනික්ඛිත්තං වා සාදියෙය්‍ය, **නිස්සග්ගියං පාචිත්තියං.** (18)

9 යො පන භික්ඛු නානප්පකාරකං රූපියසංවොහාරං සමාපජ්ජෙය්‍ය, **නිස්සග්ගියං පාචිත්තියං.**

10 යො පන භික්ඛු නානප්පකාරකං කයවික්කයං සමාපජ්ජෙය්‍ය, **නිස්සග්ගියං පාචිත්තියං.**

**එළකලොමවග්ගො දුතියො.**

1 දසාහපරමං අතිරෙකපත්තො ධාරේතබ්බො, තං අතික්කාමයතො **නිස්සග්ගියං පාචිත්තියං.** (21)

2 යො පන භික්ඛු ඌනපඤ්චබන්ධනෙන පත්තෙන අඤ්ඤං නවං පත්තං චෙතාපෙය්‍ය, **නිස්සග්ගියං පාචිත්තියං.** තෙන භික්ඛුනා, සො පත්තො භික්ඛුපරිසාය නිස්සජ්ජිතබ්බො, යො ච තස්සා භික්ඛුපරිසාය පත්තපරියන්තො, සො තස්ස භික්ඛුනො පදාතබ්බො 'අයං තෙ භික්ඛු පත්තො යාව භෙදනාය ධාරෙතබ්බො'ති, අයං තත්ථ සාමීචි. (22)

---

8 යො පන භික්ඛු; ජාතරූපරජතං=රන් රිදී මසු කහවණු; උග්ගණ්හෙය්‍ය වා= තමා පිණිස තෙමේ ම පිළිගනී නම් හෝ; උග්ගණ්හාපෙය්‍ය වා=තමා පිණිස අනුන් ලවා ගත්වා නම් හෝ; උපනික්ඛිත්තං=තමා පිණිස තබන ලද්දක්; සාදියෙය්‍ය වා=මුවින් නොබැණ ඉවසා නම් හෝ;

9 යො පන භික්ඛු; නානප්පකාරකං=කත- අකත විසින් අනෙකප්‍රකාර වූ; රූපියසංවොහාරං=රන් රිදී මසු කහවණු පෙරළි කිරීමට; සමාපජ්ජෙය්‍ය=පැමිණේ නම්;

10 යො පන භික්ඛු නානප්පකාරකං=චීවරාදි විසින් අනෙකප්‍රකාර වූ; කයවික්කයං=කැප බඩු ගනුදෙනුවට; සමාපජ්ජෙය්‍ය=පැමිණේ නම්; නිස්සග්ගියං පාචිත්තියං=නිසගි පචිති වේ.

**එළකලොම වර්ගයයි.** 2.

1 දසාහපරමං=දස දිනක් පරම කල්; අතිරෙකපත්තො=නො ඉටූ නො විකැප්පූ හෙයින් වැඩි වූ පාත්‍රයෙක්; ධාරෙතබ්බො=දරිය යුත්තේය; තං අතික්කාමයතො=ඒ පාත්‍රය දසාහපරමකාලය ඉක්මවන්නහුට; නිස්සග්ගියං පාචිත්තියං=නිසගි පචිති වේ.

2 යො පන භික්ඛු; ඌනපඤ්චබන්ධනෙන=උනු පස්බාන් ප' ඇති ව; අඤ්ඤං නවං පත්තං චෙතාපෙය්‍ය=අන් නව පයක් ඉල්වා

3 යානි ඛො පන තානි ගිලානානං භික්ඛූනං පටිසායනීයානි භෙසජ්ජානි, සෙය්‍යථීදං, සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං, තානි පටිග්ගහෙත්වා සත්තාහපරමං සන්නිධිකාරකං පරිභුඤ්ජිතබ්බානි, තං අතික්කාමයතො **නිස්සග්ගියං පාචිත්තියං**. (23)

4 මාසො සෙසො ගිම්හානන්ති භික්ඛුනා වස්සිකසාටිකචීවරං පරියෙසිතබ්බං, අද්ධමාසො සෙසො ගිම්හානන්ති කත්වා නිවාසෙතබ්බං, ඕරෙන චෙ මාසො සෙසො ගිම්හානන්ති වස්සිකසාටිකචීවරං පරියෙසෙය්‍ය, ඕරෙනද්ධමාසො සෙසො ගිම්හානන්ති කත්වා නිවාසෙය්‍ය, **නිස්සග්ගියං පාචිත්තියං**. (24)

---

ගනී නම්; නිස්සග්ගියං පාචිත්තියං=නිසගි පචිති වේ; තෙන භික්ඛුනා=ඒ මහණහු විසින්; සො පත්තො=ඒ විනවා ගත් පය; භික්ඛුපරිසාය=සඟ මැද; නිස්සජ්ජිතබ්බො=නිසජිය යුත්තේය; තස්සා භික්ඛුපරිසාය=ඒ මහණ පිරිස්හි; යො ච පත්තපරියන්තො=හැම දෙනහට ගන්වා කෙළවර ලද යම් පයෙක් වේ ද; සො=ඒ පය; තස්ස භික්ඛුනො=ඒ මහණහට; භික්ඛු=මහණ; තෙ=තා විසින්; අයං පත්තො=මේ පය; යාව භෙදනාය=බිඳීම දක්වා; ධාරෙතබ්බො ඉති=දැරිය යුතු යයි කියා; පදාතබ්බො=දිය යුත්තේය; අයං තත්ථ සාමීචි=මේ එහි වතයි;

3 ගිලානානං භික්ඛූනං=ගිලන් මහණුන් විසින්; පටිසායනීයානි=වැළඳිය යුතු වූ; යානි ඛො පන තානි භෙසජ්ජානි=යම් ඒ භෛෂජ්‍ය කෙනෙක් ඇත් ද; සෙය්‍යථීදං=ඔහු කවරහු ද යත්; සප්පි=ගිතෙල්ය; නවනීතං=වෙඬරුය; තෙලං තලතෙල් ඈ තෙල්ය; මධු=මීය; ඵාණිතං=උක්පැණි උක්සකුරුය යන මොහුයි; තානි පටිග්ගහෙත්වා=ඒ බෙහෙත් පිළිගෙන; සත්තාහපරමං=සත්දිනක් පරම කොට ඇති කාලයක්; සන්නිධිකාරකං (කත්වා)=සන්නිධි කොට තබා (-තමා භාරයේ තබා ගෙන); පරිභුඤ්ජිතබ්බානි=වැළඳිය යුත්තාහ; තං අතික්කාමයතො=ඒ සත්තාහපරම කාලය ඉක්මවන්නාහට; නිස්සග්ගියං පාචිත්තියං.

4 ගිම්හානං=ගිමන් සාරමස් අතුරින්; මාසො=අවසාන මාසය; සෙසො ඉති=ඉතිරිව ඇතැයි සලකා; භික්ඛුනා=මහණහු විසින්; වස්සිකසාටිකචීවරං=වැසි කල දැරිය යුතු සිවුර; පරියෙසිතබ්බං=නෑ පැවරුවන්ගෙන් සෙවිය යුතු ය; ගිම්හානං=ගිමන් මස් අතුරින්; අද්ධමාසො සෙසො ඉති=අඩමසක් ඉතිරි ව ඇතැයි සලකා; කත්වා=ගෙත්තම් ඈ කොට; නිවාසෙතබ්බං=හැන්ද යුතු; ගිම්හානං=ගිමන් මස් පිළිබඳ; මාසො සෙසො ඉති=මසක් ශෙෂයයි සලකා; ඕරෙන=



5 යො පන භික්ඛු භික්ඛුස්ස සාමං චීවරං දත්වා පච්ඡා කුපිතො[1] අනත්තමනො අච්ඡින්දෙය්‍ය වා අච්ඡින්දාපෙය්‍ය වා **නිස්සග්ගියං පාචිත්තියං** (25)

6 යො පන භික්ඛු සාමං සුත්තං විඤ්ඤාපෙත්වා තන්තවායෙහි චීවරං වායාපෙය්‍ය, **නිස්සග්ගියං පාචිත්තියං**. (26)

7 භික්ඛුං පනෙ'ව උද්දිස්ස අඤ්ඤාතකො ගහපති වා ගහපතානී වා තන්තවායෙහි චීවරං වායාපෙය්‍ය, තත්‍ර චෙ සො භික්ඛු පුබ්බෙ අප්පවාරිතො තන්තවායෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය "ඉදං ඛො ආවුසො චීවරං මං උද්දිස්ස වීයති ආයතඤ්ච කරොථ, විත්ථතඤ්ච අප්පිතඤ්ච සුවීතඤ්ච සුප්පවායිතඤ්ච සුවිලෙඛිතඤ්ච සුවිතච්ඡිතඤ්ච කරොථ, අප්පෙව නාම මයම්පි ආයස්මන්තානං කිඤ්චිමත්තං අනුපදජ්ජෙය්‍යාමා'ති, එවඤ්ච සො භික්ඛු වත්වා කිඤ්චිමත්තං අනුපදජ්ජෙය්‍ය අන්තමසො පිණ්ඩපාතමත්තම්පි, **නිස්සග්ගියං පාචිත්තියං**. (27)

---

එයින් මෑත හෙවත් පශ්චිම මාසයට පෙර; වස්සිකසාටිකචීවරං පරියෙසෙය්‍ය=වැසි සළු සිවුරක් ඉල්වා ගනී නම්; ගිම්හානං=ගිමන් මස් පිළිබඳ; අද්ධමාසො සෙසො ඉති=අඩමසක් ඉතිරි ව ඇතැයි සලකා; ඕරෙන=ඉන් මෑත හෙවත්-අඩමසට පෙර; කත්වා නිවාසෙය්‍ය=කොට හඳී නම්;

5 යො පන භික්ඛු; භික්ඛුස්ස=මහණකුට; සාමං=තෙමේ; චීවරං දත්වා=සිවුරක් දී; පච්ඡා=පසුව; කුපිතො=කිපියේ; අනත්තමනො=නො සතුටු සිත් ඇත්තේ; අච්ඡින්දෙය්‍ය වා= (සකසඤ්ඤයෙන්) පැහැර ගනී නම් හෝ; අච්ඡින්දාපෙය්‍ය වා=පැහැර ගත්වා නම් හෝ;

6 යො පන භික්ඛු; සාමං=තෙමේ; සුත්තං විඤ්ඤාපෙත්වා=නූල් ඉල්වා ලබා ගෙන; තන්තවායෙහි=නො නෑ නො පැවරූ පෙහෙරන් ලවා; චීවරං වායාපෙය්‍ය=වස්ත්‍රයක් වියවා නම්;

7 භික්ඛුං පනෙ'ව උද්දිස්ස=මහණක්හු ම උදෙසා; අඤ්ඤාතකො ගහපති වා=නො නෑ ගැහැවියෙක් හෝ; ගහපතානී වා=මාගමක් හෝ; තන්තවායෙහි=පෙහෙරන් ලවා; චීවරං වායාපෙය්‍ය=පිළියක් වියවා නම්; සො භික්ඛු=ඒ මහණ තෙම; පුබ්බෙ අප්පවාරිතො=වස්ත්‍රහිමියා විසින් ප්‍රථමයෙන් නොපවරන ලද්දේ; තත්‍ර=ඒ පෙහෙරන් කරා; උපසඞ්කමිත්වා=එළඹ; ආවුසො=ඇවැත්නි; ඉදං චීවරං=මේ පිළිය; මං උද්දිස්ස වීයති=මා උදෙසා වියනු ලැබේ; ආයතඤ්ච කරොථ=දික් වූවක් ද කරවු; විත්ථතං ච=පුළුල ඇත්තක් ද කරවු;

---

1 'දත්වා කුපිතො' (මරම්ම)

8 දසාහානාගතං කත්තිකතෙමාසි[1] පුණ්ණමං භික්ඛුනො පනෙ'ව අච්චෙකචීවරං උප්පජ්ජෙය්‍ය, අච්චෙකං මඤ්ඤමානෙන භික්ඛුනා පටිග්ගහෙතබ්බං, පටිග්ගහෙත්වා යාවචීවරකාලසමයං නික්ඛිපිතබ්බං, තතො චෙ උත්තරිං නික්ඛිපෙය්‍ය **නිස්සග්ගියං පාචිත්තියං**. (28)

9 උපවස්සං ඛො පන කත්තිකපුණ්ණමං යානි ඛො පන තානි ආරඤ්ඤකානි සෙනාසනානි සාසඞ්කසම්මතානි සප්පටිභයානි, තථාරූපෙසු භික්ඛු සෙනාසනෙසු විහරන්තො ආකඞ්ඛමානො තිණ්ණං චීවරානං අඤ්ඤතරං චීවරං අන්තරඝරෙ නික්ඛිපෙය්‍ය, සියා ච තස්ස භික්ඛුනො කොචිදෙ'ව පච්චයො තෙන චීවරෙන විප්පවාසාය,

---

අප්පිතං ච=ඝන ඇත්තක් ද කරවූ; සුචිතං ච=හැම තැන සම කොට වියන ලද්දක් ද කරවූ; සුප්පවායිතං ච=මනා ව නූල් එළන ලද්දක් ද කරවූ; සුවිලෙඛිතං ච=මනාව ගහන ලද්දක් ද කරවූ; සුවිතච්ඡිතං ච=කොස්සෙන් මනා ව මදින ලද්දක් ද; කරොථ=කරවූ; මයංපි=අපි දු; ආයස්මන්තානං=ආයුෂ්මතුනට; චෙ=ඉදින්; කිඤ්චිමත්තං=කිසිවක්; අපෙපවනාම අනුපදජ්ජෙය්‍යාම ඉති=පසුව දෙන්නමෝ නම් යෙහෙකැයි; චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය=චීවරයෙහි අධික විධානයට පැමිණේ නම්; එවං ච වත්වා=මෙ සේ ද කියා; සො භික්ඛු=ඒ මහණ; කිඤ්චිමත්තං=කිසිවක්; අන්තමසො=යටත් පිරිසෙයින්; පිණ්ඩපාතමත්තංපි=ආහාරමාත්‍රයකුදු; අනුපදජ්ජෙය්‍ය=දේ නම්;

8 දසාහානාගතං=දසදිනෙකින් නොපැමිණෙ ලද; කත්තිකතෙමාසිපුණ්ණමං=වප් මැදි පොහොයෙන් උපලක්ෂිත කාලය මුළුල්ලෙහි; "(චීවර මාසය ලබන්නට පෙර දස දින ඇතුළත)" භික්ඛුනො පනෙ'ව=භික්ෂුවක්හට; අච්චෙකචීවරං උප්පජ්ජෙය්‍ය=අච්චෙකචීවරයක් (වස්සාවාසික වසයෙන්) උපදී නම්; අච්චෙකං මඤ්ඤමානෙන භික්ඛුනා=ඉක්මන් සිවුරෙකැයි දන්නා මහණහු විසින්; පටිග්ගහෙතබ්බං=පිළිගත යුතුයි; පටිග්ගහෙත්වා=පිළිගෙන; යාවචීවරකාලසමයං=චීවරකාලය තෙක්; නික්ඛිපිතබ්බං=නො ඉටා නො විකපා තැබිය යුතුයි; තතො උත්තරිං=ඒ චීවරකාලයෙන් මත්තෙහි; නික්ඛිපෙය්‍ය චෙ=නො ඉටා නො විකපා තබා නම්;

9 ආරඤ්ඤකානි=අරනෙහි වූ; සාසඞ්කසම්මතානි=සොර බිය නිසා සැක සහිතයයි දන්නාලද; සප්පටිභයානි=බිය සහිත වූ; යානි ඛො පන තානි සෙනාසනානි=යම් ඒ සෙනසුන් කෙනෙක් ඇත් ද; උපවස්ස ඛො පන=පෙර වස් වැස නිමවා; තථාරූපෙසු සෙනාස-

---

1 තෙමාසික [මරම්ම]



ඡාරත්තපරමං තෙන භික්ඛුනා තෙන චීවරෙන විප්පවසිතබ්බං, තතො චෙ උත්තරිං විප්පවසෙය්‍ය අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා, **නිස්සග්ගියං පාචිත්තියං**. (29)

10 යො පන භික්ඛු ජානං සඞ්ඝිකං ලාභං **පරිණතං** අත්තනො පරිණාමෙය්‍ය, **නිස්සග්ගියං පාචිත්තියං**. (39)

**පත්තවග්ගො තතියො.**

උද්දිට්ඨා ඛො ආයස්මන්තො තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා, තත්‍ථා'යස්මන්තෙ පුච්ඡාමි කච්චි'ත්‍ථ පරිසුද්ධා, දුතියම්පි පුච්ඡාමි කච්චි'ත්‍ථ පරිසුද්ධා, තතියම්පි පුච්ඡාමි කච්චි'ත්‍ථ පරිසුද්ධා, පරිසුද්ධෙ'ත්‍ථා'යස්මන්තො, තස්මා තුණ්හී, එවමෙ'තං ධාරයාමීති.

**නිස්සග්ගියා පාචිත්තියා නිට්ඨිතා.**

——:o:——

---

නෙසු විහරන්තො=එබඳු සෙනසුන්හි වසන; ආකඞ්ඛමානො=සොර බිය නිසා ගමෙහි සිවුරක් තබන්නට රිසියෙන; භික්ඛු=මහණතෙම; තිණ්ණං චීවරානං=තෙසිවුරු අතුරින්; අඤ්ඤතරං චීවරං=එක්තරා සිවුරක්; කත්තික පුණ්ණමං=ඉල් මැදි පෝ තෙක් මසක් මුළුල්ලෙහි; අන්තරඝරෙ නික්ඛිපෙය්‍ය=හාත්පස ගොදුරු ගමෙක්හි තබන්නේය; තස්ස භික්ඛුනො=ඒ මහණහට; තෙන චීවරෙන විප්පවාසාය=ගමෙහි තුබූ ඒ සිවුරින් වියෝව වසනු පිණිස; කොචිදෙ'ව පච්චයො සියා=කිසි කාරණයෙක් වන්නේ නම්; තෙන භික්ඛුනා=ඒ මහණහු විසින්; ඡාරත්තපරමං=සරුයක් පමණ කාලයක්; තෙන චීවරෙන විප්පවසිතබ්බං=ඒ සිවුරෙන් වෙන්ව විසිය යුතුය; අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා=සඞ්ඝ සම්මුතිය නැතිව; තතො උත්තරිං=ඒසරුයෙන් මතු; විප්පවසෙය්‍ය චෙ=සෙනස්නෙන් වෙන්ව වෙසේ නම්;

10 යො පන භික්ඛු; පරිණතං=දෙම්හයි කයින් වදනින් පිරිනමන ලද; සඞ්ඝිකං=එහෙයින් සඞ්ඝයාට අයත් වූ; ලාභං=චීවරාදි ලාභයක්; ජානං=දන්නේ (-දැන දැන); අත්තනො පරිණාමෙය්‍ය=තමහට නතු කෙරේ නම්; නිස්සග්ගියං පාචිත්තියං.

**පත්ත වග්ගයයි. 3.**

**නිසග් පචිති ඇවැත්හු සමාප්තයහ.**

——:o:——

a **ඉමෙ ඛො පනායස්මන්තො ද්වෙ නවුති පාචිත්තියා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.**

1. සම්පජාන මුසාවාදෙ **පාචිත්තියං**.

2. ඔමසවාදෙ **පාචිත්තියං.**

3. භික්ඛුපෙසුඤ්ඤෙ **පාචිත්තියං**.

4. යො පන භික්ඛු අනුපසම්පන්නං පදසො ධම්මං වාචෙය්‍ය, **පාචිත්තියං**.

5. යො පන භික්ඛු අනුපසම්පන්නෙන උත්තරිං දිරත්ත තිරත්තං සහසෙය්‍යං කප්පෙය්‍ය, **පාචිත්තියං**.

6. යො පන භික්ඛු මාතුගාමෙන සහ සෙය්‍යං කප්පෙය්‍ය **පාචිත්තියං**.

---

a ආයස්මන්තො=ආයුෂ්මතුනි; ඉමෙ ඛො ද්වෙ නවුති පාචිත්තියා ධම්මා=මේ දෙයානූ පචිති ඇවැත්හු; උද්දෙසං ආගච්ඡන්ති=උදෙසීමට පැමිණෙත්.

1 සම්පජානමුසාවාදෙ= දැන දැන මුසාකීම නිමිතිකොට; පාචිත්තියං=මහණහට පචිති ඇවැත් වේ.

2 ඔමසවාදෙ=උපසපනකුට ජාත්‍යාදීන් සටා බිණීම නිමිති කොට;

3 භික්ඛුපෙසුඤ්ඤෙ=භික්ෂූනට ඔවුනොවුන් බිඳුවන කේලාම් කීම නිමිති කොට;

4 යො පන භික්ඛු; අනුපසම්පන්නං=අනුපසපනකුට; පදසො=පදාදි වශයෙන්; ධම්මං=පෙළ දහම්; වාචෙය්‍ය=එක්ව කීම වශයෙන් හදාරවානම්;

5 අනුපසම්පන්නෙන=අනුපසපනකු හා; උත්තරිං දිරත්ත තිරත්තං=දෙ තුන් රැයෙකින් මත්තෙහි; සහසෙය්‍යං කප්පෙය්‍ය=එකවජ්ජනාදි ගෙයෙකැ හොවී නම්;

6 මාතුගාමෙන=මිනිස් මාගමක හා; සහසෙය්‍යං කප්පෙය්‍ය=එක් සෙනස්නෙක හොවී නම්;



7 යො පන භික්ඛු මාතුගාමස්ස උත්තරිං ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙය්‍ය අඤ්ඤත්‍ර විඤ්ඤුනා පුරිසවිග්ගහෙන **පාචිත්තියං**.

8 යො පන භික්ඛු අනුපසම්පන්නස්ස උත්තරිමනුස්සධම්මං ආරොචෙය්‍ය, භූතස්මිං **පාචිත්තියං**.

9 යො පන භික්ඛු භික්ඛුස්ස දුට්ඨුල්ලං ආපත්තිං අනුපසම්පන්නස්ස ආරොචෙය්‍ය අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා, **පාචිත්තියං**.

10 යො පන භික්ඛු පඨවිං ඛණෙය්‍ය වා ඛණාපෙය්‍ය වා **පාචිත්තියං**.

**මුසාවාද වග්ගො පඨමො.**

---

7 මාතුගාමස්ස = මාගමකට; විඤ්ඤුනා පුරිසවිග්ගහෙන= ශ්‍රවණොපචාරයෙහි නුවණැති මිනිසකු; අඤ්ඤත්‍ර=හැර; උත්තරිං ඡප්පඤ්ච වාචාහි=ස පස් පෙදෙකින් අධික වචනයෙන්; ධම්මං දෙසෙය්‍ය=පෙළ දහම් කියා නම්;

8 අනුපසම්පන්නස්ස= අනුපසපනකුට; උත්තරිමනුස්සධම්මං= උතුරු මිනිස් දම්; ආරොචෙය්‍ය=කියා නම්; භූතස්මිං=සිය සතන්හි එදම් ඇති කල්හි;

9 භික්ඛුස්ස=මහණක්හුගේ; දුට්ඨුල්ලං ආපත්තිං=සඟවෙසෙස් ඇවැතක්; භික්ඛු සම්මුතියා අඤ්ඤත්‍ර=අපලොකනයෙන් සම්මත කිරීමක් නැතිව; අනුපසම්පන්නස්ස ආරොචෙය්‍ය=අනුපසපනකුට වස්තුව හා සටා කියා නම්;

10 යො පන භික්ඛු=යම් මහණෙක්; පඨවිං=අකැප පොළොව; ඛණෙය්‍ය වා=තෙමේ කණීනම් හෝ; ඛණාපෙය්‍ය වා=අනුන් ලවා කණවා නම් හෝ; පාචිත්තියං=පචිති වේ.

**1. මුසාවාද වර්ගයයි.**

1 භූතගාමපාතබ්‍යතාය **පාචිත්තියං**. (11)

2 අඤ්ඤවාදකෙ විහෙසකෙ **පාචිත්තියං**. (12)

5 උජ්ඣාපනකෙ ඛීයනකෙ **පාචිත්තියං**. (13)

4 යො පන භික්ඛු සඞ්ඝිකං මඤ්චං වා පීඨං වා භිසිං වා කොච්ඡං වා අජ්ඣොකාසෙ සන්ථරිත්වා සන්ථරාපෙත්වා වා තං පක්කමන්තො නෙ'ව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය, අනාපුච්ඡං[1] වා ගච්ඡෙය්‍ය, **පාචිත්තියං**. (14)

5 යො පන භික්ඛු සඞ්ඝිකෙ විහාරෙ සෙය්‍යං සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා තං පක්කමන්තො නෙ'ව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය, අනාපුච්ඡං[1] වා ගච්ඡෙය්‍ය, **පාචිත්තියං**. (15)

---

1 භූතගාමපාතබ්‍යතාය=තෘණ වෘක්ෂ ලතාදීන්ගේ ඡේදනාදිය නිමිති කොට; පාචිත්තියං=පචිති ඇවැත් වේ;

2 අඤ්ඤවාදකෙ=පුළුවුත් දූය තබා අනෙකක් කීමෙහි ද (පචිති වේ); විහෙසකෙ=නිහඬ ව සිට සඞ්ඝයාට වෙහෙස දීමෙහි ද පචිති වේ.

3 උජ්ඣාපනකෙ=(සම්මුති ලද මහණහු ගැන) ලාමක කොට සිතවන සේ බිණීමෙහි ද (පචිති වේ) ඛීයනකෙ=ඔවුනොවුන් දෙස් පතළ කිරීමෙහි ද පචිති වේ.

4 යො පන භික්ඛු; සඞ්ඝිකං=සඟසතු; මඤ්චං වා=හැඳක් හෝ; පීඨං වා=පුටුවක් හෝ; භිසිං වා=මෙට්ටයක් හෝ; කොච්ඡං වා=උසීරාදියෙන් කළ හිඳිනා අස්නක් හෝ; අජ්ඣොකාසෙ-සෙවෙනි නැති තැනෙක්හි; සන්ථරිත්වා වා=තෙමේ අතුරා හෝ; සන්ථරාපෙත්වා වා=අනුපසපනකු ලවා අතුරවා හෝ; පක්කමන්තො=අන් දිගකට යන්නේ; තං=ඒ සෙනසුන; නෙ'ව උද්ධරෙය්‍ය=සුදුසු තැනෙක නො තබා නම්; න උද්ධරාපෙය්‍ය=අනුන් ලවා හෝ නො තබවා නම්; අනාපුච්ඡං වා=නො පිළිවිස (භාර නො දී) හෝ; ගච්ඡෙය්‍ය=යේ නම්; පචිති වේ.

5 යො පන භික්ඛු, සඞ්ඝිකෙ විහාරෙ=සඟසතු වෙහෙර තුළ; සෙය්‍යං=භිසි ආදි සඟසතු ශය්‍යාවක්; සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා=අතුරා හෝ අතුරුවා හෝ; පක්කමන්තො තං නෙ'ව උද්ධරෙය්‍ය න උද්ධරාපෙය්‍ය=වෙහෙරින් බැහැර තැනකට යන්නේ එය වේයන් විසින් නො කෑ හැකි සේ අකුළා නො තබා නම් හෝ නො තබවා නම් හෝ; අනාපුච්ඡං වා ගච්ඡෙය්‍ය=නො පිළිවිස හෝ යේ නම්;

1 අනාපුච්ඡං [මරම්ම]



6 යො පන භික්ඛු සඞ්ඝිකෙ විහාරෙ ජානං පුබ්බුපගතං භික්ඛුං අනුපඛජ්ජ සෙය්‍යං කප්පෙය්‍ය "යස්ස සම්බාධො භවිස්සති, සො පක්කමිස්සතී"ති, එතදෙ'ව පච්චයං කරිත්වා අනඤ්ඤං, **පාචිත්තියං**. (16)

7 යො පන භික්ඛු භික්ඛුං කුපිතො අනත්තමනො සඞ්ඝිකා විහාරා නික්කඩ්ඪෙය්‍ය වා නික්කඩ්ඪාපෙය්‍ය වා **පාචිත්තියං**. (17)

8 යො පන භික්ඛු සඞ්ඝිකෙ විහාරෙ උපරි වෙහාසකුටියා ආහච්චපාදකං මඤ්චං වා පීඨං වා අභිනිසීදෙය්‍ය[1] වා අභිනිපජ්ජෙය්‍ය වා, **පාචිත්තියං**. (18)

9 මහල්ලකං පන භික්ඛුනා විහාරං කාරයමානෙන යාව ද්වාරකොසා අග්ගළට්ඨපනාය ආලොකසන්ධිපරිකම්මාය ද්වත්තිච්ඡදනස්ස පරියායං අප්පහරිතෙ ඨිතෙන අධිට්ඨාතබ්බං. තතො චෙ උත්තරිං අප්පහරිතෙ'පි ඨිතො අධිට්ඨහෙය්‍ය, **පාචිත්තියං** (19)

---

6 යො පන භික්ඛු; සඞ්ඝිකෙ විහාරෙ=සඟසතු වෙහෙරෙහි; පුබ්බුපගතං භික්ඛුං=පළමු ව වෙසෙමින් සිටි මහණහු; ජානං=නො නැඟිට විය යුත්තෙකැයි දන්නේ; අනුපඛජ්ජ=පීඩා පිණිස මඤ්චාදීන් ගේ සමීපයට එළඹ; යස්ස සම්බාධො භවිස්සති=යමකුට ගැහැට වන්නේ ද; සො පක්කමිස්සතීති=හෙතෙම අන්තෙනකට යේවයි; එතදෙ'ව පච්චයං කරිත්වා=මෙයම කාරණ කොට; අනඤ්ඤං=අනෙකක් කාරණ නොකොට; සෙය්‍යං කප්පෙය්‍ය=ශයනය කෙරේ නම්;

7 යො පන භික්ඛු; කුපිතො=කිපියේ; අනත්තමනො=නො සතුටු සිත් ඇත්තේ; භික්ඛුං=මහණකු; සඞ්ඝිකා විහාරා=සඟසතු වෙහෙරින්; නික්කඩ්ඪෙය්‍ය වා=ඇද දමා නම් හෝ; නික්කඩ්ඪාපෙය්‍ය වා=ඇද දමවා නම් හෝ;

8 යො පන භික්ඛු; වෙහාසකුටියා=අහස් කිළියෙක; උපරි=තලාද මත තැබූ; ආහච්චපාදකං=වල්හි හිස විද පාසිළු ගැන් වූ; මඤ්චං වා=හැඳෙක හෝ; පීඨං වා=පුටුවෙක හෝ; අභිනිසීදෙය්‍ය වා=කය වතුරුවා හිඳී නම් හෝ; අභිනිපජ්ජෙය්‍ය වා=හොවී නම් හෝ;

9 මහල්ලකං පන විහාරං=සස්වාමික බැවින් මහල්ලක නම් වූ විහාරයක්; කාරයමානෙන භික්ඛුනා=කරන කරවන මහණහු විසින්; යාව ද්වාරකොසා=ද්වාරකොෂය හෙවත්-උළුවස්ස හාත්පස දෙරියන් වියත් පමණ පෙදෙස යම්තාක් ද ඒ තාක්; අග්ගළට්ඨපනාය=කවාට සහිත දොරබාව නිසල වනු පිණිස; (පුනප්පුනං ලිම්පිතබ්බො

1 "සහසා අභිනිසීදෙය්‍ය"කත්ථචි.

10 යො පන භික්ඛු ජානං සප්පාණකං උදකං තිණං වා මත්තිකං වා සිඤ්චෙය්‍ය වා සිඤ්චාපෙය්‍ය වා, **පාචිත්තියං**. (20)

### භූතගාමවග්ගො දුතියො.

1 යො පන භික්ඛු අසම්මතො භික්ඛුනියො ඔවදෙය්‍ය **පාචිත්තියං**. (21)

2 සම්මතො'පි චෙ භික්ඛු අත්ථඞ්ගතෙ සූරියෙ භික්ඛුනියො ඔවදෙය්‍ය, **පාචිත්තියං**. (22)

3 යො පන භික්ඛු භික්ඛුනූපස්සයං උපසඞ්කමිත්වා භික්ඛුනියො ඔවදෙය්‍ය, අඤ්ඤත්‍ර සමයා **පාචිත්තියං**; තත්ථායං සමයො, ගිලානා හොති භික්ඛුනී, අයං තත්ථ සමයො. (23)

---

වා ලිම්පාපෙතබ්බා වා=නැවත නැවත තමා හෝ ලිම්පනය කට යුතු අනුන් ලවා හෝ ලිම්පාපනය කටයුතු) අලොකසන්ධිපරිකම්මාය =වාතපාන කවාටයන් ගේ පිරියම් පිණිස (ඒ කවුළු පොහොරු පළල පමණ පෙදෙස); නැවත නැවත ලිම්පනය කටයුතුය; ඡදනස්ස=ඡදනයාගේ; ද්වත්තිපරියායං=දෙ-තුන් සෙවෙනියක්; අප්පහරිතෙ ඨිතෙන=ධාන්‍ය නො වපුළ තැන (-ගෙමිදුලෙහි) සිටියහු විසින්; අධිට්ඨාතබ්බං=විධාන කටයුතුය; තතො උත්තරිං= දෙ-තුන් මහෙකින් දෙ-තුන් පරික්ෂෙපයෙකින් මත්තෙහි; අප්පහරිතෙ ඨිතො'පි=ධාන්‍ය නොවපුළ තැන සිටියේ ද; අධිට්ඨ-හෙය්‍ය=විධාන කෙරේ නම්;

10 යො පන භික්ඛු; උදකං=මේ දිය; සප්පාණකං=ප්‍රාණීන් සහිතයයි; ජානං=දන්නේ; තිණං වා මත්තිකං වා=තණ හෝ මැටි හෝ; සිඤ්චෙය්‍ය වා=එදියෙන් තෙමා නම් හෝ; සිඤ්චාපෙය්‍ය වා= තෙමවා නම් හෝ; පාචිත්තියං;

### 2 භූතගාම වර්ගයයි.

1 යො පන භික්ඛු; අසම්මතො=සඞ්ඝයා විසින් අසම්මත වූයේ; භික්ඛුනියො=මෙහෙණියනට; ඔවදෙය්‍ය=අෂ්ටගුරුධර්ම පාලි පාඨ විසින් ඔවා දේ නම්;

2 සම්මතො'පි භික්ඛු=සම්මුති ලද මහණ ද; අත්ථඞ්ගතෙ සූරියෙ=හිරු අවරට ගිය කල්හි; භික්ඛුනියො ඔවදෙය්‍ය චෙ=ඉදින් මෙහෙණියනට අෂ්ටගුරුධර්මයෙන් හෝ අන් දහමෙකින් හෝ ඔවා දේ නම්;

3 යො පන භික්ඛු; අඤ්ඤත්‍ර සමයා=සුදුසු කාලය හැර; භික්ඛුනී උපස්සයං උපසඞ්කමිත්වා=මෙහෙණ අසපුවට එළඹ; භික්ඛු



4 යො පන භික්ඛු එවං වදෙය්‍ය ආමිසහෙතු භික්ඛූ[1] භික්ඛුනියො ඔවදන්තීති, **පාචිත්තියං**. (24)

5 යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං දදෙය්‍ය අඤ්ඤත්‍ර පාරිවට්ටකා, **පාචිත්තියං** (25)

6 යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා චීවරං සිබ්බෙය්‍ය වා සිබ්බාපෙය්‍ය වා **පාචිත්තියං**. (26)

7 යො පන භික්ඛු භික්ඛුනියා සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය අන්තමසො ගාමන්තරංපි අඤ්ඤත්‍ර සමයා, **පාචිත්තියං**; තත්ථා'යං සමයො, සත්ථගමනීයො හොති මග්ගො සාසඞ්කසම්මතො සප්පටිභයො, අයං තත්ථ සමයො. (27)

---

නියො ඔවදෙය්‍ය=මෙහෙණියනට ඔවා දේ නම්; පාචිත්තියං=පචිති වේ; තත්ථ=එහිලා; අයං සමයො=මේ සමයයි; භික්ඛුනී=මෙහෙණ; ගිලානා හොති=ගිලන් වේ ද; තත්ථ=එහි; අයං සමයො=මේ කාලයයි.

4 යො පන භික්ඛු; භික්ඛූ=භික්ෂූහු; ආමිසහෙතු=චීවරාදි ආමිසය නිමිති කොට; භික්ඛුනියො ඔවදන්තීති=මෙහෙණියනට ඔවා දෙත් යයි; වදෙය්‍ය=කියා නම්;

5 යො පන භික්ඛු; අඤ්ඤාතිකාය භික්ඛුනියා=නො නෑ මෙහෙණකට; පාරිවට්ටකා අඤ්ඤත්‍ර=මාරුකිරීමක් නැති ව; චීවරං දදෙය්‍ය=සිවුරක් දේ නම්;

6 යො පන භික්ඛු; අඤ්ඤාතිකාය භික්ඛුනියා=නො නෑ මෙහෙණක ගේ; චීවරං=සිවුරක්; සිබ්බෙය්‍ය වා=ගෙත්තම් කෙරේ නම් හෝ; සිබ්බාපෙය්‍ය වා=ගෙත්තම් කරවා නම් හෝ;

7 යො පන භික්ඛු; භික්ඛුනියා සද්ධිං=මෙහෙණක සමඟ; සංවිධාය=මන්ත්‍රණය කොට ගෙන; එකද්ධානමග්ගං=එකම අදන් මඟකට; අන්තමසො=යටත් පිරිසෙයින්; ගාමන්තරංපි=අන්ගමට නමුදු; සමයාඅඤ්ඤත්‍ර=යා යුතු කාලය හැර; පටිපජ්ජෙය්‍ය=පිළිපද නේ නම්; පාචිත්තියං=පචිති වේ; තත්ථ අයං සමයො; මග්ගො=මඟ; සත්ථගමනීයො හොති=සාර්ථයක් සමඟ යා යුතු වේ ද; සාසඞ්ක-සම්මතො=සාසඞ්කයයි දන්නා ලද්දේ වේ ද; සප්පටිභයො=භය සහිත වේ ද; තත්ථ=එහි; අයං සමයො=මේ සමයයි;

---

1 "ථෙරා භික්ඛූ" (මරම්ම)

8 යො පන භික්ඛු භික්ඛුනියා සද්ධිං සංවිධාය එකං නාවං අභිරුහෙය්‍ය උද්ධගාමිනිං වා අධොගාමිනිං වා අඤ්ඤත්‍ර තිරියං තරණාය, **පාචිත්තියං**. (28)

9 යො පන භික්ඛු ජානං භික්ඛුනීපරිපාචිතං පිණ්ඩපාතං භුඤ්ජෙය්‍ය අඤ්ඤත්‍ර පුබ්බෙ ගිහිසමාරම්භා, **පාචිත්තියං** (29)

10 යො පන භික්ඛු භික්ඛුනියා සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙය්‍ය' **පාචිත්තියං.** (30)

**ඔවාදවග්ගො තතියො.**

---

1 අගිලානෙන භික්ඛුනා එකො ආවසථපිණ්ඩො භුඤ්ජිතබ්බො, තතො චෙ උත්තරිං භුඤ්ජෙය්‍ය, **පාචිත්තියං**. (31)

---

8 යො පන භික්ඛු; තිරියං තරණාය අඤ්ඤත්‍ර=සරසින් එගොඩ වීම හැර; භික්ඛුනියා සද්ධිං සංවිධාය=මෙහෙණක හා බැණ ගෙන; උද්ධගාමිනිං වා=උඩුගඟට යන හෝ අධොගාමිනිං වා=යටි ගඟට යන හෝ; එකං නාවං අභිරුහෙය්‍ය=එක් නැවකට (-ඔරුවකට) නැඟ යේ නම්;

9 යො පන භික්ඛු; ජානං=(භික්ඛුනී පරිපාචිතයයි) දැන දැන; පුබ්බෙ= මෙහෙණිය විධාන කරන්නට පෙරම; ගිහිසමාරම්භා අඤ්ඤත්‍ර=ගිහියන් පිළියෙළ කරන ලද්ද හැර; භික්ඛුනී පරිපාචිතං= මෙහෙණිය විසින් නිපදවනලද; පිණ්ඩපාතං=පඤ්චභොජනයෙන් එක්තරාක්; භුඤ්ජෙය්‍ය=වළඳා නම්;

10 යො පන භික්ඛු; එකො=එකලා වූයේ; එකාය=එකලා වූ; භික්ඛුනියා සද්ධිං=මෙහෙණක සමඟ; රහො නිසජ්ජං කප්පෙය්‍ය= රහස් ව හිඳී නම්; පාචිත්තියං=පචිති වේ.

**3. ඔවාද වර්ගයයි.**

---

1 අගිලානෙන භික්ඛුනා=නොගිලන් මහණහු විසින්; එකො= එක් දිනකට තිසි වූ; ආවසථපිණ්ඩො=ආවසථයෙක්හි පැනවූ භොජනයෙක්; භුඤ්ජිතබ්බො=වැළඳිය යුත්තේය; තතො උත්තරිං= එයින් මත්තෙහි; චෙ භුඤ්ජෙය්‍ය=ඉදින් වළඳා නම්;



2 ගණභොජනෙ අඤ්ඤත්‍ර සමයා **පාචිත්තියං**; තත්‍ථා'යං සමයො, ගිලානසමයො චීවරදානසමයො චීවරකාරසමයො අද්ධානගමනසමයො නාවාභිරූහනසමයො මහාසමයො සමණභත්තසමයො, අයං තත්‍ථ සමයො. (32)

3 පරම්පරභොජනෙ අඤ්ඤත්‍ර සමයා **පාචිත්තියං**; තත්‍ථා'යං සමයො, ගිලානසමයො චීවරදානසමයො චීවරකාරසමයො, අයං තත්‍ථ සමයො. (33)

4 භික්ඛුං පනෙ'ව කුලං උපගතං පූවෙහි වා මන්‍ථෙහි වා අභිහට්ඨුං පවාරෙය්‍ය, ආකඞ්ඛමානෙන භික්ඛුනා ද්වත්තිපත්තපූරා පටිග්ගහෙතබ්බා, තතො චෙ උත්තරිං පටිග්ගණ්හෙය්‍ය; **පාචිත්තියං**; ද්වත්තිපත්තපූරෙ පටිග්ගහෙත්වා තතො නීහරිත්වා භික්ඛූහි සද්ධිං සංවිභජිතබ්බං, අයං තත්‍ථ සාමීචි. (34)

---

2 සමයා අඤ්ඤත්‍ර=සමය තබා; ගණභොජනෙ=ගණයා එක් ව පිළිගත් පඤ්චභොජනය නිමිති කොට; පාචිත්තියං=පචිති වේ; තත්‍ථ=ගණව පිළිගත්මෙහිලා; අයං=මේ මතු කියනු ලබන්නේ; සමයො=සත් වැදෑරුම් සුදුසු කාලයයි; ගිලාන සමයො=ගිලන් සමයය; චීවරකාරසමයො=සිවුරු ගෙත්තම් කරන සමයය; අද්ධානගමන සමයො=අදන්මඟට පිළිපත් සමයය; නාවාභිරූහන සමයො= නැව් නඟින සමයය; මහාසමයො=බොහෝ මහණුන් රැස් වන සමයය; සමණභත්තසමයො=පැවිදි ලැබුවකු බතින් පැවරූ සමයය; තත්‍ථ=එහිලා; අයං සමයො=මෙ කාලයයි.

3 පරම්පර භොජනෙ=නිමන්ත්‍රිතාහාරය තබා උපිළිවෙළින් අන් භොජනයක් වැළඳීම නිමිතිකොට; සමයා අඤ්ඤත්‍ර=සමය හැර; පාචිත්තියං=පචිති වේ;

4 කුලං උපගතං=කුලයට එළැඹි; භික්ඛුං පනෙ'ව= භික්ෂු-වක්හු, පූවෙහි වා=පූවලින් හෝ; මන්‍ථෙහි වා=මිත්‍ථයෙන් හෝ; අභිහට්ඨුං පවාරෙය්‍ය=වෙතට එළවා රිසියෙනතාක් ගන්නට පවරා නම්; ආකඞ්ඛමානෙන භික්ඛුනා=කැමැති වන මහණහු විසින්; ද්වත්තිපත්තපූරා=පිරූ දෙ-තුන් පා කෙනෙක්; පටිග්ගහෙතබ්බා= පිළිගත යුත්තාහ; චෙ=ඉදින්; තතො උත්තරිං=දෙතුන් පයෙකින් මත්තෙහි, පටිග්ගණ්හෙය්‍ය=පිළිගනී නම්; පාචිත්තියං=පචිති වේ; ද්වත්තිපත්තපූරෙ=පිරූ දෙතුන් පාත්‍රයන්; පටිග්ගහෙත්වා=පිළි ගෙන; තතො නීහරිත්වා=ලද තැනින් බැහැර ගෙන ගොස්; භික්ඛූහි සද්ධිං සංවිභජිතබ්බං=භික්ෂූන් සමඟ බෙදගත යුතුයි; තත්‍ථ=එහිලා; අයං සාමීචි=මේ වතයි;

5 යො පන භික්ඛු භුත්තාවී පවාරිතො අනතිරිත්තං ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා, **පාචිත්තියං**. (35)

6 යො පන භික්ඛු භික්ඛුං භුත්තාවිං පවාරිතං අනතිරිත්තෙන ඛාදනීයෙන වා භොජනීයෙන වා අභිහට්ඨුං පවාරෙය්‍ය 'හන්ද භික්ඛු ඛාද වා භුඤ්ජ වා' ති ජානං ආසාදනාපෙක්ඛො, භුත්තස්මිං **පාචිත්තියං**. (36)

7 යො පන භික්ඛු විකාලෙ ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා, **පාචිත්තියං**. (37)

8 යො පන භික්ඛු සන්නිධිකාරකං ඛාදනීයං වා භොජනීයං වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා, **පාචිත්තියං**. (38)

9 යානි ඛො පන තානි පණීතභොජනානි, සෙය්‍යථිදං? සප්පි නවනීතං තෙලං මධු ඵාණිතං මච්ඡො මංසං ඛීරං දධි; යො පන භික්ඛු එවරූපානි පණීත භොජනානි අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය' **පාචිත්තියං**. (39)

---

5 යො පන භික්ඛු; භුත්තාවී=වැළඳුයේ; පවාරිතො=පැවරියේ; අනතිරිත්තං=අයිරිත් නොකළ; ඛාදනීයං වා=යව්කැලි කන දෑයක් හෝ; භොජනීයං වා=බිදිය යුතු දෑයක් හෝ; ඛාදෙය්‍ය වා=කා නම් හෝ; භුඤ්ජෙය්‍ය වා=වළඳා නම් හෝ;

6 යො පන භික්ඛු; භුත්තාවිං=වැළඳූ; පවාරිතං=පැවරූ; භික්ඛුං=මහණෙක්හු; ජානං=පවාරිත බව දැන දැන; ආසාදනාපෙක්ඛො=චොදනා කැමැති වූයේ; භික්ඛු=මහණ; හන්ද=එසේ නම්; ඛාද වා=කවයි හෝ; භුඤ්ජ වා=වළඳවයි හෝ; අනතිරිත්තෙන=අයිරිත් නො කළ; ඛාදනීයෙන වා භොජනීයෙන වා=කන දෑයෙකින් හෝ බුදින දෑයෙකින් හෝ; අභිහට්ඨුං=එළවා; පවාරෙය්‍ය=පවරා නම්; භුත්තස්මිං=මහණ වැළඳූ කල්හි;

7 විකාලෙ=නොකල්හි; ඛාදනීයං වා=කෑ යුත්තක් හෝ; භොජනීයං වා=බිදිය යුත්තක් හෝ; ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා=කානම් හෝ වළඳා නම් හෝ;

8 සන්නිධිකාරකං=පිළිගෙන රැයක් ඉකුත් වූ;

9 යානි ඛො පන තානි පණීතභොජනානි=ප්‍රණීත සඞ්ඛ්‍යාත ගිතෙල් ආදියෙන් මිශ්‍ර යම් ඒ භොජන කෙනෙක් වෙත් ද, සෙය්‍යථිදං=ඔහු කවරහ යත්; සප්පි=ගිතෙල්ය; නවනීතං=වෙඬරුය; තෙලං=තල ඈ තෙල්ය; මධු=මීය; ඵාණිතං=උක් සකුරුය; මච්ඡො=දිය මස්ය; මංසං=ගොඩ මස් ය; ඛීරං=කිරිය; දධි=දීය යන මොහු නව



10 යො පන භික්ඛු අදින්නං මුඛද්වාරං ආහාරං ආහරෙය්‍ය අඤ්ඤත්‍ර උදකදන්තපොනා, **පාචිත්තියං**. (40)

**භොජනවග්ගො චතුත්ථො.**

---

1 යො පන භික්ඛු අචෙලකස්ස වා පරිබ්බාජකස්ස වා පරිබ්බාජිකාය වා සහත්ථා ඛාදනීයං වා භොජනීයං වා දදෙය්‍ය, **පාචිත්තියං**. (41)

2 යො පන භික්ඛු භික්ඛුං එවං වදෙය්‍ය[1] "එහාවුසො, ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසිස්සාමා"ති තස්ස දාපෙත්වා වා අදාපෙත්වා වා උය්‍යොජෙය්‍ය "ගච්ඡාවුසො, න මෙ තයා සද්ධිං කථා වා නිසජ්ජා වා ඵාසු හොති, එකකස්ස මෙ කථා වා නිසජ්ජා වා ඵාසු හොතී"ති එතදෙව පච්චයං කරිත්වා අනඤ්ඤං, **පාචිත්තියං**. (42)

---

දෙනයි; යො පන භික්ඛු=යම් මහණෙක්; එවරූපානි පණීත භොජනානි=මෙබඳු පිණී බොජුන්; අගිලානො=ගිලන් නුවූයේ; අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා=තමා පිණිස ඉල්වා ගෙන; භුඤ්ජෙය්‍ය=බුදී නම්;

10 අදින්නං=නො පිළිගන්වන ලද; ආහාරං=වැළඳිය යුතු යමක්; මුඛද්වාරං=ගලබිලයට; ආහරෙය්‍ය=එළවා නම්; උදකදන්තපොනා අඤ්ඤත්‍ර=දිය දැහැටි තබා; පාචිත්තියං=පචිති වේ.

**4 භොජන වගියයි.**

---

1 අචෙලකස්ස වා=නග්න නිගණ්ඨයකුට හෝ; පරිබ්බාජකස්ස වා=පිරිවැජියකුට හෝ; පරිබ්බාජිකාය වා=පිරිවැජියකට හෝ; සහත්ථා=සියතින්;

2 යො පන භික්ඛු; යම් මහණෙක්; භික්ඛුං=භික්ෂුවක් හට; ආවුසො=ඇවැත; එහි=තෝ මා හා එව, ගාමං වා නිගමං වා=ගමකට හෝ නිගමයකට හෝ; පිණ්ඩාය පවිසිස්සාම ඉති=පිඬු පිණිස යම්හයි; එවං වදෙය්‍ය=මෙසේ කියා ද; තස්ස=ඒ කැටිව ආ මහණහට; දාපෙත්වා වා=යම් කිසි ආමිසයක් දෙවා හෝ; අදාපෙත්වා වා=නො දෙවා හෝ; (මාගමක හා කෙළිරිසි ඇති වූයේ) ආවුසො=ඇවැත; තයා සද්ධිං=තා සමඟ; කථා වා=බිණීම හෝ; නිසජ්ජා වා=හිඳීම හෝ; ඵාසු න හොති=සුව නොවේ; එකකස්ස=එකලා වූ; මෙ=මට; කථා වා නිසජ්ජා වා ඵාසු හොති; ගච්ඡ ඉති=තෝ පළමුව යවයි;

---

1 "එවං වදෙය්‍ය" ඉති එකච්චෙසු පොත්ථකෙසු න හොති.

3 යො පන භික්ඛු සභොජනෙ කුලෙ අනුපඛජ්ජ නිසජ්ජං කප්පෙය්‍ය, **පාචිත්තියං**. (43)

4 යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං රහො පටිච්ඡන්නෙ ආසනෙ නිසජ්ජං කප්පෙය්‍ය, **පාචිත්තියං** (44)

5 යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙය්‍ය, **පාචිත්තියං**. (45)

6 යො පන භික්ඛු 'නිමන්තිතො සභත්තො සමානො සන්තං භික්ඛුං අනාපුච්ඡා පුරෙභත්තං වා පච්ඡාභත්තං වා කුලෙසු චාරිත්තං ආපජ්ජෙය්‍ය අඤ්ඤත්‍ර සමයා, **පාචිත්තියං**; 'තත්ථායං සමයො, චීවරදාන සමයො, චීවරකාර සමයො, අයං තත්ථ සමයො; (46)

---

එතදෙව පච්චයං කරිත්වා=මාගමක සමඟ හසනාදි අනාචාරයම කාරණ කොට; අනඤ්ඤං=අන් සුදුසු කරුණක් කාරණ නොකොට; උය්‍යොජෙය්‍ය=පිටත් කර යවා නම්;

3 සභොජනෙ=මෛථුනරාගයෙන් යුත් අඹුසැමියන් ඇති; කුලෙ=යහන් ගබෙක; අනුපඛජ්ජ=ඇතුළට වැද; නිසජ්ජං කප්පෙය්‍ය=හිඳී නම්;

4 මාතුගාමෙන සද්ධිං=මාගමක සමඟ; රහො=ඇසට නො පැනෙන; පටිච්ඡන්නෙ ආසනෙ=පිළිසන් අස්නෙක;

5 එකො=එකලා වූයේ; එකාය=එකලා වූ; මාතුගාමෙන සද්ධිං=සුබැසි දුබැසි දන්නා මාගමක සමඟ; රහො=ඇසට ද කනට ද රහස් වූ තන්හි; නිසජ්ජං කප්පෙය්‍ය=හිඳී නම්;

6 නිමන්තිතො=පස් බොජුන් අතුරින් එකෙකින් පවරන ලද්දේ; සභත්තො සමානො=එම බතින් ම බත් සහිත වූයේ; සන්තං භික්ඛුං=දෙලොස් රියන තුළ වූ මහණක්හු; අනාපුච්ඡා=නොවිචාරා; පුරෙභත්තං වා=නිමන්ත්‍රිතාහාරය වැළඳීමට පෙර හෝ; පච්ඡාභත්තං වා=වැළඳීමට පසුව හෝ (මධ්‍යාහ්නය තෙක් කාලය ඇතුළත); අඤ්ඤත්‍ර සමයා=සමය තබා; කුලෙසු=පැවරූ ගෙය තබා අන් ගෙවල; චාරිත්තං ආපජ්ජෙය්‍ය=හැසිරීමට යේ නම්; පාචිත්තියං; තත්ථ=ඒ අන් ගෙවලට යාමෙහි; අයං සමයො=මේ සමයසි; චීවරදාන සමයො=සිවුරු දෙන කාලය; චීවරකාරසමයො=සිවුරු කරන සමයය; තත්ථ අයං සමයො;



7 අගිලානෙන භික්ඛුනා චාතුමාස පච්චය පවාරණා සාදිතබ්බා අඤ්ඤත්‍ර පුන පවාරණාය අඤ්ඤත්‍ර නිච්චපවාරණාය, තතො චෙ උත්තරිං සාදියෙය්‍ය, **පාචිත්තියං**. (47)

8 යො පන භික්ඛු උය්‍යුත්තං සෙනං දස්සනාය ගච්ඡෙය්‍ය අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා, **පාචිත්තියං** (48)

9 සියා ච තස්ස භික්ඛුනො කොචිදෙ'ව පච්චයො සෙනං ගමනාය, දිරත්තතිරත්තං තෙන භික්ඛුනා සෙනාය වසිතබ්බං; තතො චෙ උත්තරිං වසෙය්‍ය, **පාචිත්තියං** (49)

10 දිරත්තතිරත්තං චෙ භික්ඛු සෙනාය වසමානො උය්‍යොධිකං වා බලග්ගං වා සෙනාබ්‍යූහං වා අණීකදස්සනං වා ගච්ඡෙය්‍ය **පාචිත්තියං**. (50)

**අචෙලකවග්ගො පඤ්චමො.**

---

7 අගිලානෙන භික්ඛුනා=නොගිලන් මහණහු විසින්: චතුමාස පච්චය පවාරණා=සාරමසකට ගිලන්පසයෙන් කරන පැවරීම; සාදිතබ්බා=(රොගයක් වූ විටෙක ගනිමියි.) ඉවසිය යුතුය; පුනපවාරණාය අඤ්ඤත්‍ර=නැවත සාරමසකට පැවරීම තබා; නිච්චපවාරණාය අඤ්ඤත්‍ර=යාවජීවයෙන් පැවරීම තබා; චෙ=ඉදින්; තතො උත්තරිං=පරිච්ඡින්න කාලයෙන් හා පැවරූ බෙහෙතින් හා මත්තෙහි; සාදියෙය්‍ය=ඉවසා නම්;

8 තථාරූපප්පච්චයා අඤ්ඤත්‍ර=සුදුසු කරුණක් නැතිව; උය්‍යුත්තං සෙනං=යුද පිණිස නික්මුණු සිවුරඟ සෙන්; දස්සනාය ගච්ඡෙය්‍ය=දක්නට යේ නම්;

9 තස්ස භික්ඛුනො=ඒ මහණහට; සෙනං ගමනාය=සේනාවට යනු පිණිස; කොචිදෙ'ව පච්චයො සියා ච=කිසි කරුණෙක් වන්නේ නම්; තෙන භික්ඛුනා=ඒ මහණහු විසින්; දිරත්තතිරත්තං=දෙ-තුන් රැයක්; සෙනාය වසිතබ්බං=සෙනාවෙහි විසිය යුතු; චෙ=ඉදින්; තතො උත්තරිං=තෙරැයෙන් මතු; වසෙය්‍ය=වෙසේ නම්;

10 චෙ=ඉදින්; දිරත්තතිරත්තං=දෙතුන් රැයක්; සෙනාය වසමානො භික්ඛු=සෙනාවෙහි වසන මහණ; උය්‍යොධිකං වා=යුද බිමට හෝ; බලග්ගං වා=සේනා ගණන් ගන්නා තැනට හෝ; සෙනාබ්‍යූහං වා=සෙනා සන්නිවෙශස්ථානයට හෝ; අණීකදස්සනං වා=ඇත් ඇණි ආදිය දක්නට හෝ; ගච්ඡෙය්‍ය=යේ නම්; පාචිත්තියං.

**5. අචෙලක වර්ගයයි.**

1 සුරාමෙරයපානෙ **පාචිත්තියං** (51)

2 අඞ්ගුලිපතොදකෙ **පාචිත්තියං** (52)

3 උදකෙ හස්සධම්මෙ **පාචිත්තියං** (53)

4 අනාදරියෙ **පාචිත්තියං** (54)

5 යො පන භික්ඛු භික්ඛුං භිංසාපෙය්‍ය **පාචිත්තියං** (55)

6 යො පන භික්ඛු අගිලානො විසිබ්බනාපෙක්ඛො ජොතිං සමාදහෙය්‍ය වා සමාදහාපෙය්‍ය වා අඤ්ඤත්‍ර තථාරූපප්පච්චයා, **පාචිත්තියං** (56)

7 යො පන භික්ඛු ඔරෙනද්ධමාසං නහායෙය්‍ය අඤ්ඤත්‍ර සමයා, **පාචිත්තියං**; තත්‍ථා'යං සමයො, දියඩ්ඪො මාසො සෙසො ගිම්හානන්ති වස්සානස්ස පඨමො මාසො ඉච්චෙ'තෙ අඩ්ඪතෙය්‍යමාසා උණ්හසමයො පරිළාහසමයො ගිලානසමයො කම්මසමයො අද්ධානගමන සමයො වාතවුට්ඨිසමයො, අයං තත්‍ථ සමයො. (57)

---

1 සුරාමෙරයපානෙ=රහමෙර පානය නිමිති කොට;

2 අඞ්ගුලිපතොදකෙ=කිසිලි ආදියෙහි කිති කැවීම නිමිති කොට;

3 උදකෙ=දියෙහි; හස්සධම්මෙ=සිනාවට සුදුසු කෙළියෙහි;

4 අනාදරියෙ=පුගුලාට හෝ ධර්‍මයට හෝ අනදර කිරීමෙහි;

5 භික්ඛුං=මහණක්හු; භිංසාපෙය්‍ය=භය ගන්වා නම්;

6 තථාරූපප්පච්චයා අඤ්ඤත්‍ර=පහන් දල්වීම් ආදි එබඳු කරුණක් හැර; අගිලානො=ගිලන් නුවූයේ; විසිබ්බනාපෙක්ඛො=ගිනිතප්නා කැමැත්තේ; ජොතිං=ගිනි; සමාදහෙය්‍ය වා=තෙමෙ දල්වා නම් හෝ; සමාදහාපෙය්‍ය වා=අනුන් ලවා දල්වවා නම් හෝ;

7 ඔරෙනද්ධමාසං=නෑ දින පටන් අඩමසක් නොපිරුණු කල්හි; සමයා අඤ්ඤත්‍ර=සමය තබා; නහායෙය්‍ය=නහා නම්; පාචිත්තියං=පචිති වේ; තත්‍ථ=ඒ නැමෙහි; අයං සමයො=මේ කාලයයි; ගිම්හානං=ගිම්න් සාරමසේ; සෙසො දියඩ්ඪො මාසො=අවශෙෂ වූ එක් මස් අඩමසය; වස්සානස්ස=වසන් සාරමසේ; පඨමො මාසො=පළමුවන මසය; ඉති=මෙසේ; එතෙ අඩ්ඪතෙය්‍යමාසා=මේ දෙමස් දෙපෝ කෙනෙක; උණ්හසමයො=ගිම්න්හි යෙළමසයයි කී උෂ්ණ සමය ද; පරිළාහ සමයො=වසන්හි පළමු මසයයි කී පරිදාහ සමය ද; ගිලාන සමයො=ගිලන් සමය ද; කම්මසමයො=කර්‍මාන්ත සමය ද; වාතවුට්ඨිසමයො=වාතවුට්ඨි සමය ද යන; අයං=මේ; තත්‍ථ සමයො=එහි කාලයයි.



8 නවං පන භික්ඛුනා චීවරලාභෙන තිණ්ණං දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණකරණං ආදාතබ්බං නීලං වා කද්දමං වා කාළසාමං වා, අනාදා චෙ භික්ඛු තිණ්ණං දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණකරණං නවං චීවරං පරිභුඤ්ජෙය්‍ය, **පාචිත්තියං**, (58)

9 යො පන භික්ඛු භික්ඛුස්ස වා භික්ඛුනියා වා සික්ඛමානාය වා සාමණෙරස්ස වා සාමණෙරියා වා සාමං චීවරං වික්කප්පෙත්වා අපච්චුද්ධාරකං[1] පරිභුඤ්ජෙය්‍ය, **පාචිත්තියං**. (59)

10 යො පන භික්ඛු භික්ඛුස්ස පත්තං වා චීවරං වා නිසීදනං වා සූචිඝරං වා කායබන්ධනං වා අපනිධෙය්‍ය වා අපනිධාපෙය්‍ය වා අන්තමසො හස්සාපෙක්ඛො'පි, **පාචිත්තියං**. (60)

**සුරාපානවග්ගො ඡට්ඨො.**

---

8 නවං පන භික්ඛුනා චීවරලාභෙන=අලුත් සිවුරු ලද මහණහු විසින්; නීලං වා=නිලක් හෝ; කද්දමං වා=දිය මඩ හෝ; කාළසාමං වා අඟුරු දූලි ඈ කාලවර්‍ණයක් හෝ යන; තිණ්ණං දුබ්බණ්ණකරණානං=ත්‍රිවිධ දුර්වර්‍ණකරණයන් අතුරෙන්; අඤ්ඤතරං දුබ්බණ්ණකරණං=එක්තරා දුර්වර්‍ණකරණයක්; ආදාතබ්බං=බහාලිය යුතු; චෙ තිණ්ණං දුබ්බණ්ණකරණානං අඤ්ඤතරං දුබ්බණ්ණකරණං; අනාදාය=නො දී; භික්ඛු=මහණ; නවං චීවරං පරිභුඤ්ජෙය්‍ය=අලුත් සිවුරක් පරිභොග කෙරේ නම්;

2 භික්ඛුස්ස වා=උපසපනකුට හෝ; භික්ඛුනියා වා=මෙහෙණියකට හෝ; සික්ඛමානාය වා=සික්ඛමානාවකට හෝ; සාමණෙරස්ස වා=හෙරණකුට හෝ; සාමණෙරියා වා=හෙරණකට හෝ; සාමං=තෙමේ; චීවරං වික්කප්පෙත්වා= "ඉමං චීවරං තුය්හං වික්කප්පෙමි"යි සිවුරක් විකපා; අපච්චුද්ධාරකං=නොකළ පච්චුද්ධරණය ඇතිව; පරිභුඤ්ජෙය්‍ය=වළඳ කෙරේ නම්;

10 අන්තමසො=යටත් පිරිසෙයින්; හස්සාපෙක්ඛො'පි=කෙළි කැමැත්තේ ද; භික්ඛුස්ස=මහණකුගේ; පත්තං වා=ඉටත් පොහෝනා පයක් හෝ; චීවරං වා=විකපුම් පොහෝනා චීවරයක් හෝ; නිසීදනං වා=සදස නිසීදනයක් හෝ; සූචිඝරං වා=හිඳි ගුළාවක් හෝ; කායබන්ධනං වා=කාබාතක් හෝ; අපනිධෙය්‍ය වා=තෙමේ සඟවා නම් හෝ; අපනිධාපෙය්‍ය වා=අනුන් ලවා සඟවවා නම් හෝ; පාචිත්තියං=පචිති වේ.

**6 සුරාපාන වර්ගයයි.**

---

1 'අපච්චුද්ධාරණං' (මරම්ම)

1 යො පන භික්ඛු සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපෙය්‍ය, **පාචිත්තියං**. (61)

2 යො පන භික්ඛු ජානං සප්පාණකං උදකං පරිභුඤ්ජෙය්‍ය, **පාචිත්තියං**. (62)

3 යො පන භික්ඛු ජානං යථාධම්මං නිහතාධිකරණං පුන කම්මාය උක්කොටෙය්‍ය, **පාචිත්තියං**. (63)

4 යො පන භික්ඛු භික්ඛුස්ස ජානං දුට්ඨුල්ලං ආපත්තිං පටිච්ඡාදෙය්‍ය, **පාචිත්තියං**. (64)

5 යො පන භික්ඛු ජානං ඌනවීසතිවස්සං පුග්ගලං උපසම්පාදෙය්‍ය, සො ච පුග්ගලො අනුපසම්පන්නො, තෙ ච භික්ඛූ ගාරය්හා, ඉදං තස්මිං **පාචිත්තියං**. (65)

6 යො පන භික්ඛු ජානං ථෙය්‍යසත්ථෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය අන්තමසො ගාමන්තරම්පි, **පාචිත්තියං**. (66)

---

1 සඤ්චිච්ච=මොහු මරමි යි සිතා; පාණං=තිරිසන් සතකු; ජීවිතා වොරොපෙය්‍ය=දිවියෙන් තොර කෙරේ නම්;

2 ජානං=ප්‍රාණීන් සහිතයයි දැන; සප්පාණකං උදකං=පණුවන් ඇති දිය; පරිභුඤ්ජෙය්‍ය=පරිභොග කෙරේ නම්;

3 ජානං=වූපසමිතයයි දන්නේ; යථා ධම්මං=ධර්මයට අනුව; නිහතාධිකරණං=විනිච්ඡිත අධිකරණයක්; පුන කම්මාය=නැවත විනිශ්චය කරනු පිණිස; උක්කොටෙය්‍ය=උගුළුවා නම්;

4 භික්ඛුස්ස=මහණක්හු ගේ; දුට්ඨුල්ලං ආපත්තිං=සඟවෙසෙස් ඇවැතක්; ජානං=කිසියම් උපායෙකින් දන්නේ; පටිච්ඡාදෙය්‍ය=අනෙකකුට නොකියා සඟවා නම්;

5 ජානං=දැන දැන; ඌනවීසතිවස්සං පුග්ගලං=උනුවිසි වයස් පුඟුලකු; උපසම්පාදෙය්‍ය=උපාධ්‍යාය ව උපසම්පදා කරවා නම්; සො ච පුග්ගලො=ඒ පුඟුලා ද; අනුපසම්පන්නො=උපසම්පන්න නො වෙයි; තෙ ච භික්ඛූ=ඒ ගණපූරක භික්ෂූහු ද; ගාරය්හා=නින්දා කට යුතු වෙත් (දුකුළාවට පත් වෙති); තස්මිං=ඒ උපාධ්‍යායයා කෙරෙහි; ඉදං පාචිත්තියං=මේ පචිතිය දත යුතු.

6 ජානං=ථෙය්‍යසත්ථයෙකැයි දැන දැන; සංවිධාය=සාකච්ඡා කොට ගෙන; ථෙය්‍යසත්ථෙන සද්ධිං=සොර සත්වා මුළක් සමඟ, එකද්ධානමග්ගං=එක් අදන් මඟකට; අන්තමසො=යටතින්; ගාමන්තරං පි=අන් ගමට නමුදු; පටිපජ්ජෙය්‍ය=යේ නම්;

(**7 අව ද මෙ පරිදි යි.**)



7 යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං සංවිධාය එකද්ධානමග්ගං පටිපජ්ජෙය්‍ය අන්තමසො ගාමන්තරම්පි, **පාචිත්තියං** (67)

8 යො පන භික්ඛු එවං වදෙය්‍ය ''තථා'හං භගවතා ධම්මං දෙසිතං ආජානාමි, යථා යෙ'මෙ අන්තරායිකා ධම්මා වුත්තා භගවතා, තෙ පටිසෙවතො නා'ලං අන්තරායායා''ති; සො භික්ඛු භික්ඛූහි එවම'ස්ස වචනීයො ''මා ආයස්මා එවං අවච, මා භගවන්තං අබ්භාචික්ඛි, න හි සාධු භගවතො අබ්භක්ඛානං, න හි භගවා එවං වදෙය්‍ය, අනෙකපරියායෙන ආවුසො අන්තරායිකා ධම්මා අන්තරායිකා වුත්තා භගවතා, අලඤ්ච පන තෙ පටිසෙවතො අන්තරායායා''ති. එවං ච සො භික්ඛු භික්ඛූහි වුච්චමානො තථෙ'ව පග්ගණ්හෙය්‍ය, සො භික්ඛු භික්ඛූහි යාවතතියං සමනුභාසිතබ්බො තස්ස පටිනිස්සග්ගාය; යාවතතියඤ්චෙ සමනුභාසියමානො තං පටිනිස්සජ්ජෙය්‍ය, ඉච්චෙතං කුසලං, නො චෙ පටිනිස්සජ්ජෙය්‍ය, **පාචිත්තියං**. (68)

---

8 යො පන භික්ඛු=යම් මහණෙක් තෙම; යෙ ඉමෙ අන්තරායිකා ධම්මා=යම් මේ අන්තරායකර වූ ආපත්ති කෙනෙක්; භගවතා වුත්තා=බුදුන් විසින් වදාරන ලද්දෝ ද; තෙ=ඒ ධර්මයෝ; පටිසෙවතො=සෙවුනා මහණහට; යථා=යම් සේ; අන්තරායාය=සග මොක් ආදියට අන්තරාය පිණිස; න අලං=සමර්ථ නොවෙත් ද; අහං=මම; භගවතා=බුදුන් විසින්; දෙසිතං ධම්මං=දෙසන ලද ධර්මය; තථා ආජානාමි ඉති=එ සේ දනිමි යි; එවං වදෙය්‍ය=මෙසේ කියා නම්; සො භික්ඛු=ඒ මහණ තෙම, භික්ඛූහි=සෙසු ලජ්ජි මහණුන් විසින්; ආයස්මා=ඇවැත; එවං මා අවච=මෙසේ නොකියව; භගවන්තං=බුදුනට; මා අබ්භාචික්ඛි=නින්දා නොකරව; භගවතො=බුදුනට; අබ්භක්ඛානං=ගැරහීම; න හි සාධු=නොමැනවි; භගවා=භගවත් තෙම; එවං න හි වදෙය්‍ය=මෙසේ නොම වදාරන්නේය; ආවුසො=ඇවැත, අන්තරායිකා ධම්මා=අන්තරායකර ධර්මයෝ; අනෙකපරියායෙන=නා නා කාරණයෙන්; අන්තරායිකා=අන්තරාය කරයහ යි; භගවතා වුත්තා=බුදුන් විසින් කියන ලදහ; තෙ=ඒ ධර්මයෝ; පටිසෙවතො=සෙවිනාහට; අන්තරායාය=අන්තරාය පිණිස; අලං ච පන ඉති=සමර්ථයෝ ද වෙති යි; එවං වචනීයො අස්ස=මෙ සේ තෙවරක් කිවයුතු වන්නේය; සො භික්ඛු=ඒ මහණ තෙම; භික්ඛූහි=සෙසු මහණුන් විසින්; එවං ච වුච්චමානො=මෙසේ ද කියනු ලබන්නේ; තථෙ'ව=එසේ ම; පග්ගණ්හෙය්‍ය=දැඩි ව ගෙන සිටී නම්; සො භික්ඛු භික්ඛූහි; තස්ස පටිනිස්සග්ගාය=ඒ දෘෂ්ටිය හරනා පිණිස; යාවතතියං සමනුභාසිතබ්බො=තුන් යළක් සමනුභාසන කම් කළයුතු වන්නේය;

9 යො පන භිකඛු ජානං තථාවාදිනා භිකඛුනා අකතානුධමෙමන තං දිට්ඨිං අපපටිනිසසටෙඨන සද්ධිං සමභුඤ්ජෙයය වා සංවසෙයය වා සහ වා සෙයයං කපෙපයය, **පාචිතතියං**. (69)

10 සමණුද්දෙසො'පි චෙ එවං වදෙයය 'තථා'හං භගවතා ධමමං දෙසිතං ආජානාමි, යථා යෙ'මෙ අනතරායිකා ධමමා වුතතා භගවතා, තෙ පටිසෙවතො නා'ලං අනතරායායා"ති. සො සමණුද්දෙසො භිකඛුහි එවම'සස වචනීයො 'මා ආවුසො සමණුද්දෙස එවං අවච, මා භගවනතං අබභාචිකඛි, න හි සාධු භගවතො අබභකඛානං, න හි භගවා එවං වදෙයය, අනෙකපරියායෙන ආවුසො සමණුද්දෙස අනතරායිකා ධමමා අනතරායිකා වුතතා භගවතා, අලඤ්ච පන තෙ පටිසෙවතො අනතරායායා"ති;

එවඤ්ච පන සො සමණුද්දෙසො භිකඛුහි වුචචමානො තථෙ'ව පගගණෙහයය, සො සමණුද්දෙසො භිකඛුහි එවම'සස වචනීයො "අජජතගෙග තෙ ආවුසො සමණුද්දෙස න චෙ'ව සො භගවා සතථා අපදිසිතබෙබා, යම්පි ච'ඤ්ඤෙ සමණුද්දෙසා ලභනති භිකඛුහි සද්ධිං දිරතතතිරතතං සහසෙයයං, සා'පි තෙ නතථි, චර පිරෙ විනසසා'ති; යො පන භිකඛු ජානං තථා නාසිතං සමණුද්දෙසං උපලාපෙයය වා උපටඨාපෙයය වා සමභුඤ්ජෙයය වා සහ වා සෙයයං කපෙපයය, **පාචිතතියං**. (70)

**සපපාණකවගෙගා සතතමො.**

---

චෙ=ඉදින්; යාවතතියං සමනුභාසියමානො=තුන් යළක් සමනුභාසන කම් කරනු ලබන්නේ; තං=ඒ ලබ්ධිය; පටිනිසසජෙජයය=හරනේ නම්; ඉච්චෙතං=එසේ මේ හැරපීම; කුසලං=මැනැවි.

9 ජානං=උක්ඛිත්තයෙකැයි දැන දැන; තථාවාදිනා=එබඳු මිථ්‍යාවාද ඇති; අකතානුධමෙමන=ඔසාරණය කරනු නොලැබූ; තං දිට්ඨිං අපපටිනිසසටෙඨන=ඒ මිථ්‍යාලබ්ධිය නොහළ; භිකඛුනා සද්ධිං=මහණකු සමඟ; සමභුඤ්ජෙයය වා=ධර්මාමිෂසම්භොග කෙරේ නම් හෝ; සහ වා සෙයයං කපෙපයය=නානුපවාර වූ එකාවජ්ජනයෙහි වුවත් එක්ව හොවී නම්;

10 සමණුද්දෙසො අපි=හෙරණෙක් ද; භගවතා යෙ'මෙ අනතරායිකා වුතතා, තෙ පටිසෙවතො —පෙ— සො සමණුද්දෙසො=ඒ හෙරණ තෙමේ; භිකඛුහි=සෙසු මහණුන් විසින්; ආවුසො සමණුද්දෙස=ඇවැත සමණුද්දෙසය; මා එවං අවච —පෙ— තෙ=ඒ ධර්මයෝ; පටිසෙවතො=සෙවිනහුට; අනතරායාය=අනතරාය



1 යො පන භිකඛු භිකඛුහි සහධමමිකං වුචචමානො එවං වදෙයය "න තාවා'හං ආවුසො එතසමිං සිකඛාපදෙ සිකඛිසසාමි, යාව න අඤ්ඤං භිකඛුං බයතතං විනයධරං පරිපුචඡාමී"ති, **පාචිතතියං**; සිකඛමානෙන භිකඛවෙ භිකඛුනා අඤ්ඤාතබබං පරිපුචඡිතබබං පරිපඤ්හිතබබං, අයං තතථ සාමීචි. (71)

---

පිණිස; අලං ච පන ඉති=සමර්ථයහ යි; එවං වචනීයො අසස=මෙසේ කිවයුතු වන්නේය.

සො සමණුද්දෙසො භිකඛුහි එවං ච වුචචමානො, තථෙව පගගණෙහයය=එසේම ගෙන සිටී නම්; සො සමණුද්දෙසො භිකඛුහි; ආවුසො සමණුද්දෙස=ඇවැත සාමණේරය; අජජතගෙග=අද පටන්; තෙ=තා විසින්; සො භගවා=ඒ භගවත් තෙම; සතථා=මගේ ශාස්තෘයයි; න චෙ'ව අපදිසිතබෙබා=නො ම පැවසිය යුත්තේය; අඤ්ඤෙ සමණුද්දෙසා=සෙසු හෙරණහු; භිකඛුහි සද්ධිං=භික්ෂූන් සමඟ; දිරතතතිරතතං=දෙතුන් රැයක්; යම්පි ච සහසෙයයං ලභනති=යම් සහසෙයයාවක් ලබත් ද; සා'පි=ඒ සහසෙයයාව ද; තෙ නතථි=තට නැත; පිරෙ=මමත්වය නැති එම්බා හෙරණ; චර=සඟරමින් යව; විනසස ඉති=නො පැනෙන තැනකට යවයි; එවං වචනීයො අසස=මෙසේ කිවයුතු වන්නේය; යො පන භිකඛු=යම් මහණෙක්; ජානං=දණ්ඩකම්මනාසනාවෙන් නසනලද බව දැන දැන; තථා නාසිතං=එසේ දණ්ඩකම්මයෙන් බැහැර ලන ලද; සාමණෙරං=හෙරණකු; උපලාපෙයය වා=සඞ්ග්‍රහ කෙරේ නම් හෝ; උපටඨාපෙයය වා=වත් පිළිවෙත් කරවා ගනී නම් හෝ; සමභුඤ්ජෙයය වා=ධර්මාමිෂ සම්භොග කෙරේ නම් හෝ; සහ වා සෙයයං කපෙපයය=සහසෙයයා කෙරේ නම් හෝ; පාචිතතියං=පචිති ඇවැත් වේ.

**7 සපපාණක වර්ගයයි.**

1 භිකඛුහි=මහණුන් විසින්; සහධමමිකං වුචචමානො=ශිකෂා පදයෙන් ඔවා දෙනු ලබන්නේ; ආවුසො=ඇවැත; යාව=යම්තාක්; බයතතං=බහුශ්‍රැත වූ; විනයධරං=විනයධර වූ; අඤ්ඤං භිකඛුං=තොප කෙරෙන් අන් භික්ෂුවක්; පරිපුචඡාමි=විචාරම් ද; තාව=ඒතාක්; එතසමිං සිකඛාපදෙ=තෙල ශිකෂාවෙහි; න සිකඛිසසාමි ඉති=නො හික්මෙමැයි; එවං වදෙයය=මෙසේ කියා නම්; පාචිතතියං=පචිති වේ; භිකඛවෙ=මහණෙනි; සිකඛමානෙන භිකඛුනා=හික්මෙනු රිසි ඇති මහණහු විසින්; අඤ්ඤාතබබං=වසතු නිදානාදිය දත යුතු; පරිපුචඡිතබබං=අර්ථ විචාළ යුතු; පරිපඤ්හිතබබං=පරීක්ෂා කටයුතුය.

2 යො පන භික්ඛු පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ එවං වදෙය්‍ය "කිං පනි'මෙහි ඛුද්දානුඛුද්දකෙහි සික්ඛාපදෙහි උද්දිට්ඨෙහි යාවදෙව කුක්කුච්චාය විහෙසාය විලෙඛාය සංවත්තන්තී" ති, සික්ඛාපද විවණ්ණනකෙ **පාචිත්තියං**. (72)

3 යො පන භික්ඛු අන්වද්ධමාසං පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ එවං වදෙය්‍ය "ඉදානෙ'ව ඛො ආවුසො[1] අහං ආජානාමි අයං පි කිර ධම්මො සුත්තාගතො සුත්තපරියාපන්නො අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡතී" ති; තඤ්චෙ භික්ඛුං අඤ්ඤෙ භික්ඛූ ජානෙය්‍යුං නිසින්නපුබ්බං ඉමිනා භික්ඛුනා ද්විත්තික්ඛත්තුං පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ කො පන වාදො භිය්‍යො, න ච තස්ස භික්ඛුනො අඤ්ඤාණකෙන මුත්ති අත්ථි, යඤ්ච තත්ථ ආපත්තිං ආපන්නො, තං ච යථාධම්මො කාරෙතබ්බො, උත්තරිං ච'ස්ස මොහො ආරොපෙතබ්බො "තස්ස තෙ ආවුසො අලාභා, තස්ස තෙ දුල්ලද්ධං, යං ත්වං පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ න සාධුකං අට්ඨිකත්වා මනසි කරොසී" ති, ඉදං තස්මිං මොහනකෙ **පාචිත්තියං** (73)

---

2 පාතිමොක්ඛෙ=ප්‍රාතිමොක්ෂය; උද්දිස්සමානෙ=ආචාර්යයා විසින් අතැවැසියාට කියනු ලබන කල්හි හෝ සජ්ඣායන කරනු ලබන කල්හි හෝ; උද්දිට්ඨෙහි=උදෙසන ලද; ඛුද්දානුඛුද්දකෙහි=ඛුද්දානුඛුද්දක වූ; ඉමෙහි සික්ඛාපදෙහි=මේ සිකපදවලින්; කිං=කවර ප්‍රයෝජනයෙක් ද; යාවදෙ'ව=යම්තාක් නොහොත් අතිශයින්; කුක්කුච්චාය=කැප ද අකැපදැයි යන කුකුස් පිණිස; විහෙසාය=විපිළිසර විසින් වෙහෙස පිණිස; විලෙඛාය=සිතේ රෙඛාහටගැනීමට හෙවත් නොසිලුටු බව පිණිස; සංවත්තන්ති ඉති=වැටෙති යි; එවං වදෙය්‍ය=මෙ සේ කියා නම්; සික්ඛාපද විවණ්ණනකෙ=මෙසේ ශික්ෂාපදයනට ගැරහීම නිමිති කොට; පාචිත්තියං=පචිති වේ.

3 අන්වද්ධමාසං=අඩමසක් පාසා; පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ=පොහෝ විසින් **පාමොක්** උදෙසනු ලබන කල්හි; ආවුසො=ඇවැත්නි; ඉදානි එව ඛො=දැන් ම වනාහි; අහං ආජානාමි=මම දනිමි; සුත්තාගතො=ප්‍රාතිමොක්ෂයෙහි වන; සුත්තපරියාපන්නො=පාමොක්හි ඇතුළත්; අයං පි ධම්මො=මේ ධර්මයත්; අන්වද්ධමාසං=අඩමසක් පාසා; උද්දෙසං ආගච්ඡති කිර ඉති=උදෙසීමට ඒ ලයි; එවං වදෙය්‍ය=මෙසේ කියා නම්; ද්විත්තික්ඛත්තුං=දෙතුන් වරෙක; පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ=පාමොක් උදෙසනු ලබන කල්හි හුන් විරූ බව ගැන; කො පන වාදො=කියනු ම කිමැයි; අඤ්ඤෙ භික්ඛූ=සෙසු භික්ෂූහු; තං භික්ඛුං=ඒ මහණහු ගැන; ජානෙය්‍යුං වෙ=

1 "ආවුසොති" පදං මරම්ම පොත්ථකෙසු නත්ථි



4 යො පන භික්ඛු භික්ඛුස්ස කුපිතො අනත්තමනො පහාරං දදෙය්‍ය, **පාචිත්තියං**. (74)

5 යො පන භික්ඛු භික්ඛුස්ස කුපිතො අනත්තමනො තලසත්තිකං උග්ගිරෙය්‍ය, **පාචිත්තියං**. (75)

6 යො පන භික්ඛු භික්ඛුං අමූලකෙන සඞ්ඝාදිසෙසෙන අනුද්ධංසෙය්‍ය, **පාචිත්තියං**. (76)

7 යො පන භික්ඛු භික්ඛුස්ස සඤ්චිච්ච කුක්කුච්චං උපදහෙය්‍ය 'ඉති'ස්ස මුහුත්තම්පි අඵාසු භවිස්සතී' ති එතදෙ'ව පච්චයං කරිත්වා අනඤ්ඤං, **පාචිත්තියං**. (77)

---

ඉදින් දනිත් නම්; තස්ස භික්ඛුනො=ඒ මහණහට; අඤ්ඤාණකෙන=නොදැන **පත්** බව **කාරණ** කොට; මුත්ති න ච අත්ථි=ඇවැතින් ගැලවීමෙක් නැත; තත්ථ=තමා කළ ඒ අනාචාරයෙහි; යං ච ආපත්තිං ආපන්නො=යම් ඇවැතකට පැමිණියේ ද; තං ච=ඒ ඇවැත කරණ කොට ද; යථාධම්මො=ධර්මවිනය විධි පරිදි; කාරෙතබ්බො=කරවිය යුතු; උත්තරිං ච=යථාධර්මකරණයෙන් මත්තෙහි ද; ආවුසො=ඇවැත; යං=යම් හෙයකින්; ත්වං=තෝ; පාතිමොක්ඛෙ උද්දිස්සමානෙ=පාමොක් උදෙසන ලබන කල්හි; සාධුකං=මොනවට; අට්ඨිංකත්වා=අර්ථි භාවය හෙවත්-එයින් තමහට ප්‍රයෝජනයක් ඇති බව කොට; න මනසි කරොසි=මෙනෙහි නොකෙරෙහි ද; (තස්මා) තස්ස තෙ=ඒ තට; අලාභා=මෙලෝ පරලෝ ලාභයෝ නොවත්නාහ; තස්ස තෙ=ඒ තට; දුල්ලද්ධං=(පිනිත් ලද මිනිසත් බව) දුක් පිණිස ලබන ලද්දක් විය; ඉති=මෙසේ නිඥ කොට: අස්ස=ඒ මහණහුට; මොහො ආරොපෙතබ්බො=ඤත්තිදුතිය කම්වදන් කියා මෝහාරොපනය කට යුතු; මොහනකෙ=නැවත මොහනය කරන; තස්මිං=ඒ පුඟුලා කෙරෙහි; ඉදං පාචිත්තියං=මේ පචිතිය දතයුතු.

4 කුපිතො=කිපියේ; අනත්තමනො=නොසතුටුවූයේ; භික්ඛුස්ස=මහණකුට; පහාරං දදෙය්‍ය=පහර දේ නම්,

5 තලසත්තිකං=අත්සැත්; උග්ගිරෙය්‍ය=නඟා නම්;

6 අමූලකෙන=දිට්ඨාදි මුල් නැති; සඞ්ඝාදිසෙසෙන=සඟ වෙසෙසින්; අනුද්ධංසෙය්‍ය=චෝදනා කෙරේ නම්;

**7** යො පන භික්ඛු=යම් භික්ෂුවක්; ඉති=මේ කුකුස් ඉපදවීමෙන් අස්ස=මේ මහණහට; මුහුත්තං පි=ඇසිල්ලකුදු; අඵාසු භවිස්සති ඉති=අඵාසු වන්නේයයි; සඤ්චිච්ච=මෙ සේ සිතා; භික්ඛුස්ස=මහණකුට; කුක්කුච්චං උපදහෙය්‍ය=සංසය උපදවා නම්; එතදෙ'ව=මේ දුක් ඉපදවීම ම; පච්චයං කරිත්වා=කාරණ කොට; පාචිත්තියං=පචිති වේ; අනඤ්ඤං=අන් අනුශාසනාදියක් කාරණ කොට පචිති නොවේ;

8 යො පන භික්ඛු භික්ඛූනං භණ්ඩනජාතානං කලහජාතානං විවාදාපන්නානං උපස්සුති තිට්ඨෙය්‍ය 'යං ඉමෙ භණිස්සන්ති තං සොස්සාමී'ති එතදෙ'ව පච්චයං කරිත්වා අනඤ්ඤං **පාචිත්තියං**. (78)

9 යො පන භික්ඛු ධම්මිකානං කම්මානං ඡන්දං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජෙය්‍ය, **පාචිත්තියං**. (79)

10 යො පන භික්ඛු සඞ්ඝෙ විනිච්ඡයකථාය වත්තමානාය ඡන්දං අදත්වා උට්ඨායා'සනා පක්කමෙය්‍ය, **පාචිත්තියං**. (80)

11 යො පන භික්ඛු සමග්ගෙන සඞ්ඝෙන චීවරං දත්වා පච්ඡා ඛීයනධම්මං ආපජ්ජෙය්‍ය 'යථාසන්ථුතං භික්ඛූ සඞ්ඝිකං ලාභං පරිණාමෙන්තී'ති, **පාචිත්තියං**. (81)

12 යො පන භික්ඛු ජානං සඞ්ඝිකං ලාභං පරිණතං පුග්ගලස්ස පරිණාමෙය්‍ය, **පාචිත්තියං**. (82)

**සහධම්මික වග්ගො අට්ඨමො.**

---

8 භණ්ඩනජාතානං=හටගත් දබර ඇති; කලහජාතානං=හට ගත් කලහ ඇති; විවාදාපන්නානං=විවාදාධිකරණයට පත්; භික්ඛූනං= මහණුන් ගේ; උපස්සුති=බස් ඇසෙන තැන; යං=යම් වචනයක්; ඉමෙ භණිස්සන්ති=මොහු කියත් ද; තං සොස්සාමි ඉති=එය අසමි යි; එතදෙ'ව පච්චයං කරිත්වා=මෙය ම කාරණ කොට; අනඤ්ඤං= අනෙකක් කාරණ නො කොට; තිට්ඨෙය්‍ය=සිටී නම්;

9 ධම්මිකානං කම්මානං=විනය පරිදි කළ චතුර්විධ කර්මයනට; ඡන්දං දත්වා=ඡන්දය දී; පච්ඡා=පසුව; ඛීයනධම්මං=ගරහන බවට; ආපජ්ජෙය්‍ය=පැමිණේ නම්;

10 සඞ්ඝෙ=සඟ මැද; විනිච්ඡයකථාය වත්තමානාය=විනිශ්චය කථාවක් පවත්නා කල්හි; ඡන්දං අදත්වා=(කර්මයකොප්‍යකරන රිසි යෙන්) ඡන්දය නො දී; ආසනා උට්ඨාය=හුනස්නෙන් නැගිට; පක්ක මෙය්‍ය=පහව යේ නම්;

11 සමග්ගෙන සඞ්ඝෙන=සමඟ සඞ්ඝයා හා එක් ව; චීවරං දත්වා=සම්මත මහණකුහට චීවරයක් දී; පච්ඡා=පසුව; යථාසන්ථුතං= මිත්‍රතා පරිදි; භික්ඛූ=භික්ෂූහු; සඞ්ඝිකං ලාභං=සඟසතු ලාභ; පරිණා මෙන්ති ඉති=පිරිනමත් යයි; ඛීයනධම්මං=ගරහන බවට; ආපජ්ජෙ= ය්‍ය=පැමිණේ නම්;

12 ජානං=(සංඝිකයයි) දැන දැන; පරිණතං=පිරිනැමූ; සංඝිකං =එ හෙයින් ම සඟ සතු වූ; ලාභං=ලාභයක්; පුග්ගලස්ස=අන් පුඟුල කුට; පරිණාමෙය්‍ය=පිරිනමා නම්.

**8. සහධම්මික වර්ගයයි.**



1 යො පන භික්ඛු රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස අනික්ඛන්තරාජකෙ අනීහතරතනකෙ[1] පුබ්බෙ අප්පටිසංවිදිතො ඉන්දඛීලං අතික්කමෙය්‍ය[2], **පාචිත්තියං**. (83)

2 යො පන භික්ඛු රතනං වා රතනසම්මතං වා අඤ්ඤත්‍ර අජ්ඣාරාමා වා අජ්ඣාවසථා වා උග්ගණ්හෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා **පාචිත්තියං**. රතනං වා පන භික්ඛුනා රතන සම්මතං වා අජ්ඣා- රාමෙ වා අජ්ඣාවසථෙ වා උග්ගහෙත්වා වා උග්ගණ්හාපෙත්වා වා නික්ඛිපිතබ්බං 'යස්ස භවිස්සති, සො හරිස්සතී'ති, අයං තත්‍ථ සාමීචි. (84)

3 යො පන භික්ඛු සන්තං භික්ඛුං අනාපුච්ඡා විකාලෙ ගාමං පවිසෙය්‍ය අඤ්ඤත්‍ර තථාරූපා අච්චායිකා කරණීයා, **පාචිත්තියං**. (85)

---

1 ඛත්තියස්ස=කැත් කුලයෙහි උපන්; මුද්ධාවසිත්තස්ස= ක්‍ෂත්‍රියාභිෂෙකයෙන් අභිෂෙකය ලත්; රඤ්ඤො=රජහු ගේ; අනික්ඛන්තරාජකෙ=බැහැර නොගිය රජහු ඇති; අනීහතරතන- කෙ=බැහැර නොගිය මෙහෙස්න ඇති; (සයනීඝරෙ=යහන් ගැබැ) පුබ්බෙ=ඇතුළුවන්නට පෙර; අප්පටිසංවිදිතො=තමා ආ බව නො දැන්වූයේ; ඉන්දඛීලං=එළිපත; අතික්කමෙය්‍ය=ඉක්ම ඇතුළත වදී නම්;

2 අජ්ඣාරාමා වා අජ්ඣාවසථා වා අඤ්ඤත්‍ර=ඇතුළු අරම ද ඇතුළු ගෙය ද හැර; රතනං වා= දශවිධ රත්නය හෝ; රතනසම්මතං වා=පිළී ආදි උපභොග පරිභොග වස්තුවක් හෝ; උග්ගණ්හෙය්‍ය වා=රැකදෙන රිසියෙන් තෙමේ ගනී නම් හෝ; උග්ගණ්හාපෙය්‍ය වා=අනුන් ලවා ගන්වා නම් හෝ; පාචිත්තියං=පචිති වේ; භික්ඛුනා= මහණහු විසින්; රතනං වා=රත්නයක් හෝ; රතන සම්මතං වා= රත්නසම්මත වස්තුවක් හෝ; අජ්ඣාරාමෙ වා=ඇතුළු අරමැ හෝ: අජ්ඣාවසථෙ වා=ඇතුළු ගෙහි හෝ (දැක); උග්ගහෙත්වා වා=තමා ගෙන හෝ; උග්ගණ්හාපෙත්වා වා=අනුන් ලවා ගන්වා හෝ; යස්ස භවිස්සති=යමක්හු ගේ මේ ධනය වන්නේ ද; සො හරිස්සති ඉති= හෙතෙම ගෙන යන්නේ යයි සිතා; නික්ඛිපිතබ්බං=තබා තැබිය යුතුයි; අයං=මේ; තත්‍ථ=අරම්හි අමතකව තබා ගිය වස්තුව ගැන්- මෙහි; සාමීචි=විනයානුගත වතයි.

3 තථාරූපා=අහි ඩසනාදි රූපවූ; අච්චායිකා කරණීයා අඤ්ඤත්‍ර=ඉක්මන් කටයුත්තක් නැති ව; සන්තං භික්ඛුං=විද්‍යමාන මහණහු අතින්; අනාපුච්ඡා=නොපිළිවිස; විකාලෙ ගාමං පවිසෙය්‍ය= විකල්හි ගම් වදී නම්;

---

1 'අනිග්ගත රතනකෙ' (මරම්ම)    2 'අතික්කාමෙය්‍ය' (මරම්ම)

4 යො පන භික්ඛු අට්ඨිමයං වා දන්තමයං වා විසාණමයං වා සූචිඝරං කාරාපෙය්‍ය, භෙදනකං **පාචිත්තියං**. (86)

5 නවං පන භික්ඛුනා මඤ්චං වා පීඨං වා කාරයමානෙන අට්ඨඞ්ගුලපාදකං කාරෙතබ්බං සුගතඞ්ගුලෙන අඤ්ඤත්‍ර හෙට්ඨිමාය අටනියා, තං අතික්කාමයතො ඡෙදනකං **පාචිත්තියං**. (87)

6 යො පන භික්ඛු මඤ්චං වා පීඨං වා තූලොනද්ධං කාරාපෙය්‍ය, උද්දාලනකං **පාචිත්තියං**. (88)

7 නිසීදනං පන භික්ඛුනා කාරයමානෙන පමාණිකං කාරෙතබ්බං, තත්‍රිදං පමාණං, දීඝසො ද්වෙ විදත්ථියො සුගතවිදත්ථියා, තිරියං දියඩ්ඪං, දසා විදත්ථි, තං අතික්කාමයතො ඡෙදනකං **පාචිත්තියං**. (89)

---

4 අට්ඨිමයං වා=ඇටමුවා හෝ; දන්තමයං වා=දළමුවා හෝ; විසාණමයං වා=අංමුවා හෝ; සූචිඝරං=හිඳි ගුළාවක්; කාරාපෙය්‍ය=කරවා නම්; (ඒ මහණහට) භෙදනකං=බිඳ දමා ඇවැත් දෙසීම අවසන් කොටැති; පාචිත්තියං;

5 නවං=අලුත්; මඤ්චං වා=ඇඳක් හෝ; පීඨං වා=පුටුවක් හෝ; කාරයමානෙන භික්ඛුනා පන=කරවන මහණහු විසින් වනාහි; හෙට්ඨිමාය අටනියා අඤ්ඤත්‍ර=හැඳවලේ යටභාගය හැර; සුගතඞ්ගුලෙන=සුගත් අඟුලින්; අට්ඨඞ්ගුලපාදකං=අටඟුල් පා ඇත්තක් කොට; කාරෙතබ්බං=කරවිය යුතු; තං අතික්කාමයතො=ඒ පමණ ඉක්මවන්නහුට; ඡෙදනකං පාචිත්තියං=සිඳ දමා ඇවැත් දෙසීම ඇති පචිති වේ.

6 තූලොනද්ධං=පුළුන් වළඳනා ලද; මඤ්චං වා පීඨං වා; කාරාපෙය්‍ය=කරවා නම්; උද්දාලනකං පාචිත්තියං=විදුරණය ඇති පචිති වේ.

7 නිසීදනං කාරයමානෙන භික්ඛුනා පන=නිසීදන චීවරයක් කරවන මහණහු විසින්; පමාණිකං කාරෙතබ්බං=ප්‍රමාණ යුක්ත කොට කරවිය යුතු; තත්‍ර=ඒ චීවරයෙහි; ඉදං පමාණං=මේ පමණි; දීඝසො=දිගින්; සුගතවිදත්ථියා=සුගත් වියතින්; ද්වෙ විදත්ථියො=දෙවියතෙක; තිරියං=සරස (-පුළුලින්); දියඩ්ඪං=එක් වියත් සාඟු-ලෙකි; දසා=දවල්ල; විදත්ථි=වියතෙකි; තං අතික්කාමයතො=ඒ පමණ ඉක්මවා කරන්නහුට; ඡෙදනක පචිති වේ.



8 කණ්ඩුපටිච්ඡාදිං පන භික්ඛුනා කාරයමානෙන පමාණිකා කාරෙතබ්බා, තත්‍රිදං පමාණං, දීඝසො චතස්සො විදත්ථියො සුගතවිදත්ථියා, තිරියං ද්වෙ විදත්ථියො, තං අතික්කාමයතො ඡෙදනකං **පාචිත්තියං**. (90)

9 වස්සිකසාටිකං පන භික්ඛුනා කාරයමානෙන පමාණිකා කාරෙතබ්බා, තත්‍රිදං පමාණං දීඝසො ඡ විදත්ථියො සුගතවිදත්ථියා, තිරියං අඩ්ඪතෙය්‍යා, තං අතික්කාමයතො ඡෙදනකං **පාචිත්තියං**. (91)

10 යො පන භික්ඛු සුගතචීවරප්පමාණං චීවරං කාරාපෙය්‍ය අතිරෙකං වා, ඡෙදනකං **පාචිත්තියං**, තත්‍රිදං සුගතස්ස සුගතචීවරප්පමාණං; දීඝසො නව විදත්ථියො සුගතවිදත්ථියා, තිරියං ඡ විදත්ථියො, ඉදං සුගතස්ස සුගතචීවරප්පමාණං. (92)

**රතන වග්ගො නවමො.**

---

උද්දිට්ඨා ඛො ආයස්මන්තො ද්වෙනවුති පාචිත්තියා ධම්මා, තත්ථා'යස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා, දුතියම්පි පුච්ඡාමි

---

8 කණ්ඩුපටිච්ඡාදිං කාරයමානෙන භික්ඛුනා පන=කස් පිළිසන් සිවුරක් කරවන මහණහු විසින්; පමාණිකා කාරෙතබ්බා=පමණින් යුතු වූවා කරවිය යුතු; තත්‍ර ඉදං පමාණං=එහි මේ පමණි; දීඝසො සුගතවිදත්ථියා චතස්සො විදත්ථියො=දිගින් සුගත් වියතින් සිවු වියතෙකි; තිරියං ද්වෙ විදත්ථියො=පුළුලින් දෙවියතෙකි; තං අතික්කාමයතො=ඒ පමණ ඉක්මවන්නහුට;

8 වස්සිකසාටිකං කාරයමානෙන භික්ඛුනා පන=වැසි සළු සිවුරක් කරවන මහණහු විසින්; පමාණිකා කාරෙතබ්බා=පමණ යුතු වූවා කරවිය යුතු; තත්‍රිදං පමාණං; දීඝසො සුගතවිදත්ථියා; ඡ විදත්ථියො=ස වියතෙකි; තිරියං; අඩ්ඪතෙය්‍යා=අඩුතුන් වියතෙකි.

10 යො පන භික්ඛු=යම් මහණෙක්; සුගතචීවරප්පමාණං වා=සුගත් සිවුර පමණ කොට ඇති හෝ; අතිරෙකං වා=අධික කොට ඇති හෝ; චීවරං කාරාපෙය්‍ය=සිවුරක් කරවා නම්=ඡෙදනකං පාචිත්තියං=ඡෙදනක පචිති වේ; තත්‍ර=එහි ලා; ඉදං=මේ; සුගතස්ස=සුගත්හු ගේ; සුගතචීවරප්පමාණං=සුගත් සිවුරේ පමණයි; දීඝසො=දිගින්; සුගතවිදත්ථියා නව විදත්ථියො=සුගත් විතින් නව වියති;

කච්චිත්ථ පරිසුද්ධා, තතියම්පි පුච්ඡාමි, කච්චිත්ථ පරිසුද්ධා, පරිසුද්ධෙ'ත්ථා'යස්මන්තො, තස්මා තුණ්හී, එවමෙ'තං ධාරයාමීති.

**පාචිත්තියා නිට්ඨිතා.**

—:o:—

**a ඉමෙ ඛො පනා'යස්මන්තො චත්තාරො පාටිදෙසනියා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.**

1 යො පන භික්ඛු අඤ්ඤාතිකාය භික්ඛුනියා අන්තරඝරං පවිට්ඨාය හත්ථතො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා, පටිදෙසෙතබ්බං තෙන භික්ඛුනා ගාරය්හං ආවුසො ධම්මං ආපජ්ජිං අසප්පායං **පාටිදෙසනියං,** තං පටිදෙසෙමීති,

2 භික්ඛූ පනෙ'ව කුලෙසු නිමන්තිතා භුඤ්ජන්ති, තත්‍ර චෙසා භික්ඛුනී වොසාසමානරූපා ඨිතා හොති "ඉධ සූපං දෙථ ඉධ ඔදනං දෙථා" ති, තෙහි භික්ඛූහි සා භික්ඛුනී අපසාදෙතබ්බා "අපසක්ක

---

තිරියං ඡ විදත්ථියො=සරස ස-වියතෙකි; ඉදං=මේ; සුගතස්ස=සුගත් හුගේ; සුගතචීවරප්පමාණං=සුගත් සිවුරේ පමණයි.

**9 රතන වර්ගයයි.**

**පචිති ඇවැත්හු නිමියහ.**

—:o:—

a ආයස්මන්තො=ආයුෂ්මත්හි; පාටිදෙසනියා=පාටිදෙසනීය නම් වූ; ඉමෙ ඛො පන චත්තාරො ධම්මා=මේ සිවු ඇවැත් කෙනෙක්; උද්දෙසං ආගච්ඡන්ති=උදෙසීමට එත්.

1 යො පන භික්ඛු=යම් මහණෙක්; අන්තරඝරං පවිට්ඨාය=ඇතුළු ගමට පිවිසි; අඤ්ඤාතිකාය භික්ඛුනියා හත්ථතො=නො නෑ මෙහෙණක අතින්; ඛාදනීයං වා භොජනීයං වා=ඛාදනීය හෝ භොජනීය හෝ; සහත්ථා පටිග්ගහෙත්වා=සියතින් පිළිගෙන; ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා=කා නම් හෝ වළඳා නම් හෝ; තෙන භික්ඛුනා=ඒ මහණහු විසින්; ආවුසො=ඇවැත; ගාරය්හං=ගැරහිය යුතු වූ; අසප්පායං=නුසුදුසු වූ; පාටිදෙසනියං ධම්මං=පාටිදෙසනීය නම් ඇවැතකට; ආපජ්ජිං=පැමිණියෙමි; තං=ඒ ඇවැත; පටිදෙසෙමි ඉති=දෙසමි යි; පටිදෙසෙතබ්බං=දෙසිය යුතු.

2 භික්ඛූ පනෙ'ව=භික්ෂූහු වනාහි; නිමන්තිතා=ක්ෂත්‍රියාදීන් විසින් භොජනයෙන් පවරන ලද්දාහු; කුලෙසු=කුල ගෙවල; භුඤ්ජන්ති=වළඳත් ද; ඉධ සූපං දෙථ=මෙහි සූපදෙව; ඉධ ඔදනං දෙථ ඉති=මෙහි බත් දෙවයි; වොසාසමානරූපා=විධාන කරන ස්වභාව ඇත්තා වූ; එසා භික්ඛුනී=මේ මෙහෙණ; තත්‍ර ච=ඒ කුල



තාව භගිනි යාව භික්ඛූ භුඤ්ජන්තී" ති; එකස්ස'චෙපි භික්ඛුනො න පටිභාසෙය්‍ය තං භික්ඛුනිං අපසාදෙතුං "අපසක්ක තාව භගිනි යාව භික්ඛූ භුඤ්ජන්තී" ති, පටිදෙසෙතබ්බං තෙහි භික්ඛූහි ගාරය්හං ආවුසො ධම්මං ආපජ්ජිම්හා අසප්පායං **පාටිදෙසනියං,** තං පටිදෙසෙමාති.

3 යානි ඛො පන තානි සෙඛසම්මතානි කුලානි, යො පන භික්ඛු තථාරූපෙසු සෙඛසම්මතෙසු කුලෙසු පුබ්බෙ අනිමන්තිතො අගිලානො ඛාදනීයං වා භොජනීයං වා සහත්ථා පටිග්ගහෙත්වා ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා පටිදෙසෙතබ්බං තෙන භික්ඛුනා ගාරය්හං ආවුසො ධම්මං ආපජ්ජිං අසප්පායං **පාටිදෙසනියං**, තං පටිදෙසෙමීති.

4 යානි ඛො පන තානි ආරඤ්ඤකානි සෙනාසනානි සාසඞ්කසම්මතානි සප්පටිභයානි, යො පන භික්ඛු තථාරූපෙසු සෙනාසනෙසු විහරන්තො[1] පුබ්බෙ අප්පටිසංවිදිතං ඛාදනීයං වා භොජනීයං වා අජ්ඣාරාමෙ සහත්ථා පටිග්ගහෙත්වා අගිලානො ඛාදෙය්‍ය වා භුඤ්ජෙය්‍ය වා, පටිදෙසෙතබ්බං තෙන භික්ඛුනා ගාරය්හං ආවුසො ධම්මං ආපජ්ජිං අසප්පායං **පාටිදෙසනියං**, තං පටිදෙසෙමීති.

---

යෙහි ද; ඨිතා හොති=සිටිනී වෙයි ද; භගිනි=නැහෙණියෙනි; යාව භික්ඛූ භුඤ්ජන්ති=යම් තාක් භික්ෂූහු වළඳමින් සිටිත් ද; තාව=ඒ තාක්; අපසක්ක ඉති=ඉවත යව යි; සා භික්ඛුනී=ඒ මෙහෙණ; තෙහි භික්ඛූහි=ඒ වළඳන මහණුන් විසින්; අපසාදෙතබ්බා=පහ කට යුත්තිය; භගිනි, යාව භික්ඛූ භුඤ්ජන්ති, තාව අපසක්ක ඉති තං භික්ඛුනිං; අපසාදෙතුං=පහ කරන්නට; එකස්ස අපි භික්ඛුනො=එක් මහණකුට ද; න පටිභාසෙය්‍ය චෙ=නො වැටහිණි නම්;

3 සෙඛසම්මතානි=සෙඛසම්මුති ලද; යානි ඛො පන තානි කුලානි=යම් ඒ කුලයෝ වෙත් ද; යො පන භික්ඛු; තථාරූපෙසු=එබඳු වූ; සෙඛසම්මතෙසු කුලෙසු=සෙඛසම්මුති ලද කුලයන්හි; පුබ්බෙ=ඝරුපචාරයට වැදීමට පළමු ව; අනිමන්තිතො=ආරාධනය නොකරන ලද්දේ; අගිලානො=ගිලනෙක් නුවූයේ; ඛාදනීයං වා භොජනීයං වා, සහත්ථා පටිග්ගහෙත්වා ඛාදෙය්‍ය වා= (අනු සුගමයි)

4 සාසඞ්කසම්මතානි=සාසඞ්කයයි සම්මත වූ; සප්පටිභයානි=බලවත් බිය ඇති; ආරඤ්ඤකානි=අරණෙහි වූ; යානි ඛො පන තානි සෙනාසනානි=යම් ඒ සෙනසුන් කෙනෙක් ඇත් ද; යො පන භික්ඛු=යම් මහණෙක්; තථාරූපෙසු සෙනාසනෙසු විහරන්තො=එබඳු සෙන-

---

1 'විහරන්තොති' පදං චිරම්ම පොත්ථකෙසු නත්ථි

උද්දිට්ඨා ඛො ආයස්මන්තො චත්තාරො පාටිදෙසනීයා ධම්මා, තත්ථා'යස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා, දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා, තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා, පරිසුද්ධෙත්ථා'යස්මන්තො, තස්මා තුණ්හී, එවමෙ'තං ධාරයාමීති.

**පාටිදෙසනීයා නිට්ඨිතා.**

---

**a ඉමෙ ඛො පනා'යස්මන්තො සෙඛියා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.**

1 පරිමණ්ඩලං නිවාසෙස්සාමී'ති සික්ඛා කරණීයා.
2 පරිමණ්ඩලං පාරුපිස්සාමී'ති සික්ඛා කරණීයා.
3 සුපටිච්ඡන්නො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.
4 සුපටිච්ඡන්නො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.
5 සුසංවුතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.
6 සුසංවුතො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.
7 ඔක්ඛිත්තචක්ඛු අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.
8 ඔක්ඛිත්තචක්ඛු අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.
9 න උක්ඛිත්තකාය අනතංඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.
10 න උක්ඛිත්තකාය අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.

**පරිමණ්ඩලවග්ගො පඨමො**

---

සුත්හි වසන්නේ; පුබ්බෙ අප්පටිසංවිදිතං=පළමුවෙන් නොවිචාරා ගෙනෙන ලද; ඛාදනීයං වා භොජනීයං වා; අජ්ඣාරාමෙ=අරම තුළ දී; සහත්ථා පටිග්ගහෙත්වා; අගිලානො=ගිලන් නුවූයේ;

**පාටිදෙසනීයයෝ නිමියහ.**

---

a ආයස්මන්තො=ආයුෂ්මත්නි; ඉමෙ ඛො පන සෙඛියා ධම්මා= මේ හික්මිය යුතු වූ ධර්මයෝ; උද්දෙසං ආගච්ඡන්ති=උදෙසීමට එති.

1 පරිමණ්ඩලං=හාත්පසින් වට වන සේ; නිවාසෙස්සාමි ඉති= හඳනය හඳින්නෙමි යන; සික්ඛා=ශික්ෂා තොමෝ; (භික්ඛුනා=මහණහු විසින්) කරණීයා=කටයුත්තීය; 2. පරිමණ්ඩලං=වට ව; පාරුපිස්සාමි=පොරෝනා සිවුර පොරවන්නෙමි යි, 3. සුපටිච්ඡන්නො= සුපිළිසන්ව; අන්තරඝරෙ=ඇතුළු ගමෑ; ගමිස්සාමි ඉති=යන්නෙමියි; 4 නිසීදිස්සාමි ඉති=හිඳින්නෙමියි; 5-6 සුසංවුතො=සුවිනීත ව; 7-8. ඔක්ඛිත්තචක්ඛු=යටට හෙළන ලද ඇස් ඇති ව; 9-10 උක්ඛිත්තකාය=එක් පසින් හෝ දෙපසින් හෝ ඔසවන ලද සිවුරෙන් උපලක්ෂිත ව;

**1. පරිමණ්ඩල වග්ගයයි.**



1. න උජ්ජග්ඝිකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.
2. න උජ්ජග්ඝිකාය අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.
3. අප්පසද්දො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.
4. අප්පසද්දො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.
5. න කායප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.
6. න කායප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.
7. න බාහුප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.
8. න බාහුප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.
9. න සීසප්පචාලකං අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.
10. න සීසප්පචාලකං අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.

**උජ්ජග්ඝිකාවග්ගො දුතියො.**

---

1. න ඛම්භකතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.
2. න ඛම්භකතො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.
3. න ඔගුණ්ඨිතො අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.
4. න ඔගුණ්ඨිතො අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.
5. න උක්කුටිකාය අන්තරඝරෙ ගමිස්සාමීති සික්ඛා කරණීයා.
6. න පල්ලත්ථිකාය අන්තරඝරෙ නිසීදිස්සාමීති සික්ඛා කරණීයා.
7. න සක්කච්චං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.
8. පත්තසඤ්ඤී පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.
9. සමසූපකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.
10. සමතිත්තිකං පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.

**ඛම්භකතවග්ගො තතියො.**

---

1-2. උජ්ජග්ඝිකාය=මහ සිනා ඇති ව; 3-4. අප්පසද්දො=අල්ප ශබ්ද ඇත්තේ; 5-6. කායප්පචාලකං=කයේ සෙලවීම ඇති ව; 7-8. බාහුප්පචාලකං=අත් සෙලවීම් ඇති ව; 9-10. සීසප්පචාලකං=හිස සෙලවීම ඇති ව;

**2. උජ්ජග්ඝිකා වග්ගයයි.**

---

1-2. ඛම්භකතො=උකුලෙහි තැබූ අත් ඇති ව; 3-4. ඔගුණ්ඨිතො=හිස වසා පෙරෙව්යේ; 5. උක්කුටිකාය=අත් පත්ලෙන් හෝ විළුඹින් හෝ යන ගමනින්; 6. පල්ලත්ථිකාය=අතින් හෝ වස්ත්‍රයෙන් හෝ අකවටු ඇවිළීම ඇති ව; 7 සක්කච්චං=සිහි එළවා; පිණ්ඩපාතං පටිග්ගහෙස්සාමි ඉති=අහර පිළිගනිමියි; 8. පත්තසඤ්ඤී=පාත්‍රයෙහි

1. සක්කච්චං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.
2. පත්තසඤ්ඤී පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.
3 සපදානං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.
4. සමසූපකං පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.
5. න ථූපතො ඔමද්දිත්වා පිණ්ඩපාතං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.
6. න සූපං වා බ්‍යඤ්ජනං වා ඔදනෙන පටිච්ඡාදෙස්සාමි භිය්‍යොකම්‍යතං උපාදායා'ති සික්ඛා කරණීයා.
7. න සූපං වා ඔදනං වා අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.
8. න උජ්ඣානසඤ්ඤී පරෙසං පත්තං ඔලොකෙස්සාමීති සික්ඛා කරණීයා.
9. නා'තිමහන්තං කබළං කරිස්සාමීති සික්ඛා කරණීයා.
10. පරිමණ්ඩලං ආලොපං කරිස්සාමීති සික්ඛා කරණීයා.

**සක්කච්චවග්ගො චතුත්ථො.**

---

පිහිටි සංඥ ඇත්තේ; 9. සමසූපකං=ප්‍රමාණවත් සූප ඇතිව; 10. සමතිත්තිකං=මුවවිට යට රේඛාව හා සමව පිරුණු;

**3. ඛම්භකත වර්ගයයි.**

1. සක්කච්චං=සිහි ඇති ව; 2. පත්තසඤ්ඤී=පාත්‍රගත සංඥ ඇත්තේ; 3. සපදානං=අනුපිළිවෙළින්; 4. සමසූපකං=ප්‍රමාණයුක්ත සූප ඇති ව; 5. ථූපතො=බත මුදුනින්; ඔමද්දිත්වා=හනා; 6. භිය්‍යොකම්‍යතං උපාදාය=බොහෝ ගනු කැමැති බව නිසා; සූපං වා=සූපයක් හෝ; බ්‍යඤ්ජනං වා=මාළු හෝ; ඔදනෙන=බතින්; න පටිච්ඡාදෙස්සාමි ඉති=නො සඟවමි යි; 7. සූපං වා=සූපයක් හෝ; ඔදනං වා=බත් හෝ; අගිලානො=ගිලන් නුවූයේ; අත්තනො අත්ථාය=තමන් සඳහා; විඤ්ඤාපෙත්වා=ඉල්වා ගෙන;

8. උජ්ඣානසඤ්ඤී=දොස් කියන සිත් ඇත්තේ; පරෙසං පත්තං=මෙරමා වළඳන පය; න ඔලොකෙස්සාමි=නො බලමියි;

9. අතිමහන්තං=ඉතා මහත්වූ; කබළං=බත් ආලොපය; න කරිස්සාමි ඉති=නො කරමියි; 10. පරිමණ්ඩලං=වට කොට; ආලොපං කරිස්සාමි=ආලොපය කරමියි;

**4. සක්කච්ච වර්ගයයි.**



1. න අනාහටෙ කබළෙ මුඛද්වාරං විවරිස්සාමීති සික්ඛා කරණීයා.
2. න භුඤ්ජමානො සබ්බං හත්ථං මුඛෙ පක්ඛිපිස්සාමීති සික්ඛා කරණීයා.
3. න සකබළෙන මුඛෙන බ්‍යාහරිස්සාමීති සික්ඛා කරණීයා.
4. න පිණ්ඩුක්ඛෙපකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.
5. න කබළාවච්ඡෙදකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.
6. න අවගණ්ඩකාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.
7. න හත්ථනිද්ධුනකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.
8. න සිත්ථාවකාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.
9. න ජිව්හානිච්ඡාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.
10. න චපුචපුකාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

**කබළවග්ගො පඤ්චමො**

1. න සුරුසුරුකාරකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.
2. න හත්ථනිල්ලෙහකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.
3. න පත්තනිල්ලෙහකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.
4. න ඔට්ඨනිල්ලෙහකං භුඤ්ජිස්සාමීති සික්ඛා කරණීයා.

---

1. කබළෙ=ආලොපය; අනාහටෙ=මුවට නොඑළවූ සඳ; මුඛද්වාරං=මුඛය; න විවරිස්සාමි ඉති=විවර නොකරමියි;

2. භුඤ්ජමානො=වළඳමින්; සබ්බං හත්ථං=සියලු ඇඟිලි; මුඛෙ=මියෙහි; න පක්ඛිපිස්සාමි ඉති=නොලමියි;

3. සකබළෙන මුඛෙන=ආලොපය සහිත මුවින්; න බ්‍යාහරිස්සාමි ඉති=කථා නො කරමියි;

4. පිණ්ඩුක්ඛෙපකං=ආලොපය මුවට දමා ගසමින්;

5 කබළාවච්ඡෙදකං=ආලොපය කඩ කඩා; 6. අවගණ්ඩකාරකං=වඳුරන් සේ හක්කෙහි රැස් කොට; 7. හත්ථනිද්ධුනකං=අත ගසා දමමින්; 8. සිත්ථාවකාරකං=බත් හුළු විසුරුවමින්; 9. ජිව්හානිච්ඡාරකං=තොලින් පිටතට දිව නෙර නෙරා; 10. චපුචපුකාරකං=‘චපු චපු’ යන හඬ ඇති ව;

**5. කබළ වර්ගයයි.**

1. සුරුසුරුකාරකං=‘සුරු සුරු’ යන හඬ ඇති ව; න භුඤ්ජිස්සාමි=පානීයවගී නොවළඳමියි; 2. හත්ථනිල්ලෙහකං=අත ලෙව ලෙව; 3. පත්තනිල්ලෙහකං=ඇඟිල්ලෙන් පාත්‍රය ලෙව ලෙව; 4. ඔට්ඨනිල්ලෙහකං=දිවින් පිටිතොල ලෙව ලෙව; 5. සාමිසෙන

5. න සාමිසෙන හත්ථෙන පානීයථාලකං
පටිග්ගහෙස්සාමීති සික්ඛා කරණීයා.
6. න සසිත්ථකං පත්තධොවනං අන්තරඝරෙ
ඡඩ්ඩෙස්සාමීති සික්ඛා කරණීයා.
7. න ඡත්තපාණිස්ස අගිලානස්ස ධම්මං
දෙසිස්සාමීති සික්ඛා කරණීයා.
8 න දණ්ඩපාණිස්ස අගිලානස්ස ධම්මං
දෙසිස්සාමීති සික්ඛා කරණීයා
9. න සත්ථපාණිස්ස අගිලානස්ස ධම්මං
දෙසිස්සාමීති සික්ඛා කරණීයා.
10. න ආයුධපාණිස්ස අගිලානස්ස ධම්මං
දෙසිස්සාමීති සික්ඛා කරණීයා.

### සුරුසුරුවග්ගො ඡට්ඨො

1. න පාදුකාරූළ්හස්ස අගිලානස්ස ධම්මං
දෙසිස්සාමීති සික්ඛා කරණීයා.
2. න උපාහනාරූළ්හස්ස අගිලානස්ස ධම්මං
දෙසිස්සාමීති සික්ඛා කරණීයා.
3. න යානගතස්ස අගිලානස්ස ධම්මං
දෙසිස්සාමීති සික්ඛා කරණීයා.
4. න සයනගතස්ස අගිලානස්ස ධම්මං
දෙසිස්සාමීති සික්ඛා කරණීයා.

---

හත්ථෙන=ආමිස සහිත අතින්; පානීයථාලකං=පැන්බොන තල්ලි; න පටිග්ගහෙස්සාමි=නො පිළිගනිමියි; 6. සසිත්ථකං=හුළු සහිත; පත්තධොවනං=පා දෙවූ දිය; 7. ඡත්තපාණිස්ස=කුඩ ගත් අත් ඇති; අගිලානස්ස=අගිලනාට; 8. දණ්ඩපාණිස්ස=දඬු ගත් අත් ඇති; 9. සත්ථපාණිස්ස=කඩු ඈ සැත් ගත් අත් ඇති; 10 ආයුධපාණිස්ස=දුනු ඈ ආයුධ ගත් ඇති;

### 6. සුරු සුරු වර්ගයයි.

1. පාදුකාරූළ්හස්ස=පය ලූ මිරිවැඩි ඇති; 2. උපාහනාරූළ්හස්ස=පය ලූ වහන් ඇති; 3. යානගතස්ස=රථාදියෙහි හුන්; 4. සයනගතස්ස=බිම තමුදු හොත්තාවූ; 5. පල්ලත්ථිකාය නිසින්නස්ස=අකවටු බැඳ හුන්නාවූ; 6. වෙඨිතසීසස්ස=කෙසාන්තය නො පෙනෙන සේ හිස් වෙළුම් ලා සිටි; 7. ඔගුණ්ඨිතසීසස්ස=හිස වසා පෙරෙවියා වූ; 8. ඡමාය නිසීදිත්වා=බිම හිඳ; ආසනෙ නිසින්නස්ස=අසුනෙක්හි හුන්නාවූ; 9. නීචෙ ආසනෙ නිසීදිත්වා=මිටි අස්නෙහි හිඳ; උච්චෙ ආසනෙ නිසින්නස්ස=උස් අසුන්හි හුන්; 10. ඨිතො=



5. න පල්ලත්ථිකාය නිසින්නස්ස අගිලානස්ස ධම්මං
දෙසිස්සාමීති සික්ඛා කරණීයා
6. න වෙඨිතසීසස්ස අගිලානස්ස ධම්මං
දෙසිස්සාමීති සික්ඛා කරණීයා.
7 න ඔගුණ්ඨිතසීසස්ස අගිලානස්ස ධම්මං
දෙසිස්සාමීති සික්ඛා කරණීයා.
8. න ඡමාය නිසීදිත්වා ආසනෙ නිසින්නස්ස
අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා.
9 න නීචෙ ආසනෙ නිසීදිත්වා උච්චෙ ආසනෙ නිසින්නස්ස
අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා.
10. න ඨිතො නිසින්නස්ස අගිලානස්ස ධම්මං
දෙසිස්සාමීති සික්ඛා කරණීයා.
11. න පච්ඡතො ගච්ඡන්තො පුරතො ගච්ඡන්තස්ස
අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා.
12. න උප්පථෙන ගච්ඡන්තො පථෙන ගච්ඡන්තස්ස
අගිලානස්ස ධම්මං දෙසිස්සාමීති සික්ඛා කරණීයා.
13. න ඨිතො අගිලානො උච්චාරං වා පස්සාවං වා
කරිස්සාමීති සික්ඛා කරණීයා.
14. න හරිතෙ අගිලානො උච්චාරං වා පස්සාවං වා
ඛෙළං වා කරිස්සාමීති සික්ඛා කරණීයා.
15. න උදකෙ අගිලානො උච්චාරං වා පස්සාවං වා
ඛෙළං වා කරිස්සාමීති සික්ඛා කරණීයා.

### පාදුකවග්ගො සත්තමො.

උද්දිට්ඨා ඛො ආයස්මන්තො සෙඛියා ධම්මා, තත්ථායස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා, දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා; තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා, පරිසුද්ධෙත්ථා'යස්මන්තො, තස්මා තුණ්හී, එවමෙතං ධාරයාමීති.

### සෙඛියා නිට්ඨිතා.

---

යන්නේ; පුරතො ගච්ඡන්තස්ස=පෙරටුව යන්නාවූ; 12. උප්පථෙන ගච්ඡන්තො=නො මඟින් යන්නේ; පථෙන ගච්ඡන්තස්ස=මඟින් යන; 13. ඨිතො=සිටියෙම්; අගිලානො=නොගිලන් ව; උච්චාරං වා=මල කිස හෝ; පස්සාවං වා=වටත් කිස හෝ; 14 හරිතෙ=නිල් තණ ඈ මත්තෙහි; 15. අගිලානො=ගිලන් නුවූයේ; උදකෙ=පරිභොගාහී දියෙහි;

### 7. පාදුක වර්ගයයි

a **ඉමෙ ඛො පනායස්මන්තො සත්ත අධිකරණසමථා ධම්මා උද්දෙසං ආගච්ඡන්ති.**

1 උප්පන්නුප්පන්නානං අධිකරණානං සමථාය වූපසමාය සම්මුඛා විනයො දාතබ්බො, 2. සති විනයො දාතබ්බො, 3. අමූළ්හ විනයො දාතබ්බො, 4. පටිඤ්ඤාය කාරෙතබ්බං, 5. යෙභුය්‍යසිකා, 6. තස්ස පාපියසිකා, 7. තිණවත්ථාරකොති.

උද්දිට්ඨා ඛො ආයස්මන්තො සත්ත අධිකරණසමථා ධම්මා, තත්ථා'යස්මන්තෙ පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා, දුතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා, තතියම්පි පුච්ඡාමි කච්චිත්ථ පරිසුද්ධා; පරිසුද්ධෙ'ත්ථා'යස්මන්තො, තස්මා තුණ්හී එවමෙ'තං ධාරයාමීති.

**අධිකරණ සමථා නිට්ඨිතා.**

———

උද්දිට්ඨං ඛො ආයස්මන්තො නිදානං, උද්දිට්ඨා චත්තාරො පාරාජිකා ධම්මා, උද්දිට්ඨා තෙරස සඞ්ඝාදිසෙසා ධම්මා, උද්දිට්ඨා ද්වෙ අනියතා ධම්මා, උද්දිට්ඨා තිංස නිස්සග්ගියා පාචිත්තියා ධම්මා, උද්දිට්ඨා ද්වෙ නවුති පාචිත්තියා ධම්මා, උද්දිට්ඨා චත්තාරො පාටිදෙසනීයා ධම්මා, උද්දිට්ඨා සෙඛියා ධම්මා, උද්දිට්ඨා සත්ත අධිකරණ සමථා ධම්මා, එත්තකං තස්ස භගවතො සුත්තාගතං සුත්තපරියාපන්නං අන්වද්ධමාසං උද්දෙසං ආගච්ඡති, තත්ථ සබ්බෙහෙ'ව සමග්ගෙහි සම්මොදමානෙහි අවිවදමානෙහි සික්ඛිතබ්බන්ති.

**විත්ථාරුද්දෙසො පඤ්චමො.**

——:o:——

**භික්ඛු පාතිමොක්ඛං නිට්ඨිතං**

---

a ආයස්මන්තො=ආයුෂ්මතුනි; අධිකරණ සමථා=අධිකරණයන් සංසිඳුවන; ඉමෙ ඛො පන සත්ත ධම්මා=මේ සත් වැදෑරුම් ධර්ම කෙනෙක්; උද්දෙසං ආගච්ඡන්ති=උදෙසිය යුතු බවට පැමිණෙත්.

උප්පන්නුප්පන්නානං=උපනුපන්; අධිකරණානං=විවාදාදි අධිකරණයන් ගේ; සමථාය=සමනය පිණිස; වූපසමාය=සංසිඳවීම පිණිස; සම්මුඛා විනයො දාතබ්බො=සම්මුඛාවිනය දිය යුත්තේය; සතිවිනයො දාතබ්බො=සතිවිනය දිය යුත්තේය; අමූළ්හවිනයො දාතබ්බො=අමූළ්හවිනය දිය යුත්තේය; පටිඤ්ඤාය කාරෙතබ්බං=පටිඤ්ඤාවෙන් කරවිය යුතු; යෙභුය්‍යසිකා=යෙභුය්‍යසිකා කටයුත්තීය; තස්සපාපියසිකා=එනම් සමථය කට යුතු; තිණවත්ථාරකො=තිණවත්ථාරකය කටයුතු.

**අධිකරණ සමථයෝ සමාප්තයහ.**

——:o:——

**ප්‍රාතිමොක්ෂ ව්‍යාඛ්‍යාව නිමි,**

# පාතිමොක්ඛදීපිකා.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

## පූර්වකෘත්‍ය.

සඟමැද විනය පිළිවිසීමත් විසඳීමත් සම්මුතිය ලැබ කළයුතු බැවින් පාමොක් උදෙසීමට පළමුව නවවිධ පූර්වකෘත්‍යයන්ගේ ද චතුර්විධ පත්තකාලඞ්ගයන්ගේ ද සම්පූර්ණ බව විචාරනු පිණිස, පාමොක් උදෙසන භික්ෂුව **'සුණාතු මෙ භන්තෙ'** යන ආදි ඤත්ති වාක්‍යය කියා තමන් සම්මතකොට ගනී. දෙවෙනි ඤත්ති වාක්‍යයෙන් සම්මුතිය ලැබ ගන්නා ආරාධක භික්ෂුව විසඳීම සිදු කරයි. පොහෝ කිරීමට පෙර කටයුතු පුබ්බකරණාදිය නම් කරනු සඳහා, **විනය අටුවාවෙහි** එන **'සම්මජ්ජනී'** යන ආදි ගාථාත්‍රය පාතිමොක්ඛපාළියේ ද නිදානුද්දෙසයට මුලින් පසු කාලෙක යොදා ඇත්තේය. සමහර පොතෙක පැනෙන **'සම්මජ්ජන කරණං'** යනාදි අර්ථකථනය ද මාතිකාට්ඨකථා විනයත්ථමඤ්ජූසාවන් සමාශ්‍රය කොට පසුව යොදන ලද්දෙකි. **"සඞ්ඝස්ස පත්තකල්ලං, කිං සඞ්ඝස්ස පුබ්බකිච්චං"** යන නිදාන පාඨයනට අනුව ඒ ගාථා පොතෙහි යොදනලද නමුත්, ඒවා කියාම පාමොක් උදෙසිය යුතු යයි නියමයෙක් නැත. පුබ්බකරණාදීන් ගේ නිමාව විචාරනු පිණිස දෙශක ආරාධක දෙදෙනාගේ වචන ප්‍රතිවචන ක්‍රමයෙන් කීමේ වරදෙක් ද නැත. මෙය පිළිබඳ විමර්ශනයෙක් **විනයාලඞ්කාර ටීකාවෙහි** එයි.

———

## නිදානුද්දෙසය

1 **සුණාතු මෙ භන්තෙ**

**'සුණාතු'** යන්නෙන් අසන්නට අණ කරයි. මේ අණවීම පාමොක් උදෙසන්නාගේ නොව බුදුන්ගේය. **'ආවුසො'** යි නොදක්වා **'භන්තෙ'** යි දක්වීමෙන් සඞ්ඝයා ගෞරව වචනයට සුදුසු බව ද, සඞ්ඝස්ථවිර ම නොව ව්‍යක්ත භික්ෂුවත් විනයේ දී ස්වාමි බව ද හඟවයි. උද්දෙස දෙකක් වත් කටපාඩමින් කිය හැකි වනොත් සඞ්ඝස්ථවිරයන්හට ම පාමොක් උදෙසුම අයත් වේ. (මෙයින් අන්තරායයක් නැතිව ද සැකෙවින් පාමොක් උදෙසිය හැකි බව පැනෙයි.) නොඑසේ නම් ව්‍යක්ත (-පෙළ කටපාඩම් ඇති) ප්‍රතිබල (-මැනවින් උසුරුවිය හැකි) භික්ෂුවට අයත් වේ.

## 2 සඞ්ඝො

දක්ඛිණෙය්‍ය සඞ්ඝ සම්මුති සඞ්ඝයයි සඞ්ඝයා ද්විප්‍රකාර වේ. **දක්ඛිණෙය්‍යසඞ්ඝයා** නම් ආර්‍ය්‍යසඞ්ඝයායි. අරිය අනරිය වෙසෙසක් නැතිව සියලු භික්ෂු සමූහයා **සම්මුති සඞ්ඝයා**යි. විනය කම් විසින් සම්මුති සඞ්ඝයා පඤ්චවිධයි.

i. **චතුවග්ග**- උපසම්පදා පවාරණා අබ්භාන හැර සෙසු කම් කළ හැකියි.

ii. **පඤ්චවග්ග**-අබ්භාන මධ්‍යදෙශොපසම්පදා හැර සෙසු කම් කළ හැකියි. දෙවැන්න දසවග්ග කරණීයයි.

iii. **දසවග්ග**-අබ්භානය හැර සෙස්ස කළ හැකියි.

iv. **වීසතිවග්ග**-සියලු විනය කම් කළ හැකියි.

v. **අතිරෙක වීසතිවග්ග**- විනය කම්හි දී අධික ව වටනා බවත් ඌන ව නොවටනා බවත් දැක්වීමට මෙසේ කියවිණ.

## 3 අජ්ජුපොසථො පන්නරසො

උපොසථ ශබ්දය මෙහි දිනවාචක වේ. එක් ඍතුවකට අට බැගින් වසරකට පොහෝ සූවිස්සෙක් වේ. තෙවෙනි සත්වැනි පොහෝ චාතුද්දසිකයි. සෙස්ස පන්නරසිකයි. පක්ෂයකට වරක් තුදුස්වක් දින හෝ පසළොස්වක් දින හෝ පොහෝ කරන්නට අනුදන වදාළ බැවිනුත්, භණ්ඩනකාර මහණුන් පවාරණට්ඨපනය කරන්නට සැරසෙන ලකුණු පැනුණුකල දෙ-තුන් පොහොයක් තුදුස්වක් දින කරන්නට අනුදන වදාළ බැවිනුත්, ආගන්තුකයන් ආවාසිකයන් හට අනුව යායුතු යන ආදිය වදාළ බැවිනුත්, තෙවෙනි සත්වැනි පොහෝ හැර සෙසු පොහෝ පැමිණි කලත්, තුදුස්වක්හි උපොසථ කරණයට හැකි බව පැනෙයි.

ආවාසික භික්ෂූහු කිසියම් කාරණෙකින් දෙවෙනි පොහොය තුදුස්වක්හි කළහ. එදින සිට දින ගණන් ගැනීමේ දී ඔවුනට තෙවෙනි තුදුස්වක් පොහොය, පක්ෂයේ තෙළෙස්වක් දිනට පැමිණේ. එදින අනුපොසථ දිනයක් බැවින් පසුදා හෙවත් තුදුස්වකද ඔවුහු **'පන්නරසො'** යි පූ කිස කොට පොහෝ කරති. ආගන්තුක භික්ෂූහු පියෙවි සිරිත අනුව දෙවැන්න පසළොස්වක්හි ද තෙවැන්න තුදුස්වක්හිද කළ හැකිවෙත්. මේ දෙපක්ෂය එක් සීමාවකට රැස් ව පොහෝ කරන්නට පූ කිස කරන කල්හි වැඩිපක්ෂයට අනුව ගොස් **'අජ්ජුපොසථො චාතුද්දසො'**යි හෝ **'පන්නරසො'**යි හෝ එකක් නියම්කොට ගත යුතු. මේ අදහස **ඛුද්දසික්ඛාටීකාවෙහි** පැනේ.



ආවාසිකයන් වැඩිවීම නිසා 'පන්නරසො'යි තෙවෙනි පොහොය කළවිට, නියම පසළොස් වැනි දින ඔවුනට පැළවිය වෙයි. ආගන්තුකයනට එදින පසළොස්වකමැයි. මෙසේවූ විට පෙරදා පොහෝ කොට නිමවූ බැවින් කැමැත්තාහු නම් ආවාසිකයෝ අන්පසට පැමිණිය යුත්තාහ. ඔවුන්ගේ කායසාමග්ගිය නො ලද හොත් ආගන්තුකයන් බැහැර සීමාවකට ගොස් පොහෝ කළ යුතු.

තුදුස්වක්හි පොහෝ කරන්නට රැස්ව ධම්සාකච්ඡා කරමින් සිටිය දී අරුණ නැංගහොත් පසුදා පන්නරස පොහොය කළ හැකියි. මේ **රතනිසාමිවාසියයි**.

තමන්ගේ පවාරණයේ දී කලහකාර මහණුන් පවාරණය වළකන්නට සැරසෙන බව දැනුණ හොත්, දෙ-තුන් පොහොයක් තුදුස්වක්හි කොටපියා, කලහකරුවනට තෙරස හෝ චාතුද්දස හෝ වන දිනයෙහි, තමනට පන්නරස පවාරණය කට හැකි වෙයි. දෙ-තුන් පොහොයක් යයි කී කල 3-4 හෝ 3-4-5 හෝ තුදුස්වක්හි කටයුතු. එවිට ද තෙවැන්න සමග තුදුස්වක් පොහෝ දෙකෙක් ලැබේ.

පළමුවෙන් පොහෝ කළ දින සිට තුදුස් දිනක් පිරීමෙන් තුදුස්වක් පොහොය ද, පසළොසක් පිරීමෙන් පනුරසි පොහොය ද පැමිණේ. තෙළෙස්වක උපොසථ දිනයක් නො වුව ද, ඇතැම් විට එදින ද පොහෝ කැරෙන බවක් උක්ත වාක්‍යයෙන් පැනෙයි. ලොකව්‍යවහාර තිථි අනුගමනය කිරීමේ දී පනුරසිය තුදුස්වක් කොට හෝ තුදුස්වක පනුරසිය කොට හෝ පොහො කළයුතු බව **විමතිවිනොදනියෙහි** එයි.

**සාමග්ගි උපොසථය**- කොසඹෑපුර භික්ෂූන් අතර මෙන් භෙද යක් ඇතිවූ විට, උක්ඛිත්තක භික්ෂුව සීමාවට පමුණුවා ඇවැත් දෙසවා, කම්මපටිප්පස්සද්ධි විසින් කම්වැකි කියා සහමැදට ගත් සඳ, සමගිය පිණිස එදවස කැරෙන පොහොය සාමග්ගි උපොසථ යයි. පනුරසි තුදුස්වක් දිනයන්හි සමග වී නම් පියෙවි පොහෝ කළයුතු. ඉල්මස හැර සෙසු එකොළොස් මස්හි මෙය ලැබේ.

**පවාරණය**- (=**ආපත්තිවිසොධනාය අත්තවොස්සග්ගො ඔකාසදානං.**) චාතුද්දසික පන්නරසික සාමග්ගියයි **පවාරණ දින තුනෙකි** පෙරවස් වුසුවනට වප් පුනුපෝය ද, කලහකාර භික්ෂූන් විසින් ඔවුන්ගේ පවාරණය "**ආගමෙ කාළෙ පවාරෙය්‍යාථ**" යි හෝ "**ආගමෙ ජුණ්හෙ පවාරෙය්‍යාථ**" යි හෝ කැතති තබා **පච්චුක්කඩ්ඩනය** (=ඉදිරියට දැමීම) කළ හොත් වප් කාලපක්ෂයේ සත්වැනි තුදුස්වක ද, ඉල් පුනුපෝදා ද, පවාරණ දින වන්නේය. "මෙ'මා

**ගිලානවෙ පවාරණා,"** යි වදාළ බැවින් තුදුස්වක් පසළොස්වක් දෙදිනෙන් කවර දිනෙක හෝ පැවරිය හැකි බව පැනෙයි. එහෙයින් මහවෙහෙර භික්ෂූහු තුදුස්වක්හි පවරා පසළොස්වක්හි කායසාමග්‍රිය දුන්හ; අටවක්හි චේතියගිරි දර්ශනයට ද ගියහ. මෙසේ යාම තුදුස්-වක්හි පවරණ අදහසින් වියයුතුයයි **වජිරබුද්ධි සාරත්ථදීපනී** ටීකා වල ප්‍රකාශිතයි. පවාරණයෙන් පසු අරුණ ගතවත්ම වුත්ථවස්ස වන බව මෙයින් පැනේ.

කොසඹෑපුරයෙහි මෙන් වස් වුසුවන් භිත්ත ව පවාරණට්ඨපනාදියෙකින් පවුරුණු කළ නො හෙන සඳ, යම් දිනෙක සමඟ වුව හොත්, එදින **"අජ්ජ පවාරණා සාමග්ගී"** යි සමඟි පවුරුණු කළ හැකියි. මෙය වප් පුනුපෝයට පසුදා සිට ඉල් පුනුපෝය තෙක් අතර කාලය තුළ කැරෙන්නෙකි.

**4 යදි සඞ්ඝස්ස පත්තකල්ලං.**

(පත්තො කාලො ඉමස්ස කම්මස්සා'ති= පත්තකාලං, පත්ත-කාලමෙ'ව පත්තකල්ලං, සකත්ථෙ ණ්‍යො) සඞ්ඝයා ගේ උපොසථ කරණය සඳහා කාලය සුදුසුවීමට අඞ්ග සතරක් සම්පූර්ණ විය යුතු.

i. පෙර කී පොහෝ දින තුනින් එකක් එළඹීම පළමු වැන්නයි.

ii. යටත් පිරිසෙයින් පුවතත් මහණුන් සිවු නමක්, එක් සීමාවෙක අත්පස නො හැර සිටීම දෙවැන්නයි. අනුක්ඛිත්තක අපාරාජික භික්ෂූහු පකතත්ත නම් වෙති. මෙහි දී අත්පස නම් එක් රියන් සමාරයයි ටීකා දෙකෙක්හි එයි. පවාරණ සික්ඛාදියෙහි දී දෙරියන් වියතයයි දක්විණ.

iii. සඞ්ඝයා සභාග වස්තුවෙකින් ඇවැතකට නො පැමිණ සිටීම තෙවැන්නයි. විකාලභොජනාදි සමාන වස්තුවෙකින් පත් ඇවැත **වත්ථුසභාග** නම් වේ. වෙන් වෙන් වස්තුවලින් පත් එකම ඇවැත **ආපත්තිසභාග** නම් වේ. ප්‍රථමය මෙහි ගැනේ. ලඝුවිනය කර්මයෙන් පිරිසිදුවන බැවින් ලහුකාපත්ති නම් වන ථුල්ලච්චය පාචිත්තිය පාටිදෙසනීය දුක්කට දුබ්භාසිතයෝ මෙහිලා ගැනෙති. වත්ථුසභාග සභාවෙසෙසක් ද ඇති කල පත්තකල්ල නොවතුදු එය දෙසනාගාමි නොවේ. විකල් බොජුනෙන් පත් පචිතිය, ගණ-භොජනාදි අන් වස්තුවෙකින් පචිතියට පත් වැ සිටින්නකු වෙත දෙසීමෙන් දුකුළා නො වේ. පොහො අග එබන්දකු නැතහොත් ඇවැත් දෙසා ගෙන එන සේ අසල වෙහෙරකට මහණකු යැවිය යුතු. ඔහු වෙත සෙස්සවුන් විසින් දෙසිය හැකියි. සභාගාපත්ති දෙසීමෙන් පිළිගැනීමෙන් වන දුකුළා ගැන නොතකා දෙසා නම්



ආපත්ති ආරොචනය සිදු වේ. නැවත එම දුකුළා දෙසිය යුතු, වස්තු සභාගාපත්ති නැතහොත් ආපත්ති සභාගය ඇත ද, සඞ්ඝයා ගේ පාමොක් උදෙසුම පත්තකාල ම වේ. ආපත්තිසභාග ඇවැත් ඇවැද පාමොක් උදෙසුමෙන් ඒ ඒ පුඟුලනට විනා සඞ්ඝයාට ඇවැත් නො වන හෙයිනි;

iv. ගහට්ඨ, භික්ඛුනී, සික්ඛමානා, සාමණේර, සාමණේරී, සික්ඛාපච්චක්ඛාතක, පාරාජික, ත්‍රිවිධ උක්ඛිත්තක, පණ්ඩක, ථෙය්‍යසංවාසක, තිත්ථියපක්කන්තක, තිරච්ඡානගත, භික්ඛුනි දූසක, මාතු පිතු අරහන්තඝාතක, සඞ්ඝභෙදක, ලොහිතුප්පාදක, උභතො බ්‍යඤ්ජනක යන එක්විසි දෙනකුන් අත්පසැ නො සිටීම සිව් වැන්නයි.

සීමා

- බද්ධසීමා
  - ඛණ්ඩ
  - සමානසංවාස
  - අවිප්පවාස
- අබද්ධසීමා
  - ගාම
  - සත්තබ්භන්තර
  - උදකුක්ඛෙප

## බද්ධ සීමාව.

එකොළොස් විපත් සිදු නො වන සේ, ත්‍රිවිධ සම්පත්තියෙන් යුක්ත කොට, නිමිති ගටා, කම්වැකි කියා සම්මත සිමාව බද්ධසීමාව යි. එකොළොස් විපත්තිහු මතු දැක්වෙති:-

**1 අතිඛුද්දිකා-** කම්ාහීයා සමඟ භික්ෂූන් එක්විස්සකට පරිමණ්ඩලාකාරයෙන් සුවසේ හිඳිය නො හැකි සීමාවයි. මෙබන්-දක් සම්මත කළ ද සීමාවෙක් නො වේ.

**2 අතිමහතී-** බද්ධසීමාව යටත්පිරිසෙයින් මහණුන් එක් විස්සකට හිඳීමට පමණ වියයුතු, උපරිම ප්‍රමාණය තුන් යොත් නෙකි, එයින් කෙසගක් පමණ නමුදු මහත් වී නම් අසීමායි.

**3 ඛණ්ඩනිමිත්තා-** මෙය **අඝටිතනිමිත්තා අනිමිත්-තුපගනිමිත්තා** යයි ද්විප්‍රකාරයි. පළමු කිර්තිත (=කියූ) නිමිත්ත අවසන්හි ද කිත්තනය නො කළහොත් අඝටිත නිමිත්තතාව වේ. නිමිත්තකට නො සැහෙන තල්-පොල් ආදි වෘක්ෂ හෝ වැලි-පස් ගොඩක් හෝ අතර නිමිත්තකට තැබීම දෙවැන්නයි. සීමාවකට යටත්පිරිසෙයින් නිමිති තුනක් තුන් දිසාවෙක පිහිටිය යුතුය. උඩත්පිරිසෙයින් සියගණනක් නමුදු තබා කැමැති හැඞයකට

සම්මත කටහැකියි. නිමිති තුන අතුරින් එකක් නුසුදුසු වීම මෙහි ගතයුතුය. වැඩි ගණනක් ඇති තැනෙක තුන් පැත්තෙක නිමිති තුනක් මිනා නම් නිවරදයි.

**4 ඡායානිමිත්තතා-** වෘක්ෂ පර්වතාදීන් ගේ සෙවණ නිමිති වශයෙන් තැබීමයි.

**5 අනිමිත්තතා-** සර්වාකාරයෙන් නිමිති නො කියා සම්මත කිරීමයි.

**6 බහිසීමෙ ඨිත සම්මතා-** කිත්තනය කළ නිමිතිවලින් බැහැරට ගොස් සම්මත කිරීම.

**7-8-9- නදී සමුද්‍ර ජාතස්සරවල බද්ධසීමා සම්මත කළ නොහේ.**

**10 සීමාය සීමං සම්භින්දනතා සම්මතා-** පෙර සම්මත අන් බද්ධසීමාවක් සමඟ සම්බද්ධ වන සේ සම්මත කිරීම.

මේ සම්බන්ධය වන අයුරු මාතිකාට්ඨකථාවේ එන අඹ දඹ උපමාවෙන් දත හැකිය. සීමා සඞ්කරය ගැන එක් වාද මුඛයෙක් එයින් පැන නැගුණේ විය.

**'අම්බා චේ'ව ජම්බුවා'ති වෙ රුක්ඛා අඤ්ඤමඤ්ඤං සංසත්තවිටපා හොන්ති** යනාදිය කී හෙයින් දඹගස ඇතුළු කොට අඹගස නිමිතිකොට පළමු සීමාව බැඳිණ. එ බව නො දත්තවුන් විසින් පසුව, අඹගස ඇතුළු කොට දඹගස නිමිති කොට දෙවෙනි සීමාව බැඳිණ. මෙයින් සීමා සම්භින්දනය විය. සීමා නිමිති ගාමසීමාවට විනා බද්ධසීමාවට අයත් නො වේ. ගාම බද්ධ සීමා දෙක වෘක්ෂලතාදියෙන් සම්බද්ධ වුවත් නිවරද යයි පවසන චෝළිය භික්ෂූහු අඹ-දඹ ගස්දෙකේ අතු එකිනෙක ගැටී තිබීම සම්මත සාධනයට සාධක කොට දක්වති.

සිවු දෙනකුනට එක්ව විනය කර්මයක් කළ නොහැකි තරම් අල්ප ප්‍රදෙශයක් සම්බද්ධවීමෙන් සීමාසම්භින්දනය ද, ඊට වඩා අල්ප වුවොත් අජ්ඣොත්ථරණය ද සිදු වේ. එක් මහණකුට අධිඨන් පොහෝ කළ නො හැකි ස්වල්ප ප්‍රමාණයක් අසුවීමෙන් සම්භින්දනය වෙයයි **අත්ථයොජනාවෙ** කියැවිණ.

ගාම-බද්ධසීමා වෘක්ෂලතාදි සම්බන්ධයෙන් සම්භින්දය නො වන බවට මතු දැක්වෙන නිදර්ශන ද ඉදිරිපත් කෙරෙති.

i සීමානිමිති සඳහා වැඩෙනසුලු පබ්බත- රුක්ඛ- වනාදිය නියම කිරීම. (සම්මතයෙන් පසු වැඩී බද්ධසීමාවට පිවිසෙනහෙයිනි.)



ii තෙයොදුන් මහාසීමාවක් සම්මත කිරීමේ දී ඒ භූමිය හා සම්බද්ධ සෙසු ගම්වල රුක් වැල් තෘණ ආදිය ඉවත් කළ යුතු බව සටහන් නො වීම. (ඉවත් කළයුතු නම් අටුවාවෙහි ඉදුරා එය දැක්වෙන්නේය, **කල්‍යාණි** සීමාව බැඳීමේ දී **ධම්මචෙතිය රජු** එසේ කළ බවක් **කල්‍යාණි ශිලාලිපියෙහි** එයි.)

iii වන මැද ගස් නො කපා වෙහෙරක් කරන කල, එහි බඳින සීමාව වනට්ඨ-සීමට්ඨ රුක්ලියෙන් සම්බද්ධවීම.

iv ටැම් මත කළ පහයේ උපරිමතලවල සීමා සම්මතය නියම කිරීම.

v තවද ඛණ්ඩසීමාවෙහි පිහිටි නුගගසේ අතු අරළු මහාසීමා භූමියෙ හෝ සීමට්ඨ (=සීමාවේ පිහිටි) රුක්ලිය හෝ පහසා සිටියේ නම්, මහාසීමාගත භික්ෂූන් අත්පසට ගෙන හෝ සිමින් පිටතට යවා හෝ ඛණ්ඩසීමාවේ කර්ම කළයුතුයයි ප්‍රකාශිත වුව ද, මහාසීමා-ඛණ්ඩසීමා දෙක අතරවූ ගාම සීමාව සමඟ සම්බද්ධවීමේ දොෂයෙක් නො කියැවිණ. මෙයින් ද ගාමසීමාව හා සම්බන්ධය දොෂකර නො වන බව පැනේ.

විසභාගසීමාවල විනා සභාගසීමාවල සඞ්කර දොෂයක් මොහු නො පිළිගනිති. බද්ධසීමා දෙකෙක සම්බන්ධය සංකරයට හෙතුයි. ගාමසීමාව හා සම්බන්ධය දොෂකර නම් ගමේ බද්ධසීමා සම්මුතිය ද අජ්ඣොත්ථරණය වන බැවින් සදොස විය යුතුයයි **විමතිවිනොදනියෙහි** ප්‍රකාශිතයි. මේ සියලු මතාන්තරවලින් පෙනීයන්නේ සමූහනනයෙන් ශුද්ධ කළ ගම සමඟ බද්ධසීමාවේ සම්බන්ධය නිවරද බවයි. එහෙත් අශුද්ධ ගම සමඟ සම්බන්ධය සැක ඉපදීමට හෙතුයි. පෙර සම්මත සීමාවක් වුව හොත් සඞ්කරය සිදුවන හෙයිනි. (මීට ප්‍රතිපක්ෂ කාරුණ්‍ය සීමාලඞ්කාර සඞ්ග්‍රහාදියෙන් දත හැකිය.)

**11 සීමාය සීමං අජ්ඣොත්ථරණතා සම්මතා- විමතිවිනොදනී** මතයෙන් පූර්ව සම්මත සීමාවෙක සිවුදෙනකුට එක්ව විනයකර්ම කළ හැකි භූමිප්‍රමාණයේ සිට ද, **සමන්තපාසාදිකා අත්ථයොජනා** මතයෙන් එක් නමකට අධිඨන් පොහෝ කළ හැකි භූමිප්‍රමාණයේ සිට ද වැඩි කොටසක් හෝ මුළුල්ල ම හෝ අසුවන සේ සම්මත කිරීම යි. මෙහි ලා පසුව සම්මත සීමාව අසීමායි. මෙහෙණියන් ගේ සීමාවක් යට වුව ද දෙස් නැත. මෙහෙණිය මහණුන් ගේ කර්මය වගී නො කරයි.

# ත්‍රිවිධ සම්පත්ති.

**නිමිත්ත සම්පත්ති, පරිස සම්පත්ති, කම්මවාචා සම්පත්ති** යනු ත්‍රිවිධ සම්පත්තියයි. පර්වතාදි අෂ්ටවිධ නිමිති නිමිත්තූපගයි.

1 **පබ්බත නිමිත්ත**- සුද්ධපංසු (=හුදුපස්මුවා), සුද්ධපාසාණ, උභයමිශ්‍ර =ගල්පස්මුසු) භූමියෙන් උඩට නැගි හස්තිප්‍රමාණ (=රියන් $7\frac{1}{2}$ පමණ) වූ අකෘත්‍රිම ත්‍රිවිධ පර්වතය ම නිමිත්තූපග වේ.

2 **පාසාණ නිමිත්ත**- හස්තිප්‍රමාණයට ඌන ව දෙතිස් පලම් සකුරුගෙඩියක් පමණවූ ද ගල නිමිත්තූපගයි. අයගුළ (=යබොර) තම්බකාංසාදියත් පාසාණ ගණයට යේ. කෙතරම් මහත් වුව ද ගඩොළු හෝ අනිමිත්තූපග ගල්රැසක් හෝ සුදුසු නො වේ. පිටසී පාසාණය (=ගල්තලාව) කෙතරම් විශාලවුවත් හස්තිප්‍රමාණයට අඩු නම් පාසාණමැයි. පොළොව යට පිහිටි කොටස මෙහිලා අව්‍යවහාරී යි.

3 **වන නිමිත්ත**- ඇතුළත හර ඇති සතර පස් රුකෙකින් සුතුවූ ද සියක් යොදුන් වූ ද කවර වනයක් නමුදු වරී. ගස් නො කපා වනමැද වෙහෙර කළහොත්, එවෙහෙර සීමාවේ නිමිත්තකට වනය නො ගතයුතු. පිටසීපාසාණය ගැන ද එසේයි. ඇතුළට තෙරා තිබෙන නොහොත් විනිවිදගිය ගල් තලාව නිමිති කළහොත්, නිමිත්තමත වෙහෙර වීමෙන් සීමාවක් නොලැබිය හැකි වෙයි.

4 **රුක්ඛ නිමිත්ත**- කුඩා හුණදණ්ඩක් පමණවූ නොහොත් පන්හිදක් පමණවූ එකෙණෙහි සිටැවූ අරටු සහිත වගීයේ පැළයක් ද යටත් පිරිසෙයින් වරී. සිටැවූ මූල්සහිත පැළයේ අලුතින් මුල්-අතු ඇදීම ආවශ්‍යක නො වේ. පැලවෙන සුලු අත්තක් ගැන නම් එස සෙදේ.

5 **මග්ග නිමිත්ත**-තවලම් මඟක් හෝ ගැල් මඟක් හෝ වරී. කුඹුරකට කැලයකට යනු පිණිස වූ මාර්ගය ද, සමම්ශ්‍රවූ හෝ විහාර මධ්‍යගාමී හෝ මාර්ගය ද නො වරී.

6 **වම්මික නිමිත්ත**- එදවස නැගි ගව අඟක් පමණ තුඹස ද වරී.

7 **නදී නිමිත්ත**- මතු උදකුක්ඛෙපසීමා කථාවේ දැක්වෙන ලක්ෂණ ඇති නදියයි. නදියේ දිය ගෙන යනු සඳහා තැනුණු ඇළවල් නොවරී. නදිය සරස බැඳ ඇති බැමි උඩින් ජලය ගලා යේ නම් නදියමැයි. ගලා නො යතොත් උදක නිමිත්තට ගතයුතු



8 **උදක නිමිත්ත**- වළ-පොකුණු-විල්-කලපු-මුහුදුවල ගලා නො බස්නා දියයි. කම්වාචාවසානය තෙක් නො සිඳෙතොත් වළක් කැණ දිය පුරවාගෙන කීර්තනය කළ ද මනාමය.

මේ නිමිති අතුරෙන් එක්වගීයෙකින් හෝ මුසුකොට කිහිපවගීයෙකින් හෝ සීමා බැන්ද හැකියි. නිමිති තුනෙකින් බැඳි සීමාව ත්‍රිකොණ ද, සතරෙකින් චතුරශ්‍ර ද වේ. අඩිචන්ද්‍ර මුදිඞග (=ආයත චතුරශ්‍ර සණ්ඨානාදි කවර හැඩයකට වුවත් සුදුසු පරිදි නිමිති තබා සම්මත කට හැකියි.

## පරිස සම්පත්තිය.

කම්මාර්හ භික්ෂූන් සිවුනමක් සිටීම, ඡන්දාර්හයන් ගේ ඡන්දය ගෙන ඊම, හමුවූ භික්ෂූන් පටික්කොසනය නො කිරීම හෙවත් කර්මයට බාධා නො කිරීම යන අඞගත්‍රය සපිරුණු කල පරිස සම්පත්තිය සිද්ධයි. සීමා සම්මුතිය චතු වග්ගකරණීය බැවින් ගාමසීමාගත සෙසු භික්ෂූහු ඡන්දාර්හයෝ යි. නදී-ජාතස්සරාදියකට හෝ බද්ධසීමාවකට හෝ ඇතුළුව සිටින්නවුන් ගේ ඡන්දය ආවශ්‍යක නො වේ. එබදු අන්‍ය සීමාගතයන්ගේ ඡන්දය පැමිණෙන්නේ ද නො වේ. සීමා සම්මන්නනයේ දී ගමේ අන්බද්ධසීමා වතොත් සම්භින්දන නිවාරණය පිණිස සීමන්තරික පාසාණ ද; සීමා නොමැති විහාර වතොත් මතු බැඳ ගැනීමට අවකාශ ද තැබිය යුතුය. ගම් කිපයක් එක් කොට මහා සී ාවක් බැඳීමේ දී සමානසංවාස සීමා සම්මුතිය සඳහා, කම්වදන් කියන ගමින් පිටත් ගම්වල වසන මහණුන් අත්පසට පැමිණියත් එක් එක් ගම වෙන් වෙන් බද්ධසීමා වැනි නිසා නො පැමිණියත් නිවරද බව ද; අවිප්පවාස සීමා සම්මුතියේ දී සියලු ගම් එක් කොට බැඳි බද්ධසීමාවෙක සිට කැරෙන විනයකර්මයක් බැවින් පැමිණිය යුතු බවද **මහාසඳුමපෙරමතයයි**

## කම්මවාචා සම්පත්තිය.

ඤත්තිදෝස අනුසාවනදෝස සිදු නො වන සේ පිරිසිදු ව ඤත්ති දුතිය කම්මවාචාව කියා සීමා සම්මුතිය කටයුතුය. **මේ ත්‍රිවිධ සම්පත්තියි**.

**ඛණ්ඩසීමා, සමානසංවාසසීමා, අවිප්පවාසසීමා යනු** බද්ධ සීමා ප්‍රභෙදමැයි, තෙයොදුන් සීමා වැනි මහසීම් සම්මත කිරීමේ දී **කර්ම** කිරීමේ පහසුව සලකා එහි ඇතුළත බඳින කුඩා කුඩා සීමා ඛණ්ඩසීමා නම්. "එකවීසති නිසීදනකප්පහොනකතො පට්ඨාය යාව එකූනසහස්ස නිසීදනකප්පහොනකා ඛණ්ඩසීමා නාම" යනු **පාතිමොක්ඛ පදත්ථ අනුවණ්ණනා පාඨයි.** එකකම්ම-එකුද්දෙසයන්

සඳහා සමානසංවාසසීමා ද, අධිෂ්ඨිත චීවරයෙන් වෙන්ව විසීම සඳහා අවිප්පවාසසීමා ද සම්මත කරනු ලැබේ. බොහෝ සෙයින් චීවර විප්පවාසය සිදුවන බැවින් මහාසීමාව **'අවිප්පවාසසීමා,'** යි වහරනු ලැබේ. ඛණ්ඩසීමාවේ ද අවිප්පවාසය ලැබේ. මහාසීමාවක් බැඳීමේ දී නිමිති කීර්තනය කොට ඇතිතාක් ඛණ්ඩසීමා බැඳගෙන සීමන්තරිකා පාෂාණ තැබිය යුතුයි. (බද්ධසීමා දෙක අතර පිහිටි ගාමසීමා භූමිය සීමන්තරිකා නම්. මේය සම්භින්න දෝෂ නිවාරණය කරයි.) නැවත ඛණ්ඩසීමාවට තැබූ සීමන්තරිකා පාෂාණ හෙවත් උපචාරගල් මහ සීමේ නිමිති වශයෙන් කීර්තනය කොට, බාහිර නිමිති ද සුදුසු සේ තබා, ඛණ්ඩසීමාවෙන් ඉවත්ව මහසීමේ සිට එය සම්මත කටයුතු.

අවිප්පවාසසීමාව ගාම-ගාමූපචාරයන්හි නො පිහිටන බැවින් මහසීම්තුළ තිබෙන ගම්වල චීවරවිප්පවාසය නො ලැබේ. දෙනිස් ඛණ්ඩ සීමාවෙකින් හෙබි මහාසීමාවෙක් අනුරාපුරයෙහි විය. සාමාන්‍යයෙන් බද්ධසීමාව ජල පොළොව දක්වා බසිතුදු පාෂාණ ප්‍රාසාදාදී මස්තකයෙහි සීමා සම්මනනයේ දී අධොභාගයේ එක්විසි දෙනකුනට සිටිය හැකි පෙදෙසක් සම්බන්ධවේ නම් සීමාව යට බසී. නැතහොත් උඩ ම නවතී. **'සමානසංවාසසීමාගතයනට දෙමු'** යි යමෙක් චීවරාදිය දේ නම් ඛණ්ඩසීමාදියෙහි සිටියවුනට එය නො ලැබේ. ඒවා වෙන් වෙන් සමානසංවාසසීමා වන හෙයිනි. අවිප්පවාස සීමාගතයනට යයි දුන් දෑය ග්‍රාමස්ථ භික්ෂූනට අයත් නො වේ. එහි ඒ සීමාව නොමැති හෙයිනි.

## සීමා සමූහනනය.

ශාසනාන්තර්ධානයෙන් හෝ සමූහන කර්මවාක්‍යයෙන් හෝ විනාශ වන තෙක් ප්‍රතිෂ්ඨාපිත බද්ධසීමාව පවත්නේය. සස්න පිහිටි තැන් සිට මෙතෙක් විනයකර්ම කරනු පිණිස භික්ෂූහු බොහෝ සීමා බැන්දහ. එහෙයින් නිදොස් කොට නව සීමාවක් සම්මතකොට ගැනීමේ දී සමීක්ෂ්‍යකාරී වියයුතු. නොදැනුමෙන් වත් පැරණි සිමක් හා සම්භින්න අජ්ඣොත්ථරණයෙන් දොසක් වුවහොත්, එහි කළ සියලු කම් කොප්‍ය වෙයි.

නවසීමා සම්මතයට පෙර පැරණි සිමක් වතොත් නැතිවනු පිණිස සමූහන කර්මවාක්‍යය තියනි. යම් හෙයකින් ගම් කිහිපයක් සම්බන්ධ කොට සම්මත මහසිමෙක් වී නම්, එක් තැනෙක සිට කම් වදන් කියුව ද, ඒ සීමාව තුළ අනෙක් ගම්වල භික්ෂූන් සිටියහොත් සමූහනය නො වේ. වර්ගකර්ම වන හෙයිනි. සීමාව කොතරම් විශාල වුවත් වර්ග නො වී එක්තැන්ව කම්වදන් කියුවහොත් සකල සීමාව ම සමූහනය වේ.'බන්ධනයේ දීත් එසේය. ශඞ්කාවිනොදනය පිණිස



නිමිතිවලින් බැහැර ද සමූහනය කළයුතු. අනුරාපුර මහසිම හා සම්බන්ධවුණු විදුලියකම්බිකණු සමූහනය හෝ බන්ධනය හෝ කැරෙන සීමා ප්‍රදේශය තුළ පිහිටියේ නම් සම්භින්නයෙන් කර්මය කොප්‍ය විය හැකි බව කියත්. යම් ගමෙක්හි සීමාවක් බඳිනු රිසියෙත් නම් පැරණි බද්ධසීමාවක් වතොත් සමූහනය වීමටත්, නො වතොත් ශඞ්කාවිනොදනයටත් සමූහන කම්වදන් කියා, එගම්හි අන් සීමාවලට ඇතුළු නො වී සිටින භික්ෂූන්ගෙන් හත්ථපාසානයන ඡන්දාහරණ වශයෙන් ගම ශුද්ධ කොටගෙන සීමාසම්මුතිය කළ යුතුයි.

## ත්‍රිවිධ අබද්ධසීමාව.

**ගාම සීමාව**- කර්මවාක්‍යයෙකින් සම්මත නො කැරෙන සීමා අබද්ධසීමායි. ගමෙකැයි රජයෙන් පිළිගත් කුඩාවූ හෝ මහත්වූ හෝ ප්‍රදේශය ගාමසීමා නම්. නිගම නගර ද එහිම ඇතුළති. රජුන් විසින් ගමෙකින් කොටසක් වෙන් කොට ගම්මුදලි ආදීනට දෙනු ලැබුව හොත් එය විසුංගාම නම්. ගම් දෙකක් වශයෙන් සලකා කම් කළ හැකියි. මෙවැනි විසුංගාමසීමා ලඞ්කාවේ දුලභයි. ඒ පිළිබඳ ආචාර්‍යවාද ද බොහෝය. අන්තරඝරය පමණක් නො ව ගාම පරික්ෂෙපයෙන් බැහැර වූ, ගමට අයත් කෙත් වතු ඈ සියල්ල ම ගාමසීමාවට ඇතුළති. දොළොස් යොදුන් බරණැස් පුරයත්, අඩියන් පොහොයට පොහෝනා අහල් ගණනක දූපතත් ගාම සීමාව මැ යි. ගාමසීමා වෙන් වෙන් බද්ධසීමා වැනියයි අටුවාහි ප්‍රකාශිත බැවින්, ගාමසීමා දෙකක් රුක්ලිය ආදියෙන් සම්බද්ධ වීමෙන් සම්භින්නය වේයයි ඇතැමුන් කියතුදු ගාමසීමාවේ භණ්ඩුකයන් උපසපත් කළ මිහිඳුමාහිමියන් එබඳු සෙසු ගම් හා ගැටුණු රුක්ලිය ඉවත්කරවූ බව නො සටහනි.

**සත්තබ්භන්තර සීමාව**- අරණ්‍යයෙහි වසන භික්ෂූන් ගේ පොහෝ-පවුරුණු ආදියට යෙදේ. ගාම නිගම නගර සීමාවශයෙන් නො ගැනෙන, උඩත්පිරිසෙසින් වින්ධ්‍ය වැනි මහ වනයෙක්හි ද; ග්‍රාමපරිච්ඡෙදක ඉන්ද්‍රකීලයේ සිට බඹ 500 ක් ඉක්මවා ලැබියයුතු පශ්චිම අරණ්‍යසෙනාසනයෙහි ද (පශ්චිම අරණ්‍යයෙහි මෙය නො ලැබේයයි ද යෙත්.) රුස්වූ සඞ්ඝ ගණ පුද්ගලයන්ගේ අත්පසේ සිට අබ්භන්තර සතෙකින් පිරිසිදෙන මණ්ඩලයෙක්හි පිහිටයි. අබ්භන්තරයෙක් අටවිසි රියනෙකි. සඞ්ඝයා රුස්ව සිටි බිම හැර සෙස්ස සෘජුව රියන් 392 කි. අන් සඞ්ඝකෙනකුන් වෙන් ව කම් කරතොත්, සම්භින්න ශඞ්කා දුරුවනු පිණිස සත්තබ්භන්තරයක් උපචාර වශයෙන් තබා දූරස්ථව කටයුතු. මෙහි තුරු ලියෙන් සම්භින්නය නො වන සේය.

එක් දිනෙකින් ගොස් මසුන් මරා ඉය නො හැකි තරම් දුර සමුද්‍රයෙහි පිහිටි දූපතෙක ද මේ සීමාව ලැබේ. සත්තබ්භන්තර සීමාවේ උත්කෘෂ්ට පරිච්ඡේදය රියන් 392 ක් බව පැනේ. දූපත ඒසා විශාල නො වුවත් සීමාව ලබාගත හැකි හෙයිනි. මේ සීමාවේ චීවරවිප්පවාසය ද ලැබේ. එහි ලා එක් එක් භික්ෂුවකට වෙන වෙන සීමා ලැබෙන බවත්, එය **චීවරවිප්පවාස සත්තබ්භන්තර** නම් වන බවත් ප්‍රකාශිතයි.

**උදකුක්ඛෙප සීමාව**- නදී සමුද්‍ර ජාතස්සරයන්හි ලැබේ. වර්ෂා ඍතුවේ දී පසළොස් දිනෙකින් දස දිනෙකින් පස් දිනෙකින් වැසි වස්නා සඳ, නො සිඳ ගලන දිය ඇත්තේ නදියයි. (මෙයින් මසකට සවරක් වස්නා බව කියවේයයි **අත්ථයොජනාවෙ** එයි, 'අඩමසක් වස්සි, අඩමසක් නො වස්සි'යි **කඞ්ඛාවිතරණියෙහි** සටහනි. පසළොස් දිනකට වරක්වත් නො වසී නම්, දුබ්බුට්ඨි සමය ද, දෙ-තුන් දිනකට වර බැගින් වසී නම් අතිවුට්ඨි සමය ද වේයයි **කල්‍යාණී ප්‍රකරණයෙහි** පැවසේ.)

සමුද්‍රයෙහි වාරකන් නොමැති සමයෙහි රළ ගසා නැවත මුහුදට ගලා ගොස් නවත්නා තැන සිට කැප බිමයි. කිසිවකු විසින් නො කැරුණු, වැසි සමයෙහි දිය සිටුනා විල්-කලපු ජාතස්සර යි. මේ ස්ථානයන්හි බලමැදුම් පුරුෂයක්හු විසින් පස ඇට දමනපරිදි, දිය හෝ වැලි හෝ ඉස පිරිසිඳින ලද පෙදෙස **උදකුක්ඛෙප සීමා** වයි. නදියේ දෙතැනෙක කම් කරතොත් උදකුක්ඛෙප ප්‍රමාණයක් අතර තබා දුරුව කටයුතුය. උදකුක්ඛෙප ගාම සීමාවන් අතර සීමන්තරිකයෙක් නැත. උභයසීමා සම්භාරයෙන් විසදෘශ හෙයිනි. උදකු ක්ඛෙපජලය ගමෙහි වැටුණ ද එහි සීමාව නූපදී. සීමාසඞ්කර නො වේ. උදකුක්ඛෙප බද්ධසීමා ගැන ද එසේය. එහෙත් උදකුක්ඛෙප පරිච්ඡින්න ප්‍රදෙශයේ පිහිටි රුක්ලිය ආදියෙකින් ගාමබද්ධාදි සීමාවක් සපශී කොට සිටීම සඞ්කරයට හෙතු වේ. නදියෙහිවූ ගල් ද බැම් ද පියෙවි දියෙන් වැසේ නම් නදියයි, නැතහොත් ගමයි.

**5. සඞ්ඝා උපොසථ කාරකයා.**

සටත්පිරිසෙසින් සිවුදෙනකුන් විසින් කැරෙන සඞ්ඝුපොසථය, තිදෙනකු ඤත්ති තබා ද දෙදෙනකු ඤත්ති නො තබා ද කැරෙන ගණුපොසථය, හුදෙකලා වූවහු විසින් කැරෙන අධිට්ඨානු පොසථයයි කාරකයන් ගේ වශයෙන් උපොසථය ත්‍රිවිධ වේ.

පස් නමක් වත් පිරුණු සඳ කැරෙන සඞ්ඝපවාරණය, සිවු දෙනකු හෝ තිදෙනකු හෝ ඤත්ත් තබා ද, දෙදෙනකු ඤත්ති නො තබා ද කැරෙන ගණපවාරණය, හුදෙකලා වූවහු කැරෙන පුග්ගල පවාරණයයි, පවාරණය ද ත්‍රිවිධ වේ. මෙහිලා **සඞ්ඝුපොසථය ගැනේ**.



**උපොසථය.**

- **සුත්තුද්දෙස**
  - **ආණා**
  - **ඔවාද**
- **පාරිසුද්ධි**
  - **අඤ්ඤෙසං ච සන්තිකෙ**
    - **පවාරිතානං ච**
    - **අපවාරිතානං ච**
  - **අඤ්ඤමඤ්ඤාරොචන**
    - **ඤත්තිං ඨපෙත්වා**
    - **අට්ඨපෙත්වා**
- **අධිට්ඨාන**

**6. පාතිමොක්ඛං උද්දිසෙය්‍ය.**

සුත්තුද්දෙස, පාරිසුද්ධි, අධිට්ඨානයයි කළයුතු ආකාර විසින් ත්‍රිවිධ වූ උපොසථයන් අතුරින් මෙහි සුත්තුද්දෙසය ගැනේ. සුත්තුද්දෙසය නම් පාමොක් දෙසීමයි. එය ඔවාදපාතිමොක්ඛුද්දෙසය, ආණාපාතිමොක්ඛුද්දෙසයයි ද්විප්‍රකාරයි. ඔවාදපාතිමොක්ඛය නම් වන **'ඛන්තිපරමං'** ආදි ගාථාත්‍රය බුදුවරු ම දෙසත්. දීර්ඝායුෂ්ක බුදුවරු ආණාපාතිමොක්ඛය නො පනවති. කලින්කල ඔවාපාමොක් දෙසත්, සියලු භික්ෂූහු එදින රැස්වෙති. අප බුදුහු ප්‍රථම බොධියේ දී (ප්‍රථම බොධිය මුල් වර්ෂ 20 යි, 15 යනු ධම්පාල මතයි.) ඔවා පාමොක් ම දෙසූහ. පිරිසිදු පිරිසෙහි ඔවාද පාතිමොක්ඛය නො දෙසීමට කරුණු නැති බැවිනි. අපිරිසිදු පිරිසෙහි බුදුහු පාමොක් නො දෙසති. එය භික්ෂූනට ද සුදුසු නැත. එහෙත් ඔවුනට චොදනා සාරණාදියෙන් පිරිස පිරිසිදු කොට ගත හැකිය. බුදුවරු එසේ නො කරති.

බුදුවීමෙන් විසිවසක් ඉක්මගිය පසු අප බුදුහු ආණාපාතිමොක්ඛය පැනවූහ. එතෙක් පරිජි සඟවෙසෙස් පනවා නො තිබිණ. දෙළොස් වැනි වසෙහි වෙරඤ්ජාවේ දී, සිකපද පනවන සේ සැරියුත් තෙරුන් කළ ඇරියුම ගුරු ඇවැත් පැනවීමට නොහොත් පාතිමොක්ඛුද්දෙසයට පොහෝනා සිකපද පැනවීමට කැරිණැයි සිතිය හැකිය. පස්ලුහු ඇවැත්කඳු පැනවීම 12-20 වසර අතර සිදුවිණැයි ඇතැම්හු කියති. භූයොවෘත්තියෙන් එසේ විය හැකි වුවත් ඉන් පෙර ද ඇතැම් සිකපද පනවා තුබුණු බවට සාධක ඇත.

**220 ක් සික්ඛාපදවලින් හෙබි ආණාපාතිමොක්ඛය උද්දෙස** වශයෙන් **නිදානුද්දෙස- පාරාජිකුද්දෙස- සඞ්ඝාදිසෙසුද්දෙස- අනියතුද්දෙස- විත්ථාරුද්දෙස** යි පිරිසිදීම් පසෙකින් යුක්තයි. අන්තරායයක් ඇතිකල සැකෙවින් පාමොක් උදෙසිය හැකියි. **අන්තරායයෝ දශ දෙනෙකි:-**

i. පොහෝකිරීමට හුන්කල්හි රජකු පැමිණීම, ii. සොරුන් පැමිණීම, iii. ලැව්ගින්නක් පැමිණීම, ආවාසයකට ගිනිඇවිළීම, iv වැසි පැමිණීම ගංවතුර ගැලීම, v. බොහෝ මිනිසුන් පැමිණීම, vi. යකකු මහණකු අල්ලා ගැනීම, vii. ව්‍යාඝ්‍රාදි චණ්ඩමෘගාගමනය, viii. සර්පයකු මහණකු ඩැහීම, ix. මහණකු ලෙඩවීම, කලුරියකිරීම, සතුරන් ගැනීම, x. මිනිසුන් මහණකු බ්‍රම්සරින් චුත කරනුවට අල්ලා ගැනීම.

නිදානුද්දෙසය අවසන් නො වුව හොත් සුත පදයෙන් දෙසිය නො හැකිය. යම් උද්දෙසයක් අඩාළව තිබියදී අන්තරාය වී නම් එය ද සුත විසින් දෙසිය යුතු. පාතිමොක්ඛ (-ප-අති-මොක්ඛ) යන වචනයේ තේරුම අතිශ්‍රෙෂ්ඨ යනුයි. එය සීලයටත් ග්‍රන්ථයටත් යෙදේ. **'පාති'** යනු සිල්රක්නහුට ද නමි. ඒ පාතියා අපායාදි බියෙන් ගළවානුයි සීලය **පාතිමොක්ඛ** නමි. එය ද්‍යොතනය කරන ග්‍රන්ථයත් එනම් වේ.

පොහෝ කරන තැනෙක ඤත්ති දෙකක් නොතැබුව මනා බැවින්, අධිකවූ පෙරවස් වුසුවන් පැවරූ පසු, පසුවස් වැසූ හෝ අසිහියෙන් වස් නො වැසූ හෝ ඡින්නවස්ස වූ හෝ සෙස්සන් විසින් ඔවුන් වෙත පිරිසිදු පොහෝ කට හැකියි. පසුවස් වුසුවෝ අධික වෙත් නම්, පාමොක් දෙසූ පසු, පවාරණ ඤත්ති නො තබා පැවරිය යුතුය. දෙපක්ෂයෙහි වූවෝ ඔවුනොවුනට ගණපූරක වෙති.

පවාරණ දිනවලින් පිටත් උපොසථ දිනයෙක්හි ආවාසිකයන් පාමොක් උදෙසූ කෙණෙහි සීමාවට පැමිණි සම හෝ ඌන හෝ ආගන්තුකයන් ඔවුන් වෙත පිරිසිදු පොහෝ කටයුතුය. වැඩිදෙනකුන් පැමිණිය හොත් පූකිස කොට නැවතත් පාමොක් දෙසියයුතු. පාමොක් දෙසන විට සම-ඌන භික්ෂූන් පැමිණියහොත් සෙස්ස ඇසිය යුතු. වැඩිදෙනකු ආවොත් මුල පටන් දෙසිය යුතු.

අන්‍යොන්‍යාරොචනයේ දී එක් සිම්කට පත් තිදෙනකු **"සුණන්තු මෙ ආයස්මන්තා අජ්ජුපොසථො පන්නරසො, යදායස්මන්තානං පත්තකල්ලං මයං අඤ්ඤමඤ්ඤං පාරිසුද්ධිං උපො-**



නොකියා ද පිරිසිදු පොහෝ කටයුතුය. හුදෙකලා වූවහු විසින් පූකිස කොට පියා අනෙකකු නො එන බව දැන **'අජ්ජ මෙ උපොසථො පන්නරසො'ති අධිට්ඨාමි'** යි අධිෂ්ඨාන් පොහෝ කටයුතුය.

කත්තබ්බාකාර විසින් තෙවාචික (=වාක්‍යය තෙවරක් කීම) ද්වෙවාචික-එකවාචිකයයි **පවාරණය ද ත්‍රිප්‍රභෙද වේ.** පවරන්නා සඞ්ඝපරියාපන්න සේ නො ගැනෙන හෙයින් සඞ්ඝපවාරණයට යටතින් භික්ෂූන් පස් නමක් සිටිය යුතු. සිවුදෙනකු හෝ තිදෙනකු හෝ ගණඤත්ති කියා ද, දෙදෙනකු නො කියා ද අන්‍යොන්‍ය පවාරණය කළ යුත්තේය. අධිට්ඨාන පවාරණය හුදෙකලා වූවහුට යි. සාමග්‍රිය පිණිස පොහොය ද, විසුද්ධිය පිණිස පවාරණය ද කැරේ. පොහෝ නොකොට මහණුන් නැති අන්‍යාරාමාදියකට හෝ ලද්ධි නානාසංවාසකයන් ගෙන් සභික්ඛුක තැනකට හෝ අන්තරායක් නැති ව යේ නම් දුකුළාය. පොහෝ නොකිරීමෙන් ද දුකුළා වේ.

**7 කිං සඞ්ඝස්ස පුබ්බකිච්චං** (කතං)?

'සඞ්ඝස්ස' යන්නේ අර්ථ 'සඞ්ඝත' යනුයි. **'සඞ්ඝො උපොසථං කරෙය්‍ය'** යනු කී බැවින් ඒ උපොසථ කරණයට පූර්ව කටයුතු පූර්වකෘත්‍ය කරන ලද දැයි මෙයින් විචාරයි. ඡන්ද ආරොචනාදි පස පූර්වකරණයනට පසුව වුවත්, උපොසථකර්මයට පෙරාතුව කළයුතු බැවින් පූර්වකෘත්‍ය නමි. මෙහි දී **'සම්මජ්ජනී'** ආදි උභයපක්ෂගත කාරණ නවයම උපොසථ කරණයට පූර්ව කළයුතු බැවින් **පුබ්බකිච්ච** නම් වී. උපොසථස්ථානය හැමැදීම, රාත්‍රියේ නම් පහන් දැල්වීම, ආගන්තුකයන් පිණිස පියයුතුවූද, අත් පා සේදීම ආදි පරිභොගයට ආවශ්‍යකවූ ද දිය තැබීම, ආසන පැනවීම, යන සතර පුබ්බකරණයි. මහ තෙරුන් ගේ අණ ලද්දකු විසින් සඞ්ඝයා රැස් වීමට පෙර කළ යුතු.

I. **ඡන්දපාරිසුද්ධි-** එක් සිමක් තුළ සිටින ගිලාන-ගිලානො පස්ථායකාදිවූ කාය සාමග්‍රිය දීම සඳහා අත්පසට යා නො හෙන්නෝ ඡන්දය හා පාරිසුද්ධිය හා දීමට සුදුස්සෝ ය. මෙය **ඡන්දදානය, පාරිසුද්ධිදානය, ඡන්දපාරිසුද්ධිදානය** යි ත්‍රිවිධ කළ හැකිය. එහෙත් පාරිශුද්ධිය දෙන්නහු විසින් ඡන්දය ද දුනමනායයි නියමිත බැවින් **ඡන්ද-ඡන්දපාරිශුද්ධි** යි ද්විභෙද කළ හැකි ද වෙයි. උපෝසථයේ දී ඡන්දය පමණක් දීමෙන් සඞ්ඝයාට විනා තමාට උපොසථය සිදු නො වේ. පාරිශුද්ධිය දුන හොත් තමාටද, ධර්මකර්මතා සම්පාදනයෙන් සඞ්ඝයාට ද පොහොය සිදු වේ. පාරිසුද්ධිය දෙනවිට ඡන්දය ද දුන හොත් සඞ්ඝයා විසින් සෙසු කර්මයක් වුවත් කළ හැකි වෙයි. තමාට ද පොහොය සිදු වේ.

භිදුණ භික්සඝන සමග කරන කල ද, තිණවත්ථාරක සමථ පවාරණසඞ්ග්‍රහයන්හි දී ද ඡන්දය දීම ප්‍රමාණ නො වේ. සියලු දෙන අත්පසට ඉයයුතු වෙත්. ඡන්දපාරිසුද්ධිය වනාහි ගණයා වෙත හෝ පුද්ගලයා වෙත හෝ නො යයි. කම්ප්‍රාප්ත සඞ්ඝයා වෙතම යයි. එබැවින් යම් සීමාවෙක භික්ෂූන් සිව්නමක් සිටිද්දී, එක් නමක ගේ සැඳ ගෙන, සෙසු තිදෙන ගණුපොසථය කළහොත් එය වර්ගකම් යෙක් වේ. ඡන්දහාරකයා පිරිසවෙත පැමිණීමෙන් ඔහුත් සමඟ සිවුනම වුව ද ඡන්දාරොචනය සිදු වේ. පස් නමක් සිටිද්දී එක් නමකගෙ සැඳගෙන සෙසු සිවුදෙන ගණපවාරණය කළත් සඞ්ඝ පවාරණය කළත් වර්ගකම් වේ.

ඡන්දදානයේ දී **‘ඡන්දං දම්මි, ඡන්දං මෙ හර, ඡන්දං මෙ ආරොචෙහි’** යනු වාක්‍යයි. කයින් ද වදනින් ද කැමැති බසෙකින් ද කිවහැකියි. ඡන්දපාරිසුද්ධි හරණය උපසම්පන්නයකු විසින් කළයුතු. උක්ඛිත්තයකුට හෝ හෙරණකුට හෝ නො දන දුන ද යෙතියි කියත්. තමාට දුන් ඡන්දය අනෙකකු ලවා සඟමැදට යැවිය නො හැකියි. තමා ම යායුතු. ඡන්දපාරිවාසිය ඇති කල සඞ්ඝකම් කළ නොහේ. කම්යක් පිණිස රුස්වූ මහණුන් යම්කිසි කරුණෙකින් කම්ාශාව හැරපියා ඡන්දයත් විස්සජ්ජනය කොට සිටිය දී, නැවතත් කම්කරණෙච්ඡාව උපන හොත් ඡන්දය ගෙන ම කළයුතු. **පරිස පාරිවාසිය; රත්තිපාරිවාසිය, ඡන්දපාරිවාසිය, අජ්ඣාසය පාරිවාසිය** යි මෙය චතුර්විධයි.

II. **උතුක්ඛානය**– ඍතුව මෙපමණ ගොස්ය, මෙපමණ ශෙෂයයි කීමයි. (**‘උතුනිඛ’** යන තැන **‘උතු’** සද නපුංසක ලිඟුවට ද ඇතිබව පැනේ. ‘උතු + ඉධ’ යි විච්ඡෙද කොට ‘න’ ආගමයෙන් ද නිපදවත්. ‘තීණි’ යනු වෙනුවට ‘තයො’ යි පෙර තිබුණ බවක් **ගණ්ඨිදීපනියෙන්** පැනේ.)

III. **භික්ඛුගණනාව**– උපොසථාගාරයෙහි රුස්වූ භික්ෂූන් ගේ ගණන කීමයි, උතුක්ඛාන භික්ඛුගණනාවන් කවරකු විසින් නමුදු කළ හැකියි.

IV. **ඔවාදය**– මෙහෙණියන් අවවාද ඉල්ලනලද බව සඟමැද කිවයුතු. අෂ්ටගුරුධර්මයෙන් මෙහෙණියනට අවවාද දීම **භික්ඛුනොවාදයයි**. මෙහෙණියෝ පොහෝදට පෙරදා අවුත්, තුදුස්වක් පසු- රුසි දෙදිනෙන් කවරදා පොහොය කෙරේදැයි විචාරා දැන ගෙන, පොහොදා අවුත් භික්ෂුවක් හමුවෙහි වාක්‍යයෙකින් අවවාද ඉල්ලති. ඒ භික්ෂුව එබව පොහොඅග රුස්වූ සඟනට දැන්විය යුතු. එවිට මෙහෙණියනට ඔවා දෙන්නකු වතොත්, ඔහු වෙත එළඹෙන්නට කිවයුතු. නැති නම් සුදුස්සකු සම්මත කළයුතු. එසේත් නො ලැබේ



නම් ‘අවවාදදායකයෙක් නැත, මෙහෙණියෝ ප්‍රසාදවහ කායවාක් කර්මයෙන් ත්‍රිශික්ෂාව පුරත්ව’ යි කිවයුතු. මෙය උද්දෙසකයා විසින් කිවයුතුයි. මේ පණිවිඩය ද පෙරකී මහණහු විසින් පැළවියදා නතු දැන්මට එන මෙහෙණියන් කීපදෙනාට දැන්විය යුතුය. ඔවා දීම ද එදින සිදු වේ. එයට සියලු මෙහෙණියෝ යා යුත්තාහ.

8. **පාරිසුද්ධිං ආයස්මන්තො ආරොචෙථ.**

නිරාපත්තික ව පාමොක් ඇසිය යුතු. පාරිසුද්ධි ආරොචනයට හෙතුව පාමොක් දෙසුමයි. ඒ ආරොචනය කරන අයුරු **‘යස්ස සියා ආපත්ති’** යනාදීන් මතු පැවසේ.

9. **පාතිමොක්ඛං උද්දිසිස්සාමි**

පාරිසුද්ධි ආරොචනයෙහි හෙතුවයි. පූර්වවාක්‍යයට ගැළපෙන සේ **‘සඞ්ඝො උපොසථං කරිස්සති’** යනාදීන් නො කියවුණ ද ලක්ෂණ විසින් දෙක ගැළපේමය. සඞ්ඝයා ගේ සාමග්‍රිය ඇතිකල, චතුවර්ගිය මහණුන් අතුරෙන් උද්දෙසකයා තබා සෙසු ගණයාගේ සාමග්‍රිය (=කයින් සිතින් සහිතබව) ඇතිකල උද්දෙසකයා ගේ උදෙසීමෙන් සඞ්ඝයා විසින් පාමොක් උදෙසන ලද නම් වන්නේය. ඔහු ගේ උදෙසීමෙන් විනා උපොසථකරණයෙන් සඞ්ඝයාට උපො- සථය සිදු නො වන බැවින් **‘උපොසථං කරිස්සාමි, පාතිමොක්ඛං උද්දිසිස්සාමි’** යි නො කියැවිණ. නිදානුද්දෙසාවසානයේ පැනෙන ආපත්තිඛෙත්තය වන යාවතතියානුසාවනය අපෙක්ෂා කොට **‘උද්දිසිස්සාමි’** යි අනාගතක්‍රියාව යෙදිණි. ‘මතු ආපත්ති ඛෙත්තය එයි, ආපත්තිභීරුක තෙපි පළමුවෙන්ම ඇති ඇවැත කියව්’ යන අදහස එයින් ලැබේ.

10. **සාධුකං සුණොම මනසි කරොම**

සාධුකං යන්නෙහි අර්ථය ‘ඒ පාමොකින් තමන් ධනවතකු කොට, සිතට බැහැර යන්නට ඉඩ නො දී ප්‍රාතිමොක්ෂය සලකමු, කෙළවර දක්වා විෂය කරමු’ යන්නෙන් ප්‍රකාශිතයි. උද්දෙසකයාත් සඞ්ඝපර්යාපන්න බැවින් මෙහි උත්තමපුරුෂාඛ්‍යානය යෙදිණ. ආපත්තික්ෂෙත්‍ර දර්ශනාශාරාභිත්‍යයෙන් **‘සුණිස්සාම’** යි අනාගතයෙන් නො කියැවිණ

11. **යස්ස සියා ආපත්ති.**

මේ ආපත්තිසද්දින් සප්තාපත්තිස්කන්ධය ම ගැනේ. ඇවැත්වලට පත්වීම් ආකාර සයෙකින් සිදු වේ

I. **අලජ්ජිතාය**– අලජ්ජීකම නිසා, අලජ්ජියා මෙබන්දය.

**“සඤ්චිච්ච ආපත්තිං ආපජ්ජති - ආපත්තිං පරිගූහති,**
**අගති ගමනඤ්ච ගච්ඡති - එදිසො වුච්චති අලජ්ජි පුග්ගලො”**

සමෙක් ආපත්තිජනක වස්තුව දැන මැඩ පියා ද හෙවත් අකැපබව දැන දැන ව්‍යතික්‍රම සිතින් වස්තුව මඩී ද; පත් ඇවැත දැන දැන අනාදරයෙන් නො දෙසා ද; ගුරු ඇවැතින් නො නැගිටී ද; (ලජ්ජාව නිසා සඟවන්නා අලජ්ජී නම් නො වේ.) බඩු බෙදන තන්හි දැන දැන සිවුඅගතියට යේ ද මෙතෙම ලජ්ජාරහිත පුද්ගලයි.

II. **අඤ්ඤාණතාය**- නුවණමඳ බාලයකු බැවින්, කටයුතු නො කටයුතු නො දැන ක්‍රියා කිරීමෙන් ද ඇවැත් අවදී.

III. **කුක්කුච්ච පකතත්තාය**-කැප ද අකැප දැයි විනය සංශය උපන ද, විනයධරයන් නො පිළිවිස, කැපයයි ගෙන මැඩ සාපත්තික වේ.

IV. **සතිප්ලවා**- සහසෙය්‍යාදියට සතිසම්මොසයෙන් (=ප්‍රමාදයෙන්) ද පත් වේ.

V. **අකප්පියෙ කප්පිය සඤ්ඤිතාය**—විකාලයෙහි කාලයයි සිතා වළඳා සාපත්තික වේ.

VI. **කප්පියෙ අකප්පිය සඤ්ඤිතාය**- කාලයෙහි විකාලයයි සිතා වළඳා සාපත්තික වේ. මේ කරුණු ද අලජ්ජිත්වයට සඞ්ග්‍රහ කළ හැකියි. සෙසු තැන් ද මෙපරිදි දත හැකිය.

**12. සො ආවිකරෙය්‍ය**-

පත් ඇවැත සඟමැද හෝ ගණමැද හෝ පුඟුලා වෙත හෝ දෙසාවා, ප්‍රකාශ කෙරේවා. භික්ෂුත්වයෙන් චුතවීම පාරාජිකාපත්ති දෙශනයයි. ඇවැතකට නො පැමිණිය ද, පත්ව පරිවාසාදියෙන් නැගී සිටිය ද, වස්තු විසින් ආපත්ති විසින් උභයාකාර විසින් දෙසනලදුව ද, උපන් විමතිය ආරොචනය කරන ලදුව ද **'ආපත්ති අසන්ති'** නම් වේ.

**13. යාවතතියං අනුසාවිතං හොති.**

යාවතතියානුසාවනය ගැන මත කිහිපයෙක් අටුවාවෙහි ප්‍රකාශිතයි. ප්‍රාතිමෝක්ෂය තුන්වන වර දක්වා අස්වනු ලැබේ. ඇවැත් සිහි කරන මහණ තෙවන අනුසාවනයේ දී මුසවා දුකුළාවට පත් වේ. තෙවන වර දක්වා අස්වන අයුරු **'තථායසමණකොන'** යනාදීන් ප්‍රකටය. මෙය පෙළපොත්හි පාරාජිකාදීන් ගේ අවසන්හි විනා නිදානාවසානයේ නැතත්, උදෙසෙස කාලයේ කිවයුතු වේ. මුසාවාදඞ්ග සම්පූර්ණ නො වන බැවින්, බුද්ධ ප්‍රඥප්තිය අනුව මෙහි දී දුකුළා වේ. තුෂ්ණීම්භූත ව සිටියහුට මනොද්වාරයෙන් ඇවැත සිදු නො වතුදු, කිවයුත්ත නො කියූ බැවින් වාග්ද්වාරයේ අක්‍රියයෙන් ඇවැත නැගේ.



**14 අන්තරායිකො ධම්මො.**

මුසාව පශ්චාත්තාප විසින් සිතේ විපිළිසර බවට ද, විපිළිසරය ප්‍රමෝද්‍යප්‍රීත්‍යභාවයට ද, ප්‍රමෝද්‍යප්‍රීත්‍යභාවය ප්‍රථධ්‍යානාදීන් ගේ අලාභයට ද කාරණ වේ. පරිත්ත මුසාවාදය වුවත් මහාදීනව ඇත්තේයයි මෙයින් කියැවිණ.

**15. විසුද්ධා පෙක්ඛෙන.**

'වුට්ඨානගාමි සඟවෙසෙසින් නැගී සිටිනු කැමැත්තහු විසින් දෙශනාගාමි ක්ෂුද්‍රාපත්තියෙන් පිරිසිදුවනු කැමැත්තහු විසින්' යන අර්ථයි. අනවශෙෂ පරිජි නම් ගිහිවීමත් ඇතුළති. **'සරමානෙන'** යන්නෙන් ඇවැත සචිත්තක බව පැනේ. **'ආපන්නෙන'** යනු පරපදයට විශෙෂණ කොට හෝ අවත් ඇවැතින් යයි පඤ්චම්‍යර්ථ කොට හෝ ගත හැකියි.

**16. සන්ති ආපත්ති ආවිකාතබ්බා.**

සඞ්ඝ ගණ පුද්ගලයනට ඇවැත් දැන්විය යුතු. සඞ්ඝුපොසථයේ දී සඞ්ඝයාට ද, ගණුපොසථයේ දී ගණයාට ද, පාරිසුද්ධි උපොසථයේ දී පුඟුලාට ද කිවයුතුය යන මතයෙක් ද වේ. එයින් ගණුපොසථයේ දී වුවත් පත් ඇවැත් නො කියා පොහෝ කිරීමෙන් දුකුළා වන බව හඟවා. ආරොචනාධිප්පාය වශයෙන් එසේ ක් බව අනෙක් මතයයි. සඟමැද කියමියි සලකා පැවසීමෙන් සඞ්ඝ මධ්‍යාරොචනය ද, දෙපස සිටින්නන් සලකා කීමෙන් ගණාරොචනය ද, සභාග පුඟුලකුට කීමෙන් පුගගලාරොචනය ද සිදු වේ.

**17. ආවිකතාහිස්ස ඵාසු හොති.**

විපිළිසර නො ඉපදෙන නිසා ධ්‍යානාදීන් ගේ ලාභයට පහසු වේ. ඇවැත් පළකළ විට **'අකාමා පරිවත්ථබ්බං'** යනාදිය සලකා භික්ෂූහු සාපත්තිකයා ලවා පරිවාසාදිය පුරවා ගුරුඇවැතින් ද නඟා සිටුවත්. එහෙයින් ද ඵාසු වේ.

**නිදානයේ පිණ්ඩාර්ථ පසෙකි.**

i ඤත්තිය – 'සුණාතුමෙ-පෙ-
පාතිමොක්ඛං උද්දිසෙය්‍ය.
ii පුබ්බකිච්ච පුච්ඡා – 'කිං සඞ්ඝස්ස-පෙ-උද්දිසිස්සාමි.
iii නිදානුද්දෙස සවනවිධි – 'තං සබ්බෙව-පෙ-මනසිකරොම.
iv විසුද්ධාරොචන විධි – 'යස්ස සියා -පෙ-අනුසාවිතං හොති.
v අනාරොචනෙ ආපත්තිවිධි– 'යො පන භික්ඛු-පෙ-ඵාසුහොති.

——

# පඨම පාරාජිකං.

**18. යො පන භික්ඛු.**

අට වැදෑරුම් උපසම්පදාවන් අතුරින් ඤත්තිචතුත්ථ කම්වදනින් උපසම්පදාව ලත් භික්ෂුව මෙහි දී ගැනේ.

1. **එහි භික්ඛුපසම්පදා**:- බුදුන් **'එහිභික්ඛු'** යනාදිය කී පමණින්, බුදුන් ම පබ්බජ්ජා-උපසම්පදා ආචාර්‍ය උපාධ්‍යාය කොට ගෙන, ලබන උපසපුවයි. අටපිරිකර හෝ පාත්‍ර චීවරමාත්‍රයක් හෝ සිල්වතකුට දී, 'මේ දානය එහිභික්ඛුභාවය පිණිස උපනිඃශ්‍රය වේව'යි යමෙක් පැතී නම්, ඒ පැතුම ඔහුට බුදුන් හමුවෙහි පුඤ්ඤිද්ධිමය පරික්ඛාර ලාභයට හෙතු වේ. අනතිම භවිකයනට පමණයි.

2. **සරණා'ගමනූ'පසම්පදා**:- මුල දී මහණවනු කැමැත්තෝ දුර සිට ද බුදුන් සොයා ආහ. එ වෙහෙස දුරලනු පිණිස තෙසරණින් මහණ උපසපුව දෙව'යි මහණුනට අනුදැන වදාළහ සැරියුත් තෙරුන් රාධ නම් බමුණා පැවිදිකළ තැන දී මෙය පිළිකෙව් කොට ඤත්තිචතුත්ථ උපසම්පදාව අනුදත්හ. පිරිසුදු පුහුලනට ලැබෙන්නකි.

3. **ඔවාද පටිග්ගහණූපසම්පදා**:- මහාකාශ්‍යප ස්ථවිරයනට ලැබිණ. මහසුප් තෙරණුවෝ බුදුන්ගේ අවවාදත්‍රයක් පිළිගෙන පැවිද්දත් උපසම්පදාවත් ලැබූහ

4 .**පඤ්හබ්‍යාකරණූ'පසම්පදා**:-පුවරම් වෙහෙර සක්මන්හි යෙදී සිටි සොපාකයන් අතින් බුදුහු පැන පුළුවුත්හ. පිළිතුරෙන් තුටුවූ බුදුහු සත්වැසි හෙරණහුට උපසපුව අනුදත්හ. සුමන සාමණේරයනට දායජ්ජ නම් උපසම්පදාවක් දුන් බව ධම්මපදට්ඨකථාවෙහි එයි.

5. **ගරුධම්මපටිග්ගහණූ'පසම්පදා**:- අෂ්ටගුරුධර්මයන් පිළිගැන්ම මහාප්‍රජාපතී ගෞතමියගේ උපසම්පදාව විය. සෙසු සභාග මෙහෙණියෝ භික්ෂූන් විසින් උපසම්පාදිත වූහ.

**අෂ්ට ගුරුධර්ම**:-

i. සියවස් වූ ද මෙහෙණ විසින් එ දවස උපසපන් මහණහට ද අභිවාදනාදිය කටයුතු.

ii. මෙහෙණ අසපුවේ සිට අඩයොදුන් අබතුර ඔවා දෙන මහණෙක් නො වේ නම්, එබඳු අසපුවේ වස් නො වැසිය යුතු.

iii. අඩමසක් පාසා පොහොය ඇසීමට ද ඔවා ලැබුමට ද භික්ෂූන් වෙත එළැඹිය යුතු



iv. වස් වුසු මෙහෙණින් උභතොසඞ්ඝයා වෙත පවාරණය කටයුතු

v. ගුරු ඇවැත් අවන් මෙහෙණ උභතොසඞ්ඝයා වෙත අඩමසක් මානත පිරිය යුතු

iv. මෙහෙණින් වෙත පැවිදි ව පාණාතිපාත-අදත්තාදාන-අබ්‍රහ්මචරිය-මුසාවාද-සුරාමෙරයපාන-විකාලභොජන විරති යන සදම්හි දෙවසක් හික්මුණු සික්ඛමානාව මහණුන් වෙතින් සිවුවරක් ද මෙහෙණින් වෙතින් සිවුවරක්දැ යි අටවරක් කම්වැකි කීමෙන් දියයුතු වන බැවින් අට්ඨවාචිකා නම් වූ උපසම්පදාව ලැබිය යුතු.

vii. මෙහෙණින් විසින් මහණුනට කවරකට නමුදු ආක්‍රොශ පරිභව නො ද කළයුතු

viii. මහණුනට අවවාද අනුශාසනා නො ද කළයුතු.

6. **දූතෙන උපසම්පදා**:- උපසපුව ලබන්නිය (අන්තරායයක් නිසා) බැහැර සිටිය දී, ව්‍යක්ත ප්‍රතිබල අන් මෙහෙණක දූත වශයෙන් අවුත් භික්ඛුසඞ්ඝයා ගෙන් උපසම්පදාව ඉල්ලූ කල නො හමුයෙහි ම කම්වදන් කියා උපසපුව දෙන සේ **අඩ්ඪකාසි නම් ගණිකාව ඇරැබැ** බුදුහු අනුදත්හ.

7. **අට්ඨවාචිකූ'පසම්පදා**:- මෙහෙණනට අනුදත් උපසම්පදාව ය.

8. **ඤත්තිචතුත්ථූ'පසම්පදා**:- ඤත්තියෙන් ද අනුසාවනය තෙවරකින් ද භික්ෂුනට ලැබෙන උපසම්පදාව යි. මුලින් කී පස බුදුන් ධරමාන සමයෙහි වී. පසු කී තුන ස්ථාවරයි. ඤත්තිචතුත්ථ උපසම්පදා කර්මය අකොප්‍යවීමට **වත්ථු ඤත්ති අනුසාවන සීමා පරිස** යන සම්පත් සම්පූර්ණ වියයුතු.

1. **වත්ථුසම්පත්තිය**- "භික්ඛුභාවො වසති එත්ථා'ති වත්ථු" උපසම්පත් පිහිටන තැනි හෙවත් උපසම්පත් අපෙක්ෂක පුද්ගලයායි. පිළිසඳ පටන් විසි වයස් නුවූ පුහුලා ද, පාරාජික, පණ්ඩක, ථෙය්‍යසංවාසක, තිත්ථිය පක්කන්තක, තිරච්ඡානගත, මාතුඝාතක, පිතුඝාතක, අරහන්තඝාතක, භික්ඛුනී දූසක, සඞ්ඝභෙදක, ලොහිතුප්පාදක උභතොබ්‍යඤ්ජනක යන මොහු ද උපසම්පත් ලැබුමට අභී නො වෙත්.

i **පණ්ඩක**-ආසිත්තපණ්ඩක, උසූයපණ්ඩක, ඔපක්කමික පණ්ඩක, පක්ඛපණ්ඩක, නපුංසකපණ්ඩක යයි **පණ්ඩකයෝ පස් දෙනෙකි**

සිය මුවෙන් මෙරමා ලිඞ්ගය ගත්විට ඔහු ගේ ශුක්‍ර තම මුඛයෙහි වැගිරේ. එවිට තමාට ද මොචනය වීමෙන් පරිළාහ දුරු වේ. මේ **ආසිත්තපණ්ඩකයාගේ** ලක්‍ෂණ යි. අන්‍ය යුගලයක ගේ මෛථුනය දැකීමෙන් ඊර්‍ෂ්‍යා විසින් සෙවිනා රිසි උපන්විට **උසූයපණ්ඩකයාගේ** මොචනය සිදු වේ. උපක්‍රමයෙන් අපනීත බීජ ඇත්තා **ඔපක්කමිකපණ්ඩක** යි. කාලපක්‍ෂයෙහි පණ්ඩක වන තැනැත්තේ **පක්ඛපණ්ඩක** යි. අපණ්ඩක පක්‍ෂයෙහි පැවිදි කළ ද පණ්ඩක පක්‍ෂයෙහි ලිඞ්ගනාසනාවෙන් නැසිය යුතුයයි සෙත්. ප්‍රතිසන්ධියේ දී ම භාව රූප රහිතව උපන්නේ **නපුංසකපණ්ඩක** යි. ආසිත්ත, උසූය, පක්ඛපණ්ඩක යන තිදෙන පුරිසභාව ලිඞ්ගාදි යුක්ත අහේතුක පටිසන්ධිකයෝ යි. කෙලෙස් බහුල බව නිසා නපුංසක පණ්ඩකයා වැනිනු යි පණ්ඩක සඞ්ඛ්‍යාවෙහි ලා ගැනෙති

ii **ථෙය්‍යසංවාසක**-ලිඞ්ගත්ථේනකාදි විසින් තෙවැදෑරුම් ය.

**ලිඞ්ගත්ථේනක**-තමාම පැවිදි ව 'දසවස් විසිවස් ඇත්තෙමි'යි බොරුවට වස් ගණන් නො ගන්නා, උපෝසථාදියට ද නො යන, වැඳුම් ද නො ගන්නා මෙතෙම ශ්‍රමණ ලිඞ්ගය පමණක් ගත් හෙයින් ලිඞ්ගත්ථේනක වේ. භික්‍ෂූන් විසින් පැවිදි කරනු ලැබූ හෙරණෙක් සිවුරු ඉවත් කොට, එහෙත් 'නැවත හැඳ ගනිමි' යි එහි ආලය ඇති ව මෛථුන සෙවනය කොට, නැවත හැඳ පෙර ව හෙරණ බව පිළින කෙරේ ද; භික්‍ෂූන් දුන් ලිඞ්ගය නො හළ බැවින් මෙතෙම ලිඞ්ගත්ථේනක ද නො වේ. සාමණේරලිඞ්ගානුරූප අභිවාදනාදි සාමණේර සංවාසය ඉවසූ හෙයිනුත් සාමණේර ප්‍රතිඥාව නො හළ හෙයිනුත් සංවාසත්ථේනක ද නො වේ. සිවුරෙහි ආලය රහිත ව නගන ව හෝ හෙළපිළි හැඳ හෝ මෛථුනසෙවනාදියෙන් අශ්‍රමණ ව නැවත හැඳ පෙරවා ද හේ ලිඞ්ගත්ථේනකයි.

යම් උපසපනෙක් චීවරයෙහි සාලය ව මෛථුනකර්මාදිය කොට, නැවත පැවිදිවෙස් ගෙන පෙර සේ වස්ගණන් ආදිය ගනී ද ථේනක නො වේ. ගිහි බව පතන හෙරණෙක් හොබී ද නො හොබී දැයි පිරික්සනු පිණිස ගිහියන් හඳනා අයුරින් කහවත් හැඳ, හොබීයයි සනිටුහන් කොට, නැවත ශ්‍රමණලිඞ්ගය ගනී ද ථේනක වේ.

**සංවාසත්ථේනක**-භික්‍ෂූන් විසින් පැවිදි කරනු ලැබූ හෙරණෙක් වංචක සිතින් 'මම දසවස් විසිවස් ඇත්තෙමි' යනාදීන් බොරු වස් ගණන් කියා ද, යථාවුඩ්ඪ අභිවාදනාදිය ඉවසා ද, උපොසථාදියට යේ ද, මෙතෙම සංවාසත්ථේනක නම් වේ. ථෙය්‍යසංවාසක යන්නෙහි සංවාස සඳින් එකකම්මාදිය පමණක් නො ව මහණ වෙස් ගැන්ම, භික්‍ෂුවමී ගිණීම යන ආදි සියලු ක්‍රියාවෝ කියැවෙති. බාලයෝ වැඩිමහලුන් ගේ වැඳුම් ඉවසුව ද ථේනක නො වෙති.



උපසපන් භික්‍ෂූන් ගැන පැනවූ සික්ඛාපදයන්හි දී ආදිකම්මිකයෝ ඇමැතින් මිදෙති. මේය හෙරණුන් පිළිබඳ බැවින් ආදිකම්මිකයා ද නො මිදේ.

**උභයත්ථේනක**-තෙමේ ම පැවිදි ව පූර්වෝක්ත සංවාසය ඉවසී නම් උභයත්ථේනක වේ. තෙමේ පැවිදි ව සාමණේර වස් ගණන් ගිණී නම් උභයත්ථේනකයි.

රාජකොප, දුබ්භික්ඛ, කන්තාරගමන, රෝගිය, වෛරිභය යන කරුණෙකින් හෝ නස්නා සිවුරු ගෙන ගොස් දෙන රිසියෙන් හෝ ලිඞ්ගය ගත ද ථේනක නො වේ. භික්‍ෂූන් වංචා කරන සිත නැති හෙයිනි. ගිහියන් වංචා කරන සිත තිබුණ ද වරද නො වේ. මෙසේ ලිඞ්ගය ගත්තහු කෙසේවත් භික්‍ෂුසංවාසය නො ඉවසිය යුතු සඞ්ඝිකාදියට නො ගොස් පොදුබත් බුදිමින් සිටිය හැකියි. භික්‍ෂූන් නැති වෙහෙරෙක විහාරබත් බුදිමින් සිටිය හැකි බවද පෙනේ. බියක් නැත ද 'කෙළි පිණිස ලිඞ්ගය ගෙන, මහණුන් වෙත දී පබ්බජිතාලය දක්වා වන්දනාදිය නො ඉවසන තැනැත්තේ ද; 'මහණ වූවොත් මගේ වෙශය හොබී දැ'යි බලනු පිණිස සුද්ධචිත්තයෙන් ලිඞ්ගය ගත් තැනැත්තේ ද ථේනක නො වේ. 'මෙසේවූ කල ථේනක වෙති'යි නො දැන ලිඞ්ගය ගෙන වෙහෙරට පැමිණියහුට උපසපුව පිහිටා යයි කී බැවින් ගිහියකු උපසපන් කරතත් පිහිටන බව හැගේ යයි **වජිරබුද්ධියෙහි එයි**. යමෙක් සික්ඛාපච්චක්ඛානය කොට ශ්‍රමණ වෙශය පහ නො කොට, දුශ්ශීල්‍ය ක්‍රියාවක් කොට හෝ නො කොට හෝ, කිසිවෙක් මේ බව නො දනීයයි පෙරසේ වස්සගණනාදියට පත්වේ ද, හේ ද ථෙය්‍යසංවාසකයෙක් වේ.

iii **තිත්ථියපක්කන්තක**-ථෙය්‍යසංවාසක බව අනුපසපනා පිළිබඳව යි. උපසපනෙක් බොරු වස් ගණන් කියා සංවාස ඉවසුව ද අශ්‍රමණ නො වේ. තිත්ථියපක්කන්තක කථාව උපසපනා පිළිබඳ බැවින් අනුපසපනෙක් තිත්ථියපක්කන්තක නම් නො වේ. යමෙක් තීර්ථක පරිව්‍රාජකාදීන් වෙත ගොස් හෝ නො ගොස් හෝ විමසීම ආදි අදහසින් තොර ව 'තීර්ථක වන්නෙමි' යන අධ්‍යාශයින් ඔවුන් ගේ ලිඞ්ගය (-වෙශය) සිරුරින් දරා ද, එකෙණෙහි හේ තිත්ථියපක්කන්තක වේ. ඔවුන් ගේ සස්සතාදි ලබ්ධි ගත ද ලිඞ්ගය නො ගත හොත් පක්කන්තක නො වේ. සස්සතාදි ලද නො ගෙන, ව්‍රතචර්‍ය්‍යා සුන්දරයයි සිතා ලිඞ්ගය ගත හොත් පක්කන්තක වේ. රාජභයාදියෙකින් ලිඞ්ගය ගත ද තීර්ථක වීමේ ලබ්ධිය නැති හෙයින් වරද නැත.

iv **තිරච්ඡානගත**-මිනිසුන් හැර නාග-සුපර්ණ-යක්‍ෂ-දෙවාදි සියල්ලෝ මෙහි දී තිරිසන්නු යි. පැවිදි උපසම්පදා නො ලබත්.

v **මාතුඝාතක** vi **පිතුඝාතක**-මිනිසකු විසින් ප්‍රාණසංඥීව වධකචෙතනාවෙන් තමින් වැදූමිනිස් මව මරනු ලැබුව හොත් ආනන්තරිය සිදු වේ. මිනිස් නො වූ මව මැරුවත් තිරිසනකු විසින් මනුෂ්‍යවූ මව මැරුවත් ආනන්තරිය නො වේ. පිතුඝාතකයා ද මෙපරිදියි. වෙශ්‍යාවක ගේ දරුවකු පියා බව නො දැන වුවත් ජනක පියා මැරුවොත් ආනන්තරිය වේ. වධක සිතත් අරමුණු වූ ජීවිතෙන්ද්‍රියත් ආනන්තරිය අනානන්තරිය කරණයෙහි ප්‍රමාණයි. එළ වෙකැයි සිතා පියා මැරුවත් ආනන්තරියම යි.

vii **අරහන්තඝාතක**-මනුෂ්‍යජාතික ක්ෂීණාශ්‍රව දරක දැරිකාවක තමුදු මැරීමයි. අමනුෂ්‍ය රහත් කෙනකුන් හෝ ආසීපුද්ගලයකු හෝ නැසුව ද, තිරිසනකු විසින් මිනිස් රහතකු නැසුව ද ආනන්තරිය නැත. කර්මය බරයි. කුශලාකුශලයන් ගේ තික්ඛ විසදභාවය මිනිසුන් පිළිබඳව ම වේ.

viii **භික්ඛුනීදූසක**-උභතො සඞ්ඝයා ගෙන් උපසපුව ලත් පිරිසිදු සිල් ඇති මෙහෙණිය තුන් මඟින් එක් මඟෙක්හි **දූෂණය** කෙරේ නම්; බලාත්කාරයෙන් හෙළ පිළි හඳවා, එහෙත් ඒ හැඳීම නො කැමැති වන්නිය දූෂණය කෙරේනම් භික්ඛුනී දූසකයි. හෙළ පිළි හැඳ ගිහිබව පිළිගත් කෙණෙහි ඇ මෙහෙණක් නො වේ. වරක් සීලවිපත්තියට පත්වූවක කෙරෙහි ද දූෂක නොවේ. පැවිදි උපසම්පදා ලබා.

ix **සඞ්ඝභෙදක**-දෙව්දත් සේ ධර්මවිනය පෙරළා අපලොකනකම්ම, ඤත්තිකම්ම, ඤත්තිදුතියකම්ම, ඤත්තිචතුත්ථකම්ම, යන සිවු කම් අතුරින් එක් කමක් එක් සීමෙක්හි වෙන්ව කරන්නා සඞ්ඝභෙදකයි. පෙර ම පරිජියට පත්වූවකු හෝ යම් දෙසෙකින් උපසපුව නො පිහිටියකු හෝ සඞ්ඝයා බින්ද ද ආනන්තරිය නො වේ. සඞ්ඝයා බිඳුණේ වේ. පැවිද්ද නො වැළකිණ.

x **ලොහිතුප්පාදක**-දුට්ඨචිත්තයෙන් (-වධක සිතින්) බුදුන් සිරුරින් ලේ සොලවන්නායි. අභෙද්‍යකාය බැවින් බුදුන් සිරුරින් ලේ නොවැගිරේ, ලෙය එකතු වේ.

xi **උභතොබ්‍යඤ්ජනක**-බ්‍යඤ්ජන සදින් ස්ත්‍රී පුරුෂ නිමිති ගැනේ. ස්ත්‍රී උභතො බ්‍යඤ්ජනකයාගේ ස්ත්‍රී නිමිත්ත ප්‍රකටයි. පුරුෂ ලිඞ්ගය අප්‍රකටයි. තෙමේ ද ගැබ් ගනියි, අනුන් ද ගැබ් ගන්වයි. ස්ත්‍රීභාවරූපය පමණක් වෙයි. එක් අයකුට භාවරූප දෙකෙක් නො ලැබේ. ස්ත්‍රියක කෙරෙහි රාගය උපන් කල පුරුෂ නිමිත්ත ප්‍රකට වේ, ස්ත්‍රී නිමිත්ත සැඟ වේ. පුරුෂ උභතො බ්‍යඤ්ජනකයා ගේ පුරුෂලිඞ්ගය ප්‍රකටයි. ස්ත්‍රීනිමිත්ත අප්‍රකටයි. අනුන් ගැබ් ගන්



වයි, තෙමේ ගැබ් නො ගනියි. පුරිසින්ද්‍රිය පමණෙක් ඇත. කර්මජවූ පුරිසින්ද්‍රිය ප්‍රතිසන්ධියේ දී ම පහළ වේ. ප්‍රවෘත්තියේ දී නිමිති පහළ වේ.

පූර්වොක්ත තෙළෙස් පුගුලන් හැර සපිරුණු විසිවස් පුරුෂයකු වූ කල, සඞ්ඝයා ගේ උපසම්පදා කර්මය පත්තකල්ල නම් වන්නේය.

2 **ඤත්තිසම්පත්තිය**-ඤත්තිදෙෂ පසෙකි:-

i **වත්ථුඅපරාමසන**-වස්තු සඞ්ඛ්‍යාත උපසම්පද් අපෙක්ෂකයා ගේ නම කීර්තනය නොකිරීම යි. අපරාමසනය නම් නො කීමයි.

ii **සඞ්ඝ අපරාමසන**-'සුණාතු මෙ භන්තෙ සඞ්ඝො' යනාදියෙහි 'සඞ්ඝො' යනු නොකියා හැර දැමීමයි.

iii **පුග්ගලඅපරාමසන**-උපාධ්‍යාය නාමය නොකියා හැරීමයි,

iv **ඤත්ති අපරාමසන**-ඤත්ති වාක්‍යය නො කියා, අනුසාවන කර්මවාක්‍යය ම සිවුවරක් කීමයි.

v **පච්ඡා ඤත්ති ඨපන**-පළමු ව කර්මවාක්‍යය කියා පසු ව ඤත්තිවාක්‍යය කීමයි.

3 **අනුසාවනසම්පත්ති**-වත්ථු අපරාමසන, සඞ්ඝ අපරාමසන. පුග්ගල අපරාමසන, සාවන හාපන, අකාල සාවනයයි සාවන දෙස් පසෙකි. ප්‍රථමත්‍රය පෙර පරිදියි.

iv **සාවන හාපනය**-කර්මවාක්‍යය නො කියා සිවුවරක් ඤත්ති වාක්‍යය කීම ද, කම්මවාචාවේ දී අකුරෙක පදයෙක අනුච්චාරණය ද, දුරුච්චාරණය (-වරදවා කීම) ද, ඤත්තිය තබා වරක් දෙවරක් අනුසාවනවාක්‍යය කීම ද සාවනහාපනයයි, දුරුච්චාරණය නම් කිවයුතු අකුර හැර අන් අකුරක් කීමයි.

කම්මවදන් කියන්නහු විසින් සිථිල ධනිතාදිය මැනැවින් උසුරුවිය යුතු බව **පරිවාර අටුවාවෙහි** ප්‍රකාශිතයි.

"**සිථිල ධනිතඤ්ච දීඝ රස්සං-ගරුක ලහුකඤ්ච**
**නිග්ගහිතං,**
**සම්බන්ධං වවත්ථිතං විමුත්තං දසධා බ්‍යඤ්ජන බුද්ධියා**
**පභෙදො**" යි.

**සිථිල** නම් අල්ප ප්‍රාණාක්ෂරයයි, **ධනිත**නම් මහාප්‍රාණාක්ෂරයයි, **දීඝරස්සාදිය** ප්‍රකටයි, 'තුණ්හිස්ස' යි හෝ 'තුණ්හාස්ස' යි හෝ පර පදය හා සම්බන්ධ කොට කීම **සම්බන්ධයයි**. 'තුණ්හී-අස්ස' යනාදීන් පරපදය හා සම්බන්ධ නො කොට කඩා කීම **වවත්ථිතය** යි. විවෘත

මුඛයෙන් අනුනාසික නො කොට කීම **විමුත්තය** යි. 'එසා ඤත්ති' යනු 'එසං ඤත්ති' යි අවිවෘතව අනුනාසික කොට කීමෙන් විමුත්තය නිග්ගහිතය සේ කීවා වේ. 'පත්ත කල්ලං' යනු විවෘතව කිවොත් 'පත්තකල්ලා' යි කියැවේ. එය නිග්ගහිතය විමුත්ත කිරීමෙකි. සිථිල, ධනිත, නිග්ගහිත, විමුත්ත යන සතරින් **කර්මදූෂණයවේ** සෙසු සයින් නො වේ, එහෙත් 'නාගො' යනාදිය හ්‍රස්ව කොට 'නගො' යනාදීන් නො කිවයුතු, බහූසු-බහුසු, නක්ඛමති-නඛමති, උපසම්පදාපෙක්ඛො උපසම්පදාපෙඛො, අත්ථකථා-අට්ඨකථා ඈ විසින් සුදුසු පරිදි දීඝරස්සාදිය, රස්සදීඝාදි විසින් පෙරළා කිව හැකියි. සම්බන්ධ වවත්ථිත කෙසේ කිව ද වරද නැති.

v **අකාල සාවනය**-ඤත්තිය නො කියා කම්වදන් කීමයි.

5 **පරිස සම්පත්තිය**-කම්මප්පත්තයන් ගේ අනාගමනය, ඡන්ද රහයන් ගේ ඡන්ද අනාහරණය, හමුවූවන් ගේ පටික්කොසනය හෙවත් වැළකීම යනුවෙන් පිරිස් දෙස් තුනෙකි. පරිජී නො අවන්, උකෙඛිනී කම් නො ලත්, උපොසථපවාරණට්ඨපනයෙන් බැහැර නො කළ, පකතත්ත භික්ෂූහු පස් දෙනෙක් උපසම්පදාකර්මය කිරීමට සුදුසු වෙති. කම්මප්පත්තයන් හැර, එක් සීමෙක්හි සිටින සෙසු භික්ෂූහු ඡන්දදානයට අර්හ වෙති. ඤත්තිචතුත්ථ උපසම්පදාවෙන් උපසපන්වූ මහණ මෙහි දී (-ලොකාවද්‍ය ශික්ෂාවත්හි) ගැනිණ. එහි-භික්ඛූපසම්පන්නාදීහුත් අචිත්තක සහසෙය්‍යාදි පණ්ණත්තිවජ්ජ ආපත්තීනට පත් වෙත්.

පඤ්චාබාධ ඵුට්ඨාදීහුත් හත්ථච්ඡින්නාදීහුත් උපසම්පදාව ලබත්. කාරකයනට ආපත්තිකරයි. ගහට්ඨාදි අනුපසම්පන්නයනුත්, පාරාජික උක්ඛිත්තක නානාසංවාසක භික්ෂූකීනුත් අත්පසැ නො විය යුතු. සිටිය ද කර්මය කොප්‍ය නො වේ. උපසම්පදා අපෙක්ෂකයා ද අත්පසැ සිටියයුතු. පණ්ඩකාදීන් ගෙන් ගණපූරණය වන තැන කර්මය කොප්‍ය වේ. පාසිවුරු නැත ද '**පරිපුණ්ණ'ස්ස පත්තචීවරං**' යි කම්වැකි කීමෙන් කර්මනිෂ්පත්තියට බාධා නැත. මූගයා (=ගොළුවා) ට ත් උපසම්පදාව පිහිටන බව පැනේ. එහෙත් උභතො සුද්ධියෙන් පැවිදි කළ හැකි නො වේ. පාරාජිකාපන්නයකු හෝ ථෙය්‍යසංවාසකයකු හෝ කර්මවාක්‍යය කියූ කල, සඞ්ඝයා ඔහු ගැන උපසම්පන්න සඤ්ඤී නම් කර්මය පිහිටයි. ගහට්ඨාදි යමකු කිවොත් එසේ නො වේ. '**සඞ්ඝො උපසම්පාදෙය්‍ය**' යනාදිය ඇති බැවින් සඞ්ඝපරියාපන්න හෝ සඞ්ඝපරියාපන්න සඤ්ඤිත හෝ යම්කිසිවකු කියූකල සඞ්ඝයා කියූවා නම් වේ. සියලු විනයකර්මයන්හි මේ යෙදේ. **කර්ම නිෂ්පත්තියට** බාධා නැත.



**19 සික්ඛාසාජීව සමාපන්නො.**

සික්ඛා නම් අධිසීල, අධිචිත්ත, අධිපඤ්ඤා යන ත්‍රි ශික්ෂායි. (අධිකං උත්තමං සීලං-අධිසීලං) අබුද්ධොත්පාද කාලයෙහි ද වන පඤ්චඞ්ග අට්ඨඞ්ග දසඞ්ගසීල නිවනට හෙතු නො වේ. මාර්ගඵල යනට උපනිඃශ්‍රය වන කල **අධිසීලයයි** කිවයුතු. පාතිමොක්ඛ සංවර සීලයට වඩා මාර්ගඵලයුක්ත සීලය අධිසීලයයි. මෙහි පාති-මොක්ඛ සංවරසීලය ගැනේ.

අබුද්ධොත්පාදකාලයෙහි ද වන කාමාවචර අටකුසලුත්, ලෞකික අටසමවතුත් චිත්ත නමි. විපස්සනාපාදක අට්ඨසමාපත්ති චිත්තය **අධිචිත්ත** නමි. '**අත්ථි දින්නං**' යනාදීන් පැවති කම්මස්සකතා ඤාණය පඤ්ඤා නමි. මෙය බුදුන් නැතිකල ද වේ. තිලක්ඛණාකාර පරිච්ඡෙදක විපස්සනා ඤාණය **අධිපඤ්ඤා** නමි. ලෞකික අධිචිත්ත අධිපඤ්ඤාවෙන් යුත් අය 'මෙවුන්දම් සෙවමි'යි සිත් ඉපදවූ කල එයින් පිරිහෙති. ව්‍යතික්‍රමණය නො වුව හොත්, සිත උපන් පමණින් අධිසීලය නො බිඳේ.

ප්‍රාතිමොක්ෂසංවරශීලය නම් චාරිත්‍ර වාරිත්‍ර විසින් ද්විප්‍රකාර විනයපිටකාගත ශික්ෂාපදශීලයයි. වාරිත්‍රශීල විසින් විරතියුක්ත චෙතනාවත් චාරිත්‍රශීල වශයෙන් විරති රහිත චෙතනාවත් තමන් කෙරෙහි පවත්වන තැනැත්තේ 'සික්ඛා සමාපන්න' නම් වේ. '**සහ ජීවන්ති එත්ථා'ති-සාජීවං**' (ශික්ෂාපදයයි) **සික්ඛා ච සාජීවං ච-සික්ඛාසාජීවං**' පනත් නො ඉක්මවන්නේ සාජීව සමාපන්න නම් වේ. ප්‍රඥප්ති අව්‍යතික්‍රමණය ශික්ෂාපූරණයට ප්‍රත්‍යය වේ. සාජීව ශබ්ද සාහචර්‍යයෙන් සික්ඛා සදින් අධිසීලය ගැනේ. සික්ඛා සදින් පිරියයුතු බවත්, සාජීව සදින් නො ඉක්මවියයුතු බවත් කියැවෙන බව පැනේ.

**20 සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා.**

පත්වූ ශික්ෂාව ප්‍රතික්ෂෙප නො කොට, සාජීවයෙහි දුර්වලභාවය පළ නො කොට යන අදහසයි. ශික්ෂා ප්‍රත්‍යාඛ්‍යානයෙන් දුර්වලභාවය ද ප්‍රකාශ වේ. සික්ඛා සාජීව යන වචන දෙකට ගැළපෙන සේ මෙසේ යෙදිණ. **ප්‍රත්‍යාඛ්‍යානයට අඞ්ග සයක් පිරිය යුතුය.**

**''චිත්තං ඛෙත්තඤ්ච කාලො ච-පයොගො පුග්ගලො තථා,**
**විජානනන්ති සික්ඛාය-පච්චක්ඛානං ඡළඞ්ගිකං.''**

i. **චිත්ත**- උපසපන් බවෙන් චුතවන රිසි සිත වියයුතුය. අනෙකක් කියන අදහසින්, ඉක්මන්කම නිසා '**බුද්ධං පච්චක්ඛාමි**' යි කිව ද (මෙය නුවණැතියකුට ද කියවිය හැකියි.) අන් අරුතක් කියනු කැමැත්තෙන් වැරද '**බුද්ධං පච්චක්ඛාමි**' යි කිව ද (මෙය මූර්ඛයා ගැනයි.) ප්‍රත්‍යාඛ්‍යාන නො වේ.

ii. **ඛෙත්ත**- බුද්ධං, ධම්මං, සඞ්ඝං, සික්ඛං (=උපසපත් සීලය), විනයං, පාතිමොක්ඛං, උද්දෙසං, උපජ්ඣායං, ආචරියං, සද්ධිවිහාරිකං, අන්තෙවාසිකං, සමානුපජ්ඣායකං (-එක් උපාධ්‍යායයා ඇති සබ්‍රහ්මචාරියා), සමානාචරියකං, සබ්‍රහ්මචාරිං (=භික්ඛුං) පච්චක්ඛාමි යන තුදුස් පද ද; 'ගිහී'ති මං ධාරෙහි, උපාසකො, ආරාමිකො, සාමණෙරො, තිත්ථියො, තිත්ථියසාවකො, අස්සමණො, අසක්‍යපුත්තියො'ති මං ධාරෙහි' යන අටපදයද්‍යයි දෙවිසිපදත් එහි පර්‍යාය පදත් ගෙන කීකල ප්‍රත්‍යාඛ්‍යාන වේ.

iii. **කාල**- 'පච්චක්ඛාමි, මං ධාරෙහි' ආදි ක්‍රමයෙන් වර්තමාන කාල කොට හෝ, 'අලං මෙ බුද්ධෙන, කිංනු මෙ බුද්ධෙන, න මම'ත්ථො බුද්ධෙන, සුමුත්තො'හං බුද්ධෙන' යනාදීන් කාලපරාමර්‍ශයක් නො කොට හෝ කීමෙන් ප්‍රත්‍යාඛ්‍යානය වේ. අතීත අනාගත කාල කොට හෝ පරිකල්ප සප්තමී කොට හෝ කීමෙන් නො වේ.

iv. **පයොග**- හඬුන් යැවීමෙන් හෝ හස්තමුද්‍රාවෙන් ඇඟවීමෙන් හෝ නො ව, යම් කිසි බසෙකින් වාග් භෙද කොට කීමෙන් ම ප්‍රත්‍යාඛ්‍යානය වේ.

v. **පුග්ගල**-ප්‍රත්‍යාඛ්‍යානය කරන්නාය අසන්නායයි පුගුලෝ දෙදෙනෙකි. ප්‍රතික්ෂෙප කරන්නහු යක්ඛුම්මත්ත, පිත්තුම්මත්ත, ඛිත්තචිත්ත, වෙදනට්ටයකු (=බලවත් වේදනාවෙන් පීඩිතයකු) නො වියයුතු. අසන්නාත් සිහි ඇති මිනිසකු වියයුතු.

vi. **විජානනය**- යමකු නියම කොට කීකල ඔහු ඒ අර්ථය එවිගස දත හොත් ප්‍රත්‍යාඛ්‍යානය වේ. අනෙකකු දත හොත් නො වේ. නියම නො කොට කීකල යම් කවර මිනිසකු දත හොත් වේ. සික්ඛාපච්චක්ඛානයෙහි අටසැත්තෑපද කෙනෙක් ද, දුබ්බල්‍යාවිකම්මවාරයෙහි එක්සිය සැටපද කෙනෙක් ද **විභඞ්ගයෙහි** ප්‍රකාශිත වෙති.

**21 මෙථුනං ධම්මං**-

'ධම්ම' ශබ්දයෙන් අජ්ඣාචාරය (=වරද) කියැවේ. නිපුං වස්ත්‍රාදියෙන් වැසූ හෝ නො වැසූ හෝ මාර්‍ගයෙහි එබදුවූ ම සිය හදනින් තිල ඵල මාත්‍රයකු දූ මෙහෙයුව පරිජි වේ. මෛථුනපාරාජිකාව පිළිබඳ නිමිතිවලට නිඃශ්‍රයවූ සත්ත්වයෝ දෙළොස් දෙනෙකි. මාර්‍ග සමනිසෙකි. ස්ත්‍රීන් ගේ වච්ච පස්සාව මුඛයයි මාර්‍ග තුනෙකි. පුරුෂයන් ගේ දෙකෙකි. මිනිස් නොමිනිස් තිරිසන් ස්ත්‍රීන් තිදෙනා ගේ මාර්‍ග නවයෙකි. මනුෂ්‍යාදි තුන් උභතොබ්‍යඤ්ජනකයන් ගේ ද නවයෙකි මනුෂ්‍යාදි තුන් පණ්ඩකයන් ගේ සයෙකි.



**22 තිරච්ඡාන ගතාය'පි.**

තිරිසන් ගිය මාගමක් කෙරෙහි ද මෙවුන්දම් සෙවුමෙන් පරිජි වේ.

**'අපදානං අහිමච්ඡා - ද්විපදානඤ්ච කුක්කුටී,**
**චතුප්පදානං මජ්ජාරී - වත්ථු පාරාජිකස්ස'මා.'**

අපාද සතුන් අතුරින් නා පොළොං පිඹුරු ආදි දීර්‍ඝජාතීහු ද, මස් කැසුබු ආදි ජලචරයෝ ද, කුක්කුටී ග්‍රහණයෙන් කාක පරෙවි ආදි පක්ෂීහු ද, මජ්ජාරී ග්‍රහණයෙන් වඳුරු මුගටි ආදි සිවුපාවෝ ද ගනු ලැබෙති. මොවුන් ගේ මඟෙක තලැටක් සා තැන මෙහෙයුව පරිජි වේ.

**23 පාරාජිකො හොති.**

**'පරාජෙති'** යි කර්තෘ සාධනයෙන් නිපන් විට සික්ඛාපද ආපත්තීන් ද, **'පරාජීයති'** යි කර්මසාධනයෙන් නිපන් විට පුද්ගලයා ද පවසයි. 'පරාජිත' යන්නෙහි තකාරයට කකාර ද වෘද්ධි ද කොට 'පාරාජික' ශබ්දය නිපදවති මෙහි පුද්ගලයා ගැනේ.

**24 අසංවාසො.**

**'සහ වසන්ති එත්ථා'ති සංවාසො (එකකම්මාදි), නාස්ස සංවාසො යෙන සො අසංවාසො'** සංවාසය නම් එකකම්ම, එකුද්දෙස, සමසික්ඛතා, යන මොහුයි. සීමාගත අපාරාජික අනුක්ඛිත්ත ලජ්ජිමහණුන් එක්ව කරන බැවින් චතුර්විධ සඞ්ඝකර්ම එකකම් නම්. එක් ව උදෙසන බැවින්, පඤ්චවිධ පාතිමොක්ඛුද්දෙසය එකුද්දෙස නම්. නො ඉක්මවීමෙන් ද, උග්ගහ පරිපුච්ඡාදි විසින්ද, සම ව හික්මියයුතු බැවින්, සියලු චාරිත්‍ර වාරිත්‍ර සිඛපද ඇතිබව සමසික්ඛතා නම්. උපොසථ, පවාරණ, සඞ්ඝකම්ම යනුවෙන් ද ත්‍රිවිධ සංවාසයෙක් දැක්වේ. සිල්වතුන් විසින් මේ සංවාසය පූර්වෝක්ත පුගුලා සමඟ නො කැරේ. එහෙයින් හේ සංවාස නැත්තෙකි.

---

## ආපත්තීන් පිළිබඳ සප්තදශාකාරය.

1 **නිදාන**- සිකපදය පනවන කල බුදුන් වැඩවුසූ, ප්‍රඥප්තියට කාරණවූ වස්තුව සිද්ධවූ ස්ථානයයි. එහිලා උභතො විභඞ්ගාගත සිකපද පැනවූ ස්ථාන සතෙකි.

2 **පුග්ගල**- ශික්ෂා ප්‍රඥප්තියට කාරණවූ වරද කළ ආදිකම්මිකයාය. භික්ෂූහු තෙවිසි දෙනෙක් ද භික්ෂුණීහු සත් දෙනෙක් ද වෙත්.

3 **වත්ථු**- ඒ ඒ පුද්ගලයන් කළ මෛථුන සෙවනාදි වරද යි.

4 **පඤ්ඤත්ති විධි**- (=පකාර)- ශික්ෂාපද පැනවූ ප්‍රකාරයයි හෙවත් ප්‍රභේදයයි. එය නව ප්‍රකාරයි.

i **පඤ්ඤත්ති**- පළමුවෙන් පැනවූ මූල ප්‍රඥප්තියයි.

ii **අනුපඤ්ඤත්ති**- ආපත්තිකර, අනාපත්තිකර, ආපත්ති-උපත්ථම්භකර විසින් පළමු පැනවූ සිකපදයට පසුව එකතු කළ කොටසි.

iii **අනුප්පන්නපඤ්ඤත්ති**- වරද සිදුවීමට පෙර පැනවූ ශික්ෂායි. මෙහෙණින් ගේ අෂ්ටගුරුධම් පමණසි.

iv **සබ්බත්ථපඤ්ඤත්ති**- මධ්‍යදේශය ප්‍රත්‍යන්තය දැ යි සියලු පෙදෙස්හි පිරියයුතු ශික්ෂායි.

v **පදේසපඤ්ඤත්ති**- එක් ප්‍රදේශයකට පමණක් සීමිත වන ශික්ෂායි. අනුසාවනක ආචාර්‍යයන් ඇතුළු පස් නමින් උපසම්පදා කිරීම, සතරපට පටන් බොහෝ පට ඇති වහන් (ආරාමය හැර) දැරීම, ධුවනහානය (ප්‍රාතිමෝක්ෂයෙහි එන්නේ මෙය පමණි.) සයනය පිණිස සම් ඇතිරිය යන මේ සතරින් මධ්‍යදේශයෙහි පමණක් ඇවැත් වේ.

vi **සාධාරණපඤ්ඤත්ති**-මහණ මෙහෙණ දෙපසට ම පොදු ශික්ෂායි.

vii **අසාධාරණ පඤ්ඤත්ති**- එක් පක්ෂයකට පමණක් අයත් ශික්ෂායි

viii **එකතො පඤ්ඤත්ති**- ix **උභතොපඤ්ඤත්ති** ද්වය අට විසින් අසාධාරණ සාධාරණ පඤ්ඤත්ති මැ යි.

5 **ආණත්ති**- අන්හට නියෝග කොට පනත් කැඩවීමේ දී ආණාපකයාහට ඇවැත් වන පිළිවෙළය. ඇතැම් සිකපද අණවා කැඩීමෙන් ඇණවූවහුට ඇවැත් නො වේ. 2-3 පරිජ් ඇණවීමෙන් ද වේ.

6 **ආපත්ති**- ආපත්තිහෙතු යි කිවයුත්ත උත්තරපද ලෝපයෙන් 'ආපත්ති' යි වී. පාරාජිකාදිය සිදුවීමට පෙර පැවති කායසංසග්ගාදිය පූර්ව ප්‍රයෝගයි. ඒ පූර්වප්‍රයෝග සහප්‍රයෝගයන්හි දී සිදුවන ඇවැත්ය. පරිජ්-සඟවෙසෙස් අවදින්නාහට, පූර්ව-සහප්‍රයොගාදි විසින් දුකුළා-ථුල්ලැසි සිදු වේ. ආචාරවිපත් වන සෙසු ඇවැත් **කඩු** පසට පැමිණෙන්නාහට පූර්ව ප්‍රයොගාදි විසින් දුකුළා වෙයි.



7 **අනාපත්ති**- නො දැන නො සිතා නො සිහියෙන් ඇවැත් නො වන අයුරුය. "**උපක්ඛමාදි අජානනමෙව අජානනන්ති වෙදිතබ්බං**" යනු කඞ්ඛා යොජනායි.

8 **විපත්ති**- මහණකම නැතිවීම ද කිලිටිවීම ද වේ. මෙය **සීල-ආචාර-දිට්ඨි-ආජීව විපත්තියයි චතුර්විධයි.**

i **සීලවිපත්ති**- පරිජ් සඟවෙසෙස්වලින් ශීලවිපත්තිය වේ පරිජියෙන් ශීලවිනාශය ද, සඟ වෙසෙසින් කිලිටි ද වේ.

ii **ආචාර විපත්ති**-යහ පැවැත්ම නැතිවීම හෝ කිලිටි වීමයි. ථුල්ලැසි-පචිති-පාටිදෙසනීය-දුක්කට-දුබ්භාසිත යන පස් ලුහු ඇවැතට පත්වීමෙන් මෙය සිදු වේ. (ථුල්ලැසියට හා ලොකාවද්‍ය පචිතියට පත්වීමෙන් නැසීම ද සෙස්සෙන් කිලිටිවීම ද වේ.)

iii **දිට්ඨිවිපත්ති**- මිත්‍යාදෘෂ්ටියත් අන්තග්‍රාහක දෘෂ්ටියත් දිට්ඨි විපත්ති නමි. මේ දෘෂ්ටි නොහැරීම කාරණ කොට සමනු-භාෂණ කම් කිරීමේ දී, ඥප්තියෙන් වන දුකුළාව ද, අනුශ්‍රාවණ දෙකින් වන දුකුළාව ද, අවසන්හි වන පචිතිය දැයි ඇවැත් කිහිපයෙක් වේ. "**මිච්ඡාදිට්ඨි නාම නත්ථි දින්නන්ති ආදිනයප්පවත්තා දසවත්ථුකා දිට්ඨි, සස්සතු'ච්ඡෙද සඞ්ඛාතං අන්තං ගණ්හාපකා දිට්ඨි අන්තග්ගාහිකා නාම**" යනු විමති විනොදනි යි.

iv **ආජීව විපත්ති**- සම්‍යක් ආජීවය නැතිවීම හෝ කිලිටි වීමයි. සිවුපසය පතා, නැති උතුරුමිනිස් ධම් කීමෙන් වන පරිජ් ද, පර්‍යායයෙන් කීමෙන් වන ථුල්ලැසියද, සංචරිත්තයෙන් වන සඟවෙසෙස ද, පිණී බොජුන් ඉල්ලා ගැන්මෙන් වන පචිති ද, එයින් ම මෙහෙණියනට වන පාටි-දෙසනීය ද, සූපොදන විඤ්ඤත්තියෙන් වන දුකුළා දැයි ඇවැත් සයෙක් වේ. මේ සඳහා වෙන ම ශික්ෂා නැත. ආජීව සදින් සිවුපසය කියැවේ.

9 **අඞ්ග**-වස්තු ව්‍යතික්‍රමයේ දී ඇවැත සම්පූර්ණවීමට උවමනා අවයව කාරණ යි.

10 **සමුට්ඨාන**-ඇවැත් සිදුවීමේ දී මුල් වන කායාදිය යෙදෙන ආකාරයයි. **සමුට්ඨාන නම් කාය-වාචා-චිත්තමැයි**. එය සයාකාරයි.

i **එක සමුට්ඨාන**- "**එකං සමුට්ඨානං උප්පත්තිකාරණං යස්සා සා එකසමුට්ඨානා**" කායචිත්ත හෝ, වාචාචිත්ත හෝ, කායවාචාචිත්ත හෝ.

ii **ද්විසමුට්ඨාන**-කාය-කායචිත්ත හෝ, වාචා-වාචාචිත්ත හෝ, කායවාචා-කායවාචාචිත්ත හෝ, කායචිත්ත-කායවාචාචිත්ත හෝ, වාචාචිත්ත-කායවාචාචිත්ත හෝ.

iii **තිසමුට්ඨාන**-කාය-වාචා-කායවාචා හෝ; කායචිත්ත-වාචාචිත්ත-කායවාචාචිත්ත හෝ.

iv **චතු සමුට්ඨාන**- කාය-කායවාචා- කායචිත්ත- කායවාචාචිත්ත හෝ; වාචා-කායවාචා- වාචාචිත්ත- කායවාචාචිත්ත හෝ.

v **ඡසමුට්ඨාන**-සයමැයි. සමුට්ඨාන ශීර්ෂ විසින් ද පඨම පාරාජිකා සමුට්ඨාන යනාදීන් තෙලෙස් ආකාර වේ.

11 **කිරියා**-ක්‍රියා'ක්‍රිය විසින් ද පඤ්චවිධයි.

i **කිරියතො**-ඇතැම් විටෙක නො කටයුතු දෑය කිරීමෙන් කාය වාක් ප්‍රයොග සඞ්ඛ්‍යාත ක්‍රියාවෙන් ඇවැතට පැමිණේ. කාය විඤ්ඤත්තියෙන් හෝ වචීවිඤ්ඤත්තියෙන් හෝ වරද කරන්නහුට වන ඇවැති. සියතින් පොළොව කැණීමෙන් කායික ක්‍රියාවෙන් ද, අනුන් ලවා කැණවීමෙන් වාචසික ක්‍රියාවෙන් ද ඇවැත සිදු වේ.

ii **අකිරියතො**-කයින් වදනින් කටයුතු දෑය නොකිරීමයි. ප්‍රථම කඨින ශික්ෂාවේ දී කයින් හෝ වදනින් හෝ කළයුතු අධිෂ්ඨානය ද විකප්පනය ද නො කොට සිටීමෙන් ඇවැත වේ. **'දුක්ඛමං මයා යං පුඤ්ඤං න කතං'** යනාදි තන්හි මෙන් කයින් නො කළ දෑය ද ව්‍යවහාර වශයෙන් කායකර්මයයි කියනු ලැබේ.

iii **කිරියාකිරියතො**-කිරීමෙන් ද නො කිරීමෙන් ද සිදුවන ඇවැති. නො නෑ මෙහෙණක ගෙන් චීවරයක් ගැනීමේ දී තමන් යමක් දියයුතු. එහිලා චීවර ගැන්ම ක්‍රියා ද, පාරිවට්ටක නො දීම අක්‍රියා ද වේ.

iv **සියාකිරියතො සියාඅකිරියතො**-('සියා' යනු කදාචි' යන අරුති.) ඇතැම්විට කිරීමෙන් ද ඇතැම්විට නො කිරීමෙන් ද පත් විය හැකි ඇවැතයි. මුදල් පිළිගැනීමේ දී ක්‍රියාවෙන් ද, ළඟ තබන මුදල කායවාක් ප්‍රයොගයෙන් පිළිකෙව් නො කිරීමේ දී අක්‍රියයෙන් ද ඇවැත් වේ.

v **සියා කිරියතො සියා කිරියා'කිරියතො**-ඇතැම් අවස්ථාවෙක කිරීමක් නිසා ද, ඇතැම්විට කිරීම නො කිරීම නිසා ද පත් විය හැකි ඇවැතයි. කුටිකාර ශික්ෂාවේ දී කුටිවාස්තුව දෙසවා පමණ ඉක්මවා කිරීමෙන් ක්‍රියාවශයෙන් ද; කිළිවත් නො දෙසවා



පමණ ඉක්මවා හෝ නො ඉක්මවා හෝ කිරීමෙන් අකිරිය කිරිය විසින් ද ඇවැත වේ. වස්තුව නො දෙසවීම අකිරියයි. කුටිකරණය කිරියයි.

12 **සඤ්ඤා**- වස්තු ව්‍යතික්‍රමණය කරන්නහුගේ සිතේ පවත්නා හැඟීමයි, ව්‍යතික්‍රමණය දැනීමයි. **'වත්ථු වීතික්කමෙ පවත්තා සඤ්ඤා'** යනුවෙන් එය පහද ඇත.

**'චිත්තඞ්ග විජ්ජමානෙ'පි වත්ථුවීතික්කමසඤ්ඤාය අභාවෙන විමොක්ඛො එතස්සා'ති සඤ්ඤාවිමොක්ඛා.** (-ස චිත්තකා'පත්ති.) **'නත්ථි සඤ්ඤාය අභාවෙන විමොක්ඛො එතස්සා'ති නො සඤ්ඤාවිමොක්ඛා.**(අචිත්තකා'පත්ති.)

සඤ්ඤා විමොක්ඛාපත්තීන්හි දී ව්‍යතික්‍රමය වුවත් ව්‍යතික්‍රම සංඥාව නො වී නම්, ඇවැත් නො වේ. නො සඤ්ඤාවිමොක්ඛාපත්තීන්හි දී, ව්‍යතික්‍රම සංඥාව නො වුව ද, වරද සිදුවී නම් ඇවැත් වේ.

13 **චිත්ත**-වත්ථුවීතික්කම විජානන චිත්තයයි (=වරද කරනබව දන්නා සිත.) **"චිත්තමෙත්ථ තිවිධං හොති සමුට්ඨානමත්ත චිත්තං, වත්ථුවීතික්කම විජානන චිත්තං පණ්ණත්තිවීතික්කම විජානන චිත්තං චා'ති"** යනු කංඛා යොජනායි. සචිත්තකාපත්ති කායචිත්ත, වාචාචිත්ත, කායවාචාචිත්ත, යන තුන් සමුට්ඨානයෙන් සිදුවේ. අචිත්තකාපත්ති කාය, වාචා, කායවාචා යන අචිත්තකත්‍රයෙන් හෝ අචිත්තකමිශ්‍ර වීමෙන් හෝ සිදුවේ.

'සිඛපද දත නොදත, විකුම් දත විකුම් සිද්ධ වුව, සචිත්තක ඇවැත් අවදී. (විකුම්) නොදත නො අවදී"

"සිඛපද දත නොදත, විකුම් දත නො දත, විකුම් සිද්ධ වුව, අචිත්තක ඇවැත් අවදී" යනු **සිඛවළඳ විනිසයි.**

සඤ්ඤාද්වය අනාපත්ති මුඛයෙන් ද, චිත්තනියමය ආපත්ති මුඛයෙන් ද කපිතයි. අර්ථ වශයෙන් වෙනසෙක් නැත යනු **විමති විනොදනියි.**

14 **වජ්ජ**-ලොකවජ්ජ, පණ්ණත්තිවජ්ජ, යන දෙකයි. **"යස්ස සචිත්තකපක්ඛෙ චිත්තං අකුසලමෙ'ව තං ලොකවජ්ජං"** යනු කී බැවින් සචිත්තක පක්ෂයෙහි ඇවැතට පත් වීම අකුසල සිතින් ම වේ නම් ඒ ලොකවජ්ජයි. වස්තු ව්‍යතික්‍රමණය නො දැන ද ඇතැම් ඇවැතකට පත් වේ. ඒ අචිත්තකාපත්තියි සචිත්තකාපත්ති නම්

වස්තුව්‍යතික්‍රමය දැනම පත් වන ඇවැත්ය. සචිත්තකාචිත්තක සඞ්ඛ්‍යාත දෙපසෙහි ම ඇවැත් මෙහිලා ගැනේ. ව්‍යතික්‍රමණය දැන පත් වන කල අකුසල සිතක් ම උපදිතොත් එය ලොකවජ්ජ සි.

**"විනා'පි චෙතනාය ආපජ්ජිතබ්බත්තා අචිත්තකානි, චිත්තෙ පන සති අකුසලෙනෙව ආපජ්ජිතබ්බත්තා ලොකවජ්ජානි චෙ'ව අකුසල චිත්තානි ච."**

**"පණ්ණත්තිවජ්ජස්ස වත්ථුවීතික්කම විජානන චිත්තෙන සචිත්තකපක්ඛෙ චිත්තං සියා කුසලං, සියා අකුසලං, සියා අබ්‍යාකතං, තස්මා තස්ස සචිත්තකපක්ඛෙ චිත්තං අකුසලමෙවාති අයං නියමො න'ත්ථී'ති සෙසං පණ්ණත්තිවජ්ජනති වුත්තං"** යනු සාරාර්ථදීපනිසි.

සුරා පිමේ දී සුරායසි නො දැන බීවත් අකුසල් සිතම උපදනේය යනු **විමතිවිනොදනී** මතයසි.

**15 කම්ම**-කායකම්ම, වාචාකම්ම, කායවාචාකම්ම විසින් ත්‍රිවිධසි. අදත්තාදානයේ දී කායද්වාරයෙන් ද, වාක්ද්වාරයෙන් ද ඇවැතට පත්විය හැකිසි. චිත්තසාදියන මාත්‍රය සලකා මනොද්වාරයෙහි ද ඇවැත් වේයසි ටීකාවේ කියැවිණ. ඒහිලා කාවිසි පියොවින් කළයුතු පිළිකෙව් නො කළ නිසා, අක්‍රියසමුට්ඨානය කාය-වාක් ද්වාරිකසි.

**16 කුසලත්තික**- කුසල අකුසල අව්‍යාකෘත චිත්තසි. පරිජි ආදිය අකුසල් සිතින් ද, සිකපද නො දැන පදසොධම්මවාචනාදිය කුසල් සිතින් ද, නො සිහියෙන් සහසෙය්‍යාදිය අව්‍යාකෘත සිතින් ද සිදු වේ. රහත්හු අව්‍යාකෘත සිතින් ම ඇවැත් අවදිති.

**17 වෙදනත්තික**-දුට්ඨදෙසාදියෙහි දුක් වේදනාව ද මෛථුන සෙවනාදියෙහි සුවවේදනාව ද, සුවවේදනාවෙන් පත්වන දැය මධ්‍යස්ථ කිරීමෙන් උපෙක්ඛා වෙදනාව ද ඇති වේ. නිදමින් නිරොධයට පත්වුණු පුද්ගල අචිත්තක ව අවෙදන ව සහසෙය්‍යාපත්තියට පත් වේ.

——



## ප්‍රථම පාරාජිකාව පිළිබඳ සප්තදශාකාරය.

1 **නිදාන**- වෙසාලිය.

2 **පුග්ගල**- සුදින්න.

3 **වත්ථු**- මෙවුන්දම් සෙවුම.

4 **පඤ්ඤත්ති**- "යො පන භික්ඛු මෙථුනං ධම්මං පටිසෙවෙය්‍ය පාරාජිකො හොති අසංවාසො." යනු **මූලප්‍රඥප්තිය** සි. "අන්තමසො තිරච්ඡානගතාය'පි" යනු ද, "භික්ඛූනං සික්ඛාසාජීව සමාපන්නො සික්ඛං අපච්චක්ඛාය දුබ්බල්‍යං අනාවිකත්වා." යනු ද **අනුප්‍රඥප්තිසි**.

5 **ආණත්ති**- ඇණවීමෙන් මෙවුන්දම් සෙවුමේ දී ඇණවූවහුට පරිජි නො වේ. (එහෙත් අකප්පිය සමාදාන දුකුළා වේ.)

6 **ආපත්ති**-මෙවුන්රායෙන් කාසසග කිරීමෙන් දුකුළාසි. නිමිත්තෙහි හටගත් නො නට කායප්‍රසාදය ඇති පිළකයක් හෝ චම්මඛීලයක් (=ඛීලාකාර සමක්) හෝ මෙහෙයීමෙන් පරිජිසි. කායප්‍රසාදය නැති වියළි පිළකයක් (=බිබිළ නොහොත් ඉන්න) හෝ මළසමක් හෝ ලොම් ඇඟිලි ආදිය හෝ මෙහෙයීමෙන් දුකුළාසි. ස්ත්‍රී-පුරුෂ-පණ්ඩකාදි සියලු මිනිසුන් ගේ ඇස්-නාසා-කන් සිදුරෙහි ද, අඞ්ගජාත කොෂයෙහි (-මූත්‍ර පුටයෙහි) ද, ඇත්-අස්-ගො ආදි තිරිසනුන් ගේ වත්ථිකොස නාසා පුටයන්හි ද මෙහෙයීමෙන් ථුලැසි වේ. තිරිසනුන් ගේ ඇස්-කන්වලද, ස්ත්‍රී - පුරුෂාදීන් ගේ කිසිලි ආදියෙහි ද මෙවුන්රායෙන් මෙහෙයීමෙන් දුකුළාසි.

7 **අනාපත්ති**-අනුන් කළ උපක්‍රමය නො දත්තහුට ද, ව්‍යතික්‍රමය දැන නො ඉවසූවහුට ද, උම්මත්තක ඛිත්තචිත්ත වෙදනට්ට ආදි කම්මික යන මෙථුනට ද ඇවැත් නැත. උම්මත්තකයා නම් පිත්තුම්මත්තකයා සි. පිත්ත කොෂයෙහි සිටි බද්ධපිත්තය කිපීමෙන් හෙවත් සැලී වැගිරීමෙන් උම්මත්තක බව වේ. බෙහෙතින් ද සුව කළ නො හේ. ඛිත්තචිත්තයා නම් පියෙවි සිහි නැති යක්ඛුම්මත්තකයා සි. බිරුරු දැක්වීමෙන් ද, හෘදය මාංස මැඩීමෙන් ද යක්කු සතුන් ඛිත්තචිත්තයන් කරති. පිත්තුම්මත්තක නිරතුරු උමතුසි. පියෙවි සත් නො ලබා. යක්ඛුම්මත්තක අතරතුර පියෙවි සත් ලබා.

8 **විපත්ති**-සීලවිපත්තියසි.

9 **අඞ්ග**-සෙවුනා සිත, මාර්ගයෙන් මාර්ග ප්‍රතිපාදනයසි දෙකෙකි.

10 **සමුට්ඨාන** කාය චිත්ත සමුට්ඨානයයි.

11 **කිරියා**- ක්‍රියාවෙන් ඇවැත වේ. පරොපක්‍රමයෙන් මෛථුනය ඉවසන කල අක්‍රියයෙන් ද වන බව පැනේ. එහෙත් **විමති විනොදනිය ක්‍රියාභාවය** ම සාධනය කෙරේ.

12 **සඤ්ඤා**-මෛථුන පටිසංයුත්ත කාමසඤ්ඤාව නැතහොත් ඇවැත් නො වන බැවින් සඤ්ඤාවිමොක්ඛයි.

13 **චිත්ත**-සිත ඇතිව ම පත් වන බැවින් සචිත්තකයි.

14 **වජ්ජ**-අකුසල සිතින් ම පත්වන බැවින් ලොකවජ්ජයි.

15 **කම්ම**-කායකම්මයි. කායද්වාර බව වීමට කායවිඤ්ඤත්තිය පමණක් ප්‍රමාණයි. සිත කායවිඤ්ඤත්තිය පිළිබඳ අඞ්ගමාත්‍රයෙකි.

16 **කුසලත්තික**-අකුසලචිත්තයි.

17 **වෙදනත්තික**-සුඛ හෝ උපෙක්ෂා හෝ වන බැවින් ද්විවෙදනයි. (මත් තෙහි ආවශ්‍යක තැන් පමණෙක් දක්වනු ලැබේ.)

---

## දුතිය පාරාජිකා.

25 **ගාමා වා අරඤ්ඤා වා.**

වැට කඩුලු පවුරු ආදියෙන් පරික්ඛිත්ත නම් එම පරික්ෂෙපයෙන් ද, අපරික්ඛිත්ත නම් අන්තිම ගෘහයේ උපචාරයේ සිට ගැසූ ගලක් වැටෙන මානයෙන් ද ඇතුළත ග්‍රාමයයි. පියස්සෙන් දිය වැටෙන සීමාවෙන් ඇතුළත ගෙයයි. අපරික්ඛිත්ත ගෙහි ඉදිරි දොරටුවේ සිට කාකුඩ්ඩපක නියායෙන් දමූ කුල්ලක් මුසුනක් වැටෙන තරම් දුරින් ද, වැට පවුරු ඇතොත් එයින් ද ඇතුළත ගෘහොපචාරයයි. ගමේ සිට ගැසූ ගලක් හෙන තැනින් මොබ ගාමොපචාරයයි. උපචාරය ද ගමට ඇතුළති. එහෙත් පරික්ඛිත්ත ග්‍රාමයේ උපචාරය විනයෙහි උපයොගයට නො යන බව **විනයත්ථ මඤ්ජූසා**වෙහි ප්‍රකාශිතයි එක් ගෙයක් ඇති ස්ථානය ද නගරය ද ගමට ඇතුළති. ගාම-ගාමූපචාර හැර සෙස්ස මෙහි දී අරණ්‍යයි. අභිධම් යේ දී දොරටු එළිපතෙන් බැහැර අරණ්‍යයයි. සූත්‍රාන්ත අරණ්‍ය සෙනාසනය ග්‍රාම ඉන්ද්‍රඛීලයේ සිට දුනු පන්සියයක් දුරින් පිහිටියේය.

26 **අදින්නං.**

භාණ්ඩස්වාමීන් විසින් කයින් හෝ වචනින් හෝ නො දෙන ලද්දවූ ද, අනපෙක්ෂතාවෙන් නොහරන ලද්දවූ ද වස්තුවයි.



27 **ථෙය්‍ය සඞ්ඛාතං.** (කාරණතේ පඨමා)

"ථෙනස්ස භාවො ථෙය්‍යං, (නකාරයට ලොපයි.) ථෙය්‍යඤ්ච තං සඞ්ඛාතඤ්චා'ති ථෙය්‍යසඞ්ඛාතං" සඞ්ඛා සඞ්ඛාත දෙ සඳ ම කොටස යන අර්ථය දෙන බැවින් මෙහි තේරුම 'සොර සිත නමැති සිත් කොටසින්' යනුයි. මෙයින් විස්සාසග්ගාහ තාවකාලිකග්ගාහ වශයෙන් පැවැති අථෙය්‍යචිත්ත කොට්ඨාසය නො ගැනේ.

28 **ආදියෙය්‍ය.**

**ආදියන හරණ අවහරණ ඉරියාපථවිකොපන ඨානාචාවන සංකෙතවීතිනාමන** යන ස පදයෙන් විභඞ්ගයෙහි මෙය වර්ණිතයි. අටුවාවෙහි දක්වෙන පස්විසි අවහාරයෝ මෙහි ප්‍රභෙද වෙති. අභියොගාදි ආකාර නානාත්වයෙන් ඔවුන් ගේ භින්නතාව වේ. ස වැනි සඞ්කෙතවීතිනාමනය නිස්සග්ගියාවහාර පරිකප්පාවහාර දෙකට සාධාරණයි. **නානාභණ්ඩපඤ්චකය, එකභණ්ඩපඤ්චකය, සාහත්ථිකපඤ්චකය, පුබ්බපයොගපඤ්චකය, ථෙය්‍යාවහාරපඤ්චකය** යනු පඤ්චක පසයි.

## 1. නානා භණ්ඩ පඤ්චකය.

**සවිඤ්ඤාණක අවිඤ්ඤාණකවසෙන නානාවිධා භණ්ඩා එතස්සා'ති නානාභණ්ඩං, පඤ්චන්නං අවහාරානං සමූහො පඤ්චකං, නානාභණ්ඩමෙ'ව පඤ්චකං නානාභණ්ඩපඤ්චකං.**

i **ආදියෙය්‍ය**-අන්සතු පුෂ්පාරාමඵලාරාමාදිය 'මාසතු'යයි පැමිණිලි කෙරේ නම් දුකුළායි. අත්පත්වේ ද නො වේ දැයි වත්හිමියාට සැක උපදවා නම් ථුල්ලැසියි. 'ඒ අරමින් කම් නැතැ'යි වත්හිමියා ධුරනික්ෂෙප කළ කල (=තමා අයත් කර ගැන්මෙහි උත්සාහය හළ කල) සටන් කරුත් 'නො දෙමි'යි ධුර නික්ෂෙපකොට සිටී නම් පරිජියි.

ii **හරෙය්‍ය**-මෙය ගෙනයව යි හිමියන් විසින් නො මෙහෙයන ලද යම් මහණෙක් 'මම ගෙන ගොස් දෙමැ'යි තෙමේ ම බඩුව හිසින් ගෙන යමින් සොරසිතින් කරට ගනී ද නැතහොත් ඔසවා ද පරිජියි. ගෙනයේව යි හිමියන් ගේ අදහස තිබුණත් ඔවුන් එසේ අණ නො කළ බැවිනි. බඩභාරාදියෙහි ද මෙ ම නයයි. 'මේ බඩුව ගෙනගොස් අසුවල් තැන දී දෙව'යි හිමියන් විසින් අණ කරනු ලැබුව හොත් එය උපනික්ඛිත්ත භාණ්ඩයෙක් වේ සොරසිතින් ඨානාචාවනය කළ ද පරිජි නැත. හිමියා ගේ ධුර නික්ෂෙපයෙන් ම පරිජි වේ.

iii **අවහරෙය්‍ය**-ආරක්ෂාවට තැබූ භාණ්ඩයක් හිමියා ඉල්ලූ කල 'මම නො ගත්මි'යි කීමෙන් දුකුලා ද, දේ දෝ නො දේ දෝ යි සැක ඉපදවීමෙන් ථුලැසි ද, අපෙක්ෂාව හැරීමෙන් පරිජි ද වේ. වෙහෙස කොට දෙමියි සිති නම් නො වේ. සිතින් නො දෙමියි සිතා වචනයෙන් දෙමි යි කිව ද මුකාහි නැති.

iv **ඉරියාපථං විකොපෙය්‍ය**-'බඩුව එය ගෙනයන්නා සහිත ව ගනිමි'යි සිතා තර්ජනයෙන් ඔහු ගේ ගමන් මඟ වළහා, තමන් කැමැති මඟට එක් පියක් තැබවීමෙන් ථුලැසි ද, දෙවැන්නෙන් පරිජි ද වේ.

v **ඨානා චාවෙය්‍ය**-යම් කවර තැනෙක තුබූ භාණ්ඩයක් සොර සිතින් ඨානාචාවනය කළ හොත් පරිජි වේ.

## 2. එකභණ්ඩ පඤ්චකය.

**'සවිඤ්ඤාණකා වසෙන එකො භණ්ඩො එතස්සා'ති එකභණ්ඩං.'** ස සවාමික දාසයකු හෝ තිරිසනකු හෝ පූර්වෝක්ත අභියොගාදි විසින් ආදියන, හරණ අවහරණ, ඉරියාපථවිකොපන, ඨානාචාවන කිරීම් වශයෙන් මෙය ලැබේ. මෙහි දී හුදු සවිඤ්ඤාණකයෝ ම ගැනෙති. ප්‍රථම පඤ්චකයෙහි සවිඤ්ඤාණක අවිඤ්ඤාණකයන් ගේ මුසුවීම වේ. අවිඤ්ඤාණකයන් ගේ වශයෙන් තෙවෙනි පඤ්චකයක් නො දැක්විය හැක්කේ ඉරියාපථවිකොපනය එහි නො ලැබෙන හෙයිනි.

## 3. සාහත්ථික පඤ්චකය.

සාහත්ථික සඳින් සහචරිත පඤ්චකය ගෙන '**සාහත්ථිකං ච තං පඤ්චකඤ්චා'ති සාහත්ථිකපඤ්චකං**' යනු වී. 'සාහත්ථිකාදි පඤ්චක' යන්නෙහි මධ්‍යපදලොපයෙන් හෝ සිද්ධ වී.

i **සාහත්ථික**-අනුන් සතු වස්තුවක් සියතින් සොරා ගැන්මයි

ii **ආණත්තික**-අසුවල් බඩුව සොරා ගනුව යි අනෙකකුට නියම කිරීමේ දී, ඇණවුම් ලැබුවහු එකාන්තයෙන් එය ගනිතොත් ඇණවූ තැනැත්තා නියම කළ කෙණෙහි පරිජියට පත් වේ. ඇණවුම් ලද්දේ ගත් කෙණෙහි පරිජිපත් වේ.

iii **නිස්සග්ගිය**-සුංවත් ගන්නා තැනෙක දී බදු නො ගෙවා, තම බඩු බැහැර හෙළා ගැන්මෙන් පරිජි වේ. මේ **සුඞ්කඝාතයි**. යමෙක් බඩුවක් ගෙන අසුවල් තැනින් මොබ දුටොත් 'බලන්නට ගත්මි'යි බැණ ආපසු දෙමි, නො දුට හොත් ගෙන යමි යි සිතා



පිරිකැපූ තැන ඉක්මවා ගනී ද පරිජි වේ. මේ **පරිකප්පිතොකාස**යි. ශුද්ධ සිතින් අනුන් ගේ බඩුවක් ගෙන, සොර සිතින් පිළිසන් තැනෙක බහාලීම ද මෙහි සඞ්ගෘහිත වේ.

iv **අත්ථසාධක**-"**ක්‍රියාසිද්ධිතො පුරෙතරමෙ'ව පාරාජිකාපත්ති සඞ්ඛාතං අත්ථං සාධෙති'ති අත්ථසාධකො**" අසුවලා ගේ මෙනම් බඩුව හැකි දිනෙක ගනුවයි ඇණවුම් ලද අවහාරකයා පනස් වසෙකින් එය ගත ද, ආණාපකයාහට ඇණවූ කෙණෙහි ම පරිජි වේ. සොරා ගැන්මට පෙර මළ ද පරිජිව ම මෙලේ වේ. මේ ඇණවීම් ප්‍රයොගය, බඩු ගැන්මට පෙර පරිජි අර්ථය සිද්ධකළ බැවින් අත්ථසාධක විය. නික්ෂෙප ප්‍රයොගය ද අත්ථසාධක වේ. එහෙයින් මෙරමා ගේ තෙල් සැළි ආදියෙහි, පාදයක් අගනා තෙල් බොන සේ වහන් වස්ත්‍රාදිය හෙළා නම්, අතින් මූත් කෙණෙහි (තෙල් උරාගැනීමට පෙර ම) පරිජි වේ. තම බඳුනෙහි අනෙකකු බහා තැබූ ගිතෙල් ආදියට සොර සිතින් පෙර සේ යමක් දමාලුවත් පරිජිමැයි. වහන් බහාලීම් ප්‍රයොගය තෙල් පීමට පෙර ම පරිජි අර්ථය සිද්ධකළ බැවින් සාහත්ථික වශයෙන් අත්ථසාධක විය යනු **සාරත්ථදීපනියි**. ආණත්තිය එකෙණෙහි ගැන්ම සඳහා ද, අත්ථසාධකය පසුව ගැන්ම සඳහා ද වේ.

v **ධුර නික්ඛෙප**- '**ධුරස්ස ආලය සඞ්ඛාතස්ස භාරස්ස නික්ඛිපනං පරිච්චජනං නිරුස්සාහ භාවා'පජ්ජනං ධුරනික්ඛෙපො.**' මෙය උපනික්ඛිත්ත භණ්ඩ (=පරිස්සමට තැබූ දෑය) වශයෙන් කීයේ උපලක්ෂණ වශයෙනි. එහෙයින් ආරාමාදිය ගන්නා කල්හි ද තාවකාලිකව ගත් දෑයක් නො දෙන කල්හි ද, භාණ්ඩදෙයය නො දෙන කල්හි ද දෙදෙනා ගේ ධුර නික්ෂෙපයෙන් පරිජි සිදු වේ.

## 4. පුබ්බපයොග පඤ්චකය.

i **පුබ්බපයොග- ඨානෙන වා ඨාචාය වා පයුඤ්ජනං ආණාපනං පයොගො. ආණත්තස්ස භණ්ඩගහණතො පුබ්බත්තා ඉති පුබ්බො ච සො පයොගො චා'ති පුබ්බපයොගො**

අසුවලා ගේ බඩු ගනුවයි ඇණවුම් ලද්දේ නො වරදවා ගනී නම්, එකෙණෙහි ම ආණාපකයාට පරිජි වේ. පුබ්බපයොග අත්ථසාධක දෙක්හි වෙනස නො පැහැදිලිය. **සිඛවලඤ්ජනිස්සයෙහි** වෙනසක් කියා ඇතත් අත්ථ ශබ්දය හැර අන් වෙනසෙක් එහි දු නැත. ආණත්තික අත්ථසාධක පුබ්බපයොග ත්‍රයම ඇණවීමෙන් සිදු වේ. පූර්වද්වයෙහි කාලභෙදය වෙයි. පුබ්බපයොගය කාලභෙදයක් නැති ව සාමාන්‍ය ඇණවීමක් ඇති තැන යයි සිතිය හැකියි.

ii **සහපයොග**-"**ඨානාචාවන බිලසඞ්කාමන පයොගෙන සහ වත්තමානො සහපයොගො**" ඨානාචාවන වශයෙන් ද, පිටතට නෙරවා හිමි කණු සිටුවීමෙන් ද, වැල් ඇදීමෙන් ද, වැටපවුරු බැඳීමෙන් ද අන්සතු කෙත් වත් සොර සිතින් ගැනීම් වශයෙන් කැරෙන ප්‍රයොගයෙහි දී අවසන් පියොච්හි පරිජි වේ. බිලසඞ්කාමන යේ දී හිමියෝ ධුරනික්ඛෙප නො කොට සිය අයිතිය ගනු රිසි ව සිටිත් නම් පරිජි නැත. බිලසඞ්කාමනය කළ බව නො දැන තිබෙන පරිදි හිමියන් භාර ගත හොත් ඒ භාරගැනීම ද ධුරනික්ඛෙප ගණනට යේ. සඞ්කාමනයට පළමුවෙන් අයිතිකරුවෝ ධුරනික්ඛෙප කළෝ නම්, ඉන් පසු කළ සඞ්කාමනයේ දී අවහාර නැති.

iii **සංවිදාවහාර**-"**සමං එකී භූත්වා ඕදහිත්වා මන්තෙත්වා අවහරණං සංවිදාවහාරො**-බොහෝ දෙනකු සොර කමක් කිරීමට සාකච්ඡා කොට ගෙන සිටින සඳ, ඔවුනතුරෙන් එකකු හෝ සොර කම කළ හොත් සැමටම පරිජි වේ.

iv **සඞ්කෙතකම්ම**- "**පුබ්බන්හාදි කාලපරිච්ඡෙදෙන සඤ්ජානනං සඞ්කෙතො, සඞ්කෙතෙන කතං කම්මං සඞ්කෙතකම්මං.**" පෙරවරු පස්වරු යනාදීන් කාලය නියම කොට සොරා ගනුවයි ඇණවීමේ දී ආණත්තයා කාලය නො වරදවා ගතිතොත් ආණාපකට ඇණවූ කෙණෙහි පරිජිසි. අද පෙරවරු ගනුවයි ඇණවුම් ලද්දේ පසුදා පෙරවරු ගනී නම් ආණාපකයාට ඇවැත් නැති. සති මාස් වෂී පිළිබඳව ද නය එයයි.

v **නිමිත්තකම්ම**-"**සඤ්ඤුප්පාදනත්ථං කස්සචි නිමිත්තකරණං.**" සංඥ උපදවා දෙනු පිණිස ඇස කෑණීම හිස වැනීම වැනි නිමිත්තක් පෙන්වා ඒ අනුසාරයෙන් සොරා ගැන්මට සැලසීමයි. ඇණවුම් ලද්දහු පෙර පසු නො ව නිමිති අනුව සොරා ගතිතොත් මූලට්ඨයාට සලකුණු කළ කෙණෙහි පරිජි වේ. සඞ්කෙත කම්ය කාල වශයෙන් ද නිම්ත්තකම්ය ක්‍රියා වශයෙන් ද දැක්විණ.

## 5. ථෙය්‍යාවහාර පඤ්චකය.

i **ථෙය්‍යාවහාර**-ගෙවල් බිඳුම ආදි ලෙසින් අදෘශ්‍යමානව ද, තුලාකූට, මානකූට, කූටකහාපණාදි වශයෙන් වංචාකොට ද ගැන්මයි. තුලාකූටය හෙවත්-තරාදියෙන් වංචාකිරීම **රූපකූටාදි විසින් චතුර්විධ වේ**

**රූපකූට**-ගන්නාවිට ලොකු තරාදියෙකිනුත්, දෙනවිට කුඩා තරාදියෙකිනුත් බඩු කිරීම.



**අඞ්ගකූට**-ගන්නාවිට තුලාවේ පසුපස ද, දෙනවිට ඉදිරි පස ද මැඩීම.

**ගහණකූට**-ගන්නාවිට තරාදි රැහැන මුලින් ද, දෙනවිට අගින් ද ඇල්ලීම.

**පටිච්ඡන්නකූට**-තරාදි තටුව සිදුරු කොට යකුඩු බහා ගැනීමේ දී පසුපසට ද, දීමේ දී ඉදිරිපසට ද කිරීම.

**මානකූටය හදයභෙදාදි විසින් ත්‍රිභෙද යි.**

**හදයභෙද**-නැළි ආදි මිනුම් භාජනවල සිදුරක් කොට තෙල් ආදිය දෙනවිට සිදුර අතින් වසා වහා ගෙන දීම ද, ගන්නා විට තම බඳුනට වඩා වැටෙන සේ සෙමින් වැක්කිරීම ද වේ.

**සිඛාභෙද**-සහල් ආදිය අනුනට දෙනවිට වහා පුරවා මුදුන කපා ද ගන්නාවිට සෙමින් පුරවා මුදුන තබා ද මැනීම.

**රජ්ජුභෙදය**-කෙත්වත් මැනීමේ දී කුඩු මහත් වන සේ මිනුමය. **කූටකහාපණ** නම් හොරකාසි දීමයි. **කංසකූට** නම් සවර්ණය කියා බාල ලොහවගී දීමයි. මේ හැර කවර උපායෙකින් තමුදු වංචා කොට ගනු දෙනු කිරීමේ දී ථෙය්‍යාවහාරය සිදු වේ.

ii **පසය්හාවහාර**-'**පසය්හ අභිභවිත්වා හරණං**' ගාමඝාතක පන්ථඝාතකාදි සොරුන් සේ අනුන් අයත් දෑය බලාත්කාරයෙන් ගනී ද, බියපත් කොට ගනී ද, ගතයුතු බද්දට වැඩියෙන් බදු ගනී ද පරිජිසි.

iii **පරිකප්පාවහාර**-"**වත්ථං සුත්තකාදීනං පරිච්ඡිජ්ජ කප්පනං පරිකප්පො; අථවා භණ්ඩවසෙන ච පරිකප්පෙත්වා අවහරණං පරිකප්පාවහාරො.**" වස්ත්‍රයක් සොරා ගනු කැමැත්තෙක් අඳුරේ පිවිස 'අන් දෙයක් වුවොත් නො ගනිමි'යි සිතා පෙට්ටියක් සොරාගෙන යයි. ඇත්ත වශයෙන් එහි වස්ත්‍රයෙක් වී නම් උද්ධාරයෙහි ම පරිජිසි. අන්දෙයෙක් වී නම් නැත. ලැබුණු දේ මැනැවැයි ගතහොත් පරිජිසි. පෙට්ටියේ වස්ත්‍ර නො වීය. හිමියන් විසින් ලුහු බඳනා ලද්දේ එය හැර දමා දිවීය. හිමියෝ පෙට්ටිය රැගෙන ගියහ. වරද නැත. අනෙකකු ගෙන ගිය හොත් භණ්ඩදෙය යි. (=බඩුව හෝ තදඝනක අන් බඩුවක් හෝ දිය යුතු.) බඩුව නො දැක හිමියන් පෙරළා ගිය කල්හි, මා ගෙනා දෑය මට ම අයත්යයි සකසඤ්ඤ වෙත් ගෙන ගිය ද භණ්ඩදෙය්‍ය මැයි. **මේ භණ්ඩපරිකප්පයයි.**

යමෙක් අන් අරමකට ගොස් අගනා බඩුවක් ගෙන අසුවල් තැනින් මොබ දී දුටොත් 'බලනු පිණිස ගනිමි' යනාදිය පවසා

ආපස්සු දෙමි, නො දුට රැගෙන යමියි සිතා අදහස් කළ සීමාව ඉක්මවා ගෙන යයි ද පරිජ් වේ. **මේඛනාසපජ්ජනපයයි.**

iv **පටිච්ඡන්නාවහාර**– "**තිණපණ්ණාදීහි පටිච්ඡාදනත්ථාය අවහාරො.**" අනුන් සතු බඩුවක් දැක පසුව ගනිමි යි පස් වැලි ආදියෙන් වසා දැමීමෙන් පරිජ් සිදු නො වේ, ඨානාචාවනය නො වූ හෙයිනි. සොයා බලා නො දැක පසුව බලමු යි හිමියෝ සාලය ව ගියාහු නම් උද්ධාරයෙහි ම පරිජ්සි. හිමියන් ගිය පසු 'දැන් මෙය මා සතුය'යි සකසඤ්ඤයෙන් ගත ද, හිමියන් නැති වනෙකැයි පසුල් සඤ්ඤයෙන් ගත ද භණ්ඩදෙය්‍යයි. හිමියෝ නිරාලය ව ගියාහු නම් සොර සිතින් ගත ද පරිජ් නැත. ඉල්ලුවොත් දියයුතු.

v **කුසාවහාර**-පිරිකර ආදිය බෙදීමේ දී තමන් ගේ වඩා වටිනා කොටසින් වුවත්, අනුන් ගේ අඩුවටිනාකමින් යුත් පරිජ් පොහෝනා වතක් සොරසිතින් කුස මාරු කොට ගනී නම් පරිජ් වේ.

බහුශ්‍රැත විනයදත්නා භික්ෂුවක් අකැප පිරිකරක් ගෙනයන මහණකු දැක, ඒ පිරිකර කඩා බිඳ දැමී නම් චොදනා නො කළ හැකිසි. පයඝීය කථාවෙන් අයිනාදන් පරිජ් නො වේ. සොරාගත් තමා ගේ බඩුවක් නැවත තමන් ගතහොත් පරිජ් නො වේයයි ද, අනෙකකු ගතහොත් පරිජ් වේ යයි ද යෙත්. ඔච්චු ඇල්ලීමෙන් දුකුළා වන බවත්, පරාජිතයා නොදුන හොත් ධුරනික්ෂෙපයෙන් ඇවැත් කළයුතු බවත් **විමතිවිනොදනියෙහි** එයි.

**29 රාජානො.**

මේ රාජ සදින් අමාත්‍ය විනිශ්චයකාරාදීන් ද සඞ්ගෘහිත වන බව පදභාජනියෙන් පැනේ. බිම්බිසාරයන් ම ගැනෙන බව **මාතිකාට්ඨකථාවේ** සටහනි.

**30 චොරං.**

පස් මස්සක් හෝ අයිරා පස් මස්සක් හෝ එබඳු වටිනා වස්තු-වක් හෝ සොරාගත් තැනැත්තාය. **හනෙය්‍යුං** යන්නෙන් අත් පා ආදියෙන් තැළීම ද, ශස්ත්‍රාදියෙන් කැපීම ද කියැවේ. **බන්ධෙය්‍යුං** යන්නෙන් රජ්ජුබන්ධන සඞ්ඛලිකබන්ධන නගරබන්ධන පුරිසගුත්ති වශයෙන් කැරෙන බන්ධනය ද; **පබ්බාජෙය්‍යුං** යන්නෙන් රටින් බැහැරලීම ද කියැවේ.

**31 තථාරූපං.**

අයිනාදන් පරිජ්යේ දී මිල නියම වන්නේ පුරාණ නීලකහා-පණයා ගේ වශයෙනි. බිම්සර රජුකල එහි බර මාසක විස්සෙකි.



**මාසකය නම් මදට යයි විනයත්ථමඤ්ජූසාව** කියයි. පාදයකට මාසක පසෙකි. මාසක පසෙක රන්වල වටිනාකමින් පාදය පිරිසිඳිය යුතුය යනු **විමතිවිනොදනී** ආදියෙහි ප්‍රකාශිතයි. මේ නීලකහා-පණය ගැන මත දෙකෙකි. තනි රනින් ම නිමවන ලද්දක්ය යනු විමතිවිනොදනී ආදියේ මතය බව පාදපරිච්ඡේදයෙන් සලකාගත හැකියි. **උත්තරවිනිශ්චය ටීකාවේ** රන්මාසක පසක් ද රිදීමාසක පසක් ද, තඹමාසක දසයක් ද, වියැටක් පමණ ලොහො ද දමා නිම කළ මිශ්‍රකහාපණය ම නීලකහාපණයයි ද වියැට විස්සක් බර රනින් පාදයේ අග්ඝ පිරිසිඳිය යුතුයයි ද ප්‍රකාශිතයි. **හෙරණ සිඛ විනි-සෙහි** ද මේ මතය එයි. වියැට විස්ස මාසක දෙකහමාරයයි **කඞ්ඛා යොජනාවේ** කියැවේ, මාසකයට වියැට සතරක් ද පසක් ද අටක් ද වේයයි මත පවති. පාදය රන් මංචාඩි දෙකහමාරයයි ගත ද එය සත 75 කට වැඩිවූ ගණනක් බව පැනේ.

මංචාඩි 28 ක් බර රන්පවුමක මේකල වටිනාකම රුපියල් 78 ක් පමණ වේ. මෙය ලඞ්කාව තුළ ව්‍යවහාර වන ගණනයි. එවිට පාද-යෙක වටිනාකම 6. 95 ක් පමණ වේ.

———

ආපත්ති විනිශ්චයයේ දී මතු දැක්වෙන කරුණු ද විමසා බැලියයුතු බව **අටුවාහි** ප්‍රකාශිතයි.

**'වත්ථුං කාලඤ්ච දෙසඤ්ච – අග්ඝං පරිභොග පඤ්චමං,**
**තුලයිත්වා පඤ්චඨානානි – ධාරෙය්‍යත්ථං විචක්ඛණො'**

i **වත්ථුව**. සොරාගත් භාණ්ඩය ස සවාමික ද අසවාමිකදැයි සෙවිය යුතුය. අසවාමික නම් නිරාපත්තිකයි. ස සවාමික නම් සාලය (=බලාපොරොත්තු ඇතිව සිටි බව) නිරාලය බව දතයුතු. සාලය භාණ්ඩයක් නම් ඇවැත් නියම කළ යුතු.

ii **කාලය**. ඇතැම් බඩු සමහර කලෙක වඩා අගී. සොරා ගත්දින වටිනාකම සලකා ඇවැත් කළයුතු.

iii **දෙශය**. සොරකම කැරුණු පෙදෙසයි. එ පෙදෙසේ බඩුවේ වටිනා කමින් ඇවැත් පිරිසිඳිය යුතු.

iv **අග්ඝ**. බඩුවේ වටිනාකමයි. අලුත් බඩුව වඩා අගී. පරණවූ පසු අගය බසී. සැමදා එකවටිනාකමින් නො ගිණිය යුතු.

v **පරිභොග**. පරිභොගයෙන් ද බඩුවේ වටිනාකම බසී. තමන් මිල දී ගත් වාසිය වරක් කැපීමෙනුත් මූවගත් තැබීමෙනුත් උදකසාටිකාව වරක් හැඳපෙරවීමෙනුත් මුල් අගයෙන් අඩු වේ. අග්ඝහානිය භාණ්ඩ හිමියා මිල දී ගත් බඩු ගැනයි.

———

# සප්තදශාකාරය.

1. **නිදාන** - රජගහ නුවර.
2. **පුග්ගල** - ධනියත්ථෙර.
3. **වත්ථු** - බිම්සර රජුගේ දැව සොරා ගැන්ම.
4. **පඤ්ඤත්ති** - 'ගාමා වා අරඤ්ඤා වා' යනු අනුප්‍රඥප්තියි.
5. **ආණත්ති** - අනෙකකු ලවා සොරකම් කරවීමේ දී ආණා-
පකහට ද පරිජි වන බැවින් **සාණත්තිකයි**.
6. **ආපත්ති** - සොරාගැන්මට යාම් ඊම් ආදි සියලු පූර්ව ප්‍රයොග
යන්හි දුකුළායි. භාණ්ඩය සපඅී කිරීමෙන් ද දුකුළායි.
සෙලවීමෙන් ථුල්ලැසියි. මස්සකට වැඩි පස්මස්සකට අඩු
දූයක් ගැන්මෙන් ථුල්ලැසි ද, මස්සක් හෝ මස්සකට අඩු
දූයක් ගැන්මෙන් දුකුළා ද වේ.
7. **අනාපත්ති**. සකසඤ්ඤිස්ස, විස්සාසගාහෙ, තාවකාලිකෙ,
පෙතපරිග්ගහෙ. තිරච්ඡානපරිග්ගහෙ, පංසුකූලිකසඤ්ඤි-
ස්ස, උම්මත්තකාදීනං.

i. **සක සඤ්ඤිස්ස** - තමා සතු බඩුවෙකැයි සිතා අනෙකකු ගේ
බඩුවක් ගත ද ඇවැත් නැත. පසුව දියයුතු. හිමියන්
ඉල්ලූ කල නොදුන හොත් ධුරනික්ෂෙපයෙන් පරිජියි.

ii. **විස්සාසගාහෙ**- තමා ගේ දෘෂ්ටමිත්‍ර වූ හෝ දෘඪමිත්‍ර වූ හෝ
යමෙක් 'ඇසීමෙන් කම් නැත, මා සතු දූය කැමැති විටෙක
ගනුව' යි පවරා ඇත්තේ නම්; හෙතෙම ජීවත් ව ද සිටී
නම්, ගත්කල සතුටු ද වේ නම්, ඔහු ගේ දූයක් 'මා ගත්
කල තුටු වේ' යයි විශ්වාසයෙන් ගත හැකියි. මෙහි ලා
කරුණු තුනක් වත් සම්පූර්ණවිය යුතු

දෘෂ්ටමාත්‍රමිත්‍ර- ඔහු ජීවත්වීම- ගත්විට තුටු වීම.
දෘඪමිත්‍ර- ඔහු ජීවත්වීම- ගත්විට තුටු වීම.
මගේ දූයක් කැමැති විටෙක ගන්නැයි පැවරීම- ඔහුගේ ජීවත්
වීම- ගත්කල තුටු වීම යනුයි.

ගැනීම ගැන තුටු සිත උපදවා හෝ වචනයෙන් තුටුබව
පළ කොට හෝ පසුව කුපිත ව ආපසු ගත නො හැකිය. නො
දෙන රිසි තිබුණත් සිතින් ඉවසූ හෝ කිසිවක් නො බිණූ හෝ
පුද්ගලයා දුන්දූය නැවත ගන්වන්නට අභී නො වේ. ගත්විට
තුටු නො වන්නකුගේ දූයක් විස්වසිත් ගත ද නැවත දියයුතු.
ඉල්ලුවිටත් එය හිමියනට අත්වියයුතු.



iii. **තාවකාලිකෙ**- 'ආපසු දෙන්නෙමි'යි සිතා යමකුගේ බඩුවක්
තාවකාලි කොට ගැන්මෙහි වරද නැත. ඔබ ම ගන්නැයි
හිමියා නො කීවොත් ආපසු දියයුතුයි. සඞ්ඝික දූය පෙරළා
දිය යුතුමැයි.

v. **පෙත පරිග්ගහෙ**- දෙවියන් සතු ප්‍රෙතයන් සතු දූය ගත
හැකියි. දෙවියන් සඳහා පිදූ වස්ත්‍රාදිය ද ආරක්ෂකයන්
නැති තැන ගතහැකියි.

v. **තිරච්ඡාන පරිග්ගහෙ**-සිංහ-ව්‍යාඝ්‍ර-සුනඛාදීන් ඩැහැගෙන යන
යමක් හෙළවා ගත ද පරිජි නො වේ. එහෙත් එය කාරු-
ණ්‍යයට සුදුසු නො වේ.

vi. **පංසුකූලිකසඤ්ඤිස්ස**-අස්වාමික දූයෙකැයි පිරිසිදු සිතින් ගත
වරද නො වේ හිමියෝ ඉල්වත් නම් දියයුතු.

9. **අඞ්ග**- මිනිසකුට අයත්බව, අන්සතු දෙයකැයි දන්නාබව,
පාදග්ඝනක භාණ්ඩයක්බව, සොරසිත් ඇතිබව, උක්ත
අවහාරයෙකින් ගැන්මයයි අඞ්ගපසෙකි.

10. **සමුට්ඨාන**-කායචිත්තයෙන් හෝ වාචාචිත්තයෙන් හෝ කාය
වාචා චිත්තයෙන් හෝ නැගේ.

සියතින් ගන්නාකල කායචිත්තයෙන් ද, අනුන් ලවා
ගන්වනකල (-ආණත්තියේ දී) වාචාචිත්තයෙන් ද, 'මේ
ඉතා බර බඩුවෙකි, ඔබත් කොනක් ගන්නැ'යි දෙදෙනකු
ගේ ප්‍රයොගයෙන් බඩුවක් ස්ථානාචාවනය කිරීමේ දී කාය-
වාචාචිත්තයෙන් ද ඇවැත් වේ. මෙහිලා කායවාග්ද්වය
අඞ්ගමාත්‍රයි. සාහත්ථික හෝ ආණත්තික හෝ ප්‍රධානවූ යම්
ප්‍රයොගයෙකින් ස්ථානාචාවනය වී නම්, එයින් ඇවැත් කළ
යුතු. සාහත්ථික-ආණත්තික දෙදෙන ඔවුනොවුනට අඞ්ග
නො වෙති. ඇණවීමෙන් මිසු තුනකුත්, සියතින් තුනකුත්
සොරාගත්විට පරිජි නැත. සාහත්ථිකයේ දී ගන්නා
කෙණෙහි ද ආණත්තිකයේ දී ඇණවූ කෙණෙහි ද පරිජි
වන බැවින් මේ දෙක්හි නියතකාලතාව වේ. එහෙයින්
අඞ්ග නො වනුයේ.

ii. **කිරියා**-කිරීමෙන් ඇවැත වේ.

12. **සඤ්ඤා**-සොරාගනිමි යන හැඟීම නො වේ නම් ඇවැත නො
වන බැවින් සඤ්ඤාවිමොක්ඛයි.

—,ο/—

## තතියපාරාජිකා.

**32. සඤ්චිච්ච.** (පෙරකිරියයි. සං යනු සහාර්‍ථයෙහි අව්‍යයයි.)

මෙතෙම ප්‍රාණියෙකි යන සංඥාවත් සමග හෙවත්-ඒ සංඥාව ඉපදීමට අනතුරු ව, නසමි යන වධකචෙතනාවෙන් සිතා-සන්ටුහන් කොට යන අදහසයි. **'මනුස්ස'** ශබ්දය නො යොද **'පාණ'** ශබ්දය යෙදීම නිසා, මිනිසෙකැයි නො දැන හුදක් 'ප්‍රාණියෙකි' යන හැඟී මෙන් නමුදු මිනිසකු නැසුවහුට පරිජ සිද්ධ වේයයි ප්‍රකාශිතයි.

**33. මනුස්සවිග්ගහං.**

කලලාවස්ථාවෙහි පටන් මරණාවස්ථාව තෙක් ක්‍රමයෙන් අභිවර්‍ධනයට පත් මිනිස්සිරුර **'මනුස්සවිග්ගහ'** නමි. කලලරූපය නම්, පිළිසඳ සිත හා එකවට ම කර්මශක්තියෙන් පහළ වන, කාය-භාව-වත්‍ථු යන දශකත්‍රයෙන් ලැබෙන සමතිසක් වූ රූපයයි. මෙය පියෙවි ඇසට නො පැනේ. පිළිසඳ සිත හා හටගත් රූපතිස පවත්නාකල්හි ඉපද නිරුද්ධවන සොළොස් චිත්තක්ෂණකාලය තුළ, චුතිසිතක් ඉපදිය නො හැකි බැවින්, එම කාලයෙහි කලලරූපයා ගේ මරණයෙක් සිදු නො වේ. එපමණ කලක් නො සිට මියන මවක ගේ ගැබ්ගැන්ම ද නො වන බැවින්, මවගේ මරණය ද සිදු නො වේ.

**34. ජීවිතා.**

ජීවිතය නම් ජීවිතෙන්‍ද්‍රියයි. එය රූප-අරූප විසින් ද්විභෙද වේ. කර්මබලයෙන් රූපස්කන්ධයෙහි හටගන්නා, රූපසමූහය ජීවත් කරන ශක්තිවිශෙෂය **රූපජීවිතෙන්‍ද්‍රියයි.** හැම සිතක් පාසා ම යෙදෙන චිත්තචෛතසිකයන් ජීවත් කරන ශක්තිවිශෙෂය හෙවත්-චෛතසිකය **අරූපජීවිතෙන්‍ද්‍රියයි.** අරූපජීවිතෙන්‍ද්‍රිය පවත්නා කාලය මෙන් සතළොස් වාරයක් රූපජීවිතෙන්‍ද්‍රිය පවතී.

**35. වොරොපෙය්‍ය.**

මව් කුසේ දී තැලීම මැඩීම ගබ්සාබෙහෙත් දීම ආදියෙන් ද, ප්‍රසූති කාලයේ සිට සාහත්‍ථිකාදි ප්‍රයොගයන්ගෙන් ද වෙන්කිරීමයි. ඝාතනය පිළිබඳ විශෙෂාවබොධයට **පාණ, පාණාතිපාත, පාණාතිපාතී, පාණාතිපාතප්පයොග යන චතුෂ්ටය** දතයුතු වේ.

i. **පාණ නම්** ව්‍යවහාර වශයෙන් සත්ත්වයායි. හෙවත්-පඤ්චස්කන්ධයයි. **පරමාර්‍ථ** වශයෙන් ජීවිතෙන්‍ද්‍රියයි.

ii. **පාණාතිපාත නම්** ජීවිතෙන්‍ද්‍රිය නසාලීමට උපකාරවත් ප්‍රයොගය උපදවන චෙතනාවයි. යම් චෙතනාවෙකින්, පවත්නා ජීවිතෙන්‍ද්‍රියට නිශ්‍රය වන පඨවි ආදි මහාභූතයන් කෙරෙහි, උපක්‍රම



කරණයට හෙතු වූ මහාභූතයන් නිසා, මතු උපදනා මහාභූතයෝ නූපදින් ද; එබඳු ප්‍රයොග නහාලන, කාය-වාග්ද්වාරයන් ගෙන් එක්තරා ද්වාරයෙකින් පවත්නා චෙතනාව පාණාතිපාතයයි. ද්‍රව්‍ය නො වූ චිත්තචෛතසික පරපුර ක්ෂණික බැවින් ඡෙදන හෙදනාදියට භව්‍ය නො වේ. අචෙතනික බැවින් හුදු රූපපරපුර සිඳලීමෙන් ද ප්‍රාණඝාතය නො වේ. අතීත අනාගත රූපපරම්පරා, ඉක්මගිය බැවින් ද නූපන් බැවින් ද සිඳිය නො හැකිය. පච්චුප්පන්නරූපය ජීවත්වන බැවින් එහි උපක්‍රමය යුක්තය. හෙ ද **ඛණපච්චුප්පන්න, සන්තතිපච්චුප්පන්න, අද්ධාපච්චුප්පන්න** විසින් ත්‍රිවිධයි. උත්පාද-ස්ථිති-භඞ්ග යන අවස්ථාත්‍රයෙන් යුක්ත චිත්තක්ෂණය **ඛණපච්චුප්පන්නයි.** කාමාවචර ජවනවාර සතක් අටක් පවත්නා කාලය බුද්ධකභාණක මතයෙන් **අරූපචු සන්තතිපච්චුප්පන්නයි.** ශීතස්ථානයෙන් අවුත් හුන්නහුට විසභාග උෂ්ණ ඍතුව පහළවන තාක් පවත්නා රූපය **සන්තතිපච්චුප්පන්නයයි.** පටිසන්ධි චුති අතර කාලය **අද්ධාපච්චුප්පන්නයි.** මේ දෙක්හි රූපජීවිතෙන්‍ද්‍රිය නැසිය හැකියි. සන්තතිය නැසුණුකල අද්ධානයත් නැසුණේ වේ. රූපජීවිතය විකොපනය කිරීමේ දී එයට සම්බන්ධපැවතුම් ඇති බැවින් අරූප චිත්තචෛතසික ද විච්ඡෙදයට පත් වේ. සන්තති මරණය මෙහි දී යෙදේ.

iii. **පාණාතිපාතී** නම් පූර්වොක්ත චෙතනා යුක්ත පුද්ගලයි.

iv. **පාණාතිපාතප්පයොග නම්;** සාහත්‍ථික, නිස්සග්ගිය, ආණත්තික, ථාවර, විජ්ජාමය, ඉද්ධිමය ප්‍රයොගයි.

**සාහත්‍ථික**-සිය අත් පා ආදි සිරුරින් හෝ සිරුරින් නො මුදා කඩු ආදියෙන් හෝ පහර දීමයි.

**නිස්සග්ගිය**-දුර සිටින්නකු මරනු සඳහා කයින් හෙල්ල ආදිය දැමීම ද, කායපටිබද්ධවූ දුනු-තුවක්කු ආදියෙන් ඊතල වෙඩිසැර ඇයැවීම ද නිස්සග්ගිය ප්‍රයොග නම වේ. මේ අඞ්ගද්වය **උද්දිස්ස අනුද්දිස්ස** වශයෙන් ද්විප්‍රභෙද වේ. උද්දිස්සකයෙහි යමකු උදෙසා පහරදේ නම්, ඔහුගේ ම මරණින් ප්‍රාණඝාතය වේ. අනුද්දිස්සකයේ දී පුගුලකු වෙන් කොට නො ගත් බැවින්, කවරකුගේ හෝ මරණින් කර්මසිද්ධිය වේ. පහර දීමෙන් පසුව හෝ එයින් මැරේ නම් පහර දුන් කෙණෙහි ම ප්‍රාණඝාතය වේ. බොහෝ දෙනකුන් එක්ව පහරදීමේ දී යමකුගේ පහරින් මෙළේ නම්, ඔහුට කර්ම සිද්ධියයි. වධකචිත්තය පච්චුප්පන්නාරම්මණ වුව ද, අනාගත ජීවිතෙන්‍ද්‍රිය ඇරැබැ ද ප්‍රාණඝාතය පවත්නාබව පූර්වොක්ත කරුණින් පැනේ. ආණත්තියේ දීත් ඝාතනය පසුව වුව ද පරිජය පෙර ම වේ. ථාවර

ප්‍රයොගයේ දී ප්‍රයෝගයට පසුව පිළිසිඳගත්තකුගේ මරණයෙන් වන ප්‍රාණඝාතය ද අනාගතාරම්මණ ව උපදී. පෘථුජ්ජනකාලයෙහි දුන් විෂාදියෙකින් රහත් ව යමෙක් මෙළේ නම් අරහන්තඝාතකයි. පුහුදුන්කල දුන් දන රහත්ව වැළඳුව ද පෘථුජ්ජනයාට ම දුන්නේ වේ.

**ආණත්ති**-ආණත්තියේ දී **වත්ථු-කාල-ඔකාස-ආවුධ-ඉරියාපථ-ක්‍රියාවිශෙෂ** යන සකරුණින් වන සඞ්කෙත-විසඞ්කෙතතා වත් දතයුතුය. ක්‍රියාවිශෙෂාඞ්ගය ආවුධාඞ්ගයට ද සඞ්ග්‍රහ කෙරෙත්.

**වත්ථුව** නම්, මරනුලබන පුහුලාය. යමකු මැරවීමේ දී අණකළ කෙණෙහි ම ආණාපකයාට පරිජ් වේ. අනෙකකු මැරුව හොත් නො වේ. තමන් මරවා ගැනීමෙන් තමාට දුකුළායි. පරප්‍රාණියකු ගැන ප්‍රාණසංඥිතාලක්ෂණ අඞ්ගය සම්පූර්ණ නො වන බැවිනි. මව් පිය ආදි වස්තුවිශෙෂයෙන් ආනන්තරියාදි කර්මවිශෙෂය ද, ආපත්ති විශෙෂය ද වේ.

**කාල** නම්, පූර්වාහ්ණ අපරාහ්ණ යෞවනාදි කාල විශෙෂයයි. පෙරවරු මරවයි කීකල පස්වරු මැරී නම් ආණාපකට ඇවැත් නැත.

**ඔකාස** නම්, අසුවල් තැන දී මරව යි ග්‍රාම-වන-මාර්ගාදි ස්ථාන නියම කිරීමයි. විසංකෙත නුවූව පරිජිසි.

**ආවුධ** නම්, කඩු දුනු ආදි විසින් අවි නියම කිරීමයි.

**ඉරියාපථ** නම්, ගමන හිඳීම නිදීම සිටීම යන ඉරියවුවලින් යමක් නියම කොට මරවයි නියෝ කැරුමයි.

**ක්‍රියාවිශෙෂ** නම්, විදීම වෙඩි තැබීම ඇනීම ආදියයි. 'ඉදිරි භාගයට පසුභාගයට ගසා මරව යනාදිය වත්ථුවට අයත්ය' යනු **සාරත්ථදීපනී** මතයයි. 'එය ක්‍රියා විශෙෂයයි ද, පහර දෙන්නට නියම කළ ශරීරප්‍රදෙශය වෙනස් වුව ද වත්ථුවිසංවාදනය නො වේ' යනු **විමතිවිනොදනියි**. යමෙක් කවර තැනෙක දී කෙසේ හෝ යමකුගේ මරණය පතන්නේ අකුශලයෙන් හෝ චොදනාවෙන් මිදෙනු රිසියෙන් ලෙශයෙන් කාලාදි නියමයක් කෙරේ ද; පර්‍යාය යෙන්.මනුස්සවිග්ගහ පරිජ්ජෙන් බේරීමක් නැති බැවින් කාලාදි විසංකෙතය වුවත් කර්මසිද්ධිය වේයයි මතයෙක් වේ. යමෙක් ගිහි කල මව හෝ පියා හෝ මරන්නට නියම කොට පැවිදි වේද; පැවිද්දෙන් පසු මරණය සිදු වුවත් හේ ආනන්තරිකයෙකි. පැවිදි උප සපන් බව නො පිහිටයි. ක්‍රියාවිශෙෂාඞ්ගය අවුධාංගගතයි.

**ථාවර**-එක් තැනෙක පිහිටවූ උපකරණවලින් මැරෙන්නට සැලසීමයි. මඟ බොරුවළවල් කැණීම, හිඳිනා ඇඳ-පුටු ආදියෙහි



කඩු-හුල් ඈ තැබීම, විෂ යෙදීම, මනා නොමනා රූ එළවීම, යක් වෙස් ඈ ගෙන සිටුම, බිරුසත් නැගුම ආදියයි. මෙහි ද **උද්දිස්ස අනුද්දිස්ස** භෙදය වේ. තමාට අයත් බොරුවළ විකුණුව ද, එහි වැටී යමකු මළොත් මූලට්ඨයාට මුකති නැති. පිහිටි පොළොව සේ සම-තල කළ මනාය. මරණසංවණ්ණනා ලිපි සැපසුම ද, එල්ලා මැරීම නොව විදුලිපුටුවේ තබා මැරිය සුතුය යනාදි යොජනාක්‍රම ඉදිරිපත් කිරීම ද නො මනාය.

**විජ්ජාමය**-මන්ත්‍රශාස්ත්‍රයෙන් මැරීමයි. අථර්ව වෙද දන්නෝ සත්දිනක් අලොණ ආහාර කා, කුසතණෙහි හෙව තපස් කොට, සොහොන් ගොස්, වෙදවිහිත මන්ත්‍ර පිරිවහත්. එයින් ඔවුන් සිතූ දෑය සිද්ධ වේ. මෙය කායවාක් කර්මයනට සඞ්ගෘහිත වේ. විද්‍යාධරයෝ ද ගාන්ධාරවිද්‍යාදියෙන් එබඳු දෑය කෙරෙත්

**ඉද්ධිමය**-උපතින් ලත් කම්මවිපාකජ ඉද්ධියෙන් මැරුමයි. තජ්ජනය දත් සැපුම ආදි ක්‍රමයෙකින් බියපත් කොට මැරීම ගැනේ.

**36. සත්ථහාරකං වා අස්ස පරියෙසෙය්‍ය.**

**හරතී'ති-හාරකං**. (කර්තෘයෙහි), **හරිතබ්බන්ති-හාරකං** (කර්මයෙහි) ශස්ත්‍රයයි. **සසති හිංසති එතෙනා'ති-සත්ථං,** මුගුරු පහන් රුහැන් ආදිය ද ශස්ත්‍ර සඞ්ඛ්‍යාවට යෙයි. **"සත්ථං ච තං හාරකඤ්චා'ති- සත්ථහාරකං"** (විශෙෂණ පරනිපාතයි.) **'අස්ස'** යන්නෙහි අරුත **'මනුස්ස විග්ගහස්ස'** යන්නෙන් කියැවිණ. **'පරියෙසෙය්‍ය'** යන්නෙන් සෙවීම යන අරුත ගතහොත් ශස්ත්‍රයක් සෙවීම් මාත්‍රයෙන් ම පරිජ් වේ යයි විරුද්ධාර්ථයෙක් නැගේ. එහි අරුත **'උපනික්ඛිපෙය්‍ය'** යි කියැවිණ. මරණ රිසියෙන්නහුට ගත හැකි වන සේ ළඟ තැබීමයි. මෙයින් **ථාවරප්පයොගය** ප්‍රකාශිතයි.

**37. මරණවණ්ණං වා සංවණ්ණෙය්‍ය.**

'යමෙක් මෙසේ මැරේ නම් සගට යයි' යනාදි විසින් වචනයෙන් හෝ ලිපියෙන් මරණයේ ගුණ පැවසීමයි. පර්‍යායයෙන් කිව ද මළ හොත් ඇවැතට ප්‍රමාණයි. පිණ්ඩබොජුන් ' නො ලබන මේ දුක්දිවියෙන් කවර වැඩෙක් දෑ'යි දිවියෙහි දෙස් දැක්වීම ද, 'ඔබ පිනැත්තෝය, දිවියට වඩා මරණය මැනැවැ'යි මරණයෙහි අනුසස් බිණීම ද මරණ සංවණ්ණනය මැයි.

**38. මරණාය වා සමාදපෙය්‍ය.**

'විෂ කව, ගෙල වැල් ලව' ආදි ක්‍රමයෙන් මරණොපක්‍රම හෙවත් මරණයට උපාය දක්වාලීමයි. **'අම්භො පුරිස, කිං -සෙ- මතං තෙ ජීවිතා සෙය්‍යො'** යනු සංවණ්ණනය කරන අයුරු දක්වන වාක්‍යයි. මෙහි ආණත්තික ප්‍රයොගය කියැවිණ. **'මතං'**යනු භාවයෙහි සිද්ධයි,

**39. ඉතිචිත්තමනො.**

**'ඉති'** ශබ්දය පූර්වෝක්ත 'මතං තෙ ජීවිතා සෙය්‍යො'යි කියැවුණු මරණය ම නිදර්ශනය කරයි. චිත්ත-මන දෙස ද අසත්‍යාර්ථයෙහි සිද්ධව විශෙෂණ සමාස ව සිටී. චිත්ත ශබ්දයට 'මන' යනු පර්‍ය්‍යාය විශෙෂණයි. ඉන් සිත ම ගැනේ.

**40. චිත්තසඞ්කප්පො.**

'ඉති' යනු අධ්‍යාහෘතයි. චිත්තශබ්දයෙන් විචිත්‍රාර්ථය ද, සඞ්කප්ප සදින් සංවිදහනය ද පැවසෙයි. 'විචිත්තා නානප්පකාරො සඞ්කප්පො යස්ස සො-චිත්තසඞ්කප්පො' මරණසංඥා, මරණචෙතනා, මරණ අදහස් නැමැති සංවිදහනය ඇත්තේය යන අරුති. සංකප්ප සද්දේ මේ තෙ අරුතම වේ.

**41. අනෙකපරියායෙන.**

ජීවිතයෙහි ආදීනව දැක්වීම් විසින් අවචාකාරයෙන් ද, මරණ ගුණ වැනීම් විසින් උච්චාකාරයෙන් ද යන තන් අයුරින් කැරෙන වර්ණනයයි. නැවත 'මරණවණ්ණං වා සංවණ්ණෙය්‍ය, මරණාය වා සමාදපෙය්‍ය' යන වැනි නිගමනය (-නැවත විශෙෂ කොට ප්‍රකාශනය) සඳහායි.

---

## සප්තදශාකාරය.

6. **ආපත්ති**-බොරුවළවල් තැනීම් ආදි පූර්වප්‍රයොගයෙහි දුකුළායි. මිනිසාට දුක් ඉපදවීමෙහි ද, යක්ෂ-ප්‍රෙත-පිශාචයන්ගේ මරණයෙහි ද ථුල්ලැසියි. තිරිසනකු මැරුව පචිතියි.

7. **අනාපත්ති**-නො සිතා මරන්නහුට ද, නො දන්නහුට ද, මරණ අදහස් නැත්තහුට ද, උම්මත්තකාදීනට ද ඇවැත් නැත. නො සිතා මරන්නා නම්, ' 'මේ උපක්‍රමයෙන් මොහු මරමි' යි නො සිතා ක්‍රියාවක් කළ තැනැත්තේයි. මොහොල් දෙකක් ගන්නා විට එකක් දරුවකු මත හිණ. හේ මෙළේය. උපක්‍රමය නො සැලකූ නිසා මහණහට පරිජි නො වී. නො දන්නා නම්, මෙයින් මැරේයයි උපක්‍රමය නො දත් තැනැත්තේයි. විෂ යෙදූ පිණ්ඩපාතය දීමෙන් භික්ෂුහු මළහ. දුන් මහණ එහි විෂ තිබුණ බව නො දනී එහෙයින් වරද නො වී.

9 **අඞ්ග**-මිනිස් ප්‍රාණය, ප්‍රාණසංඥාව, වධකචිත්තය, උපක්‍රමය, මරණය.



10. **සමුට්ඨාන**-අදින්නාදාන සමුට්ඨානයයි. කායචිත්ත, වාචාචිත්ත, කායවාචාචිත්තයි. අදත්තාදානයේ දී කිලෙස සාහත්ථිකාණත්තික නයින් කායවාචාචිත්තයෙන් ඇවැත් වේයයි දතයුතු.

12. **සඤ්ඤා**-මරණසිත නැතහොත් ඇවැත් නොවන බැවින් සඤ්ඤාවිමොක්ඛයි.

17. **වෙදනාත්තික**-දුක්ඛවෙදනායි. රජකු සිනා සෙමින් සොරකුට මරණදඬුවම නියම කළ ද, සන්නිට්ඨාපක චෙතනාව දුක් සහිතමය. එහිලා සිනාව අනර්ථව්‍යපසමාදි අන්කරුණක් විෂය කොටගෙන වේ. මරණවිධාන චෙතනාව දොම්නස් සහගතමැයි. පෙරපසු උපදනා සුඛවෙදනාවලින් ආකීර්ණබැවින් උපන් දොම්නස පරම්පරාවශයෙන් නො පවතී. එහෙයින් එය පුහුදුනට ප්‍රකට නැති.

—— ॰॰ ——

## චතුත්ථ පාරාජිකා.

**42. අනභිජානං.**

'න අභිජානං-අනභිජානං' සියසතන්හි නූපන් හෙයින් ද, නුවණින් පසක් නො කළ හෙයින් ද ඇතිබව නො දන්නේ.

**43. උත්තරිමනුස්සධම්මං.**

**"උත්තරිමනුස්සානං ඣායීනඤ්චෙව අරියානඤ්ච ධම්මො උත්තරිමනුස්සධම්මො"** සෙසු මිනිසුන් කෙරෙන් අතිශයින් උතුම් වූ ධ්‍යානලද්දවුන් ගේ ද ආර්‍ය්‍යයන්ගේ ද ධර්මයයි. නොහොත් **'උත්තරිමනුස්සධම්මා'ති-උත්තරිමනුස්සධම්මො'** භාවනා මනසිකාර රහිත ව ප්‍රකෘතියෙන් ම මිනිසුන් විසින් උපදවාගතයුතු හෙයින් හෝ මනුෂ්‍යාත්මභාවය ගෙනදෙන හෙයින් හෝ දශකුශල කර්මපථධර්මය මනුෂ්‍යධර්ම නම් වේ. එයින් අධික ව උත්තරිතර ව සිටි ධ්‍යානාදිය උත්තරිමනුස්සධම්ම නම්. මෙයින් රූපාවචර අරූපාවචර ලොකොත්තර ධර්මයෝ ගැනෙති.

**44. අලමරියඤාණදස්සනං.**

"ජානනට්ඨෙන ඤාණං. (මහග්ගත ලොකුත්තර පඤ්ඤා), දස්සනට්ඨෙන දස්සනං, ඤාණං ච තං දස්සනං චා'ති-ඤාණදස්සනං; අරියං විසුද්ධං උත්තමං ඤාණදස්සනං අරියඤාණදස්සනං; අලං පරියත්තං කිලෙස විද්ධංසන සමත්ථං අරියඤාණදස්සනං එත්ථා'ති වා අස්සා'ති වා අලමරියඤාණදස්සනො. (-උත්තරිමනුස්ස ධම්මො) තං." ක්ලෙශවිධ්වංසනයෙහි සමර්ථ පවිත්‍ර වූ මහග්ගතලොකුත්තර ප්‍රඥා සඞ්ඛ්‍යාත උත්තරිමනුස්සධර්මයයි.

**45. අත්තූපනායිකං**-(කාව්‍ය යනු අධ්‍යාහාරයි.)

'අත්තනි තං උපනෙති, අත්තානං වා තත්ථ උපනෙතී'ති අත්තූපනායිකො." මේ ධර්මය මා කෙරෙහි ඇතැයි හෝ මම ඒ ධර්මයෙහි පැනෙමි යි හෝ කොට යන අරුති.

**4ï. සමුදාචරෙය්‍ය.**

කී දෑය වටහාගත හැකි මිනිසකුට කයින් වචනයෙන් පැවසීම යි. අතීතාතම ගැන නො ව වත්මින් ආතමය ගැන වියයුතු. ප්‍රකාශය අනාගතකාලික ද නො ද වියයුතු.

**47. ඉති ජානාමි ඉති පස්සාමි ඉති.**

ප්‍රකාශය කැරෙන අයුරු දැක්වෙන වැකියෙකි. **'ඉති'** යන්නෙන් මේ මේ කරුණු නිසා දනිමි යි දන්නා අයුරු පෙන්නයි.

**48. තතො අපරෙන සමයෙන.**

ඇවැත දන්නා පිළිගන්නා කාලයයි. පළමුවෙන් ප්‍රකාශිතක්ෂණයෙහි ම ඇවැත සිදුවිය. **'සමනුග්ගාහියමානො'** යනුවෙන් කුමක් කෙසේ කවර ද කොතැන්හි ලබන ලද්දැයි චෝදනා කරනු ලබන කල්හි විචාරනු ලබන කල්හි යන අදහස කියැවේ.

**49. විසුද්ධාපෙක්ඛො.**

පරිජි අවන් අයට ගිහිවීමාදිය විසුද්ධියයි. එයින් රහත්මග හැර සෙසුමගපල ලැබිය හැකියි.

**50. අජානමෙවං.**

'අජානමෙ'ව'යි ද පාඨයි. 'එව' අවධාරණාර්ථයි. 'අජානං (-පඨමායි) එවං ජානාමි ඉති අවචං, අපස්සං එවං පස්සාමි ඉති අවචං'යි සබඳ වේ. එවං ශබ්දයෙන් ප්‍රථමධ්‍යානාදීන් ගේ දැනීම කියැවේ. 'පළමු දැන් සමවදිමි' යනාදීන් කියූ අර්ථය (-ධ්‍යානාදිය) රහිත බැවින් හිස්වූ, විසංවාදනය අපෙක්ෂාකරන්නහුගේ කායවාක් ප්‍රයොග සඞ්ඛ්‍යාත මෘෂාවයි. වංචන අදහස කියන්නට පෙරත්, කියන කෙණෙහිත් ඇත මෘෂාව සිද්ධ වේ.

**51. අඤ්ඤත්‍ර අධිමානා**-(කමෙම පසුවමී.)

**"අධිගතො'ති වා අධිකො වා මානො අධිමානො"** පරිශුද්ධ ශීලසම්පත්හි පිහිටා තිලකුණට නඟා සකරදම් සමසන්නහුට මේ ධර්ම මා විසින් අධිගතයයි හෝ අනධිගතයෙහි අධිගතයයි දැඩි ව උපදනාවූ හෝ මානය (-හැඟීම) අධිමානයයි. සොතාපත්තාදීනට 'මම සකෘදාගාමි වෙමි' යනාදි හැඟීම් නූපදී. අසුවල් මඟින් අසුවල්



කෙලෙස් පැහේයයි ප්‍රභූපතිය නො දත් අරිසච්චනට ඇතැම්විට සඳෙහ උපදී, මහානාම ශාක්‍යයනට සෙයින්. **'සබ්බසං හි අන්තනා අධිගතමග්ගෙන පහීනා කිලෙසා පාකටා හොන්ති'** යනු යෙභුයයවෘත්තියෙනැයි යෙත්. ප්‍රහීන කෙලශාදි ප්‍රත්‍යවෙක්ෂණය සියල්ලනට ම සපුරා නො ලැබේ. හුදු සමථලාභියා ද විදර්ශනාලාභියා ද දසවිසිවසක් සතන්හි කෙලශොතපත්තියක් නො දක්නාහු තුන් මඟින් එක් මඟකට ප්‍රාප්තයම්හයි වරදවා සිතති. කෙලශ සමුදාචාරය කිසිසේත් නොදක්නා සමථවිදර්ශනාලාභියා තමන් රහත්වූ බව ම සිතයි.

---

## සප්තදශාකාරය.

6. **ආපත්ති**-'පඨමජ්ඣානං සමාපජ්ජිං' ඈ විසින් කීමේ දී දිවැසින් දිවසොයින් නො ව පියෙවි කතින් එකෙණෙහි අසන තැනැත්තේ අරුත දන්තේ නම් පරිජි වේ. නො දත පසුව දත ථුලැසියි. අඤ්ඤපදෙසයෙන් (-ඔබේ වෙහෙර වසන මහණ ධ්‍යානලද්දෙකි යි තමන් ගැන ම පර්‍යායයෙන්) කීවිට දත ථුලැසියි. නො දත දුකුළායි.
7. **අනාපත්ති**-අධිමානාරොචනය, අනුල්ලපනාධිප්පාය (-අභූතාරොචන අදහස් නැති බව) යන අවස්ථාවන්හි ඇවැත් නො වේ.
9. **අඞ්ග**-උතුරු මිනිස්දම් තමන් කෙරෙහි නැති බව, අසත්ගුණ සම්භාවනාවෙන් මිනිසකුට කීම, පර්‍යායයෙන් නො ව ඉදුරා කීම, ආරොචනය ලබන්නනු මිනිසකු වීම, එකෙණෙහි දැනීම යයි අඞ්ග පසෙකි.

——:o:——

**52. යථාපුරෙ තථාපචජා.**

ගෘහස්ථ අනුපසම්පන්නකාලයෙහි යම්සේ භික්ෂූන් හා එක කර්මාදිය නැත් ද, පරිජි අවන් කලත් එසේම සංවාස නැත්තේය. **'උපසම්පන්නානම්පි පාරාජිකසමාපන්නියා සරණගමනාදි සාමණෙරභාවස්සා'පි අභබ්බතාතො.'** යනු විමතිවිනොදනීවාක්‍ය හෙයින් පාරාජිකාපන්නයාට සරණයවත් නැත. එහෙත් මේ නැත්තේ ප්‍රව්‍රජ්‍යාශරණයයිද ගිහිසරණය ඇතැයි ද කියන්නෝ වෙත්මැයි.

---

## සුවිසිපරිජි.

**භික්ෂුණීන්ගේ අසාධාරණ පරිජි සතරෙකි:-**

**උබ්භජාණුමණ්ඩලිකා**-රාගයෙන් තෙත් ව එබඳු පිරිමියකුහු විසින් කැරෙන දණින් උඩ අකුඇටින් යට ආමසනය ඉවසීම.

**වජ්ජපටිච්ඡාදිකා**-අන් මෙහෙණකගේ පරිජි ඇවැතක් දැන සැඟවීම.

**උක්ඛිත්තානුවත්තිකා**-උක්ඛෙපනීකම් ලත් මහණකුහට අනුවර්තනය වීම.

**අට්ඨවත්ථුකා**-අසද්ධර්මය පිළිබඳ කරුණු අටෙකින් පරිජිවීමකි.

**අභව්‍යපුද්ගලයෝ එකොළොස් දෙනෙකි.** මොවුනතුරෙන් පණ්ඩක, තිරච්ඡානගත, උභතොබ්‍යඤ්ජනක යන තිදෙන අහේතුක පටිසන්ධිකයෝයි. කර්මවිපත්තියෙන් පිළිසඳ කොණෙහි ම පරාජය ප්‍රාප්තයෝය. ස්වර්ගය ලබත්. මගපල නො ලබත්. මහණඋපසපුව නො ලබනා බැවින් සිව්පිරිසිදු සිල්හි පිහිටුම ද නැත. දුහේතුක පටිසන්ධිකයෝ ද මගපල නො ලබත්. පැවිදි උපසපන් බවෙහි පිහිටා මතු ඵල ලැබීමට අර්හ වෙත්. ථෙය්‍යසංවාසක, තිත්ථියපක්කන්තක, මාතුඝාතක, පිතුඝාතක, අරහන්තඝාතක, භික්ඛුනීදූසක, රුධිරුප්පාදක, සඞ්ඝභෙදක යන අට දෙන තමන් ගේ ක්‍රියාවෙන් විපතට පත් බැවින් අභව්‍ය වෙති. ථෙය්‍යසංවාසක, තිත්ථියපක්කන්තක, භික්ඛුනීදූසක යන තිදෙනාට ස්වර්ගය අවාරිතයි, මාර්ගය වාරිතයි. සෙසු පස්දෙනාට ස්වර්ග මාර්ග දෙක ම වාරිතයි.

**විබ්භන්තා භික්ඛුනී**-ගිහිවෙසෙහි අභිලාෂය ඇතිව, හෙළපිළී හැඳි මෙහෙණ, අන් ව්‍යතික්‍රමයක් නැත ද අශ්‍රමණ වෙයි.

**ලම්බී**-(ලම්බමානං අඞ්ගජාතං යස්ස) ලම්බී වූ පමණින් පරිජි නැත. සිය දීර්ඝාඞ්ගජාතය සියමියෙහි හෝ වසමඟෙහි හෝ සෙවනා අදහසින් මෙහෙයුවේ ම පරිජි පත් වේ. මුදුපිට්ඨිකයාට මුවමඟ පිවිසීම කී හෙයින් මෙහි වසමඟම ගැනේ.

**මුදුපිට්ඨිකා**-(මුදුකතා පිට්ඨි යස්ස) තම අඞ්ගජාතය තම මුවින් ගැනීමෙන් පරිජි වේ. යමෙක් සිය මුවින් වච්චමග්ගය හෝ කතුන් ගෙ පස්සාවමග්ගය හෝ ගනී ද, පුරිසනිමිත්තෙනත් පුරිසනිමිත්තා හෝ පහසා ද පරිජි නො වේ. මොහු දෙදෙන කාමාතුරවූ විට පරිජි පත් විය හැකි වෙති.

**මුඛගාහී**-යමෙක් කාමාතුර ව සිය මියෙන් අනෙකකුගේ අඞ්ගජාතය ගනී ද පරිජියි.



**අඞ්ගජාතාභිනිසීදකා**-අනෙකකුගේ කර්මණ්‍ය අඞ්ගජාතය සිය වසමඟට පිවිසෙන සේ එමත හිඳී නම් හෝ, අඞ්ගජාතය සිය වසමඟට පිවිසෙනු ඉවසා නම් හෝ පරිජියි. මොහු දෙදෙන සහවාසින් ගේ සීලවිනාසයට හෙතුවිය හැකි බැවින් විවර්ජිත වෙති.

ලම්බී ආදි සිවු දෙන අනුලෝම පරිජියට හසු වෙති. රාගයෙන් දෙදෙනකු අතර පවත්නා ක්‍රියාව මෛථුන ධර්මයයි. මේ එසේ නො ව හුදක් මාර්ගයෙන් මාර්ගප්‍රතිපාදනමාත්‍රයෙන් පැමිණිය යුතු හෙයින්, මෛථුන පරිජියට අනුලෝම වන නිසා, අනුලෝම පරිජියයි යෙති. දුතිය තතිය පරිජිවලට ඇතුළත් වන බැවින් මාතුඝාතකාදි සිවු දෙන අනුපසම්පන්නයන් ගැනයි.

**පාරාජිකුද්දෙසය නිමි.**

——/○/——

## 1. සුක්කවිසට්ඨි සික්ඛා.

**53. සඤ්චෙතනිකා.**

සංවිජ්ජති මොචනස්සාදචෙතනා අස්ස සුක්කවිසට්ඨියා'ති සඤ්චෙතනා (සං සද විද්‍යමානාර්ථයි.) සංචෙතනාව-සංචෙතනිකා, නොහොත්- "සඤ්චෙතනා අස්ස අත්ථී'ති- සඤ්චෙතනිකා" (සං සද්දේ විශෙෂාර්ථ නැත.) සුක්කවිසට්ඨි යන්නට විශෙෂණයි. මොචනාස්වාදචෙතනාවෙන් සිතා උපක්‍රමයක් මිදීමත් ගැන දැනීම ඇති යන අදහසයි.

**54. සුක්කවිසට්ඨි.**

ස්ථානාවචනයයි. අඞ්ගජාතය කර්මණ්‍ය වූ කල, ආරොග්‍යාදි අභිප්‍රායක් එල්බ ගෙන, අජ්ඣත්තරූපාදි යම් කිසි රූපයෙක්හි, මොචනාස්වාද සිතින් නිමිත්තෙහි උපක්‍රම කිරීමේ දී, ස්ථානයෙන් ශුක්‍ර සෙල්වීමයි.

**කාලය**-වර්චස් පීඩිතතාව, රාගපීඩිතතාව, මූත්‍රපීඩිතතාව, වාත පීඩිතතාව, උච්චාලිඞ්ග නම් ප්‍රාණීන් ඩැහීම (-දලඹු වැනි එනම් ප්‍රාණීන් ගේ රොමසපර්ශය) යන කරුණු පසින් අඞ්ගජාතය කර්මණ්‍ය විය හැකියි.

**අභිප්‍රාය**-රාගපරිදාහාභාවයෙන් නීරොග වීම, මිදීමෙන් සුව ලැබුම, මිදීම බෙහෙතක් කොට ගැනුම, මුදා කීටාදීනට දීම, කීටාදීනට දී පින් ලැබුම, මුදා මහත්‍ර පිරිවහා කීටාදීනට දීම, දී සග ලැබුම, චොළගහණාදියෙන් දරුබීජයකට කරුණු කොට ගැනුම, නීලාදිවිසින් වර්ණ විමසුම, ක්‍රීඩා අදහස යනුවෙන් අභිප්‍රාය දශාකාරයි.

**උපාය**-අජ්ඣත්තරූපය (-තමාගේ හස්තාදිය), බහිද්ධාරූපය (-අන්‍යයන්ගේ හස්තාදි උපාදින්නකය ද අනුපාදින්නකය ද), ආකාසෙ කටිකම්පන (-කිසි දූයෙක නො ගටා අහස්හි කටිකම්පනයෙන් අඞ්ගජාතය සෙලවීම) යයි උපාය සතරාකාරයි.

**වත්ථුව**-නීල, පීත, ලොහිත, අවදාත, තක්‍ර, උදක, තෛල, ක්ෂීර, දධි, සර්පිස් යන වර්ණ විසින් වස්තුව හෙවත් ශුක්‍රය දශාකාරයි. පිත්ත-සෙම්හ-පුබ්බ-ලොහිත යන මොවුන් පිළිබඳ ආසයන්ගේ ද රසාදීන්ගේ ද නානාත්වයෙන් වර්ණ නානාත්වය වේ. කාල 5, අභිප්‍රාය 10, උපාය 4, වස්තු 10 යන මොවුන් එකිනෙක ගුණවීමෙන් මෙහි දී ප්‍රධාන සඟවෙසෙස් හෙද 2000 ක් ලැබේ.

**ශුක්‍ර පිහිටි තැන**-වස්ති ශීර්ෂය (-මූත්‍රකරණයේ මූල), කටිය, සකලසිරුරයයි මත තුනෙකි. තෙවැන්න බහු සම්මතයි. කාය ප්‍රසාද භාවරූප ජීවිතෙන්ද්‍රිය යන මොවුනට සේ කෙස් ලොම් මල මූත්‍ර කෙළ මූකුණු ආදිය හැර සෙසු සියල් සිරුර ශුක්‍රයට ස්ථාන වේ. ඇතුන්ගේ දෙකපොලින් මද වැහෙන්නේ එහෙයිනි. සියල් සිරුර කලඹා තැනින් මිදුණ කෙණෙහි ඇවැත් වේ. තැනින් සැලුණවිට දකසොතයට හෙවත්-මූත්‍රමාර්ගයට වැටීම නවතාලිය නො හේ. ශුක්‍රය චතුජයි. බාලදරුවනට ද ඇතැයි යෙත්. කාමරාගය නිසා ම එහි චලනය සිදු වේ. දකසෝතයේ සිට උතුජරූප පමණෙක් ශේෂ වේ. සදෙව්ලෝ දෙවියනට ශුක්‍ර ඇත ද ඨානාචාවනය සිදු නො වේ. රූපීබ්‍රහ්මයනට කැල ම ශුක්‍ර නැත.

### ආපත්තිවිනිශ්චයයේ දි ඒකාදශරාගය දතයුතු.

i. **මොචනස්සාදය**-මොචනයට පූර්වභාගයෙහි පැවැති කැමැත්තයි. ශයනසමයෙහි රාගපීඩිත ව ඌරු හස්තාදියෙන් අඞ්ගජාතය දූඩිව පෙළා මොචනයට උත්සාහ ඇති කොට නිදිගත්තහුට මිදීයාමෙන් ඇවැත් වේ. ඇවැත සිදුවීමට මොචනස්සාදය තිබිය යුතුය. අන් ආස්වාදයෙකින් නිමිත්තෙහි උපක්‍රම කළවිට මිදුණත් ඇවැත් නැත.

ii. **මුච්චනස්සාදය**-(අත්තනො ධම්මතාය මුච්චමානෙ අස්සාදෙ) පියෙවියෙන් මිදෙනවිට ආස්වාදය උපනත් උපක්‍රම නො කළ හොත් ඇවැත් නැති.

iii. **මුත්තස්සාදය**-(මුත්තෙ අස්සාදෙ) පියෙවියෙන් මිදුණුවිට නැවත ආස්වාදය උපදවා ද, එහෙත් උපක්‍රම නො කෙළේ නම් මිදුණ ද නිරවැති.



iv. **මෙථුනස්සාදය**-මෛථුනරාගයෙන් ස්ත්‍රියක පහසනවිට මිදුණ හොත් මේ සඟවෙසෙස නො වේ.

v. **කණ්ඩූති**-කසන විට මිදුණ ද ඇවැත් නො වේ.

vi. **ඵස්සස්සාදය**-කායසංසග්ග රාගයෙන් ස්ත්‍රියක පහසන විට මිදුණ හොත් සුක්කවිස්සට්ඨි සඟවෙසෙස් නො වේ.

vii. **දස්සනස්සාදය**-ස්ත්‍රියක ගේ යොනිප්‍රදෙශය බලබලා සිටිය දී මිදීගිය ද ඇවැත නො වේ.

viii. **නිසජ්ජස්සාදය**-ස්ත්‍රියක හා රහස්හි හිඳිමේ දී මිදීයාමයි

ix. **වාචස්සාදය**-ස්ත්‍රියක හා මෙවුන්දම් පිළිබඳ තෙපුල් බණමින් සිටිය දී මිදීයාමයි

x. **ගෙහසිතපෙම**-මේ ගෙහ සදින් මව් සෝයුරි ආදි නෑයෝ ගැනෙති. අන්තන්හි පඤ්චකාමගුණික රාගයයි. මාතෘස්නෙහාදි යෙන් ඔවුන් වැළඳගන්නා විට මිදීගිය ද සඟවෙසෙස් නො වේ. පැහැසීමෙන් දුකුළායි.

xi. **වනභඞ්ගස්සාදය**-ස්ත්‍රියක විසින් එවුණු මල් ආදිය පුන පුනා කෙළවන්නහුට මිදියා. යි. මේ අවස්ථාවන්හි සඟවෙසෙස්නැත.

**55. අඤ්ඤත්‍ර සුපිනන්තා.**

(සුපිනෙන එව සුපිනන්තෙනා.) සුපින සදින් සිහිනෙන් මිදීම කියැවේ. සතරකරුණෙකින් සිහින දක්නා ලැබේ.

i. **ධාතුක්ෂොභය**-විසභාග බෙහෙත්-ආහාර-වාසාදිය නිසා කිපුණු වා-පිත් ආදි ධාතුනට අනුව ඇතැම් සිහින පැනේ.

ii. **අනුභූතපූර්ව**-පූර්වයෙහි සිදුවූවක් හෝ සිතින් සලකන ලද්දක් හෝ ඇතැම්විට පැනේ.

iii. **දෙවතොපසංහාර**-'මෙතෙම මෙසේ සලකාව' යි දෙවියන් සිතුකල, නිදන්නහුගේ භවාඞ්ග සන්තතිය සැලී ඔවුන් සිතු පරිදි සලකමින් පවති. ඔහු පිරිකැපු අරමුණ දෙවියන් එළවන ලද්දක් වන්නේය. ඒ දෙවානුභාවයයි. පෙරකී හෙද මිශ්‍රව ද සිහින පැනේ. රහත්හු සිහින නො දකිත්.

iv. **පුබ්බනිමිත්ත**-මතු උපදනා අර්ථානර්ථ දක්වන සිහිනයි.

නිද්‍රාවේ දී නිරතුරුව ද, පිබිද සිටුනා විට චිත්තවීථින් අතර ද භවාඞ්ගච්ඡෙදය ලැබේ. කයේ ගිලන් බව නින්දට කාරණයි. ඒ ගිලන් බව සිතේ ථිනමිද්ධ පහළවීමෙන් ද කය වෙහෙසට පත්වීමෙන් ද සිදුවිය හැකියි. රහතනට ථිනමිද්ධ නැත. සිහින දක්නෝ

මනොද්වාරික චිත්තවීථියෙහි. එ ද කපිමිද්ධාවස්ථාවෙහිය. භවාඞ්ග-ගත වීමත් ඉන් නැගී සිටීමත් නිරතුරුව වනකල කපිමිද්ධය වේ. සිහිනෙන් කියන කරන දෙය ද කුශලාකුශල සඞ්ඛ්‍යාවට යේ. එහෙත් වස්තුදුර්වලත්වය නිසා ප්‍රතිසන්ධිවිපාක නො ව ප්‍රවෘත්තිවිපාක මාත්‍රයක් ගෙන දේ. වස්තුව නම අරමුණය යනු ටීකා කිහිපයෙක මතයයි හෘදයවස්තුව යනු **වජිරබුද්ධි මතයයි**. සිහිනයේ දීත් ආසෙවාද චෙතනාව ලැබෙතත් පිනමිද්ධාභිභූත බැවින් එය අව්‍යවහාර්‍යයි.

**56. සඞ්ඝාදිසෙසො.**

(සඞ්ඝො ආදිම්හි චෙ'ව සෙසෙ ච ඉච්ඡිතබ්බො අස්ස ආපත්ති-නිකායස්සා'ති.) ආපත්ති යන්නෙන් ආපත්තිවුට්ඨානය හෙවත්-ඇවැතින් නැගී සිටීම කියැවේ. එහිලා මූල දී පරිවාසදානය ද, මධ්‍යයෙහි මානත්තදානය ද, අවසන අබ්භානය ද සිදුකිරීමෙහි ලා භික්ෂුව විසින් සඞ්ඝයා ම ලැබියයුතු. එබැවින් මේ ඇවැත් සමූහයට **'සඞ්ඝාදිසෙස'** යන නම ලැබිණ. සමූහවාචක නාමයෙන් ඇතැම් තැන අවයවය ද ප්‍රකාශ කැරේ.

"යො පන භික්ඛු සඤ්චෙතනිකං සුක්කවිසට්ඨිං ආපජ්ජෙය්‍ය" යනුවෙන් කාරකයා නො දැක්වීම කණ්ඩුවනාදි අදහසින් උපක්‍රම කරනවිට මිදුණත් ඇවැත් නො වනබව දක්වනු පිණිසයයි යෙත්.

5. **ආණත්ති**-අනුන් ලවා තමන්ගේ ශුක්‍ර මිදවීමෙන් ඇවැත් වේ. එහෙත් මෙය අනාණත්තිකායි. සිතා උපක්‍රම කළවිට නො මිදුණොත් ථුලැසියි. උපක්‍රම නො කරන්නහුට ද, මොචන අදහස් නැත්තහුට ද, උමතු ආදීනට ද ඇවැත් නො වේ. චෙතනාව, උපක්‍රමය, මිදීමයයි අඞ්ගත්‍රයෙකි.

——:(०):——

## 2. කායසංසග්ගසික්ඛා.

**57. ඔතිණ්ණො.**

කම්සාධන විසින් රාගය විසින් බැසගන්නාලද්දේ යන අරුත ද කර්තෘසාධන විසින් තෙමේ රාගයට බටුයේ යන අරුත ද පැවැසේ. කායසංසග්ගරාගයෙන් යුක්ත පුද්ගලයායි. මෙයින් සෙවනාධිප්පාය හෙවත්-පහස් සුව විඳිනු රිසිය කියැවිණ.

**58. විපරිණතෙන චිත්තෙන.**

සුද්ධභවඞ්ගසන්තතිය හැරපියා කා-පහස් විඳුනා රාග වශයෙන් පෙරළි සිත විපරිණත සිතයි. පාත්‍රප්‍රතිග්‍රහණාදියේ දී සුද්ධසිතින් පැහැසූන ද නිරවැත් බව මෙයින් හැඟේ. 'විපරිණතෙන චිත්තෙන ඔතිණ්ණො'යි ද උපයොගාර්ථයෙහි කරණ වශයෙන් සලකා 'විපරි-ණතං චිත්තං ඔතිණ්ණො' යි ද ගෙන අරුත් දක්වත්.



**59. මාතුගාමෙන සද්ධිං.**

එකෙණෙහි උපන් බිළිඳු ද මෙහි මාගමියි. මැය හා මෛථුන යෙන් පරිජ් ද, රහොනිසජ්ජාවෙන් පචිති ද සිදු වේ. තමන් ඇය වෙත හෝ ඇය තමන් වෙත හෝ එළඹිය ද වෙනස් නැත. මළ ඉතිරිය පැහැසීමෙන් ථුලැසි කී හෙයින් ජීවිතෙන්ද්‍රිය සහිත ස්ත්‍රිය ම ගතයුතු.

**60. කායසංසග්ගං.**

සිය කයින් ස්ත්‍රියගේ කය පැහැසීම කායසංසග්ගයයි. ස්ත්‍රිය ගේ රාගසහිත රහිත බව ගණන් නො ගැනේ. සසගවන අසුරු **හත්ථග්ගාහං** යනාදීන් පැවැසේ. වැලමිට පටන් හියග තෙක් මෙහි දී අතයි. සෙසුතන්හි මිණිබඟතේ සිට නියග දක්වායි. ස්ත්‍රිය හැඳි පැළඳි වස්ත්‍රාභරණ නො ව උපාදිණ්ණශරීරය ම ස්පර්ශ විය යුතුය.

**61. වෙණිග්ගාහං වා.**

වෙණිග්‍රහණයෙන් ලොම් නිය දත් ආදි කම්මපච්චය උතු සමුට්ඨාන වස්තු ද ඇවැතට ප්‍රමාණවත් බව පැවැසේ. ගෙතූ සැරසූ කෙශකලාපය වෙණියයි. උපලකුණු විසින් නො ගෙතූ නො ගැවසූ කෙස් ද ලොම් ද සඞ්ගෘහිත වේ. සම්පූර්ණ වෙණිය නො ව එක් කෙසක් ලොමක් පැහැසුණ ද ඇවැත් වේ. මේ ආපත්තියේ දී කාය විඤ්ඤාණයා ගේ ඉපදීම ඒකාන්ත නො වේ. මාගමගේ හා තමා ගේ හා කායානුගත කෙශාදීන් ගේ ස්පර්ශය දැක, එය ඉවසීම ද ඵස්ස-පටිවිජානනයයි. රෙදි පොරවා නිදන ස්ත්‍රියක ගේ ශරීරය, වස්ත්‍ර මතු පිටින් වහා ස්පර්ශ කරනවිට තමන් නො දැන රොමස්පර්ශය සිදු වුවත්, පහස් විඳුනා අදහසින් කයින් ව්‍යායාම කොට ස්පර්ශය ලත් හෙයින් ඵස්සපටිවිජානනය ලැබෙයයි යෙත්.

**62. අඞ්ගස්ස පරාමසනං.**

හැඳි පෙරෙව් මාගම හිසපටන් අතගෑමේ දී වස්ත්‍රාමසනකය ස්පර්ශවීමෙන් ථුලැසි ද, ශරීරය ස්පර්ශවීමෙන් සඞ්ඝවෙසෙස් ද වේ. අතත් වෙණියත් තබා සෙස්ස මෙහි අඞ්ගයි.

---

## සප්තදශාකාරය.

6. **ආපත්ති**-ස්ත්‍රියකෙරෙහි ස්ත්‍රීසංඥ ඇතිවිට සඞ්ඝවෙසෙස් වේ. විමති ඇතිවිට ද, 'පණ්ඩකයෙකි, පුරුෂයෙකි, තිරිසනෙකි'යි සංඥ ඇතිවිට ද ථුලැසියි. පුරුෂයන් කෙරෙහි තිරිසනුන් කෙරෙහි ස්ත්‍රීසංඥ ඇත්තහුට ද, පුරුෂයා කෙරෙහි පුරුෂ

සංඥ ඇත්තහුට ද, වෙමතිකයාට ද දුකුළාසි. තිරිසන් ස්ත්‍රීන් කෙරෙහි ද දුකුළාසි. යක්ඛී දෙවිඣී පෙතිඣී මනිඣීන් පිළිබඳ ව ථුලැසියි.

තම කයින් ස්ත්‍රීශරීරය පිළිබැඳි වස්ත්‍රාභරණාදියක් පැහැසීමෙන් ද, තම කය පිළිබඳ වූවෙකින් ස්ත්‍රිය ගේ කය පැහැසීමෙන් ද ථුලැසියි. ස්ත්‍රියක් තම කයින් භික්ෂුවගේ කායපිළිබැඳි වූවක් පහසනවිට **'ඵස්සං පටිවිජානාති'** යන අඞගය ලැබේ යයි පවසන්නේ කායපටිබද්ධය කය හා සම්බද්ධ සවභාව ඇති හෙයිනි. තම කායපටිබද්ධයෙන් ස්ත්‍රියගේ කායපටිබද්ධය ද, තම නිස්සග්ගියෙන් (-දමාගසන ගල්මුල් ආදියෙන්) ස්ත්‍රියගේ කය ද කායපටිබද්ධය ද නිස්සග්ගිය ද පහස්සුව විදුනා රිසියෙන් පැහැසීමෙන් දුකුළාසි.

ස්ත්‍රීශරීරය පමණක් නො ව ඔවුන් පරිභොග කරන වස්ත්‍රාභරණාදි සියල්ලත්, ලී-මැටි ආදියෙන් තැනූ තිරිසන් ගත මනුෂ්‍යගත ස්ත්‍රීරූපත්, දශවිධරත්නත්, ධාන්‍යවර්ගත්, තල් පොල් ඈ ඵලත්, සියලු ආයුධවර්ගත්, තූර්යභාණ්ඩත්, අනාමාසයි. ගෙහසිත ප්‍රේමයෙන් මව-දුව-සෝවුරි ආදීන් කයින් හෝ කායපටිබද්ධයෙන් හෝ ඡුපසනයේ දී දුකුළාසි.

7. අනාපත්ති-**'ඉත්ථියා ඵුසියමානස්ස සෙවනාධිප්පායස්සා'පි කායෙන අවායමන්තා ඵස්සං පටිවිජානන්තස්ස'** පහස් විඳුනා අදහස ඇත ද, නිසල ව සිටිය හොත් ඇවැත් නැති. මෙහි ලා කාමරාගය ඇත ද කායවලනයක් සිදු නො වන බැවින් ස්ත්‍රිය විසින් කැරෙන කායවලනය ඉවසුවත් තමාගේ ප්‍රයෝග යක් නැති නිසා චිත්තොත්පාදමාත්‍රයෙන් ඇවැත් නො වේ. ප්‍රථම පාරාජිකයේ දී අනුන් උපක්‍රම කරනවිට සෙවනා අදහස පහළවීමෙන් අඞගජාතය කර්මණ්‍ය වේ. එය තමා විසින් කැරුණක් සේ සලකන බැවින් පාරාජි කියැවිණැයි ද, පළමු සඟ වෙසෙස්හිද පරප්‍රයොග සාදියනයෙන් අඞගජාතක්ෂෝභය වන නිසා ඇවැත් වේයයි ද **විමතිවිනොදනියෙහි** එයි.

**මොක්ඛාධිප්පායෙන ඵුට්ඨං ඵුසන්තස්ස**-මාගමක් තමන් අල්ලාගත හොත් එයින් මිදෙනු සඳහා කැරෙන ප්‍රයත්නයේ දී සිරුර පැහැසුව ද ඇවැත් නැත. අතරතර ස්පර්ශරාගය උපනත් මිදීමේ අදහස නො පි නම් ඇවැත් නැතැයි ද යෙත්.

**අසඤ්චිච්ච**-පාත්‍රප්‍රතිග්‍රහණාදි උපායෙකින් මාගම පහස් මිසි සිත් නැති ව පිළිගන්නාවිට අත් හැපුණ ද ඇවැත් නැත. **අසතියා**-අන්‍යවිහිත ව, මාගමක පහන්නා බව නො දැන අන්‍යා



දිගු කිරීම ආදියෙන් ස්පර්ශ වුව ද වරද නැත. **අජානන්තස්ස** ස්ත්‍රියක බව නො දැන පිරිමි වෙසින් සිටි ගැහැනියක පැහැසුව ද වරද නැත. **අසාදියන්තස්ස**-ස්ත්‍රීන් විසින් ඔසවාගෙන යනු ලැබීමේ දී මෙන් නො ඉවසන්නාහට ද ඇවැත් නො වේ.

9. **අඞග**-මිනිස් මාගම, මාගම යන සංඥා, පහරන රාගය, ව්‍යායාමය, හත්ථග්ගාහාදි සමාපජ්ජනයයි පසෙකි.

---

## 3. දුට්ඨුල්ලවාචාසන සික්ඛා.

**63. ඔතිණ්ණො.**

ඔතිණ්ණතාවත් විපරිණතචිත්තතාවත් දුට්ඨුල්ලවාචස්සාද රාගය හෙවත්-අසභ්‍යතෙපුල් බිණීමේ ආස්වාදචෙතනා සම්ප්‍රයුක්ත රාගය වශයෙනි.

**64. මාතුගාමං.**

'මේ මෛථුනය පිළිබඳ කථාවෙකි'යි සභ්‍යාසභ්‍යවචන දන්නා නුවණැති මාගම ගැනේ. මහලුවූ ද මූසාව නො ගැනේ.

**65. දුට්ඨුල්ලාහි වාචාහි.**

"දුට්ඨුං කුච්ඡිතභාවං උපෙති ගච්ඡතී'ති. දුට්ඨුල්ලා (වාචා)" වසමඟ පසමඟ පිළිබඳවූත් මෛථුනධර්මය පිළිබඳවූත් කථායි

**66. ඔභාසෙය්‍ය.**

වණ්ණාවණ්ණ යාචන ආයාචන පුච්ඡන පතිපුච්ඡන ආචික්ඛන අනුසාසන අක්කොසන වශයෙන් නානාප්‍රකාර අසද්ධර්මවචන ප්‍රකාශ කිරීමයි. **වණ්ණභණනය** නම් වසමඟ පසමඟ පිළිබඳ ගුණ කීමයි. 'ස්ත්‍රීලක්ෂණයෙන් යුක්ත වෙහි' යනාදීන් කීමෙන් දුකුළාසි. වසමඟ පසමඟ සබඳ කොට ගෙන 'තව වච්චමග්ගො සුභො සුසණ්ඨානො' යනාදීන් කිකල ම සඟවෙසෙස් වේ.

**අවණ්ණභණනය**-ආක්‍රොශය මතු දැක්වෙන ඒකාදශපදයෙන් සිද්ධවිය හැකියි.

| | |
|---|---|
| අනිමිත්තා | - කෙසිසිදක් සා කුඩාමාගී ඇත්ති |
| නිමිත්තමත්තා | - අපරිපූර්ණ නිමිනි ඇත්ති |
| අලොහිතා | - වියළුණු මාගී ඇත්ති |
| ධුවලොහිතා | - නිතර තෙත් දකසොතය ඇත්ති |
| ධුවචොළා | - බැඳු රෙදිගුළියක් ඇත්ති |
| පග්ඝරන්තී | - නිති මූත්‍ර වගුරුවන්නී |

සිබරිණී - පිටත නික්මුණු මස් දළුවක් ඇත්තී
ඉත්ථිපණ්ඩකා - පණ්ඩක ස්ත්‍රියකි (අනිමිත්තාවමැයි)
වෙපුරිසිකා - මසු දැලි යුත් පුරුෂයකු වැන්නී
සම්භින්නා - එක්වුණු වස-පස මං ඇත්තී
උභතොබ්‍යඤ්ජනකා - ස්ත්‍රී-පුරුෂ දෙනිමිති ඇත්තී

මොවුනතුරෙනුදු **සිඛරිණී සම්භින්නා උභතොබ්‍යඤ්ජනා** යන තෙපදයෙන් ඝටිතවූ කල්හි සඝවෙසෙස් වේ. මේ තෙපදයත් පූර්‍වොක්ත වච්චමග්ග පස්සාවමග්ග මෙථුනධම්ම යන තෙපදයත් හුදෙකලාව ම ආපත්තිකරයි. සෙසු අනිමිත්තාදි පද **'අනිමිත්තෙ, මෙථුනං ධම්මං දෙහි'** යනාදි විසින් (වච්ච-පස්සාව) මෙථුනධම්ම පදයන් හා යොදා කීකල ම සඝවෙසෙස් වේ. එසේ නො යොදා අට පදයෙන් කීමෙන් (අවර්‍ණභණනය වුව ද) ස්ත්‍රිය එකෙණෙහි දතොත් ථුල්ලැසිසි. පසුව දත දුකුළායි. දෙමඟ දෙස් කීම අවර්‍ණභණනයයි.

මෙහිලා වස-පස මං සඞ්ඝාදිශෙෂ ක්ෂෙත්‍රයි. අකුයෙන් (-උර ඇටය) යට, දණින් උඩ පූර්‍වොක්තරාගයෙන් වර්‍ණභණනාදියෙන්, ස්ත්‍රිය එකෙණෙහි දත ථුල්ලැසිසි. නො දත, පසුව දත දුකුළායි. අකු ඇටින් උඩ හෝ දණින් යට හෝ ඇගේ කායසම්බද්ධ වස්ත්‍රාභරණාදියෙක හෝ වර්‍ණභණනයේ දී දත ද නො දත ද දුකුළායි. එක් තෙපුලක් බොහෝ ස්ත්‍රිනට කීමෙන් මාගම් ගණිනින් ද, බොහෝ තෙපුල් එක්ස්ත්‍රියකට කීමෙන් තෙපුල් ගණිනින් ද සඟ වෙසෙසි. **'දූතෙන වා පණ්ණෙන වා ආරොචිතෙ අනාපත්ති'** යනු කුදුසික ටීකායි.

'යථා තං යුවා යුවතිං' යන්නෙහි තං යනු නිපාතයි. ''යථා යුවා යුවතිං මෙථුනූපසංහිතාහි ඔභාසෙය්‍ය තථා''යි සබඳ වේ.

## සප්තදශාකාරය.

7. **අනාපත්ති-අත්ථපුරෙක්ඛාර**-අර්ථකථනය පෙරටු කොට මාගමුනට අනිමිත්තාදි පදයන් කියන්නහුට ද නොහොත්-අටුවාව සජ්ඣායනා කරන්නහුට ද; **ධම්මපුරෙක්ඛාර**-පෙළකියවන්නහුට ද නොහොත්-සජ්ඣායනා කරන්නහුට ද; **අනුසාසනිපුරෙක්ඛාර**-'දැනුත් අනිමිත්තාවක් වෙහි, මතු මෙබඳු නො වන්නට පින් කරව'' යනාදින් අනුසසන්නහුට ද ඇවැත් නො වේ.

9 .අඞ්ග-මනුස්සිත්ථි, ඉත්ථි සඤ්ඤිතා, දුට්ඨුල්ලවාචස්සාදරාගො, භණනං, තංඛණං විජානනං, යි පසෙකි.



10. **සමුට්ඨාන**-අදින්නාදාන සමුට්ඨානයයි හස්තමුද්‍රාවෙන් ප්‍රකාශ කිරීමේ දී කායචිත්තය ලැබේ.

17. **වෙදනාත්තිකා**-සුඛ උපෙක්ඛා විසින් ද්විවෙදනයි. 'සිඛරිණී'සි යනාදීන් ආක්‍රොශ කරන්නහුට ප්‍රතිඝය ඉපද දුක්ඛවෙදනාව නො උපදනේ ද යත්? රාගවශයෙන් පැවැති ආක්‍රොශය අදහස් කැරෙන බැවින් එය මෙහි නො යෙදේ.

## 4. අත්තකාම පාරිචරිය සික්ඛා.

67. **මාතුගාමස්ස සන්තිකෙ.**

මාගම නම් පළමු කී සේ සුබැසි දුබැසි දන්නා ස්ත්‍රියයි. සන්තිකය නම් ශ්‍රවණොපචාරයයි, හෙවත්-පියෙවි කථාව ඇසෙන මානයයි. ඔතිණ්ණතාවත් විපරිණතචිත්තතාවත් අත්තකාමපාරිචරිය රාගය (-තමාට මෙවුන් දමින් වෙහෙකරවා ගැන්මේ රාගය) වශයෙනි.

68. **අත්තකාම පාරිචරියාය.**

කාමසඳින් මෛථුනය ද, පාරිචරියාසඳින් උවටැන් ලැබුම ද කියැවේ. තමහට මෛථුනසඞ්ඛ්‍යාත කාමයෙන් උපස්ථාන කිරීම, මෙහෙකිරීම, පුදකිරීම අත්තකාමපාරිචරියාවයි. මෙය කීම්මාත්‍රයක් පමණි. මෛථුනය බලාපොරොත්තුවෙන් කියැවෙන්නක් නො වේ.

69. **වණ්ණං භාසෙය්‍ය.**

ගුණ කියන අයුරු **'එතදග්ගං'** යනාදීන් පැවැසේ. **'පාරිචරියානං'** යනු නිර්ධාරණයෙහි ෂට්ඨියි. ප්‍රාණඝාතාදියෙන් වෙන්බැවින් සිල්වත් ද, මෛථුනයෙන් විරක්තබැවින් බ්‍රහ්මචාරී ද, එදෙකින් යුතු බැවින් කල්‍යාණදහම් ඇත්තේ ද වේ. දුට්ඨුල්ලවාචා ශික්ෂාවේ ද මෛථුනයාචනය ආගතයි. වෙනස රාග දෙකක්වීමයි. **''යො තෙ විහාරෙ වසති තස්ස අග්ගදානං මෙථුනං දෙහි''** යනාදීන් තමන් ගැන පර්‍යායයෙන් කීමෙන් දුකුළායයි යෙත්. ඇතැමෙක් සඟ වෙසෙස් ම වේ යයි කියත්. අන්මහණකු ගැන යාචනයෙන් දුකුළායි. අනුන් සඳහා කීමේ දී ද දුට්ඨුල්ලොභාසනය වේයයි **විමතිවිනොදනියෙහි** කියැවිණ. **'මය්හං දෙහි'** යනාදීන් කීමෙන් ගරුකාපත්ති නැත මෛථුනධම්මසහිතතාව නැති හෙයිනි. ''එතෙසු සික්ඛාපදෙසු මෙථුනරාගෙන වීතික්කමෙ සති සඞ්ඝාදිසෙසෙන අනාපත්ති'' යනු **වජ්‍රබුද්ධියි**.

## සප්තදශාකාරය.

6. **ආපත්ති**-මාගමකෙරෙහි මාගම යන සත් ඇති ව හස්තමුද්‍රා වෙන් නමුදු මෙවුන්දම් ඉල්ලීමේ දී ඇය එකෙණෙහි දත සහ-වෙසෙසි. නො දත පසුව දත ඵුලැසිසි.

7. **අනාපත්ති** චීවරාදි වස්තුකාමයෙන් උවටැන් කිරීමේ ගුණ වතන්නහුට ද උම්මත්තකාදීනට ද ඇවැත් නො වේ.

9. **අඞ්ග**-මනුස්සිත්‍ථී, ඉත්‍ථිසඤ්ඤිතා, අත්තකාමපාරිචරියාය රාගො, වණ්ණභණනං, විජානනං යි පසෙකි.

---

## 5. සඤ්චරිත්ත සික්ඛා.

70. **සඤ්චරිත්තං.**

(සංචරණං-සඤ්චරො, සො එතස්ස අත්‍ථී'ති සඤ්චරී, තස්ස භාවො සඤ්චරිත්තං.) අඹුසැමිබව පිණිස ස්ත්‍රී පුරුෂයන් අතර හසුන් ගෙනයාමයි. හෙවත්-මඟුල්කපුකම් කිරීමයි.

71. **සමාපජ්ජෙය්‍ය.**

පිළිගැනීම, විමසීම, පෙරළාකීම වශයෙන් පැමිණීම හෙවත්-පිළිපැදීමයි. පුරුෂයා හෝ මාගම හෝ ඔවුන්ගේ දෙමාපියන් හෝ 'ස්වාමිනි, අසුවලාට (-ස්ත්‍රියට හෝ පුරුෂයාට හෝ) මේ පණිවුඩය කියනුමැනවැ'යි කී කල, 'සාධුඋපාසක' යනාදින් වාග්භෙද කොට හෝ හිස සැලීම ආදිය කොට හෝ භාරගැන්ම පටිග්ගහණයයි. ඒ ස්ත්‍රිය ගේ හෝ පුරුෂයාගේ හෝ ඔවුනට නො වරදවා කියන මාපිය සහෝදරාදීන් ගේ හෝ සමීපයට ගොස් පිළිගත් හස්න ආරොචනය කිරීම වීමංසනයයි. ඔවුන් හස්න පිළිගත ද නිහඬ ව සිටිය ද කම් නැත. එබව නැවත අවුත් ප්‍රථමයාට පැවැසීම පච්චාහරණයයි. අඹු-සැමි බව සිද්ධිවීම හෝ නො වීම කාරණ නො වේ. මේ තුනගින් ඇවැත් වේ.

72. **ඉත්‍ථියා වා පුරිසමතිං**...... (ආරොචෙය්‍ය යනු ශෙෂයි.)

මෙසින් සඤ්චරිත්තසමාපජ්ජනය වන අයුරු ප්‍රකාශිතයි. පුරුෂයකු විසින් හෝ මාගමක විසින් හෝ මෙහෙයන ලදුයේ පුරුෂයාගේ අදහස මාගමට හෝ මාගමගේ අදහස පුරුෂයාට හෝ ප්‍රකාශ කිරීමයි. **ජායත්තනෙ වා ජාරත්තනෙ වා** (**නිමිත්තත්‍ථෙ භුම්මං.**) යන්නෙන් බිරියක සොර බිරියක සැමියකු සොරසැමියකු වීම නිමිති කොට යන අදහස ද; **තංඛණිකාය'පි** (තංඛණේ වසිතබ්බා) යන්නෙන් උපලක්ෂණ වශයෙන් මුහුත්තිකාව හෙවත්-ස්වල්පකාලයක් සංවාසයට තැකූ ස්ත්‍රිය ද කියැවේ.



**ස්ත්‍රීහු දස දෙනෙකි**:-

මාතුරක්ඛිතා පිතුරක්ඛිතා, මාතාපිතුරක්ඛිතා, භාතුරක්ඛිතා, භගිනීරක්ඛිතා, ඤාතිරක්ඛිතා, ගොත්තරක්ඛිතා, (-තමා උපන් කොණ්ඩඤ්ඤාදි ගොත්‍රයන්හි වූවන් විසින් රක්නා ලබන්නී), ධම්මරක්ඛිතා (-පණ්ඩරඞ්ග පරිබ්බාජකයන් සේ එක් ශාසනාකෙතකුන් වෙත පැවිදිවූවන් විසින් හෝ මාලාකාරාදි එක් ගණයෙක වූවන් විසින් හෝ රක්නා ලබන්නී), සාරක්ඛා (-පුරුෂයකු විසින් 'මැ මාගේය'යි ගැබ්හි පටන් අයත් කරගනු ලැබූ හෝ මාලාදාමාදිය දැමීමෙන් අයත් කරගනු ලැබූ හෝ තැනැත්තී. එතැන් පටන් ඇ සස්වාමිකායි.), සපරිදණ්ඩා (-රජුන් විසින් සෙස්සනට තහනම් කරනු ලැබූ තැනැත්තී.)

සස්වාමික බැවින් පසුව කී දෙදෙනාට පුරුෂ සංසර්ගයෙන් මිච්ඡාචාරය වේ. අස්වාමික බැවින් සෙස්සනට නො වේ.

**භාර්‍ය්‍යාවෝ ද දශ දෙනෙකි**:-

ධනක්කීතා (-මිල දී ගනු ලැබූ තැනැත්තී.), ඡන්දවාසිනී (-සිය කැමැත්තෙන් පුරුෂයකු රඳවා ගත් තැනැත්තී.), භෝගවාසිනී (-ගෘහොපකරණ දී බිරියබවට ගත් ස්ත්‍රී), පටවාසිනී (-නිවාසන පාරුපන මාත්‍රයක් ලැබ භාර්‍ය්‍යාබවට පත් දිළිඳු ස්ත්‍රී), ඔදපත්තකිනී (-දිය බඳුනැ අත්බහා එකීභාවයට පත් වූවා), ඔභතචුම්බටා (-හිසින් සුඹුළු බහා බිරිය බවට ගත් කටස්හාරිකාදි ස්ත්‍රී), දාසී ච භරියා ච (-මෝ දාස්සක් ද වෙයි භාර්‍ය්‍යාව ද වෙයි.), කම්මකාරී ච භරියා ච (-අඹුබවට පත් බැළයට මෙහෙ කළ තැනැත්තී), ධජහටා-(විදෙශයෙන් කරමරානීත වශයෙන් පැහැරගෙනෙනු ලැබූ තැනැත්තී), මුහුත්තිකා (-තාවත්කාලික ව සංවාසයට ගනුලැබූ ස්ත්‍රී.)

මේ භාර්‍ය්‍යාවනටත් විසිවැදෑරුම් ස්ත්‍රීන් කරා ගිය පුරුෂයාටත් මිථ්‍යාචාරය වේ. භික්ෂුවගේ සඤ්චරිත්තයට මොහු විෂය ද වෙති.

මාතුරක්ඛිතාවට කියවයි කීකල අනෙකකට කී නම් විසඞ්කෙතයි. දරකඳරිකාවන් නො දූත සිටිය දී ඔවුන්ගේ මාපියන් හසුන් යැවුව ද ගුරු ඇවැති. මිහණ අනුන් ලවා විමසවා කියා ද සඤ්චරිත්තමැයි. භික්ෂුවට නො දන්වා අදහස ලිපියේ ලියා 'මෙය අසුවලාට දෙව'යි දුන් ලිපිය ගෙනගියහුට සඤ්චරිත්ත නැත.

---

## සප්තදශාකාරය

5. **ආණත්ති**-පතිගණ්හාති, වීමංසති, අභතාවාසිකාං පච්චාහරා පෙති යන ක්‍රමයෙන් සාණත්තිකයි.

6 **ආපත්ති**-අඞ්ග දෙකෙකින් ථුල්ලැසි ද එකෙකින් දුකුලා ද වේ.

7 **අනාපත්ති**-සඞ්ඝයාගේ අඩාළ උපොසථාගාරාදියක් හෝ චෛත්‍ය කර්මයක් හෝ සඳහා වියදම් ලැබුම්ට උවසු උවැසියන්ගේ පණිවුඩ ගෙනයන්නහුට ඇවැත් නො වේ.

9. **අඞ්ග**-මනුස්සජාතිකතා, න නාලංවචනීයතා, පතිගණ්හන, වීමංසන, පච්චාහරණයයි අඞ්ග පසෙකි.

ස්ත්‍රිය ද පුරුෂයා ද අඹුසැමිබවෙන් වෙන් ව, අනුන් විසින් අවවාද කොට සම්බන්ධකළයුතු බවට පත්ව සිටිත් නම් '**වත්ත-බ්බතාය අලං අරහා**' යනුවෙන් '**අලංවචනීයා**' නම් වෙත්. (ඒ ඒ දෙශචාරිත්‍රවලට අනුව විවාහයෙන් වෙන්ව සිටිනඅයයි ) තාවකාලික ව කෝපයෙන් ගියත් සිතින් වෙන් නුවූවෝ නො ගැනෙති. '**න අලං වචනීයා-නාලං වචනීයා**' නො හළ තැනැත්තියයි. '**න හි නාලං වචනීයා-න නා'ලං වචනීයා**' 'අලං වචනීයා' යන්නෙහි අර්ථයමැයි. මුහුත්තිකාදීන් කෙරෙහි අලංවචනීය භාවය පුරුෂයා කෙරෙහි විරක්තමාත්‍රයෙන්ම වේ.

10. **සමුට්ඨාන-ඡසමුට්ඨානයි**-ශික්ෂාපදය හෝ අලංවචනීය භාවය හෝ ඒ දෙක ම හෝ නො දත කායවිකාරයෙකින් හස්ත පිළිගෙන හස්තමුද්‍රාවෙන් ම විමසා කියන්නහුට කායද්වාරයෙන් ඇවැත නැගේ. හිඳින මිහණහු වෙත එළඹ 'අසුවලාගේ අදහස දන කියව'යි පැවසූ සඳ, තමන් වෙත පැමිණි ඇයගේ හෝ ඔහුගේ හෝ අදහස විචාරා දන, නැවතත් තමන් වෙත එළැඹි හස්න දුන් තැනැත්තහුට ඒබව ඇරොජීමේ දී හුදු වාචාවෙන් ඇවැත සිදු වේ. අන් කරුණක් සඳහා යන එනවිට මෙයත් සිද්ධ කිරීමෙන්ද හුදු වාචාවෙන් ඇවැත් වේ. මේ දෙක මිශ්‍රවීමෙන් කායවාචාවෙන් ඇවැත් වේ. සිකපද නොදත් රහතන් වහන්සේ වුවත් හැර ගිය දෙමාපියන් සමඟ කිරීමේ දී කායවාචාවෙන් ඇවැතට පත්විය හැකියි.

ප්‍රඥප්තියත් අලංවචනීයභාවයත් දන මේ තුන් ප්‍රකාරයෙන් ක්‍රියා කරන්නහුට කායචිත්ත, වාචාචිත්ත, කායවාචාචිත්ත යන සචිත්තකත්‍රයෙන් ඇවැන් සිදු වේ. ප්‍රඥප්තිය දත් පමණින්ම සචිත්තක ව ඇවැත් වේයයි කීම නුසුදුසු බවත්,



පනත දත ද 'අපරිත්‍යක්තය'යි සිතන්නහුට සචිත්තක ව නැගේයයි කිව නො හැකි බවත් ටීකාගතයි. 'ප්‍රඥප්තිය හෝ අලංවචනීයභාවය හෝ නොදැනීම් වශයෙන් මේ ශික්ෂාව අචිත්තකය' යනු **විමතිවිනොදනියි**. ශික්ෂාපදය පමණක් දැනීම ප්‍රමාණවත්ය යනු **අත්ථයොජනා** මතයයි.

---

## 6. කුටිකාර සික්ඛා.

73. **සඤ්ඤාචිකාය**.

(සයං පවත්තිතා යාචිකා සංයාචිකා, තාය.) තමා විසින් කැරුණු යාචනයෙන් යනු අර්ථයි. යාචනමාත්‍රයෙන් කිර්‍රියක් කළ නො හැකි බැවින් '**සයං යාචිතකෙහි උපකරණෙහි**' යන්නෙන් අභිප්‍රායාර්ථය ප්‍රකාශිතයි. විඤ්ඤත්තියෙන් හෙවත්-යාචනයෙන් වැ පොරෝ වැල් ආදි උපකරණ ලබාගෙන කිරීමයි. නො නෑ නො පැවරූ අයගෙන් තමා සතුකර ගැනීමට යමක් ඉල්ලීම නිසුදුනට කැප නැත. තාවකාලික ව ඉල්ලාගත හැකියි. ගෙදරකින් දියටිකක් ඉල්ලීම ද සුපොදන විඤ්ඤත්තියට ඇතුළත් වේ. හිමියත් ඇති වස්තු ගැන ම විඤ්ඤත්තිය සිදුවේ. වඩු ආදි කවරකුගෙන් නමුදු හස්තකර්මය ඉල්ලිය හැකියි. හස්තකර්මය වස්තුවක් නො වන බැවිනි. ඇසූ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් තමාගේ උවමනාව කිව හැකියි. චීවර-පිණ්ඩපාත දෙක්හි පරිකථාදියෙන් හැඟවීම ද නො වටී. සෙනාසනවිසයෙහි පරිකථා, ඔභාස, නිමිත්තකර්ම වටී. ග්ලානප්‍රත්‍යය විෂයෙහි ඉල්ලීමාදියෙන් වරද සිදු නො වේ.

74. **කුටිං**.

තමන්ගේ පෞද්ගලික වාසය පිණිස විහාරයෙක හෝ අරණ්‍යාදියෙක හෝ තනාගන්නා කිළියෙකි. දුතියපරිජ් තිදනයේ ද මෙවැනි කුටිකරණයක් ගැන පැවසිණ. සබ්බමත්තිකාමය (දෙරබා කවුළු ඈ හැරයි.) කුටිකාරණය ප්‍රතික්ෂිප්තයි. පිළිස්සූ ගඩොලින් ගෙඩි ගෙවල් සේ කළ කිළි මැටිමුවා කිළි ගණයට නො යයි.

මේ ශික්ෂාවෙන් කියැවෙන්නේ උල්ලිත්තාදි කුටියෙකි. ආපත්ති සිද්ධියට භිත්තිලිම්පනයත් ආවශ්‍යක වුව ද, උල්ලිත්තාදි ලක්ෂණ ඡදනය පිළිබඳව විනා භිත්තිය පිළිබඳ ව නො වේ. ඇතුළ ලේප කළ කිළිය උල්ලිත්තා කුටි නම්. '**උද්ධං මුඛං ලිත්තා උල්ලිත්තා**' ඇතුළතින් ඡදනය ලේප කිරීමේදී උඩට නෙරූ මුව ඇති ව කැරෙන බැවින් තත්නාමය සිද්ධ වී. '**අධො මුඛං ලිත්තා අව-ලිත්තා**' යටිකුරු කළ මුව ඇතිව ලේප කැරෙන බැවින් පිටතින්

ලිත්ත ඡදනය ඇති කිළිය අවලිත්තා නම්. දෙපස ම ලිත්ත වූවා උල්ලිත්තාවලිත්තා නම්. මේ ලිම්පනයක් සුණෙන් හෝ මැටියෙන් හෝ කැරෙන බව පැනේ. (පියස්සෙහි මැටි ගැසීමේ සිරිතෙක් ඉන්දියාවේ ඇත්තේල.) බුදුහු ඉට්ඨකා, සිලා, සුධා, තිණ, පණ්ණ යන පස් ඡදනයන් අනුදත්හ.

ලෙප නම් සුධා මත්තිකා දෙකයි. අළු ගොම මඩ ආදිය ලෙප නො වේ. හිතනිය ද ඡදනය ද ලෙපයට ස්ථානයි. කණු දොරබා ආදිය අලෙපොකාසයි.

**75.** **කාරයමානෙන.**

මේ ප්‍රයොජ්‍යක්‍රියාවචනයෙන් කරවන්නා පමණක් නො ව කරන්නා ද කියැවේ. **අස්සාමිකං** (නත්ථි සාමි පති අස්සා'ති අස්සාමිකා.) අස්වාමිකභාවය කර දෙන්නකු නැති බැවිනි. **අත්තුද්දෙසං** (අත්තා උද්දෙසො අස්සා කුටියා'ති අත්තුද්දෙසා.) සාමි භාවයෙන් තමන් දක්විය යුතු කුටියයි.

**76.** **පමාණිකා කාරෙතබ්බා.**

(පමාණයුත්තා කාරෙතබ්බා) උපරිම සීමාව පිටතින් දිග සුගත් වියතින් 12 කි. පළල ඇතුළතින් **7** කි. පහළ සීමාව පළලින් පියෙවි රියන් 4 කි පියෙවි රියන් සතරින් අඩු නම්, දිග සැටරියන් වූව ද කුටි නො වේ. ප්‍රමාණය මිනීමේ දී මහාමත්තික (-කටුමැට්ට) යෙන් හෝ ථුසපිණ්ඩ (-දෙමැට්ට ගසතොත් එයින් හෝ ගතයුතු. දැවමුවා ගල්මුවා ගඩොළුමුවා බිත් ඇති කිළිය ඡදනය හා ලෙප කිරීමේ දී අවසාන පිණ්ඩ දෙකින් ථුල්ලැසි සඟවෙසෙස් වේ. හිතනිය ලෙප නො කොට හෝ මඳක් ඉතිරිවන සේ ලේප කොට හෝ ඡදනය සපුරා ලේපකළ ද, ලේප ඝටනාව සිදු නො වන බැවින් ඇවැත් නැත. මැටිමුවා බිත්හි දී මැට්ට ම ලේප සඞ්ඛ්‍යාවට ගැනෙන බැවින් ඡදන ලේපය හා සම්බද්ධ වීමෙන් ඇවැත් වේ

**77.** **අනාරම්භං.**

(අනුපද්දවං) දිමි, කඩි, වේ, මී, සප්, ගෝනුසු, පත්තෑ, ඇත්, අස්, සී, දිවි, වග, වලස්, කළුඳෑ ආදි සතුන්ගේ වාසස්ථාන ද, පුබ්බන්න අපරන්න ධාන්‍යක්ෂෙත්‍ර සොරුන් මරන තැන් අත්පා සිඳින තැන් සොහොන් උයන් රජවතු ඇත්හල් අස්හල් දඟගෙවල් තැබෑරුම් මස්ලොඹු මාගී සිවුමං සඬි සභා සංසරණ ආශ්‍රිතස්ථාන ද උපද්‍රව සහිතයි.

**78.** **සපරික්කමනං.**

"පරිතො කමන්ති ගච්ඡන්ති එත්ථා'ති- පරික්කමනං, පරික්කමනෙන සහ වත්තතී ති. සපරික්කමනං" උපචාර සහිත යනු අර්ථයි.



ප්‍රපාතාදිය ඇති බැවින් බරපැටවූ ගැලකට හාත්පස යා නො හැකි නම් උපචාර රහිතයි. ප්‍රමාණයුක්ත කුටියක් කරනු කැමැති භික්ෂුව ගෙපළ සමතල කොට, සඞ්ඝයා වෙත පැමිණ, කුටිවාස්තුව බලන සේ ඉල්ලිය යුතු. සියලු සඞ්ඝයා නො යතොත්, ඤත්තිදුතිය කම් වදනින් හෝ අපලෝකනයෙන් හෝ සම්මුති ලද කිහිපනමක් ගොස්, අනාරම්භ සපරික්කමන බව් විමසා සඞ්ඝයාට දැන්විය යුතු කුටිකාරකගේ යාච්ඤාවෙන් කුටිවාස්තුව දෙසා සම්මත කළ යුතු වේ.

---

## සප්තදශාකාරය.

**6.** **ආපත්ති**-වාස්තුව නො දෙසවා ප්‍රමාණය ඉක්මවා කුටිය කිරීමට යොදන සියලු ප්‍රයොගයන්හි දුකුලාසි අවසන් පිණ්ඩයන්හි ථුල්ලැසි සඟවෙසෙස් වේ. සාරම්භ නම් අපරික්කමන නම් දුකුලාසි. වාස්තුව නො දෙසීමෙන් ද, ප්‍රමාණය ඉක්මවීමෙන් ද සඟවෙසෙස් දෙකෙකි.

**7.** **අනාපත්ති**-අඩාළ කුටිය සඞ්ඝයාට හෝ සාමණේරාදීනට හෝ දී තමනට මිදිය හැකියි. (ලැබූ භික්ෂුව තමන් සඳහා අවසන් කිරීමෙන් සඟවෙසෙස් ඇවදිය හැකියි.)

ලෙණ, ගුහා, තිණකුටි, පණ්ණච්ඡදන ගෘහයන් කළ හැකියි. වෙන ම අනුදත් නිසා හෝ ලෙපඝටනය නැති නිසා හෝ ලෙන් නිවරදයි. (චිත්‍රකම් සඳහා යොදන ලේපය ගණන් නො ගැනේ.) ගුහා නම් ගඩොළු දැව සිලා යනාදියෙන් කළ කුළුගේ වැනි නො උස් පතිස්සය විශෙෂයක් බවත් එහි ලෙපදනය නැති බවත් ටීකාවන්හි එයි. භූමිගුහා නම් බිම් ගෙවල්ය. තණින් සොයා ඇත් නම් සත්මහල් වූද තිණකුටිය නිවරදයි. ලෙපාරක්ෂාවට මතුපිට තණ ආදිය අතුරා කැරෙන කිළි තිණකුටි නො වේ. උපාධ්‍යායාදි අනෙකුන්ගේ වාසය සඳහා කිළිය කරන්නහුට වරද නැත. උපොසථාගාර භොජනසාලා ජන්තාඝර අග්ගිසාලා සඳහා කළ ද වරද නැත.

**9.** **අඞ්ග**-උල්ලිත්තාදීනං අඤ්ඤතරතා, හෙට්ඨිමපමාණසම්භවො, අදෙසිතවත්ථුකතා, පමාණාතික්කන්තතා, අත්තුද්දෙසිකතා, වාසාගාරතා, ලෙපඝටනා.

**11.** **කිරියා** 'කිරියා ච කිරියා කිරියා ච' වාස්තුව දෙසවා පමණ ඉක්මවා කිරීම කිරියයි වාස්තුව නොදෙසවා පමණ නො ඉක්මවා කිරීම කිරියා කිරියයි. අකිරිය නම් වාස්තුව නො දෙසීමයි පණ්ණත්ති අජානනයෙන් අචිත්තකයි.

---

## 7. විහාරකාර සික්ඛා.

**79.** **මහල්ලකං.**

**'මහන්තභාවො එතස්ස අත්ථී'ති-මහල්ලකො'** කරවා දෙන ස්වාමියකු ඇති බැවින් ද විහාරවාස්තුව (-ගෙපළ) දෙසවා පමණ ඉකුත් කොට කරවිය හැකි බැවින් ද පළමු කුටියට වඩා මහල්ලක භාවය වේ.

**80** **විහාරං.**

**'විහරන්ති එත්ථා'ති-විහාරො'** මේ විහාර සදින් මහ වෙහෙරෙක් නො ගැනේ. තමනට වාසය පිණිස කැරෙන ආවාසයෙකි, ගැනෙන්නේ. වාස්තුව නො දෙසවා කිළිය කිරීමෙන් කිරියා කිරිගැනෙන්නේ. වාස්තුව නො දෙසීම නිසා අක්‍රියයෙන් නැගේයෙන් ඇවැත නඟී. වාස්තුව නො දෙසීම නිසා අක්‍රියයෙන් නැගේයෙන් ඇවැත නඟී. **'භික්ඛු වා'** යන තන්හි 'වා' සද 'මහල්ලකං ච විහාරං කාරෙය්‍ය, භික්ඛු ච අනභිනෙය්‍ය'යි සමුච්චය කරයි. අවධාරණාර්ථ යයි ද සෙත්.

---

## 8. දුට්ඨදෙස සික්ඛා.

**81.** **දුට්ඨො දොසො.**

'දූසියිත්ථාති දුට්ඨො' (කම්ම සාධනයි.) ද්වෙෂයෙන් දූෂිතවූ තැනැත්තායි. 'දූසෙති පරං විනාසෙතී'ති-දොසො' (කත්තු සාධනයි.) අනුන් දූෂණය කෙරේනුයි දොස නම්. දෙ පරිද්දෙන් ම එකෙක් කියැවේ. දූසිත-දූසකාකාර පමණයි වෙනස. ප්‍රීති සුඛාදියෙන් තොරවූ තැනැත්තා **'අප්පතීත'** නම්.

**82.** **අමූලකෙන.**

'නා'ස්ස මූලනති-අමූලකං' දස්සන, සවන, පරිසඞ්කා යන මුල් නැති බැවින් අමූලකයි. අමූලකබව චොදකයා ගේ වශයෙනි. චුදිතකයා (-චොදනා ලද්දහු) වරදට පත් වූවා හෝ නො වූවා හෝ කම් නැත. චොදකයා දස්සනාදිය නො කෙළේ නම් ඇවැතට ප්‍රමාණවනි. අදිට්ඨ අසුත අපරිසඞ්කිත විසින් අමූලක බව වේ. අදිට්ඨ නම් පියෙවි ඇසින් හෝ දිවැසින් හෝ නො දක්නාලද්දයි. අසුත නම් පියෙවි කනින් හෝ දිව කනින් හෝ නො අසන ලද්දයි. පරිසඞ්කිතය වනාහි-දිට්ඨපරිසඞ්කිත සුතපරිසඞ්කිත මුතපරිසඞ්කිත විසින් ත්‍රිවිධයි. දැකීමක් අනුව ඇසීමක් අනුව ගන්ධාදියක් අනුව උපන් සැකයයි. **'පාරාජිකෙන ධම්මෙන'** යන්නෙන් සූවිසි පරිජි අතුරෙන් භික්‍ෂූනට සාධාරණ එකුන්විසි පරිජි මෙහිලා ගැනේ.



**83.** **අනුද්ධංසෙය්‍ය.**

තමා චොදනා කිරීම ද, අන් පැවිද්දකු ගිහියකු ලවා චොදනා කරවීම ද අනුද්ධංසනයයි.

**චොදනා භෙද** (I)

**චක්ඛු සන්දස්සනා**-මෙවුන් ධම් සෙවියෙහි යනාදීන් වස්තුව දැක්වීම.

**ආපත්ති සන්දස්සනා**-'මෙවුන්ධම් ඇවැතට පත්වූයෙහි' යනාදීන් ඇවැත දැක්වීම.

**සංවාස පටික්ඛෙප**-'නත්ථි තයා සද්ධිං උපොසථො වා පවාරණා වා' යනාදීන් පිළිකෙව් කිරීම.

**සාමීචි පටික්ඛෙප**-පිළිවෙලින් අභිවාද පච්චුට්ඨාන අඤ්ජලි කම්ම සාමීචිකම්ම කිරීමේ දී එකකු අත්හැරලීම.

**චොදනා භෙද** (II)

**සීලවිපත්ති චොදනා**-පරිජි සඟ වෙසෙසින් සෙවීම.

**ආචාරවිපත්ති චොදනා**-සෙසු ඇවැතින් චොදනා කිරීම.

**දිට්ඨිවිපත්ති චොදනා**-දශවස්තුක මිථ්‍යාදෘෂ්ටියෙන් ද, ශාස්වතොච්ඡෙද සඞ්ඛ්‍යාත දෘෂ්ටියෙන් ද චොදනා කිරීම.

**ආජීවවිපත්ති චොදනා**-ආජීවය නිමිති කොට පැනවූ සික්පද සයෙන් චොදනාකිරීම.

'මෙවුන්ධම් සෙවියෙහි' යනාදීන් කිවත් චොදනාව නැගුණේ වේ. එහෙත් සඟවෙසෙස් වීමට අස්සමණ, සාමණෙර, කොණ්ඩ (-දුසිලුනට නමෙකි.) නිගණ්ඨ, තාපස, ගහට්ඨ, ජෙට්ඨබ්බනික, උපාසක, දුස්සීල, පාපධම්ම, අනොතාපුති, අවස්සුත ආදි වචනයන් හා සටාම කිවයුතු. **'නත්ථි තයා සද්ධිං උපොසථො වා පවාරණා වා' සඞ්ඝකම්මං වා'** යනුවෙන් නොව **'දුස්සීලො'සි නත්ථි තයා සද්ධිං උපොසථො වා'** යනාදීන් දුස්සීලාදි පද සටා ම කිවයුතු වේ.

පරිජියට පැමිණියෙහි යනාදීන් චොදනා කිරීමේ දි ඔහු එකෙණෙහි දත හොත් වදනක් පාසා සඟවෙසෙස් වේ. සම්පස්සඅන්‍යයකු ලවා චොදනා කරවූව ද ආණාපකට ඇවැත්ය. 'මම ද දනිමි' යනාදීන් ආණත්තයාත් චොදනා කෙරේ නම් ඔහුට ද ඇවැත් වේ. අනුද්ධංසන අදහස තිබුණත් 'අසුවලා මෙසේ මෙසේ කියයි' යනුවෙන් අනෙකකු කී දූයක් කීමෙන් ඇවැත් නැත. නො කී දූයක් කීනම් ඇවැත් වේ. දූතයකු හෝ ලිපියක් හෝ යවා කැරෙන

ජාති නම් කැත් බමුණු ඈ ජාතියි. චොදකයා තැබූ නම් ද, ධම්මරක්ඛිතාදි නම් ද නාමයි. ගොත්ත නම් ගොතමාදි ගොත්‍රයි. දීඝ හ්‍රස්වාදි ආකල්ප නානාත්වයත්, කෘෂ්ණ ශුක්ලාදි වර්ණ නානාත්වයත් ලිඞ්ග නම් වේ. ලහුකාපත්ති පාරාජිකාපත්ති සේ ගැත්ම ආපත්ති ලෙසයයි. පත්ත නම් යපත් ආදියයි. පාංශුකූලාදිය චීවරයි. උපජ්ඣාය නම් චුදිතකයාගේ උපාධ්‍යායයි. චුදිතකයාගේ ප්‍රව්‍රජ්‍යාචාර්ය ආචාර්යයි. චුදිතක වසන ප්‍රාසාදාදිය ආවාසයි.

මේ සිඛයේ දී 'මෙත්තියා භික්ඛුනී'යි කියේ පූර්වව්‍යවහාරය තකාය. දූන් බි ගෘහස්ථාවකි.

---

## 10. පඨම සඞ්ඝභෙද සික්ඛා.

**88. සමග්ගස්ස සඞ්ඝස්ස.**

කායචිත්ත දෙකින් එකීභූතවූ, සමාන සංවාසකවූ, සමාන සීමස්ථවූ (-එක්සීම්හි සිටි) සඞ්ඝයා සමග්ගසඞ්ඝයායි. ලද්ධිනානා සංවාසක (-උක්ඛිත්තානුවත්තක) කම්මනානාසංවාසක (-උක්ඛෙපනීය කර්මය කරනුලැබූ තැනැත්තා) යන දෙදෙන නො ගැනෙති. **'සමානො එකුපොසථාදිභෙදො අස්ස'** යනු බැවින් සමානසංවාසක නම් එක්ව උපොසථාදිය කරන තැනැත්තේයි. මෙතෙම අන් සඞ්ඝයා හා සමසිත් ඇති බැවින් සිතින් අවියුක්තයි. සමානසීමස්ථවූයේ ඒ ඒ සඞ්ඝකර්මයන්හිදී කායසාමග්ගි දානයෙන් (-අත්පසට එළැඹීමෙන්) ශරීරයෙන් අවියුක්ත වේ.

**89. භෙදාය පරක්කමෙය්‍ය.**

මේ සඞ්ඝයා කෙසේ කවදා බිඳේදූයි සිතා යමෙක් අනුගාමිකයන් සොයා ද, ගණබන්ධනය කෙරේ ද, හෙතෙම භෙදයට උත්සාහ දරන්නෙකි.

**90. භෙදන සංවත්තනිකං වා අධිකරණං.**

'අධම්මං ධම්මො'ති දීපෙති' යනාදීන් ප්‍රකාශිත සඞ්ඝභෙදය සඳහා හෙතුවන, අටළොස් වස්තූන් අතුරෙන් යම් කරුණක් ගෙන සිටී ද. මේ අධිකරණ සද කාරණාවයි.

**91. එවමස්ස වචනීයො.**

ලජ්ජිභික්ෂුවක් මෙබඳු මහණකු දුට ද, අසුවල් තැන ඇතැයි ඇසුව ද, තමා ම ඔහු වෙත ගොස් 'සඟබේ නො කළ මනාය' යනාදීන් එහි ආදීනව කිවයුතුය. දූතයකු යවා කියවීමෙන් දුකුළාවෙන් මිදිය නො හේ.



**“සම්මොදමානො”** යන්නෙන් සමානදිට්ඨි සමානචිත්ත සංඛ්‍යාත අන්‍යොන්‍ය සම්පත්තියෙන් හෝ ශීලාදි සම්පත්තියෙන් හෝ තුටුවන්නේ යන අදහසද, **“අවිවදමානො”** යන්නෙන් 'මේ ධර්මය, නැත අධර්මය' යනාදීන් විවාද නැත්තේ යන අදහස ද, **“එකුද්දෙසො”** යන්නෙන් නො සම්භයත් තත් සීම්හි වෙන් ව පාමොක් උදෙසන බැවින්, එක්ව පවත්නා පාමොක් උදෙසීම් ඇත්තේ යන අදහස ද කියැවේ.

**'භෙදාය පරක්කමෙය්‍ය'** යනු කී හෙයින් භෙදයට හෙතුවන කරුණක් ගෙන පවසන්නට පෙර පක්ෂපර්යෙෂණාදි කාලයේ වුවත් සමනුභාසන කර්ම කළ හැකිය. එබඳු මහණහු වෙන්ව හෝ සඟමැදට හෝ ගෙන **'මා ආයස්මා සමග්ගස්ස සඞ්ඝස්ස භෙදාය පරක්කමි'** යනාදීන් කිවයුතු. තෙවරක් කියාත් නො හළහොත් දුකුළා වේ. ඉක්බිති ඤත්ති චතුත්ථකම්වදන් කියා සමනුභාසනකර්ම කළ යුතු. අවසන් **'ය්‍ය'** කාරයෙන් පසු සඟවෙසෙස් වේ.

අපලොකනාදි චතුර්විධ කර්ම ද, පාතිමොක්ඛුද්දෙසය ද, සඞ්ඝභෙදයෙහි ප්‍රධාන කාරණයි. වොහාර (-අටළොස් භෙදකරධර්ම පැවසීම), අනුසාවන (-තමාගේ මතය කුළුගැන්වීමට අනුනට කරුණු කීම), සලාකගාහ (-ස්ථිර කරගනු පිණිස තම මතය කැමැත්තවුන් ලවා ලහපත් ගැන්වීම) යන තෙකරුණ එයින් පූර්වභාග ක්‍රියායි. සිවුනමක් එක් සීම්හි වෙන්ව සඞ්ඝකර්ම කළවිට සඞ්ඝයා භින්නවූයේ වේ.

---

## සප්තදශාකාරය.

6 **ආපත්ති**-ඤත්තියෙන් දුකුළා ද, කම්මවාචා දෙකින් ථුලැසි ද, 'යස්ස නක්ඛමති සො භාසෙය්‍ය' යන තෙවන කම් වදනේ ය්‍යකාරයට පැමිණි පසු සඟවෙසෙස් ද වේ.

7. **අනාපත්ති**-සමනුභාෂණ කර්ම නො කරනු ලැබූවහුට ද, හළහුට ද, උම්මත්තකාදීනට ද සඟවෙසෙස් නැත. ආදිකම්මික දෙව්දත් හට සමනුභාසන කම් නො කළ හෙයින් සඟවෙසෙස් නො වී. (අරිට්ඨසික්ඛය හැර අන්සියලු සමනුභාසනයන්හි මෙසේය.)

9. **අඞ්ග**-භෙදාය පරක්කමනං, ධම්මකම්මෙන සමනුභාසනං, කම්මවාචා පරියොසානං, අප්පටිනිස්සජ්ජනං යි සතරෙකි.

10. **සමුට්ඨාන**-කාය වාචා චිත්ත සංඛ්‍යාත සමනුභාසන සමුට්ඨානයි.

11. **ක්‍රියා**-'හරනෙමි'යි කාය විකාර හෝ වාග්භෙද හෝ නො කරන්නහුට ඇවැත් වන බැවින් අක්‍රියායි.

12. **සඤ්ඤා**-නො හරින්නෙමි යන සංඥාව නැත් නම් ඇවැතින් මිදෙන බැවින් සඤ්ඤාවිමොක්ඛයි.

13. **චිත්ත**-නො හරින්නෙමියි දන්නා සිතින් සචිත්තකයි.

——:o:——

## 11. දුතිය සඞ්ඝභෙද සික්ඛා.

සඞ්ඝභෙදයට උත්සාහ දරන මහණහුට- ඔහුගේ ලබ්ධිය, කැමැත්ත, අභිප්‍රාය ගෙන ඒ අනුව පිළිපදනා හෙයින් අනුවත්තක වූ, සමගවූවන් බිඳුවාලන කලහකාර වදන් පවසන හෙයින් වග්ග වාදවූ, දෙතුන් නමක් භික්ෂූන් වුව හොත් පිළිපැදියයුතු ආකාරය මෙයින් කියැවේ. සඞ්ඝයා සඞ්ඝයාට නිග්‍රහවශයෙන් කම් නො කැරෙන හෙයින් දෙතුන් නමයයි කියැවිණ. උබ්බාහිකාදි සම්මුති කම් බොහෝ දෙනාට ද කැරේ.

——:o:——

## 12. දුබ්බචසික්ඛා.

92. **දුබ්බචජාතිකො**.

**"දුක්ඛෙන වත්තබ්බො අනුසාසිතුං අසක්කුණෙය්‍යො ජාති සභාවො අස්සා'ති-දුබ්බචජාතිකො"** දුබ්බචභාවයට හෙතුවූ

1. නැති ගුණ ඇතිසේ දතින්වයි සිතන බව ද, පිළිගැන්මෙහි අමාත්‍රඥ බව ද,
2. තමන් හුවන බව ද, අනුන් ගරහන බව ද,
3. කිපෙනසුලු බව ද,
4. ක්‍රොධය නිසා ඇතිවන නැවත නැවත සිත් පැටලීම ද,
5. දුර්මොචනීය බලවත් උපනාහය ද,
6. කෝප සහගත වදන් කීම ද,
7. චොදකයාට විරුද්ධව සිටීම ද,
8. චොදකයාට වදනින් අපහාස කිරීම ද,
9. චොදකයාට "තෝත් මෙ නම් ඇවැත් අවත්හි" යි පෙරළා කීම ද,
10. අන්කරුණින් අන්වදනින් ප්‍රස්තුතය යටපත් කිරීම ද,
11. සිය පවත් සපුරා හෙළි කොට නො බිණීම ද,



12. අනුන්ගේ ගුණ මැකීම ද, පරගුණ සියගුණ හා සම කිරීම ද,
13. පරසම්පත් නො ඉවසීම ද, සියසම්පත් සඟවාලීම ද,
14. අසත්ගුණ ප්‍රකාශනය ද, කළ වරද සැඟවීම ද,
15. නො නැමෙන බව ද, උත්තානස්වභාව ද,
16. ස්වභාවය ඉක්ම සියදෘෂ්ටිය පරාමර්ශනය කිරීම ද, එය දැඩිව ගැන්ම ද යන් විසින් සොළොස් ආකාරවූ හෝ පලාසාදිත්‍රය වෙත ම ගෙන එකුන්විසි ආකාරවූ හෝ ධර්මයන්ගෙන් යුක්තබැවින් තමා කෙරෙහි පැවති අනුසසුන් බුහුමන් පෙරටුව නො ගෙන නුහුරට ම ගන්නා තැනැත්තේ දුබ්බචයායි.

93. **උද්දෙස පරියාපන්නං**.

'උද්දිසීයති'ති-උද්දෙසො (-පාතිමොක්ඛො), තස්මිං පරියාපන්නා අන්තොගධා-උද්දෙසපරියාපන්නා' සියලු ශික්ෂාපද ප්‍රාතිමොක්ෂයෙහි ඇතුළත් වේ. අධිශීල ශික්ෂාලාභයට උපායභූත විනය ප්‍රඥප්තීහු සික්ඛාපද යන්නෙන් ගැනෙති.

94. **සහධම්මිකං වුච්චමානො.** (කරණත්ථෙ දුතියා.)

පස්සහ දැමියන් විසින් හික්මිය යුතු හෙයින් හෝ ඔවුන් සතු හෙයින් හෝ බුදුන් පැනවූ සිකපද සහධම්මික නමින් කියැවේ· ධම්මසද්ද කාරණාර්ථයයි ගෙන 'කරුණු සහිතව කියනු ලබන්නේ' යන අරුත ද ගතහැකියි. **'මම වචනාය'** යන තන්හි 'වචනාය' යනු අපාදානාර්ථයෙහි චතුර්ථියි අඤ්ඤමඤ්ඤවුට්ඨාපනය නම් අවත් ඇවැතින් නැඟී සිටීමයි. කම්වදන් අවසනැ සඟවෙසෙයි.

———

## 13. කුලදූසන සික්ඛා.

95. **ගාමං වා නිගමං වා**

පවුරු රහිත ව අවුණු සහිත වූයේ නිගමයයි. පවුරු අවුණු සහිතවූයේ නගරයයි. ගාම සදින් නගරය ද ගැනේ. ග්‍රාමාදිය නිසා සිවුපසය ලැබෙන බැවින් ගම් ඇසුරු කොට විසීම වේ.

96. **කුලදූසකො**.

**'පුප්ඵදානාදීහි මනුස්සානං සද්ධං විනාසෙන්තො කුලානි දූසෙතී'ති-කුලදූසකො'** සැදැහැවත් කැත් බමුණු ඈ කුලයන් ලාභාශාවෙන් මල්ඵලාදිය දී සතුටු කොට ගත් සඳ, එසේ නො

කරන ලජ්ජීමහණුන් කෙරෙහි ඔවුන්ගේ ශ්‍රද්ධාහානිය වේ. එය කුලදූසනය යි.

සපු ඉද්දැදි මල්වගී දීම, අඹ-දඹ-තැඹිලි ආදි ඵලවගී දීම, මහරි ආදි සුනුවගී දීම, පියෙවිමැටි නිල්මැටි ඈ මැටිවගී දීම, දැහැටි දඬු දීම, හුණදඬු ඈ දීම, වෙදකම් කිරීම, ගිහියන් ගේ හසුන් ගෙන යාම යන අට **කුලදූසන කර්‍මයි**. කුලසඞ්ග්‍රහ තකා තමාසතු හෝ අනුන්සතු හෝ දෑ දීමෙන් දුකුලා ද, සඟසතු දෑ අධිපතිභාවයෙන් දීමෙන් ථුලැසි ද, සොරසිතින් දීමෙන් අගයේ පමණින් පරිජි ආදිය ද, සිදු වේ. කුලදූසනයෙන් උපන් පසය පස්සහදෑමියනට ම නො වටී.

**97. පාප සමාචාරො.**

**'මාලාවච්ඡ රොපණාදයො පාපකා සමාචාරා අස්සා'ති-පාපසමාචාරො'** ආදි සඳින් රොපාපන, සිඤ්චන, සිඤ්චාපන, ඔචිනන, ඔචිනාපන, ගන්ථන, ගන්ථාපනයෝ ගැනෙති. කුලසඞ්ග්‍රහ සඳහා මල්පලරුක් තමා සිටුවීමෙන් ද, අනුන් ලවා අකැපබසින් සිටුවවීමෙන් ද පචිති හා දුකුලා වේ. ආරාමය සඳහා ද ඡායා සඳහා ද, තෙරුවන් පුදනු සඳහා ද කැපබසින් රොපාපනය වටී. කුල සඞ්ග්‍රහ තකා කැපදිය හෙවත් ප්‍රාණීන් රහිත දිය වක්කළ ද, වැක්කරවුව ද දුකුලායි. **'පරිභොගත්ථාය පන සයං සිඤ්චනෙ අකප්පිය වොහාරෙන සිඤ්චාපනෙ ච දුක්කටං'** යනු බැවින් පරිභොග සඳහා කැපවහරින් වැක්කරවිය හැකි බව පැනේ. පුද පිණිස රොපිතයට කැපදිය දෑමුව ද වටී. අකපපිය වොහාර, කප්පිය වොහාර, පරියාය, ඔභාස, නිමිත්තකම්ම යන පස ම කුලදූසනයේ දී නො සෙදේ.

**98. ආයස්මා ඛො කුලදූසකො......**

මෙයින් පබ්බාජනීයකම් කිරීමට සුදුසු බව කියැවේ. මෙබඳු මහණකු දුටුවිට, චොදනා කොට ඇවැත ආරොපණය කොට ඤත්ති චතුත්ථ කම්වදන් කියා පබ්බාජනීයකම් කළයුතු. කම්කරනු ලැබූ වන් දූසනය කළ ගම්හි ද, විසූ වෙහෙර ද නො සිටිය යුතුයි. අන් ගමෙක වැස ද එගමට පිණ්ඩචර්‍යාවෙහි නො යා යුතු.

**99. එවඤ්ච සො භික්ඛු......**

**'සො භික්ඛු'** යන්නෙන් පබ්බාජනීය කම් කරනු ලැබූ මහණ ගැනේ. ඔහු,



1. උපසම්පදාවේ දී උපාධ්‍යාය කර්‍මවාචාචාර්‍ය නො වීම,
2. ආගන්තුකයනට නිස නො දීම,
3. උපාධ්‍යායව අලුත් හෙරණුන් නො ගැන්ම,
4. භික්ඛුනොවාදසම්මුති නො ඉවසීම,
5. සම්මත වුවත් ඔවා නො දීම,
6. පබ්බාජනීයකර්‍මයට හෙතුවූ ඇවැතට,
7. එවැනි අන් ඇවැතකට,
8. එයට ද වඩා ලාමක ඇවැතකට නො පැමිණීම,
9. පබ්බාජනීය කම්වදන් නො ගැරහීම,
10. කම්කළ මහණුනට අවමන් නො කිරීම,
11. පුවතත් මහණහුගේ පොහෝ, 12. පවාරණ නො වැළකීම,
13 තම බසෙහි අනුන් නො හැසිරවීම හෙවත් අණ නො දීම,
14. පාමොක් උදෙසීමාදියෙන් වෙහෙර දෙට තැන් නො දුරීම,
15. චොදනා සඳහා අවසර නො ගැන්ම, 16. චොදනා නො කිරීම,
17. මේන් පෙර ඔබ වරදෙකියි සිහිපත් නො කිරීම,
18. මහණුන් ඔවුනොවුන් කලහයෙහි නො යෙදවීම,

යන අටළොස් වත් පිරිය යුතු.

එසේ වත් නො පුරමින් භික්ෂූනට අගතිගාමීහයි චොදනා කෙරේ නම්, පරිභව කෙරේ නම් එයින් මුදවනු පිණිස (කුලදූසන යෙන් වැළකීමට නො වේ ) **'මා ආයස්මා අවච'** යනාදීන් කරුණු කිවයුතු. තෙවරක් කියාත් නො හළහොත් දුකුලායි. ඉක්බිති සඟ මැදට ගෙන තුන් යළක් කිවයුතු. නො හළහොත් දුකුලායි. අව-සන්හි සමනුභාසනකම් කළයුතු. කම්මවාචා පරියොසානයේ සඟ වෙසෙස් වේ. **'පක්කමතාය'සමා'** යනාදියෙන් පබ්බාජනීය කම් ලද්දහු ගේ වත් කියැවේ. අටළොස්වත් පුරා ඉල්ලූකල කම්මපටි-ප්පස්සම්භය (-අවලංගුකිරීම) කළයුතු. එහෙත් දූසනය කළ කුල යන් ගෙන් රහත් ව ද පසය නො පිළිගතයුතුය.

---

**100. නව පඨමාපත්තිකා.**

**'පඨමං ආපජ්ජති එතෙසන්ති-පඨමාපත්තිකා'** වරද කළ කෙණෙහි ඇවැත් වන ශික්ෂා පඨමාපත්තිකයි. තුන්වන සමනු භාසන කර්‍මාවසානයේ දී ඇවැත්වන ශික්ෂා යාවතතියකයි.

**101 ජානං පටිච්ඡාදෙති.**

කරුණු දශයෙකින් සඟවෙසෙස් ඇවැත පටිච්ඡාදනය වේ.

**1-2. ආපත්ති ච ආපත්තිසඤ්ඤී ච**- සඟවෙසෙසක් වීම ද, වස්තුවශයෙන් (-අසුචිමෝචනාදි ව්‍යතික්‍රම මාත්‍ර වශයෙන්) හෝ නාම වශයෙන් හෝ එබව දැනීම ඇතිබව ද වේ. මෙසේ ඇතිව අන් භික්‍ෂුවකට නො දන්වා අරුණ නඟාලුව හොත් ගුරුඇවැත පටිච්ඡන්න වෙයි. නිරවැතැයි හෝ අන් ඇවැතැකැයි හෝ වෙමතිකව හෝ සැඟවුව ද ඡන්න නො වේ. ලුහු ඇවැතැකැයි සිතා ගුරු ඇවැත දෙසුව ද නො දෙසුණේ වේ.

**3-4. පකතත්තො ච පකතත්තසඤ්ඤී ච**- උක්ඛෙපනීය කම් නො ලැබූ සමානසංවාසකයකු බව ද, එබඳු සත් ඇති බව ද; උක්ඛිත්තකයා ආරෝචනය නො කළ ද පිළිසන් නො වේ.

**5-6. අනන්තරායිකො ච අනන්තරායිකසඤ්ඤී ච**-ගමනට බාධක රාජචෞරාදි දස අනතුරු නැතිබව ද, එබව දැන්ම ද.


**7-8. පහු ච පහුසඤ්ඤී ච**-මහණකු කරා යාමටත් ආරෝචනය කිරීමටත් හැකි බව ද, එබව දැනීම ද; හැකියාව ඇතිව 'නො හැක්කෙමි' යන සංඥවෙන් ඡාදිතවුව ද අච්ඡාදිතයි

**9-10. ඡාදෙතුකාමතා ඡාදනා**-සඟවනු කැමැත්ත ද, සැඟවීම ද; හුදෙකලා වසන භික්‍ෂුවක් ඇවැතට පත්ව සභාගමහණකු ගේ පැමිණීම අපෙක්‍ෂාවෙන් හෝ සිටින තැනකට යාමෙන් හෝ රාත්‍රි ඉක්ම ගිය ද ඡන්න නො වේ. තමා හා අවෛරී සභාගමහණ කුට මෙනම් ඇවැතට පත්වීමියි දැන්වියයුතු. පිළිසන් කිරීමෙන් දුකුළාවෙක් ද වේ.

**102. අකාමා පරිවත්ථබ්බං.**

සඟවෙසෙස් ඇවැත් ඇවදුණහුට සඟමොක් නො නිපදෙන බැවින් නො කැමැත්තහු විසිනුදු පිරිවෙස් සමාදන් ව විසිය යුතු. පරිවාසය පටිච්ඡන්නපරිවාසාදි ප්‍රභෙද ඇත්තේය.

**පරිවාසය.**






1. **පටිච්ඡන්නපරිවාසය-'පටිච්ඡන්නාය ආපත්තියා සති දාතබ්බො පරිවාසො'** පිළිසන් දිනගණන් දන්නා මහණහුට දෙන පිරිවෙසයි. සුක්කවිස්සට්ඨි කායසංසග්ගාදි නානාවත්ථුක ඇවැතට පත් වුවත් **'සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං නානාවත්ථුකායො'** යි වස්තුකීර්තන වශයෙන් හෝ **'සම්බහුලා සඞ්ඝාදිසෙසා ආපත්තියො ආපජ්ජිං'** යි නාමමාත්‍රවශයෙන් හෝ වාක්‍ය ගත ද ඇවැතින් නැඟිය හැකියි.

2. **සුද්ධන්තපරිවාසය-'සුද්ධන්තතො පට්ඨාය දාතබ්බො පරිවාසො'** රාත්‍රිපරිච්ඡේදය මුළුල්ල ම හෝ කොටසක් හෝ නො දන්නහුට ද, සිහි නො කළ හැක්කහුට ද, විමති ඇත්තහුට ද දෙන පරිවාසයයි. එය ද්විප්‍රකාරයි. උපසම්පදාව ලත් දින පටන් අනුලෝම වශයෙන් හෝ, සඞ්ඝයාට ආරෝචිත දින පටන් පිළිලොම වශයෙන් හෝ, තමන් සුද්ධ ව සිටි දින ගණන හැරපියා, සෙසු අපරිසුද්ධ දින සඳහා ලබාගන්නා පිරිවෙස **චූළසුද්ධන්තයයි.** එසේ අනුලොම් පිළිලොම් විසින් රාත්‍රිපරිච්ඡේදය නොදන්නහුට ද, විමති ඇත්තහුට ද දෙන පිරිවෙස **මහාසුද්ධන්තයයි.** එය ගත් දින පටන් උපසපන් වූ දිනතෙක් රාත්‍රි ගැණ, එපමණ දිනගණනක් සමාදන් ව විසිය යුතුය.

3. **සමෝධාන පරිවාසය**-මෙය ත්‍රිවිධයි. පිරිවෙස් ගෙන වත නික්‍ෂෙප නො කොට වසනසඳ පත් ඇවැතක් පිළිසන් වී නම්, පළමු රැකි පරිවාස-මානත්තවල දින ගණන් මකා, මූල් ඇවැතට දෙවැන්න ද බහාලීමෙන් කැරෙන මූලායපටිකස්සනය කොට, තදනන්තර ව දියයුතු පරිවාසය **ඔධාන සමෝධානයයි.** අනතුරාපත්තිය අප්පටිච්ඡන්න නම් මූලායපටිකස්සනය පමණක් කොට මුල සිට පිරිවෙස් පිරිය යුතුය. දිනක් දෙදිනක් ආදිවශයෙන් පිළිසන් ඇවැත් ඇතහොත්, වැඩියෙන් පිළිසන් ඇවැතේ දිනගණනට සෙස්ස ද ලා දෙන පිරිවෙස **අග්ඝසමෝධානයයි.** මෙය සභාගවස්තුක ආපත්තීන් පිළිබඳ ව වේ. සුක්කවිස්සට්ඨි-කායසංසග්ගාදි නානාවස්තුක ඇවැත් එකට මුසු කොට දෙන පිරිවෙස **මිස්සකසමෝධානය** යි. (පටිච්ඡන්න පරිවාසයෙන් ද නැඟිය හැකියි.) **"අග්ඝසමොධානො නාම සභාගවත්ථුකායො සම්බහුලා ආපත්තියො ආපන්නස්ස බහුරත්තිං පටිච්ඡාදිතාපත්තියං නික්ඛිපිත්වා දාතබ්බො. ඉතරො නානාවත්ථුකානං වසෙනාති අයමෙතෙසං විසෙසො"** යනු වජිරබුද්ධි පාඨයි. මේ වෙසෙස ලක්‍ෂණමාත්‍රයෙක යනු **විනයාලඞ්කාරටීකායි.**

පරිවාසය සමාදන්වූවහු විසින් පෙළේ එන ආරෝචන වාක්‍ය යේ අදහස නො හැර කවර බසෙකින් නමුදු භික්‍ෂූනට ආරෝචනය කළයුතු. පෙර කී අටළොස්වත් ඇතුළු අනූසතරක් වත් පිරියයුතු.

අරිසැවියක දූක නිසජ්ජාදි ආකාරයන් සමඟ **'අයෙයා මයා දිට්ඨා මෙථුනං ධම්මං පටිසෙවමානා'** යනාදීන් කිව ද, චූදිත-කයා අලජ්ජියකු වුව ද, ප්‍රතිඥවෙන් ම ඇවැත් කළයුතු. ඇසින් දුටු දේත් ඇතැම්විට සත්‍යය ම නො වන බැවිනි. ත්‍රිවිධ ආපත්තීන් අතුරෙන් කවර ඇවැතෙක්දැයි ඒකාන්ත නො වන බැවින් අනිය-තයි. මේ ශික්ෂාව පළමුපරිජ්, කායසංසග, රහොනිසජ්ජා (අචෙලක වග්ග 4) යන ශික්ෂාපදයන්ගේ වශයෙන් දැක්විණ.

## සප්තදශාකාරය.

6. **ආපත්ති**-රහස්සාදයෙන් (-මාගම හා එකළාව හිඳ හසන ලපන කායසංසගාදිය කෙරෙම් යි පැවති ආස්වාදරාගයයි. රහො-නිසජ්ජස්සාදයේ මෛථුනරාග ස්වභාව නැතත්, ඒ පිළිබඳ ක්ලෙසයක් යයි ටීකාවල ප්‍රකාශිතයි.) මාගම වෙත යන රිසි යෙන් කෙරෙන අක්ඛි අඤ්ජන, පාරුපන, පාදඨපන ආදි සියලු පියොච්හි දුකුළා ද, මාගම හිඳිනා අස්නෙහි හිඳුත් ම පවිති ද වේ. හුදෙකළා හිඳීමෙන් දුකුළාසි. බොහෝ කතුන් හා හිඳුව ඔවුන් ගණිතින් ද, නැගි නැගී හිඳුත් පියෝ ගණිතින් ද, පචි තිසි. තමා පතා ගිය මාගම නො ව අනෙකක අවුත් හින්ද හොත් අසුද්ධසිතින් ගිය නිසා ආස්වාදය ඉපදීමෙන් පචිතිසි. සුද්ධසිතින් ගොස් හිඳගත් මිහණ වෙත මාගමක් අවුත් හුන්න හොත් රහස්සාදය උපතත් චිත්තොත්පාදමාත්‍රයෙන් ඇවැත් නො වේ. එබඳු ආස්වාද උපන් මිහණ වහා නැගී සිටිය යුතු බව ද, නො නැගිට්ට හොත් අක්‍රියයෙන් පචිති වන බව ද කියැවේ.

7. **අනාපත්ති**-අඬ නො වූ විඥ මිනිසකු උපචාරගත ව සිටුනා විට ද, සිටියහුට ද, රහස් සංඥ නැත්තහුට ද, වික්ෂිප්ත සිත් ඇත්තහුට ද පචිති නැත. වැසූ දොර ඇති ගබඩාවේ එළිපත වෙත විඥයකු සිටිය ද ඇවැත් වේ. මහණහු හුන් දෙළොස් රියන් මානයේ අනන්ධයකු චින්තනපර ව හෝ කම්මට්ඨාන යුක්ත ව හෝ (-ඇස් අරිද්දෙයි කාංක්ෂා වන බැවින්) සිටිය හොත් පචිති නැත. සමීපයේ අන්ධයකු සිටිය ද, වැද හෙව මහනිදි නිඳන අනන්ධයකු සිටිය ද, සත්‍රීන් දහසක් සිටිය ද, ඇවැතින් මිදිය නො හේ.

---



# දුතිය අනියත.

මෙහි කියැවෙන්නේ පිළිසන් නො වූ අස්නෙකි. භිත්ති ද්වාරා-දියෙන් නො වැසුණ අසුනයි. පවුරු පිරිකෙව් ඇතත් සැමිදුල් විහාරමිදුල් අපටිච්ඡන්නමැයි. මෛථුනසෙවනයට සුදුසු නො වූ තැනක් බැවින් නාලංකම්මනියභාවය වේ. දුට්ඨුල්ලවාචාව මුඛ්‍ය වශයෙන් ගැනුණ ද, අත්තකාමපාරිචරියා, කායසංසග්ග, රහො නිසජ්ජාවෝ ද ඇතුළත් වෙති. (කායසංසග කියූ විරූ බැවින් මෙහි නො යෙදේයයි ද යෙත්.)

**108**. **රහො නිසජ්ජං සාදියෙය්‍ය**.

**'සොතස්ස රහො'** යන්න මෙහි දී ගැනේයයි සාරත්ථදීපනියේ දැක්වුණ ද, කයිතුඩු දුට්ඨුල්ලොභාසය සිදුවන බැවින් **'චක්ඛුස්ස රහො'** යන්න ද යෙදේ. දෙළොස් රියන් මානයේ අනන්ධ අබධිර විඥයකු නැතිවිට රහස් හිඳීම සිදු වේ. අනන්ධ අබධිර විඥ මාගමක හෝ පිරිමියකු හෝ දෙළොස් රියන් උපචාරයෙහි සිටිය ද හුන්න ද නිදුව ද ඇවැත් නො වේ. ඇස් ඇති බිහිරා තුළුල් තෙපුල් නො අසයි. ඇස් නැති අබධිරයා කායසංසග හෝ කායික දුට්ඨුල්ලොභාසය හෝ නො දකී. එහෙයින් ඒ දෙදෙන කාරණ නො වෙති. ප්‍රථමා-නියතයෙහි සත්‍රීන් සිටිය ද ඇවැති. ඔවුන් මෛථුනය පිළිසොයන බැවිනි. මෙහි සත්‍රිය ද නිරාපත්තිකරයි.

කායචිත්ත, වාචාචිත්ත, කායවාචාචිත්ත යන සමුට්ඨානත්‍රිකය ම මෙහි ලැබේ. කායසංසග කෙරෙමින් තුළුල් තෙපුල් බණනා විට හෝ තුළුල් තෙපුල් කියමින් හිඳුනා විට හෝ කායවාචාචිත්තය ලැබේ. හුදු දුට්ඨුල්ලය ද එයින් ලැබේ. මේ ශික්ෂාවේ රහස්සාදය නම් මාගමක හා රහස් ව හිඳ තුළුල් තෙපුල් කීමේ ආස්වාදයයි. (අචෙ-ලකවග්ග 5 වැනි ශික්ෂාව අනුව පචිතිය වේ.)

### අනියතවල ප්‍රයෝජනය.

ආපත්ති විශෙෂයක් නො දැක්වෙන හෙයින් අනියත දෙසිකය නිරර්ථකයයි නො ගත යුතුය. විනයවිනිශ්චයාවස්ථාවන්හි දී චූදිතකයාගේ ප්‍රතිඥවෙන් ම ඇවැත් නියම කළයුතු බවට ද්වාරය මින් විවර කළහ. මෙහෙණියන් පිළිබඳව ද මේ න්‍යායය සාධාරණ සේ ගතහැකි බැවින් ඔවුනට අනියත නො දැක්විණ. ප්‍රථම සිඛයේ **'පටිච්ඡන්නෙ ආසනෙ'** යි දැක්වූ ඔකාස නියමයෙන් අපටිච්ඡන්නා සනයේ අවාරිතයයි ඇතිවිය හැකි මිථ්‍යාග්‍රාහය දුරලනුපිණිස දෙ-වැන්න ද ආවශ්‍යක විය. ඔකාසභෙද, රහොභෙද, රහොනිසජ්ජ-ස්සාදභෙද විසින් ද දෙක්හි නානාත්වය වේ. පරිජ් ද සඟවෙසෙස් ද

පව්තිඳුයි ඇවැත අනියත කල, ප්‍රතිඥවෙන් ම පරිජි ආදිය ආරෝපණය කරනු ලැබේ. විශෙෂාපත්ති අදශිතයෙන් ග්‍රන්ථාන්තයේ අනියත දක්වියයුතුයයි සිතිය හැකි වුවත්, ගරුකාපත්ති මිශ්‍රිත හෙයින් එසේ නො යෙදිණ. ඇවැතක් කැලම නො දැක්වෙන බැවින් ආදියේ ද නො යෙදේ.

**අනියතුද්දෙසය නිමි.**

—|○|—

## 1. පඨම කඨිනසික්ඛා.

### 109. නිට්ඨිතචීවරස්මිං.

කඨිනය අතුලවුනට පස්මසක් පස් අනුසස් ලබාගැනීමට චීවර පලිබොධ ආවාසපලිබොධ යන දෙකින් එකක්වත් නො සිදී පැවැත්ත යුතුය. ආනිසංසමූලක චීවරයක් හෝ පච්චාසාචීවරයක් හෝ මෙහි චීවරසද්දින් කියැවේ. සම්පූර්ණයෙන් සිවුර මසා අවසන් කිරීම, සොරුන් පැහැරගෙනයාම, වේයන් කෑම, ගින්නෙන් දැවීම, අසුවල් තැනින් ලබමි යි බලාපොරොත්තු වූ වස්ත්‍රයක් නො ලැබී යාම යන මේවායින් කවරක් සිදුවුවත් චීවරපලිබොධය සිඳීයයි. **'පලිබොධාති කඨිනත්ථාරස්ස අනුප්පබන්ධනපච්චයා'** යනු වජිරබුද්ධියි. 'නිට්ඨිත චීවරස්මිං' යන්නෙන් චීවරපලිබොධමාත්‍රය නැති බව කියැවේ. කඨිනානිසංස සිදීමට බාධක කරුණ පලිබොධයයි.

### 110. උබ්භතස්මිං කඨිනෙ.

මෙයින් ආවාසපලිබොධාභාවය (-ආවාසයෙහි ඇල්ම නැතිබව යනු කඞ්ඛා විතරණි ) කියැවේ. අෂ්ටමාතෘකාවලින් හෝ අන්තරුබ්භාරයෙන් හෝ කඨිනය ඉදිරේ. **'කඨිනස්සා'ති කඨිනත්ථාරස්ස, උබ්භාරායා'ති වූපසමාය අප්පවත්තියා'** යනු වජිරබුද්ධියි.

**වස් විසුම.**

දෙරබා දෙරවූ ඇති සෙනස්නෙක්හි වසන්මස්හි වස් වසන සේ බුදුහු අනුදත්හ. නො කඩ කොට තෙමස විසූ මහණහු විසින් කඨිනය ඇතිරිය හැකියි. පස්සහදෑමියන් හෝ මාපියන්හෝ ගිලන් කල ඔවුන්ගේ කටයුතු සඳහා ද, පස් සහදෑමියන්ගේ විනයකුකුස් මිසදිටු අදහස් දුරලනු සඳහා ද, පරිවාස තජ්ජනීයාදි කම් සඳහා ද, පෞද්ගලික හෝ සාඞ්ඝික හෝ සෙනාසනාදියේ කටයුතු සඳහා ද, ගිලන් නො වූ ද තමන්ගේ ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් දක්නා සඳහා ද, සති ආරාධනා නැතත් **සත්තාහකරණීයයයි** ඉටා යාහැකියි. සතිකරණීන් යන්නහු විසින් උපචාරසීමාව ඇතුළත සිට 'සත්තාහය



තුළ එමි'යි ආභොග කොට යායුතු. ආභොග නො කොට උපසරසිම් ඉක්මවූ කෙණෙහි වස්සච්ඡේදය වේයයි යෙත්. පළමු ආභොග කොට යන සඳ විසම්‍ෘතව ගිය ද වරද නැත්.

මහා පවාරණ දින පවරා හෝ නො පවරා හෝ යන්නහු විසි තුදු සත්තාහකරණීය නිමිත්තක් ඇතිකල ම යායුතු. නො එසේ වූව වස්සච්ඡේදයයි. ප්‍රධාන වශයෙන් පවාරණ දිනය තෙමසට අයත් බැවින්, එදින ගතවීමෙන් පැළවියදු සිට වූත්වස්ස වන නමුදු, පවාරණ දිනයට අරුණ නැගීමෙන් අප්පවාරිතයෝත් වූත්වස්ස වෙතියි **සාරත්ථදීපනියෙහි** ප්‍රකාශිතයි.

සත්තාහකරණීය නිමිත්තක් නැත ද, සත්දින තුළ එමියි ආභොග කොට ගොස්, එපරිදිම එන්නහුට දුකුළා මිස වස්සච්ඡේදය නො වේ යන මතය විමසිය යුත්තෙකි. වස් වැසූ දින අරුණ නො නගාම සතිකරණීන් යා හැකියි. සත්වැනිදින පැමිණ අරුණ නො නගාම නැවතත් සතිකරණීන් යා හැකිය යන මතය **විමතිවිනොදනියෙහි** බණ්ඩිතයි. එහෙත් සතිකරණීන් ගියහුට දෙතුන් දිනෙකින් පැමිණ අරුණ නො නගා නැවතත් බැහැර යා නො හැකිදැයි විමසිය යුතුය. කෙසේ වුවත් මූල් සත්තාහකරණයේ හැටියට සත් වැනි අරුණ වස්සීමාවේ ගතකළ යුතුය.

**කඨිනය.**

අනන්තරායෙකින් මහපවුරුණෙන් නො පැවරුව ද වස්සච්ඡේදය නො වූවනට කඨිනය ඇතිරිය හැකියි. අතුළ සිවුර තබා සෙසු සිවුරු පිළි ආනිසංස චීවරයි. වස්සාවාසික වශයෙන් ලැබෙන මේ සිවුරුපිළි කඨිනය ඇතුරුවනට අයත්ය. කඨිනය ලැබුවෝත් අනුමෝදන් වූවෝත් කඨිනය අතුළාහු වෙති. පස් අනුසස් ලබත්. පස් සහදෑමියන් විසිනුදු කඨින දියහැකියි. එක්වස්සීමාවෙක්හි බොහෝ විහාර වුවත් එක් තැනකට රැස්ව ඇතිරියයුතු.

i කැපීම මැසීම රැදීම කප්තැබීම ඈ පුබ්බකරණ, ii පරණ සිවුර පසුදිරීම, iii කෙළින්සිවුර අධිෂ්ඨාන් කිරීම, iv කඨිනත්ථාරය, v අෂ්ටමාතෘකා, vi උභයපලිබොධ, vii පක්කමනන්තිකාදි උද්ධාර, viii පස්අනුසස් යන අෂ්ටාඞ්ග දන්නා මහණ කඨිනය ලැබීමට භව්‍යයි.

චීවරශබ්දය වස්ත්‍රාර්ථය ද, නිමකළ සිවුර ද ප්‍රකාශ කරයි. මසා නිමකළ සිවුර කඨිනදානයට අයොග්‍යය යන මතය ගැන **වජිරබුද්ධියෙහි** මෙසේ සටහනි.

**4. නාසනන්තිකා**-අනුසස් සිවුර ගෙන බැහැර ගොස් ආපසු නො යමි සි (මෙසින් ආවාසපළිබොධයේ සිඳීම විය.) සිතා සිවුර කරනවිට එය සොර සතුරු උපද්‍රවාදියෙකින් විනාශ වී නම් චීවර පළිබොධයේ ද සිඳීම වෙයි.

**5. සවනන්තිකා**-අනුසස් සිවුර ලැබ වස්වුසූ අවස ගැන අපෙක්‍ෂා ඇතිව අන් වෙහෙරකට ගොස් සිවුර නිම කොට (මෙසින් චීවර පළිබොධය සිඳිණ) වසනසඳ තම වෙහෙර භික්‍ෂූන් අන්තරුබ්භාර වශයෙන් කෙළින් උදුළ බව ඇසුවොත් ඇසූවිටම ආවාස පළිබොධයත් සිඳීයයි.

**6. ආසාවච්ඡෙදිකා-'ආසාය අවච්ඡෙදෙ එතිස්සාති-ආසාවච්ඡෙදිකා'** ආවාසාලය හැරපියා බැහැරින් අනුසස් සිවුරු ලබන ආශා ඇතිව ගිය මහණ කවර කරුණෙකින් නමුදු එය නො ලැබිය. එකල ආසාවච්ඡේදය වීමෙන් පළිබොධය සිඳීයයි.

**7. සීමාතික්කමනන්තිකා**- වස්වුසූ වෙහෙර ගැන ආලය ඇතිව සිවුර රැගෙන බැහැර යයි. ආපසු එනවිට චීවරමාස සීමාව හෙවත්-පස්මස බැහැරදීම ගත වේ. මෙහි දී සිවුර නිමකිරීමෙන් චීවරපළිබොධයත්, පස්මස ගතවීමෙන් ආවාසපළිබෝධයත් සිඳේ. ගත සිවුර නො කළහොත් පළිබොධ දෙකම එකවට සිඳේයයි සුතුය. මේ සප්තකයේ දී උවසර සිමින් බැහැර වූවනට අනුසස් නැතිව යේ.

**8. සහුබ්භාර**-ආවාසාලය නො පියා සිවුර රැගෙන බැහැර ගිය මහණහු නැවත පැමිණෙන විට කම්වදතින් කෙළින් උදුරයි. සිවුර එසින් සෙස්සනටත් තමාටත් එකවිට අනුසස් නැතිව යයි. සිවුර නො කර, කිරීමට සොත්සාහ ව සිටියේ නම් පළිබොධ දෙකම එකවට සිඳේ. කළහොත් චීවර පළිබොධය පළමුවෙන් සිඳේයයි සැලකිය හැකිය. ටීකාවන්හි නො පැහැදිලි තැනෙකි මේ.

**අන්තරුබ්භාරය** පළිබොධ නිබ්සඳීම කම්වාක්‍යය කියා වෙහෙරෙක්හි කඨිනත්ථාරය සිඳලීමයි. **"බහි සීමං ගතානං ආගතානං වසෙන සහුබ්භාරෙ, බහි සීමං අගතානං වසෙන අන්තරුබ්භාරෙති එකොයෙව උබ්භාරෙ ද්විධා වුත්තො"** යනු විනිච්ඡයටීකායි.

චීවරමාසපස තුළ කවරදුවත් නො එමියි සිතා උවසර සිම ඉක්මවූ කෙණෙහි ආවාසපළිබොධය සිඳේ. 'එමි'යි සිතා ගොස් යම් දිනෙක 'නො එමි'යි සිතුව හොත් එදා හෝ සිඳේ. ආවාසාලය හැර පීමෙන් ආවාසපළිබොධය ද සිවුර කොට නිමවීම ආදියෙන් චීවර පළිබොධය ද නැති වේ. සඞ්ඝදායකාදීන් ගෙන් වස්ත්‍රයක් ලබමි'යි හෝ ලත් වස්ත්‍රයෙන් 'සඞ්ඝාටි ආදිය කොට ගනිමි'යි හෝ



කඨිනානිසංසය අනුමෝදන්වූවහු ගේ කැමැත්ත වේ නම්, ඒතාක් ද චීවරපළිබොධය ඇත. පැතූ තැනින් පිළී නො ලැබීමෙන් හෝ ලත් පිළියෙන් සිවුරු කොට නිමවීමෙන් හෝ කරන රිසිය පහව යාමෙන් හෝ චීවරපළිබොධය නැති වේ. පළිබොධ දෙක ම සිඳීමෙන් විනා එකක සිඳීමෙන් කඨිනුද්ධාරය නො වේ.

**111.** දසාහපරමං.

(අත්‍යන්ත සංයොගයෙහි ද්විතියායි.) ලැබුණු දිනය නිඃශ්‍රිත ගතවූ රාත්‍රියත් ගෙන එකොළොස් වන අරුණ ඉක්මවාලීමෙන් නිසගි පචිති වේ.

**112.** අතිරෙකචීවරං.

නො ඉටූ නො විකැපූ ඛොමාදි ජාතිසයට අයත් විකප්පනයට වත් සෑහෙන ප්‍රමාණ ඇති කළ නො කළ චීවර අධික හෙවත් අතිරෙකචීවරයි. තැබීම හෝ පරිභොගය හෝ ධාරණ නම්.

### ස සිවුරු.

ඛොම නම් ගසේ වැහැරින් කළ වස්ත්‍ර උපචාර විසින් ඛොම යි. ක්‍ෘමිකොශවල හුයින් කළ වස්ත්‍ර කොසෙය්‍යයි. කපුරෙදි කප්පාසයි. හණරෙදි සාණයි. ඛොමාදි පස ම හෝ කොටසක් හෝ මුසු කොට වියූ වස්ත්‍ර භඞ්ගයි. එනම් ගසෙක පට්ටාවලින් කැරේයයි ද යෙත්. මිනිස්ලොම් ද ව්‍යාල චණ්ඩසතුන් ගේ ලොම් ද තබා එළුලොම් ආදියෙන් කළ වස්ත්‍ර කම්බලයි. මේ කියැවුණේ සැපවූ ජාතිවශයෙන් සය වැදෑරුම්වූ වස්ත්‍රයි. එනම් වාකයෙන් කළ වස්ත්‍ර නිසා දුකූල සාණයට අනුලොම්. පත්තුණ්ණ, චීන, සොමාරවස්ත්‍ර වාකමයයි. ප්‍රාණිකොශයෙන් නිපදවතැයි ද යෙත්. ඵහිභික්ඛුපබ්බජ්ජාවේ දී පුඤ්ඤිද්ධියෙන් ලැබෙන චීවරත් දෙවියන්ගෙන් ලත් වස්ත්‍රත් ඛොමාදියෙන් එක්වගීයෙක් ම වේ. මේවාත් ස සිවුරට අනුලොම්ය.

### අධිෂ්ඨාන යොග්‍ය නව චීවර.

**"අනුජානාමි භික්ඛවෙ තිචීවරං අධිට්ඨාතුං න විකප්පෙතුං; වස්සිකසාටිකං වස්සානං චාතුමාසං අධිට්ඨාතුං තතො පරං විකප්පෙතුං; නිසීදනං අධිට්ඨාතුං න විකප්පෙතුං; පච්චත්ථරණං අධිට්ඨාතුං න විකප්පෙතුං; කණ්ඩුපටිච්ඡාදිං යාව ආබාධා අධිට්ඨාතුං තතො පරං විකප්පෙතුං; මුඛපුඤ්ඡනචොළකං අධිට්ඨාතුං න විකප්පෙතුං; පරික්ඛාරචොළං අධිට්ඨාතුං න විකප්පෙතුං."**

ත්‍රිචීවරාදි උක්ත නවචීවර සඞ්ඝාටි ආදි නමින් ඉටා පරිභොගකරන්නහු විසින් **'ඉමං සඞ්ඝාටිං අධිට්ඨාමි'** යනාදීන් නම් කියා

ඉටියයුතු. 'ඉමං චීවරං සඞ්ඝාටිං අධිට්ඨාමි' යි හෝ වටියි යෙත්. විකපන්නහු විසින් 'ඉමං චීවරං තුය්හං විකප්පෙමි' යනුවෙන් සාධාරණ චීවර නාමයෙන් විකපිය යුතු. කවරක් නමුදු විකැපීමේ දී 'ඉමං සඞ්ඝාටිං විකප්පෙමි' යනාදීන් විශෙෂ නම් කියා විකැපුව ද නො විකැපේ. අතිරෙක චීවර ම වේ. ඉටන් කටයුතු නවචීවරයේ ම පශ්චිමප්‍රමාණයක් දක්වා නැත. විකැපුමට විෂය වන පහළම ප්‍රමාණය (වියත් $2 \times 1$) අන්තිම ප්‍රමාණයයි ගතහැකිය. නිසීදන කණ්ඩුපටිච්ඡාදන, වස්සිකසාටිකයන් ගේ ප්‍රමාණ දක්වා ඇත්තේ උපරිමසීමාවෙනි. මුඛපුඤ්ඡන පච්චත්ථරණ පරික්ඛාරචොළයන්ගේ උත්කෘෂ්ට පරිච්ඡේදයෙක් නැත. පශ්චිමප්‍රමාණය විකප්පනූපග-ප්‍රමාණ වියයුතු.

**1-3 තිචීවර**-තෙ සිවුරු ඉටන් කරන්නහු විසින් මුල්, කඳ, පත්, සුඹුළු, පල, මල් යන එක්තරා රඳනෙකින් රඳා, කප්තබා ප්‍රමාණයුක්ත වූවක් ම ඉටියයුතුයි. තිචීවරයේ පශ්චිමප්‍රමාණය ඍජුව කී තැනක් සූත්‍රයෙහි නැතත්, පරිමණ්ඩලසුපටිච්ඡන්නාදි ශික්ෂා සපුරා හැඳ පෙරවිය හැකිවන සේ අටුවාවන්හි එක්තරා ප්‍රමාණයක් දක්වා ඇත. තෙසිවුරේ ම දිග මිටිපස්රියනි. (මුට්ඨිපඤ්චක යන්න මිටි රියන්පස යයි ද, දිගරියන් සතර මැන පස්වැන්න මිටිරියනින් ගතමනායයි ද, දෙපරිද්දෙකින් තෝරත්.) සඟළ උතුරුසඟ දෙක උසනින් මිටිතුන් රියනි. අඳනය දෙරියන් සමාර හෝ දෙරියනි. උපරිම ප්‍රමාණය සුගත් සිවුරට (වියත් $9 \times 6$) උනු වියයුතුය. අනත ඣය දර්ශනයෙන් මධ්‍යයෙහි පොහෝනා රිසියෙන පමණ ගත හැකි යයි ද, මෙ කී පමණින් අඩුවැඩි සිවුරු පිරිකර සොළු නමින් ඉටිය යුතුයයි ද, එහි ත්‍රිචීවරාධිෂ්ඨාන නො පිහිටායයි ද ප්‍රකාශිත ව ඇත.

නවසඟළක් ඉටන්නහු විසින් ඉටාතුබූ පරණසඟළ ගෙන **'ඉමං සඞ්ඝාටිං පච්චුද්ධරාමි'** යි පසුදිරිය යුතු. **"පච්චුද්ධරාමීති අධිට්ඨානං උක්ඛිපාමි පරිච්චජාමී'ති අත්ථො"** යනු විමති විනොදනියි. ඉක්බිති නවසඟළ ගෙන **'ඉමං සඞ්ඝාටිං අධිට්ඨාමි'** යි සිතින් සිතමින් ශරීරාවයවයෙකින් පැහැසියයුතු. මේ කයින් ඉටන අයුරු යි. වාග්භෙද කොට ද ඉටියහැකියි. අත්පසැ (අත්පස නම් දෙරියන් සමාරයි. දෙළොස් රියනයයි ද මතයෙක් වේ.) වී නම් **'ඉමං'**යි කිව යුතු. අසම්මුඛයෙහි එදා ගොස් පෙරළා පැමිණිය හැකි තරම් දුරු වූවක් නම් සිවුර තැබූ තැන සලකා **'එතං සඞ්ඝාටිං අධිට්ඨාමි'** යි කියා ඉටියයුතු. කායවාචා අධිට්ඨානය ද මෙහි ම සඞ්ගෘහිතයි. අනික් දෙසිවුර ද මෙනයින් ඉටාගතයුතු.

පිරිකරසොළු විසින් ඉටාතුබූ පිළියෙන් සිවුරක් කොට සඞ්ඝාටි ආදි නාමයෙන් ඉටතොත් පසුදුරු ම ඉටියයුතු. පිරිකරසොළු විසින් ම



නම් නැවත ඉටීම අනාවශ්‍යකයි. තුන් සිවුරත් පරිභොග පහසුව පිණිස පිරිකර සොළු නමින් ද ඉටති. දෙවැනි කඨින සිඛය තුන් සිවුරු අධිඨන් ඇත්තහු හෙවත්-තෙචීවරිකයා පිළිබඳවයි. තෙචීවරික ධුතාඞ්ගධාරියා විසින් පංසුකූල විසින් ලත් පිළිය දසදිනතුළ මසා රඳා පොරවන්නට නො හැකි වතොත් පිරිකරසොළු විසින් ඉටා දසදින ඉක්මවිය යුතු. නැතහොත්-නිසගි වේ.

**4 වස්සිකසාටිකා**- (දිග සු: වි: 6, සරස $2\frac{1}{2}$) නැම සඳහා අනුදත් බැවින් නො කපා වණ්ණභෙදය වනු පිණිස රඳා, කප් තබා ඉටිය හැකියි. එකොකැ විනා දෙකොකැ අධිඨන් නො පිහිටයි.

**"වස්සිකසාටිකා වස්සානමාසාතික්කමෙනා'පි කණ්ඩුපටිච්ඡාදි ආබාධවූපසමෙනා'පි අධිට්ඨානං විජහති"** යන මාතිකාට්ඨකථා වැකියෙන් වැසිසළු කස්පිළිසන් දෙකේ අධිෂ්ඨානය තත් කාලාතික්‍රමයෙන් ඉබේ නැති වේ යයි කියැවේ. අධිෂ්ඨිතචීවරයක් ම පච්චුද්ධරණය කළයුතු නිසා **'තතො පරං පච්චුද්ධරිත්වා විකප්පෙතබ්බා'** යනුවෙන් කීයේ වැසිසළුබවින් ඉවත්කිරීම මිස පච්චුද්ධරණ විනයකර්මය නො වේ. අධිඨන් කොට තැබුවක් බැවින් වස්සාරමස අවසන්හි ඉටන් සිඳී ගිය ද නිසගි නොවේ. හෙමන්තයේත් දසාහපරිහාරය ලැබෙන බැවින් දසදින තුළ විකැපිය යුතු. ආබාධව්‍යුපසමයෙන් කස්පිළිසනේ ද ඉටන් සිඳේ. ඉක්බිති දසදින තුළ විකැපියයුතු. මේ එක් මතයෙකි.

ඉබේ ඉටන් සිදෙන බව විනයට්ඨකථාවේ නො කියැවේ. පච්චුද්ධාර ශබ්දය එනම් විනයකර්මවිෂයෙහි ම යෙදේ. මාතිකාට්ඨකථාවේ **'අධිට්ඨානං විජහති'** යන්නෙන් ද පච්චුද්ධරණ වශයෙන් ම සිදුවන විජහනය කියැවිණ. අධිට්ඨානවිජහනාඞ්ග ප්‍රකාශ වන තන්හි කාලාතික්‍රමය අඞ්ගයක් සේ ගෙන නැත. එහෙයින් පසුදුරන තෙක් ඉටන් ඇත. ඉල් පුනුපෝදා පුසුදිරියයුතු. පසුදාවන තෙක් තිබුණ හොත් විකප්පනක්ඛෙත්තයෙහි ඉටන් තිබීමෙන් දුකුළා වේ. මෙහෙයින් පුනුපෝදා පසුදුරා පැළවියදා විකැපියයුතු. මේ තවත් මතයෙකි.

කඨිනමාසයතුළ ලැබුණු වස්ත්‍ර අතිරෙකචීවර ව සිටි බැවින් කඨිනමාසාතික්‍රමයෙන් නිසගි වන්නා සේ මෙය ද වස්සානාතික්‍රමයෙන් නිසගි වේ. එහෙයින් පුණ්ණමියෙහි පසුදුරා පසුදා විකප්පනය කටයුතුය. පුණ්ණමියෙහි පසුදුරා එදම විකප්පනය කටයුතුය නැතහොත්-නිසගි වේයයි ද මතයෙක් වේ.

**5 නිසීදන**- **'නිසීදන්ති එත්ථා'ති නිසීදනං'** කායගුත්ති චීවරගුත්ති සෙනාසනගුත්ති සඳහා අතුරා හිඳින්නට අනුදතවදාළ සිවුරි. (සු: වි: $2 \times 1\frac{1}{3}$ දසාව වියතෙකි.) නිසීදනයෙන් වෙන් ව සාර මසක් නො විසියයුතු. මෙය නිසීදන සන්ථතයෙන් බාහිර චීවරයෙකි.

තුන්සිවුර විකප්පනය කොට පරිභොග කළ හැකියයි ද මතයෙක් වේ. එසේ වුවොත් සෙසු සිවුරුවලත් තුන්සිවුරේත් වෙනසෙක් නැත. අන් තුන්සිවුරක් ඉටනු රිසි ඇත්තහු විසින් පූර්වාධිෂ්ඨිත ත්‍රිචීවරය පච්චුද්ධරණය කොට විකප්පනය කළ හැකියි. විප්පවාසයෙන් මිදෙනු පිණිස කාලපරිච්ඡින්න කොට විකප්පනය කිරීම සුදුසුයයි නො සිතේ. මෙය ගැන ද ආචාර්‍යවාද කිහිපයෙක් වේ.

## සුගත්වියත.

සුගත්වියතේ ප්‍රමාණය නිශ්චය කිරීම අතිශයින් දුෂ්කර වේ. මානවෙසෙසෙකැයි ද බුදුරදුන්ගේ ම වියතයයි ද ඒ ගැන මත දෙකෙක් වේ. දෙවැන්න වඩා මැනැවි. සුගත්වියත මැදුම්මිනිස් වියතින් තෙවියතැයි **කුටිකාරසික්ඛා අටුවාහි** කියැවිණ. මැදුම්මිනිස් වියත යනු ද වඩුවියත යනු ද එකෙක්මය. සුගත් අඟල්අට වඩුරියනයයි **සාරත්ථදීපනී විනයත්ථමඤ්ජූසා** ආදියෙහි ද, මිටිරියනයයි **සුත්තසඞ්ගහට්ඨකථා සුත්තනිපාතට්ඨකථා** ආදියෙහි ද ප්‍රකාශිත වඇත. මෙහි ද මතභෙදයෙක් පැනේ. පියෙවිඅඟල වඩුඅඟල යන දෙකෝ වෙනසෙක් කුදුසික්ටීකාවේ නො කියැවේ. එහෙත් "**වඩ්ඪකීහත්ථං ඉදානි පකතිහත්ථෙන දියඩ්ඪහත්ථං**" යනු විනයාලඞ්කාරටීකාසි. "**තං පන [පාකතික මුට්ඨිරතනං] වඩ්ඪකීනං විදත්ථි මතනං**" යන විනිශ්චයටීකා වැකියෙන් පැනෙන්නේ වඩු රියනින් පහෙන් තුන් කොටස පියෙවි රියන බවයි.

වඩුරියන ගැන ද නිශ්චිත තීරණයෙක් නැත. එය මෙකල රියනින් දෙරියනෙකැයි ද, අඟල් අටවිස්සෙකැයි ද, සත් විස්සෙකැයි ද, සූ විස්සෙකැයි ද නානාමත ඇත්තකි.

සුගත්වියතේ පමණ නිශ්චිත වුවහොත් බුද්ධකායයේ පමණත් නිශ්චිත වූවා වෙයි. බුදුහු සිය වියතින් අටවියත් වෙතියි සලකන හෙයිනි. සුගත්වියත මැදුම්මිනිස් වියතින් තෙගුණයයි කීම, සුගත දෙහය මැදුම්මිනිසකුගේ දෙහය මෙන් තෙගුණයක් උසයයි කීමට සමානයි. සුගත්වියත ඒසා විශාල වූවක් නො වන බව නිසීදන ශික්ෂාවෙන් දත හැකිය. "**භගවතා භික්ඛූනං අතිඛුද්දකං නිසීදනං අනුඤ්ඤාතං**" යනු උදායිහාමුදුරුවන් කීයේ සුගත්වියතින් දෙවියත් දික්වූ ද එකහමාරක් පළලවූ ද නිසීදනය ගැනයි. අටුවා මතයට අනුව වඩුරියනින් මෙහි ප්‍රමාණය දිගින් තෙරියනි. පළලින් දෙරියන්සාඟුලෙකි. විනයාලඞ්කාරමතයට අනුව මෙකල මිනිස් රියනින් පමණ සෙවීමට නැවත එකසමාරින් ගුණකළයුතුය. මෙවැනි නිසීදනයෙක හිඳගත නො හෙන තරම් සථූලතාවක් කවරකුට නමුදු ඇතිවිය නො හැකිය. '**අතිඛුද්දකං**' යන විශෙෂණය සාර්ථවීමට නම් සුගත්වියත වඩුවියතින් තෙවියත් නොවූවමනාය.



සුගත්වියතේ පමණ සෙවීමේ දී සලකාබැලිය යුතු කරුණෙක් වෙයි. එනම්, කුටිකාර ශික්ෂාවයි. කුටියේ උපරිම ප්‍රමාණය සුගත් වියත් 12 × 7 කි. අටුවාමතයට අනුව පශ්චිම ප්‍රමාණය පළලින් සිවු රියනෙකි. නොහොත්-නවවියත් හැඳක් හරවාගත හැකි වන සේ පමණ වියයුතුය. මෙයින් හෙළිවන්නේ බුදුරදුන්ගේ සත්වියත ප්‍රකෘතිමනුෂ්‍යයකුගේ නවවියතට අධික වූවක් බවයි. නන්දතෙරණුවෝ බුදුනට වඩා සතරඟුලෙකින් මිටියහ. මහසුප්තෙරණුවෝ ද එබඳු වෙති. මේ දෙතෙරණුවෝ බුදුන් මෙන් දොළොස් රියන් අටළොස් රියන් උසඇත්තාහයි සලකමුද? නවවියත් හැඳක් හරවා ගැනීමට තරම් කුටියේ පළලඇතිවියයුතුය යන අටුවාටීකා මතය චින්තනීය වෙයි.

ස්‍යාමදෙශීය පඬිවරයකු විසින් රචිත **සුගතවිදත්ථිවිධාන** නම් පොතේ සුගත්වියත පිළිබඳ මහගුවිමර්ශනයෙක් දක්නාලැබේ. සුගත දෙහයේප්‍රමාණය සියම්රටේ ව්‍යවහාර වන වඩු අඟුලින් 129 කැයි එහි මතය වේ. (මේ අඟල දැනට භාවිතයෙහි එන අඩිකෝදුවේ අඟල දඅනෙකක් ද යනු කීම දුෂ්කරයි.) මධ්‍යම පුරුෂයකු මෙන් තෙගුණයෙකින් බුදුහු උස නො වෙතියි උදාහරණයෙන් සිද්ධ කෙරෙමින් කුටිකාරාදි ශික්ෂා ගැන ද එහි කරුණු දක්වා ඇත. බුදුහු දොළොස් රියන් අටළොස් රියන් වෙතියි යනු ඇතැම්විට බුද්ධානුභාවයෙන් යුක්තව සිටිනාසඳ පෙනෙන පෙනුමක් ගැන කී කථාවක් විය හැකියි.

**113.** **නිස්සග්ගියං.**

සඞ්ඝ-ගණ-පුද්ගලයන් වෙත පැමිණ "**ඉදං (ඉමානි) මෙ භන්තෙ චීවරං දසාහාතික්කන්තං නිස්සග්ගියං ඉමා'හං ආයස්මතො නිස්සජ්ජාමි**" යි කවර බසෙකින් නමුදු නිසගිසිවුර නිසජා ඇවැත් දෙසියයුතු. එය ලද භික්ෂුව "**ඉමං චීවරං ආයස්මතො දම්මි**" යි කියා ආපසු දියයුතු. මෙය විනයකර්ම මාත්‍රයෙකි.

## සප්තදශකාරය.

4. **පඤ්ඤත්ති**-'දසා'හපරමං' යනු අනුප්‍රඥප්තියි. පශ්චිම බොධියේ අජාසත්රජුසමයේ කඨිනය අනුදත් බවත්, 'නිට්ඨිත චීවරස්මිං උබ්භතස්මිං කඨිනෙ' යන්න ප්‍රඥප්ති අනුප්‍රඥප්ති ද්වයට ම ඇතුළත් නො වන බැවින් කඨිනය අනුදැනීමෙන් පසු වහරන්නට වූ බවත් **වජ්‍රබුද්ධිමතය** යි.

6. **ආපත්ති**-නිසගි සිවුර නිස්සජ්ජනය නො කොට මුඳ හදින වරක් පාසා දුකුළායි. එය පරිභොග කරන අනෙක් භික්ෂුවකට

ඇවැත් නො වේ. දසාහ අනතික්කන්තයෙහි අතික්කන්තයයි හෝ විමති ඇති ව හෝ පරිභොග කළ ද දුකුළායි.

7. **අනාපත්ති**-අනොතාදසා'හං අධිට්ඨිතෙ, විකප්පිතෙ, විස්සජ්ජිතෙ, (-අනෙකකුට දීම.) නට්ඨෙ (-අනුන්ගේ බඩු සමග තිබී චොරාදිහරණයෙන් නැතිවීම), විනට්ඨෙ (-වේ ආදීන් කෑම,) දඩ්ඪෙ, අච්ඡින්නෙ (-සොරුන් පැහැරගැනීම,) විස්සාසගාහිතෙ, උම්මත්තකාදීනඤ්ච.

8. **විපත්ති**-පරිජි සඟවෙසෙස් තබා අන් සියල්ල ආචාර විපත්තියි.

9. **අඞ්ග**-ජාතිප්පමාණ සම්පන්නස්ස චීවරස්ස අත්තනො සන්තකතා, ගණනූපගතා (-අතට නො ලැබුණත් දින පිරීම සිදුවේ.) ඡින්නපලිබොධභාවො, අතිරෙකචීවරතා, දසාහාතික්කමො.

10. **සමුට්ඨාන**-කායවාචාවන් ගෙන් කටයුතු ඉටුම් විකැපුම් නො කිරීමෙන් කායවාචාවෙන් ද, සිත ඇතිව ම නො කිරීමෙන් කායවාචාචිත්තයෙන් ද ඇවැත් වේ.

1. **කිරියා**-ඉටුම් විකැපුම් නො කිරීමෙන් ඇවැත් වන බැවින් අක්‍රියයි.

12. **සඤ්ඤා**-නො දැන ද පත්වන බැවින් නොසඤ්ඤාවිමොක්ඛයි.

—|○|—

## 2. දුතිය කඨින (උද්දෙසිත) සික්ඛා.

**114 නිට්ඨිතචීවරස්මිං පන භික්ඛුනා.**

'භික්ඛුනා' යනු ස්වාම්‍යාර්ථයෙහි තතියා සේ ගෙන 'භික්ඛුනො චීවරස්මිං නිට්ඨිතෙ' යනුවෙන් අර්ථ ගතයුතු. භික්ෂුවගේ චීවර පලිබොධය ද ආවාසපලිබොධය ද සිඳුණු කල්හියි.

**115. තිචීවරෙන.**

"**ඉමං සඞ්ඝාටිං අධිට්ඨාමි, ඉමං උත්තරාසඞ්ගං අධිට්ඨාමි, ඉමං අන්තරවාසකං අධිට්ඨාමි**" යි ඉටූ තෙසිවුරැයි සමූදයා ගේ එකදෙශය ද සමූදය වන්නා සේ ඉටූ තුන්සිවුරෙන් එකොකුදු තිචීවර නම් වේ. ඇතැම් තැන නො ඉටූ සිවුරු ද තිචීවර සඳින් කියැවේ.

**115. විප්පවසෙය්‍ය**

කාය ලගන නුවූවත් දෙරියන් වියත් අත්පසැ කවර ඉරියව්වෙකින් සිටිය ද විප්පවාස නො වේ. සාමාන්‍ය විප්පවාසලක්ෂණ දක්වා විශෙෂ දක්වන්නට ග්‍රාමාදි පසළොස් ඔකාස කෙනෙක් ප්‍රකාශිත වෙති.



ඇතුළුගම, උද්දොසිතාදි ඈකාර රහිත නිවෙස්න, සමුද්‍රතීරාදියෙහි කැරෙන බඩුහල්, දික්පහ, සඳලු සහිත පහ, නැව, සතරන් එලාරාම, ජඞ්ඝසත්‍ථ සකටසත්‍ථ, කුඹුර, කමත, රුක්මුල, අබවස, ආවාස යනු අවකාශස්ථානයි.

ගාම නම් එකකුටිකාදි ඇතුළුගමයි. නිගම නගර ද එයට ඇතුළුනි. එක් රජකුට හොජකයකුට අයත් ගමෙක් පවුරුපිරි ආදියෙන් පරික්ෂිප්ත වේ නම්, එබඳු ගමැ සිවුරු තබා ගම්තුළ කවර තැනෙක තමුදු අරුණ නඟාලිය හැකියි. අපරික්ෂිප්ත වේ නම් සිවුරු තැබූ ගෙහි හෝ ගේ අත්පසැ හෝ විසිය යුතු. ඇතුළුගම්හි සියල්ල ගාම යන්නට සඞ්ග්‍රහවන බැවින් සෙසු තුදුස් අවකාශස්ථානයෝ ගමින් බැහැර වූවෝ වෙති. එකකුලායත්ත වුවත් නානාකුලායත්ත වුවත් අපරික්ෂිප්ත නම් වෙනසෙක් නැත, පරික්ෂිප්තයේ වෙනස ඇත.

පරික්ඛිත්ත **අපරික්ඛිත්ත** විසින් එකූපචාර නානූපචාර භාවය සාරත්‍ථදීපනී විමතිවිනොදනී දෙක්හි දක්වා ඇත. සත්‍ථ-රුක්ඛමූල-අජ්ඣොකාසයන් තබා සෙස්සෙහි පරික්ඛෙප අපරික්ඛෙප විසින් එකූපචාර නානූපචාරතාව **වජිරබුද්ධියෙහි** කියැවිණ. ගාම-නිවෙසන - උද්දොසිත - ඛෙත්ත - ඛල - ආරාම - විහාරයන් පිළිබඳ ව පරික්ඛිත්ත වීමෙන් එකූපචාරතාවත්, අපරික්ඛිත්ත වීමෙන් නානූපචාරතාවත්; අබවස තබා සෙස්සෙහි එකකුලායත්ත නානාකුලායත්ත විසින් එකූපචාර නානූපචාරතාවත් ගැනෙතියි **විනයත්‍ථමඤ්ජූසාවෙහි** එයි. අබවස සත්තබ්භන්තර විසිනි.

"ප්‍රාකාර පරිඛාදීන් පරික්ෂිප්ත වැ එකකුලස්වාමික වී නම් එකූපචාර යැ, අපරික්ෂිප්ත වැ එකකුලායත්ත තමුදු පරික්ෂිප්ත වැ නානාකුලායත්ත වී තමුදු නානූපචාරයි' යනු **කඞ්ඛාවිතරණී.**

ද්වාර-වීථි-සරයන්හි වසන්නහු විසින් සුපිළිසත් ව සහසෙය්‍යාදිය නො වන සේ විසිය යුතු බව කියා ඇත. උදකුක්ඛෙප සීමහි ද විප්පවාසය ලැබෙතියි යෙත්.

**117. අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා.**

තුන් සිවුර ම පරිභොග කළ නො හෙන ගිලන් මහණහට ඉන් වෙන් ව විසුමට ඤත්තිදුතිය කම්වැකි කියා දෙනු ලබන සම්මුතිය භික්ඛුසම්මුති නම් ආබාධය සුව වූ පසු සිවුර ඇති තැනට යා යුතු. නැතහොත්-එහි ම සිට පසුදිරිය යුතු. එවිට අසිරා සිවුරෙක් වේ.

නිසගිසිවුර ඇත තිබුණත් නිසජන්නට ද පෙරළා දෙන්නට ද හැකියි. **'ඉදං මෙ භන්තෙ චීවරං රත්තිවිප්පවුත්ථං අඤ්ඤත්‍ර භික්ඛුසම්මුතියා නිස්සග්ගියං, ඉමා'හං ආයස්මතො නිස්සජ්ජාමි'** යි නිසජා ඇවැත් දෙසිය යුතු. තෙසිවුරෙන් යමෙකින් වෙන් ව ගම් වැදුමට ගිලානබව, වස්සිකසාටකය, නදීපාරගමන, අග්ගළගුත්ති විහාර, අත්ථතකඨින, යන කරුණු පසක් චීවරක්ඛන්ධකයෙහි පෙන්වා ඇත. කවර කරුණෙකින් නමුදු ගුප්තවිහාරයෙහිම තබා යායුතු නිසා, කඨිනය අනුදැනීමට පෙර භික්ෂූන් වෙත සිවුරු තබා ගම් වැදුම් ලෙශයෙන් චාරිකාවෙහි යෙදුණු මහණුන් ඇරබ මේ සිඛය දෙසූ.

## සප්තදශාකාරය.

7. **අනාපත්ති**-අරුණින් පෙර පසුදුළහුට ද, විස්සජ්ජනාදිය කළහුට ද, සම්මුති ලද්දහුට ද ඇවැත් නො වේ.

9. **අඞ්ග**-අධිට්ඨිතචීවරතා, අනත්ථතකඨිනතා, අලද්ධසම්මුතිකතා, රත්තිවිප්පවාසො යි අඞ්ග සතරෙකි. බද්ධසීමාවේ සිවුර තබා ඉන් බැහැර ව අරුණ නභාලීමත්, අබද්ධසීමා විෂයෙහි නම් යටකී ග්‍රාමාදියෙන් දුරු ව සිට අරුණ නභාලීමත් විප්පවාසය නම් වේ.

11. **සමුට්ඨාන**-කායවාචාචිත්ගෙන් කළයුතු පච්චුද්ධරණය නො කිරීමෙන් කායවාචා සමුට්ඨානයෙන් නැගේ. අධිෂ්ඨාන් විකප්පුම් සේ පච්චුද්ධරණය ද කයින් හෝ වචනයෙන් හෝ කළයුතුබව පැනේ.

---

## 3. තතිය කඨින සික්ඛා.

### 118. අකාලචීවරං.

(නිට්ඨිතචීවරස්මිං යනු උද්දෙසිතයේ පරිදියි.) **"අනත්ථතෙ කඨිනෙ එකාදසමාසෙ උප්පන්නං, අත්ථතෙ කඨිනෙ සත්තමාසෙ උප්පන්නං, කාලෙ'පි ආදිස්ස දින්නං"**

**"කාලෙ'පි ආදිස්ස දින්නන්ති සඞ්ඝස්ස වා ඉදං අකාලචීවරන්ති උද්දිසිත්වා දින්නං එකපුග්ගලස්ස වා ඉදං තුය්හං දම්මී'ති දින්නං"** යනු පෙළ හා අටුවායි.

කඨිනය නො අතුළේ නම් වර්ෂාතුවේ අවසාන මාසය ද, අතුළේ නම් හෙමන්තයත් ඇතුළුව පස්මස ද චීවර කාලයයි. එයින් බැහැරවූ පිටිසමයේ ලැබුණු වස්ත්‍ර අකාල චීවරයි. **'කාලෙපි ආදිස්ස දින්නං'** යනුවෙන් කියැවෙනුයේ චීවරකාලය තුළ වුවත්



අකාල චීවර නමින් සඞ්ඝයාට හෝ පුද්ගලයාට හෝ ලැබුණු චීවර ද අකාලචීවර වන බවයි. පඨම අනියතයෙහි **'සොතස්ස රහො'** යන්න මෙන් මෙය ද ප්‍රාසංගිකවශයෙන් කියැවිණ. එහි වෙනස නම් කාලයෙහි වුවත් අකාලචීවර නමින් සඞ්ඝයාට ලැබුණු වස්ත්‍ර, කඨිනය අතුළවුන් පමණක් නො ව සම්මුඛීභූත සියල්ලන් විසින් බෙදා ගතයුතු වීමයි. බෙදූලත් වස්ත්‍ර පච්චාසාචීවර ඇත්නම් මාසපරමය, නැතිනම් දසාහපරමය යනු චීවරකාලයට නො වේ, පිටිසමයට යි.

චීවරකාලයෙන් පිටත් එකොළොස් මස තුළ හෝ සත්මසතුළ හෝ උපන් චීවර වුත්ථවස්සයන් පමණක් නො ව හමුවූ සියල්ලන් විසින් බෙදා ගතයුතු වන බැවින් අකාලචීවරයයි යෙනි. ප්‍රධානවශයෙන් මෙහි මෙය ම ගැනේ. චීවරකාලයෙහි 'සඞ්ඝස්ස අකාලචීවරං දම්මි'' යි නො කියා 'සඞ්ඝස්ස දම්මි' යි කියා දුන් වස්ත්‍ර කෙළින් අතුළවුන් පමණක් බෙදාගතයුතු බැවින් කාලචීවර නම් වේ. 'චීවරං උප්පජ්ජෙය්‍ය' යි නොකියා 'අකාලචීවරං උප්පජ්ජෙය්‍ය' යි සවිශෙෂණ කොට කීමෙන් කෙළින් උදුළ ද කාලචීවරයෙක් ඇතැයි හැගේ. එය නම් අන්තිම වර්ෂා මාසයේ උපන්වස්ත්‍රයෙකි. 'එකපුග්ගලස්ස ඉදං' යන ආදිය කීයේ 'ආදිස්ස දින්නං' යන වචනසාමර්ථ්‍යයෙන් ප්‍රාසතාවිකබැවින් මිස පෞද්ගලික ව ලත්දෙය සෙස්සන් හා බෙදාගතයුතු නිසා නො වේ.

### 119. උප්පජ්ජෙය්‍ය.

කිහිප ආකාරයෙකින් චීවර ලදහැකි වෙයි. සඞ්ඝයාට හෝ සුත්තන්තිකාදි ගණයාට හෝ ලැබුණු වස්ත්‍රවලින් තමාගේ කොටස වශයෙන් ලැබිය හැකිය. නෑ-මිතුරන්ගෙන් ලැබිය හැකියි. පංසුකූල වශයෙන් හෝ කපුනූල් ආදි තම කැපධනය දීමෙන් හෝ ලැබිය හැකියි.

**"අට්ඨිමා භික්ඛවෙ මාතිකා චීවරස්ස උප්පාදාය, සීමාය දෙති, කතිකාය දෙති, භික්ඛාපඤ්ඤත්තියා දෙති, සඞ්ඝස්ස දෙති, ආදිස්ස දෙති, පුග්ගලස්ස දෙති'** යන මාතෘකාවන් අතුරෙන් කවරෙකින් නමුත් අකාලචීවර ලක්ෂණයෙන් ලත් චීවර සඳහා 'අකාලචීවරං උප්පජ්ජෙය්‍ය' යනු කියනලදි. මෙහි විස්තර චීවරක්ඛන්ධකයෙහි වේ.

### 120 ඛිප්පමෙ'ව කාරෙතබ්බං.

ලැබුණුවස්ත්‍රය සිවුරකට ප්‍රමාණවත් වේ නම්, ප්‍රථම කඨින සිඛයට අනුව දසදින තුළ ම කොට නිම කළ යුතුය. අධිෂ්ඨානට පොහෝනා සිවුරක් කිරීමට ප්‍රමාණවත් නො වේ නම් නො ඉටා

නො විකපා මසක් තබා ගත හැකිසි. එසේ තබාගත හැක්කේ සඞ්ඝ-ගණ-ඤාති-මිත්‍රාදීන් ගෙන් අඩුව පුරා ගැනුමට වස්ත්‍රයක් ලැබේයයි බලාපොරොත්තුවක් ඇතහොත් පමණි.

**121. තතො චෙ උත්තරිං.**

පච්චාසා ඇත ද මසට වඩා තැබිය නො හැකිසි. 31 වන අරුණ නැගුමෙන් නිසගි වේ. **"ඉදං මෙ භන්තෙ අකාලචීවරං මාසාතික්කන්තං නිස්සග්ගියං ඉමා'හං ආයස්මතො නිස්සජ්ජාමි"** යි නිසජා ඇවැත් දෙසිය යුතු.

මූලචීවරය උපන් දිනයෙන් පසු විසිදිනක් තුළ උපන් පච්චාසා චීවරය, මූලචීවරය මසක් තැබීමට ඉඩ නො දේ. පච්චාසාචීවරයට අයත් දසදින ම පරිච්ඡෙද කරයි. (මූලචීවරය උපන්දාට පසුදා පච්චාසාව ලැබිණි නම් මූලචීවරයටත් කාලය එදා සිට දස දිනයි.) විසිවැනි දිනයෙන් පසු 21-22 ආදි දිනවල පච්චාසාව ලැබිණි නම් මූලචීවරයට බල වැඩියි. පච්චාසාවට දසාහකාලය නො ලැබේ. නවාහාදි විසින් කාලය වේ. මූලචීවරය හා එක් කොට මසා නො නිමිණි නම් පච්චාසාවට දසාහපරමතාව ලැබේ. පච්චාසාව මූලචීවරය හා නො ගැළපේ නම් අන් පච්චාසාවක් ලබාගෙන මාසය තුළ කළයුතු ප්‍රථමයෙන් ලැබුණු විසභාගපච්චාසාව පිරිකරසොළු නමින් ඉටිය යුතු. මූලචීවරය ථූල ද පච්චාසාව සිහිනු ද වේ නම් මූලචීවරය පිරිකරසොළු නමින් ඉටා පච්චාසාචීවරය මූලචීවරය කොට ගෙන මසක් තබාගත හැකිසි, අන් පච්චසාවක් ඇත හොත්. පච්චාසාව ගැන තිබුණ අපෙක්ෂාව සිඳිණි නම් දස දින ඉක්මවා සිටි මූලචීවරය එදින ම ඉටියයුතු.

**122. සතියා'සි පච්චාසාය.**

සඞ්ඝ-ගණාදීන් ගෙන් වස්ත්‍රයෙක් ලැබේයයි බලාපොරොත්තු-වක් ඇත ද, මසකට වඩා නො ඉටා නො විකපා තැබිය නො හැකිය. සිවුරට පොහෝනා තරමේ මූලචීවරයක් ලදහොත් පච්චා-සාවක් නිසා තබාගත නො හැකිසි. පච්චාසාව ලැබුණ ද නො ලැබුණ ද ඒ ගැන ආශාව සිඳෙන තෙක් මුලින් ලැබුණු වස්ත්‍රය මාසයක් තබාගත හැකිය. පඨමකඨින ශික්ෂාවෙන් දස දිනක් කල් ලැබිණ. පච්චාසාවක් ඇතොත් මසක් මුළුල්ලෙහි තබාගැනීමට මෙසින් ඉඩලැබිණ. පඨමකඨිනයට වඩා අඞ්ගවල වෙනස මාසා-තික්කන්ත භාවයයි.

——:o:——



# 4. පුරාණ චීවර සික්ඛා.

**123. අඤ්ඤාතිකාය.**

පියාගේ ද, පියාගේ මවගේ ද, පියාගේ සහෝදර සහෝදරියන් ගේ ද; මවගේ ද, මවගේ පියාගේ ද, මවගේ සහෝදර සහෝදරියන් ගේ ද, සත්වැන්නා තෙක් කවුරුත් හා අසම්බන්ධ වූවා අඤ්ඤා-තිකාව යි.

**124. පුරාණචීවරං.**

රඳු කප් තබා වරක් හැඳි පෙරෙවිය ද, කායික පරිභොග විසින් උරමත හිසමත තබනලද්ද ද, බිමෙහි හත කොට ගන්නාලද්ද ද, පුරාණචීවර වේ. මේ චීවර සඳින් හැඳීමට පෙරවීමට ගන්නා චීවර ම ප්‍රකාශිත වේ. (රඳු කප් තැබූ චීවරයයි කී බැවින් කප් නො තබන ලද්ද පවිති නො කෙරේයයි මතයෙක් වේ. එහෙත් එය විනයවිධි දැක්වීමට කියැවිණැයි ගැන්ම මැනැවි.)

**125. ධොවාපෙය්‍ය.**

'සෝදව'යි වදතින් කියුව ද, අදහස තේරුම් යන සේ කාය-විකාරයක් කොට අත්හි තැබුව ද, දෙළොස්රියන් උවසරතුළ සිට අහසට දැමුව ද, අනෙකකු අත යැවූව ද, ඇය සේදුවහොත් භික්ෂුවට ඇවැත් වේ. රැඳවීම ඇපිළීම (-මිටින් දඬුවෙන් ගැසීම) දෙක්හි ද එසේය.

5. **ආණත්ති**-සාණත්තිකයි. ඇණවුම්ලද මෙහෙණගේ ලිප් බැඳීම ආදි සියලු ප්‍රයොගයන්හි භික්ෂුවට දුකුළායි. දෙවා හෝ රඳු හෝ කොළවා හෝ අවසන්හි පචිතියි. ධොවනාදි ත්‍රය ම කරවන විට (එකෙක තෙවරක් නිසජ්ම නො වන හෙයින්) පළමු ක්‍රියාවෙන් නිසගි පචිති ද සෙස්සෙන් දුකුළා ද වේ.

6. **ආපත්ති**-නො නිසජා පරිභොග කරන්නහුට ද, අනෙකකු සතු පුරාණචීවරයක් හෝ තමාගේ ද මෙරමාගේ ද නිසිදන පච්චත්ථරණයක් හෝ දෙවවන්නහුට ද දුකුළායි.

7. **අනාපත්ති**-නෑ මෙහෙණගේ යෙහෙළියක් දෙවා ද, නො කියා දෙවා ද, අපරිභුත්තචීවර හෝ වහන්කඩු ඈ අන් පිරිකර හෝ දෙවා ද, ඇවැත් නො වේ. දෙළොස් රියන් උපචාරයෙන් පිටත සිට කායවාග්විකාර කොට අණවන්නහුට ද ඇවැත් නො වේ.

9. **අඞ්ග**-පරණසිවුරක් බව, උපචාරයෙහි සිට නො නෑ මෙහෙණ කට ඇණවීම, ධොවනාදියයි අඞ්ගත්‍රයෙකි. අචිත්තකයි.

——

# 7. තතුත්තරි සික්ඛා.

**132. අභිහට්ඨුං.**

ගැනීමට කැමැති කරවන්නේ ද හෙවත්-නිමන්ත්‍රණය කරන්නේ ද යනු අර්ථයි. පෙරකිරිය සේ ගතහොත් 'එළවා පවරන්නේ ද' යනු අර්ථයි. කයින් වස්ත්‍ර ගෙනවුත් පාමුල තබා කැමැති තාක් ගන්නේයයි කීම **කායාභිහාරයයි**. අපගේ වස්ත්‍ර බොහෝය, එයින් කැමැති තාක් ගන්නේයයි පැවරීම **වාචාභිහාරයයි.**

**133. සන්තරුත්තරපරමං.**

අසිඳුනාලද සිවුරු ඇති තෙචීවරිකයා විසින් හඳනා පොරෝනා පමණක් ගතයුතු. පියෙවියෙන් (සාසඞ්කසිබ හෙයින් හෝ අවිප්ප-වාස සම්මුති හෙයින් හෝ තෙවැත්තක් නො ලත් හෙයින් හෝ අතුල කෙළින් ඇති හෙයින් හෝ) උත්තරාසඞ්ගය පමණක් පොරවන්නහු විසින් එපමණ ගතයුතු.

තෙචීවරිකයාසි මෙහි සටහන් වූයේ විනයතෙචීවරික ධුතඞ්ග-තෙචීවරිකයන් සඳහා නොව අසිඳුනා විට තුන් සිවුරක් තිබුණ බව දැක්වීම සඳහා බවත්, අන් තැනෙක වැඩිපුර තම සිවුරු තිබුණ ද, නො ලද හැකි බැවින් ඔවුන් විසිනුදු ඉල්ලාගත හැකි බවත්, **සාරත්ථදීපනිමතයයි**. **'තෙචීවරිකා'** යන මෙයින් අච්ඡින්නචීවර-යෙන් වැඩිපුර සිවුරු විහාරාදියෙහි නැති බවත්, ඇතොත් විඤ්ඤා-පනය නො වටනා බවත්, තව්කාලි කොට ගෙන සිය සිවුරු ගෙන්වාගෙන පරිභොග කළයුතු බවත්, **විමතිවිනොදනී මතයයි.**

7. **අනාපත්ති**-දෙසිවුරක් කොට සෙස්ස ආපසු දෙමියි ගන්නහුට ද, දායකයා විසින් 'සෙස්සත් ඔබ ම ගන්නැ'යි කියන ලද්දහුට ද, අච්ඡින්නනට්ඨචීවරබව නිසා නො ව බහුශ්‍රැතභාවාදිය නිසා ද, අච්ඡින්නකාලයෙන් පෙර ලද්දහුට ද, නෑයන්ගෙන් හා පැවරුවන්ගෙන් හා ඉල්ලාගන්නහුට ද, සිය සැප ධනයෙන් ගන්නහුට ද, ඇවැත් නො වේ.

9. **අඞ්ග**-තතුත්තරිතා, අච්ඡින්නාදි කාරණතා, අඤ්ඤාතකවිඤ්ඤ-ත්තිය පටිලාභො.



# 8. පඨම උපක්ඛට සික්ඛා.

**134. චීවර චෙතාපන්න.**

(ගහපතිස්ස යනු ද ගහපතානියා යනු ද කර්තෘර්ථයෙහි ෂෂ්ඨියි. 'චීවරං චෙතාපෙන්ති පරිවත්තෙන්ති අනෙනා'ති 'චීවරචෙතා-පන්නං' තකාරාගමයි.)

වස්ත්‍රයක් ගැනීමට එක් කොට තැබූ කහවණු රන් රිදී පටක සූත්‍ර කප්පාසාදි වස්තු සිවුරු මිලයි. **'චීවරෙන අච්ඡාදෙස්සාමි'** යන්නෙහි අදහස 'වස්ත්‍රයක් දෙන්නෙමි' යනුයි. 'කෙබඳු වස්ත්‍රයක් උවමනා ද? කෙබන්දක් මිල දී ගනිම්දැයි ගැහැවියන් විසින් නො විචාරනලදු ව, දිගින් පුළුලින් සියුමින් වැඩි හොඳ චීවරයක් ලබන රිසියෙන් විධාන කිරීම ඇවැතට කාරණ වේ. ඒ විධානය කරන අයුරු **'ඉමිනා චීවරචෙතාපන්නෙන'** යනාදීන් පැවසේ. කල්‍යාණකම්‍යතාව නම් සුන්දරවූවක් මහඇගිවූවක් කරවන රිසියයි. **'පුබ්බෙ අප්පවාරිතො'** යනු කී බැවින් "එකෙණෙහි පවාරිතයා ද අප්පවා-රිතයෙක් ම වේ" යනු **වජිරබුද්ධියි.**

7. **අනාපත්ති**-නෑ පැවරුවන් විෂයෙහි ඇවැත් නො වේ.

**'මහග්ඝං චෙතාපෙතුකාමස්ස අප්පග්ඝං චෙතාපෙති'** යන්නෙන් අගය අඩුවූවක් හෝ එයින් අන් දෑයක් හෝ ලබා ගන්නහුට ඇවැත් නැතැයි කියැවිණ. වටිනාකම වැඩි කිරීම ඇරැබෑ මේ සිකපදය පැනවූ නිසා දෙනු කැමැත්තෙමියි දායකයා නො කීකල ද එබඳු කැමැත්තෙක් ඇතැයි අසා වටිනාකම වැඩි නො කොට ගෙන්වා ගත හැකිය යනු **සාරත්ථ-දීපනී මතයයි.**

**'අප්පග්ඝං චෙතාපෙති'** යනු කීවේ නිසගිපචිති නො වන බව සලකාය. විඤ්ඤත්තියෙන් දුකුළා වේ. **'පුබ්බෙ අප්පවාරි-තො'** යන්නෙන් විඤ්ඤත්ති කාරණය කියැවිණ. සාරත්ථදීපනී මතය රාජසිබය සමග ද නො ගැළපේ. මෙහි ද "දායක දූතා-දීහු කැමැති යමක් කියන්නේයයි නො පැවරුවාහු නම් ඔවුනට කීමෙන් දුකුළා වේ" යනු **විමතිවිනොදනී මතයයි.**

9. **අඞ්ග**-අඤ්ඤාතක විඤ්ඤත්ති, භිය්‍යොකම්‍යතා, තාය පටිලාභො යි අඞ්ගත්‍රයෙකි.

5. පෙරසේ දූතයා විසින් විචාරනු ලබන භික්ෂුව නැති නිසා හෝ විචාරණය කරනු නො කැමැති නිසා හෝ 'කැපකාරුවෙක් නැතැ'යි කියයි. එවිට එතැනට පත් මිනිසකුට මුදල දී 'මොහු ගෙන් සිවුර ගනු මැනැවැ'යි කියා දූතයා යයි. මේ දූතයා විසින් හමුවෙහි දක්වූ කැපකරුවෙකි.

6. දූතයා ගමට පිවිස තමන් රිසියෙන්නකුට මුදල දී පෙරමෙන් භික්ෂුව වෙත එළඹ එබව කියා යයි.

7. තමන් නො පැමිණ අන්දූතයකු අත එපුවන කියා එවයි.

8. භික්ෂුව වෙතින් යන විට ම 'මම අසුවලාට දෙමි' ඔහුගෙන් ඉල්ලාගනුමැනැවැ'යි කියා යයි.

දූතයා විසින් දක්වුණ මේ සතරදෙනා කෙරෙහි භෙසජ්ජ-ක්ඛන්ධකයෙහි එන **මෙණ්ඩක සිඛයට අනුව පිළිපැද්දයුතු**. දහස්වරක් චෝදනා කළ ද අන් කැපකරුවකු යවා කැපවත් ගෙන්වා ගත ද නිවරදයි.

9. දූතයා විසින් පිළිවිස්නා ලද භික්ෂුව 'කැපකරුවෙක් නැතැ'යි කියයි. එවිට සමීපයෙහි සිටියෙක් 'ගෙනව, මම එය කර දෙමි' යි මුදල ගනියි. දූතයාත් භික්ෂුවට එබව නො කියා ම යයි. මේ **මුඛවෙවටිකකප්පියකාරයායි** (-කිසිවකු විසින් නො දක්වන ලද සිය තෙපුලෙන් ම කැපකරුවූයේයි.)

10. අනෙකෙක් 'සිවුරක් ගෙන දෙව' යි භික්ෂුව ගේ උපස්ථායකුට හෝ අන් කවරකුට හෝ මුදලක් දෙයි. මේ **පරම්මුඛකප්පිය-කාරයායි**.

මේ දෙදෙනා කෙරෙහි නො නැ නො පැවරුවන් කෙරෙහි මෙන් පිළිපැද්ද යුතු. වස්තුව ඔවුන් සතු නිසා නොව චීවරාදිය ඔවුන්ගෙන් ලබා ගන්නැයි දූතයා නො කී නිසාය.

**141. අත්ථො මෙ ආවුසො චීවරෙන.**

චෝදනා කරන අයුරුයි. මිලට ගෙනෙව යනාදිය නො කිවයුතු. රූපිය සංවොහාරය සිදු නො වනු පිණිසයි.

**142. ඡක්ඛත්තුපරමං.**

(භාවනපුංසකයි. හෙවත්-ක්‍රියාවිශෙෂණයි.) චෝදනා තුනක් ද සිටීම් සයක් ද මෙහි කියැවිණ. එක් චෝදනාවෙකින් සිටීම් දෙකෙක් පිරිහේ. දොළොස්වරක් සිටිය හැකියි. එහෙත් චෝදනා නොකළ හැකියි. 'වැඩියේ ඇයිදැ'යි නිහඬ ව සිටින්නහු ගෙන් විචාළ හොත් 'ජානාසි'යි කිවයුතු. බණ දෙසීම හිඳීම ආදිය නො ද කළයුතු. එක්



වරක් ගොස් සවරක් චෝදනා කළ හොත් සියල්ල අවසන් වේ. උක්ත චෝදනා ඨාන ගණිතින් වැඩිපුර කොට උපදවා ගත් වස්ත්‍රය නිසග්ගි වේ. සිවුර නො ලද හොත් ධනයෙන් මහණහුට ඵලයක් නුවූ බවත්, තම ධනය ලබාගතයුතු බවත්, සිවුරුමිල එවූවනට දන්වා යැවියයුතු. නො දන්වුව දුකුළායි. දන්වීමෙන් පසු ඔවුන් පිළිවිස ලබාදුන හොත් ගත හැකියි.

5. **ආණත්ති**-මෙය අනාණත්තිකයි. එහෙයින් පරියායෙන් කියා උපාසකාදීන් ලවා චෝදනා කරවත් නම්, ඔවුන් සත්වර තමුදු චෝදනා කොට ලබා දුන ද නිවරද බව **විමතිවිනෝදනී** මතයයි

9. **අඞ්ග**-භික්ෂුව විසින් පෙන්වූ කැපකරුවකු වීම, දූතය 'සඤ්ඤාතො සො මයා' යනාදිය කීම, අතිරෙක උත්සාහය, එයින් පිළිලැබුමයයි සතරෙකි.

**චීවරවග්ගො පඨමො.**

---

## 11. කොසිය සික්ඛා.

**143. කොසිය මිස්සකං.**

කොසකාර නම් පණුවන්ගේ කොෂයෙන් නිපන් හුයින් මිශ්‍ර වීමයි. එළුලොමින් සන්ථතය කරන කල්හි, තමන් නො දැන සිටිය දී වාතවේගයෙන් අවුත් වැටී එක් හුයක් නමුදු මුසු වුව අබ්බොහාරික නො වේ. අචිත්තකව ම ඇවැත සිදු වේ.

**144. සන්ථතං.**

සමබිමෙක එළුලොම් ආදිය අතුරා එමත කැඳ ඉටි ආදිය වක් කොට හිඳිනා හෝනා පමණට තනාගනු ලබන්නෙකි වියවා ගත ද වටී. තැනීම් තැනවීම් ප්‍රයොගයන්හි දුකුළා ද, නිමවීමෙන් පචිති ද වේ.

5. **ආණත්ති**-තමන් සඳහා කරවීමෙන් පචිති වන බැවින් සාණත්තිකයි.

6. **ආපත්ති**-තමාගේ අඩාල සන්ථතය තමා ම නිම කිරීම, අනුන් ලවා නිම කරවීම, මෙරමා විසින් කොට අඩාල කල සන්ථතය තමා නිම කිරීම, මෙරමා ලවා නිම කරවීම, යන සිවු තන්හි ම පචිතියි. අනුන් සඳහා කිරීම කරවීමෙහි ද, අනුන් විසින් කැරුණක් ලැබ පරිභොග කිරීමෙහි ද, දුකුළායි.

7. **අනාපත්ති**-වියන්, බුමුතුරුණු, කඩතුරා, භිසි, කත්වයින් කිරීම; එයට නිසිපරිභොගය; වියවා කිරීම, මෙහි ලා නිරාපත්තිකයි.

9. **අඞ්ග**-කොසියභාවය, තමන් පිණිස කිරීම කරවීම, පිළිලැබුම (-තිම කිරීම) යයි ත්‍රයෙකි.

---

## 12. සුද්ධකාළක සික්ඛා.

**145. සුද්ධ කාළකානං.**

සෙසු පැහැ ඇති එළුලොම් හා මුසු නො කොට ස්වභාවයෙන් හෝ රඳනින් හෝ කළුවූ එළුලොමින් සන්ථතයක් කළහොත් පචිති වේ. පළමුශික්‍ෂාවෙහි එක් අංසුවෙකින් මුසු වුවත් පචිති කියැවිණ. මෙහි **'එකෙනාපි අසංසට්ඨා අමිස්සකබා'** යි නො කී බැවින් අන් පැහැඇති ලොමින් මුසු වුවත්, එය නො පැනෙන ස්වරූප නම් සුද්ධ කාළක ම වේ යයි **වජිරබුද්ධියෙහි** එයි. සෙස්ස කොසිය සිඛය වැනියි.

---

## 13. වෙභාග සික්ඛා.

**146. වෙභාගා සුද්ධ කාළකානං.**

මෙය උක්තාංශට පරිච්ඡේදයයි. කාළලොමාධිකබව වළක්නු පිණිස සිඛය පැනවූ බැවින් දෙකොටසකට වඩා ගැන්ම වරදයි. කොතරම් අඩු වුව ද වරද නැත. **"එකස්ස'පි කාළලොමස්ස අතිරෙකභාවෙ නිස්සග්ගියං"** යනු මාතිකාට්ඨකථාවේ කීයේ, සිඛය අචිත්තක නිසා, තරාදියෙන් කිරා තැබූ ගොඩට සුළඟින් වත් වැඩි පුර එකක් වැටුණ හොත් නිසඟි වේය යන අදහසින් වියයුතු බව **වජිරබුද්ධි සාරත්ථදීපනී** මතයි.

**147 ගොචරියානං.**

මෙහි පමණ අධමාත්‍රතයෙන් කියැවිණ. සුදු එළුලොම් හැර සෙසු සියලු වර්ණම ගොචරියට හෙවත්-කපිලවර්ණයට (-දුඹුරුපාටට) ඇතුළති. කළුලොම් අඩියකට වැඩිවිය නො දී සෙසු ලොම් ගෙන ඇතිරිය කළයුතු

උක්තප්‍රකාරයෙන් අධික වන සේ ලොම් ගෙන නො කළයුතු සන්ථත තමන් සඳහා කළහෙයින් ද, ද්වෙභාගාදී විසින් ගෙන නො කළ හෙයින් ද, මේ සිඛය කිරියාකිරියයි. ඔදාතාදියෙන් මිශ්‍රතය යන හැඟීම ඇති ව හුදු කළු ලොමින් ම සන්ථතය කිරීමෙන් ද හුදු කළු



ලොම් දෙකොටසකට වඩා තිබිය දී අධික නොවේයයි යන හැඟීම ඇති ව කිරීමෙන් ද මෙය **අචිත්තකභාවේයයි** යෙත්. බහුතර ව හෙළ තනිකර හෝ සුදු කපිලවර්ණ ලොම් ගෙන කළත්, පමණට කළු ලොම් ගෙන කළත් විතානාදිය කළත් ඇවැත් නො වේ.

මේ ශික්‍ෂාපදත්‍රයෙහි උක්ත ආස්තරණයන් නිස්සජ්ජනය කොට හෝ නො කොට හෝ ලැබ පරිභොග කරන්නහුට දුකුළායි. අනෙකකු කරනලද්දක් ලැබ පරිභොග කළ ද දුකුළායි. කොසිය සුද්ධ කාළක අකැප හෙයිනි.

---

## 14. ඡබ්බස්ස සික්ඛා.

**148 ඔරෙන චෙ ඡන්නං වස්සානං.**

අලුත් සන්ථතයක් කළ භික්‍ෂුව සාවුරුද්දක් එය පරිභොග කළ යුතු වේ. පරිභොග කළ ද නො කළ ද ඇතිරිය නිම කළ දින සිට වර්ෂය ගිණිය යුතුය එදින සිට සාවුරුද්දතුළ අනෙකක් කළහොත් නිසඟිපචිති වේ.**'නිස්සජ්ජෙබ්බා'** යන්නෙන් අන්‍යයනට දීම කියැවේ.

**149 .අඤ්ඤත්‍ර භික්ඛු සම්මුතියා.**

සන්ථතය නො මැති ව ගමනාදියට අපහසු ඇති ගිලන් මහණහුට යන යන තැනට එය ගෙන යා නො හැකි නම්, ඒ ඒ තැන දී සන්ථත කර ගැනීමට ඉඩ ලැබෙන පිණිස ඤත්තිදුතිය කම්වැකියෙන් සන්ථතසම්මුතිය දිය හැකියි. පළමු වැළඳි රොගය සංසිඳුණු පසු, එය ම හෝ අනෙකක් හෝ නැවත වැළඳුණ ද පළමු සම්මුතිය ම ප්‍රමාණයි. සම්මුතිය නො ලැබ සාවුරුද්ද තුළ අලුත් ඇතිරි කිරීමෙන් පචිති වේ. ආපත්ති භෙදය කොසියසිඛයේ මෙනි.

7. **අනාපත්ති**-සාවුරුද්ද පිරුණු පසු කිරීම, කරවීම, අනුන් කැරුණක් ලැබ පරිභොග කිරීම, විතානාදිය කිරීම යන මෙහි ලා ඇවැත් නො වේ. උනු සාවුරුද්දෙහි අතිරෙක ඡබ්බස්ස සඤ්ඤිතාදි විසින් අචිත්තකබව විමතිවිනොදනියේ කියැවේ.

---

## 15. නිසීදන සන්ථත සික්ඛා.

**150. නිසීදන සන්ථතං.**

මෙය දසා සහිතයි. නවචීවරයට අයත් නිසීදන චීවරයත් මේ සන්ථතයත් එකෙක් ම යයි මතයෙක් වේ. මේ සන්ථතයේ ප්‍රමාණ නියමය නැති නිසා ද, අධිට්ඨානුපග නො වන නිසා ද, අටුවාහි නො කී නිසා ද, ටීකා කිහිපයෙක එම මතය ප්‍රතික්‍ෂිප්තයි. නිසීදන

චීවරය බොමාදි වස්ත්‍රඛණ්ඩයන් පමණට එළා සන්ථතය සේ කරනු ලැබේයයිද මේ ශික්ෂාවේ කියැවෙන සන්ථතය ලොමයෙන් කැරෙන්නෙකැයි ද යෙති. නිදාන කථාවෙහි මේ සන්ථතය චතුරස්‍ර චීවරයෙකැයි භික්ෂූන් කළ අදහස වැරදි වූවක් බව ද **'සන්ථතං පන භික්ඛුනා'** යි නො වදුරා **'නිසීදන සන්ථතං'** යනාදිය කියේත් සන්ථතයේ චීවර සංඥාව දුරලනු සඳහා බව ද පැවසේ.

**151. පුරාණ සන්ථතස්ස සාමන්තා.**

වරක් හිඳගත ද නිඳගත ද සන්ථතය පුරාණසන්ථත සඞ්ඛ්‍යාවට යේ. වටව හෝ සතරැස් කොට හෝ කැපූ තැන සුගත්වියත් පමණ වියයුතු. ඇතිරීම එක් තැනෙක හෝ ලිහා සෙස්ස හා මුසුකොට හෝ කළයුතු. වියත් ප්‍රමාණය උත්කෘෂ්ට ප්‍රමාණයයි ද සාරත්ථදීපනියේ හෙට්ඨිමප්පමාණයයි කියේ ප්‍රමාදයෙකැයි ද කඞ්ඛාවිතරණියේ ප්‍රකාශිතයි.

6. **ආපත්ති**-අනුන් සඳහා කිරීමෙන් ද කරවීමෙන් ද දුකුළායි.

7. **අනාපත්ති**-පැරණි සන්ථතයක් නොමැති නිසා නො ගෙන කළ ද, අනෙකකු කැරුණක් ලැබ පරිභොග කළ ද, විතාන, බුමුතුරුණු, කන්වයින් කළ ද වරද නැති. සුගත් වියතක් නො ගෙන ගත්තෙමියි ද, සුගත් වියතින් උනුව ගෙන ඌන නො වේයයි ද හැඟීම ඇති ව කිරීමෙන් අවිත්‍තක වේ.

14-15 ශික්ෂාදෙක්හි වදාළ සන්ථත දෙක නිසජ්ජා ලත් පසු පරිභොගය කැපයි.

---

## 16. එළකලොම සික්ඛා.

**152. අද්ධානමග්ග පටිපන්නස්ස.**

අද්ධාන යන්නෙන් දීඝීමාගී සඞ්ඛ්‍යාත දෙගව්වෙන් වැඩි තැන් ගැනේ. නිදාන කථාවට අනුව මෙසේ කියැවුණ ද දැහැමින් කොතැන දී ලද ද ගත හැකියි. **'උප්පජ්ජෙය්‍යුං'** යන්නෙන් කී ඉපදීම නම්, සඞ්ඝ ගණ ඥාති මිත්‍රයන් ගෙන් ද, පංසුකූල විසින් ද, කැප සිය ධනයෙන් ද ලැබීමයි.

**153. සහත්ථා හරිතබ්බානි. (හාරෙණ පඤ්චමි.)**

**'සහත්ථා'** යි කියේ උපලක්ෂණවශයෙනි. කවර අවයවයෙකින් ගෙනගිය ද වෙනසෙක් නො වේ. අනන්තරායෙන් තෙයොදුනෙන් පිටත හළ කල ලොම් ගණනින් නිසගිපචිති යි. තෙයොදුන ඉක්මවීමේ දී පළමු පියෙන් දුකුළා ද දෙවැන්නෙන් පචිති ද වේ.



**154. අසන්තෙපි හාරකෙ.**

ගෙනයන්නකු ඇත ද නැත ද තමා විසින් තෙයොදුනක් තැන් ගෙනයා හැකියි. අනෙකකු ලවා ඉනිදු ඇතට ගෙන යා හැකියි තෙයොත්න ඉක්මවීමෙහි උත්සාහභාවය ඇතිව, අනෙකකු ගෙන යෙතියි අශුද්ධසිතින් තැබූ ලෝම, එසේ ම අනෙකකු ගෙන ගිය හොත් ඇණවීමක් නොවූ බැවින් ඇවැත් වේ. ගමනේ අභිලාෂයත් ඇණවීමත් ඇතහොත් නිරාපත්තිකයි. අනෙකකු ගෙන යාවි යන අදහස නැති බැවින් සුද්ධසිත් ඇති ව තබනලද්ද වාතයෙන් පෙරළේ ද, අන්‍යයෙක් හෝ ගෙනයා ද මෙහි දී අවිත්‍තකව ද ඇවැත සිදු වේ. හිමියා නො දැන සිටිය දී ගමන්කරන යානාදියෙක තබා ඉක්මවීමෙන් ද ඇවැත් වේ. මෙතෙම මෙය ගෙන ගොස් ඉක්මවවයි යන හැඟීම යාන ස්වාමියාට නොවූ බැවිනි.

7. **අනාපත්ති**-තෙයොත්නක් ගෙනගොස් ආපසු ගෙන ඊමෙහි ද, තුන්යොදුන් තැන වාසයට ගොස් අසත්ප්‍රාය සේ දැන අන් තැනකට ගෙනයාමෙහි ද, සොරුන් විසින් ගන්නාලදු ව නැවත ලැබුවෙහි ද, නිසජීම් විනය කම් කොට ලැබුවෙහි ද, අනෙකකු ලවා ගෙනයාමෙහි ද, කම්බලාදි එයින් කළ භාණ්ඩ ගෙනයාමෙහි ද ඇවැත් නැත.

9. **අඞ්ග**-අකෘතභාණ්ඩබව, ප්‍රථම ලැබීම, (චොර හරණාදියෙන් පසු නැවත ලැබුණ හොත් ඒ තැන් සිට ද තෙයොදුනක් ගෙන යා හැකියි.) තමා ගෙන හෝ අනුන් නො දැන සිටිය දී යානාදියෙක බහා හෝ සීමාව ඉක්මවීම, හරණ පච්චාහරණ අභාවය, අවාසාධිප්පාය.

13. **විනක**-'පතත් නො දන්නේ හෝ දැන ද සිවුරු ඇ පිරිකර ලොම් ඇලුණුබව් නො දැනැ තුන්යොදුන් ඉක්මවා නම් රාත්නට ද මේ ඇවැත් වනුයෙන් අවිත්තකයි' යනු කඞ්ඛා පිටපති.

---

## 17. එළකලොම ධොවාපන සික්ඛා.

නො නෑ මෙහෙණක ලවා එළලොම් සේදවීමෙන් ද, රදන් කරවීමෙන් ද, අවුල් හැරවීමෙන් ද, නිසගි පචිති වේ. විස්තර පුරාණ-චීවර ධොවාපන සිඛපදය වැනියි.

---

# 18. රූපියසික්ඛා.

**155. ජාතරූප රජතං.**

**ජාතරූප** නම් රත්‍ය. **රජත** ශබ්දයෙන් රිදී පමණක් නො ව කහාපණ මාසකාදිය ද සඞ්ගෘහිත වේ. රන්මුවා රිදීමුවා පියෙවියයි **කහවණු තෙවගෙකි**. තඹලෝ ආදියෙන් කැරෙන ලෝහමාසක ද, හරඳුව උණපතුරු තල්පත් ආදියෙන් රූප නගා කැරෙන දරුමාසක ද, ලාකඩ ආදියෙන් තැනෙන ජතුමාසකදැයි **මාසකය ත්‍රිවිධයි**. මෙ පමණක් නො ව ලොවැ ගනුදෙනුවෙහි පවත්නා ඇට සම් ආදියෙන් තැනූ, රූ නැඟූ නො නැඟූ කවර මුදලක් නමුදු මෙයට ඇතුළත් වේ. මෙහි ප්‍රකාශිත **රජත රජතමාසක ජාතරූප ජාතරූපමාසක** යන සිවු නිසගිවත් තමන් පිණිස පිළිගැන්මෙන් නිසගිපචිති ද, අනුන් පිණිස පිළිගැන්මෙන් දුකුළා ද වේ.

**රාජසික්ඛාපදයෙහි** කී මුක්තා මාණික්‍යාදි දුකුළාවත් අතුරින්, පස්සහදුම්යන් විසින් පිළිගනු ලැබූ ධඤ්ඤ විරහිත මුක්තාදියෙන් උපදවාගත් පසය විළඳත සැම්ට ම දුකුළා වේ. ධාන්‍ය ගැන මත හෙද පවති. මෙ ශික්ෂාපදයෙන් නිසගිවත් දුකුළාවත් පිළිගැන්ම වාරිතයි.

**156. උග්ගණ්හාපෙය්‍ය වා උග්ගණ්හාපෙය්‍ය වා.**

තමන් සඳහා දෙනුලබන මුදලක් හෝ අස්වාමික මුදලක් හෝ තෙමේ ම ගනී නම්, අනෙකකු ලවා ගන්වා ගනී නම් වස්තු ගණනින් පචිති වේ.

**157. උපනික්ඛිත්තං වා සාදියෙය්‍ය.**

ඉදිරියට ගෙනාවූ ද නො ගෙනාවූ ද, 'මේ ඔබට වේ'යයි වචනයෙන් හෝ හස්තමුද්‍රාවෙන් හෝ පරිත්‍යාග කරනලද රජතාදිය, කාය වාක් ප්‍රයොගයෙන් පිළිකෙව් නො කොට සිතින් ඉවසී නම් නිසගිපචිති වේ. ගනු කැමැත්ත ඇති ව වුවත් කයින් හෝ වදනින් හෝ පිළිකෙව් කෙරේ නම්, කා විසි පිළිකෙව් නො කොට 'කැප නැත' යන සුද්ධසිතින් නො ඉවසා සිටී නම් නිරාපත්තිකයි. තුන් දෙරින් කවර දෙරෙකින් නමුදු පිළිකෙව් කිරීම ප්‍රමාණයි. කා විසි පිළිකෙව් නො කොට, සිතින් අධිවාසනා කිරීමේ දී, කයින් වදනින් කටයුතු පිළිකෙව් නොකිරීම නිසා අකිරියයෙන් ඇවැත් සිදුවේ. මනොද්වාරයෙහි ඇවැත් නො නැගේ.

අකැපයයි වළකද් දී පාමුල තබාලූ මුදලක් දැක, එතැනට පැමිණි කිසිවකු 'මේ කිම්දැ'යි විචාළහොත් සිදුවූ පුවත කිවයුතු. එවිට ඔහු 'මම මෙය රැක දෙන්නෙමි, ගුප්තස්ථානයක් පෙන්වනු



මැනැවැ'යි කීවොත් මතුම්හලට ද නැඟ 'මේ එබඳු තැනෙකැ'යි ප්‍රත්‍යය පරිභොගය තකා ගුප්තස්ථානයක් පෙන්විය හැකියි. 'මෙ තැන තබන්නැ'යි කීවොත් වස්තුව පරාමර්ශිත වන නිසා උග්ගණ්හාපනය සිදු වේ. මේ ධනය කැප අකැප දෙක නිසා පිහිටියේ වේ. (අසාදිත බැවින් එයින් ලත් ප්‍රත්‍යය කැපයි. දුබ්බිවාරණය කළ හොත් අකැප වේ. එහෙයින් අකැප බව ඇසුරු කොට සිටියේත් වේ.) මුදල තැබූ ගබඩාව දෙර වසා රැක්ක හැකිය. වෙළෙඳකු කැප පාත්‍රචීවරාදියක් ගෙන ආවොත් 'මෙය අපට ආවශ්‍යකය, මෙබඳු මිලෙකුත් ඇත. එහෙත් කැපකරුවෙක් නැතැ' යි කිවයුතුය. වෙළෙඳ 'මම කැපකරු වෙමි' යි පිළිත කෙරේ නම්, දෙර හැර 'අසුවල් තැන ඇතැ'යි කිව හැකිය. (**'ඉදං ගණ්හ'** යනු නො කිව යුතු.) එම මුදලින් ලැබුණු කැප බඩුව පරිභොගාර්හයි. වෙළෙඳ අධිකමිල ගනීනම් නවතාලීම ද වටී.

**158. නිස්සග්ගියං.**

රූපිය අකැප බැවින් සඞ්ඝයාට නො ව සඟමැද නිසජ්ජය යුතු එතැනට ගිහියකු පැමිණිය හොත් ඔහුට **'ඉමං ජානාහි'** යනු කිවයුතු. 'කුමක් ගෙනෙම්දැ'යි ඔහු ඇසුවොත්, රූපියසංවොහාරයෙන් වළකිනු පිණිස, 'මේ මේ දැය ගෙනෙව'යි නො කියා, ගිතෙල් ආදිය මහණුනට කැපයයි කීම වටී. ඔහු ඒ මිලයෙන් ගෙනා දැය මුදල් පිළිගත් භික්ෂුව හැර සෙස්සනට කැපයි. යමක් ගෙනෙන්නට ඒ මිනිසා නො දනිතොත් 'මේ මුදල ඉවත ලන්නැ'යි කිවයුතුය. එයත් සිදු නො වේ නම්, ඤත්තිදුතිය කම්වැකි කියා රූපියඡඩ්ඩකයකු සම්මත කොට ඒ භික්ෂුව ලවා බැහැර කරවිය යුතුය.

6 **ආපත්ති**-තිකපාචිත්තියි. රූපියෙහි රූපියසංඥ ඇත්තහුට ද, සවණ්ණ ද බරපතන (-රන්වැනි ලොහවර්ගයක්) දැයි විමති ඇත්තහුට ද, (පිණ්ඩාදිය දෙනවිට ඒවා හා මුසු කොට මුදලක් දීම වැනි අවස්ථාවෙක්හි) අරූපිය සංඥ ඇත්තහුට ද, පචිතියි. අරූපියෙහි රූපියසඤ්ඤී වෙමතිකයනට ද, සඞ්ඝචෙතියාදිය පිණිස ගන්නහුට ද, මුක්තාදිය පිළිගන්නහුට ද, දුකුළායි. මිනිසුන් නිසගිවස්තු ද දුකුළාවස්තු ද ගෙන අවුත් සෑආදියට දෙම්හයි කිවහොත් පිළිකෙව් නො කොට එබව ආරාමිකාදීනට දැන්වියයුතු.

මතු පැවැසෙන රතනසික්ඛයට අනුව තබන්නහුට ඇවැත් නො වේ. ජාතරූපභාවය, අත්තුද්දෙසිකතාව, ගහණාදියයි අඞ්ගත්‍රයෙකි. පිළිගැන්මෙන් පත් වන නිසා සියාකිරියායි, පිළිකෙව් නො කිරීමෙන් ද පත්වන නිසා සියාඅකිරියායි,

———

# 19. රූපියසංවොහාර සික්ඛා.

**159. නානප්පකාරකං.**

ශිඛාභරණ පාදාභරණාදි වශයෙන් කරන ලද්දාවූ ද, රන්පොලු රන්උළු වශයෙන් පවත්නාවූ ද උභය මිශ්‍රවූ ද, සුවර්ණරජතාදියයි.

**160. රූපිය සංවොහාරං.**

මේ රූපිය සඳින් රන් ද, රිදී ද, එයින් තැනූ මුදල් ද, ව්‍යවහාර යෙහි පවත්නා සෙසු සියලු මුදල් වර්ග ද කියැවේ තමන් පිළිගත් මුදලින් ද, නො පිළිගෙන කැපක්‍රමයෙන් ලත් මුදලින් ද, ගනුදෙනු කිරීම රූපිය සංවොහාරයයි.

**රූපියෙ රූපියසඤ්ඤී රූපියං චෙතාපෙති.**
**රූපියෙ වෙමතිකො රූපියං චෙතාපෙති.**
**රූපියෙ අරූපියසඤ්ඤී රූපියං චෙතාපෙති.**

තමන් සතු රූපියයෙහි රූපිය සංඥී ව හෝ වෛමතික ව හෝ අරූපියසංඥී ව හෝ අනුන් සතු රූපියය පරිවර්තනය කෙරේනම් නිසගිපචිති වේ.

**අරූපියෙ රූපියසඤ්ඤී රූපියං චෙතාපෙති.**
**අරූපියෙ වෙමතිකො රූපියං චෙතාපෙති.**
**අරූපියෙ අරූපියසඤ්ඤී රූපියං චෙතාපෙති.**

කැපවත් ද දූකුලා වත් ද මේ ත්‍රිකයෙහි අරූපිය සඳින් කියැවේ. ඒවා දී රූපිය ලබාගත ද නිසගිපචිති වේ.

පූර්වෝක්ත නිසගිවතින් නිසගිවතක් හෝ මුක්තාදි දූකුලාවතක් හෝ වස්ත්‍රාදි කැපවතක් හෝ **පරිවර්තනය** කොට ගැනීමේ දී, පළමු පිළිගැන්මෙන් රූපියපටිග්ගහණසිඛයෙන් ද පරිවර්තනයෙන් මේ සිකයෙන් ද නිසගිපචිති වේ. නිසජීම මේ සිකය අනුවයි. තමා ගේ අරූපියයෙන් අනුන් ගේ රූපියය ද, රූපියයෙන් අරූපියය ද පරිවර්තනය කොට ගැනීමෙන් රූපියව්‍යවහාරය සිදු වේ. දූකුලා-වතින් දූකුලාවතක් හෝ කැපවතක් හෝ ගැනීමෙන් ද, කැපවතින් දූකුලා වතක් ගැනීමෙන් ද දූකුලා ඇවැත් වේ.

**රූපියෙ රූපියසඤ්ඤී අරූපියං චෙතාපෙති.**
**රූපියෙ වෙමතිකො අරූපියං චෙතාපෙති.**
**රූපියෙ අරූපියසඤ්ඤී අරූපියං චෙතාපෙති.**

මේ ත්‍රිකය අටුවාගතයි. මෙහි දී ද නිසගිපචිති වේ මුදල් දී ගත් කැප බඩුව සඞ්ඝයාට නිස්සජ්ජනය කළ පසුව වුවත් සියල්ලවුන් ගේ ම පරිභොගයට නො වදී. නිසජා ලත් පසු පරිභොග කළ



හැක්කක් ම විනයකම් විසින් නිසජ්ය යුතු බවත් මෙය එබන්දක් නොවන බැවින් ඉවත දමා පචිති දෙසා ගත යුතු බවත් **විමති විනොදනී** මතයයි. අරූපිය නිසජ්ය යුතු බව හෝ එයින් කළයුතු දෑ හෝ ඉදුරා පෙළෙහි නො ආයේ ය. 'සඞ්ඝයාට නිසජු කැපබඩුව සෙස්සන් විසින් පරිභොග කළ හැකි වේ' යන මතයෙක් ද වෙයි.

**අරූපියෙ රූපියසඤ්ඤී ආපත්ති දුක්කටස්ස**
**අරූපියෙ වෙමතිකො ආපත්ති දුක්කටස්ස.**
**අරූපියෙ අරූපියසඤ්ඤී අනාපත්ති.**

පස්සහදූමියන් හැර සෙස්සවුන් හා කැපවතින් කැපවත් ගනුදෙනු කිරීමේ දී මතු **කයවික්කය සිඛයෙන්** ඇවැත් වේ. කය වික්කය නො වන සේ කළ හොත් එයින් ද ඇවැත් නො වේ.

**අකැප පාත්‍ර චතුෂ්ටය.**

1. භික්ෂුව විසින් පිළිගනු ලැබූ රූපිය දී, යකඩ සෑදීම පටන් කොට සියල්ල කරවාගෙන තනවාගත් පාත්‍රය **මහාඅකප්පිය පාත්‍රයයි**. මෙය මුලසිට ම දූෂිත වූවෙකි. අන්මුල්හිමියකු නැති නිසා මහා අකප්පිය වී. නැවත එය අයබීජබවට ද පත්කළ නො හේ. සඞ්ඝයාට නිස්සජ්ජනය කළ ද කිසිවකුට කැප නැත. පිළිගත් රූපිය සඟමැද නිස්සජ්ජනය නො කොට, එයින් කැපබඩුවක් ගෙන, පසුව සඟමැද නිසජුව ද පරිභොගාර්හ නො වේ. ඉදින් ඒ මහණහු මිල දී ගත් කැපවත් හෝ දූකුලාවත් හෝ දී නැවත රූපිය පරිවර්තනය කොට ගත්තාලද නම්, ඒ රූපිය නිසජු පසු, අන් භික්ෂූන් විසින් එයින් කැප දෑයක් ගතහැකි වේ. මුතු ඈ දූකුලාවත් පිළිගෙන කරවූව ද සියල්ලනටම අකැපි.

2. පිළිගත්මුදල් දී භික්ෂුවක් විසින් ගනු ලැබූ පාත්‍රය පස්සහදූමියනට ම අකැප වේ. මුදල මුදල් හිමියාටත් පාත්‍රය පාත්‍රස්වාමියාටත් ආපසු දුන් විට, මුලසිට දූෂිත නො වූ බැවින් නැවත කැප වහරින් රැගෙන පරිභොග කළ හැකියි.

3. මුදල් ගත්වාගෙන කැපකරුවකු සමඟ ගොස් පාත්‍රයක් දැක 'මෙය මට හොඳය'යි භික්ෂුව කියයි. කැපකරු ගනුදෙනු බේරයි. කැපවහරින් කළත්, මුදල තමන් පිළිගත්තා ලද්දක් බැවින්, ඒ පාත්‍රයත් සියල්ලනට ම **අකැප** වේ. නිසජ්ය යුතු මුදල නො නිසජා එයින් ගත් බැවින් සෙස්සනට අකැපවිය. (සඟමැද නිසජ්ය යුත්තේ රූපියය විනා එයින් ගත් බඩු නො වන බව මෙයිනුත් පැනේ යනු **විමතිවිනොදනියි**.)

4. මුදල් නො පිළිගෙන කැපකරුවකු සමඟ ගොස් 'මේ මුදල රැගෙන පාත්‍රයක් දෙන්නැ' යි මුදල් දෙවා පාත්‍රයක් ගනී. දුබ්බි-චාරිත බැවින් එය ඒ භික්ෂුවට අකැප වේ. මුදල ගිහිසන්තකයක් වූ බැවින් රූපියසංවොහාරය නො වී. එහෙයින් පචිති නැත. මුදල් නොපිළිගත් බැවින් සෙස්සනට කැපයි

පස්සහදූමියන් සන්තක රූපිය ගනුදෙනු කිරීමෙන් ම දෙස් වේ. එහිදු තමා සතුයෙහි පචිති ද, සෙස්සෙහි දුකුළා ද වේ. පාත්‍රය පමණක් නො ව කවර බඩුවක් නමුදු පෙර කී ක්‍රමයෙන් ගත දෙස් වේ.

මේ සිඛය අනාණත්තික බව මාතිකාට්ඨකථාවෙහි එයි. ආරාමි-ඳින් ලවා යමක් ගෙන්වීමේ දී ආණත්තිය ලැබෙන බව **විමති-විනොදනී** මතයයි. මෙහි අඞ්ග දෙකෙකි. පරිවත්තන ධනය හෝ පරිවත්තිත ධනය හෝ රූපියවීම, පරිවත්තන පරිවත්තාපනය, යනුයි.

——:o:——

## 20. කයවික්කය සික්ඛා.

**161. නානප්පකාරකං.**

චීවර පිණ්ඩපාතාදි කැපවස්තූන් ගේ ගනුදෙනුව මෙයින් වැළැකේ. යට සිඛයෙන් වැළැකුණේ රූපියසංවොහාරයයි. හෙවත්-මුදල් ගනුදෙනුවයි.

**162. කය වික්කයං.**

අනෙකකුගේ වස්තුවක් ගැනීම **කයයි**. තමාගේ වස්තුවක් දීම **වික්කයයි**. මෙය රැගෙන මෙනම් වස්තුව දෙන්නැයි ඉල්ලාසිටීමෙන් දුකුළා වේ. සියබඩුව පරහස්තයටත් පරබඩුව ස්වහස්තයටත් පත් කල නිසගිපචිතියි. මාපියන්ගෙන් යමක් ඉල්ලීමෙන් විඤ්ඤත්ති සිදු නො වේ. ඔවුනට යමක් දීමෙන් සද්ධාදෙය්‍ය විනිපාතය ද නො වේ. එහෙත් ඔවුන් සමඟ ද **'ඉමිනා ඉමං දෙහි'** යන ක්‍රමය අනුව ගනුදෙනු කිරීමෙන් ඇවැත් වේ. සෙසු නෑයන්ගෙන් යමක් ඉල්ලීම නිසා විඤ්ඤත්ති නො වතුදු, ඔවුනට යමක් දීමෙන් සද්ධාදෙය්‍ය විනිපාතය වේ. නො නෑයකු සමඟ ගනුදෙනු කිරීමෙන් දුකුළා දෙකෙක් ද පචිතියෙක් ද වේ.

ඉතිරිබත් බුදින්නකුට පූර්වාපර සම්බන්ධ ක්‍රියාවෙන් 'මෙය කා මේ කිස කරව'යි කීම, **'ඉමිනා ඉමං දෙහි'** යන කීම වැනි බැවින් පචිති වේ. **'ඉදං භත්තං භුඤ්ජිස්සසි, ඉදං නාම කරොහි'** යනු



වෙන් අසම්බන්ධක්‍රියාවෙන් කීවොත් කයවික්කය නො වේ. අන-පෙක්ෂිත බැවින් ඔවුනට බත් දීම සද්ධාදෙය්‍යවිනිපාත ද නො වේ. හස්තකර්ම කරවීමෙහි විඤ්ඤත්තිදු නැත.

නිසගිවතක් පරිභුක්තකල්හි ද, නැසුණුකල්හි ද පචිත් දෙසන්නා සේ කොසොරෝපණ වස්ත්‍රධොවනාදියෙන් පරභාණ්ඩ-යක් සියතට නො පත ද නිසගිපචිති දෙසිය යුතු

7. **අනාපත්ති**-බඩුවක වටිනාකම විමැසීමෙන් ඇවැතෙක් නො වේ. වෙළෙඳ කී අගයට වඩා තමාගේ භාණ්ඩය අගී නම්, එබව කියා 'තොප වස්තුව අන්‍යයකුට දෙව'යි දැන්විය යුතු. ඊට සරිලන සේ තවත් බඩුවක් දෙමියි වෙළෙඳ කීවොත් **'ඉමිනා ඉමං දෙහි'** යන ව්‍යවහාරය නො වූ නිසා කයවික්කය සිදු නො වේ. පරභාණ්ඩය වඩා අගී නම්, භාණ්ඩස්වාමියාත් එ බව නො දනී නම් වංචන සිතින් ගතහොත් ථෙය්‍යාවහාරයෙන් පරිජියට පත් විය හැකියි. වෙළෙඳ හැර ඔහුගේ පුතකු නමුදු කැප කරු කොට ගෙන, 'මෙයින් මෙය රැගෙන දෙන්නැ'යි කියා බඩුව ගත හැකියි. **'ඉදං අම්හාකං අත්ථි, අම්හාකං ච ඉමිනා ඉමිනා අත්ථො'** යනාදීන් ව්‍යවහාර කිරීම කැපයි. පස්සහදූමියන් සමඟ මෙකී ගනුදෙනුවෙන් කයවික්කය සිදු නො වේ. 'තෙමේ මිල නො කොට මෙරමා කළ මිලයෙන් ගනී නම් නිරුවැති' යනු **සිඛවළඳ විනිසයි**. මේ සිඛය අනා-ණත්තිකයි. කැපවත් බව, පස්සහදූමියන් නො වීම, ගනු දෙනුවය යි අඞ්ගත්‍රයෙකි.

**එළක ලොම වග්ගො දුතියො.**

——/o/——

## 21. පත්ත සික්ඛා.

**163. අතිරෙකපත්තො.**

නො ඉටූ නො විකැපූ පාත්‍රය අයිරා තන්හි සිටී. එකොළොස් වන අරුණ නැගීමෙන් එය නිසගි වේ. **උක්කට්ඨ, මජ්ඣිම, ඔමක** යන පාත්‍රයන් අතුරෙන් ප්‍රමාණයුක්ත තමා සතු, කාලවණ්ණ කළ පාත්‍රය ඉටා පරිභොග කළයුතු වේ.

මනාව සුදු කොට පැහැසි නො කැඩුණු තෙවස් පැරණි හැල් සාල් මගධනැළි දෙකක් ගෙන, අමු නො වන සේ ද, බෙරි නො වන සේ ද, පිඩු නොවන සේ ද පිස, එම බතුත්, සියලු කුළුබඩු දමා පිසූ නො වගුරුවා අතින් ගෙන යාහැකි මුග්ගසූපයත්, එපමණ මස් ආදි ව්‍යඤ්ජනත්, යම් පාත්‍රයෙක බහා හිරවෙකින් ගටන සඳ

අහරහි නො ගැවේ නම්, ඒ පාත්‍රය **උක්කට්ඨුක්කට්ඨපාත්‍රයයි**. මදි නම් **උක්කට්ඨපාත්‍රයයි**. අහර හිරටිත් මත්තෙහිත් වේ නම් **උක්කට්ඨොමකයි**. පෙර කී අහරින් භාගයක් හෙවත් - මගධනැළියෙක බත් බහා **මජ්ඣිමුක්කට්ඨ, මජ්ඣිම, මජ්ඣිමොමක** පාත්‍රයෝ ද, ඉනිදු භාගයෙක හෙවත් - සාල්පතෙක බත් බහා **ඔමකුක්කට්ඨ, ඔමකමජ්ඣිම, ඔමකොමක** පාත්‍රයෝ ද පිරිසිඳිය යුත්තාහ. උක්කට්ඨුක්කට්ඨ, ඔමකොමක පාත්‍ර අපාත්‍රයි. අපාත්‍ර උදකහරණාදි ප්‍රයොජනයට ගත හැකියි.

මහණුනට සරුප්වූ මෙවැනි ය පයක් හෝ මැටිපයක් හෝ ලද්දහු විසින් ය-පය පස්වරක් ද, මැටිපය දෙවරක් ද, කාලවණ්ණ වන සේ පිළිස්සියයුතු. (-එක්වරින් කාලවණ්ණ වේ නම් ප්‍රමාණයයි ද යෙත්.) ප්‍රථමකඨිනයෙහි කී සේ පැරණි පය පසුදුරා, අලුත් පය දසදිනතුළ ඉටියයුතු. නො එසේ වතොත් පළමුපය නො පසුදුරා අලුත් පය විකැපියයුතු. ඉටියහැක්කේ එක්පයෙකි. විකප්පනයට කෙතරම් වුවත් වටී. සම්පසථ හෝ දූරසථ හෝ පාත්‍රය කයින් ද වදනින් ද ඉටිය හැකියි. මේ අධිෂ්ඨාන විකප්පනයට හසුවන්නේ කාලවණ්ණ කළ පාත්‍රයෙක්මැයි.

අනෙකකුට දීමෙන් ද, ගිහිවීමෙන් ද, මරණයෙන් ද, ලිඟුපෙරළීමෙන් ද, පසුදිරීමෙන් ද, මුවවිටින් යට දෑඟුලෙන් ඔබ තණඹලක් නික්මිය හැකි සිදුරෙන් ද ඉටත් බිඳේ. චොරහරණ-විස්සාසගාහයෙන් ද ඉටත් නැතිවිය හැකියි. "මගධ නැළි නම් මැදුම් පිරිමිනියක්හු අතින් අටපතක් ගන්නා නැළිය" යනු සිඛවළඳ විනිසයි.

---

## 22. ඌනපඤ්චබන්ධන සික්ඛා.

### 164. ඌනපඤ්චබන්ධනෙන.

(**ඌනානි පඤ්චබන්ධනානි අස්ස පත්තස්සා'ති-ඌනපඤ්චබන්ධනො.**) පිළියම් පසෙකින් අඩු පාත්‍රයක් ඇති වැ නො නෑ නො පැවරුවන් ගෙන් අලුත් පයක් ඉල්ලා ගනී නම්, නිසගිපචිති වේ. **'චෙතාපෙය්‍ය'** යන්නෙන් නො නෑ නො පැවරුවන්ගෙන් විඤ්ඤත්තියෙන් ලබාගැන්ම කියැවේ.

මැටිපයෙක මුවවිටින් යට ඉරක් ගියහොත් ආමිස නො රඳන සේ පිළියම් දෑමියයුතුය. දෙඅඟලට එක් පිළියම බැගින් ගෙන, දසෙ ඟුලක් දික් හිරක් ගියේ නම්, පිළියම් කළ ද එය අපාත්‍රයි. අන් කිසකට යෙදිය හැකියි. මෙසේ වූ විට විඤ්ඤත්තියෙන් පයක් ලබා ගත ද නිදොසි. තන් තන් තැන හිරි පසක් ගිය ද පුණෝකතක්‍රමය මැයි. ය-පය කෙතරම් සිදුරු වුවත් තඹලෝ ආදියෙන් අමිස් නො ලග්නා සේ මට කොට බැන්දහැකි නම්, එය ම **පරිභොග** කළ හැකියි. ආමිස ලැගෙතොත් අනෙකක් විනවාගත හැකියි



### 165. පත්ත පරියෙසනා.

පඝිතාත පාත්‍රයයි. **රූපියපටිග්ගහණ, රූපියසංවොහාර, දුතියපත්ත** යන ශික්ෂාවන්ගෙන් වන ආපත්තිත්‍රය සඞ්ඝයා කෙරෙන් ම නැගෙන බැවින්, විනවාගත් නවපය සඟමැද නිසජිය යුතු. ඉටූ පා ගෙන සතරපස්නමක් සීමාවට පැමිණි පසු, පා හිමියා එය නිසජා ඇවැත් දෙසන්නේය. ඉක්බිති සඞ්ඝයා ඤත්ති දුතිය කම්වදනින් පාත්‍රය ගන්වන මහණකු සම්මත කෙරේ. ඒ භික්ෂුව සඞ්ඝස්ථවිරයන් වෙත පැමිණ නිසජු පයේ ඇති ගුණ කියා ඔවුනට දියයුතු. ඔවුන්ගේ පය දෙවැන්නාටත්, දෙවැන්නාගේ පය තෙවැන්නාටත් යන ක්‍රමයෙන් මාරුවී ගොස්, ඉතිරිවන කෙළවර සිටියහුගේ පය විනවාගත්තහුට දියයුතු. (නො කැමැති නිසා හෝ අපිස් බව නිසා හෝ භික්ෂූන් නො ගත ද වරද නැත.) ඒ භික්ෂුව ද ලැබූ පාත්‍රය දුප්පරිභොග නො කොට සෙසු පා සේ පරිභොග කළයුතු. කාලවණ්ණ නො කළ ද, ප්‍රමාණයුක්ත පාත්‍රයක් විනවා ගැනීමේ දී මේසිඛයෙන් ඇවැත් වේ.

7. **අනාපත්ති**-තමාගේ පාත්‍රය චොරහරණාදියෙන් නටකල්හි හෝ බිඳීගියකල්හි හෝ නො නෑ නො පැවරුවන්ගෙන් විනවා ගත ද ඇවැත් නැත. සඞ්ඝවශයෙන් පැවරුවහුගෙන් පඤ්චබන්ධන ඇති විට ද, පුද්ගල වශයෙන් පැවරුවහුගෙන් හෝ නෑයන්ගෙන් හෝ උනුපස්බාන් ඇනිව ද විනවාගතත් නිවරදයි. සිය ධනයෙන් ගත ද මැනැවි.

9. **අඞ්ග**-අධිෂ්ඨිතපාත්‍රය උනුපස්බාන් බව, තමා සඳහා විනවීම, නො නෑ නො පැවරුවන්ගෙන් විනවීම, ප්‍රතිලාභය යි සිවුරඟි.

——:o:——

## 23. භෙසජ්ජ සික්ඛා.

### 166. පටිසායනීයානි.

වැළඳියයුත්තේ පිළිගත් දෑයයි. නො පිළිගත් බව දත දත අනුභව කරනු පිණිස සියතින් ගෙන තැබූ දෑය (-උග්ගහිතය) පටිසායනීය නො වේ. එබැවින් අටවැනි අරුණ නැඟුණ ද නිසගි නො වේ. බෙහෙතින් සිදුවන කිස කැරුණ ද නො කැරුණ ද ගිතෙල් ආදියට භෙසජ්ජනාමය ව්‍යවහාතයි

මස් කැප සතුන්ගේ **ගිතෙල් ද වෙඬරු ද** නිසගිවත්ය. අකැපවූවන්ගේ ගිතෙල් ද වෙඬරු ද පිළිගෙන සත්දිනක් ගෙවාලීමෙන් දුකුළා වේ. තනකිරි වුව ද කැප බව පැනේ පෙර බත

පිළිගත් ගිතෙල් එදින පෙරවරු අන් ආමිස හා මුසු කොට ද, පස්බත පටන් සත්දිනක් මුසු නො කොට ද වැළඳිය හැකියි. පෙරබත තමා පිළිගත් වෙඬුරින් අනුපසපනකු ගිතෙල් කළහොත් පෙරබත සාමිසවත් වටී. තමා කළහොත් නිරාමිස ව වටී. පෙරබත තමා පිළිගත් කිරි - දී - තල ආදියෙන් අනුපසපනකු කළ ගිතෙල් ද නවනීත ද තෙල් ද එදා පෙරවරුයෙහි සාමිසව වුවත් වළඳනු වටී. තමන් කළහොත් නිරාමිස ව වැළඳියයුතු. ගිතෙල් ආදිය නො ව තත්වස්තුව පිළිගත් බැවින් පස්බත පටන් අනුභව නො කළයුතු.

තල අබ මී එරඬු වසා යන **තෙල්** නිසගිවත්ථ. පෙළෙහි නො ආ පොල්තෙල් කොසඹතෙල් ආදිය පිළිගෙන දින සත ඉක්මවීමෙන් දුකුළායි. මිනිස්වසා හැර සියලු සතුන්ගේ **වසා තෙල්** වටී. පෙරවරු තමන් වසා පිළිගෙන පිසා පෙරා ගතහොත් නිරාමිස ව දිනසත වැළඳියයුතු. පස්බත පිළිගන්නට ද කරන්නට ද නො වටී. (භික්ෂූනට කිසියම් ආමිසක් පිසිය නො හැකිය. එහෙත් වසා හැකිය, කිරි මෝරු ආදිය වරක් පැසුණු කල්හි, පුනපාකය අනුඥාත බැවින් ගිනිදමන්නට වටී.)

කණවේමැසි, මීමැසි, බමරමැසි, දඬුවෙල්බැමැසි යන මොවුන් කළ **මී නිසගිවත්ථ**. පැණි නො වැකුණු මීවද ද මීඉටි ද **යාවජ්ජීවිකයි**.

උක්වලින් ලබාගත් දියමුසු වූ ද, නුමුසුවූ ද කසට රහිත රසය ද පැණිහකුරු ද **සත්තාහකාලිකයි**. දියමුසු උක්සකුරු අගිලනාවත් වටී. ඇල්දියේ දමා රසය දියට ආකල නො මැඩ ගත් මීරසයෙන් කළ පැණි දුකුළාවත්ථ. (**'අමද්දිතබ්බා කතනාති කොචි. තස්ස කාරණං න දිස්සති'** යනු **විමතිවිනොදනියි**.) අඹ-ඉඳි-කෙසෙල් ආදි යාවකාලික ඵලවලින් කළ පැණි **යාවකාලිකමැයි**.

නිසගිවූ බෙහෙත් නිසජා ඇවැත් දෙසියයුතු. නැවත ලැබ නිස්සට්ඨ චීවර සේ පරිභොග කළ නො හේ. ඇඟ ගැල්වීමටවත් නො වටී. පහන් දැල්වීම ආදිය පිණිස යෙදිය හැකියි. සෙසු භික්ෂූන්ගේ කායික පරිභොගයට ද සුදුසුයි.

167. **තානි පටිග්ගහෙත්වා.**

මෙයින් ගිතෙල් ආදියේ මුල් වස්තුව වූ ක්ෂීරාදිය පිළිගැන්ම වැළකේ. වසා හැරයි. තමා පිළිගත් කිරි-දී ආදියෙන් අනුපසපනකු කළ ගිතෙල් ආදිය එදින පෙරවරු විනා පස්වරු පටන් නො වටී. **'සත්තාහපරමං'** යනු අසත්යෝගි දෙවනවිබත්. **'සන්නිධිකාරකං'** යනු අධ්‍යාහෘත **'ඛාදං'** යන්නට කර්ම වේ.



7. **අනාපත්ති**-ගිතෙල් ආදිය ඇඟ ගැල්වීමට ගනිමියි සත්දිනතුළ ඉටූ විට, පරිභොගයෙහි නිරපෙක්ෂතාව නිසා පිළිගැන්ම නැතිව යයි. (මේ සාරත්ථ දීපනී මතයයි.) දෙදෙනකු සතු වූවක් එකකු පිළිගෙන නො බෙදා තැබුව හොත් සත්දින ඉකුත ද ඇවැත් නො වේ. කිසිවකු විසින් පරිභොග කිරීම නො වටී. තමාගේ බෙහෙත් අන්භික්ෂුවක් පිළිගෙන තැබුව හොත් සතිය ගිය ද ඇවැත් නැත. නිසගිවීමට තමා සතු බවත්, තමා පිළිගත් බවත් වියයුතු. එකක් අඩුවූව නිසගි නො වේ. අනුපසපනකුට නිරපෙක්ෂ ව දී පසුව ලද්ද වැළඳුව ද වරද නැත. වස්තුව පරිභොග කරන අදහස වේ නම් පටිග්ගහණ විජහනය නො වේ. පිළිගත්බව, තමාසතුබව, සතිය ඉකුත් වීමයයි මේ ශික්ෂා වේ අඞ්ගත්‍රයෙකි.

——:o:——

## 24. වස්සිකසාටික සික්ඛා.

168. **මාසො සෙසො ගිම්හානං.**

මැදින් මස කාලපක්ෂයේ මුල සිට ඇසළ පුනු පෝ දක්වා වූ සිවු මස **ගිම්හානසමයයි**. ඒ ගිම්හාන සමයේ මසක් ශෙෂ ව ඇති කල්හි හෙවත් පොසොන් අවපෑළවියේ සිට ඉල් පුනුපෝ දක්වා ඇති පස්මස **වැසි සළු සොයන කාලයයි**. එහිදු පොසොන් අවපෑළවියේ සිට අමාවක තෙක් ඇති පසළොස් දින පර්යේෂණ සමයයි. කිරීමට ද කාලයය යනු **විනයඅටුවායි**. ඇසළ ශුක්ලපක්ෂයේ පසළොස් දින සෙවීම, කිරීම, හැඳීම යන ත්‍රයට ම කාලයයි. ඇසළ අවපෑළවියේ සිට ඉල් පුනුපෝ තෙක් වන වස්සාන සමයය සෙවීම, කිරීම, හැඳීම, ඉටීම යන සතරට ම ක්ෂෙත්‍රයයි. මේ පස්මස හැර සෙසු හෙමන්ත සිවුමස ද, ගිම්හානයේ මුල් තෙමස ද යන සත් මස **පිට්ඨිසමයයි.**

මේ පිට්ඨිසමය සඞ්ඛ්‍යාත සත්මසතුළ නෑ-පැවරුවන් ගෙන් හෝ නො නෑ-නො පැවරුවන් ගෙන් හෝ **"කාලො වස්සිකසාටිකාය, අඤ්ඤෙපි මනුස්සා වස්සිකසාටිකං දෙන්ති"** යනාදීන් පර්යායයෙන් සිහිපත් කරවා වැසිසළු ලබාගැනීමෙන් මේ ශික්ෂා පදයට අනුව නිසගි පචිති වේ. **"දෙථ මෙ චීවරං"** යනාදීන් නො නෑ-නො පැවරුවන් විනවා ලැබීමෙන් අඤ්ඤාතකවිඤ්ඤත්ති සිඛයට අනුව ද නෑ පැවරුවන් විනවා ලැබීමෙන් මේ සිකයට අනුව ද නිසගි පචිති වේ.

පොසොන් අවපෑළවියේ සිට ඉල් පුනුපෝ තෙක් පස්මස **කුච්ඡිසමය** හෙවත්-ඇතුළුසමය වේ. මේ කාලය තුළ (නො නෑ-නො පැවරුවන් වුවද) ඕසෙවියෙන් වැසිසළු දෙන්නන් හැර

**“කාලෙ වස්සිකසාටිකාය”** යනාදීන් සතුප්පාද කොට (-මතක් කර) නො නෑ නො පැවරූවන්ගෙන් වැසිසළු ලබාගැනීමෙන් වත්ත හෙදයෙහි දුකුළා වේ. ඔවුන් ම විනවා ලබාගැනීමෙන් **අඤ්ඤාතක විඤ්ඤත්ති** සිඛයට අනුව නිසගි පචිති වේ. සඞ්ඝයාට පැවරූවන් ගෙන් හෝ පියෙවියෙන් වැසිසළු දෙන්නන්ගෙන් (-නො පවර සිරිතක් වශයෙන් දෙන අයගෙන්) හෝ සතුප්පාද කොට ද තමාගේ නෑ පැවරූවන්ගෙන් විඤ්ඤත්ති කොට ද වැසිසළු; ලබාගැනීමෙන් ඇවැත් නො වේ.

විසමෘත වීමෙන් හෝ නො පොහෝනා බැවින් හෝ මැසීම ආදිය නො කළ හොත් (එය වැසිසළු සඞ්ඛ්‍යාවට නො යේ) වස් සාරමස ද, කඨිනය අතුළ හොත් හෙමන්ත සාරමස ද, මූලචීවරය කරතොත් ගිමන්මුල්මස ද, (හෙමන්ත පශ්චිම පොහෝදින මූල චීවර කටයුතු බැවින් එකුන්තිස් දිනෙකි ලැබෙනුයේ.) පූර්වෝක්ත ගිමන් අන්ත මස ද (වස්සුක්කඩ්ඪනය කළහොත් දෙමසයි) යන දස මස තුළ නො ඉටා නො විකපා තැබිය හැකියි.

වස්සානයට පෙර පඬුපෙවීම කප්බිඳු තැබීම ආදිය කොට වැඩ නිමකරනු ලැබ දසදිනක් ඉක්මවා සිටි සළුව වසන්දින ඉටිය යුතු. වස්වසන දිනයෙන් දිනක් දෙදිනක් ආදිවශයෙන් පෙරාතුව ලත් නිමකළ සළුව දසදින නො ඉක්මවා ඉටිය යුතු. වස්කාලය තුළ ලැබුණ ද එසේමය. වැඩ නො නිමිය හොත් දශාහාතික්‍රමණයලැබේ. එහෙත් නිමකළ දිනයේ ඉටියයුතුය. වප් පුනු පෝයෙන් පෙර ම සත්දිනක පටන් ලත් නිමකළ සළුව දසදින ඉක්මයාමට පෙර ම චීවරකාලය ලබන බැවින් නො ඉටා තැබිය හැකියි. වැසිසළුව නො කෙලේ නම් නො කළ නිසා ද, කෙළේ නම් දසාහපරමසිඛය විකොපනය නො කොට ද තැබිය හැකිය.

ගිම්හානසමයේ අවසන්මසින් පෙර සොයාගනුලැබූ ද, අවසන් මස පසඟින් පෙර හඳිනුලැබූ ද වැසිසළුසිවුර නිස්සජ්ජනය කටයුතු වේ. මෙහි නිසගි දෙකෙකි.

6. **ආපත්ති**-නිකපාචිත්තියි. වැසිසළු සිවුරු තිබියදී නග්නව එළිමහන් තැන වැස්සෙන් කය තෙමන්නහුට දුකුළාවේ. නානකොටු වැව් පොකුණු ආදියේත්, පියස්සෙන් වැටෙන ජලයෙනුත්, කළ ආදියෙන් වක් කොට ගැනීමෙනුත් ස්නානය කළ ද ඇවැත් නො වේ.

7. **අනාපත්ති**-පැහැරගනුලැබූ හෝ නටුවාවූ හෝ සෙසු සිවුරු ඇත්තහු අසමයේ සෙවූව ද හැන්ද ද ආපත්ති නැති. නො හැන්දෙත් සොරුන් ගෙන යතියි සිතා අසමයේ හඳින්නහුට



ද වරද නො වේ. මෙය මතභෙද සහිතයි. **සමන්තපාසාදිකා ව්‍යාඛ්‍යාය** එම අත්ථයොජනාව නිරකරයි.

9. අඞ්ග-අනතුද්දෙසිකතාව, අසමයෙහි සෙවීම, එයින් ලැබීමයයි සෙවීමේ දී ත්‍රයයෙක් ද; සචීවරතාව (-සෙසු සිවුරු ඇතිබව) ආපදාභාවය, සකභාවය, අසමයෙහි නිවාසනයයි හැඳීමේ දී සතරෙක් ද වේ.

——:o:——

## 25. චීවර අච්ඡින්දන සිඛා.

**169 සාමං චීවරං දත්වා.**

චාරිකාවේ දී පාත්‍රචීවර පච්චත්ථරණාදිය ගන්වා ගෙන යාම, අත්පා මෙහෙ ගැනීම ආදිය පසස්නා භික්ෂුවක්, අන් භික්ෂුවක්හට විකැපුම් පොහෝනා සිවුරක් දී, පසුව සකසඤ්ඤායෙන් පැහැරගනී නම් (සිලමනය නිසා) නිසගි පචිති වේ. මෙහි **‘දත්වා’** යන්නෙන් නිරපෙක්ෂව දීම කියැවිණ.

**170. අච්ඡින්දනය.**

අපෙක්ෂිත වතාවත් නො කරන බැවින් අසිඳ ගැන්ම විය. නිරපෙක්ෂව දුන් දෙය වුවත් “මගේ සිවුර මම ම ගන්මි” යි සව සංඥාවෙන් පැහැරගත්බැවින් පසය්හාවහාරයෙන් පරිජි නො වී. සොර සිතින් ගතහොත් පරිජි වියහැකියි. එක් සිවුරක් හෝ එකට බැඳ තැබූ බොහෝ සිවුරු හෝ අසිඳ ගැනීමෙන් එක් පචිත්තෙක් ද; එකට බැඳ නො තැබූ ද, වෙන් වෙන් ව තැබූ ද බොහෝ සිවුරු අසිඳීමෙන් වත් ගණනින් බොහෝ පචිති ද වේ. තාවකාලික කොට දුන් සිවුරු අසිඳ ගැන්මෙන් ආපත්ති නො වනබව පැනේ.

**171. අච්ඡින්දාපෙය්‍ය වා**

පැහැරගනුවයි අනෙකකුට ඇණවීමෙන් දුකුළා ද, පැහැර ගැන්මෙන් පචිති ද වේ. ආණත්තයා අවශ්‍යයෙන් ම ගනී නම් ඇණවූ කෙණෙහි ම පචිතිය වන බව **විමතිවිනොදනිය** කියයි.

6 **ආපත්ති**- නිකපාචිත්තියි. උපසම්පන්නයකුගේ විකැපුම් පොහෝනා සිවුරක් හැර සෙසු පාත්‍රාදි පිරිකරක් හෝ, අනුපසපතකුගේ කවර පිරිකරක් හෝ තමාගේය යන හැඟීම ඇතිව ගැනීමෙන් දුකුළා වේ. අනුපසපන් කල්හි දී උපසම්පදා ලත් පසු ගැන්මෙන්ද පචිතියි. විශ්වාසයෙන් ගැන්මෙන් පචිති නො වේ.

9. **අඞ්ග**-විකප්පුම්පොහෝනා සිවුරක්බව, තමා විසින් දෙනලද්දක් වීම, තමා අයත්යයි සිතීම, උපසපන් බව, ක්‍රොධ සිතින් ගැනීම.

—||—

## 26. සුත්ත විඤ්ඤත්ති කථා.

**172. සාමං සුත්තං විඤ්ඤාපෙත්වා.**

අනුලොම් හූ සහිත බොමාදි සවැදෑරුම් නූල් අතුරෙන් යමක් ඉල්ලාගෙන අකැප පෙහෙරකු ලවා වස්ත්‍රයක් වියවාගතහොත් නිසගි පචිති සිදු වේ. **'සාමං'** යි කිව ද තමන් පමණක් නො ව අන් භික්ෂුවක් විනවාගෙන නැබූ හුසින් වියවූව ද පචිති වේ. එහෙයින් මේ 'සාමං' යන්න 'වායාපෙය්‍ය' යන්න හා සබඳ කොට, **"සාමං වායාපෙය්‍ය=තමා සඳහා වියවාද"** යන අරුත ඇතැමෙක් ගනිති. නො නෑ නො පැවරූවන්ගෙන් ඉල්ලාගත් අකැපනූල්ය මෙහි කියැවුණේ.

**173. වායාපෙය්‍ය.**

**'චීවරං මෙ ආවුසො වායථ'** යනාදි අකැපවිඤ්ඤත්තියෙන් වියවීමයි. නෑ පැවරූ පෙහෙරන් ලවා එසේ කියා වියවා ගතහැකියි. කැපනූලින් නො නෑ නො පැවරූ පෙහෙරකු ලවා **'සුත්තම්පි, වායාපෙසෙතා නත්ථි'** යනාදි පර්‍යායමුඛයෙන් කියා වියවාගත ද ඇවැත් නො වේ. පෙහෙරා නෑයෙක් හෝ පැවරූවෙක් හෝ මිල දී හත්ථ-යොදුගනුලබන්නෙක් හෝ වේ නම් හේ කැප පෙහෙරෙකි. කම්ම යාචනවශයෙන් ද කරවාගත හැකිබව ඇතැම් පොතෙක පෙනෙතුදු මේ සික්ය අනුව එයින් ද ඇවැත් වනබව **විනයාලඞ්කාරයෙහි** එයි. නෑ ආදීන් ගෙන් ලත් නූල් කැපයි.

අකැපනූලින් අකැප පෙහෙරකු ලවා වස්ත්‍රයක් වියවා ගැනීමේ දී පෙහෙරා යන්ත්‍රය සඳහා **තුරි** (-වියූ කොටස හකුළාතබන සතරැස් දණ්ඩ) **වෙම** (-නූල් තද කරන උපකරණය) පිළියෙළ කිරීම ආදි පූර්ව ප්‍රයොගයන් කරනකල්හි භික්ෂුවට දුකුළා ඇවැත් වේ. පශ්චිම චීවරප්‍රමාණය වන දිගවියත් පළල රියන්පමණ කොටසක් වියූ කල්හි නිසගි පචිති වේ. නූල් තමා සතුහෙයින් වියූ කොටසින් කොටස ද තමන් සතුවන හෙයිනි. පමණ වැඩිවීමේ දී කොටසින් කොටස නවත් ඇවැත් වේ. කැපනූලින් විඤ්ඤත්ති කොට වියවීමෙන් ද, කැප පෙහෙරා ලවා අකැපනූලින් වියවීමෙන් ද දුකුළා වේ. නිසගි නො වන පිණිස යන්ත්‍රසඑවූ වස්ත්‍රය අධිෂ්ඨාන කළ හැකියි. නැවත නැවත වියූ කොටස් ඉරීම අනාවශ්‍යකයි. කැප-අකැපනූල් මුසු කොට වියවීමෙන් ද ඇවැත් වේ.



7 **අනාපත්ති**-චීවරසිබ්බන, ආයොග, කායබන්ධන, අංසවට්ටක, ථවිකා, පරිස්සාවනාදිය සඳහා විනවාගැනීමෙන් ද; නෑ පැවරූවන් ලවා කැපනූලින් වියවීමෙන් ද, අන්භික්ෂුවක් සඳහා වියවීමෙන් ද, තමාගේ කැප ධනයෙන් ගැනීමෙන් ද, මේ සික්ය අනුව ඇවැත් නො වේ. අනාණත්තිකය සුත්තවිඤ්ඤපන වශයෙනි.

———

## 27. පෙසකාර සික්ඛා.

**174. පුබ්බෙ අප්පවාරිතො**

"කවරවස්ත්‍රයක් වූවමනා ද? කෙබන්දක් වියවම් ද? කියන්නැ" යි වස්ත්‍රහිමියා විසින් නො පවරනලද භික්ෂුව, රෙද්ද වියන පෙහෙර කරා ගොස්, දායකයා ගේ අදහසට වැඩිවූ විධානයක් හෙවත්-අකැපවිධානයක් කෙරේ නම් පචිති වන බව මේ ශික්ෂා පදයෙන් පැවැසේ. **"ඉදං බො ආවුසො"** යනාදිය ඒ විධානය කරන අයුරු දක්වන වාක්‍යයි. **ආයත, විත්ථත, අප්පිත** (=ඝන කිරීම) යන තුනින් නූල් අධික වේ. එයින් ඇවැත නැගේ. **සුවීත** (=සමව වියීම) **සුප්පවායිත** (=සම ව නූල් එළීම) **සුවිලෙඛිත** (=තුනී කිරීම) **සුවිතච්ඡිත** (=මනාව මැදීම) යන සතර වියන ආකාරය ම දක්වයි. **"කිඤ්චිමත්තං අනුපදජ්ජෙය්‍යාම"** යනු කිව ද, පිණ්ඩදාන ධම්මදානාදිය ඇවැත සිදු වීමට ආවශ්‍යක නො වේ. මහණහුගේ කථාව නිසා රෙදි හිමියාගෙන් අධික නූල් ලබාගෙන ආයතාදි යමක් කෙරේ නම් භික්ෂුවට දුකුළා වේ. වස්ත්‍රය ලත්පසු පචිති වේ.

7. **අනාපත්ති**-ඤාතකපවාරිතානං තන්තවායෙහි, අඤ්ඤස්ස වා අත්ථාය, අත්තනො වා ධනෙන, මහග්ඝං වායාපෙතුකාමං අප්පග්ඝං වායාපෙන්තස්ස.

9. **අඞ්ග**-අඤ්ඤාතක අප්පවාරිතානං තන්තවායෙ උපසඞ්කමිත්වා විකප්පමා'පජ්ජනතා, චීවරස්ස අත්තුද්දෙසිකතා, තස්ස වචනෙන සුත්තවඩ්ඪනං, චීවරපටිලාභො.

——(◦)——

## 28. අච්චෙකචීවර සික්ඛා.

**175 කත්තිකතෙමාසිපුණ්ණමං**

(අච්චන්ත සංයොගෙ දුතියා, දස අහානි-දසාහං, දසාහෙන අනාගතා-දසාහානාගතා පුණ්ණමා) යන්නට විශෙෂණයි.) මහා පවාරණ දිනය වන වප් පුනු පෝයෙන් පෙර දසදිනක සිට යන අදහසයි. එම ශුක්ලපක්ෂයේ පස්වැනි දින සිට, තෙමසට අයත්

පවාරණ දිනයත් සමඟ එකොළොස් දින තුළ උපන්, ඉක්මන් සිවුරු පිළිබඳ නිධානමුඛය මෙයින් දක්වේ. පසළොස්වකියෙහි ලත් චීවරයට පුණ්ණමියෙන් පෙර ම අරුණු දසයක් ඉක්මගිය ද, මේ සිකපදයට අනුව නිසගි නො වේ. පුණ්ණමිය සමඟ එකොළොස් දිනක් තැබියහැකියි. පසළොස්වකියේ **උපන්** අනච්චෙකචීවරය දසදින ඉක්මවා තබාගැනීමෙන්, චීවරමාසය ලැබීමට පෙර ම ඇවැතට පත් වේ. එකොළොස් වන අරුණ වස්කාලයේ ම උදාවන බැවිනි. සවැනි දින පටන් ලැබුණු අනච්චෙකචීවරත්, පසුදුරා තැබූ සිවුරුත්, සෙසු අතිරේකචීවරත්, පඨමකඨින සිඛයට අනුව චීවරමාසය අවසන් වන තෙක් නිසගි නො වේ.

**176 අච්චෙකචීවරං.**

යුදසෙන් හා යන්නකු හෝ ගිලනකු හෝ ගැබිනියක හෝ ක්ෂණික ශ්‍රද්ධා ලාභියකු හෝ වුත්ථවස්ස වීමට පෙර ම භික්ෂූන් කැඳවා හෝ භික්ෂූන්වෙත එළඹ හෝ 'වස්සාවාසික දෙමැ'යි දුන් වස්ත්‍ර **අච්චෙකචීවර** හෙවත් ඉක්මන් සිවුරු නමි.

**177 උපපජ්ජෙය්‍ය.**

පෞද්ගලික ව ලැබීමයි. වස් වසන සඞ්ඝයාට පසළොස්වකියෙන් පෙර ලැබුණු අච්චෙකචීවර වුවත් පස්වෙනිදා බෙදාගත හොත් මේ පරිහාර ලැබේ. පස්වැනිදා පටන් සඞ්ඝයාගෙන් හෝ ගණයාගෙන් හෝ පෞද්ගලිකවශයෙන් හෝ තමාට ලැබුණු අච්චෙකචීවර ගැන මේ සිකපදයෙන් පැවසේ. පස්වැනිදාසින් පෙර පෞද්ගලික ව ලද හොත් මේ පරිහාර නැත. නො බෙදා තැබූ වස්ත්‍ර නිසගි නො වේ. මේ සිකපදය පුණ්ණමියෙහි නිසගි නිවාරණයට පැනවුණු බව **පතිස්සමතයයි.**

**178 යාවචීවර කාලසමයං නික්ඛිපිතබ්බං**

කඨිනය නො අතුළහොත් පැසුම් වස් මස ද, අතුළහොත් පස්මසක් ද චීවරකාලයයි. මේ කාලය තුළ නො ඉටා නො විකපා තැබියහැකියි. අච්චෙකය ලත් භික්ෂුව හැඳිනගැන්මට ලකුණක් එහි කොට තැබියයුතුය. වස්සච්ඡේදය වුව හොත් වස්ත්‍රය සඞ්ඝික වන බැවින් දීමේ පහසුව පිණිසයි.

**"කාමං චෙ'ස දසාහපරමං අතිරෙකචීවරං ධාරෙතබ්බන්ති ඉමිනා'ව සිද්ධං අනුප්පත්තිවසෙන අපුබ්බං විය අත්ථං දස්සෙත්වා සික්ඛාපදං ඨපිතං"** යන අට්ඨවා වැකිය සඳෙහය යනු ටීකාමතයි. මේ අර්ථය සිද්ධවීමට නම් **"නවාහානාගතං කත්තිකතෙමාසිපුණ්ණමං"** යනුවෙන් පාඨය වියයුතු බව ද **"ජුණ්හපක්ඛපඤ්චමිතො පට්ඨාය"** යනුත්, **"අච්චෙකචීවරස්ස අනත්ථතෙ**



**කඨිනෙ එකාදස දිවසාධිකො මාසො'** යනුත් අට්ඨවාපාඨය හා නො ගැළපෙන බව ද හේතුවශයෙන් පැවසේ. එහෙත් පුණ්ණමිය හැර දසදින කී නිසා නිවැරදියයි **අත්ථයොජනාවේ** ප්‍රකාශිතයි. නො ඉටා නො විකපා පූර්වෝක්තචීවරකාලය ඉක්මවාලීමෙන් නිසගි පචිති වේ.

9. **අඞ්ග**- විකප්පනූපග පච්ඡිමප්පමාණස්ස අච්චෙකචීවරස්ස අත්තනො සන්තකතා, දසාහානාගතාය කත්තිකතෙමාසිපුණ්ණමාය **උප්පන්නභාවො**, අනධිට්ඨිත අවිකප්පිතතා, චීවරකාලාතික්කමො.

——:o:——

## 29. සාසඞ්ක සික්ඛා.

**179 උපවස්සං.**

(පෙර කිරියෙකි. බිඳුව ආගමජයි. **'විහරන්තෙන'** යනු හා සබඳි.) වස්සච්ඡේදය නො කොට තෙමස ගෙවා යන අරුති. වස් වැස අවසන්කළ පමණින් **අසමාදානචාරය** නො ලැබේ. කෙළින් අතුළ යුතුය. නො එසේ වුවහොත් මේ සිකපදය නිරර්ථ විය හැකියි.

**180. කත්තික පුණ්ණමං.**

('නික්ඛිපෙය්‍ය' යන කිරිය හා සබඳ වීමෙන් අසත්යෝගි දෙවන විබති.) වප්කාලපක්ෂයේ පැළවියේ පටන් ඉල් පුනු පෝ තෙක් එකුන්තිස්දින මුළුල්ලෙහි හෙවත් චීවර මාසයතුළ යන අදහසයි.

**181. ආරඤ්ඤකානි.**

ගම්දොර එළිපත (-ඉන්ද්‍රඛීලය) පටන් දුනු පන්සියයක් දුරින් පිහිටි සෙනාසනයයි. (ඇජර දුන්න හෙවත්-යොධ දුන්න නවවියති. දුනුලනුව දෑමූවිට වියතක් ඌනව සිවුරියන් වේ.) පරික්ෂිප්ත ග්‍රාමයේ දොරටු එළිපතත්, අපරික්ෂිප්ත ග්‍රාමයේ පරික්ෂේපයට සුදුසු තැනත් (එනම් කෙළවර පිහිටි ගෙහි **උප**චාරයේ සිට ගැසූ ගලක් වැටෙන තැන.) පරික්ෂිප්ත විහාරයේ පරික්ෂේපයත්, අපරික්ෂිප්ත විහාරයේ ගමට ආසන්න ව පිහිටි සෙනස්නත් (-සෙනසුන් උපචාරයේ සිට ගැසූ ගලක් වැටෙන තැන පටන් යනු **මජ්ඣිමභාණකමතයි.**) අතර පියෙවි මඟින් දුර මිනිය යුතු

**182. සාසඞ්ක සම්මතානි.**

('සාසඞ්කානි ඉති සම්මතානි, 'ආරඤ්ඤකානි' යන්නට විශේෂණයි.) ආරාම-ආරාමූපචාරයන්හි සොරුන් කඳවුරු බැඳ වුසු තැන් ද, භුත්ත-ඨිත-නිසින්න-නිපන්න ස්ථානයෝ ද පැනෙත්නම් ඒ සෙනසුන **සාසඞ්කසම්මතයි.** මිනිසුන් මැරූබව ද, කැපූබව ද, බඩුපැහැරගත් බව ද පෙනේ නම් **සප්පටිභයයි.**

**183.** **අන්තරඝරෙ නික්ඛිපෙය්‍ය.**

මෙබඳු අරන්සෙනසුනෙක වසන මහණහු විසින් කැමැත්ත ඇතහොත්, හාත්පස පිහිටි ගොදුරුගම් අතුරින් පිසියෙන ගමෙක, ඉවූ තෙසිවුරෙන් එක් සිවුරක් මුළුමස ම තබා, සෙනසුනෝ දවස් තහාලිය හැකිසි. තිසඟි නොවේ. මෙය සිදුවීමට අඞ්ගසතරක් පිරී තිබියයුතුය

1. පෙරවස් වැස මහපවුරුණින් පවාරිත වීම. (පවාරණය අඞ්ගයෙක් නො වේ. වස් නො සිඳීම පමණි. පසුවස් වුසුවහු විසිනුත්, සුන්වස් වූවහු විසිනුත් නො ලද හැකිසි.)
2. චිවරමාසය එළඹ සිටීම, ඉන් මතු දිනෙකුදු නො ලැබේ.
3. පඤ්චධනුසතික සෙනස්නේ විසීම, (මින් අඩුව පිහිටි හෝ ගව්වට ඩිඩා දුරු ව පිහිටි හෝ සෙනසුන අඞ්ග නො වේ. පිණ්ඩපාතයට ගොස් නැවත බත්වේලාවට ආපසු පැමිණීමට හැකි තරම් දුර පිහිටි සෙනස්න ගැනේ.)
4. සාසඞ්කා හෝ සප්පටිභය හෝ වීම. එකෙකුදු පමණි.)

**184.** **සියා ච තස්ස=ඡ=විප්පවාසාය.**

අන්තරඝරයෙහි සිවුර තබා තම සෙනස්නේ වසන්නහුට මුළු චිවරමාසයේ ම චීවරවිප්පවාසය නො වේ. ගමේ සිවුර තබා, තම සෙනස්නෙන් නික්ම අන් ගමනක් ගියහුට සරුයක් සෙනසුනෙන් වෙන් ව විසියහැකිසි. තම වෙහෙරෙහි හෝ සිවුර තැබූ ගමැ සුදුසු තැනෙක හෝ සිට සත්වැනි අරුණ නංවාලියයුතු.

ගොදුරු ගමින් පෙරදිග වෙහෙර වෙයි. භික්ෂුව ගමන ගියේ බටහිරටය. (ගම පසු කොට ගිය බව පැනේ.)තම සෙනසුනට අවුත් සත්වැනි අරුණ නංවාලිය නො හැකි නම්, ගාමසීමාවට පැමිණ, අම්බලම් ආදි සුදුසු තැනෙක සිට අරුණ නංවා, සිවුරු තතු විමසා යායුතු එසේත් කළ නො හැකි සේ දුරු තෙනකට ගියේ වේ නම් එහි සිටම සිවුර පසුදිරියයුතු. එවිට එය අතිරේකචීවරයෙක් වේ. ගාමූපචාරයේ අන් වෙහෙරෙක වුවත් අරුණ නංවාලිය නො හේ. මෙහි කී සම්මුතිය නම්, දුතියකඨිනයෙහි දැක්වූ ගිලනාට ලැබෙන විප්පවාසසම්මුතිය යි.

**9.** **අඞ්ග**-අධිට්ඨිත චීවරතා, අනත්ථත කඨිනතා, අලද්ධ සම්මුතිතා, ඡාරත්තතො උත්තරි විප්පවාසො.

——



# 30. පරිණත සික්ඛා.

**185.** **ජානං සඞ්ඝිකං ලාභං.**

සඞ්ඝයා සතු දැය සඞ්ඝිකයි. මෙය සඞ්ඝයාට පරිත්‍යක්ත වූවක් අතට පැමිණියක් නො වුව ද, සඞ්ඝයාට යොමු ව පැවතුණ හෙයින් සඞ්ඝිකයයි කියැවිණ. ලැබියයුතු සිවුපසය ම- යටත් පිරිසෙයින් සුනු පිඩකුදු, දැහැටිදඬෙකුදු ලාභ නම්. සඞ්ඝයාට දෙම්හයි කයින් වදනින් පිරිනැමූ වස්තුව පරිණත නම්.

**186.** **අත්තනො පරිණාමෙය්‍ය**

'අපට දෙව'යි තමනට පිරිනමවා ගැනීමට කරන ප්‍රයෝගයන්හි දුකුළා ද, අතට පත් සඳ පචිති ද වේ. සඟනට දුන් දෙය නො ගතයුතු. පෙරළාදියයුතු. නො දුනහොත් අගය අනුව පරිජි ද වියහැකිසි. මේ සිඛයේ දී නෑපැවරුවන්ගෙන් පිරිනමවා ගත ද මිදීමෙක් නැත. එක් වෙහෙරෙක සඟනට පිරිනමනලද්ද, අන් වෙහෙරක සඟනට හෝ චෛත්‍යකට හෝ පුඟුලකුට හෝ පිරිනමවා නම්, එක් චෛත්‍යකට පරිණතය අන්‍ය චෛත්‍යකට හෝ සඞ්ඝයාට හෝ පුද්ගලයනට හෝ පිරිනමවා නම්, එක් පුඟුලකුට පරිණතය අන් පුඟුලකුට හෝ සැයකට හෝ සඟනට හෝ පිරිනමවා නම් දුකුළා වේ. (එක් සුනඛයකුට පිරිනමනලද්ද අන්‍ය සුනඛයකුට පිරිනමා නම් දුකුළා වේ. එහෙත් පරිත්‍යක්ත පසු ඔහු පලවා අනෙකකුට දිය හැකිසි.)

9. **අඞ්ග**-සඞ්ඝෙ පරිණත භාවො, තං ඤත්වා අත්තනො පරිණාමනං, පටිලාභො. සඞ්ඝයාට පිරිනමන ලද්දෙකි යන සංඥාව නො වී නම් ඇවැතින් මිදෙන බැවින් සඤ්ඤාවිමොක්ඛයි.

**පත්ත වග්ගො තතියො.**

**නිස්සග්ගියා නිට්ඨිතා.**

——/०/——

# 1. මුසාවාද සික්ඛා.

**187.** **සම්පජාන මුසාවාදෙ.**

('මුසා අභූතස්ස වාදෙ-මුසාවාදෙ' නිපාතය හා තප්පුරිසසමාසයි 'සම්පජානස්ස මුසාවාදෙ-සම්පජානමුසාවාදෙ' තසම්. මෙහි නිමිත්තාර්ථයෙහි සප්තමියි.)

කීමට පෙරත් කියන කෙණෙහිත් 'මුසාවක් කියමි'යි දත්තහුගේ, නො වූවක් වූ හැටියට ද, වූවක් නො වූ හැටිය ද, කයින් වදනින් හැඟවීම නිමිති කොට පචිති ඇවැත් වේ. "සුද්ධචෙතනා

වා සුද්ධසද්දෙ වා සුද්ධවිඤ්ඤත්තිනි වා මුසාවාදො න හොති, විඤ්ඤත්තියා සද්දෙන වා සඤ්ඤා තං සමුට්ඨාපිකාචෙතනා මුසාවාදො" යනු සාරත්ථ දීපනීයි. උතුරු මිනිස්ධම්හි මුසවා කීමෙන් පරිජි වේ. පරියායෙන් කීවා දත වූලැයි ද, නො දත දුකුළා ද වේ. අමුලු පරිජියෙන් මුසවා කීමෙන් සඟවෙසෙස් ද සඟවෙසෙසින් යීමෙන් පචිති ද වේ. ආක්‍රොශ සඳහා සත්ඇවැතින් මුසවා කියා හැවුව ඔමසවාදපචිති වේ. සස්නෙන් පහ කරන්නට ආචාර-විපත්තියෙන් මුසවා කිව දුකුළා වේ. හුදක් මුසා බණන්නහුට මේ සිකපදය අනුව පචිති වේ.

"සො පන සාමණෙරෙන අපි භන්තෙ මය්හං උපජ්ඣායං පස්සිත්ථා'ති වුත්තො කෙළිං කුරුමානො තව උපජ්ඣායො දාරුසකටං යොජෙත්වා ගතො භවිස්සති'ති [සන්නිට්ඨානං කත්වා වුත්තත්තා]...... එවං නෙව දවා න රවා අඤ්ඤං භණති, සො ආපත්තිං ආපජ්ජතියෙ'ව" යනු අටුවායි.

ඉක්මන් කම නිසා වහා නො විමසා දුටුවක් නො දුටුවෙමියි (=දවා) කියන්නහුට ද, මුළු සවභාව බැවින් කියනු කැමැති අර්ථය තබා අනෙකක් (=රවා) කියන්නහුට ද ඇවැත් නො වේ.

9. අඞ්ග-වඤ්චන අදහස පෙරටුවීම, කියනු කැමැති අර්ථය අන්‍යයාට හඟවනු පිණිස කාය-වාක් දෙකින් උත්සාහ කිරීමයයි දෙකෙකි. "වඤ්චනාධිප්පායස්ස හි අසති විසංවාදනපුරෙක්ඛාරතාය විඤ්ඤත්තියා'පි මුසාවාදො න හොති. දුක්කටමත්ත මෙ'ව හොති. තස්මා ඉදං'පි අඞ්ගමෙවා'ති ගහෙතබ්බං" යනු විමතිවිනොදනියි.

---

## 2. ඔමසවාද සික්ඛා.

**188. ඔමසවාදෙ.**

කන සිත පාරවන නින්දා බස් බිණීම ඔමසවාදයයි. බමුණු සැඩොල් ආදි **ජාතිය**, අවකණ්ණක (-කන් කොටා. දුස විශෙෂයක් සි ද යෙත්.) බුද්ධරක්ඛිතාදි **නාමය**, කොසිය ගොතමාදි **ගොත්‍රය**, පුස්සඩු ගොවිකම් ආදි **කර්මාන්තය**, නළකාර මුදුදි **ශිල්පය**, මධුමෙහාදි සියලු **රොගය**, අතිදීඝතාතිදීඝාදි **ලිඞ්ගය**, රාගාදි **ක්ලෙශය**, පරිජි ඈ **ආපත්තිය**, ඔටුයෙහි ගොන්හි යනාදි **ආක්‍රොශය** යන දශ ආක්‍රොශවස්තුවෙන් (-සත්‍ය වේවා, අසත්‍ය වේවා) පරිජි අවින් හෝ නො අවන් හෝ මිහණකුට වචනයෙනුදු හස්තමුද්‍රාවෙනුදු අන්‍යාපදෙස රහිත ව ඉදුරා ආක්‍රොශ කිරීම නිමිති කොට වචනයක් පාසා පචිති වේ.



මේ දශ ආක්‍රොශ වස්තුවෙන් ම **'සන්ති ඉධෙකච්චෙ චණ්ඩාලා'** යනාදීන් පර්‍යායයෙන් හවන්නහුට ද, **'චොරොසි'** යනාදීන් පෙළෙහි නො ආ හැවිලියෙන් හවන්නහුට ද, එ දෙකින් ම අනුපසපනකු (-භික්ෂුව හැර අදහස දන්නා තිරිසනා තෙක් සියල්ලන්) හවන්නහුට ද, දුකුළායි නො හමුයෙහි එසේ නින්දාබස් කියන්නහුටත් දුකුළාවේයයි යෙත්. කෙළනා අදහසින් (-සිනාවට) කවරකුට නමුදු හමුවෙහි හෝ නො හමුවෙහි හෝ නින්දාබස් බණන්නහුට දුබ්භාසිතාපත්ති වේ.

7 **අනාපත්ති-'චණ්ඩාලො'සි'** යනාදි පෙළෙහි අර්ථ වනන්නහුට ද, එම පෙළ කියන්නහුට ද, අනුශාසන අදහස් ඇත්තහුට ද ඇවැත් නො වේ

9. **අඞ්ග**-යං අක්කොසති තස්ස උපසම්පන්නතා, අනඤ්ඤාපදෙසෙන ජාති ආදිහි අක්කොසනං, මං අක්කොසතීති ජානනා, අත්ථපුරෙක්ඛාරාදීනං අභාවො.

කායවිකාර මාත්‍රයෙනුදු ඔමසන සිදු වන හෙයින් කාය-චිත්ත, වාචාචිත්ත, කායවාචාචිත්ත යන ත්‍රිසමුට්ඨානයි. දුබ්භාසිතාපත්තිය වාචාචිත්තයෙන් සිදු වේ. කය එහිලා අඞ්ගභාවයෙන් නො සැලකෙන බවත්, කායකීළා පටික්ඛෙප සිඛයෙන් දුකුළා විය හැකි බවත් **විමතිවිනොදනියි**.

—∘—

## 3. පෙසුඤ්ඤ සික්ඛා.

**189 භික්ඛු පෙසුඤ්ඤෙ.**

(භික්ඛූනං පෙසුඤ්ඤෙ.) භික්ෂුවක් අන් භික්ෂුවකට පෙර කී දශ ආක්‍රොශවස්තුවෙන් ආක්‍රොශ කරනු අසා ප්‍රියබව සඳහා හෝ ඔවුන් දෙදෙනා බිඳවනු සඳහා හෝ කයින් වදනින් දූත්වූ සඳ හෙවත්-කේලාම් කීසඳ පචිති වේ.

අන්‍යාපදෙශයෙන් හෙවත් - පර්‍යායයෙන් කියන්නහුගේ වචන ද, පෙළෙහි නො ආ චොරාදි පදයෙන් කියන්නහුගේ වචන ද අනුපසපනකු කී ආක්‍රොශ වචන ද එළවන්නහුට දුකුළා වේ. අනුපසපනකුට කීමෙන් ද දුකුළායි. පචිති සිදුවීමට නිදෙන ම භික්ෂූහු වියයුතු වෙති. ආක්‍රොශවස්තු නො වූ ක්‍රියාවක්-වචනයක් කේලාම් විසින් කීමෙනුත් දුකුළායයි යෙත්. ප්‍රියවන බවක්, බිඳුවන අදහසක් නැති ව, හුදක් පාප්ගරහි ව "අනේ! ලජ්ජා නැතිකම, ඔබ වැන්නකුටත් මෙසේ කියන්නට සිතනවා" යනාදි කියමනෙන් ඇවැත් නො වේ.

ජාති ආදීන් ගරහන මහණහුගේ වදන් අසා අන් මහණහුට එබව දැන්වීම, පියබව හෝ බිඳුවන අදහස හෝ ඇති වීම, එය දැන්ම යයි අඞ්ගත්‍රයෙකි.

———

## 4. පදසො ධම්මසික්ඛා.

**190. පදසො.**

(කොටස යන අරුත දෙන අව්‍යයෙකි.) මහණ මෙහෙණින් හැර සෙස්සකුට පෙළදහම් උගන්වන සඳ ඔවුන් හා එකට සඟොච්චාරණ විසින් කීමෙන් පචිති වේ. පද-අනුපද-අන්වක්ඛර- අනුබ්‍යඤ්ජන සඞ්ඛ්‍යාත කොට්ඨාසයෝ මෙහි පද නම් වෙති.

**පද**-පද්‍යයේ දී ප්‍රථමගාථා පාදය ද, ගද්‍යයේ දී විභක්ත්‍යන්ත ප්‍රථම පදය ද ගැනෙන බව පැනේ. උපසපන් ඇදුරා **"මනො පුබ්බඞ්ගමා ධම්මා"** යන ගය උගන්වමින්, ප්‍රථම පාදය අනුපසපනා හා එක්ව පටන්ගෙන එක්ව අවසන් කෙරේ නම් පාද ගණනින් පචිති වේ. ගැදියේ දී පදගණනිනි.

**අනුපද**-ද්‍විතීය පාදයයි. ගද්‍යයේ දෙවෙනි පදයයි. තෙරුන් **"මනො පුබ්බඞ්ගමා ධම්මා"** යනු ආරම්භ කළ ද අනුපසපනා එක් ව කියේ **"මනොසෙට්ඨා මනොමයා"** යනු කියද්දිය. දෙවෙනි පාදයේ දී පචිති වන්නේ එහෙයිනි.

**අන්වක්ඛර**-එක් එක් අකුරයි. **'රූපං අනිච්චං"** යනු කීමේ දී **'රූ'** යනු කියා නවතී. ('රූ'යි කීවොත් අන් අකුරක් කී බැවින් ඇවැත් නො වේ.) මෙසේ කීමේ දී නැවති නැවති කියන අකුරක් පාසා පචිතියි. ගාථාවල දී ද නය එයයි.

**අනුබ්‍යඤ්ජන**-මෙහි බ්‍යඤ්ජන සඳ **පදපරියාය** බවත්, මුලින් **අක්ඛරයො-**කී පදයට සමාන ව පසුව ඇති පද අනුබ්‍යඤ්ජන බවත් **අට්ඨකථාවෙ** ප්‍රකාශිතයි. එබඳු පදත්, අසමාප්තපදයෙහි අවිභක්තික අක්ෂර සමූහයත් බ්‍යඤ්ජන සදින් ගැනෙන බව පැනේ. **"රූපං අනිච්ච, වෙදනා අනිච්චා"** යනු කියවීමේ දී තෙරුන් මුල්වචන කියන අතර ක්ෂිප්‍රප්‍රාඥ හෙරණ දෙවෙනි **"වෙදනා අනිච්චා"** යන දෙක යන්නත් කියා අවසන් කෙළේය. **"අනිච්චං-අනිච්චා"** යන දෙක එක්ව කී නිසා **'අනිච්ච'** යන කොටසින් ඇවැත් විය.

පදය පදය කියවීමේ දී පද ගණනින් ද, අකුර අකුර කියවීමේ දී අකුරු ගණනින් ද, අපරිපූර්ණ පදයක් කියවීමේ දී අනුබ්‍යඤ්ජන වශයෙන් ද, පළමු පදය වැරද ගියහොත් දෙවෙනි පදයේ දී ද



ඇවැත් වන බව පැනේ. ඇදුරහු ගාථාවේ පශ්චිම පාදය කියනවිට හෙරණහු ප්‍රථමපාදය කීවත් ඇවැත්වන බවත්, එකක්හු නිශ්ශබ්ද-කල ම අන්‍යයා කියයුතු බවත් **විමතිවිනොදනියෙහි** එයි.

**191. ධම්මා.**

සඞ්ගීතිත්‍රයට ඇතුළත් පෙළදහම ද, ඇතුළත් නො වූ **කලුම්බ-**සුත්ත-රාජොවාදාදි සූත්‍ර ද ධම්මයි. ධම්ම සඞ්ගහාරූළ්හ පෙර තිබුණ අටුවාවෝ ද ගැනෙති. සෙසු බස් නො ගැනේ.

7 **අනාපත්ති**-අනුපසපනක්හු හා එක්ව උපසපන් ඇදුරකු වෙතින් කියවා ගන්නහුට ද, ඔහු හා සජ්ඣායනය කරන්නහුට ද, අනුපසපනකු වෙතින් කියවා ගන්නහුට ද, බොහෝසේ ප්‍රගුණ ගතක් කීමේ දී අමතක කොටස් එක්ව කියන්නහුට ද ඇවැත් නො වේ.

9. **අඞ්ග**-අනුපසම්පන්නතා, වුත්තලක්ඛණං ධම්මං පදසො වාචනතා, එකතො ඔසාපනං (-භණනං.)

——:o:——

## 5. සහසෙය්‍ය සික්ඛා.

**192. දිරත්ත තිරත්තං.**

වචනසිලට්ඨතාව සලකා දිරත්තග්‍රහණය කැරිණ. නොහොත්-නිරතුරු ව තෙරයක් හෙව චතුත්ථාදි දිනයන්හි නිදන්නහුට ම ඇවැත්වන බව ද, එකන්තරිකාදි විසින් නිදන්නහුට ඇවැත් නො වන බව ද දක්වනු පිණිසයි.

**193. සහසෙය්‍යං.**

(සයනං වා සහ සයන්ති එත්ථා'ති වා සෙය්‍යා.) කය දිගහැරීම සඞ්ඛ්‍යාත සයනයත් එයට ආධාරස්ථාන වන සෙනසුනත් **'සෙය්‍යා'** යන්නෙන් ගැනේ. පරිජ් පොහෝනා මුගටි පරෙවියන් ඇතුළු සියල්ලෝ ම මෙහිලා අනුපසපන්හුයි

සෙනසුන උළු-වසත්‍ර-ලැලි ආදි කවරෙකින් නමුදු සෙවිලි කොට ඇත් නම් **සබ්බච්ඡන්න**යි. තුනෙන් දෙකොටසක් ඡන්න නම් **යෙභුය්‍යච්ඡන්න**යි. අඩියක් ඡන්න නම් **උපඩ්ඪච්ඡන්න**යි. බිම සිට පියස්ස තෙක් භිත්ති-වසත්‍රාදියෙන් ප්‍රතිච්ඡන්න නම් **සබ්බපරිච්ඡ-න්න**යි. පියස්ස තෙක් නැත ද එක්රියන් සමාරක් උස පවුරු ආදියෙන් පිළිසන් නම් සබ්බපරිච්ඡන්න නමැයි ද යෙත්. **යෙභුය්‍යපරිච්ඡන්න-උපඩ්ඪපරිච්ඡන්නතාවෝ** ද පූර්වෝක්ත පරිදි දතහැකි වෙති. මේවා මිශ්‍රිත වීමෙන් ඇවැත් අටෙක් වේ.

සත්බුමු වූ හෝ සියක්ගබ් ඇති හෝ සෙනසුන එක් දෙරකින් ඇතුළු ව පරිභොග කළ හැකි වේ නම්, **ඒකූපචාරයි**. මිතුම්හලට පිටත පිහිටි හිණිවලින් නැගීම වේ නම් **නානූපචාරයි**. මෙබඳු ඒකූපචාර දුස්සකුටියෙක නමුදු පිට පිට තෙරුයක් අනුපසපනකු හා නිඳ සතරවැනි දින පටන් හිරු අස්තයට ගිය සඳ සයනය කිරීමෙන් පචිති වේ. තමාගේ හෝ මෙරමාගේ හෝ ප්‍රයොග ගණිතින් ඇවැත් වේ. සෙනස්න වෙනස් වුවත් අනුපසපනා වෙනස්වුවත් ඇවැතින් ගැළවීමෙක් නැත යොදුන් සියයක් ගොසින් නමුදු අන් අනුපසපනකු හා නිදගත ද ඇවැත් වේ. 'මෙහි නිදීම නම් නිදන ඉරියව්වෙන් විසීමයි නින්ද යාමම නො වේ. බිමින් පා නොමුඳ යහනක වැතිර නිදුවද නිදෙසි. පිට බිම නොගැටෙන සේ යම්කට හේත්තුවී නිදගත හැකිසි.

6. **ආපත්ති**-තිකපාචිත්තියයි. සබ්බච්ඡන්න චූළපරිච්ඡන්න (-සියල්ල සෙවෙනි කොට ඇති, අවට සතරෙන් කොටසක් පරිච්ඡන්න සෙනස්න.) සෙහුය්‍යච්ඡන්න චූළපරිච්ඡන්න, සබ්බපරිච්ඡන්න චූළච්ඡන්න, සෙහුය්‍යපරිච්ඡන්න චූළච්ඡන්න, උපඩ්ඪච්ඡන්න උපඩ්ඪපරිච්ඡන්න යන සෙනසුන්හි සයනය කිරීමෙන් දුකුළා වේ.

7. **අනාපත්ති**-රැයක් දෙකක් වසන්නහුට ද, තෙවැනි රෑ අරුණින් පෙර නික්ම ගොස් නැවත අවුත් වසන්නහුට ද, සබ්බාපරිච්ඡන්නාදි සෙනස්නෙක නිදන්නහුට ද, අනුපසපනා නිද සිටිය දී හිඳින්නහුට ද, හිඳසිටිය දී නිදන්නහුට ද ඇවැත් නො වේ.

9. **අඞ්ග**-පචිති පොහෝනා සෙනස්න, අනුපසපනකු නිද සිටිය දී තමන් නිදගැනීම, සිවුවැනි දින පටන් හිරු අස්තයට යාම.

මේ සිකපදය කිරියායයි සෙහුය්‍යවෘත්තියෙන් කියැවුණ බවත්, මෙය සියාකිරියා සියාඅකිරියා බවත් යෙති.

---

## 6. දුතිය සහසෙය්‍ය සික්ඛා.

**194.** **මාතුගාමෙන.**

එදවස උපන් දූරිය ද ගැනේ. අනුපාදින්නක පක්ෂයෙහි සිටි බැවින් මළඉතිරිය ඇවැතට කරුණු නොවේ. 'පළමු සිබයේ අනුපසම්පන්න සඳින් මාගමත් ගැනෙන බැවින් සිවුවැනි දින මාගම හා නිදගැනීමෙන් දෙසිබයෙන් ම ඇවැත් වේ' යන මතය නුසුදුසු බවත්, එහි අනුපසම්පන්න සඳින් පුරුෂයන් පමණක් ගැනෙන බවත් ටීකාහි එයි.



**195.** **සෙය්‍යං කප්පෙය්‍ය.**

යට කී ලකුණු ඇති සෙනස්නෙක හිරු අස්තයට ගියතැන් පටන් මාගම හා හොවී නම්, හොත් විගස ම පචිති වේ. නැගී හෝනා පියෝ ගණිතින් ද, නිදනා මාගමුන් ගණිතින් ද පචිති වේ. දවල් නිදීමෙන් ඇවැත් නොවන බව පැනේ.

6. **ආපත්ති**-උපඩ්ඪච්ඡන්න උපඩ්ඪපරිච්ඡන්න සෙනසුන්හි හොත්නහුට ද, පණ්ඩක, මෛථුනයට අඟී තිරිසන් මාගම, දෘශ්‍යමාන යක්ෂිණී ප්‍රේති යන මොවුන් හා හොත්නහුට ද දුකුළායි.

7. **අනාපත්ති**-සබ්බ අච්ඡන්න සබ්බ අපරිච්ඡන්න, සෙහුය්‍ය අච්ඡන්න සෙහුය්‍ය අපරිච්ඡන්න සෙනසුන්හි ද; එකකු හිඳ සිටිය දී ද නිදගැනීමෙන් ඇවැත් නො වේ.

---

## 7. ධම්මදෙසනා සික්ඛා.

**196.** **ධම්මං දෙසෙය්‍ය.**

ධම්ම නම් පදසොධම්ම සිකපදයෙහි උක්ත ධර්මයමැයි. පද්‍යයෙහි ගාථාපාදයෙක් ද, ගද්‍යයෙහි විභක්ත්‍යන්ත පදයෙක් ද එක් වාචා වෙයි. පෙළෙන් වචනයක් ද, අටුවාවෙන් වචන පසක් ද කිව හැකියි. කෙසේ නමුදු ස-පෙදෙන් වඩා කීයේ නම් ඇවැත් වේ. මෙහි ප්‍රකාශිත අටුවා නම් සඞ්ගීතියට ඇතුළත් පැරැණි අටුවායයි ද, පෙළබස හැර අන් බසෙකින් කැමැතිතාක් කියහැකියයි ද යෙත්. ස-පෙදෙන් වඩා කීමේ දී එක්අකුරක් කියා නැවතුව හොත් අකුරු ගණිතින් ද, පද වශයෙන් කියත හොත් පද ගණිතින් ද ඇවැත් වේ. මෙහි කී මාගම නම් මෙහෙණියන් ඇතුළු ව සුබැසි දුබැසි දන්නා මිනිස් මාගමයි.

**197.** **අඤ්ඤත්‍ර විඤ්ඤුනා පුරිසවිග්ගහෙන.**

හොඳ නොහොඳ දන්නා මිනිසකු දෙලොස් රියන් උපචාරයේ නැති විට කීමෙන්ය ඇවැත් වන්නේ. මිනිස්වෙස් ගෙන සිටි යක්ෂාදීන් සිටිය ද නො දෙසියයුතු.

6. **ආපත්ති**-යකින් පෙති පණ්ඩක යන මොවුනට දෙසන්නහුට ද, නොමාගම කෙරෙහි මාගමය යනාදි සත් ඇතියහුට ද දුකුළායි

7. **අනාපත්ති**-නුවණැති මිනිසකු උපචාරයේ ඇතිවිට ද, මාගම හෝ තමා හෝ නැගිට ඉරියවු වෙනස් කොට හිඳි සඳ ද, අන් මාගමකට දෙසනවිට ද, ප්‍රශ්නයක් විචාළවිට ද, අනෙකකුට

කරන දෙසුම මාගම අසනාවිට ද, ඇවැත් නො වේ. විචාළ පැනයට පිළිතුරු විසින් කොපමණ බණකීවත් වරද නැත.

9. **අඞ්ග**-සපෙදෙන් වඩා දෙසුම, මාගම නුවණැත්තකබව, ඉරි-යවු වෙනස් නො කළබව, කප්පියකාරකයකු ළඟ නැති බව, අපඤ්හවිස්සජ්ජනයයි පසෙකි.

---

## 8. භූතාරොචන සික්ඛා.

198 **භූතස්මිං**.

සිය සතන්හි විද්‍යමාන ධ්‍යාන මාර්ගාදි උතුරුමිනිස්දම් මහණ මෙහෙණ දෙදෙනා තබා සෙසු අනුපසපනකුට ඇරොජීමේ දී, ආරොචනයට අනතුරුව ම 'මෙතෙම ධ්‍යානලාභියෙකි' යනාදීන් දනහොත් **පචිති** වේ. නො දන ද, 'තාගේ වෙහෙර වසන්නේ ධ්‍යානලාභියෙකි' යනාදි පර්‍යායයෙන් කීවා දන ද, නො දන ද **දුකුලාසි**. පරිනිබ්බානකාලයෙහි ද, ඉන් පෙරාතුව වුවත් 'කියනු මැනැවැ'සි දූඹි ව අයදනා සඳ ද, අනුන් උත්සාහවත් කරනු සඳහා ද, ලත් ධ්‍යානාදිය උපසපනුනට කීව වරද නැත. සුත (-අත් කුසලතා) පරියත්ති (-පාළිපාඨ කුසලතා) සීල ගුණයන් කවරකුට කීව ද වරද නො වේ. ආර්‍යයන් කෙරෙහි උම්මත්තක ඛිත්තචිත්ත වෙදනට්ටයෝ නැති. උමතු බව වතොත් ධ්‍යානලාභීහු ධ්‍යානයෙන් පිරිහෙති. එහෙයින් ඔහු මෙහි දී නො ගැනෙති.

9. **අඞ්ග**-උත්තරිමනුස්සධම්මස්ස භූතතා, අනුපසම්පන්නස්ස ආ-රොචනං, තංඛණං විජානනං, අනඤ්ඤාපදෙසො. පනත් නො දන්නා බැවින් මේ සික්පදය අචිත්තක වේ. දැන දැන බුදුන්ගේ අණ ඉක්මවුව හොත් පටිසච්චානුප්පාදයෙන්, ධ්‍යානලාභී පුහුදුන්හු ධ්‍යානයෙන් පිරිහෙති. එබැවින් ඔවුනට භූතාරො-චන නැති.

---

## 9. දුට්ඨුල්ලාරොචන සික්ඛා.

199. **භික්ඛුස්ස**.

මෙසින් පරිජියට නො පත් භික්ෂුව කියැවේ. පාරාජිකාපන්නයාට ද ආක්‍රොශ කිරීමෙන් ඔමසවාද සික්පදයට අනුව **පචිති** වේ. දුට්ඨුල්ල සඳින් අන්තන්හි පරිජි සඟවෙසෙස් ගැනෙතුදු, මෙහි දී සඟවෙසෙස් පමණෙක් ගැනේ.



200. **ආරොචෙය්‍ය**.

“අජ්ඣිං මොචෙත්වා සඞ්ඝාදිසෙසං ආපන්නො” යනාදීන් වස්තුවත් ඇවැතත් එකට සටා කීමෙන් ම **පචිති** වේ. “**සුක්ක-විස්සට්ඨිං ආපන්නො**” යනාදි වශයෙන් වස්තුව පමණක් කීමෙන් ද, '**සඞ්ඝාදිසෙසං පාරාජිකං ආපන්නො**' යනාදීන් ඇවැත පමණක් කීමෙන් ද දුකුලාවෙකුදු නො වේ. සෙසු ස ඇවැත් කදු ද, අනුප-සපනා පිළිබඳ දුට්ඨුල්ලාදුට්ඨුල්ල වරද ද කියන්නහුට දුකුලා වේ. පාණාතිපාතාදි පඤ්චකය අනුපසපනා පිළිබඳ **දුට්ඨුල්ලඅජ්ඣා-චාරයයි**. සෙසු විකාලභොජනාදි පඤ්චකයත්, සුක්කවිස්සට්ඨි කාය-සංසග්ගාදියත් **අජ්ඣාචාරයි**. දණ්ඩකම්මපක්ෂයට යේ. කීමෙන් දුකුලා වේ.

201. **භික්ඛුසම්මුතියා**.

නිතොර ඇවැත් අවදනා මහණහුට ඔතප් උපදවා සංවර කරනු පිණිස “මොහුගේ මෙතෙක් ඇවැත් මෙතෙක් කුලවල කිය යුතුය” යි අපලොකනය කොට සඞ්ඝයා විසින් කටයුතු කතිකාව මෙහි **භික්ඛුසම්මුතියයි**. එය කුලපර්‍යන්ත කොට ද, නො කොට ද, ආපත්ති පර්‍යන්ත කොට ද නො කොට ද කළ හැකිසි.

7. **අනාපත්ති**-වස්තුමාත්‍රයක් හෝ ආපත්තිමාත්‍රයක් හෝ කියන්-නහුට ද, මහණසම්මුතිය නො ඉක්මවා කියන්නහුට ද ඇවැත් නො වේ.

9. **අඞ්ග**-වුත්තලක්ඛණස්ස භික්ඛුනො සවත්ථුකො සඞ්ඝාදිසෙසො, අනුපසම්පන්නස්ස ආරොචනං, භික්ඛුසම්මුතියා අභාවො.

---

## 17. පඨවිඛණන සික්ඛා.

202. **පඨවිං**.

**ජාතපඨවිය අජාතපඨවිය** යි පොළොව ද්විප්‍රකාරයි. සුද්ධ-මිස්ස-පුඤ්ජ විසින් ජාතපඨවිය තෙවැදෑරුම්. හුදු පස් හෝ හුදු මැටි හෝ ඇත හොත් **සුද්ධපඨවිය** යි. පාසාණ, සක්ඛර (-මිටින් ගත හැකි ගල්), කබල්, බොරළු, වැලි යන මේවා අඩියක් හෝ තුනෙන් කොටසක් හෝ මුසුව ඇත හොත් **මිස්සපඨවියයි**. අහසින් පතිත දියෙන් වරක් නමුදු තෙමී සිවුමසක් ඉක්මගිය පස් ද මැටි ද **පුඤ්ජපඨවියි**. ගිනි ලැමෙන් නො දැවුණු පොළොව අදඩ්ඪාපඨවී නම්. මේ සියල්ල අකැප පොළෝය. උක්තවිපර්‍යාසයෙන් හුදු ගල් සකුරු

ආදිය ද, ඒවා තුනෙන් දෙකොටසක් ඇති පස් ද මැටි ද, දැවුණු පොළොව ද, තෙමී සිවුමසක් නො ඉක්මුණු පස්රුස ද, මැටිරුස ද **ඛණපියපථවියයි**.

**203. ඛණෙය්‍ය**

කී ලකුණු ඇති අකැප පොළොව පාදඞගුට්ඨයෙන් නමුදු සාරා නම්, දිය බැහැර ලමින් බිඳී නම්, හිරි අඳී නම්, පාත්‍ර පචනාදියෙන් දවා නම්, සියලු ප්‍රයෝගයන්හි භික්ෂුවහට පචිති වේ. "**ඉමස්මිං ඔකාසෙ ඛණ, ඉමං වල්ලිං ඛණ**" ආදි නියමයෙන් වැව් පොකුණු සෑරවීම, ගිනි දල්වවීම, ඉනි සිටුවවීම, බිම සැස්වීම ආදි ක්‍රියාවන්හි, කීමෙන් දුකුලාත්, ආණත්තයාගේ කිරීමෙන් පචිතිත් වේ. '**පොක්ඛරණිං ඛණ, කන්දං මූලං ඛණ**' යනාදීන් අනියම වශයෙන් විධාන කරන්නහුට ඇවැත් නො වේ. මෙ තැන සාරව' යනාදි විසින් නියම කොට කීමෙන්ය ඇවැත් වන්නේ. කැප පොළොව සෑරීමෙන් ද දොසෙක් නො වේ.

7. **අනාපත්ති**-කැප වහරින් කරවන්නහුට ද, එබඳු සිතක් නැතිව ගල් රුක් ආදිය අදින විට හෝ, සැරයටිය ඔබනවිට හෝ, බිඳීගියකල්හි ද, අන්‍යවිහිත ව කෙනකුත් හා කථා කරමින් පා ඇඟිල්ලෙන් පොළොව කණින විට ද, අකැප පොළොව කැප පොළොව යයි විකොපනය කරන්නහුට ද, ඇවැත් නො වේ.

9. **අඞ්ග**-ජාතපථවි, පථවිසඤ්ඤිතා, ඛණනඛණාපනානි.

**මුසාවාදවග්ගො පඨමො.**

——8○8——

## 11. භූතගාම සික්ඛා.

**204. භූතගාම.**

"**භවන්ති (-ජායන්ති වඩ්ඪන්ති) ඉති-භූතා**" වැඩෙමින් පවත්නා තරුණ රුක් ලිය භූත නම්. "**අභෙසුං (-ජාතා වඩ්ඪිතා) කාලෙ-ඉති භූතා**" වැඩී මහත් වැ බිම පිහිටි නො මළ රුක්ලියයි කාල-අර්ථයෙහි '**ත**' ප්‍රත්‍යයයි. "**භූතානං ගාමො** (-රාශි) **භූතගාමො**" මේ භූතගාම සඳින් මූල් බැස නිල්ව සිටි සියලු රුක් ලිය කියැවේ. පඤ්චවිධ බීජයෙන් හටගත්තේ භූතගාමයි.

**205. පාචිත්තිය.**

ඡේදන ඡේදාපන, භෙදන භෙදාපන, පචන පචාපන, විසින් කැමැති සේ පරිභොග කිරීම හෙවත් - නැසීම නිමිති කොට



පචිති වේ. මේ සිකපදය පැනවූයේ මහණුනට අසාරුප්‍ය නිසාත්, එහි වසන සතුන් ගැන දයාව නිසාත් මිස ගස් වලට ජීවිතෙන්ද්‍රිය ඇති නිසා නො වේ.

භාජනගත හෝ රාසිකත හෝ රොපිත (-සිටවූ) හෝ නිකුත් මූල් පමණක් හෝ අඞ්කුර පමණක් හෝ ඇති **පඤ්චබීජයන් කාලකුරුවා නම්**, දුකුලා වේ. මූලින් පැළ නැගෙන නෙළුම් ඉඟුරු ආදිය මූලබීජයි. (මූලමෙ'ව බීජං මූලබීජං) කඳින් පැළ නැගෙන නුග එරබදු ආදිය **ඛන්ධබීජයි**. පුරුකෙන් පැළ හටගන්නා හුණ බට ආදිය **ඵළුබීජයි**. අගින් පැළ හටගන්නා ඉරිවේරිය ආදිය **අග්ග-බීජයි**. අඹ දඹ මුං මෑ ආදිය **බීජබීජයි**.

**ජලට්ඨ ථලට්ඨ** වසයෙන් භූතගාම විප්‍රකාරයි. දියෙහි හට ගන්නා පත් ඇති නැති සෙවෙල වගී ද, උත්පලාදිය ද **ජලට්ඨයි**. දියේ තිබිය දී සින්ද ද, දිය රහිත කොට තබා ගත ද, පචිතියි. අනෙකකු විසින් දියෙන් ගොඩලන ලද්දක් විකොපනය කිරීමෙන් දුකුලා වේ ඒවා බීජගාමයට ඇතුළත් වන බැවිනි.

කැපීමෙන් පසු උඩට ලියලා යන කොස්කණු ආදිය ද, එල නො ගත් කෙහෙලේ කපා ඉතිරි කොටය ද, භූතගාමයි. එලගත් කෙහෙලෙත් තල්පොල් ආදියෙත් කොටය බීජගාමයි. මූල් පමණ කුදු පත් පමණකුදු නො මැති බීජ, බීජගාමයි. මූල් පත් නැඟී, පත් නිල්වූ පසු භූතගාම වේ. මුංවල පත් ද, වීවල අඞ්කුර ද, නැඟුණු පසුත්, පොල්වල කොළ බෙදී යාමෙන් පසුත් භූතගාමයි. සෑ පවුරු ආදියේ දෙතුන් පතක් නො නැගි සෙවෙල බීජගාමයි. වියළුණු පසු පිසදමනු වටී. කළ කොතලාවල බැහැර සෙවෙල දුකුලාවත් ද, ඇතුළත අබ්බොහාරික ද, වේ. රුක් සොලවා ඉදුණු පල මල් ආදිය හෙළාලීමෙන් ද, පත්‍රවල අකුරු ඇඳීමෙන් ද, පචිති වේ. මල් පල නෙලන හෙරණුනට අතු නමා දුන වටී. තමාගේ පරිභොගය සඳහා එසේ කරනු ද නො වටී. කැප කොට තැබූ ඉඟුරුවල මූල් ඇදුණ හොත් මතුපිට ද අඞ්කුර ඇදුණ හොත් යට ද, සිඳුව ඇවැත් නො වේ. මූල් ද නීලාඞ්කුර ද නැගීමෙන් පසු නො වටී. තණපත් කැඩෙන සේ ද නො හැමදියයුතු.

"**රුක්ඛං ඡින්ද, අම්බරුක්ඛං ඡින්ද**" යනාදීන් අනියම කොට කීමෙන් ඇවැත් නො වේ. "**ඉමං රුක්ඛං ඉමං අම්බරුක්ඛං**" යනාදීන් නියම කොට කීමෙන්ය ඇවැත් වන්නේ. "**ඉමං පුප්ඵං ජාන, දෙහි**" යන ආදි කැපතෙපුලින් කිව වරද නැත. භූතගාම යෙන් වෙන්කරවා ගනු ලැබූ බීජගාමය, පරිභොග කරන්නහු විසින් නැවත කැපකරවා ගතයුතු වේ. කැප කිරීම අග්ගිපරිජිත

හට අනුපසම්පන්නකු ලවා උජ්ඣාපනයෙහි ද, ඔහු වෙත සිට ඛිය්‍යනයෙහි ද, කම්වැකියෙන් අසම්මත එහෙත් එබඳු බර දරන උපසම්පන්නයකුට හෝ අනුපසම්පන්නයකුට හෝ උජ්ඣාපනාදිය ද කිරීමෙන් දුකුළාසි.

ආදිකම්මිකයාට මෙහි ඇවැත් නො වේ. එහෙත් මෙහිලා මුසාවාදය ලැබෙන බැවින් එකවිට ඇවැත් දෙක දෙක වේයයි යෙත්. නොහොත්-මේ සිකපදය මුසවා සිකපදයෙන් පෙර පැනවිණ. පියෙවියෙන් ම අඝනිගාමි ව ක්‍රියා කරන්නවුනට දෙස් පහළ කිරීමෙන් ඇවැත් නො වේ.

---

## 14. පඨම සෙනාසන සික්ඛා.

**210. මඤ්චං වා.**

මසාරක, බුන්දිකාබද්ධ, කුළීරපාදක, ආහච්චපාදකයයි මඤ්ච චතුර්විධයි "මසාරක නම් හැඳ පය විද වල ඇවුණු හැඳය, බුන්දිකාබද්ධ නම් වලින් හැඳ පය ඔහවා කළ හැඳය, කුළීරපාද නම් කකුළුවන් පා සේ පා ඇති හැඳය. ආහච්චපාද නම් ඇඳවලම විද පා සිළුවද්ද ගැසූ පෝරු ඇඳ ආදියයි. පුටුයෙහි ද මෙතෙක් මැයි" යනු **කඞ්ඛා පිටපති**.

**211. භිසිං.**

වස්ත්‍රයෙන් හෝ කැප සමින් හෝ උරය තනා මිනිස්ලොම් ද හුදු තමලපත් ද හැර සෙසු ලොම් තණ පත් කොහු රෙදිකඩ ඇතුළට දමා කළ සෙනසුන්ය. මේ මෙට්ටවල හිඳීම ද වටී. ප්‍රමාණ නියම නැති බැවින් ඇඳ පුටු පාපිස්නාවනට අනුරූප වන සේ තනාගත හැකියි.

**212. කොච්ඡං.**

වාක (-වැහැරි) හෝ උසීරාදි තෘණ හෝ ගෙන මැද කුඩාවන සේ තදින් මිටි කොට බැඳ, දෙපස පළල්වන සේ පණාබෙර අයුරින් තනන ආසන වෙසෙසෙකි. සමින් වට කොට ද තනත්. සියලු සම් වගී මෙයට කැපයි.

**213. අජ්ඣොකාසෙ.**

වැසි ඇතත් නැතත් වර්ෂාඍතුව ද, හිම වැටෙතොත් හිමෙන් සමය ද යන අටමස තුළ අබවස තැබිය නො හැකිය. ගිම්කල පිරිසිදු අහස පැනේ නම් අබවස තබා ගිය හැකියි හිම නො වැටෙන රටෙක නම් හිමිත් කලත් එසේ තබා යා හැකියි. කවුඩු ආදීන්



ලග්නා රුක් යට කිසිකලෙකත් තබනු නො වටී සන්ථරණය නො කටයුතු කාලත් ප්‍රදේශත් අජ්ඣොකාස සඞ්ඛ්‍යාවට යේ. පියෙවි අබවස, තෙමෙන මඩු, රුක්මුල් නොතැබුවමනා ස්ථානයි.

**214. සන්ථරිත්වා වා සන්ථරාපෙත්වා වා.**

එබඳු අබවස මෙරමා සඳහා තමන් ඇතිරීමේ දී, ඔහු අවුත් හිඳිනා තෙක් හෝ යවයි කියන තෙක් හෝ අතුළහුට ම සෙනසුන භාරවේ. අනුපසම්පන්නකු ලවා ඇතිරවීමේ දී ආණාපක භික්ෂුවට පළිබොධයි. උපසම්පන්නයකු ලවා නම් ආණාපක භාරගන්නා තෙක් අතුළහුට ම භාරයි. තමන් ඇතිරවූ හෝ පියෙවියෙන් අතුරා තුබූ හෝ සෙනස්නෙකැ හිඳගත් පසු ඔහුට ම එය භාරයි. ධර්මාසනයෙහි ඇතිරවූ සෙනස්න පකතිසන්ථතයයි යෙත්

**215. නෙව උද්ධරෙය්‍ය.**

තමා හෝ සුදුසු තැනෙක නො තබා යේ නම්, අනෙකකු ලවා හෝ නො තබවා යේ නම්, ලජ්ජීමහණ හෙරණ ආරාමිකයනට භාර නො දී හෝ යේ නම්, පිරිකරේ සිට ලෙඩ්ඩුපාතයක් ඉක්ම යාමෙන් පචිති ඇවැතට පත් වේ. උත්තරත්ථරණ, භුම්මත්ථරණ, තට්ටිකා, චම්මඛණ්ඩ, පාදපුඤ්ඡනී, ඵලකපීඨ, දරුභණ්ඩ, මත්තිකාභණ්ඩ, යන ආදිය එසේ තබා යාමෙන් දුකුළා වේ. විශ්වාසග්‍රාහය රූහනයා වන්නකුගේ බඩුවක් තබා යාමෙන් ද, අව්වෙහි වියළෙන්නට තබ අපෙක්ෂා ඇති ව යාමෙන් ද ඇවැත් නො වේ.

9. **අඞ්ග**–මඤ්චාදීනං සඞ්ඝිකතා, වුත්තලක්ඛණෙ දෙසෙ සන්ථරණං වා සන්ථරාපනං වා, අපළිබුද්ධතා, ආපදය අභාවො, නිරපෙක්ඛතා (-අද ම අවුත් තහා තබමි යන අපෙක්ෂා නැති බව) ලෙඩ්ඩුපාතාතික්කමො.

"පනත් නො දත නො තහනුවහුට කයින් වෙයි. තො කියනුවහුට වචසින් වෙයි. පනත් දත මෙසේ ම නො කිරීමේ දී චිත්ත සහිත ව එ දෙකින් සමුට්ඨිත වේ. ලෙඩ්ඩුපාත ඉක්ම යනු ක්‍රියායි. නො තහනු ආදිය අක්‍රියායි" යනු **කඞ්ඛා පිටපති**

---

## 15. දුතිය සෙනාසන සික්ඛා.

**216 විහාරෙ සෙය්‍යං.**

ඇතුළු කාමර ද සබ්බපරිච්ඡන්න ගුත්ත (-ජනසඤ්චාරය අඩු) සෙනසුන් ද විහාර නම්. සෙය්‍යා නම් හිසි ආදි දශවිධ ශය්‍යායි.

1. ඇඳ පුටුවල අතුරන **භිසි**, 2. සුධාදියෙන් පිරියම් කළ බිම පැහැ රකිනු සඳහා අතුරන රෙදිකැලි මසා කැරෙන **චිලිමිකා**, 3. ඇඳ පුටු මතුයෙහි අතුරන **උත්තරත්ථරණ**, (-පසතුරුණු) 4. චිලිමිකා ඇත හොත් එ මත ද, නැතහොත්-හුදුබිම ද අතුරන කටසාරකාදි **බුමුතුරුණු**, 5. තාලපණ්ණ වාක යන මේවායින් කරන **තට්ටිකා**, 6. **චම්මඛණ්ඩ**, (පෞද්ගලික පරිභොගයට මූවසම් එළුසම් වටී, බුමුතුරුණු වශයෙන් හෙවත්-සෙනාසනපරිභොග වශයෙන් කවර සමක් නමුදු වටී. එ ද හකුළාගෙන ඒ ඒ වෙහෙරට ගෙන ගොස් පෞද්ගලික කොට පරිභොග කරනු නො වටී.) 7. **සදසා නිසීදනය**, 8. පාවාර කොජව නම් **පච්චත්ථරණ**, (-උගහත ලොම අත්ථරණ විසෙසයෙකි මෙ දෙක පමණක් අටුවාහි ප්‍රකාශිතයි. එහෙත් ඇඳපුටුහි අතුරන සෙසු වස්ත්‍රයෝ ද ගැනෙතියි සෙත්.) 9. **තණඇතිරි**, 10. **පත්ඇතිරි**, යනු දශ ශය්‍යායි.

මේ ශය්‍යාවන් ගෙන් යමක් පූර්වොක්ත ලක්ෂණ ඇති වෙහෙරෙහි අතුරා හෝ අතුරවා හෝ වේයන් විසින් නො කෑ හැකි සේ තැබීම් වශයෙන් උද්ධරණ නො කොට, ආපුච්ඡා හෝ නො කොට, අන් වෙහෙරක වාසයට යන රිසියෙන් ආරාමපරික්ෂෙපය නැත හොත් උපචාරය ඉක්මවා යන භික්ෂුව පචිති ඇවැතට පත් වේ. මෙසේ පචිති සිදුවන්නේ අනොතාගබ්භාදියේ තබා යාමෙන් ශය්‍යාවන් සෙනසුනත් යන දෙක ම වේයන්ගෙන් අනතරාය ලැබිය හැකි බැවිනි.

විහාරොපචාරයෙහි වූ අගුප්ත බොජුන්හල්හි ද, මණ්ඩපාදියෙහි ද අතුරා යාමෙන් සෙනසුන වේයන්ගෙන් අනතරාය නො ලබන බැවින්) දුකුළා වේ. ඇඳ පුටු විහාරයෙහි එසේ තබා යාමෙන් ද වහා අනතරාය නො වන බැවින් දුකුළා වේ. මඤ්චපීඨ අකාලයෙහි අබවස තබා යාමෙන් මුල් සිකයට අනුව පචිති ද, පිරිකෙව් ඉක්ම වීමෙන් මේ සිකයට අනුව දුකුළා ද වෙති යි සෙත්. ශය්‍යා අබවස තබා යාමෙන් දෙසිකයට ම අනුව දුකුළා වේ. සඟසතු වෙහෙර සඟසතු ශය්‍යාවක් තබා යාමෙන් පචිති කියවුණ බැවින් එකක් පමණක් සඟසතු වේ නම් වන්නේ දුකුළා පමණයයි සෙත්. තමන් සනාතකාදියෙහි ඇවැත් නො වේ.

9. **අඞ්ග**-වුත්තලක්ඛණසෙය්‍යා, තස්සා සඞ්ඝිකතා, වුත්තලක්ඛණෙ විහාරෙ සන්ථරණං වා සන්ථරාපනං වා, අපලිබුද්ධතා, (-සෙනසුන නිරුපද්‍රැත බව,) ආපදාය අභාවො, අනපෙක්ඛස්ස දිසාපක්කමනං, උපචාර සීමාතික්කමො.

---



# 16. අනුපඛජ්ජ සික්ඛා.

**217.** ජානං.

නො නැගිටවියයුත්තෙකැයි දන්නේ යනු අර්ථයි. වැඩිමහල්ලා ද, ගිලනා ද, භාණ්ඩාගාරික ධම්මකථික ගණාචරියාදීහු ද, අනුට්ඨාපනීයයෝයි. සඞ්ඝයාගේ චීවරාදි භාණ්ඩ තුබූ සෙනස්න රක්නේ භාණ්ඩාගාරික නම්. සූත්‍රාන්තාදිය උගන්වන්නේ ගණාචරියයි. මොවුන්ගේ ගුණොපකාරතාවන් සලකන සඞ්ඝයා නිත්‍යවාස සඳහා සම්මත කොට දුන් වෙහෙරයි.

**218.** **අනුපඛජ්ජ**.

සමීපයට එළඹ යනු අර්ථයි මෙහි සමීප සඞ්ඛ්‍යාත උපචාරය නම් ඇඳපුටුවල සිට එක්රියන් සමාරයි. පා ධෝනා තැන සිට ද, පස්සාවට්ඨානයේ සිට ද, ඇඳපුටුතෙක් එක්රියන් සමාරක් පළලැ'ති මහද උපචාරයයි.

**219.** **සෙය්‍යං කප්පෙය්‍ය**.

පෙර සිටි මහණහුට ගහට කරන රිසියෙන් මේ උපචාරයෙහි දශවිධ ශය්‍යාවන් අතුරෙන් යමක් අතුරා නම්, අතුරවා නම්, දුකුළා වේ. නිසීදන නිපජ්ජන දෙකින් පචිති දෙකෙක් වේ. නැගි නැගි හිඳුන් පියෝගණනින් පචිති වේ. එයින් බැහැර උපට්ඨානසාලා විහාරොපචාරාදියේ ඇතිරීමෙන් ද පරිභොග කිරීමෙන් ද දුකුළා වේ. විසභාගපුගුලා හා එකවිහාර එකපරිවෙණ වාසය මෙයින් වාරිතයි.

7. **අනාපත්ති**-තමාගේ හෝ විශ්වස්තයකු ගේ හෝ වෙහෙර අතුරන්නහුට ද, ශීතොෂ්ණයෙන් පෙළීසිටියහුට ද, ආපද්පත්තාදීනට ද ඇවැත් නො වේ.

9. **අඞ්ග**-සඞ්ඝික විහාරතා, අනුට්ඨාපනීය භාව ජානනං, සම්බාධෙතු කාමතා, උපචාරෙ නිසීදනං වා නිපජ්ජනං වා.

---

# 17. නික්කඩ්ඪන සික්ඛා.

**220.** **නික්කඩ්ඪෙය්‍ය**.

කුපිත ව දෙම්නසින් යුතු ව, සඟසතු වෙහෙරෙකින් මහණකු නෙරපීමෙන් පචිති ඇවැත් වේ. චතුභූමික පාසාදාදි සෙනසුන් වලින් භික්ෂුවගේ අත් ගෙල ආදිය ගෙන ඇදලීමෙන් හෝ 'නික්-

මෙව' යන වචනමාත්‍රයෙන් හෝ එක්පියොවින් බැහැර ලීමෙන් එක් පචිත්තෙක් ද, නොයෙක් පියොවින් බැහැරලීමෙන් දෙරටුගණනින් බොහෝ පචිතිහු ද වෙති. 'නික්මෙව'යි කී වදන් අසා තමන් ම නික්ම ගිය හොත් නිරවැතැයි යෙත්.

පාත්‍රචීවරාදි පිරිකර බැහැරලීමෙන් ද, විහාරොපචාර උපට්ඨාන සාලාදියෙන් භික්ෂුව නෙරීමෙන් ද, අනුපසම්පන්නකු හෝ ඔහු අයත් පිරිකර හෝ විහාර විහාරොපචාරාදියෙන් බැහැරලීමෙන් ද දුකුළා වේ. නෙරවයි අනෙකකුට ඇණවීමෙන් දුකුළා ද නෙරීමෙන් පචිති ද වේ.

7. **අනාපත්ති**-අලජ්ජී, උම්මත්තක, (මොවුන් සියලු සහරමින් නෙරනු නො වටි.) කලහකාර, (සහරමින් නෙරනු වටී.) මනාව නො පවත්නා අතැවැසි යන මොවුන් බැහැර කිරීමෙන් ඇවැත් නො වේ.

9. **අඞ්ග**-සඞ්ඝික විහාරො, උපසම්පන්නස්ස භණ්ඩනකාරකභාවාදි විනිමුත්තතා, කොපෙන නික්කඩ්ඪනං.

---

## 18. වෙහාසකුටි සික්ඛා.

**221 උපරිවෙහාසකුටියා.**

ලෑලි ඇතිරීමෙන් නො වැසූ, ගලප්‍රමාණයෙන් නමුදු තලාඳ (-බාල්ක) දමා ඇති, දෙබුමු තෙබුමු කුටිහු, මතුයෙහි අහස ම වන බැවින් **වෙහාසකුටි** නම් වෙති. මෙහි දී මැදුම් මිනිසකුගේ හිස නො ගැටෙන සේ උසින් සවිකළ තලාඳ ඇති කිළිය ම ගැනේ. එබඳු කිළියෙක මහලෙක්හි යන අදහසයි.

**222. ආහච්චපාදකං.**

හැඳවල හිස විද පාසිළුව ප්‍රවෙශ කොට ඇණ නො ගැසූ ඇඳ පුටු ගැනේ. මෙබඳු ඇඳ පුටුවල වහා හිඳීමෙන් ද නිදීමෙන් ද පා ගැලවී යට සිටින්නවුන් මත පතිත විය හැකියි. එම අන්තරායය වළකනු පිණිස පචිති දෙසූහ.

7. **අනාපත්ති**-අවෙහාසකුටි සඞ්ඛ්‍යාත බිම කළ පන්සල්හි ද, යට පරිභොග කළ නො හැකි බැවින් හිස ගැටෙන තරම් පහතින් තලාඳ දමා ඇති කිළියෙහි ද, යට පරිභොග නො කරන කෙබඳු කිළියෙක්හි ද, මතු තලය දෑව අතුට හෝ සුනු පිරියම් කොට හෝ ඇති කිළියෙහි ද, විසුව ඇවැත් නො වේ. ඇණ සවි කොට ඇති ඇඳපුටුහි හිඳීමෙන් ද ඇවැත් නො වේ.



9. **අඞ්ග**-සඞ්ඝික විහාරො, අසීසඝට්ටා වෙහාසකුටි, හෙට්ඨා සපරිභොගං, අපටාණී දින්නෙ ආහච්චපාදකෙ නිසීදනං වා, නිපජ්ජනං වා.

---

## 19. මහල්ලකවිහාර සික්ඛා.

**223. මහල්ලකං විහාරං.**

කරදෙන්නකු ඇති හෙයින් 'මහල්ලක' නම් ලත්, උල්ලිත්ත හෝ අවලිත්ත හෝ උල්ලිත්තාවලිත්ත හෝ ආවාසය මහල්ලක විහාර නම් වේ. සංයාචිතකුටියෙහි ඇවැත් නො වන බව මෙයින් හැඟේ.

**224. යාව ද්වාරකොසා.**

ද්වාරකොස නම් දෙරටුසමීපයයි. ද්වාරබන්ධය (-උළුවස්ස) අවට උඩත් දෙපසත් දෙරපුවරුවේ පළල පමණ පෙදෙසක් (-උසාවින් දෙරියන් සමාරක් පමණ පෙදෙස) හිමි කොට යන අදහසයි.

**225. අග්ගළට්ඨපනාය.**

අග්ගළ සඳින් දෙරපුවරු ඇති උළුවස්ස කියැවේ. එය නිසල වනු පිණිසයි. පියන කල දෙරබාවේ ද, හරින කල බිත්හි ද දෙර පුවරු හැපෙන බැවින් බිත සැලී මැටි ගැලවී වැටිය හැකියි. එ නිසා දෙරටුව සවිර වනු පිණිස නැවත නැවතත් ලිම්පනය හෙවත් මැටි ආදිය ගැසීම කළ හැකිබව මෙයින් කියැවේ. (පුනප්පුනං ලිම්පිතබ්බො වා ලෙපාපෙතබ්බො වා යනු අර්ථ වශයෙන් ලැබේ.)

**226. ආලොකසන්ධි පරිකම්මාය.**

වාකවුළුව සවිර වනු පිණිස පිරියම් කිරීම මෙයින් කියැවේ. ජනේලය අවට සිවුපසින් ම ජනෙල්පුවරුව පමණ පෙදෙස නැවත නැවත ලිම්පනය කටහැකියි. නැවත නැවත සකලඅවස ලෙපාපන ඡාදපනයන් නිමිති කොට මේ සිකය පැනවූ බැවින් පූර්වොක්ත දෙර ජනේල්වල උපචාර ප්‍රදෙශය හැර මැටිකිස නිමකළ සෙසු තැන් නැවත නැවත ලිම්පනය කිරීමෙන් (-චතුත්ථලෙපාදානයෙන්) පිණ්ඩගණනින් පචිති වේ.

**227. ද්වත්තිච්ඡදනස්ස පරියායං.**

ලෙපකම්යෙහි ලා කටයුතු දෑ දක්වා ඡදනයෙහි කළයුතු දෑ මෙයින් කියැවේ. බොහෝ කලක් නො තෙම් පවත්නා පිණිස නැවත නැවතත් ඡදනය (එකළඹ) සෙවිලි කෙරෙති. මෙ සේ කළහැක්කේ තෙවිටෙකි. සතරවැනි වර කිරීමේ දී තණකැරලි

ගණනින් පචිති වේ. (පරියාය සඳ පරික්ෂෙපාර්ථයි.) මේ ඡාදනය තෘණ පර්ණාදියෙන් පමණක් නො ව උළු ගල් ආදියෙන් ද කරන බව දක්වේ.

**228. අප්පහරිතෙ ඨිතෙන අධිට්ඨාතබ්බං.**

එසේ සෙවිලි කරවීමේ දී විධායක මහණහු සිටියයුතු තැන මෙයින් කියැවේ. හරිත නම් පුබ්බණ්ණ අපරණ්ණයි. එබඳු දෑ ඇති බිම සිට විධාන නො කටයුතු. වහල මුදුන් පෙදෙසැ සිටුනා මිනි-සෙක් යම් තැනෙක සිට පියසි අක් මානයෙන් දක්ක හැකි වේ නම්, එපමණ දුර සිට විධාන කළයුතු. පුබ්බණ්ණාදිය නැතත් තමන් මත ගෘහොපකරණ පතිත වියහැකි බැවින් ඉන් ඇතුළත සිට විධාන නො කළයුතු.

7. **අනාපත්ති**-ශ්වෙතවර්ණාදි කරණයෙහි ද, දෙ තුන්වරක් කිරීමෙහි ද, ලෙණ ගුහා තිණකුටිකාදියෙහි ද, අනුන් සඳහා ද, සිය ධනයෙන් කරවීමෙහි ද, වාසාගාර තබා සෙස්සක විධාන කිරීමෙහි ද නිරැවැති.

9. **අඞ්ග** මහල්ලක විහාරතා, අත්තනො වාසාගාරතා, උත්තරි අධිට්ඨානං.

---

## 20. සප්පාණක සික්ඛා.

**229. සිඤ්චෙය්‍ය.**

දක හෝ අසා හෝ කවර ක්‍රමයෙකින් නමුදු ප්‍රාණීන් සහිත ජලයයි දන්නේ තණ මැටි මත ඉසී ද, ඉස්වා ද, නැතහොත්-තණ මැටි ආදිය දියෙහි ලා ද, පචිති ඇවැත් වේ. කළයෙන් වක්කරන විට දහර සිටුව සිටුවා වක්කරයි නම්, පියෝ ගණනින් පචිති වේ. තණ මැටි ගොම සුනු ආදිය ගඞ්ගාදි මහදියකට දැමීමෙන් ඇවැත් නො වේ. යම් ලැමෙකින් දිය ක්ෂය ව යා නම්, නැතහොත්-කැලතී සතුන් මැරී යාහැකි වේ නම් එබඳු දියකට ලැමෙන් ඇවැත් වේ.

මේ සිකපදය බාහිරපරිභොග වශයෙන් කියැවිණ. නැම බීම ආදි අභ්‍යන්තර පරිභොග ගැන මතු සිකයෙක් එයි.

7. **අනාපත්ති** සප්පාණක දියෙහි අප්පාණක සත් ඇත්තහුට ද, නො සිතා තෘණාදියෙහි පතිතවිට ද, නො සිහියෙන් දැමුවහුට ද, පණුවන් ඇති බව නො දන වක්කරන්නහුට ද ඇවැත් නො වේ.



9. **අඞ්ග**-සප්‍රාණ දියක් බව, සිඤ්චනයෙන් පණුවන් මැරෙතියි දැන්ම, පණුවන් සහිත ජලයබව දැන්ම, වධකසිත් නැති ව අන් කරුණෙකින් ඉසීම.

14. **වජ්ජ**-මෙය පණ්ණත්තිවජ්ජයි. වධකසිත් නැතිව සිඤ්චනය කිරීමේ දී පැනවූ නිසයි වධකසිත් ඇතොත් අන් සිකපදයකට අනුව පචිති වේ.

16. **කුසලත්තික**-පතත් මැඩ ඉසීමෙන් අකුසල් සිත ද, මලසුන් ආදිය දෙවීමේ දී කුසල්සිත ද, පතත් නො දත් රහත්නට අබ්‍යාකත සිත ද වේ.

**භූතගාම වග්ගො දුතියො.**

—|○|—

## 21. ඕවාද සික්ඛා.

**230. අසම්මතො.**

සිල්වත් බව, බහුශ්‍රැත බව, උභයපාමොක් පුහුණු බව, කල්‍යාණ වදන් ඇති බව, මෙහෙණියනට ප්‍රියමනාප බව, අවවාද කිරීමෙහි සමත් බව, ගිහිකල මෙහෙණක හා කායසංසග පමණකුදු නො කළ බව, විසිවස් ඇතිබව යන අටගින් යුත් මහණහට ඤත්තිචතුත්ථ කම්වැකි කියා භික්ඛුනොවාදක සම්මුතිය දෙනු ලැබේ. මේ බහු-ශ්‍රැතබව ත්‍රිවිධයි

i. **නිස්සය මුච්චනක**-උභයපාමොක් ද, සූත්‍රයෙන් සිවුබණ වරක් ද, මහාරාහුලොවාදාදි කථාමාර්ගයක් ද, අනුමෝදනා ධර්ම ද, කම්මාකම්මවිනිච්ඡයය ද, සුදුසු කම්ටහනක්ද, දත් පස්වස් ඇති මහණ නිස මුඳ ස්වප්‍රධාන ව විසීමට සුදුසුයි.

ii. **පරිසුපට්ඨාපක**-භික්ඛු භික්ඛුනී විභඞ්ග (-පරිජ් පචිති දෙපොත) ද, කම්මාකම්ම ද, ඛන්ධවත් ද, සඟියෙකින් කොටසක් ද දත් දසවස් ඇති මහණ නිසදීමට ද සුදුසුයි.

iii. **භික්ඛුනොවාද**-අටුවා සහිත තෙවළා බණ දන විසිවස් ඇති වියයුතු. නැතහොත් විනය සහිත ව සඟි අටුවාවක් ද, චතුපපකරණ අටුවාව ද දතයුතු.

භික්ඛුනොවාද සම්මුතිය නො ලත් භික්ෂුව අසම්මත සඳින් ගැනිණ. අටඟ නැති මහණහට සම්මුතිය දුන ද පිහිටයි. සම්මන්නාන යෙන් දුකුළා වේ.

**231. ඔවදෙය්‍ය.**

මෙහෙණ සඟනට හෝ එක් මෙහෙණකට හෝ අෂ්ටගුරුධම්මයෙන් අවවාද කිරීමයි. අන් දහමෙකින් අවවාද කිරීමෙන් දුකුළා වේ. පැළවියදූ අවවාද ඇසීමට පැමිණි මෙහෙණියන්ගෙන් **‘සමග්ගා’ත්ථ භගිනියො’** (සමඟවිහු ද? නොහොත්-සියලු දෙන පැමිණියහුදැයි) පිළිවිසිය යුතු. ‘පැමිණියම්හ’යි පිළිතුරු දුනහොත් ‘අෂ්ටගුරුධම්ම ප්‍රගුණද’යි විචාළයුතු. ප්‍රගුණයයි කිවොත් **‘එසො භගිනියො ඔවාදො’** යි කීමෙන් අවවාදූපිණය කටයුතු වේ. ‘ප්‍රගුණ නැතැ’යි කිවොත් ඔසාරණය (-අෂ්ටගුරුධම්පාලිය කීම) කටයුතුයි.

7. **අනාපත්ති**-උද්දෙස විසින් ගුරුධම්පාලිය කියවන්නහුට ද, කියනු මැනැවැයි යැදි කල ඔසාරණය කරන්නහුට ද, පචිති නො වේ.

9. **අඞ්ග**-අසම්මතතා, භික්ඛුනියා පරිපුණ්ණූපසම්පදතා, ඔවාද වසෙන අට්ඨගරුධම්ම භණනං.

## 22. අත්ථඞ්ගත සික්ඛා.

**232 අත්ථඞ්ගතෙ.**

සම්මුතිය ලත් භික්ෂුව නමුදු හිරු අස්තයට ගිය පසු ගුරුධම්මයෙන් හෝ තදන්‍යධම්මයෙකින් හෝ මෙහෙණියනට අවවාද දෙන්නේ වේ නම් පචිත්තියට පත් වේ. හිරු නොබැස සිටිය දී බැස්සේය යනාදි සත් ඇතියහුට ද, මෙහෙණගෙණෙන් පමණක් උපසපුව ලත් මෙහෙණට ඔවා දෙන්නහුට ද දුකුළායි.

9. **අඞ්ග**-අත්ථඞ්ගතසුරියතා, පරිපුණ්ණූපසම්පන්නතා, ඔවදනං.

## 23. භික්ඛුනූපස්සය සික්ඛා.

**233. ඔවදෙය්‍ය.**

මෙහෙණියන් රැස්ව වුසු තැනට නමුදු ගොස් ගුරුධම්මයෙන් ඔවා දීමෙන් පචිති වේ. අන් බුදුවදනෙකින් ඔවාදීමෙන් දුකුළායි. ඔවා පිළිගනු සඳහා හෝ උපොසථාදි සංවාස සඳහා හෝ යා නොහෙන ගිලන් මෙහෙණ වෙත ගොස් ගුරුදම් ඔවා දිය හැකියි. එකතො උපසම්පන්නාවට ගරුදහමින් හෝ අන්දහමෙකින් හෝ ඔවා දීමෙන් ද, උභතො උපසම්පන්නාවට අන් දහමෙකින් ඔවා දීමෙන් ද, දුකුළා වේ. පෙර සේ පෙළ අටුවා කියවාදීම් වශයෙන් නිරුවැත් බව වේ.

9. **අඞ්ග**-උපස්සයූපගමනං, පරිපුණ්ණූපසම්පන්නතා, සමයාභාවො, ගරුධම්මෙහි ඔවදනං.



## 24. ආමිස සික්ඛා.

**234. ආමිසහෙතු.**

(**ආමිසමෙ’ව හෙතු-ආමිස හෙතු.**) සිවුපසය ද ගරුකාරමානන පූජනාදිය ද මෙහි දී **ආමිස නම් වේ.** ‘මේවා නිසා ඔවා දෙත්ය’යි සම්මත මහණහුට අගුණ කීමෙන් වදනක් පිරියතැ පචිතිය බැගින් වේ.

බැහැර තැනකට යන රිසිඇති හෙයින් ඔවාද සම්මුති ලද්දහු විසින් ම පත් කරනුලැබූ හෝ සම්මත භික්ෂුව නැති නිසා සඞ්ඝයා විසින් කම්වැකි නොකියා පත් කරනුලැබූ හෝ අටගින් යුත් භික්ෂුව ද, ගරුධම්මොවාද දුනයට සුදුසුයයි යෙත්. මෙවැනි අසම්මත භික්ෂුවට ද, සම්මත (-මහලුමහණ කල සම්මුති ලැබ පසුව හෙරණ වූවහු) හෝ අසම්මත (-පෙර සේ භාරදුන් බහුශ්‍රැත හෙරණහු) හෝ අනුපසපනුනට ද, අගුණ කීමෙන් දුකුළා වේ.

7. **අනාපත්ති**-පියෙවියෙන් සාපෙක්ෂ ව ඔවා දෙන්නහු ගැන එබඳු සත් ඇති ව දෙස් කීමෙන් ඇවැත් නො වේ. සචිත්තකාපත්ති බැවින් ආමිසනිරපෙක්ෂ ව ඔවා දෙන්නහු ගැන ‘ආමිසය නිසා ඔවා දෙයි’ යන හැගීමෙන් කියන්නහුට ඇවැත් නො වේ යනු **විමතිවිනොදනී** මතයි.

9. **අඞ්ග**-උපසම්පන්නතා, ධම්මෙන ලද්ධ සම්මුතිතා, අනාමිසන්තරතා, (-ආමිසචිත්තාභාවය,) අවණ්ණකාමතාය භණනං.

## 25. චීවරදාන සික්ඛා.

යම් භික්ෂුවක් පාරිවට්ටක නො ගෙන නො නෑ මෙහෙණකට විකපුම් පොහෝනා සිවුරක් දෙයි නම් පචිතියට පත් වේ. චීවරපටිග්ගහණ සිකයට විඩා මෙහි වෙනස පිළිගැනීම මෙහෙණක අතින් වීම පමණයි.

## 26. චීවරසිබ්බන සික්ඛා.

**235. සිබ්බෙය්‍ය.**

හඳිනු පොරවනු සඳහා ප්‍රමාණ වත වස්ත්‍රය මෙහි චීවරයයි. මසනු පිණිස කැපීම ආදිය කිරීමෙන් දුකුළා ද, හිඳ සියක්වර නමුදු ගසා අඳින වරක් පාසා පචිති ද වේ.

236. **සිබ්බාපෙය්‍ය.**

'මසව' යි සාමාන්‍යයෙන් විධාන ලද භික්ෂුව සියලුකම් නිමකළ හොත් ආණාපක භික්ෂුවට එක් පචිත්තෙක් වේ. සිවුරේ සියලු කම් ඔබට භාරයි යන මෙවැනි එක් විධානයෙකින් මැස්වීමේ දී ආරපථයක් (-සූචි නීහරණයක්) පාසා දෙදෙනාට ම පචිති වේ. ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන් සිය නෑ මෙහෙණින්ගේ සිවුරු මස්නා සඳ, විධාන යෙන් හෝ වත්වශයෙන් හෝ අවුත් මස්නා අනැවැස්සනට ද, පචිති වේ.

7. **අනාපත්ති**-එව්කාදි අන් පිරිකරක් මැසීමෙහි ද, නෑමෙහෙණ, සික්ඛමානා, සාමණේරී, යන අයගේ සිවුරක් නමුදු මැසීමෙහි ද, ඇවැත් නො වේ.

9. **අඞ්ග**-අඤ්ඤාතිකාය භික්ඛුනියා සන්තකතා, නිවාසනපාරුපනූපගතා, සිබ්බනං සිබ්බාපනං වා.

———

## 27. සංවිධාන සික්ඛා

237. **සංවිධාය.**

අසුවල් ගමට යම්හයි එක්ව කථා කොට ගෙන යන අර්ථයි. මෙහෙණ අසපු, ඇතුළුඅරම, අසනසාලා, (-වළඳන තැන,) තිත්ථාරාම, යන මේවා කැපබිම්යයි ද, එහි සිට කරන සංවිධානයෙන් දුකුලා නො වන බවත්, මෙහෙණ අසපුවේ දොරටුව වීථි ඇත්හල් යන ආදිය අකැපබිම්යයි ද, එහි සිට කරන සංවිධානයෙන් දුකුලා වන බවත්, ප්‍රකාශිතයි. කොතැන දී සංවිදහිත වුවත්, ද්වාර මාගී වරදවා වුවත් වේලාව නොවරදවා මෙහෙණ හා එක් ව යාමේ දී දෙවෙනි ගමේ උපචාරයට පත් සඳ පචිති වේ. මෙසේ ගමකට ඇතුළුවීමක් පාසා ද, ගම් නැති පෙදෙසෙහි අඩයොදුන් ඉක්මවීමක් පාසා ද පචිති වේ.

238. **අඤ්ඤත්‍ර සමයා.**

තවලම්කරුවන් සමඟ විනා යා නො හෙන මඟ සත්ථගමනීයයි. සික්ඛමානාදීන් හා යාමෙන් මාතුගාම සිකයට අනුව පචිති වේ.

7. **අනාපත්ති**-සමයෙහි ද, තමන් සංවිධාන නො කොට ද, කාල විසඞ්කෙතයෙහි ද, ජනයන් පලා යන ආපදාකාලයෙහි ද, එක්ව යාමෙන් ඇවැත් නො වේ.

9. **අඞ්ග**-ද්වින්නම්පි සංවිදහිත්වා මග්ගපටිපත්ති, අවිසඞ්කෙතං, සමයාභාවො, අනාපදා, ගාමන්තරොක්කමනං වා.

—||—



## 28. නාවාභිරුහන සික්ඛා.

239. **භික්ඛුනියා.**

මේ භික්ඛුනී සදින් මාගම ද ගැනේයයි යෙත්. සංවිධානය නම් ලොකාස්වාද මිත්‍රසන්ථව වශයෙන් නැව් නැඟ කෙළි පිණිස කර ගන්නා කතිකායි.

අඩයොදුනට වඩා පළලැති නදියෙහි ගම් පිහිටි ඉවුරු අසින් යාමේ දී ගම් ගණිතින් ද, ගම් නො මැති අගාමක අරඤ්ඤය වේ නම්, අඩයොදුන් ගණිතින් ද, ඇවැත් වේ. අඩයොදුනට ඌන නදියෙහි මැදින් ගිය ද (දෙ තෙරට ම අඩයොදුන් දුර නැති නිසා) දෙ තෙර ම ඇති ගම් ගණිතින් ද, අඩයොදුන් ගණිතින් ද, යොදුන් පළලැති නදියෙහි මැදින් යාමේ දී අඩයොදුන් ගණිතින් ද, ඇවැත් දක්වති. වැව් විල් මුහුදුවල කෙළි පිණිස යාමෙන් දුකුළායි.

7. **අනාපත්ති**–තිරියං තරණාය, අසංවිදහිත්වා අභිරුහන්ති, භික්ඛුනී සංවිදහති භික්ඛු න සංවිදහති, කාලවිසඞ්කෙතෙන අභිරුහන්ති, ආපදාසු

——:o:——

## 29. පරිපාචිත සික්ඛා.

240. **භික්ඛුනී පරිපාචිතං.**

තමා ගේ හෝ භික්ෂුව ගේ හෝ නෑපැවරුවන් නො වන, දෙතරිසි නැති ගිහියන් වෙත ගොස් 'බහුස්සුතො' යනාදීන් ගුණ කියා 'දෙථ කරොථ' යනුවෙන් ලැබෙන සේ පිළියෙළ කරනලද පඤ්චභොජනයෙන් යමක් වළඳන මහණහට ගිලීමක් පාසා පචිති ඇවැත් වේ.

241. **පුබ්බෙ ගිහිසමාරම්භා.**

මෙහෙණ පිළියෙළ කරවන්නට පෙර ම මහණුන් උදෙසා සපයා තුබූ බව 'පුබ්බෙ' යන්නෙන් කියැවේ. සමාරම්භ නම් පිළියෙළ කරන ලද්දයි. මෙහෙණිය සලසවන්නට පෙර ම දායකයන් සම්පාදිත වූ අහරක් වැළඳීමෙන් ඇවැත් නො වේ. (නෑ පැවරුවන් ගේ අසමාරද්ධය ද, සමාරද්ධය වැනි නිසා වැළඳිය හැකියි.)

7. **අනාපත්ති**-පරිපාචිතාපරිපාචිත දෙක්හි අපරිපාචිත සංඥයනට ද, ගහට්ඨ සික්ඛමානාදීන් සැපයුණෙහි ද, පස්බොජුන් තබා සෙස්සක් ගැන්මෙහි ද, ඇවැත් නො වේ. (මෙයින්

නිර්වැත් වුවද පස්සභද්දමියත් විසඤඤතති පරිකථාදියෙන් ඉපදවූ පසය වැළඳීමෙන් දුකුළා ඇවැතින් **සාපත්තික** වේ.)

9. **අඞග**-භික්ඛුනියා පරිපාචිතතා, තථාභාවජානනං, ගිහිසමා-රම්භාභාවො, ඔදනාදීනං අඤඤතරතා, අජෙඣාහරණං.

---

## 30. රහො නිසජ්ජ සිකඛා.

මෙය දුතිය අනියතය වැනිසි. අඤඤාතපතති විසින් මෙහෙ-ණක හා රහස් ව හිඳීමෙන් පචිති වන බව මෙහි උකතයි. මතු මෙවැනි මාතුගාම්සිකයෙක් ද වේ.

**ඔවාදවගෙගා තතියො.**

—/◦/—

## 31. ආවසථ පිණඩ සිකඛා.

**242**. **ආවසථපිණෙඩා.**

අඩයොදුනකුදු යා හැකිවේ නම්, අගිලනායි. මැගි ගිලන් ගැබිනි පැවිදි ආදීනට අනුරූසේ පැනවූ ඇඳ පුටු ඇති නොයෙක් ගබ්වලින් යුතු කොට තැනූ ප්‍රාසාද ද, වෘක්ෂමූල අභ්‍යවකාශ ද, මේ ආවසථ සදින් කියැවේ. මේ තැන්වල අසවලුනට පමණයයි පුද්ගල සීමා-වක් හෝ මෙපමණ දියයුතුයයි ආහාරසීමාවක් හෝ නො කොට පැමිණියනට කැඳ බත් බෙහෙත් ඈ සියල්ල පිත් පිණිස දෙනු ලැබේ. මහණහු විසින් මෙබඳු දන්සැලෙකින් එක්වරක් පස්-බොජුන් ගතහැකිසි. දෙවෙනි දිත පටත් පිළිගැන්මෙන් දුකුළා ද, වැළඳීමෙන් පිඩක් පාසා පචිති ද වේ. එකකුලයක් හෝ නානාකුල එක්ව හෝ බොහෝ තැන දෙන විට ද, එක් තැනෙකින් වරක් ගත හැකිසි.

7. **අනාපතති**-ගිලනාට ද, යන එන විට අතරමඟ වරක් ද, ගිය තැන වරක් ද, හිමියන් පවරා වැළඳවීමෙහි ද, මහණුන් උදෙසා දෙන දන්සැලෙක්හි ද, ටික ටික දෙන තැනෙක ද, පස්බොජුන් හැර කැඳ කැවිලි ආදිය ගැන්මෙහි ද, වරද නැත.

9. **අඞග**-ආවසථ පිණඩතා, අගිලානතා, අනුවසිතා (-පුනවසිතා) පරිභොජනං.

---



## 32. ගණභොජන සිකඛා.

**243**. **ගණභොජනෙ.**

[ගණෙන ලදධතතා ගණසස සනතකෙ භොජනෙ) උපසපත් සිවුනමක් හෝ එසට වැඩිවූ හෝ සඞඝයා මෙහි දී ගණයායි. ගණයා එක් ව පිළිගත් පඤචභොජනය **ගණභොජනයයි**. මෙය **නිමන්-ත්‍රණ විඥප්ති වශයෙන්** දෙපරිදි ව සිදු වේ.

**නිමන්ත්‍රණයෙන්**-සිවු නමක් එක් ව සිටුනා තැනට හෝ වෙන් වෙන් පිරිවෙන්වලට හෝ ගොස් **"ඔදනෙන නිමනෙතමි ඔදනං මෙ ගණහ"** යනාදීන් ඔදන, සතතු, කුමමාස, මචඡ, මංස, යන පඤචභොජනයේ පයඨාය නාමයක් නමුදු ගෙන අකැප වදනින් (කැමැති බසෙකින්) කළ ('භිකඛං ගණහ' යනාදිය කැප වහරයි.) ආරාධනය පිළිගෙන එක් ව හෝ වෙන්ව හෝ ගොස් දෙලොස්රියන් උපචාරය නො මූද සිට පිළිගත් කල්හි, එක් ව වැළඳුව ද, වෙන්ව වැළඳුව ද පිළිගත් පමණින් **ගණභොජනය වේ**. බත් ලැබූ භික්ෂූන් සෙස්සන් ගන්නට පෙර උපචාරය ඉක්මවා ගියහොත් ගණභොජනය නො වේ යයි ද **"භොජනං ගණහථ"**යි සාමාන්‍යයෙන් පැවරුවත් ගණභොජනය වේයයි ද යෙත්. නිමනත්‍රණ ප්‍රතිග්‍රාහකයා තනි ව මෙබඳු අකැප ආරාධනා පිළිගත ද බත් ගැන්මෙන් සෙස්සනට ගණභොජන විය හැකිසි.

**විඥප්තියෙන්**-භික්ෂූන් සිවුනමක් එක්ව 'අපට බත් දෙව'යි හෝ වෙන් වෙන් ව 'මට බත් දෙව'යි හෝ ඔදනාදි නම් ගෙන අකැප වහරින් විනවා එකට ගැන්මෙන් ගණභොජනය වේ. අන් භික්ෂුවක් විනවූව ද එක්ව ගොස් ගතහොත් සියල්ලනට ම ඇවැත් වේ. වෙන වෙන ම පිළිගෙන වැළඳුව හොත් පණීතභොජන සූපොදන විඤඤතති සිකයනට අනුව ඇවැත් වේ. භොජන නාම යෙන් ම විනවූ කල ගණභොජන වේ.

**පතුල්** පැළීමෙන් හෝ වෙන යම් රෝගයෙකින් හෝ යා නො හැකි වේ නම්, එය **ගිලානසමයයි**. කෙළින් අතුලවූනට පස්මස ද, සෙස්සනට කතතිකමාසය ද, **චීවරදානසමය** වේ. අලුත් සිවුරු මස්නා කාලය **චීවරකාරසමය** යි. අඩයොත්නකුදු යනු රිසි ඇති සඳ ද, යන සඳ ද ගොස් අවසත් කළ සඳ ද, **අද්ධානගමනසමය** වේ. නැවෙන් යනු කැමැති ඇති කලත්, යන කලත්, ගොස් අවසන් කළ කලත් **නාවාභිරූහණසමයයි**. සමූහයක් රැස්වෙන කල, (සිවුනමට තෙ නමක් සිටින අවසට තව නමක් පැමිණිය හොත් යටත් පිරිසෙයින් එයත් **මහාසමයයි**, සැපීම දුෂ්කර වේ නම්,)

පිරිවැජ්යෙක් බත් සම්පාදනය කෙරේ නම්, එය වැළඳිය හැකියි. සහධාර්මිකයන් හෝ නිඝණ්ඨකයන් හෝ කළ බත් වැළඳිය හැකියයි ද, යෙත්. මේ සමයයන්හි දී සමය ඇති මහණහුට ඇවැත් නො වේ. සෙස්සනට විය හැකියි.

**7. අනාපත්ති**-දෙ තුන් නමක් එක්ව පිළිගැන්ම (මෙහිදී අකැප නිමන්ත්‍රණයෙන් නිරුවැනි. විනවීම වී නම්, පණීතභොජනාදි-යට අනුව ඇවැත් විය හැකියි.) පිඬු සඳහා ගොස් එක්ව වැළඳීම, නිච්ච සලාක පක්ඛික උපොසථික පාටිපදික භත්ත-යන් පිළිගැන්ම ('නිච්චභත්තං ගණ්හථ' යි කිවුව පිළිගත හැකියි ) පස්බොජුන් හැර අන් බොජුනක් පිළිගැන්ම යන මෙහිලා ඇවැත් නො වේ.

**9. අඞ්ග**-ගණභොජනතා, සමයාභාවො, අජ්ඣොහරණං.

---

## 33. පරම්පරභොජන සික්ඛා.

**244. පරම්පරභොජනෙ.**

ගණභොජනයෙහි කී සෙයින් මහණහු වෙත ගොස් 'ඔදනෙන නිමන්තෙමි' යනාදි අකැපවදනින් පැවරූ භොජනයෙන් එකක් තිබිය දී අන් පඤ්චභොජනයක් වැළඳීම පරම්පරභොජනයයි. උපිළිවෙළින් නො ව නිමන්ත්‍රණ පිළිවෙළින් වැළඳිය හැකියි. නැත හොත් පළමුබොජුන විකපා දෙවෙනි බොජුන වැළඳිය හැකියි. මේ භත්තවිකප්පනය සම්මුඛාවිකප්පන පරම්මුඛාවිකප්පන වසයෙන් දෙයාකාර වේ. පස්සහදම්යන් අතුරෙන් එක්කෙනකුන් වෙත සිට **"මය්හං භත්තපච්චාසං තුය්හං විකප්පෙමි"** යි සම්මුඛා විකප්පනය ද, තමන් අදහස්කළ තැනැත්තහු ඉදිරිපිට නොවේ නම් ඔහුගේ නම ගෙන **"ඉත්ථන්නාමස්ස දම්මි"** යි පරම්මුඛාවිකප්පන-ය ද කටයුතුයි (මෙය ද පස්සහදම්යකු වෙත කළයුතුබව පැනේ. පස්සහදම්යකුගේ නම කියා ගිහියකු වෙත හෝ හුදෙකළා තමන් හෝ කළහැකි වේයයි ද මත වේ.) ප්‍රථම නිමන්ත්‍රිතය නො විකපා අන්කුලයෙකින් ලත් අහරින් හුළුකුදු වැළඳීමෙන් පචිති වේ. ගිලානාදි සමය හැරයි.

**7 අනාපත්ති**-ගිලානසමයාදියෙහි, විකපා වැළඳීමෙහි, පැවරූ දෙතුන්කුලයෙකින් බෙදූ එකට මිශ්‍රිතාහාරයෙහි (මූල නිමන්ත්‍රිතය යට වූවොත් එයින් හුළුකුදු පළමු වැළඳියයුතු.) නිමැතු පිළිවෙළින් වැළඳීමෙහි, **"භත්තං ගණ්හථ"** යි අකැපබසින්



නිමැතු විට, 'මට එයින් කම් නැත, මම භික්ෂාව ගනිම්'යි කී කල, නිච්චභත්තාදියෙහි, පස්බොජුන් තබා සෙසු අහරක් ගැන්මෙහි ඇවැත් නො වේ.

**9. අඞ්ග**-පරම්පරභොජනතා, සමයාභාවො, අජ්ඣොහරණං.

---

## 34. කාණමාතු සික්ඛා.

**245. පූවෙහි.**

පඬුරු පිණිස යැවීමට (-නෑගම්යාමට) පිළියෙළ කළ කැවුම් මුං කැරලි ආදි ඛාද්‍යවිශෙෂ මේ පූව ශබ්දයෙන් කියැවේ.

**246. මන්ථෙහි.**

මාගෝපකරණ වශයෙන් සම්පාදිත බද්ධසත්තු (-අත්ගුළා), අබද්ධසත්තු (-අත්සුනු හෙවත්-පිටි), තල, බැදිසහල් ආදිය මෙහි දී මත්ථ නම්. **"යං කිඤ්චි පාථෙය්‍යත්ථාය පටියත්තං"** යි පදභාජනී යෙහි කියැවිණ.

**247. මත්තිපත්තපූරා.**

කැමැතිවන තාක් ගන්නැයි මේ කවරක් නමුදු එළවූ සඳ දෙ තුන් පයක් පුරා ගතයුතු වේ. තෙවෙනි පයේ මෝවිටෙන් මතුයෙහි වූ පූ ගණනින් පචිති විය හැකියි. පයක් දෙපයක් ගත් මහණ එබව හමුවන සෙසු භික්ෂූනට කිවයුතු. තෙපයක් ම ගතහොත් "නො ගන්නැ"යි වැළක්විය යුතු. නො කීමෙන් ද, කීමෙන් පසු ගැනීමෙන් ද, දුකුළා වේ. මෙසේ ලබා ගත් පූවලින් එක් පයක් තමහට තබා ගෙන සෙස්ස ආසන්න බොජුන්හලකට හෝ වෙහෙරකට හෝ ගෙන ගොස් බෙදා දියයුතු. සිකය අචිත්තකවන බැවින් අපාථෙය්‍යා-දිය සඳහා පටියත්තයයි ගත ද ඇවැත් වේයයි කියැවේ.

**7 අනාපත්ති**-දෙතුන් පයක් හෝ ඌන ව හෝ ගැන්මෙහි ද, පාථෙය්‍යාදිය සඳහා පිළියෙළ නුවූවක් ගැනීමෙහි ද, ඒ සඳහා පටියත්ත වූවත් එයින් ඉතිරි වූවක් ගැන්මෙහි ද, ගමන වැළ-කීම නිසා දුන්දෙය ගැන්මෙහි ද, නෑ පැවරුවන් දීමෙහි ද, සිය ධනයෙන් ගැන්මෙහි ද, ඇවැත් නො වේ.

**9. අඞ්ග**-වුත්තල ණ පූව මත්ථතා, අසෙසතා (-නො ඉතිරි බව), අප්පටිප්පස්සද්ධ ගමනතා (-ගමන නො සිඳීම) අඤ්ඤාතකා-දිතා, අතිරෙක පටිග්ගහණං.

—(ං)—

# 35. පඨමපවාරණා සික්ඛා.

**248**. **භුත්තාවී**.

බත්හුළක් නමුදු පරගලගත කෙළේ වේ නම්, වළඳමින් සිටිය ද, වැළඳූ කොටස ගැන සලකා භුත්තාවී හෙවත්-කළ බත් කිස ඇත්තේයයි කියැවේ. වළඳා අවසාන වූයේ යන අරුත නො ගත යුතු. 'පවාරිතො' යන්නෙහි ම මේ අරුත ඇතුළතී.

**249**. **පවාරිතො**,

**වස්සපවාරණය, පච්චයපවාරණය, පටික්ඛෙපපවාරණය, යාවදත්ථපවාරණය** යන සිවු පවාරණයන් අතුරෙන් මෙහි දී භොජනපටික්ඛෙප පවාරණය ගැනේ. වළඳමින් සිටිය දී, අත්පසට ගෙනා බොජුනක් නො කැමැති නිසා පිළිකෙව් කිරීමෙන් පවාරිත වේ. පවාරිත වූ පසු මුලින් සිටි ඉරියව්ව හැරපියා අන් ඉරියව්වෙකින් සිට නැවත යව්කැලි අහරක් වැළඳීමෙන් පචිති වේ. සාමාන්‍ය ප්‍රතික්ෂෙපයෙන් නො ව අඞ්ගපසක් සම්පූර්ණවීමෙන් ම පවාරණය සිදු වේ.

1. **අසනං පඤ්ඤායති**- අඩාළ බොජුන් ඇතිබවයි. (–වළඳමින් සිටින බව.) පාත්‍රයේ හෝ අතේ හෝ මුඛයේ හෝ පස්බොජුනෙන් යමෙක් වේ නම්, භික්ෂුව එයින් හුළකුදු වැළඳුයේත් වේ නම්, මෙ වැනි අවස්ථාවෙක්හි පිළිගැන්වීමට ගෙනා පස්බොජුන් පිළිකෙව් කිරීමෙන් පවාරණය වේ. පාත්‍රයේ බොජුන් ඇත. එහෙත් මියේ හෝ අතේ හෝ නැත. ඒ අස්නෙන් ඉවත් ව ගොස් අන් තැනෙක දී වළඳනු රිසියෙන් හෝ අනෙකකුට දෙන රිසියෙන් හෝ සිටියි. එකල්හි පිළිකෙව් කිරීමෙන් පවාරණය නො වේ. විප්පකත භොජන භාවය සිඳුණ හෙයිනි. පයේ අතේ මියේ හෝ වූ බොජුනක් නො වළඳන රිසියෙන් නිරපෙක්ෂ ව සිටිසඳ පිළිකෙව් කළ ද පවාරණය නො වේ.

2. **භොජනං**- පවාරණය සිදු කරන **ඔදන, සත්තු, කුම්මාස, මච්ඡ, මංස** යන පස්බොජුනෙන් යමක් පාත්‍රාදියෙහි වීමයි. **ඔදන නම්**:- සාලි, වීහි (–සියලු වීවගී), යව (-ඉරිඟු?), ගොධුම (–තිරිඟු), කඞ්ගු (–තණ), වරක, කුද්‍රූසක ('කුද්‍රූසක නම් හමුයැ' යනු ජාතක ගැටපදයි. 'කුරක්කන්' යි ද ඇතැම්මු අර්‍ථ දෙති.) යන සප්තවිධවූ ද, ඊට අනුලොම්වූ ද, ධාන්‍යවලින් පිසූ බත් හා බොල් කැඳයි. හබලපෙති ද එයින්කළ සත්තු හතන ද පවාරණ නො දනවයි. **සත්තු නම්**:- අනුලොම් ධාන්‍ය සහිත සප්තධාන්‍යයන් කරකොට බැද කරනු ලබන්නෙකි. **"භජ්ජිතානං තු ධඤ්ඤානං- චුණ්ණං සත්තූති වුච්චති"** යනු විනය විනිච්ඡයයි. සම්පාකයෙන්



බැදි වීවල සහල් හෝ බැදි සහල් හෝ පැවිරි නො දනවයි. ඒවායේ පිටි ජනවයි. විලඳ ද එයින් කළ බත් ආදිය ද බැදි පිටි ද පස්බොජුනෙන් මුසු නො වූ සුද්ධ එලාඑල ද පස්ගෝරස ද පැවිරි නො කෙරේ. මුං ආදියෙන් නො ව යවයෙන් කෙළේ **කුම්මාස** (-රොටී?) යි. **මංස** යන්නෙන් කැප ගොඩමස් ගැනේ.

3. **හත්ථපාසෙ ඨිතො**–දායකයකු පවාරණය සිදුකරන අහරක් ගෙන භික්ෂුව ගේ දෙරියන් වියත් අත්පසට පැමිණීමයි. හිඳිනා මහණහුගේ පශ්චිමාන්තය ද, සිටියහුගේ විළුම් කෙළවර ද, දායකයාගේ දිගු කළ අත් නො ව ආසන්න වූ ශීර්‍ෂාදි අවයවයෙක ඔරිමන්තය ද අතර ප්‍රමාණය ගතයුතු අත්පසට ගෙනාවක් පිළිකෙව් කිරීමෙන් පවාරණය වේ.

4. **අභිහරති**–අත්පසැ සිටි දායකයා එබන ගන්නා පිණිස කයින් පිරිනැමීමයි. 'ගනු මැනවැ'යි කීම ආවශ්‍යක නො වේ. ළඟ සිටි අන් මහණකු නමුදු තම අතැ වූ පාත්‍රය නො පිරිනමා 'බත් ගන්නැ'යි කී කල එය පිළිකෙව් කළ ද නො පැවරේ. ළඟ සිටියකුට පිරිනමද්දී තම **පය** අතින් වැසුව ද නො පැවරේ. තමහට නො පිරිනැමූ හෙයිනි.

5. **පටික්ඛෙපො පඤ්ඤායති**- කයින් වදනින් හෝ පිළිකෙව් කිරීමයි. වචනයෙන් පිරිනැමූවක් පිළිකෙව් කළ ද නො පැවරේ. අතින් වැසීම ඇඟිලිසැලීම ආදි කායවිකාරයෙකින් හෝ 'එපා' යයි වදනින් හෝ පිළිකෙව් කළහොත් පැවරේ.

යමින් සිටිය දී පවාරණය සිදු වී නම් යමින් ද, සිටුනාවිට නම් සිටගෙන ම ද, උක්කුටික ව සිටිද්දී නම් උක්කුටික ව හිඳ ද අතිරිත්ත නො කොට වැළඳිය හැකියි. හුන් ඉරියව්ව වෙනස් කළොත් අතිරිත්ත කළයුතු වේ. කුලදූෂණාදියෙන් ද පිළිගත් මිලෙන් ද ලබා ගත් කවර අකැප බොජුනක් නමුදු පිළිකෙව් කළාට පවාරණය නො වේ. අලජ්ජීන් සතු දූය ද පිළිකෙව් කළ හැකියි. අකැප අහරක් වළඳමින් කැපබොජුනක් පිළිකෙව් කළ හොත් පවාරණය වේ.

**250**. **අනතිරිත්තං**.

ඉතිරි නො කළ භොජනයයි. සප්තවිධ විනයකර්‍මාකාරවලින් කැප නො කළ ආහාරත් ගිලානාතිරිත්තයත් ගැනේ. පවාරිත ව අන් ඉරියව්වෙකින් බොජුනක් වළඳන්නහු විසින් එය කැප කරවා ගතයුතු වේ. මුල් අස්නේම නො නැගිට සිටියහොත් කැප කිරීම ආවශ්‍යක නො වේ අනතිරිත්තවූ යාවකාලික ඛාදනීය (-තුන් කැල්ලනුත් පස්බොජුනුත් හැර සෙස්ස.) භොජනීය (-පසඳුව

භොජන) ගිලීමෙන් පිඩක් පාසා පචිතියි. **අනතිරිත්ත වීම අකප්පියකතාදි සප්තාකාරයෙකින් වේ.**

1. **අකප්පියකතං**-අහරෙහි වූ 'කප්පියං' කළ යුතු ගෙඩි ලූනු ආදිය නබාදියෙන් 'කප්පියං' නො කරන ලද නම් එබඳු අහර ද, අකැප මසක් බොජුනක් වී නම් එය ද, **අකප්පිය නම්**. ඒ අකප්පියය **"අලමෙ'තං සබ්බං"** යි (-'භික්ඛු ඉදම්පි තෙ අධිකං ඉතො අඤ්ඤං න ලච්ඡසී'ති කිර අත්‍ථො" යනු **වජිරබුද්ධි.**) අතිරිත්ත කළ හොත් එය **අකප්පියකත නම්** වේ. අකප්පියකතය ම අනතිරිත්ත වන බැවින් 'කප්පියං' නො කොට පයේ ලා තුබූ ලූනු මිරිස් ආදිය අතිරිත්ත නො වේ. පාත්‍රගත සෙසු අහර අතිරිත්ත වන බැවින් වැළඳිය හැකියි. ඒ ලූනු මිරිස් ද වැළඳියැටි වේ නම්, එයින් බැහැර කොට 'කප්පියං' කරවා, අන් බඳුනෙක බහා අතිරිත්ත ද කරවා ගෙන වැළඳිය යුතුයි.

2. **අප්පටිග්ගහිත කතං**-නො පිළිගත් අහරක් අතිරිත්ත කළ ද, නො කරනලද්දේ ම වෙයි.

3. **අනුච්චාරිතකතං**-කැප කරවා ගැනීමට පැමිණි භික්ෂුව විසින් මඳක් නො ඔසවනලද නො එළවන ලද හෝ අහර කැප කළ නො හේ

4 **අහත්‍ථපාසෙ කතං**- පැමිණි මහණහුගේ අත් පසින් බැහැර ව සිට කරනලද්දයි

5 **අභුත්තාවිනා කතං**-කැපකරන භික්ෂුව පවාරණය සිදු කරන අහරක් වළඳා ම එය කළයුතු වේ. එහෙයින් එම එළැවූ පාත්‍රයෙන් හෝ ළඟ සිටියකුගේ පාත්‍රයෙන් හෝ බත් හුළක් නමුදු ගෙන වළඳා කළයුතු. පළමු වළඳා සිටියේ නම් එද ප්‍රමාණයි

6. **භුත්තාවිනා පවාරිතෙන ආසනා වුට්ඨිතෙන කතං**- භික්ෂුව පවාරිතයෙක් වේ නම් හුන් අස්නේ හිඳ ම කැප කරන්නේය. අප්පවාරිතයෙක් වේ නම් අස්නෙන් නැඟී සිටියහු විසිනුදු කැප කළහැකි වන්නේය.

7. **අලමෙ'තං සබ්බන්ති අවුත්තං**- කැප කරවා ගැනීමට පැමිණි භික්ෂුව **"අතිරිත්තං කරොථ"** යනු කියා පාත්‍රය ඉදිරිපත් කළ සඳ, කැප කරන විනයධරයා **"අලමෙ'තං සබ්බං"** යි වාග් භෙද නො කරනලද නම් ඒ ආහාරයයි. අතිරිත්තය මීට ප්‍රතිපක්ෂ ක්‍රමයෙන් දත හැකියි.

**ගිලානාතිරිත්තය**-උපසපන් අනුපසපන් ගිලන් භික්ෂුව වළඳා ඉතිරි කළ අහර ද, නො වැළඳුවත් කවදා නමුදු ගිලන් භික්ෂුවක් සඳහා ගෙනා අහර ද ගිලානාතිරිත්ත නම්. පවාරිතයා විසිනුදු එය වැළඳිය හැකියි.



උදය වළඳන මහණ දෙදෙනෙක් පවාරිත වෙති. එ ම හුන් අස්නේ ම එක් භික්ෂුවක් සිටිය දී තදන්‍ය භික්ෂුව තමන් ලැබූ බතක් ගෙන එයින් අඩක් හුන් මහණහුගේ පාත්‍රයේ ලා අත් දෙවා සෙස්ස ඔහු ලවා අතිරිත්ත කොට ගෙන වැළඳිය හැකි වේ. මෙසේ වළඳන විට අන් බ්‍යඤ්ජනාදියක් පාත්‍රයට බෙදුව හොත් පළමු කැප කළහු විසින් එය කැප කළ නො හේ. එ ම බඳුනෙහි ම කැප කරනවිට පළමු කැප කළ අහර සමඟ කැප කළා වන හෙයිනි. අනෙකකුට හැකියි. අන් බඳුනෙක ලා නම් ඔහු විසින් හෝ අන් භික්ෂුවක් විසින් හෝ කට හැකියි. **"අඤ්ඤස්ස හි කතතො අඤ්ඤො පුන කාතුං ලභති"** යනු විමතිවිනොදනියි. කැප කළ භික්ෂුව විසින් කැප කරනු ලැබූ අහර වැළඳිය නො හේ.

පවාරිත ව කාලයෙහි යාමකාලික සත්තාහකාලික යාවජීවිකයන් අහර සඳහා ගැනීමෙන් ද වැළඳීමෙන් ද දුකුළා වේ. විකල්හි ආහාරයක් වශයෙන් වැළඳීමෙන් ද දුකුළා වේ. පිපාසාදි කරුණු ඇති විට කැප නො කරවා අන් ආමිස හා මුසු නො කොට වැළඳිය හැකියි.

**අනාපත්ති**-අතිරිත්ත කරවා ගෙන වළඳම් යි ගන්නහුට ද අනුන් සඳහා ගෙනයන්නහුට ද, යාමකාලිකාදිය අනුදත් සේ නිරාමිස ව වළඳන්නහුට ද ඇවැත් නො වේ.

9. **අඞ්ග**-පවාරිතභාවො, ආමිසස්ස අනතිරිත්තතා, කාලෙන අජ්ඣොහරණං. මේ සිකය ක්‍රියාක්‍රියයි. පිළිකෙව් කොට වැළදීම ක්‍රියායි. අතිරිත්ත නො කිරීම අක්‍රියායි.

—◦—

## 36. දුතිය පවාරණා සික්ඛා.

251. **අභිහට්ඨුං පවාරෙය්‍ය.**

කැමැති තාක් ගන්නැයි ගැනීමට පවරා නම් යන අදහසයි. පූර්වෝක්ත පරිදි පවාරිත මහණකුහට අතිරිත්ත නොකළ කවර යාවකාලික ආහාරයක් නමුදු වළඳන්නැයි ඉදිරිපත් කිරීම හන්ද යනාදියෙන් කියැවේ.

252. **ජානං.**

තමන් දැක හෝ අසා හෝ පවාරිත බව දන්නේ යනු අර්ථයි. **"ආසාදනං චොදනං මඞ්කුකරණං අපෙක්ඛතී'ති-ආසාදනාපෙක්ඛො"** ඔහුට චොදනා කරනු කැමැත්තයි.

**253.** **භුත්තාවිං.**

පවාරිතයා පිළිගත් සඳ ද වළඳන සඳ ද එළවූ මහණහට දුකුළා යි. වළඳා අවසන්හි පචිති වේ. මේ පචිතිය දුන් තැනැත්තහුටයි. වැළඳුවහුට යට සිකයට අනුව ඇවැත් වේ. යාමකාලිකාදියට අයත් දෑ අහර සඳහා එළවීමෙන් ද දුකුළා වේ.

**7.** **අනාපත්ති**-පවාරිතයා ගැන 'අප්පවාරිතයෙකැ'යි හැඟීම ඇති කල්හි ද, අතිරිත්ත කරවා දීමෙහි ද, අතිරිත්ත කරවා ගෙන වළඳවයි දීමෙහි ද, අනෙකකුට රැගෙන යවයි දීමෙහි ද ඇවැත් නො වේ.

**9.** **අඞ්ග**-පවාරිතතා, පවාරිත සඤ්ඤිතා, ආසාදනාපෙක්ඛතා, අනතිරිත්තෙන අභිහට්ඨුං පවාරණතා, භොජන පරියොසානං.

——:o:——

## 37. විකාලභොජන සික්ඛා.

**254** **විකාලෙ.**

අරුණොදය කිරණොදය බිම්බොදය යන ත්‍රයයෙන් අරුණොදයේ පටන් මද්දහන දක්වා බුද්ධාදීන් යාවකාලික අහර වළඳන කාලයයි. ඉන් පිටත් කාලයෙහි ආමිස සඞ්ඛ්‍යාවට ඇතුළත්වන කෑ යුතු යමක් වැළඳීමට පිළිගැන්මෙන් දුකුළා ද, වැළඳීමෙන් පචිති ද, වේ. විකල්හි කාලයය යන හැඟීමෙන් වැළඳුව ද පචිතිමැයි. විකල්හි යාමකාලිකාදිය අහර සඳහා ගැන්මෙන්ද, වැළඳීමෙන්ද, දුකුළා වේ.

**7.** **අනාපත්ති**-පිපාසාදිය ඇතිවිට යාමකාලිකාදිය විකල්හි වැළඳීමෙන් ඇවැත් නො වේ. රොම්හට්කයාටත් ඇවැත් නැත.

**9.** **අඞ්ග**-විකාලතා, යාවකාලිකතා, අජ්ඣොහරණං.

——:o:——

## 38. සන්නිධිකාර සික්ඛා.

**255** **සන්නිධිකාරකං.**

පිළිගෙන තබා එක්රැයක් ඉක්මවූ දෑයයි. යාමකාලිකය ඛාදනීය භොජනීය සඞ්ඛ්‍යාවට නො ගැනෙතුදු අනාපත්තිවාරයෙහි **"අනාපත්ති යාමකාලිකං යාමෙ නිදහිත්වා භුඤ්ජිතුං"** යනු කී නිසා **පචිති** ජනවන බව කියැවේ. යාමකාලිකවගීත් යාමය ඉක්මයාමෙන් එබැවින් යාවකාලික යාමකාලික දෙවගීය ම පිළිගෙන තබා අරුණ ඉක්මවා ලා වළඳන්නහුට පචිති ඇවැත් වේ. දත් අතර සැඟවී තිබුණ බත්හුළක් නමුදු පසුදින ගිලුණ හොත් මේ ඇවැතින් සාපත්තික වේ. අරුණට පළමු දෑහැටි වළඳන්නේත් මේ නිසායි.



තමන් පිළිගෙන පසුව අනුපසම්පන්නකුට නිරපෙක්ෂ ව දුන් වස්තුව නැවත ලැබුණහොත් වැළඳිය හැකියි. අනෙකකුට නො දුන ද පිළිගැන්මෙහි අපෙක්ෂා හැර දැමුව හොත් පසු දින වැළඳිය හැකිය යන සාරත්ථදීපනී මතය විමතිවිනොදනිය නො පිළිගනී. 'දුද්ධොත (=මනාව නො සේදූ) පාත්‍රයෙහි ඉතිරි ව තුබූ ආමිසය ගැන අපෙක්ෂාව නැතත්, පාත්‍රය ගැන පවත්නා අපෙක්ෂාව තගගත (=එහි තුළ වූ) භොජනයෙහි ද පවත්නා නිසා, එය වැළඳීමෙන් ඇවැත් වේ. අපෙක්ෂාව ඇති නිසා පිළිගැන්ම ද ඇති සේ ගැනේ. වස්තු පරිත්‍යාගයෙන් ප්‍රතිග්‍රහණ විසර්ජනය වේ' යනු එහි මතයයි.

පිපාසා ඇති ව සන්නිහිත යාමකාලිකය වැළඳීමෙන් පචිති වේ. ආහාරයක් වශයෙන් වැළඳුව හොත් දුකුළා සහිත පචිතියෙක් වේ. ඊයේ පිළිගෙන තුබූ යාමකාලිකය අද පෙරවරු සාමිස මුඛයෙන් වැළඳීමේ දී ඇවැත් කිහිපයෙක් වේ. සන්නිධි නිසා වන පචිතිය එකෙකි. මුඛගත යාවකාලික ආමිසය හා මුසුවීමෙන් යාමකාලිකය ද යාවකාලික බවට පෙරළේ එබැවින් පවාරිත ව සිට වැළඳුව හොත් අනතිරිත්තපසින් තවත් පචිතියක් විය හැකියි. **"හියෙය්‍යා පටිග්ගහිත යාමකාලිකං අජ්ජ පුරෙභත්තං සාමිසෙන මුඛෙන භුඤ්ජතො සන්නිහිත යාමකාලිකපච්චයා එකං පාචිත්තියං, සන්නිහිතෙන සංසට්ඨ ආමිසපච්චයා එකනති මෙ පාචිත්තියානි"** යනු විනයසඞ්ගහ ටීකාවෙහි මේ ගැන ප්‍රකාශිත වාක්‍යයි. පිළිගෙන සන්නිහිත කොට තැබූ සත්තාහකාලික යාවජීවිකයන් පෙර බත වුවත් අහර පිණිස වැළඳීමෙන් දුකුළා වේ. යාවකාලික යාමකාලික එකට පිළිගැන්මේ දී රසය මිශ්‍රිත වුව හොත් යාමකාලිකය ද යාවකාලික බව ලබයි. අනිත් කාලික ගැන ද එම ක්‍රමය යෙදේ. රස මිශ්‍රිත නො වුව හොත් වෙන් කොට පරිභොග කළ හැකියි.

අකැප සහසෙය්‍ය ජනවන ගෙයෙක රැයක් තුබූ සඞ්ඝික හෝ පුග්ගලික හෝ යාවකාලික යාමකාලික දෙක අන්තොවුත්ථ නම් වේ. එබඳු තැනෙක පිසුවොත් අන්තොපක්ක නම් වේ. අකැප කිළියේ තිබුණ ගිතෙල් ආදිය කැපකිළියේ තිබුණ අහරක් සමග මුසුකොට වැළඳුවත් අන්තොවුත්ථ දොෂය වේ. එයින් දුකුළායි. සත්තාහකාලික යාවජීවික දෑ අකැප කිළියේ තැබිය හැකියි. අන්තොවුත්ථ අන්තොපක්ක දෙස් වළහනු පිණිස කැපකිළි සතරක් අනුදැන ඇත. යාවකාලිකාදිය නිහිත කොට ඒ ඒ කල් නො ඉක්මවා ද, යාවජීවිකය ප්‍රත්‍යය ඇති විට සැමදා ද වළඳනු වටී.

**9.** **අඞ්ග**-යව්කැලි යම්කැලි අමිස් වීම, සන්නිධිය, වැළඳීම.

——:o:——

## 39. පණීත භොජන සික්ඛා.

**256. පණීත භොජනානි.**

(පණීතෙහි සංසට්ඨානි භොජනානි) පණීත සඳින් ගිතෙල්, වෙඬරු, තෙල්, මී, පැණි, මස්, මාලු, කිරි, දී, යන උතුම් බොජුන් ගැනේ. සප්තවිධ ධාන්‍යයෙන් සකස් කරන ලද්ද භොජනයයි. "සප්පිනං හත්ථං දෙහි" යනාදිය කියා නොගිලන් ව සිට පිණී බොජුන් ඉල්ලා වළඳන්නහුට පචිති ඇවැත් වේ. පිණී බොජුන් නැති ව පාසු නො ලබන්නා ගිලනායි.

නො ගිලන් ව ගිලන් සත් ඇතිව බත් නුමුසු සප්පි ආදිය බෙහෙත් පිණිස ඉල්ලා ගැන්මෙන් මතු මහානාම සිකය අනුව පචිති වේ. බෙහෙත් සඳහා නො ව තමාට වැළඳීමට විනවීමෙන් ද, මස්-මාලු-කිරි-දී විනවීමෙන් ද සෙඛියාවෙහි සූපොදන විඤ්ඤත්ති සිකයට අනුව දුකුළා වේ. සප්පි ආදියෙන් මිශ්‍රිත භොජනය මේ සිකයට අයත්ය.

7. **අනාපත්ති**-ගිලන්කල විනවා ගෙන නො ගිලන් කල වැළඳුව ද, ගිලනා ඉතිරි කළ දූය වැළඳුව ද, අනුන් සඳහා විනවූව ද පචිති ඇවැත් නො වේ.

9. **අඞ්ග**-පණීත භොජනතා, අගිලානතා, කතවිඤ්ඤත්තියා පටිලාභො, අජ්ඣොහරණං.

——:o:——

## 40. දන්තපොන සික්ඛා.

**257. අදින්නං.**

කාය, කායපටිබද්ධ, නිස්සග්ගිය, යන ක්‍රමයෙකින් අනුපසම්පන්නකු තුදුන් ආහාරයයි. හස්තාදි අවයවයෙකින්- යටත් පිරිසෙයින් පයේ ඇඟිල්ලෙන් නමුදු දීම කායික දීමයි. සිරුර හා සම්බද්ධ හැඳි ආදියෙකින් දීම කායපටිබද්ධ දීමයි. කයින් හෝ කායපටිබද්ධයෙන් හෝ, අත්පස සිටියහුගේ කයේ හෝ කා පිළිබැඳි යමෙකැ හෝ වැටෙන සේ දැම්ම නිස්සග්ගිය දීමයි. පිළිගැන්ම ද කයින් හෝ කාය පටිබද්ධයෙන් හෝ කළ හැකියි. පාත්‍රාදි උපකරණයෙකින් ගැන්ම කා පිළිබැඳි ගැන්මයි. පිළිගත හැක්කේ බලමැදුම් මිනිසක්හු විසින් එසවිය හෙන තරම් බරෙකි. එමෙන් ම අත්පසැ සිටීමත් අභිහාරය හෙවත් එළවීමත් පැවතිය යුතුය. මෙසේ තිරිසනකුගෙන් ද පිළිගත හැකියි. බලමැදුම් පුරුෂයකු විසින් ඔසවා ගත හැකි ඇඳ පුටු මේස ආදිය පහසා ද එමත වූ දෑ පිළිගත හැකියි.



වළං බිම තිබිය දී දත්කද වුවත් පිළිගත හැකියි. දූලි සහිත පාත්‍රය සෝදා හෝ පිළිගන්වා ගෙන හෝ අහර ගතයුතු. පිණ්ඩචර්‍යාවෙහි යනවිට දූලි වැටුණ හොත් අතින් නුමුඳා (අතින් මුදා තබා නැවත ගැන්මෙන් උග්ගහිත වේ.) අනුපසම්පන්නකු ළඟට ගොස් පිළිගන්වා ගත යුතු. දූලි ඉවත් කළ හැකි වේ නම් එසේ කොට වැළඳිය හැකියි. පිළිගැන්වීමේ දී පිරිසිදු බිම යමක් වැටුණ හොත් සියතින් ගෙන වළඳනු වරී. බත් පිසීමේ දී හෙරණහුට හාල් ගැරිය නො හැකි නම් බඳුනත් හාලුත් පිළිගෙන ගරා ගිනි නැති ලිප මත තැබිය හැකියි. එහෙත් ගිනි නො මෙළවිය යුතු ඉදුණු පසු බා වැළඳිය හැකියි.

සික්ඛා පච්චක්ඛානයෙන් ද, මරණයෙන ද, ලිඟු පෙරළීමෙන් ද නිරපෙක්ෂ ව බැහැර ලීමෙන් ද, චොරාදි හරණයෙන් ද, අනුපසපතකුට දීමෙන් ද පිළිගැන්ම නැති වේ.

**258. මුඛමාරං.**

ගලබිලයයි. මුවින් ගත ද නාසයෙන් ගත ද ගලබිලයෙන් පිවිසෙන තිසා සියල්ල මුවදෙරගත වේ. ආහාර සඳින් වැළඳියයුතු සිවුකැල්ල ම කියැවේ.

### සිවුකැලි.

1. **යාවකාලික**- (යාව මජ්ඣන්තිකො කාලො අස්සා'ති- යාවකාලිකො.) අන් යාවකාලික දූයක් හා මිශ්‍ර නො කළ ද, බඩසා නැති කිරීම් සංඛ්‍යාත ප්‍රයෝජනය සලසාලන මුල් බොඩ අල පොතු කොළ මල් පල ඇට පිටි ලාටු ගෝරස ඈ සියල්ල ම යාවකාලිකයි. පෙරවරු පමණක් වළඳනු වරී.

2. **යාමකාලික**- (යාමො කාලො අස්සා'ති- යාමකාලිකො.) අෂ්ටවිධ පානත්, ධාන්‍යරස නවම්හාඵලරස හැර සෙසු ඵල රසත්, තම්බා ගත් යාවකාලික පත්‍රවල රසය හැර සෙසු පත් රසත්, මීමල් රස හැර සෙසු මල් රසත්, කසට නැති උක් රසත් (-මෙය සත්තාහ කාල්කයි.) විකාලයේ කැපයි. මිදිවල සවරසය ද (-හුදු මිදි යුෂයි. මීට ඇල් දිය දමා බොනු වරී.) ඇල් දිය ලා මැඩගත් මිදිරසය ද, අඹ දඹ ඇටිකෙහෙල් සෙසු කෙහෙල් සාලූක බොරළුදමුණු යන මෙවායේ රසය ද අෂ්ටවිධ පාන නම් වේ. මිදිවල සවරසයට ඇල්දිය ලංපියයුතුයයි කී බැවින් ඇල්දිය නොලූ සෙසු රස කැපයයි මතයක් වතුදු එය නො මැනවි. **"උදකෙන පන අසම්භින්නො සරසො යාවකාලිකො"** යනු විනිච්ඡය ටීකායි.

සාලූක ශබ්දය කුමුදුදීන්ගේ මූලයෙහි ප්‍රසිද්ධයි. එහෙයින් නෙලුම් ආදියේ අල සාලූක නමැයි ඇතැම් පොතෙක එයි. "**සාලූකං නාම කන්දං**" යනු වජිරබුද්ධියි. සෙසු සත්පනුම් එලයෙන් කැරෙන නිසා අටවැන්නද එසේයයි ගැන්ම මැනැවැයි සිතේ. "**අම්බාදයො සඤ්ඤ තං තං එලෙසි වත්තමානා ඉධ උපචාරවසෙන තපේජ පානසෙ වුත්තා**" යනුද "**සාලූකං කුමුදුප්පලානං එලරසං, බුද්ධසික්ඛාවණ්ණනායං පන සාලූකපානං නාම රත්තුප්පල-නිලුප්පලාදිනං කිඤ්ජක්ඛෙහි කතපානන්ති වුත්තං**" යනුද විනිවිජය ටීකායි.

තමා එල පිළිගෙන කළ රසය පෙරබත පමණක් වටී. අනුප-සපනකු කළහොත් දෙවරුවේ ම වටී. යාවකාලික අමුකොළවගී ඇල්දිය ලා මැඩ ගත් රසය අව්වෙන් රත් කොට වුවත් වටී. ගින්-නෙන් තම්බා ගත් යව්කැලිපත්යූෂ නො වටී. මීමල් රසය හිරු රසින් කකාරා ගත ද පස්වරු නො වටී. යාමකාලිකය ගින්නෙන් උණු නො කැරේ. උණුදිය දමා තැම්බීම ද නොවටියි. දූන් ගිලන්-පසයයි බොන බීම විනයට විලොම් සේ පැනේ.

**3. යාවජීවික**-(යාව ජීවං අසස අත්ථි'ති යාවජීවිකො) කහ ඉඟුරු සුදුලූනු ගම්මිරිස් අරළු බුළු මීඉටි මල මූත්‍ර අළු ආදිය ද, අහරකිස නො සාදන මුල් හර සුඹුළු පත් මල් පල වැල් ලුණු ආදිය ද යාවජීවිකයි. පිළිගෙන දිවි ඇති තාක් තබාගෙන ගිලන් බව ඇති විටෙක වැළඳිය හැකියි. ජලය අකාලික වුවත් ඒ ඒ කාලිකයන් හා මුසු වීමෙන් තත් තත් සවභාවයට පෙරළේ.

**4 සත්තාහකාලික**-පූර්වොක්තයි. "සතැවුකැලි කොට තල් සකුරු පුලුප් සකුරු නො ගනුව, මේ දෙක පෙරවරු මුත් පස්වරු නො වටී" යනු සිඛවළඳ විනිසයි.

## දුකුළා අටෙකි.

**1. පුබ්බපයොග දුක්කටය**-අවහාරය ගැන කීමේ දී "දුතියං පරියෙසති" යනාදි දුකුළා වන තන්හි කී දුකුළායි.

**2. සහපයොග දුක්කටය**-"තතො ජාතකං ලතං වා ඡින්දති ආපත්ති දුක්කටස්ස" යනාදීන් පරිජියට පෙර සහප්‍රයෝගයේ දී දුකුළා පවිති දෙතන්හි ම වන දුකුළායි.

**3. අනාමාස දුක්කටය**- දශවිධරත්න, ධාන්‍ය, ආවුධ, තූර්‍ය්‍ය භාණ්ඩ, ස්ත්‍රීරූප ආදි නො පැහැසිය යුතු දෑ පැහැසීමෙන් සිදුවන දුකුළායි.



**4. දුරුපචිණ්ණ දුක්කටය**-නො පිළිගත් දෑය ඇල්ලීම, කැඳ හැළියේ පෙණ හැර දැමීම, පලගත් අතු සෙලවීම, ගෙඩි ඇල්ලීම, ආදිය උපසපනුනට නො වටී. කළහුට අකැපයි. යටට සැන්ද දමා කැඳ හැළිය හැඳිගෑමේ දී මිතු වූ සහල් යටට යාමෙන් තැම්බේ. මේ නිසා සාමංපාකයත් දුරුපචිණ්ණයත් (-නො පිළිගත් ආමිස හරිත භාජන කොළිරිසියෙන් පිරිමැදීම) යන දෙකම සිදු වේ. සියල්ලනට අකැපයි. භික්ෂූන්ගේ පරිභොගාරහ යමක් කරුණු ඇතිව ද සොලවනු පමණකුදු නො වටී.

**5. විනයදුක්කටය**-රජස් ඇති පාත්‍රය නො පිළිගත්වා ගෙන හෝ සෝදා නො ගෙන හෝ අහර පිළිගැන්මෙන් වන දුකුළායි. අනිත් සත්දුකුළාවෙන් පිටත් දුකුළා ද මෙහි ම ඇතුළති.

**6. ඤත්තදුක්කටය**-සඞ්ඝභෙදයට උත්සාහ කරන්නකු ගැන අසා, එය වැළකීමට කරුණු නො කියන්නහුට වන ඇවැති.

**7. ඤත්ති දුක්කටය**-මහණ පාමොක්හි යාවතතියකස ඞ්ඝාදි සෙස සතර ද, අරිට්ඨසිකායද, මෙහෙණ පාමොක්හි යාවතතියක පරිජිය ද, සතර සඟවෙසෙස් ද, චණ්ඩකාලී සිකාය ද යන එකො-ළොස් සමනුභාසන කම්යන්හි දී ඤත්තියේ දී වන දුකුළායි.

**8. පටිස්සව දුක්කටය**-වස්විසීම ආදිය සඳහා පිළින දී පසුව කඩ කරන්නහුට වන දුකුළායි.

**259. අඤ්ඤත්‍ර උදකදන්තපොනා.**

අහරක් නො වූ දියෙහි ආහාර සඤ්ඤ ඉපදවූ නිසා ද, දූහැටි මුවදෙරට පිවිසෙන නිසා ද, මහණුනට ඇතිවූ කුකුස් දුරලනු පිණිස පැනවූ අනුප්‍රඥප්තියෙකි පොකුණු ආදියෙහි වූ අතිබහල ජලය පිළිගත යුතුය. පිරිසිදු දිය පිළිගතයුතු නො වේ. උණුදියෙහි අළු වැටීගියත් පිළිගත යුතුයි. මූල දී දරඅඟුරු පිළිගෙන තිබුණ හොත් වරද නැත. තදි ජලය ද මැනවි. දූහැටිරසය නො දූන ගිලුණත්, දත් අතර ලැගුණු සියුම් නො වූ ආමිසයේ රසය ගිලුණත් ඇවැත් වේ.

**7. අනාපත්ති**-සපුන් ඩැහූ විටෙක කෙනකු නැතහොත් අළු මැටි මල මූත්‍ර යන සතර මහාවිකටයන් තමා ම ගෙන වළඳනු වටී.

**9. අඞ්ග**-අපටිග්ගහිතකතා, අනනුඤ්ඤාතතා, ධූමාදි අබෙබා-හාරිකාභාවො (-දුම් ඈ ගිලුණ ද අව්‍යවහාරයියි.) අජ්ඣො-හරණං.

**භොජන වග්ගො චතුත්ථො.**

———:o:———

# 41. අචේලක සික්ඛා.

**260. අචේලකස්ස.**

නග්නශ්‍රමණයා අචේලක නම් වේ. හෙරණ මහණුන් හැර සෙසු පැවිද්දෝ පරිබ්බාජක ද, හෙරණී මෙහෙණින් හැර පැවිදි වූ ස්ත්‍රීහු පරිබ්බාජිකා ද වෙති. මේ සියල්ලෝ තිත්ථික සදින් කියැවෙති. මෙ බත්දන් අතර පැවිදි වූ මාපියනට නමුදු කාය-කායපටිබද්ධ-නිස්සග්ගිය යන ක්‍රමයෙන් අහරක් දුන හොත් පචිති ඇවැත් වේ. දිය දැහැටි දීමෙන් දුකුළා වේ.

7. **අනාපත්ති**-අනුපසම්පන්නකු ලවා දෙවීමෙන් ද, ඔවුන් වෙත තමාගේ පාත්‍රය තබා ගන්නැයි කීමෙන් ද, ඔවුන් තැබූ බඳුනකට දැමීමෙන් ද, බැහැර සිරුර ගානා තෙල් ආදිය දීමෙන් ද ඇවැත් නො වේ.

9. **අඞ්ග**-අඤ්ඤතිත්ථියතා, අනනුඤ්ඤාතතා (-අනුනොදත් අහරක් බව) අජ්ඣොහරණත්ථාය සහත්ථා අනික්ඛිත්ත භාජනෙ දානං.

---

# 42. උය්‍යොජන සික්ඛා.

ගාම සදින් නගර ද ගැනේ. මාගමක එසේ ගමේ සිටුනා බව නො දැන නමුදු යම් භික්ෂුවක් "අසුවල් ගමට පිඬු පිණිස යම්හ"යි අන් මහණකු කැඳවා ගෙන ගොස්, ඔහුට යම්කිසි ආමිසයක් ලබා දී හෝ නො දී හෝ **"ගච්ඡ ආවුසො න මෙ තයා සද්ධිං"** යනාදිය කියා පිටත්කර යවා නම් පචිති ඇවැතින් සාපත්තික වේ.

**261. උය්‍යොජෙය්‍ය.**

මාගම හා සිනාසීම, ක්‍රීඩාකිරීම, රහස් ව හිඳීම ආදි අනාචාරයක් කැමැති ව පිටත් කිරීමයි. දෙදෙනාට ම සැපිය නො හැකි බව ආදි කරුණක් නිසා නම් වරද නැත. දස්සන සවනූපචාර වූ දෙලොස් රියන ඉක්ම ගිය කල්හි පචිති වේ. දෙරටු භිත්ති ආදියෙන් මුවහ තැනෙක්හි නම් දෙලොස් රියන් සීමාව ගණනට නො ගැනේ. **"එතදෙව"** යන්නෙන් අනාචාරය ම කියැවේ. මෙය අසායේයයි සිතා ක්‍රොධ විසින් හිඳීමාදියෙහි දෙස් කියන්නහුට දුකුළා වේ. සුද්ධ සිතින් කීමෙ වරද නැත. අසුද්ධ සිතින් හෙරණකු යැවීමෙන් දුකුළා වේ.

9. **අඞ්ග**-අනාචාරං ආචරිතුකාමතා, තදත්ථමෙ'ව උපසම්පන්නස්ස උය්‍යොජනා, උය්‍යොජිතස්ස උපචාරාතික්කමනං.

---



# 43. සභොජන සික්ඛා.

**262. සභොජනෙ කුලෙ.**

**"සහ උභොහි ජනෙහි වත්තතී'ති- සභොජනං, කුලං. අථවා භුඤ්ජිතබ්බං-භොජනං(-ඉත්ථී ච පුරිසො ච) භොජනෙන සහ වත්තතී'ති-සභොජනං, කුලං"** කුලය නම් ගෘහයයි. මෛථුනරාගයෙන් යුත් අඹුසැමියන් ඇති ගෙයෙක්හි යන අදහසයි.

**263. අනුපඛජ්ජ-නිසීදෙය්‍ය.**

එබඳු ගෙයෙක යහන් ගබට වැද හිඳින්නහුට පචිති ඇවැත් වේ. මහත් යහන් ගැබෙක්හි නම් දොරබාවේ සිට දෙරියන් වියත් අත්පස ඉක්මවා ඇතුළත සයනයට ආසන්න ව හිඳීමෙන් ද පළල පස්රියන් වූ හෝ ඌන වූ හෝ ගැබෙක්හි නම් එහි මධ්‍යය ඉක්මවා (දොරබාවේ සිට දෙරියන් වියත මැද්දයි.) හිඳීමෙන් ද ඇවැත වේ.

7. **අනාපත්ති**-හි ප්‍රමාණය නො ඉක්මවා සිටිවිට ද, දෙවෙනි මහණකු ඇති සඳ ද, දෙදෙනා බැහැර ගිය කල ද, ඔවුන් වීතරාගයන් වුවහොතින් ද ඇවැත් නො වේ.

9. **අඞ්ග**-අවීතරාග ජයම්පතිකානං සන්නිහිතතා, සයනිඝරතා, දුතියස්ස භික්ඛුනො අභාවො, අනුපඛජ්ජ නිසීදනං.

---

**44-45 රහොනිසජ්ජා දෙසික්ඛයෙ විස්තර අනියතවයෙහි උක්තයි.**

---

# 46. චාරිත්ත සික්ඛා.

**264. සභත්තො සමානො.**

පස් බොජුන් අතුරින් එකෙකින් පවරන ලද භික්ෂුව ඒ නිමන්ත්‍රණය නිසා ම බත් ඇතියේ වේ. ගණභොජනයේ මෙන් අකැප නිමන්ත්‍රණය බව **ඛන්ධාපිටපොතෙහි** එයි.

**265. සන්තං භික්ඛුං අනාපුච්ඡා.**

වෙහෙර තුළ යම් තැනෙක දී කුලපයුරුපාසන සිත උපන හොත්, එතැන සිට යන්නහු විසින් උපචාර සීමාව තුළ පියෙවි කථාව ඇසෙන මානයේ සිටින මහණකුට "මම අසුවල් ගෙදරට යමි"යි ආපුච්ඡා කොට යා යුතු. ඔබ මොබ සොයා ගොස් කීම අවශ්‍යක නො වේ. යා හැකි තැනෙක පැනේ නම් දෙලොස් රියන ඉක්ම සිටියහුට ද කිවයුතු බව **විමතිවිනොදනියෙහි** එයි.

**266. පුරෙභත්තං වා පච්ඡාභත්තං වා.**

නිමන්ත්‍රිතාහාරය වැළඳීමෙන් පෙර හෝ පසුව හෝ මධ්‍යාහ්නය ඉක්මෙන්නට පළමු නිමන්ත්‍රණය කළ ගෙය හැර අන් ගෙයකට යන්නහුට පචිති ඇවැත් වේ. අරුණ නැගෙන සඳ වැළඳු වත් ඉන්පසු මධ්‍යාහ්නය තෙක් කාලය මෙහි පස්බතයි. ගෙහි උපචාරයට පැමිණීමෙන් දුකුළා ද, එළිපත ඉක්මවීමෙන් පචිති ද වේ. ගම් වීථි ඉක්මවීමෙන් ද ඇවැත් වේයයි යෙත්.

7. **අනාපත්ති**-ගමතුළ වූ වෙහෙර, මෙහෙණ අසපු, තිත්ථිකාරාම, අසනසාලා, නිමන්ත්‍රණය කළවුන් ගේ හෝ සලාකාදිය දෙන්නවුන්ගේ ගෙය යන මේවාට යාමෙන් ද, ආපදාවක් ඇති විට යාමෙන් ද ඇවැත් නො වේ.

9. **අඞ්ග**-පඤ්චන්නං භොජනානං නිමන්තනසාදියනං, සන්තං භික්ඛුං අනාපුච්ඡනා, භත්තියඝරතො අඤ්ඤඝරූපසඞ්කමනං, මජ්ඣන්හිකානතික්කමො, සමයාපදානං අභාවො.

——:(০):——

## 47. මහානාම සික්ඛා.

**267. චාතුමාස පච්චය පවාරණා.**

සිවුමසක් පස් බෙහෙතින් පැවරූවොත් ඉවසිය යුතුයයි කියේ **"ඉච්ඡාමහං භන්තෙ සඞ්ඝං චාතුමාසං භෙසජ්ජෙන පවාරෙතුං"** යි මහානාම ශාක්‍යයා ඉල්ලූ බැවින් නිදාන වශයෙනි. නැවත සිවුමසකට පැවරූවොත් පුන පවාරණය ද, යවිදිවියෙන් පැවරූවොත් නිච්චපවාරණය ද අනුඤ්ඤාත වී. මෙහි ගැනෙන්නේ සඞ්ඝ පවාරණයයි.

මාස නියම කොට හෝ යාවජීවයෙන් හෝ **'පස්බෙහෙත් දෙමැයි'** සඞ්ඝයාට පැවරූවොත් එවේලාවේ ගිලන් බවක් නැතත්, ගිලන් වූ විටෙක ගනිමැයි සිතා ඉවසිය හැකියි. මෙ පමණ රූ ගණනක්යයි කාල පරිච්ඡේද කොට හෝ, ගිතෙල් පමණක් දෙමි යනාදීන් නාම විසින් ද පත-නැළිය බැගින් දෙමියි ප්‍රමාණ විසින් ද බෙහෙත් පරිච්ඡේද කොට හෝ පැවරූ කල්හි ඒ සීමා ප්‍රමාණ ඉක්මවා ගන්නහුට මෙ සික්ඛාපදය අනුව පචිති ඇවැත් වේ. අරළු ආදි බෙහෙත් අනාවශ්‍යක විටෙක විනවා ගැනීමෙන් ද, අරළු විනවා අනෙකක් ආවශ්‍යක කල්හි සකුරු ආදි අන් දෙයක් විනවා ගැනීමෙන් ද පචිති වේ.



7. **අනාපත්ති**-ප්‍රමාණ-රාත්‍රි ඉක්ම ගියත් ඇති තතු කියා ඉල්ලන ගිලනාට ද, නැයා පුග්ගලික පවාරකයා අපරියන්ත පවාරකයා යන මොවුන්ගෙන් ඉල්ලා ගන්නහුට ද, අනුන් සඳහා විනවන්නහුට ද ඇවැත් නො වේ.

9. **අඞ්ග**-සඞ්ඝපවාරණා, තතො භෙසජ්ජවිඤ්ඤත්ති, අගිලානතා, පරියන්තාතික්කමො.

———

## 48. උය්‍යුත්තසෙනා සික්ඛා.

**268. උය්‍යුත්තං සෙනං.**

යුද පිණිස ගමින්-නුවරින් නික්ම කඳවුරු බැඳ සිටුනා හෝ ගමන් ගන්නා හෝ සිවුරඟ සෙන් සුදුසු කරුණක් නැතිව දක්නහුට පචිති ඇවැත් වේ. ආරෝහකයන් සිවුදෙනකු ගෙන් ද පා රක්නවුන් අට දෙනකුගෙන් ද යුත් හස්තියා ය, ආරෝහකයකු ගෙන් ද පා රක්නවුන් දෙදෙනකුගෙන් ද යුත් අශ්වයා ය, ඇණ රක්නවුන් දෙදෙනකුගෙන් ද රියැදුරකුගෙන් ද සෙබළකුගෙන් ද යුත් රථය, ආයුධ සන්නද්ධ භටයන් සිවු දෙනකුගෙන් යුත් පදාතිය යන මොහු අධමාන්තයෙන් සිවුරඟ සෙන් වෙති. අඞ්ග අඩු වුව හොත් දුකුළා වේ. දක්නට යාමේ දී පියෙහි පියෙහි දුකුළා ද, පෙනෙන මානයේ සිට බැලීමේ දී පචිති ද වේ. නැවත නැවත ඉදිරියට ගොස් බලනහොත් පියෝ ගණනින් පචිති වේ.

7. **අනාපත්ති**-උයන් කෙළි ආදියට යන අනුය්‍යුත්ත සෙනාව අනුය්‍යුත්තය යන සංඥාව ඇති ව දැකීමෙන් ද, අරමේ සිට හෝ තමා සිටි තැනට පැමිණි හෝ සෙනාව දැකීමෙන් ද, අනුප්‍රඥප්තියෙහි කී ලෙස ගිලනකු උදෙසා යන්නට වීම් ආදියෙන් ද ඇවැත් නො වේ.

9. **අඞ්ග**-උය්‍යුත්තං සෙනං දස්සනත්ථාය ගමනං, අනනුඤ්ඤාතකාසෙ දස්සනං, තථාරූපපච්චයස්ස ආපදාය වා අභාවො.

———

## 49. සෙනාවාස සික්ඛා.

**269 සෙනං ගන්ත්වා.**

සෙනා පරික්ෂෙපය හෝ පරික්ෂෙපයට සුදුසු තැන හෝ සඤ්චරණස්ථාන පර්යන්තය හෝ සීමාව සේ ගෙන එයින් ඇතුළට යාමෙන් සෙනාවට යාම වේයයි ගතයුතු. යම් කිසි ආවශ්‍යක කරුණෙකින් එසේ ගිය හොත් තෙරැයක් එහි විසිය හැකියි. සිවුවැනි දින හිරු අස්තයට ගිය කල්හි අහස සිටිය ද පචිති වේ.

7 **අනාපත්ති**-නෙවෙනි අරුණින් පෙර ගොස් නැවත අවුත් වසන්නහුට ද, ගිලන් කමින් හෝ ගිලනාට බෙහෙත් සැපයීම් ආදි කිසෙකින් හෝ වසන්නහුට ද, සතුරන් විසින් යා නො හැකි සේ බාධිත සෙනාවෙහි වසන්නහුට ද, වෛරියකු විසින් හෝ ප්‍රධානයකු විසින් හෝ උපද්‍රැත ව වසන්නහුට ද, ආපදා-වෙකින් වසන්නහුට ද, ඇවැත් නො වේ.

9. **අඞ්ග**-තිරත්තාතික්කමො, සෙනාය සුරියස්ස අත්ථංගමො, ගිලානතාදීනං අභාවො.

---

## 50. උය්‍යොධික සික්ඛා.

**270. උය්‍යොධිකං.**

දෙතුන් රැයක් සෙනාවෙහි විසුව ද උය්‍යොධිකාදිය බලන්නට අවසරයෙක් නැත. **"උග්ගන්ත්වා යුජ්ඣන්ති එත්ථා'ති උය්‍යොධි-කං"** යුද්ධිමයි. **"බලස්ස අග්ගං කොට්ඨාසං ජානන්ති එත්ථා'ති-බලග්ගං"** බළහමුදු ගණින් ගන්නා තැනයි. **සෙනාබ්‍යූහ** නම් මෙ තැන ඇත් ඇණිය, මෙතැන අස් ඇණිය, යනාදීන් චක්ක-සකට-පද්මාකාරයෙන් පෙළ ගැස්සූ සෙනායි. මේ කවරක් බැලුව ද පචිති වේ.

**අචෙලකවග්ගො පඤ්චමො.**

---

## 51. සුරාපාන සික්ඛා.

**271. සුරා.**

සහල්පිටි ආදි පිටිවලීන් දියත් දමා අලළා කළ **පිට්ඨසුරාය,** කැවුමින් කළ **පූවසුරාය,** බතින් කළ **ඔදනසුරාය,** රාමණ්ඩි දමා කළ **සම්භාරසංයුත්තසුරාය** යන මොහු සුරාවලීයෝයි.

**272. මෙරය.**

කලක් පරණ කරන ලද්දේ **මෙරයයි.** මී-තල්-පොල් ඈ මල්වල රසය චිරපරිවාසිත වූයේ **පුප්ඵාසව** නම්. පනසාදි එල රසින් නොහොත්-මිදිපල ඈ මැඩ ඒ රසයෙන් කෙළේ **ඵලාසවයි.** මූදීකාරසයෙන් නොහොත්-මිදිවල සවරසයෙන් නැතහොත්-මී පැණි ආදියෙන් කෙළේ **මධ්වාසය** යි උක්රසින් කෙළේ **ගුළාසව** යි. අරළු බුළු නෙල්ලි කුළුබඩු ඈ නානා වගී දමා කළ රසය චිර-පරිවාසිත වූයේ **සම්භාරසංයුත්ත** නම්. ආසව නාමයට ඇතුළත්



වන මේ සියල්ල ම පැසෙනු පිණිස සැළියේ බහාලූ තැන පටන් බොන්නහුට පචිති ඇවැත් වේ. පුෂ්පරසයක් වූ අලුත් තෙලිදිය කැප පානයෙකි.

භික්ඛුවිභඞ්ගයෙහි උය්‍යුත්ත-උය්‍යොධික-සුරාපාන වසයෙන් අචිත්තක ලොකවජ්ජ ශික්ෂා තුනෙකි. සුරාවෙහි සුරායයි නො දැන බීමෙන් ඇවැත් වෙතත් අකුසල් සිදු නො වන බව **සාරත්ථදීපනි** මතයයි. **විමතිවිනොදනිය** එයට ප්‍රතිපක්ෂයි. "සුරාපානයේ දී සුරායයි නො දැන බීවත් අකුසල් සිත ම උපදී. (විශෙෂ ස්ථාන යෙකි මේ.) සාරත්ථදීපනියේ කියැවෙන්නේ අභයගිරිකයන් ගේ මතයෙකි. දැන බීමෙන් හෙරණුන්ගේ සිල් බිඳේ. නො දැන බීවොත් නො වේ. එහෙත් එයින් **කම්මපථප්පත්ත** අකුසලය සිදු වේ. අකුශලය එකෙකි. ඇවැත අනෙකෙකි" යනු **විමතිවිනොදනි** මතයයි.

**"සුරාය මෙරයස්ස ච සමානෙපි සම්භාරසංයොගෙ මද්දිත්වා කතා සුරා, චිරපරිවාසිතමත්තෙන මෙරයන්ති එවම්'මෙසං නානාකරණං"** යනු විනයත්ථ මඤ්ජූසායි.

7. **අනාපත්ති**-මද්‍යවර්ණ-ගන්ධ-රස-ඇති නමුත් ලොණසොවී-රකය ද (-මස් මාලු ධාන්‍ය ඵලාදි නානා ජාති බහා දෙතුන් වසක් ධාන්‍ය මැද තබා සාදන, නොයෙක් රොග සංසිඳුවන බෙහෙතෙකි.) අරිෂ්ට විශෙෂයක් වන සූත්ත ද, සුවඳවත් කිරීමට මද්‍යක් මද්‍ය බහා පිසන සූපාදිය ද වළඳනු වටී.

9. **අඞ්ග**-මජ්ජභාවො, තස්ස පානං.

---

## 52. අඞ්ගුලිපතොදක සික්ඛා.

**273. අඞ්ගුලිපතොදකො.**

**"අඞ්ගුලීහි උපකච්ඡාදීනං පතොදකං සඞ්ඝට්ටනං-අඞ්ගුලි පතොදකං"** කිසිලි ආදියෙහි කිති කැවීමයි. කවර අවයවයෙකින් නමුදු සිනාසෙන රිසියෙන් හෙවත් කෙළි අදහසින් උපසපනකුගේ සිරුර පැහැසීමෙන් පචිති වේ.

කයින් කායපටිබද්ධය, කායපටිබද්ධයෙන් කය, කායපටිබද්ධ-යෙන් කායපටිබද්ධය, නිස්සග්ගියෙන් කය, නිස්සග්ගියෙන් කාය-පටිබද්ධය, නිස්සග්ගියෙන් නිස්සග්ගිය යන අයුරින් පැහැසීමෙන් දුකුළා වේ. අනුපසම්පනා පිළිබඳව සියලු තන්හි පියොවක් පාසා දුකුළා වේ. සෙසු සිවුසහදැමියෝ ද සියලු සත්හු ද මෙහිලා අනුප-සපන්හුයි.

7. **අනාපත්ති**-හසන සිත් නැති ව හෝ පරිකර්මාදි කෘත්‍යයක් ඇතිව හෝ පැහැසීමෙන් ඇවැත් නො වේ.

9. **අඞ්ග**-හස්සාධිප්පායතා, උපසම්පන්නස්ස කායෙන කායාමසනං.

## 53. හස්සධම්ම සික්ඛා.

274. **හස්සධම්මෙ**.

දියෙහි සිනාවට සුදුසු ක්‍රීඩා කිරීම නිමිති කොට පචිති ඇවැත් වේ. කෙළනා රිසි ඇතිව පැනීම නැගීම ගැලීමාදිය සඳහා බොල-වින් වඩා සිටි දියට බස්නහුට දුකුළා වේ. පීනීම් ආදියේ දී පියො-වක් පාසා පචිති වේ. කෙළි රිසියෙන් නැව් හගුළු පැදවීමෙන් ද; අතින් පයින් කැටකැබලිත්තෙන් දියට ගැසීමෙන් ද, බඳුන් ගත දියත්තක් නමුදු දැමීමෙන් ද, අකුරු හැර සෙසු හිරක් ඇදීමෙන් ද, බොලවින් යට දියෙහි කෙළීමෙන් ද දුකුළා වේ.

7. **අනාපත්ති**-කෙළි රිසි නැති ව ස්නානාදි කටයුත්තක් සඳහා පීනීම ආදිය කළ ද වරද නැත.

9. **අඞ්ග**-උදකස්ස උපරිගොප්ඵකතා, හස්සාධිප්පායෙන කීළනං.

## 54. අනාදරිය සික්ඛා.

275. **අනාදරියෙ**.

**"අනාදරස්ස භාවො අනාදරියං"** පුහුලාට හෝ ධර්මයට හෝ අනදර කිරීම නිමිති කොට පචිති වේ. ශික්ෂාපද දක්වා උපසපනකු විසින් අවවාද කරනුලබන කල්හි 'මෙතෙම උක්ඛිත්තකයෙකි ගැර-හුම් ලද්දෙකි' යනාදීන් ඔහුගේ වදන් කරනු නො කැමැති වීම **පුග්ගලානාදරියයි** එසේ ම ඒ ශික්ෂාවෙහි නො හික්මෙනු කැමැති ව 'මේ දහම කෙසේ නැසේද්ද'යි ධර්මයට අගරු කිරීම **ධම්මානාදරියයි**. උපසපනකු විසින් සූත්‍රාභිධර්මයෙහි එන ප්‍රතිපත්තියෙකින් ඔවා දෙනු ලබන කල්හි ද, අනුපසපනකු විසින් සිකපදයෙන් හෝ සූත්‍රාදියෙන් හෝ කියනු ලබන කල්හි ද අනදර කිරීමෙන් දුකුළාවේ.

7. **අනාපත්ති**-මෙය අපගේ ආචාර්ය පරම්පරාගතයයි ද, නව අසා බලා දනිමැයි ද කියන්නහුට වරද නැත.

9. **අඞ්ග**-උපසම්පන්නස්ස පඤ්ඤත්තෙන වචනං, අනාදරිය කරණං.



## 55. භිංසාපන සික්ඛා.

276. **භිංසාපෙය්‍ය**.

උපසපනකු බියපත් කරනු සඳහා මනුස්සවිග්ගහ පරිජියේ කී පරිදි අමනාප රූප-සද්ද-ගන්ධ-රස-ඵොට්ඨබ්බයන් එළවන්නහුට ද, චොර වාළ කාන්තාරාදිය පිළිබඳ බිහිසුණු පුවත් කියන්නහුට ද, අසන්නහු බියපත් වුවත් නො වුවත් පචිති වේ. අනුපසපනකුට කීමෙන් දුකුළා වේ.

7. **අනාපත්ති**-බිය ගන්වන අදහස් නැති ව රූපාදිය එළවීමෙන් ද, කථා කීමෙන් ද ඇවැත් නො වේ.

9. **අඞ්ග**-උපසම්පන්නතා, තස්ස දස්සන සවන විසයෙ භිංසාපෙතුකාමතාය වායමනං.

## 56. ජොති සික්ඛා.

277. **සමාදහෙය්‍ය**.

තමා ගිනි දැල්වීමේ දී ගිනිගානා දඬු සකස් කිරීමේ පටන් ගිනි දල් නැගීම තෙක් වූ සියලු ප්‍රයොගයන්හි දුකුළා ද, ගිනිදල් නැගුණු විට පචිතිද වේ. ඇණවීමෙන් දුකුළායි. එයින් බොහෝ තැන දැල්වුව ද එක ම පචිත්තෙකි. ගිනි තැපීමෙන් සංසිදෙන රොගයක් නැත්තා අගිලනායි.

278. **අඤ්ඤත්‍ර තථාරූපපච්චයා**.

පහන් දැල්වීම පාත්‍රපචනය වැනි උවමනාවල දී හැරයි. කබ-ලින් ද වැටුණු නො නිමි ගිනිපෙනෙලි ඇතුළු කරන්නහුට දුකුළා වේ. නිවුණු පෙනෙලි ගින්නෙහි ලීමෙන් පචිති වේ. **"විසිබ්බනා-පෙක්ඛාති වචනතො යස්ස අපෙක්ඛා නත්ථි, තස්ස අනා-පත්ති"** යනු වජිරබුද්ධියි.

7. **අනාපත්ති**-අනෙකකු දැල්වූ ගින්නෙහි හෝ ගිනිදල් නැති අඟුරෙහි හෝ තපින්නහුට ද, එළිය පතා පහන් දැල්වීමෙහි ද, පාත්‍රපචන සෙවදකර්මාදියට දැල්වීමෙහි ද, ජන්තාඝරයෙහි දැල් වීමෙහි ද, පහන් දැල්වීමාදිය හැර අන් එබඳු කරුණක් නිසා දැල්වීමෙහි ද ඇවැත් නො වේ.

9. **අඞ්ග**-අගිලානතා, අනුඤ්ඤාතකාරණාභාවො, විසිබ්බෙතුකාමතා, සමාදහනං.

## 57. නහාන සික්ඛා.

**279.** නහායෙය්‍ය.

මේ ශික්ෂාව මධ්‍යදෙශයට පමණයි පළමු නෑ දිනයේ සිට අඩමසක් ගත වන්නට පෙර නැවත නෑමෙන් පචිති සිදු වේ. අනුදත් සමයන් හැරයි. එසේ නෑමට සුනු මැටි ගොම පිළියෙළ කිරීම ආදි සියලු ප්‍රයොගයන්හි දුකුළා ද නා අවසනැ පචිති ද වේ.

**280** **අඤ්ඤත්‍ර සමයා.**

උණ්හසමය සඞ්ඛ්‍යාත ග්‍රීෂ්ම ඍතුවේ අන්ත එක්මස් අඩමස ද, පරිළාහසමය සඞ්ඛ්‍යාත වර්ෂා ඍතුවේ මුල් මාසය ද යන කාලය තුළ දිනපතා නෑ හැකියි. නො නෑමෙන් අපාසු වේ නම් ඒ **ගිලාන සමයයි**. යටතින් මිදුල් හැමදීමත් කර්මාන්තයෙකි. එබඳු කම් ඇති සමය **කම්මසමයයි**. අඩයොදුන් ගමනක් නමුදු යන්නට සූදානම් වන්නාවූ ද, යන්නාවූද, ගොස් අවසන් කළා වූ ද කාලය **අද්ධානගමනසමයයි**. දූලි සහිත වාතයෙන් සිරුර වැසුණු සඳ. එහි දියබිඳු දෙක තුනක් වත් පතිත වුවොත් ඒ **වාතවුට්ඨිසමයයි**. මේ අවස්ථාවන්හි අඩමස ඉක්ම නොගිය ද නෑ හැකියි.

7 **අනාපත්ති**-වියළි නදියෙකින් නමුදු එතෙර වීමේ දී, වැලි කැණ කල වළෙක නාන්නහුට ද, භ්‍රමරාදීන් ලුහුබැඳීම වැනි විපතෙකින් දියේ ගිලෙන්නහුට ද, පසල් දනව්වෙහි ද වරද නැත.

9. **අඞ්ග**-මජ්ඣිමදෙසො, ඌනද්ධමාසෙන නහානං, සමයානං වා නදීපාරගමනස්ස වා ආපදානං වා අභාවො.

---

## 58. දුබ්බණ්ණකරණ සික්ඛා.

**281.** **චීවරලාභෙන.**

(“**නවං චීවරං ලාභො එතෙනා‘ති නවංචීවරලාභො**” ‘**පන භික්ඛුනා**’ යන දෙපදය මධ්‍යයෙහි ඇත ද අන්අරුත් සමස් වියයි යෙත්.) විකප්පූත් පොහෝනා සිවුරෙකැයි නො කී බැවින් හැඳීමට පෙරවීමට සුදුසු කප් නො තැබූ සං-සිවුරෙන් එකක් නව චීවර නම්. පෙර කප් නො තැබූ කිහිප දිනක් හැඳීමට නව්කැලි ව ලැබූ සිවුර ද මෙහි සඞ්ගෘහීත වේයයි යෙත්.



**282.** **දුබ්බණ්ණකරණානං.**

මෙයින් කියැවෙන්නේ මුළු සිවුර දුර්වර්ණ කිරීම නො ව කප් තැබීමයි. රඳන් කළ සිවුරේ සිවුකොනේම හෝ එක් දෙ තුන් කොනෙක හෝ මොනර ඇසේ කෘෂ්ණමණ්ඩලය සා නැතහොත් මකුණු පිටක් සා (මහත් වුව වරද නැති) සලකුණක් කළ යුතු. මෙය මුලින් පැනවූයේ සිවුරු මාරුවීමක් නිමිති කොටය. **නීලය නම්**, දියෙහි ඊයම් මලත් යබොරත් බහා තනාගන්නා චම්මකාරනීලයයි, හෙවත් කාසනීලයයි. නිල්වන් පත්‍රරසය පලාසනීලයි. **කද්දම නම්** දිය මඩයි. අඟුරු දූලි ආදි අන් යමක් **කාළසාමයි**. මෙලෙස කප් නො තබා සිවුරු පරිභොග කිරීමෙන් **පචිති** වේ. පොරොවන්නක් හෙයින් අංසකාසාව ද සඞ්ග්‍රහයට යේයයි යෙත්.

7. **අනාපත්ති**-කප් නට කල ද, තැබූ තැන දිරාගිය කල ද, කප් තබනලද්ද හා අනෙකක් මැසූ කල ද, මැඞිලි ඔගනුවා සරසනුවා පසුව ඇල්ලූ කල ද නැවත කප් තැබුම අනාවශ්‍යකයි.

9. **අඞ්ග**-අකතකප්පතා, න නට්ඨචීවරාදිතා, නිවාසනං වා පාරුපනං වා.

---

## 59. විකප්පන සික්ඛා.

**283.** **විකප්පෙත්වා.**

මෙය පිළිබඳ විස්තර පළමු කඨින සිකයෙහි කියැවිණ. නො ඉවූ සිවුරු අනෙකකුට විකපා පරිභොග කළ යුතු. විකප්පනය කළ පසු පසුදිරීම නැතිව හෝ ප්‍රතිග්‍රහණය කළ භික්ෂුව පිළිබඳ විස්වස් නැතිව හෝ සිවුරු හිමියා ඒ චීවර පරිභොග කළහොත් මේ පචිතිය වේ. **අධිට්ඨාන පච්චුද්ධරණ විකප්පන පච්චුද්ධරණ** යන දෙකින් දෙවැන්න මෙහිලා ගැනේ.

9. **අඞ්ග**-සාමං විකප්පිතස්ස අපච්චුද්ධාරො, විකප්පනූපගචීවරතා, පරිභොගො.

---

## 60. චීවරාපනිධාන සික්ඛා.

අධිෂ්ඨාන යොග්‍ය පාත්‍රයක් හෝ විකප්පූත් පොහෝනා සිවුරක් හෝ සදස නිසීදනයක් හෝ හිදිගුළා කාබානක් හෝ සිනා රිසියෙන් නමුදු (අපි සඳින් දුක් දනවන රිසිය අගුණ පලකරන රිසිය ගැනේ.) සඟවා නම් සඟවවා නම් පචිති ඇවැතට පත් වේ. උපසපනකුගේ සෙසු පිරිකරක් හෝ අනුපසපනකුගේ කවර පිරිකරක් හෝ ගෝපනය කිරීමෙන් දුකුළා වේ.

7. **අනාපත්ති**-නො මනාව තැබුවක් මනාව තබන්නහුට ද, ඔවා දී දෙමියි සඟවන්නහුට ද, වෙහෙස දීමක් කෙළි අදහසක් නැත්තහුට ද ඇවැත් නොවේ.

9. **අඞ්ග**-උපසම්පන්නස්ස සන්තකානං අපනිධානං, විහෙසෙතු කාමතා වා හස්සාධිප්පායතා වා.

**සුරාපානවග්ගො ඡට්ඨො**

—:o:—

## 61. සඤ්චිච්ච පාණ සික්ඛා.

තිරිසනකු මැරීම නිමිති කොට පචිති වේ. මහත් සතුන් කෙරෙහි ප්‍රයොග මහත්වය නිසා අකුසල් වැඩියි. ඇඳ පුටුහි මකුණු බිජුවක් නමුදු අකරුණාවෙන් බිඳ පහකිරීමෙන් පචිති ඇවැත් වේ.

7. **අනාපත්ති**-පාණෙ අපාණසඤ්ඤිස්ස, අසඤ්චිච්ච, අජානන්තස්ස, අමරණාධිප්පායස්ස, (පලඟැටි ආදින් පතිත වන බව දතදු සුද්ධ සිතින් පහන් දැල්වීමෙ වරද නැත.)

———

## 62. සප්පාණක සික්ඛා.

ප්‍රාණීන් සහිත දියයයි අනෙකකුගෙන් අසා හෝ තමා දැන හෝ පරිභෝග කිරීමේ දී පියොවක් පාසා පචිති වේ. එබඳු දියෙන් සාමිස පාත්‍රයක් සේදීමෙන් ද, උණුකැඳ පයක් නිවීමෙන් ද, බඳුනෙකින් ගෙන නෑමෙන් ද, පියොවක් පාසා පචිති වේ. ළිං ඉසීමේ දී එ දිය අන් දියෙක්හි බහාලිය යුතු. එබඳු දියක් නොමැති නම් කැපදිය සත් අට කළයක් වහා නො සිඳෙන තැනෙක බහා එහි ළිං දිය දැමිය යුතු. දිය පරිභොගය ගැන මේ සික්ෂය පැනවී.

7. **අනාපත්ති**-සප්පාණකයෙහි අප්පාණක සත් ඇත්තේ ද, පරිභොගයෙන් නො මැරෙනියි දන්නේ ද ඇවැත් නො ලබා.

———

## 63. උක්කොටන සික්ඛා.

**284**. **යථාධම්මං**.

යම් අධිකරණයෙක් යම් සමථධර්මයෙකින් සංසිඳවියයුතු වේ නම්, ඒ බුදුන් වදාළ සාසනසමයයි.

**285**. **උක්කොටෙය්‍ය**.

ව්‍යපසමනය කළ ඒ ඒ මහණුන් වෙත ගොස් **"අකතං කම්මං, දුක්කතං කම්මං, පුන කාතබ්බං කම්මං; අනිහතං දුන්නිහතං,**



**පුන නිහනිතබ්බං"** යනාදිය කියා නැවත මතුකිරීමට උත්සාහ දැරීමයි. යමකු පිළිබඳ අධිකරණය සඞ්ඝකර්මයෙන් නිහත නම්, ඒ භික්ෂුව හමුවෙහි උක්කොටනයෙන් පචිති වේයයි ද, නො හමුවෙහි නම් දුකුළා වේයයි ද යෙත්. කර්මය කරනවිට මෙබඳු පටික්කොසනයක් (-බාධාවක්) කළහොත් ධර්මකර්මයෙකැයි කෙසේ නමුදු ගිවිස්සා ගෙන ම කළයුතු. නැතහොත් කර්මය කොප්‍ය විය හැකියි.

7. **අනාපත්ති**-ධර්මකර්මයෙහි අධර්මකර්මසංඥ ව උක්කොටනය කෙරේ නම්, අධර්මයෙන් හෝ වර්ගීව හෝ කර්මාර්හ නොවූවකුට හෝ කම් කෙළේයයි උක්කොටනය කෙරේ නම්, ඇවැත් නොවේ.

9. **අඞ්ග**-යථාධම්මං නිහතතා, ජානනතා, උක්කොටනා.

———

## 64. දුට්ඨුල්ල සික්ඛා.

**286**. **පටිච්ඡාදෙය්‍ය**.

පරිජි සඟවෙසෙස් දුට්ඨුල්ලාපත්ති වුව ද මෙහි සඟවෙසෙස් පමණෙක් ගැනේ. භික්ෂුවක් සඟවෙසෙසට පත් බව කවර ක්‍රමයෙකින් නමුදු දැන අන් භික්ෂුවකට එබව නොකියමි යි ධුරනික්ෂෙප කළහොත් පචිති ඇවැත් වේ. ධුරනික්ෂෙප කොට පසුව කියා ද පචිතියට පත්ව ම කියේ වෙයි. මෙපරිදි පටිච්ඡාදනය සඳහා පරම්පරා වශයෙන් සිය දහස් ගණනකට කියා නම් සියල්ලනට ම ඇවැත් වේ.

6. **ආපත්ති**-තුළුල් ඇවැතෙක්දැයි විමති ඇත්තහුට ද, අදුට්ඨුල්ල සත් ඇත්තහුට ද, සෙසු පස් ඇවැත් කදු පිළිසොයන්නහුට ද, අනුපසම්පන්නගේ සුකුරුම්දීම් කායසංසග්ග සඞ්ඛ්‍යාත තුළුල් වරද හෝ සෙසු නොතුළුල් වරද හෝ සඟවන්නහුට ද දුකුළායි. (හෙරණුහු පිළිබඳ වැ පළමු පාණාතිපාතාදි පස දුට්ඨුල්ල වරදයයි පෙර කියැවිණ.)

7. **අනාපත්ති**-සඞ්ඝයා අතර කලහ හෙද වේයයි හෝ තමාගේ ජීවිතහානිය වේයයි හෝ කිවයුතු සුදුස්සකු නැති නිසා හෝ සඟවන රිසි නැතිව හෝ ඔහුගේ ක්‍රියාවෙන් හෙතෙම පැනේවයි හෝ නොකියන්නහුට ඇවැත් නො වේ.

9. **අඞ්ග**-උපසම්පන්නස්ස දුට්ඨුල්ලාපත්ති ජානනං, පටිච්ඡාදෙතු කාමතාය ධුරනික්ඛෙපො.

———

## 65. ඌනවීසතිවස්ස සික්ඛා.

**287. ඌනවීසති වස්සං.**

මව්කුස පිළිසිඳ ගත් දින පටන් ගණනා සඳ විසිවස් සපුරා නැති පුහුලායි. පොරණ තෙරවරු දෙළොස් මසක් මව්කුස වැස පවාරණ දින උපන් එකුන්විසි හැවිරිදි හෙරණහු තිකිණි පුනු පෝයට පසුදා හෙවත් පසුවස් වසන දා උපසපන් කළහ. එහි දී විසි වස් පිරිම මෙසේ ගැනිණ. එක් වසෙක චාතුද්දසී සයෙකි. තිස් දින මසෙකි. මෙහි දී එකුන්තිස් දින මසෙකි. මේ අඩු වන දින එක් කොට බැලූ විට විසිවසට සාරමසෙක අඩුවෙක් පැනේ. තෙ වසකට වරක් වස්සුක්කඩ්ඪනය කරත්, හෙවත් එක් මසක් අධික-යයි හැර වස් වසත්. (අධිකවර්ෂයට මාස 13 කි.) මෙසේ අටළොස් වසකට සයවරක් ලැබීමෙන් සමසෙක් අධික වේ. එයින් සාරමස අඩුවූ කල දෙමසෙක ඉතිරියෙක් වේ. එබැවින් පවාරණයට දෙමස කින් පෙර උපසපන් කළහ. මේ පචිතිය වන්නේ උපාධ්‍යාය වැ උපසපන් කරවූවහුට යි. සෙස්සනට දුකුළායි.

**288. අනුපසම්පන්නො.**

දැන කළ ද නො දැන කළ ද හෙතෙම අනුපසපනෙකි. ඔහු එ බව නො දැන විසූව ද සගට මොක්ට බාධා නැත. දැන හොත් උපසපන් විය යුතු. හෙතෙම දසවස් ඇතිව උපාධ්‍යාය ව කම්මවාචාචරිය ව අනෙකකු උපසපන් කෙරේ නම්, සෙස්සන්ගෙන් ගණය පිරෙතොත් උපසපුව පිහිටයි.

7. **අනාපත්ති**-උනුවිසිවස් ඇත්තහු ගැන පිරිපුන් විසිවස් ඇත්තෙකැයි සිතා උපසපන් කරන්නහුට වරද නැත.

9. **අඞ්ග**-ඌනවීසතිවස්සතා, තං ඤත්වා උපජ්ඣායෙන හුත්වා උපසම්පාදනං.

---

## 66. ථෙය්‍යසත්ථ සික්ඛා.

**289. ථෙය්‍යසත්ථෙන.**

රජුන් සතු සමක් නො දී ගෙන යන, සුංවත් නො දී මඟහැර යන, සොරකමට සහභාගි වූ හෝ නො වූ හෝ සොරමුළක් **ථෙය්‍යසත්ථ** සඳින් ගැනෙති. මොවුන් සමඟ කථාබස් කරගෙන ගාමන්තරයකට තමුදු යාම නිමිතිකොට පචිති වේ.



6. **ආපත්ති**-සොරුන්ගේ බසක් නැතිව තමා සංවිධාන ව යාමෙන් ද, සොරසත්වාදැයි විමති ඇතියහට ද, නොසොරුන් කෙරෙහි සොරහයි සත් ඇතියහට ද, විමති ඇතියහට ද, දුකුළායි.

7. **අනාපත්ති**-සොරුන් කෙරෙහි නොසොරහයි සත් ඇතියහට ද, කථාබස් කර නොගෙන යන්නහුට ද, ආපදුපන්නයහට ද, කාල දිවස විසඞ්කෙතයෙහි ද ඇවැත් නො වේ. මඟ අටවී විසඞ්කෙත වුවත් ඇවැත් වේ.

---

## 67. සංවිධාන සික්ඛා.

**290. මාතුගාමෙන.**

සුබැසි දුබැසි දන්නා මාගමයි. එකතො උපසම්පන්නා-සික්ඛමානා-සාමණෙරීහු ද මෙහි දී ගැනෙති. එහෙත් ඔවුන් හා සමයෙහි යා හැකියි. මෙය 27 වැනි **සංවිධානසික්ඛාපදය** වැනියි.

---

## 68. අරිට්ඨ සික්ඛා.

**291. අන්තරායිකා ධම්මා.**

සගට මොක්ට බාධක කම්ම-කිලෙස-විපාක-උපවාද-පඤ්ඤත්තිවීතික්කම සඞ්ඛ්‍යාත පඤ්චධර්මයෝ අන්තරායකරධර්මයෝ නම් වෙත්. මේ සික්ඛයේ දී පස්වැන්න ගැනේ.

1. **කම්මන්තරාය නම්**-පඤ්චානන්තර්‍ය්‍යකර්ම භික්ෂුණී දූෂණකර්මයි. පශ්චිමය සගට බාධක නො වේයයි අටුවාහි ප්‍රකාශිතයි. පූර්වතත් මෙහෙණින් ගැන මෙසේ කිව ද ආසීශ්‍රාවිකාවන් කෙරෙහි නම් අපායසංවර්තනික වේයයි **සාරත්ථදීපනියෙහි** එයි. දෙදෙනාගේ සමානච්ඡන්දවශයෙන් පැවැත්තේ සඞ්ඝන්තරායකර නොවේයයි පවසන එම ටීකාව බලාත්කාරයෙන් පැවැත්තේ නම් සඞ්ඝන්ත-රායකර වේ යන වාදයක් ද දක්වයි. ලොල විපපකතත්ත මෙහෙ-ණක දූෂණය කිරීමෙන් එම භවයේ මඟ පල නො ලබන නිසා මොක්ෂාන්තරායකරයයි ද අරිසැවියන් කෙරෙහි ද කලණපුහුදුන් වූවක කෙරෙහි ද බලහත්න් දූෂණය කිරීම ආනන්තරිය වැනියයිද **විමතිවිනොදනියෙහි** ප්‍රකාශිතයි.

2. **කිලෙසන්තරාය නම්**-නියත භාවයට පත් අහෙතුක-අක්‍රිය-නාස්තිකදෘෂ්ටිසඞ්ඛ්‍යාත මිථ්‍යාදෘෂ්ටියි. **‘‘තස්මිං අත්තභාවෙ අනිවත්තනකා අහෙතුක අ..රිය නත්ථිකදිට්ඨියොව නියත-මිච්ඡාදිට්ඨිධම්මා’’** යනු විමතිවිනොදනී බැවින් ඒ ආත්මයේදී නො

හරනා සේ දැඩිව ගෙන ඇති දෘෂ්ටීහු නියතභාවයට පැමිණියාහු නම් වෙති. එසේ නොවතොත් අනියත වෙති. **"අනියත මිසදිටු යූ සේ සි, නොහරන්නට නිසිවූ නියත බූ සේ නො වෙසි යුසේ සි"** යනු හෙරණසිඛවිනිසයි.

3 **විපාකන්තරාය නම්**- පණ්ඩක තිරච්ඡාන උභතො බ්‍යඤ්ජන ජාතිබධිරාදීන්ගේ අහෙතුක දුහෙතුක පටිසන්ධියි.

4. **උපවාදන්තරාය නම්**- සොතාපන්නයකුට නමුදු අනර්ථ කාම ව අනාත්ම වස්තුවෙන් හෝ විද්‍යමාන ගුණ වනසන රිසියෙන් හෝ ආර්‍ය්‍යයකු බව දැන වේවයි නොදැන වේවයි ආක්‍රොශ පරිභව කිරීමයි. කමා කළ විට ප්‍රයොගසම්පත්තියෙන් විපාකය ප්‍රතිබාහිත වේ.

5. **ආණාවීතික්කමන්තරාය නම්**-බුදුන් පැනවූ සත් ඇවැත් කඳුවලට දැන දැන පැමිණීමයි. දැන දැන පත් දුකුලා දුබැසි පමණෙකුදු සග මොක් දෙකට බාධක වේ. මහණ බව පිළිත කරන තෙක් පාරාජිකාපන්නයාට ද, පරිවාසාදියෙන් නැගී සිටුනා තෙක් ගරුකාපත්ති ආපන්නයාට ද, දෙසන තෙක් ලහුකාපත්ති ආපන්නයාට ද අන්තරාය පවතී. කියේමැයි **පරිවාරඅටුවාවෙහි**:-

**'සත්තපි ආපත්තියො සඤ්චිච්ච වීතික්කන්තා සග්ගන්තරායඤ්චෙව මොක්ඛන්තරායඤ්ච කරොන්තීති අන්තරායිකා, අජානන්තෙන වීතික්කන්තා පන පණ්ණත්තිවජ්ජාපත්ති නෙව සග්ගන්තරායං න මොක්ඛන්තරායං කරොන්තීති අනන්තරායිකා''** සි.

**"අජානන්තෙන වීතික්කන්තාති පණ්ණත්තිං වා වත්ථුං වා අජානන්තෙන වීතික්කන්තා පඨවිඛණනසහසෙය්‍යාදිකා, සාපි පච්ඡා ආපන්නභාවං ඤත්වා පටිකම්මං අකරොන්තස්ස අන්තරායිකාව හොති''** යනු එයට **විමතිවිනොදනී** ටීකායි.

## ඇවැත් දෙසීම.

ඇවැත් දෙසීමේ දී තමන් පත් ඇවැත් දැන, එයට නැවත නො පැමිණෙන අදහසින් හෙවත් ආයතිසංවරයෙහි පිහිටන රිසියෙන් දෙසිය යුතුය. එසේ නැතිව භික්ෂුවක් හමුවෙහි ඇවැත් දෙසන වාක්‍යය කීම් මාත්‍රයෙන් ඇවතින් පිරිසිදු විය නොහැකිය. ආපත්තාධිකරණය සම්මුඛාවිනයෙන් හා පටිඤ්ඤාතකරණයෙන් හා සමථයට පත් වේ.



මෙහිලා සැලකිය යුතු කරුණෙක් වෙයි. එනම්; පරිවාරයෙහි එන **"දෙසිතා ගණනූපගා ආපත්ති ඤාතබ්බා, දෙසිතා න ගණනූපගා ආපත්ති ඤාතබ්බා"** යන්නට අටුවා වූ **"දෙසිතා ගණනූපගා නාම යා ධුරනික්ඛෙපං කත්වා පුන න ආපජ්ජිස්සාමීති දෙසිතා හොති, අගණනූපගා නාම යා ධුරනික්ඛෙපං අකත්වා සඋස්සාහෙනෙව චිත්තෙන අපරිසුද්ධෙන දෙසිතා හොති. අයං හි දෙසිතාපි දෙසිත ගණනං න උපෙති, අට්ඨමෙ වත්ථුස්මිං භික්ඛුනියා පාරාජිකමෙව හොති"** යන පාඨයයි.

මෙය මෙහෙණියන්ගේ අට්ඨවත්ථුක පරිජිය පිළිබඳව කියන ලද්දක් බව **සාරත්ථදීපනී** මතයයි. **"පුනපි ආපජ්ජිස්සාමීති සඋස්සාහෙනෙව චිත්තෙන, අයං භික්ඛුනියා එවාති ලිඛිතං,..... එවං දෙසිතෙ පන යා කාචි ආපත්ති න වුට්ඨාතීති අපරෙ, තං න ගහෙතබ්බන්ති වුත්තං"** යනුවෙන් **වජිරබුද්ධිටීකාව** ද මත දෙකක් දක්වයි. **විමතිවිනොදනියේ** 492 වැනි පිටුවේ සාරත්ථදීපනී මතය කෙවිවාදයක් කොට මෙය භික්ෂු භික්ෂුණී දෙපක්ෂයට ම සාධාරණ වූවක් බව ප්‍රකාශිතව ඇත. විමතිවිනොදනී මතය ප්‍රශස්ත සේ පැනේ. විමසත්වා.

සෙසු අන්තරාය දත ද, විනයෙහි නො හසළ විරූ බැවින් පණ්ණත්තිවීතික්කමන්තරාය නො දත් අරිට්ඨ මහණ මෙසේ සිතී:- "පස්කම්ගුණ විඳුනා ගිහියෝ සෝවාන් සෙදගැමි අනගැමි ද වෙත්. මහණහුත් මිනා රූ දකිත්, සද අසත්, ගඳ ගනිත්, රස විඳිත්, මොලොක් අත්රණ පාපුරණ පරිභොගාදි විසින් පහස ද විඳිත්. එහෙයින් මාගමුන්ගේ රූ-සද-ගඳ-රස-පහස් හෙවත් ඔවුන් හා මෛථුනය නො වටින්නේ කිම් ද" යනුයි. මහණුන් නුවණින් පස්විකිම ඇතිව කරන, ඡන්දරාග රහිත, නිවැරැදි ප්‍රත්‍යයපරිභොගය සච්ඡන්දරාග පරිභොගය හා සම කොට හේ ගති.

මෙබඳු ග්‍රාම්‍ය දෘෂ්ටියක් ගත් මහණෙක් ඇතැයි දුටු-ඇසුවන් විසින් ඒ දෘෂ්ටිය හරනා සඳහා **'මා ආයස්මා'** යනාදීන් තෙවර දක්වා කිවයුතු. නො හළ හොත් දුකුලායි. අසා නො කිවනට ද දුකුලා වේ. සඟ මැදට ගෙන නමුදු කිවයුතු. එසේත් නො හරන්නහුට ඤත්තිචතුත්ථ සමනුභාසන කම් කළ යුතු. නො හැරීමේ දී ඥප්ති අනුශ්‍රාවණාවන්හි දුකුලා ද කම්වැකි කෙළවර මේ සිකයෙන් කියැවෙන පචිතිය ද වේ.

"අන් අයුරෙකින් නමුදු විපරීත කොට බුදුබණ කියන සෙසු භික්ෂූන් කිව ද නොහැර සිටිනවුනට තදනුකූල කොට සමනුභාසන කම්වැකි යොදා ඇවැත් ආරොපණය කරන්නට ද, ආපත්ති

අදශීනාදි තෙ කරුණින් එක් කරුණක් නිමිති කොට උක්ඛෙපනීය කර්මය කරන්නට ද වටියි. සමනුභාසනය නොකොට **'මා ආයස්මා, එවං අවච'** යනාදීන් කී කල ලබ්ධිය නො හැරීම නිසා වන දුකුළා නිමිති කොට උක්ඛෙපනී කම් කරන්නට ද වටී" යනු **විමතිවිනෝදනියි**

"මේ අරිට්ඨ භික්ෂුහට බන්ධකයෙහි උත්ක්ෂේපණීයකම් කළ හෙයින් ආදි කොට සමනුභාසන කම් කොට ඒ දෘෂ්ටිය නො හළ කලැ පාපිකාදෘෂ්ටියගේ අප්පටිනිස්සග්ගයෙහි උත්ක්ෂේපණීයකම් කෙරෙතියි දතයුතු....... අරිට්ඨ භික්ෂුහට සමනුභාසනා කොට උත්ක්ෂේපණීයකම් කළහයි දතයුතු. එහෙයින් මේ සිඛයෙහි ආදිකාර්මිකයාහට ද ආපත්තිමැයි" යනු **ඛන්ධකපිටපොත**

7. **අනාපත්ති**- අසමනුභාසියමානස්ස, පටිනිස්සජ්ජන්තස්ස, උම්මත්තකස්ස.

9. **අඞ්ග**-ධම්මකම්මතා, සමනුභාසනා, අප්පටිනිස්සජ්ජනං.

---

## 69. උක්ඛිත්ත සම්භෝග සික්ඛා.

292. **අකතානුධම්මෙන.**

**"උක්ඛෙපනීය කම්මස්ස අනුරූපො පච්චා කාතබ්බො වා ධම්මො-අනුධම්මො, අකතො ඔසාරණසඞ්ඛාතො අනුධම්මො යස්ස සො-අකතානුධම්මො"** ආපත්තිඅදස්සන- අප්පටිකම්ම-ලාමකදිට්ඨි අප්පටිවිජහනයන් නිමිති කොට ධාර්මික ව උක්ඛෙපනී කම් කරනු ලැබ අනුලෝම් වතෙහි (අටළොස් වත්හි) පිහිටා සිටිය හුට කළයුතු ඔසාරණ කර්මය (-සඟමැදට ප්‍රවේශ කර ගැනුම) **අනුධම්ම නම්**. ඒ ඔසාරණය කරනු නො ලැබූ මහණ අකතානුධම්ම නම් වේ.

293 **සම්භුඤ්ජෙය්‍ය වා.**

ආමිෂ ධම් සම්භෝගය කිරීමයි. ආමිෂයක් දීම ද ගැනීම ද **ආමිෂ සම්භෝග නම්**. එක් පියොවෙකින් බොහෝ ගත ද දුන්න ද එක් පවිත්තෙකි. ධර්මය කියවා දීම ද කියවා ගැනීම ද **ධම්-සම්භෝග නම්**. පදසොදම් සිකයෙහි කී ලෙස පද-අකුරු ගණ-නින් පවිති විය හැකිසි.

294. **සංවසෙය්‍ය.**

එකකම්ම එකුද්දෙස සංවාස නම්. උක්ඛෙපනී කම් ලද්දහු හා උපෝසථ පවාරණ හෝ සෙසු සඞ්ඝකම් හෝ කරන්නවුනට කම්



පර්යවසානයෙහි පවිති ඇවැත් වේ. නානුපවාර (-නොයෙක් දොරටු ඇති) වුවත් එකච්ඡන්න සෙනසුන්හි එක් ව හෝනා සඳ එකකු හිඳුව ද පවිති වේ. පතත් නො දන්නා රහතන් විසිනුදු පත්විය හැකි බැවින් ත්‍රිචිත්තයයි කියැවිණ. උක්ඛිත්තයා කෙරෙහි අනුක්ඛිත්තසඤ්ඤී නම් ඇවැත් නො වේ.

9. **අඞ්ග**-අකතානුධම්මතා, ජානනතා, සම්භොගාදි කරණං.

---

## 70. කණ්ටක සික්ඛා.

හෙරණකු පෙර කී පරිදි අන්තරායකර ධර්මයෝ අන්තරායකර නො වෙති යි පවසතොත් ඒ දෘෂ්ටිය හරනා සේ භික්ෂූන් විසින් කිවයුතු. නො හරතොත් දණ්ඩකම්මනාසනාවෙන් නැසිය යුතු. **නාසනා තුනෙකි.**

1. **ලිඞ්ගනාසනා**-ශ්‍රමණ වේශය ඉවත් කොට ගිහි කරලීම ලිඞ්ගනාසනාවයි. හෙරණුන් පිළිබඳ ව පාණාතිපාතාදි පස ලිඞ්ගනාසනාවට ද 'බුදුරුවන්හි අගුණ කිව' යනාදි පස සබ්බනාසනාවට ද කරුණු වන බව හෙරණ සිකෙහි එයි. **"මහණලිඟු නැසිය යුත්තෙන් යම් සාවර ගුණදහමට පිහිට නොවන්නෙන් සබ්බනාසනා නම් වී"** යන හෙරණසිඛ විනිස වැකියෙන් පැනෙන්නේ උසස් ගුණදහම් ලැබුමට බාධක නිසා **සබ්බනාසනා** යන නම වහරන බවයි. මෙයට ඇතුළත් වන අවණ්ණ භණනාදිය කරන්නවුන්ට තුන්වර තෙක් ඔවා දුන් පසු ආයති සංවරයෙහි පිහිටතොත් දඬුවම් නියම කොට, සඟමැදට ගෙන තම වරද ප්‍රකාශ කරවිය යුතු බව අටුවාහි ප්‍රකාශිතයි. සබ්බනාසනා යන නම අටුවාදියෙහි නැත. භික්ඛුනී දූසනය හැර සෙසු නවවිධ වරදට ප්‍රමාදයෙන් පත් හෙරණ වහා සංවරයෙහි පිහිටනු රිසි නම් මහණවෙස ඉවත් නොකොට සරණ දුන ද වටී. එසේ වහා සංවරයෙහි නොපිහිටන්නවුන් ගිහි කොට පසුව මහණ වෙස් ගත්වා සරණ දියයුතු. එක්වන් වරද කරනුවන් ලිඞ්ගනාසනාවෙන් නසා බැහැරලිය යුතු.

2. **සංවාසනාසනා**-උක්ඛෙපනීයකම් කිරීමයි. උක්ඛෙපනී කම් ලද්දහු හා සෙසු භික්ෂූන් විසින් එකකම්මාදි සංවාසය නොකැරේ.

3. **දණ්ඩකම්මනාසනා**- වරදකරු වසන තැනත් ආචාර්‍ය උපාධ්‍යායයන් වසන තැනත් ආවරණය කරන්නට 'බුදුහු අනුදත්හ. මෙය **සඟරමින් නෙරනා වත** නමුදු, **දණ්ඩකම්මනාසනා** නමුදු වන්නේය. වැලිදඬුවම් ආදිය පෙළෙහි නොව අටුවාවන්හි ප්‍රකාශිත විය.

“……බුද්ධාදීනං අවණ්ණභාසනම්පි අකප්පියාදිං කප්පි-යාදිභාවෙන දීපනම්පි දිට්ඨිවිපත්තියඤ්ඤෙව පවිසති….. භික්ඛු-නම්පි එසෙව නයො, මිච්ඡාදිට්ඨිකොති බුද්ධවචනාධිප්පායං විපරීතතො ගණ්හන්තො, සො එව අන්තග්ගාහිකාය දිට්ඨියා සමන්නාගතොති ච වුච්චති, සචෙ පන සස්සතුච්ඡෙදානං අඤ්ඤතරදිට්ඨියා සමන්නාගතොති වදන්ති, තං න යුත්තං, සස්සතුච්ඡෙදගාහස්ස සාමණෙරානං ලිඞ්ගනාසනාය කාරණ-ත්තෙන හෙට්ඨා අට්ඨකථායමෙව වුත්තත්තා, ඉධ ච දණ්ඩ-කම්මනාසනාය එව අධිප්පෙතත්තා.’ යනු විමතිවිනොදනියි.

**295. උපලාපෙය්‍ය.**

පාත්‍රචීවර උද්දෙස පරිපුච්ඡාදිය දෙම්යි සඞ්ග්‍රහ කිරීමයි. **උපට්ඨාපෙය්‍ය** නම් ඔවුන් ලවා වත් පිළිවෙත් කරවා ගැනුමයි. සම්භොගාදිය පෙර සේය.

සප්පාණකවග්ගො සත්තමො.

---

## 71. සහධම්මික සික්ඛා.

**296. සහධම්මිකං.** (කාරෙණ දුතියා.)

“මෙසේ නො කරව, මෙය මහණුනට අකැපය”යි සිකපදයෙහි පැවසෙන ලෙස කියනු ලැබීමයි. ධම්යට අනදර කිරීමෙන් 54 වැනි සිකය අනුව වන පචිතියෙන් ගැලවෙනු පිණිස ‘නො හික්මෙමැ” යි සෘජු ව නො කියා ලේශවශයෙන් කීමේ දී (කියන පරිදි **‘යාව න අඤ්ඤං භික්ඛුං’** යනාදීන් ප්‍රකාශිතයි.) මේ සිකය අනුව වදනක් පාසා පචිති වේ. ඔවා පිළිගෙන හික්මෙනු කැමැත්තහු විසින් වස්තු නිදාන පුද්ගලාදිය දත යුතු. මෙහි තේරුම කවරේ ද යනාදීන් විමසිය යුතු. අරුත් සොයනු පිණිස සූත්‍රාදි සතර මහාපදෙසයෙහි බහා සැසඳිය යුතු.

අපඤ්ඤත්තයෙන් (-සූත්‍රාභිධර්මයෙන්) කීමේදී ද, අනුපසම්පන්නහු විසින් පඤ්ඤත්තාපඤ්ඤත්ත දෙකින් කීමේ දී ද දුකුළා වේ.

9. **අඞ්ග**-උපසම්පන්නස්ස පඤ්ඤත්තෙන වචනං, අසික්ඛිතු-කාමස්ස ලෙසෙන වචනං.

---



## 72. විලෙඛන සික්ඛා.

**297. උද්දිස්සමානෙ.**

ඇදුරහු විසින් අතැවැස්සහුට කියඊම, අතැවැස්සා විසින් යැද ගුරුහුගෙන් කියවා ගැනීම, කටපාඩම් කීම යනාදි කවර අවස්ථාවක් නමුදු **‘උද්දිස්සමාන’** යන වචනයෙන් ප්‍රකාශිත වේ. පාමොක් උදෙසීම නො වේ.

**298. ඛුද්දානුඛුද්දකෙහි.**

ථුල්ලැසි ආදි පස් ලුහු ඇවැත්හු එකිනෙක සැලකීමේ දී **ඛුද්ද** (-කුඩා) ද, **අනුඛුද්ද** (-එයටත් වඩා කුඩා) ද වෙති. මෙහිලා ‘සඞ්ඝාදිසේසාදිය ඛුද්දක ද, ථුල්ලැසි ආදිය අනුඛුද්දක ද වේ” යනාදි නානා මත වේ. වාද සිඳීම පිණිස නාගසෙන තෙරහු ‘දුකුළා ඛුද්ද-කයයි ද දුබ්භාසිත අනුඛුද්දකය’යි ද කීහ. ධම්සඞ්ගායනාවසරයෙහි ද මෙය ගැන නිශ්චයයෙක් නො වීය. “මේ ශික්ෂාපද කියන කල්හි කැප අකැප ගැන කුකුස් ඇති වෙයි. වෙහෙස ඇති වෙයි. සිතේ නො සිලුටු බව ඇති වෙයි” යනුවෙන් උපසපනකු වෙත සිට ඔහුට විමති උපයනු පිණිස සිකපදයනට නිඳා කිරීම නිමිති කොට පචිති වේ.

විනය හැර අන් දහමක් ගැන එසේ කියා නම් දුකුළා වේ. අනුපසපනකුට විනය ගැන හෝ අන් දහමක් ගැන හෝ විමති උපදවනු පිණිස ගැරහීමෙන් ද දුකුළා වේ. නිඳා රිසි නැත්තහුට ඇවැත් නො වේ.

9. **අඞ්ග** ගරහිතුකාමතා, උපසම්පන්නස්ස සන්තිකෙ සික්ඛාපද විවණ්ණනං.

---

## 73. මොහන සික්ඛා.

අඩමසක් පාසා පොහොය කිරීම් වශයෙන් පාමොක් උදෙසනු ලබන කල්හි, යම් භික්ෂුවක් තමන් නො දන්නා නිසා ඇවැතට පත් බව හඟවනු පිණිස “මේ ධර්මය සූත්‍රයට ඇතුළත් බව මා දන්නේ අදය”යි කියා නම්, ඒ භික්ෂුවට කළයුතු දෑ මෙහි පැවසේ. පාමොක් දෙසූ දෙතුන් වරෙකවත් ඒ භික්ෂුව එහි සිටි බව සෙසු භික්ෂූහු දනිත් නම්, අඤ්ඤාණතාව නිසා ගැලවීමෙක් නැත. පත් ඇවැතට පිළියම් කරගත යුතු. ඉක්බිති **“තස්ස තෙ ආවුසො”** යනාදීන් මැනැවින් පාමොක් නො ඇසීමෙහි දෙස් දක්වා ඤත්ති දුතිය කම්වැකි කියා මොහාරොපණ නම් විනයකම් කටයුතු. එසින් පසුවත් එසේ මුළා කරතොත් පචිති වේ. මොහාරොපණය නො කළ හොත් දුකුළා පමණි.

7. **අනාපත්ති**-විස්තර වශයෙන් නිමවා පාමොක් නො ඇසුවනට ද, දෙතුන්වරෙකින් අඩුව විස්තර වශයෙන් ඇසුවනට ද, භික්ෂූන් මුළාකරන රිසි නැත්තහුට ද මෙසින් ඇවැත් නැත.

9. **අඞ්ග**- මොහාරොපණං, මොහෙතුකාමතා, වුත්තනයෙන නික්ඛිත්තුං සුතභාවො, මොහනං.

---

## 74. පහාර සික්ඛා.

**299. පහාරං දදෙය්‍ය.**

කුපිත ව කාය, කායපටිබද්ධ, නිස්සග්ගිය, යන ක්‍රමයෙකින් යටත්පිරිසෙයින් පියුම්පතෙකින් නමුදු උපසපනකුට පහර දීමෙන් පචිති වේ. පහර ලැබ අත් පා බිඳුණ ද, මැරුණ ද, මරණවෙතනා නැතිබැවින් පචිතිමැයි විරූප කරන රිසියෙන් උපසපනකුගේ කන් නාසා සිඳුව ද, අනුපසපනකුට (-ගහට්ඨ පබ්බජිත ඉත්ථි පුරිස තිරච්ඡාන යන මොවුනට) පහර දුන ද දුකුළායි. කාසසගරායෙන් මාගමකට පහර දීමෙන් සඟවෙසෙස් වේ. මෛථුන රාගයෙන් පහර දීමෙන් දුකුළා වේ.

7. **අනාපත්ති**-මිනිස් තිරිසන් කවරකු විසින් නමුදු පෙළනු ලබන කල්හි එයින් මිදෙනු සඳහා පහර දෙන්නහුට ඇවැත් නො වේ. අතරමඟ සොර සතුරන් තමාට හිංසා කිරීමට එන්නවුන් දැක **"එත්ථෙ'ව තිට්ඨ මා ආගච්ඡ"** යි කියූ වදන් නො පිළිගෙන තවද එතොත් මුගුරින් සැතින් පහර දී යා හැකියි. එයින් ඔහු මළත් ඇවැත් නො වේ. ව්‍යාලමෘගයන් ගැන ද එසේ කළ හැකියි

9. **අඞ්ග**-කුපිතතා, න මොක්ඛාධිප්පායතා, උපසම්පන්නස්ස පහාරදානං.

---

## 75. තලසත්තික සික්ඛා.

**300 තලසත්තිකං.**

**"තලමෙ'ව සත්තිසදිසත්තා සත්තිකන්ති තලසත්තිකං"** කායිකාඞ්ගයක් හෝ කායපටිබද්ධයක් හෝ (යටත් පිරිසෙයින් උපුල් පතක් නමුදු) ඔසවා නම් එය තල නමැයි දතයුතු. තලය ම සත්තික වේ තැළීමට සුදුසු වූවක් යන අරුතින් තල නම් වේ ඇයි ද යෙත්.



"තල යන්නෙන් අත්තල අභිප්‍රෙතයි. එයින් කය කියැවේ. සත්ති යන්නෙන් කායපටිබද්ධ ආයුධ විශෙෂයෙක් (-අඩයටි) කියැවේ. උපලකුණු විසින් සියලු කායපටිබද්ධ දැය සත්ති නම් වේ. **'තලඤ්ච සත්ති ච තලසත්ති'** යි සමස්ත වී" යනු **කුදුසික විකාසි**.

කුපිත ව පොථනසමත්‍ථතා විචාරණය නො කොට මෘදු වූ උපුල් පතක් නමුදු පහරදෙන ආකාර දක්වා එසවීමෙන් (-උරුක්කුකිරීමෙන්) පචිති වේ. පහර දෙන රිසියෙන් ගැසූ කල යට සිකය අනුව පචිති වේ. උරුක්කු කිරීමෙන් මේ සිකය අනුව පචිති වේ. උරුක්කු කිරීමේ දී වැරද පහර වැදුණ ද වන්නේ දුකුළාය. පහර වැදීමෙන් දුකුළා ද එසවීමෙන් පචිති ද වේ යනු තවත් මතයෙකි එහෙත් පහර දෙන රිසි නැති ව පහර දීමෙන් පළමු සිකය අනුව පචිති හෝ දුකුළා හෝ නොවිය යුතු බවත්, බියපත් කරමියි සිතා එසවූ දැය එසේ සිය සවභාවයෙන් සිට බැවීම සිදු නො කළ නිසා මේ සිකය අනුවත් පචිති නො වන බවත්, අසුද්ධ සිතින් පියෝ කළ නිසා (මේ සිකය අනුව) දුකුළා වන බවත් වැඩි දෙනාගේ මතයයි. මොක්ඛාධිප්පාය (-බේරෙන අදහස) ඇත්තහුට ඇවැත් නො වේ.

9. **අඞ්ග**-කුපිතතා, න මොක්ඛාධිප්පායතා, උපසම්පන්නස්ස තලසත්ති උග්ගිරණං.

---

## 76. අමූලක සික්ඛා.

දිට්ඨාදි මුල් රහිත බැවින් අමූලක බව වේ. තමා චොදනා කිරීම ද, අනුන් ලවා චොදනා කරවීම ද **අනුද්ධංසන** නම් වේ. චුදිතකයා එබව එකෙණෙහි දත හොත් චොදකයාට පචිති වේ. නො දැන ගත ද, පසුව දැනගත ද දුකුළායි. ආචාරවිපත්ති (ආජීව විපත්තිය ද මෙයට ඇතුළති.) දිට්ඨිවිපත්තීන්ගෙන් චොදනා කරන්නහුට ද දුකුළායි. අනුපසපනා පිළිබඳ ව නිකදුක්කටයි. සඟවෙසෙස්හි ද නොසඟවෙසෙස්හිද සඟවෙසෙසෙකැයි යන හැඟීම ඇති ව චොදනා කරන්නහුට ඇවැත් නො වේ. විස්තර දුට්ඨදෙස සිකපද යෙහි ප්‍රකාශිතයි.

9. **අඞ්ග**-උපසම්පන්නතා, සඞ්ඝාදිසෙසස්ස අමූලකතා, අනුද්ධංසනං, තංඛණං විජානනං.

---

## 77. සඤ්චිච්ච සික්ඛා

සපිරුණු විසිවස් ඇති බව ආදිය දැන දැන, මොහොතක් වත් අඵාසු ඇති කරම්හ'යි අනුසාසනාදි අදහසින් තොර ව "තා උනවීස්සේ උපසපන් වූහයි සිතම්, විකලැ වැළඳූහයි සිතූම්" යනාදීන්

උපසපන් මහණකුහට කුකුස් (-සැක) උපදවන්නහුට වදනක් පාසා පචිති ඇවැත් වේ. අඞ්ග සම්පූර්ණ නො වන හෙයින් මුසාවාද පචිති නො වේ.

තිකපාචිත්තියයි. අනුපසපනා පිළිබඳ වැ තිකදුක්කටයි. කුකුස් උපයනු රිසි නැතිව හිතෙසිතාවෙන් කියන්නහුට ඇවැත් නොවේ.

9. අඞ්ග-උපසම්පන්නතා, අඵාසුකාමතා, කුක්කුච්චුප්පාදනං.

---

## 78. උපස්සුති සික්ඛා.

**301. භණ්ඩනජාතානං**

**"භණ්ඩනං ජාතං යෙසං තෙ-භණ්ඩනජාතා, තෙසං"** කලහයේ මුල් අවස්ථාව **භණ්ඩන** නම්. එනම්:- 'අසුවලා විසින් මෙසේ කැරිණ, මෙසේ කිවොත් අපි මෙසේ කියමු'' යනාදීන් සව පාක්ෂිකයන් හා කැරෙන රහස් මන්ත්‍රණයයි. ආපත්තිගාමික කාය-වාක් ව්‍යතික්‍රමණය හත්ථපරාමාස චීවරනීහරණාදි වශයෙන් මස්තක ප්‍රාප්ත වූයේ **කලහ** නම් වේ. ආපත්තිගාමික නො වන ඔවුනොවුන්ගේ විරුද්ධකථා **වාද** නම්. විවාදය කලහයෙන් පෙර වන්නෙකි. භණ්ඩන කලහ දෙකින් වැඩී ගිය විවාදාධිකරණයට පත් වූවෝ මෙහි දී ගැනෙති.

**302. උපස්සුති.**

**සුයති'ති-සුති''** ශබ්දයයි. **"ඤාතියා සමීපං උපස්සුති"** ශබ්ද සමීපයයි. ඇසිය හැකි තැනෙක සිටීම ශබ්ද සමීපයේ සිටීම නම් වේ **"උපෙච්ච සූයති එත්ථා'ති උපස්සුති'** ශබ්දය ඇසිය හැකි ස්ථානයයි. ඔවුන්ගේ වදන් ඇසෙන තැනෙක හෙවත් දෙලොස් රියන් මානයේ සිටීමයි.

"මොවුන්ගේ කථාබස් අසා චොදනාදිය කරන්නෙමි''යි සිත අසන්නට යන පියක් පාසා දුකුළා ද, වදන් ඇසීමෙන් පචිති ද වේ. ඉදිරියෙන් යන්නවුන් රහස් බැණ බැණ යද්දී, ඔවුනට ආසන්න වීමට වහා යාමේ දී ද, පසුව එන්නවුන්ගේ වදන් ඇසීමට පසු වීමේ දී ද දුකුළා වේ. ඇසීමෙන් පචිතියි. තමන් සිටුනා තැනට නො දැන පැමිණ භික්ෂූහු රහස් කියත් නම්, තමා සිටුනා බව හැඟවිය යුතු. එසේ නො කොට ඇසීමෙන් පචිති වේ. අනුපසපනා පිළිබඳ ව තිකදුක්කටයි.



7. **අනාපත්ති**-'මොවුන්ගේ වදන් අසා මා ගත් ග්‍රහණයෙන් මිදෙන්නෙමි, කලහ නොකරන්නෙමි, මගේ නිවරද බව නෝ දක්වන්නෙමි'යි අසන්නහුට ඇවැත් නැති.

9. **අඞ්ග**-උපසම්පන්නතා, චොදනාධිප්පායො, සවනං.

---

## 79. කම්මපටිබාහන සික්ඛා.

**303. ධම්මිකානං කම්මානං.**

**"ධම්මෙන විනයෙන සත්ථුසාසනෙන කතත්තා ධම්මො එතෙසු කම්මෙසු අත්ථී'ති-ධම්මිකානි, තෙසං"** **ධම්ම** නම් භූත වස්තුව යි. ආපත්තියත් වස්තුවත් දක්වා චොදනා කිරීම හා දෙසය සිහිගැන්වීම හා **විනය** නම්. **සත්ථුසාසන** නම් ඤත්ති අනුසාවනා (-කර්මවාක්‍ය) සම්පත්ය. මේ අඞ්ගයෙන් යුක්ත අපලොකනාදි චතුර්විධ කර්ම මෙහි ගැනේ.

### චතුර්විධ කර්ම.

1. **අපලොකනකම්ම**-සීමට්ඨක සමගි සඞ්ඝයාගේ අනුමතියෙන්, අවණ්ණ භණනාදි වස්තු ප්‍රකාශ කොට 'රුච්චති සඞ්ඝස්ස'යි තෙවරක් ඇස්වීමෙන් කරන කර්මයෙකි. **ඔසාරණ, නිස්සාරණ, භණ්ඩුකම්ම, බ්‍රහ්මදණ්ඩ, කම්මලක්ඛණ** යන පඤ්චස්ථානයෙහි මෙය පවතී.

තෙරුවන් අගුණ කියන, මිසදිටු අදහස් පවසන හෙවත් බුදු වදන් විපරීත කොට කියන කණ්ටක වැනි හෙරණුනට කැරෙන නාසනාව (සහරමින් නෙරපීම) **නිස්සාරණයයි**. ලජ්ජිධර්මයෙහි පිහිටි ඔවුන් නැවත සම්භොගාදියට ගැනීම (-ඔවුන් හා සහසෙය්‍යාදිය පිළිගැන්ම)**ඔසාරණයයි**. සීමාගතයන් කැඳවා පැවිදි වන රිසි ඇත්තහු එහි පමුණුවා කැරෙන කෙසච්ඡෙදන පුච්ඡාව **භණ්ඩුකර්මයයි**. මහණුන් දුරුත්ත වදනින් සටන ඡන්න වැනි මහණුනට ආපත්ති නිශ්චය කිරීම ආදිය (යටත්පිරිසෙයින් කථාබස් පමණ කුදු) නොකරන සේ කැරෙන සම්මුතිය **බ්‍රහ්මදණ්ඩ** නම්.

අච්ඡින්න-නට්ඨජිණ්ණචීවර ඇත්තවුනට ද ගිලාන බහුස්සුතාදීනට ද සිවුරු බෙහෙත් සෙනසුන් දෙන්නවුන් විසින් ද, ආවාස කරණාදිය සඳහා ඉවත් කළයුතු ඡායූපග ඵලූපග රුක් ඉවත් කරන්නවුන් විසින් ද, චීවර පිණ්ඩපාත සඳහා දුත් දෙයින් ආවාස ජග්ගනාදිය කරන්නවුන් විසින් ද මෙවැනි අන් දැහැමි ක්‍රියාවන් කරන්නවුන් විසින් ද, තෙවරක් අස්වා කටයුතු අපලොකන කර්මය **කම්මලක්ඛණ** නම්.

(කම්ය පමණෙක් වෙයි. ඉක්බිති ව කැරෙන ඔසාරණාදිය මෙහි දී නො කැරෙයි. එහෙයින් **කම්මලක්ඛණ** නම් වේ. ඔසාරණ නිස්සාරණාදිය සේ අන් නම් නො ලබන හෙයින් හෝ කම්මලක්ඛණ නම් වේ. **ලක්ඛියතී'ති-ලක්ඛණං, කම්මමෙව ලක්ඛණං න නිස්සාරණාදීනීති කම්මලක්ඛණං**'' යනු විනිච්ඡය ටීකායි.)

**2. ඤත්තිකම්ම**-ඔසාරණය, නිස්සාරණය, උපොසථය, පවාරණය, සම්මුතිය, දානය, පටිග්ගහණය, පච්චුක්කඩ්ඪනය, කම්මලක්ඛණය යන **නව තැනෙක** වේ.

අනුසස්නෙන් පසු උපසම්පද් අපෙක්ෂකයා කැඳවීම **ඔසාරණයයි**. ව්‍යඤ්ජනවජ්ජායාවෙන් නැති අර්ථ දෙන ධම්කථක මහණහු උබ්බාහික විනිශ්චයයෙන් බැහැර කරලීම **නිස්සාරණයයි**. (සිල්වත් ආදි දසඞ්ග යුත් දෙතුන් මහණ කෙනකුන් රැස් කොට විනිශ්චයයක් කිරීම **උබ්බාහිකාවිනිශ්චයයි**.) **උපොසථ පවාරණ** ප්‍රකටයි. තමන් හෝ අනුන් හෝ සම්මත කරන්නට ''සුණාතු මෙ'' යනාදීන් තැබූ ඤත්තිය **සම්මුති** නම්. නිස්සට්ඨ පාත්‍ර චීවරාදිය දීම **දාන** නම්. සභාගැද ඇවැත් පිළිගැන්ම **පටිග්ගහණයයි**. පවාරණය කල් තැබුම **පච්චුක්කඩ්ඪනයයි**. තිණවත්ථාරක සමථයේ දී පොදුවේ තබන ඤත්තිය ද, කලහ කොට වෙන් වූ දෙපස වූවන් වෙන් වෙන් ව තබන ඤත්ති දෙක ද යන තුන **කම්මලක්ඛණයි**.

**3. ඤත්තිදුතියකම්ම**-ඔසාරණය, නිස්සාරණය, සම්මුතිය, දානය, උද්ධාරය, දෙසනාය, කම්මලක්ඛණය, යන **සත්තැනෙක** පවතී.

සිවුපසය වැළකීමට පියෝ කරන, මහණුනට ආක්‍රොශ පරිභව කරන, මහණුන් බිඳුවන, තෙරුවන් අගුණ බණන උපාසකයකු පිළිබඳ ව (මේ එක් එක් අඞගයක් ඇති කල ද) දෙයධම් නො පිළිගැන්ම සඞඛ්‍යාත පත්තනිකුජ්ජනය **නිස්සාරණයයි**. නැවත ඔහු පිළිගැන්ම **ඔසාරණයයි**. සීමා-සම්මුත-හත්‍ථුද්දෙසක-සාටිය (-වැසිසළු) ගාහාපක සම්මුති ආදිය **සම්මුති** නම්. කඨිනචීවර මතකචීවර දීම **දානයයි**. කඨිනුද්ධාරය **උද්ධාර** නම්. කුටිවත් විහාරවත් දෙසීම **දෙසනයයි**. මොහාරොපනාදියෙහි ති කම්මවාචාදිය **කම්මලක්ඛණයි**. මෙසින් තෙරසසම්මුති ආදි ලුහුකම් අපලොකනයෙන් ද කළ හැකියි.

**4. ඤත්තිචතුත්ථකම්ම**-ඔසාරණය, නිස්සාරණය, සම්මුතිය, දානය, නිග්ගහය, සමනුභාසනය, කම්මලක්ඛණය යන **සත් තන්හි** පවතී.



තජ්ජනීය, නියස්ස, පබ්බාජනීය, පටිසාරණීය, තිවිධ උක්ඛෙපනීය, යන සත් කම් කොට පහ කිරීම **නිස්සාරණයයි**. ඒ කම් පටිප්පස්සම්භනය කිරීම **ඔසාරණයයි**. භික්ඛුනොවාදක සම්මුතිය **සම්මුති** නම්. පිරිවෙස් මානත් දීම **දානයයි**. මූලායපටිකස්සනය **නිග්ගහ** නම්. උක්ඛිත්තානුවත්තිකා (-උක්ෂේපනී කම් **ලද** මහණුන් අනුව ගිය මෙහෙණ) මහණ මෙහෙණන්ගේ යාවතතියක සඟ වෙසෙස් අට හා අරිට්ඨ චණ්ඩකාලී යන දෙසිකය හා ඇතුළත් එකොළොස් සමනුභාසනා ද **උපසම්පදා** අබ්භානාදිය ද **කම්මලක්ඛණයි**.

පුඡෝකත දැහැමි **සඟකම්වලට** ඡන්දය **දී** පසුව නිඳුබස් බණන්නවුනට වදනක් පාසා පචිති ඇවැත් වේ. දැහැමි කම්හි වෙමතික නම් හෝ නො දැහැමි කම්හි **දැහැමිය** යනාදි සත් ඇති නම් හෝ දුකුළායි.

7. **අනාපත්ති**-දැහැමි කම්හි නො දැහැමිය යන සත් ඇති විට ද' අධම්වශයෙන් හෝ වගී සඞ්ඝයා විසින් හෝ කම්මාරහ නොවූවකුට හෝ කම් කෙරෙතියි ගරහන කල්හි ද ඇවැත් නො වේ.

9. **අඞග**-ධම්මකම්මතා, ධම්මකම්මසඤ්ඤිතා, ඡන්දං දත්වා ඛීයනං.

---

## 80. ඡන්දං අදත්වා ගමන සික්ඛා.

**304. විනිච්ඡයකථාය**.

චොදක චුදිතකයන් කරුණු පැවසීමෙන් ආරොචනය කරන ලද වස්තුව ආපත්තිභාවයෙන් අවිනිශ්චිත කල හෙවත් **අනුවිජ්ජකයා** විනිශ්චය කරමින් සිටින කල ද (මෙසින් ඤත්ති නො තබා කැරෙන කම් ගැනිණ.) ඤත්ති තබා කම්වැකි නො නිමි කල ද **'විනිච්ඡය කථා වත්තමානා'** නම් වේ. මේ අතරතුරේ කම්ය කොප්‍ය කරන අදහසින් පිරිසෙන් අත්පස ඉක්මවා යන්නහුට පචිති වේ.

7 **අනාපත්ති**-දැහැමි කම්හි නො දැහැමිය යන සත් ඇත්තහුට ද, සඞ්ඝයා අතර කලහ සිදුවෙනි යි හෝ අධම්-වගී කම් කෙරෙති යි හෝ යන්නහුට ද, ගිලන් ව හෝ ගිලනකු ගේ කිසක් පිණිස හෝ උච්චාරාදියෙන් පීඩිත ව හෝ කම් කුප්පන රිසි නැතිව හෝ ආපසු එන රිසියෙන් හෝ යන්නහුට ද ඇවැත් නො වේ.

9. **අඞග**-විනිච්ඡය කථාය වත්තමානතා, ධම්මකම්මතා, ධම්මකම්මසඤ්ඤිතා, සමානසීමායං ඨිතතා, සමානසංවාසකතා, කොපෙතුකම්‍යතාය හත්ථපාසවිජහනං.

---

## 81. දබ්බ සික්ඛා.

එක් සීමාවෙහි සිටි සමානසංවාසක වූ සඞ්ඝයා සමග්ගසඞ්ඝයායි. සමග්ගසඞ්ඝයා හා එක්ව, සෙනාසනපඤ්ඤාපකාදි සම්මුති ලද භික්ෂුවක්හට සඟසතු විකපුත් පොහොනා චීවරයක් අපලොකනයෙන් දී, පසුව මිත්‍ර-දෘෂ්ටමාත්‍රමිත්‍ර-දෘෂ්ටමිත්‍රතා වශයෙන් විශ්වස්ත පරිදි දේයයි දෙස් කියන්නහුට වදනක් පාසා පචිති ඇවැත් වේ.

චීවරයක් හැර අන් බෙදිය හැකි පිරිකරක් දුන් විට ද, සඞ්ඝයා විසින් සම්මත නො වුවත් භත්තුද්දෙසාදිය කරන මහණකුහට කවර පිරිකරක් නමුදු දුන් විට ද, සම්මුතිය ලැබ වේවයි නො ලැබ වේවයි සෙනසුන් පැනවීම ආදිය කරන අනුපසම්පන්නකුහට සිවුරක් හෝ අන් පිරිකරක් හෝ දුන්විට ද දෙස් පහළ කිරීමෙන් දුකුළා වේ. පියෙවියෙන් ම අගතියෙන් ක්‍රියා කරන්නකු ගැන ‘මොහුට දීමෙන් කවර වැඩෙක් වේ ද’යි දෙස් කීමෙන් ඇවැත් නො වේ.

ගරු භණ්ඩ අපලොකනයෙනුදු අනුනට දිය හැකි නො වේ. මෙහි කීයේ සෙසු පිරිකර ගැනයි.

### ගරුභණ්ඩ.

1. ආරාම (-පුෂ්පාරාම ඵලාරාම), ආරාමවත්ථු (-අරම් සඳහා පිරිසිඳ තැබූ හෝ පෙර අරම් තුබූ ඉඩම්.)
2. විහාර (-පාසාදාදිය.) විහාරවත්ථු (-පහ ඈ පිහිටි බිම්.)
3. මසාරකාදි සිවු මඤ්චය, එබඳු ම පීඨ, උණ්ණාභිසි ආදි පස්භිසි, බිම්බෝහන.
4. ලොහකුම්භි, ලොහභාණක, ලොහවාරක, ලොහකටාහ, වාසි, ඵරසු, කුඨාරි, කුදාල, නිඛාදන.
5. වල්ලි, වෙළු, මුඤ්ජ, බබ්බජ, තිණ, පණ්ණ, දාරුභණ්ඩ, මත්තිකාභණ්ඩ යන මොහු ගුරුභණ්ඩ නම් වෙති.

මේ භාණ්ඩ ප්‍රධානකමින් වත් අනුනට දිය නොහේ. වස් පිළිවෙළින් නමුදු බෙදා ගත නොහැකියි. එහෙත් මඤ්චාදි ගුරු භාණ්ඩයෙන් අන්‍ය මඤ්චාදියක් ආරාම විහාරාදි ස්ථාවර වස්තුත්, ආරාමාදි ස්ථාවර වස්තුවෙන් අන්‍ය ස්ථාවර වස්තුත් පරිවර්තනය කට හැකියි. මේවා බෙදා ගත ද සඞ්ඝිකමැයි. සොර සිතින් ගත පරිජ් ද වේ ගුරු භාණ්ඩ ගැන **මාතිකාට්ඨකථා ගණ්ඨිපදයේ** ප්‍රකාශිත අදහසෙක් විනය විනිච්ඡය ටීකාවෙහි එයි. එය මෙසේය:-



**“දායකෙහි කායෙන ඵුසිත්වා යථාසුඛං පරිභුඤ්ජථා’ති දින්නසෙනාසන මඤ්චපීඨාදිකම්පි දායකෙහි වුත්තනියාමෙන පරිභුඤ්ජන්තස්ස දොසො නත්ථීති මාතිකාට්ඨකථාය සීහළගණ්ඨිපදෙ වුත්තත්තා තථා පරිභුඤ්ජන්තස්ස අනාපත්ති. ‘ඉමං මඤ්චපීඨාදිං සඞ්ඝස්ස දම්මී’ති වුත්තෙ ගරුභණ්ඩං හොති, න භාජෙතබ්බං, සඞ්ඝස්ස පරාමට්ඨත්තා. ‘ඉමං මඤ්චපීඨාදිං භදන්තානං වස්සග්ගෙන ගණ්හිතුං දම්මී’ති වුත්තෙ සතිපි ගරුභණ්ඩභාවෙ කප්පියවත්ථුං භාජෙත්වා ගණ්හිතුං වට්ටති, අකප්පියභණ්ඩමෙව භාජෙත්වා ගහෙතුං න ලබ්භති ‘ඉමං මඤ්චපීඨං වස්සග්ගෙන ගහෙතුං සඞ්ඝස්ස දම්මී’ති වුත්තෙ වස්සග්ගෙන භාජෙත්වා ගහෙතබ්බං, වස්සග්ගෙන භාජනං පඨමං වත්වා පච්ඡා සඞ්ඝස්ස පරාමට්ඨත්තා. ‘සඞ්ඝස්ස ඉමං මඤ්චපීඨං වස්සග්ගෙන ගණ්හිතුං දම්මී’ති වුත්තෙ පන ගරුභණ්ඩං හොති, පඨමං සඞ්ඝස්ස පරාමට්ඨත්තාති. අයම්පි විසෙසො මාතිකාට්ඨකථා ගණ්ඨිපදෙයෙව වුත්තො”** යනුයි.

9. **අඞ්ග**-උපසම්පන්නතා, ධම්මෙන ලද්ධසම්මුතිතා, සඞ්ඝෙන සද්ධිං විකප්පනුපගචීවරදානං, පච්ඡා ඛීයිතුකාමතාය ඛීයනං.

---

## 82. පරිණාමන සික්ඛා.

පුහුලකුට පිරිනැමීම නිමිති කොට මෙහි සුද්ධ පචිති උක්තයි. සෙස්ස නිස්සග්ගියෙහි කී සේ ය.

“ඤාතකම්පි පරස්ස දාතුකාමං අඤ්ඤස්ස දාපෙන්ති ආපත්තියෙව සබ්බත්ථ ආපුච්ඡිත්වා දාතුකාමං යථාසුඛං විචාරෙතුං ලභති” යනු **වජිරබුද්ධියි**.

**සහධම්මිකවග්ගො අට්ඨමො.**

——:o:——

## 83. රාජන්තෙපුර සික්ඛා.

**මුද්ධාවසිත්ත** සඳින් කැත් කුලෙහි උපන් ක්ෂත්‍රියාභිෂෙකයෙන් අභිෂෙක ලත් රජෙක් කියැවේ. ‘අනික්ඛන්තො රාජා යස්මා’ යනු විග්‍රහ බැවින් **අනික්ඛන්තරාජක** සඳින් බැහැර නොවූ රජු ඇති සයනීඝරය හෙවත් නිදන ගැබ කියැවේ.

305. **අනීහත රතනකෙ**.

(අනීහතං රතනං යස්මා.) මේ රතනය නම් රාජමහිෂියයි. ඉඳුබිලය නම් බැහැර නො ගිය මෙහෙසිය ඇති යහන්ගබ කියැවේ.

යහන් ගබේ එළිපතයි. රජුන් මෙහෙසියන් යහන් ගබේ සිටිද්දී, තමන් පැමිණි බව නො දන්වා නො හඟවා එම එළිපත ඉක්ම ඇතුළට යාමෙන් පචිති වේ.

7. **අනාපත්ති**-දන්වා යන්නහුට ද, ක්‍ෂත්‍රියකු හෝ ක්‍ෂත්‍රියාභිෂෙකයෙන් අභිෂික්තයකු හෝ නො වූ විටද, දෙදෙන ම හෝ එක් කෙනකුන් හෝ හෙයින් බැහැර ගිය විට ද, සයනීය ඝර නොවන අපරික්ඛිත්ත රුක්මුල් ආදිය වෙත ද යාමෙන් ඇවැත් නො වේ.

9. **අඞ්ග**-අභිසිත්තඛත්තියතා, උභින්නම්පි සයනීඝරතො අනික්ඛන්තතා, අප්පටිසංවිදිතස්ස ඉන්‍ද්‍රඛීලාතික්කමො.

——

## 84. රතන සික්ඛා.

**306. රතනං වා රතනසම්මතං වා.**

මුත්තා, මණි, වෙළුරිය, සඞ්ඛ, සිලා, පවාළ, ජාතරූප, රජත, ලොහිතඞ්ක, මසාරගල්ල යනු **දශරත්නයි**. **රතනසම්මත** නම් මිනිසුන්ගේ උපභොග පරිභොග වස්ත්‍රාලඞ්කාරාදි වස්තුයි. "උපභොග නම් ශරීරස්පර්ශ ලදින් අනුභවනීය දෙය යැ. පරිභොග නම් ශරීරස්පර්ශ නො ලදින් අනුභවනීය දැයි" යනු **ඛුද්දසික්ඛා පිටපොත**.

**307. අජ්ඣාරාමෙ වා අජ්ඣාවසථෙ වා.**

**අජ්ඣාරාමය** නම් ආරාම ඇතුළයි. **ආවසථ** සඳින් අරම තුළ හෝ අන් බැහැර තැනෙක හෝ වන තමන් වසන තැනෙක් ගැනේ යයි ද, අරමිහි පිහිටි ගෙය අජ්ඣාරාම සඳින් ගැනෙන නිසා අරමින් බැහැර ගම්හි පිහිටි ගෙයක් ගැනේයයි ද මත දෙකෙකි. වැට කඩුලු ඇතොත් එයින් ද නැතහොත් ගෙහි සිට දැමූ කුල්ලක් හෙන තැනින් ද ඇතුළත **අජ්ඣාවසථ**යි.

රත් රිදී තමන් පිණිස ගැනීම ගැන්වීමෙන් නිසගි පචිති වේ. සඞ්ඝ ගණ පුග්ගල චෛත්‍ය නවකම්ම සඳහා නම් දුකුළා වේ. මේ දෙක හැර සෙසු මුක්තාදි රතන අට තමන් හෝ සඞ්ඝගණාදීන් හෝ පිණිස ගැනීම ගැන්වීමෙන් ද දුකුළා වේ. ගිහියන් සතු යටත්පිරිසෙයින් මාපියන් සතුවූ ද කප්පු ආදි කැප දැයක් හෝ රිදී ආදි අකැප දැයක් හෝ භාණ්ඩාගාරික ශිෂ්‍යයෙන් තබන්නහුට පචිති වේ. මාපියන් සතු කැප බඩුවක් තමා සතු කොට තැබිය හැකියි. වෙහෙර කම් කරනුවන් හෝ රාජවල්ලභයන් හෝ රැක දෙන්නැයි බඩුවක් දුනහොත් භාර නො ගත යුතු. ගුප්තස්ථානයක් පෙන්විය



හැකියි. ආරාම ආවාසයන්හි මහණුන් ගැන සැක සිතිය හැකි තැනෙක තුබූ බඩුවක් ගෙන හෝ ගන්වා හෝ තැබිය හැකියි. සොයා ආ කල දෙනු සඳහායි.

7. **අනාපත්ති**-අධ්‍යාරාමාදියෙහි ගන්නහුට ද, අරමින් බැහැර දී රතනසම්මත වස්ත්‍රාදි කැපවතක් විශ්වාසයෙන් හෝ තාවකාලව හෝ පංසුල්සඤ්ඤයෙන් හෝ ගන්නහුට ද ඇවැත් නො වේ.

9 **අඞ්ග**- අනනුඤ්ඤාතකාරණා උග්ගහණාදි, පරසන්තකතා, විස්සාසගාහ පංසුකූලසඤ්ඤානං අභාවො.

——

## 85. විකාලගාමප්පවෙසන සික්ඛා.

මධ්‍යාහ්නය ඉක්ම ගිය තැන සිට අරුණොද්ගමනය තෙක් අතර කාලය තුළ, විකාලයයි දැන හෝ නො දැන හෝ දෙළොස් රියන් උවසර සිටි මහණහු අතින් **"ගාමප්පවෙසනං ආපුච්ඡාමි"** යි නො විචාරා විහාරොපචාරය ඉක්ම පිරිකෙව් ඇති ගම එයින් ද, නැති ගම උවසර සිමින් ද (-දුතිය ලෙඩ්ඩුපාත ප්‍රමාණයෙන්) ඇතුළට යාමෙන් පචිති වේ. නො පිළිවිස වන් සඳ දුටුවකුගෙන් පිළිවිසීම ආවශ්‍යක නො වේ. බොහෝ දෙනෙක් විකලැ ගම් වදින් නම් ඔවුනොවුන් පිළිවිස යා යුතු. උත්සාහ නො හැර එයිනුදු අන් ගමකට යෙත් නම් නැවත පිළිවිසීම අනාවශ්‍යකයි.

7. **අනාපත්ති**-සර්පදෂ්ටාදි අත්‍යායික අවස්ථාවන්හි ද, පිළිවිසීමට භික්ෂුවක් නැතිවිට ද, ගම තුළ වූ ආරාමයකට හෝ මෙහෙණි අසපු, ආසනසාලා, තිර්ථකාරාමයනට හෝ යන විට ද, ගම තුළ වූ මාර්ගයෙකින් යන විට ද, මෙසාදි ආපදාවන් ඇතිකල්හි ද නො පිළිවිස ගිය ද ඇවැත් නොවේ.

9. **අඞ්ග**-සන්තං භික්ඛුං අනාපුච්ඡනං, අනුඤ්ඤාතකාරණාභාවො, විකාලෙ ගාමප්පවෙසනං. මෙය චාරිත්තසික්ඛාපදය හා සමයි.

——(○)——

## 86. සූචිඝර සික්ඛා.

**308. භෙදනකං.**

**"පඨමං ශින්දිත්වා පච්ඡා දෙසෙතබ්බන්තා තං භෙදනකං තස්ස පාචිත්තියස්ස අත්ථී'ති-භෙදනකං"** ලැබූ ගුළාව බිඳ දමා ඇවැත් දෙසිය යුතු. තමා නිමකිරීම අනුන් ලවා නිම කරවීම යන දෙතැන්හි ම පචිතියි. අනෙකකු පිණිස කිරීමෙන් ද කරවීමෙන් ද, අනෙකකු කැරුණක් ලැබ පරිභොග කිරීමෙන් ද දුකුළා යි.

7. **අනාපත්ති** ගිනිදඬු දුන්න, කාබාත්වීය, අඳුන් නළ, අඳුන් ලං, වාසිදඬු, උදකපුඤ්ඡනි (-නා සිරුර පිස්නා උපකරණයක් යන මේවායේ සෙදිය හැකිසි.

9. **අඞ්ග**-සූචිඝරතා, අට්ඨිමයාදිතා, අත්තනො අත්ථාය කරණං වා කාරාපෙත්වා වා පටිලාභො.

——||——

## 87. මඤ්චසික්ඛා.

'**අට්ඨඞ්ගුලපාදකං**' යනු ක්‍රියා විශෙෂණයි. "**ඡෙදනමෙව-ඡෙදනකං, තං අස්ස අත්ථීති-ඡෙදනකං**" පඨම සෙනාසන සික යෙහි කී මඤ්චපීඨ මෙහි කියැවේ. එබඳු අලුත් ඇඳ පුටු කරන කරවන මහණහු විසින් හැඳ වියලින් යට සුගත් අඟුල් අටෙකින් හෙවත් වඩුරියනෙකින් වැඩි නො වූ පා ඇති වන පරිදි කළ යුතු. වැඩි ව කැරුණහොත් වැඩි කොටස සිඳ දමා පචිති දෙසිය යුතු. තමන් නිම කළ ද අනුන් ලවා නිම්කරවුව ද පචිතිමැයි.

අනෙකකු පිණිස කිරීමෙන් ද කරවීමෙන් ද, අනෙකකු කරවන ලද්දක් ලැබ පරිභොග කිරීමෙන් ද දුකුළාසි. පමණ ඉකුත් ඇඳ පුටු ලදහොත් වැඩි කොටස සිඳ හෝ පොළොව සාරා වළ ලා හෝ උඩුකුරු කොට තබා හෝ පරිභොග කළයුතුයි. මේ සිකයෙහි ද මතු පැවසෙන ශික්‍ෂාපසෙහි ද තමා කරවා ලැබීමෙන් පචිති වේ. පරිභොගයෙහි ඔහුටත් සෙස්සනටත් දුකුළාසි.

9. **අඞ්ග**-පමාණාතික්කන්තමඤ්චපීඨතා, අත්තනො අත්ථාය කරණං වා කාරාපෙත්වා වා පටිලාභො.

——|०|——

## 88. තූලොනද්ධසික්ඛා.

309. **තූලොනද්ධං.**

"**තූලං ඔනද්ධං එත්ථාති-තූලොනද්ධං**" පුලුන් අතුරා කළ මතුපූර්ණකත මඤ්චපීඨමැයි. කඩරෙදි අතුරා පුලුන් බහා නැවත මතුපිට කඩරෙද්දෙන් වසා කැරෙන බව අටුවාවේ එයි. ඉඹුල් ආදි රුක් පිළිබඳ තූලය, කිරිවැල් ආදි වැල් පිළිබඳ තූලය, තෘණජාතීන් පිළිබඳ තූලයයි පුලුන් තෙ වගෙකි.



තමා නිම කළ ද අනුන් ලවා නිම කරවුව ද පිළිලැබීමෙන් පචිතියි. උද්දාලනය නම් ඉවත් කිරීමයි. ඉවත් කොට පචිති දෙසිය යුතු. අනෙකකු පිණිස කිරීමෙන් ද කරවීමෙන් ද අනෙකකු කැරුණක් ලැබ පරිභොග කිරීමෙන් ද දුකුළාසි.

ආයොග, කායබන්ධන, අංසවට්ටක, පත්තත්ථවික, පරිස්සාවන, බිම්බොහනයන්හි යෙදුව වරද නැති බිම්බොහනය දිගින් දෙරියනි, මධ්‍යයෙන් පළල මිටි රියනි. ගිලනහුට කොච්චා අතුරා පසතුරුණු එළා පරිභොග කරනු වටී.

9. **අඞ්ග**-තූලොනද්ධමඤ්චපීඨතා, අත්තනො අත්ථාය කරණං වා කාරාපෙත්වා වා පටිලාභො.

———

## 89. නිසීදනසික්ඛා.

310. **නිසීදනං.**

"**සන්ථත සදිසං සන්ථරිත්වා එකස්මිං අන්තෙ සුගතවිදත්ථියා විත්ථාරතො එව මිස්සා ඨානෙසු ඵාලෙත්වා කතාහි තීහි දසාහි යුත්තස්ස පරික්ඛාරස්සෙතං නාමං**" යනුවෙන් මෙහි සවභාවය අටුවාවෙහි ප්‍රකාශිතයි. නිසීදන චීවරයත් නිසීදන සන්ථතයත් එකක් ම බව **සාරත්ථදීපනීමතයයි**. පුරාතන ඇතැම් ඇදුරන් අතරත් ඒ මතය පැවැති බව දක්වේ. **විමතිවිනොදනී** මතය එයට ප්‍රතිවිරුද්ධයි. මේ සිකයෙන් කියැවෙන්නේ නව චීවරයට අයත් අධිට්ඨානුපග නිසීදන චීවරය ම බව පෙනේ. එහි පමණ දිගින් සුගත් වියත් දෙකෙකි. උස එකහමාරයි. දසාව වියතයි.

පමණ ඉක්මවා තමන් කළ ද අනෙකකු ලවා කරවුව ද පචිතිමැයි. අනුන් උදෙසා කිරීමෙන් ද කරවීමෙන් ද, කරන ලද්දක් ලැබ පරිභොග කිරීමෙන් ද දුකුළා සි.

7. **අනාපත්ති**-පමණ ඉක්මවා කරන ලද්දක් ලැබ සිඳ පියා පරිභොග කරන්නහුට ද, විතාන-භූමත්ථරණ සාණිපාකාර-භිසි-බිම්බොහන කරන්නහුට ද වරද නැත.

9. **අඞ්ග**-නිසීදනස්ස පමාණාතික්කන්තතා, අත්තනො අත්ථාය කරණ-කාරාපනවසෙන පටිලාභො.

———

## 90. කණ්ඩුපටිච්ඡාදිසික්ඛා.

311. **කණ්ඩුපටිච්ඡාදිං.**

නැබින් යට දණින් උඩ හටගත් කැසිලි ගෙඩි අඟිස් හගන්දරා-දිය පිළිසොයන සේ හැඳීමට අනුදත් නව චීවරයට අයත් සිවුරෙකි.

මෙහි දිග සුගත්වියත් සතරෙකි. උසත දෙකෙකි. වැඩි වුව සිඳ පචිති දෙසිය යුතු. ආපත්ති අනාපත්ති ආදිය පෙර සිකය වැනියි. මතු දෙසිකය ද එසේය.

**91 වැනි වස්සිකසාටික සික්ඛාපදයෙහි** කියවෙන වැසිසළුව දිගින් සුගත්වියත් සයෙකි. උසතින් දෙකහමාරෙකි. **92 වැනි නන්දත්ථෙරසික්ඛාපදයෙහි** ද වෙසෙස් නැත. පඨම කඨිනාදි ශික්ෂාවන්හි විස්තර ඇත.

**රතනවග්ගො නවමො.**

——:o:——

## පඨම පාටිදෙසනීය සික්ඛා.

**312. අන්තරඝරං පවිට්ඨාය.**

මේ අන්තරඝර සදින් වීථි-මාගී-මාගීසන්ධි-ගෘහාදිය කියැවේ. මෙබඳු තැනෙක සිටි මෙහෙණක විසින් සියතින් දුන් යාවකාලික ආහාරයක් වළඳනු පිණිස සියතින් ම පිළිගන්නා මහණහට දුකුළා ද, වැළඳීමේ දී පිඩක් පාසා පාටිදෙසනීය නම් ඇවැතෙක් ද වේ. අන්තරඝරයෙන් බැහැර තැනෙක සිටි මෙහෙණ විසින් දෙන ලද්ද ගත හැකිසි. මෙහෙණ සිටි තැන ම මෙහිලා ගණින් ගැනේ.

අඤ්ඤාතිකාය අඤ්ඤාතිකසඤ්ඤී යනාදීන් තිකපාටිදෙසනීයයි. අන්තරඝරෙ අන්තරඝරසඤ්ඤී, ඛාදනීය භොජනීයෙ අඛාදනීය අභොජනීය සඤ්ඤී, භික්ඛුනියා අභික්ඛුනී සඤ්ඤී ආදීන් තිකවෙඡද ත්‍රයයක් යෙදිය යුතුයයි **වජිරබුද්ධියෙහි** පැවසේ. පාටිදෙසනීය ඇවැත දෙසන අයුරු **"ගාරය්හං ආවුසො"** යනාදීන් කියැවේ.

7. **අනාපත්ති**-නෑ මෙහෙණක ලවා දෙවීම, බිම තබා දීම (ඇය ලවා හෝ පිළිගන්වා ගත යුතු.) අන්තරාරාම මෙහෙණඅසපු ආදි කැපතැන සිට දීම, ගමින් පිටත ගෙන ගොස් දීම, ප්‍රත්‍යය ඇති සඳ ගනුවයි යාමකාලිකාදිය දීම යන මෙහිලා ඇවැත් නො වේ.

9. **අඞ්ග**-අඤ්ඤාතිකාය භික්ඛුනියා අන්තරඝරෙ ඨිතාය හත්ථතො සහත්ථා යාවකාලිකගහණං, අජ්ඣොහරණං.

———



## දුතිය පාටිදෙසනීය සික්ඛා.

**313. වොසාසමානරූපා.**

මිත්‍රතා සමානචරියතා ආදි වශයෙන් 'මෙහි සූප දෙව මෙහි බත් දෙව' යනාදීන් ප්‍රකාශ කරන විධාන කරන මෙහෙණයි. ආරාධනා ලැබ කුලගෙවල පස් බොජුන් වළඳන මහණුන් වෙත සිට එසේ විධාන කරන මෙහෙණිය **'අපසක්ක තාව භගිනි'** යනාදි කියා අපසාදනය කළ යුත්තිය. ඉවත්කළ යුත්තිය. එක් මහණකු විසින් වත් එසේ නො කියනලද නම් භොජනීය පිළිගැන්මෙන් දුකුළා ද වැළඳීමෙන් පිඩක් පාසා පාටිදෙසනීය ද වේ.

7. **අනාපත්ති**-තමාගේ අහර අනෙකකු ලවා දෙවීම (තමා දුන හොත් මේ සිකයෙන් නොව යට සිකයෙන් ඇවැති.) උපාසකාදි අනෙකකු සතු අහරක් තමා දීම (දෙවීමෙන් මේ සිකයෙන් ඇවැත් වියහැකිසි) නො බෙදූ යමක් බෙදවීම නො ලත් මහණකුහට දෙවීම, හැමදෙනාහට ම සම සම ව දෙවීම, සික්ඛමානා සාමණේරීන් විසින් විධාන කිරීම, පස් බොජුන් තබා සෙස්සක් දෙවීම යන මෙහිලා ඇවැත් නො වේ.

9. **අඞ්ග**-පරිපුණ්ණූපසම්පන්නාය අනනුඤ්ඤාතාකාරෙන වොසාසනා, අනිවාරෙත්වා භොජනජ්ඣොහාරො.

———

## තතිය පාටිදෙසනීය සික්ඛා.

**314. සෙඛසම්මතානි.**

යම් කුලයෙක ශ්‍රද්ධාව වැඩේ ද, ධනය පිරිහේ ද, එබඳු කුලයට සඞ්ඝයා විසින් ඤත්තිදුතිය කම්වැකි කියා සෙඛසම්මුති නම් සම්මුතියෙක් දෙනු ලැබේ.

**315. පුබ්බෙ අනිමන්තිතො.**

ආරාධනා නැති ව එබඳු ගෙවලට පිඬු පිණිස යාම වරදය. ගෘහොපචාරයට භික්ෂුව එන්නට පෙර ම ආරාධනය ලැබිය යුතුය. උපචාරයට ඇතුළු වූ පසු ආරාධිත ව අහරක් ගත ද ඇවැත් වේ. අනිමන්ත්‍රිත වුවත් පිඬු පිණිස යා නො හෙන ගිලනාට එගෙට යා හැකියි. අහර පිණිස යාමකාලිකාදිය ගැනීමෙන් ද වැළඳීමෙන් ද දුකුළායි.

7. **අනාපත්ති**-ආරාධනා ඇති බව, ගිලන් බව, අනෙකකුගේ භික්ෂාවක් ඒ ගෙදර දී දීම, බැහැර විහාරාදියට ගෙන ගොස් දීම, භික්ෂුව එන්නට පෙර ම දොර අසල තබා ගෙන සිටියක්

දීම, නිච්චභත්ත සලාකභත්තාදිය, යාමකාලිකාදිය ප්‍රත්‍යය ඇති සඳ ගත්තැයි දීම මෙහි ලා ඇවැත් නො වේ.

9. **අඞ්ග**-සෙඛසම්මතතා, ඝරූපචාරෙ අනිමන්තිතතා, අගිලානතා, ඨපෙත්වා නිච්චභත්තාදීනි අඤ්ඤං ආමිසං ගහෙත්වා භුඤ්ජනං.

---

## චතුත්ථ පාටිදෙසනීය සික්ඛා.

**316.** **අප්පටිසංවිදිතං.**

පළමුවෙන් ආරොචනය නො කරන ලද්ද **අප්පටිසංවිදිතයයි**. අරඤ්ඤ පන්සියෙන් දුර පිහිටි සොර සතුරන් නිසා සප්‍රතිභය අරඤ්ඤෙහි වසන මහණුනට දන් දෙන රිසි ඇති දායකයන් විසින් එම ආරාම-ආරාමොපචාරයට අවුත් 'අසුවල් කුලයෙන් අසුවල් සඳ භොජනයෙක් ගෙනෙන්නේය'යි දැනුම් දියයුතු. සොර සතුරු උපද්‍රව ඇතොත් එබව භික්ෂූන් විසින් ඔවුනට කිව යුතුය. මෙසේ පනවන ලද්දේත් උපද්‍රව නිවාරණයටයි. දැනුම් දී ගෙනෙන ලද්ද **පටිසංවිදිතයයි**. එය වැළඳිය හැකියි. ආරාම-ආරාමොපචාරයෙන් පිටත තැනෙක දී හමු වූ මහණකුට ආරොචනය කළ ද පටිසංවිදිත නො වේ. අප්පටිසංවිදිතය අරමින් බැහැර යවා පටිසංවිදිත කොට නැවත ගත හැකියි. අතරමඟට ගොස් ද ගත හැකියි. ගිලනාට වරද නැත.

7. **අනාපත්ති**-පටිසංවිදිත කොට ගෙනෙන ලද්දෙන් ඉතිරිවූ හෝ ගිලානාතිරිත්ත වූ හෝ අහර ද, අරනෙහි හටගත් මූලඵලාදිය ද වළඳනු වටී.

9. **අඞ්ග**-යථාවුත්ත ආරඤ්ඤකසෙනාසනතා, යාවකාලිකතා, අනත්ථජාතකතා, අගිලානතා, අගිලානාවසෙසකතා, අප්පටිසංවිදිතතා, අජ්ඣාරාමෙ පටිග්ගහණං, අජ්ඣොහරණං.

**පාටිදෙසනීයා නිට්ඨිතා.**

——:o:——

## සෙඛියා.

හික්මිය යුතු හෙයින් සෙඛියයි. වත්තක්ඛන්ධකයෙහි ආ වත් ද මේයට ගැනේ. ඉක්මවීම සිදු වුවත් අනාදර සිත් ඇත්තනුට ම ඇවැත් වේයයි ඝනවනු වස් කාරකයෙක් නො දැක්විණ.



**317.** **පරිමණ්ඩලං නිවාසෙස්සාමි.**

කවර පාර්ශ්වයෙකින් හෝ කොන් නො එල්බෙන සේ රවුමට සිටින පරිදි හැඳීම පරිමණ්ඩල නිවාසනයයි. පමණට වඩා පහත් කොට හෝ උස් කොට හෝ හැඳීම ද ඛන්ධකාගත සෙසු නිවාසන දෙස ද මෙයට ම සඞ්ග්‍රහ වන බැවින් ඒ දෙස් ද නො වන සේ හැන්ද යුතු.

**අනාපත්ති**-පරිමණ්ඩල ව හඳිද්දී වැරද අපරිමණ්ඩල ව හැන්දහුට ද, අන්‍යවිහිත වූවහුට ද, ආදරයෙන් උගනත් පරිමණ්ඩල කොට හඳින්නට නො දන්නහුට ද ඇවැත් නො වේ. **දණ්ඩමඬලින්** යට ජඞ්ඝාසට්ඨිමියේ සිට අටඟුලක් පමණ බහා අඳනය හැන්ද යුතු. සුක්ඛජඞ්ඝ-මහාපිණ්ඩිකමංසයනට ද, දගේ හෝ පයේ හෝ වණ ඇති ගිලනාට ද ඔසවා හෝ පහත් කොට හෝ හැන්ද හැකියි.

**ලොකවජ්ජයි**. අකුසලචිත්තයි. වස්තුවත් පනතත් දන්නා සිතින් සචිත්තකය යනු **සාරත්ථදීපනී** මතයයි. ප්‍රාණඝාතාදිය සේ නිවාසනදෙස ලොකගරහිත නො වන නිසා පණ්ණත්තිවජ්ජය යනු ඵුස්සදෙව මතයයි. උපතිස්ස මතය ඊට ප්‍රතිපක්ෂයි.

**විමතිවිනොදනියෙහි** වනාහි "පණ්ණත්තිවිජානනයෙහි ලා ගැනෙන බැවින් වත්ථුවිජානනය වෙන ම කිවයුතු නො වේ. මෙය ව්‍යතික්‍රමණය කළ විට ඇවැත් වේයයි දන්නේ පනත දන්නෙක් ම වේ. උපතිස් මතයෙන් පනත් නො දත අපරිමණ්ඩලනිවාසනාදි වස්තුව දන්නහුට පනත් ඉක්මවීමේ අනාදර නැති නිසා සියලු සෙඛියාවන්හි නිරාවත් බව අනිෂ්ටයි. වැසිකිළියෙහි නො දත උදකාවසෙසය නැබූවහුට ඇවැතැයි කොසම්බකක්ඛන්ධකයෙහි කී නිසා එ ද යුතු නො වේ. එහෙයින් ඵුස්සදෙව මතයේ හැටියට වත්ථුවිජානන සිතින් සියලු සෙඛියා සචිත්තකයි. නියොග කම්‍යතාය සූපබ්‍යඤ්ජන පටිච්ඡාදන, උජ්ඣානසඤ්ඤී යන දෙසිකය ලොකවජ්ජයි. අකුසලචිත්තයි. සෙස්ස පණ්ණත්තිවජ්ජයි. ති චිත්තයි. ති වෙදනය" යි ගතයුතු බව කියවිණ.

**318.** **පරිමණ්ඩලං පාරුපිස්සාමි.**

පෙර කී පරිදි කොන් නො එල්බෙන සේ වට කොට පෙරවීමයි. එහෙත් මේ පෙරවුම ඛන්ධකාගත ගිහි පාරුපනයෙන් තොර වූ දෙපෙරවුමෙකි. **සිඛවළඳවිනිසෙහි** ඇතු පිටැ ලූ ගොටු සෙයින් දෙකොන් සම කොට පෙරවිය යුතුයයි කියේ අරමින් පොරවන මේ එකස් පෙරවුම ගැනයි. අරම තුළ-වෙසෙසින් බුද්ධුපට්ඨාන ථෙරූපට්ඨාන සඞ්ඝසන්නිපාතට්ඨානයන්හි දී මෙසේ පෙරවිය සුතු. අරමින් පිටත දී ද පිරිමඬුලු කොට ම හැන්ද සුතු, පෙරවිය සුතු. අනාපත්තිවාරය යට කී සේය.

319. **සුපටිච්ඡන්නො ගමිස්සාමි.**

නුවා කෙළවරින් ග්‍රීවාවද, දෙකොන සම කොට හකුළා මිණි බහන තෙක් අත් ද වසා ගමෙහි යා යුතු. එසේ නො කොට උරහිස හෝ ළය හෝ එළියේ ලා යාමෙන් දුකුළා වේ.

## සුපටිච්ඡන්නපාරූපනය.

සුපිළිසන් ව පොරවන්නහුගේ පිළිසන් නො වන තැන් **"ගලවාටකතො පට්ඨාය සීසං, මණිබන්ධතො පට්ඨාය හත්ථෙ, පිණ්ඩිකමංසතො පට්ඨාය පාදෙ"** යන්නෙන් කියැවිණ. වැසී සිටුනා අඞ්ග කියා ඇතහොත්, නො වැසී සිටුනා අඞ්ග නො කිව ද දත හැකිසි. නො වැසී සිටුනා අඞ්ග කියා ඇතහොත්, වැසී සිටුනා අඞ්ග නො කිව ද දත හැකිසි. වැසී සිටුනා අඞ්ගත් නො වැසී සිටුනා අඞ්ගත් යන දෙපස ම කියා ඇති තැන අර්ථය තේරුම් ගැනීමට ශතවර්ෂයෙක සිට වාද කරති.

**"තථා අක්ඛා භික්ඛුස්ස – ජත්තූනි'පි උරම්පි ච**
**විවරිත්වා යථා කාමං – ගච්ඡතො හොති දුක්කටං"**

යන විනයවිනිශ්චය ගාථාවට ලියූ **"ජත්තූනිපී ති උභො අංසකූටානි'පි; උරම්පිචා'ති හදයම්පි; විවරිත්වා'ති අපටිච්ඡාදෙත්වා"** යන ටීකාපාඨය මෙහි ලා විමසිය යුතු වේ. **"උභො අංසකූටානි'පි හදයම්පි අපටිච්ඡාදෙත්වා ගච්ඡතො දුක්කටං හොති"** (උභය අංසකූටයන් ද ළය ද නො වසා යන්නහුට දුකුළා වේ.) යනු ටීකාවෙන් පැවසෙන අදහසයි. කෙසේ යන්නහුට දුකුළා සිදු නො වේ ද යනු පූර්වෝක්ත පාඨසාමර්ථ්‍යයෙන් ම දත හැකිසි. **"උභො අංසකූටානි'පි හදයම්පි පටිච්ඡාදෙත්වා ගච්ඡතො දුක්කටං න හොති"** (උභය අංසකූටයන් ද ළය ද වසා යන්නහුට දුකුළා නො වේ.)

මෙතරම් පැහැදිලි ව අටුවා ටීකාවල ප්‍රකාශිත ව ඇත ද, මිණි බහන තෙක් වැසියයුත්තේ වම්ත පමණයයි ද, දකුණත කවදත් එළියේ ම වේයයි ද තර්ක කරමින් ශ්‍රමණවේශය අතුරුදහන් කරන්නට සමහරු ප්‍රයත්න කෙරෙති.

**"එකතො උභතොවා'පි – ඛුත්වා උක්ඛිත්තචීවරො,**
**ඉන්දීලකතො අන්තො – ගච්ඡතො හොති දුක්කටං'**

යන්නට **"එකතොපි'ති එකං අංසකූටතො වා; උභතොපී'ති උභය අංසකූටතො වා"** යනු ටීකාවයි. **"අතුරුසෙරෙහි එක්දත එව් දෙදත එව් සිවුරු නගාලා යත් ගිහුන් නොවපී"** යනුවෙන් සිඛවළඳ විනිසෙහි ද මෙය ප්‍රකාශිතයි. "පහළින්



කැරෙන එසවීමෙකි" යි අර්ථකථනය කළ ද උභයාංශකූටයන් වසා ලන බව සිද්ධ කිරීමට එයින් බාධා නැති. උභයාංශකූටයෙන් සිවුර නො නඟාලිය යුතුයයි කීමෙන් උභයාංශකූටයන් වසා පොරවන පෙරවුමක් ඇති බව ද කියැවේ.

**"ගලවළුදු මිණිබානුදු පිඬිමසුදු වැසෙන සේ සිවුරු හැද පෙරව හුන්නේ සුපිළිසන් නම්"** යන සිඛවළඳවිනිස පාඨය ද දෙජත් වසා පෙරවිය යුතු බව ප්‍රකාශ කෙරෙයි.

**"බුද්ධා ච නාම ගණ්ඨිකං පටිමුඤ්චිත්වා පටිච්ඡන්නසරීරා පරිසතිං ධම්මං දෙසෙන්ති"** පිරිස් මැද දහම් දෙසන බුදුහු අරම්හි නො වසා සිටුනා කවර කොටසක් වසා ගෙන ප්‍රතිච්ඡන්නශරීර වෙත් ද? ගණ්ඨිය නො ඇමුණුව ද ප්‍රතිච්ඡන්නශරීර වියහැකි බව ගණ්ඨිය අනුදැන වදාළ නිදානකථාවෙන් ම පෙනේ.

---

## චීවර ප්‍රමාණය.

සුගත් වියතින් දිග නවයක් වූ ද සරස සයක් වූ ද සිවුරක් දැරීමට භික්ෂූනට විනයෙන් ඉඩෙක් නැත. සුපටිච්ඡන්න ශික්ෂාදිය විකොපනය නො වන සේ හැඳ පෙරවිය හැකි වන පරිදි එක්තරා ප්‍රමාණයක් අටුවාවේ ප්‍රකාශිත ව ඇත.

**"ලාමකපරිච්ඡෙදෙන සඞ්ඝාටියා උත්තරාසඞ්ගස්ස ච දීඝතො මුට්ඨිපඤ්චකං, තිරියතො මුට්ඨිත්තිකං වට්ටති. අන්තරවාසකො දීඝතො මුට්ඨිපඤ්චකො, තිරියං ද්විහත්ථො'පි වට්ටති"** යනු අටුවායි

**"තිරියං ද්විහත්ථො'පි වට්ටති"** යනු කී බැවින් නිවාසනය ද මුට්ඨිත්තික වුව වටී යන මතයෙක් වේ. විනයත්ථමඤ්ජූසාවෙහි එන **"ද්විහත්ථො'පි වට්ටති'ති න කෙවලං අඩ්ඪතෙය්‍යොව වට්ටති, අථ ඛො ද්විහත්ථො'පි වට්ටති'ති පිසද්දස්ස අත්ථො දට්ඨබ්බො"** යන වැකියෙන් එය එසේ නො වන බව පැනේ.

සමන්තපාසාදිකා පරිමණ්ඩලශික්ෂා අටුවාවේ **"දීඝතො මුට්ඨිපඤ්චකං, තිරියං අඩ්ඪතෙය්‍යහත්ථං, තාදිසස්ස පන අලාභෙ තිරියං ද්විහත්ථප්පමාණම්පි වට්ටති"** යනුවෙන් නිවාසනයේ පමණ වෙසෙසින් කියා ඇත.

**"පච්ඡිමන්තෙන සඞ්ඝාටි – දීඝතො මුට්ඨිපඤ්චකා,**
**මුට්ඨිත්තිකා ච තිරියං – උත්තමන්තෙන සා පන**
**මුට්ඨිපඤ්චකං දීඝන්තං – පමාණං තිරියන්තතො**
**අඩ්ඪතෙය්‍යං ද්විහත්ථං වා – සෙසෙ අන්තරවාසකෙ.**

යනු **විනයවිනිච්ඡයපාඨ** යි. **ඛුද්දසික්ඛාහි ද සිඛවළඳවිනිසෙහි ද**
මේ ක්‍රමයෙන් ම ප්‍රමාණ දක්වා ඇත. "**අඩ්ඪතෙය්‍ය හත්ථං**" යනු
වෙනුවට "**මුට්ඨිතනිකං**" යි යෙදූ තැනෙක් දක්නා නො ලැබේ.
නිවාසනය ද මුට්ඨිතනික වේ නම්, සෙසු සිවුරු පමණ කී ක්‍රමය
අනුව "**මුට්ඨිතනිකං ද්විහත්ථං වා**" යි යෙදීම උචිත ක්‍රමයයි.
මෙයින් හෙළිවන්නේ "**මුට්ඨිතනික**" යන්නෙන් පැවසෙන අර්ථය
"**අඩ්ඪතෙය්‍ය හත්ථ**" යන වචනයෙන් නො පැවසෙන බවයි.

අඩ්ඪතෙය්‍යහත්ථ නම් දෙරියන් වියතයි. මුට්ඨිතනික යන්නෙන්
දෙරියන් වියත නො කියවෙන බව මතු දැක්වෙන පාඨයන් අනුව ද
දත හැකියි.

"**පඤ්චන්නං පූරණො පඤ්චමො, මුට්ඨි පඤ්චමො පරිමාණ-
මෙතිස්සා'ති මුට්ඨිපඤ්චමකා'ති වත්තබ්බෙ මකාරලොපෙන
මුට්ඨිපඤ්චකා'ති සඞ්ඛාපි වුත්තා**" යනු විනිච්ඡයටීකායි. මෙයින්
හෙළි වන්නේ මිට්රියන පස් වැනි කොට ඇති ප්‍රමාණයක් "මුට්ඨි
පඤ්චක" යන්නෙන් ගැනෙන බවයි. '**මුට්ඨි තනියො පරිමාණ-
මෙතිස්සා'ති**' යනුවෙන් මුට්ඨිතනිකා යන්න ද මේ පරිදි විග්‍රහ
කොට ඇත.

"**මුට්ඨිපඤ්චකන්ති මුට්ඨියා උපලක්ඛිතං පඤ්චකං චතු-
හත්ථෙ මිනිත්වා පඤ්චමං හත්ථං මුට්ඨිං කත්වා මිනිතබ්බන්ති
අධිප්පායො, කෙචි පන මුට්ඨිහත්ථානං පඤ්චකං මුට්ඨිපඤ්චකං
තස්මා පඤ්චපි හත්ථෙ මුට්ඨිං කත්වාව මිනිතබ්බන්ති වදන්ති**"
යනු විමතිවිනොදනියි.

"**මුට්ඨියා සහිතං පඤ්චකං යස්සා සා මුට්ඨිපඤ්චකා**" යන
කුද්දසිකාටීකා වැකිය ද විමතිවිනොදනි මතය අනුව යන බව
පෙනේ.

"**පඤ්ච පරිමාණං අස්සා'ති – පඤ්චකං, මුට්ඨිස්ස මුට්ඨි-
හත්ථස්ස සම්බන්ධි පඤ්චකං මුට්ඨිපඤ්චකං**" යනු විනයත්ථ
මඤ්ජූසායි.

මේ වාක්‍යප්‍රදෙශයන් ගැන සැලකීමේදී ආචාර්යවරයන් වැඩි
දෙනකුන්ගේ මතය මිට්රියන පස්වැනි කොට ඇති තෙවෙනි
කොට ඇති ප්‍රමාණයක් මුට්ඨිපඤ්චක මුට්ඨිතනික යන වචනවලින්
කියවෙන බවයි. ඒ නිසා ම "**මුට්ඨිතනිකං**" යනු වෙනුවට "**අඩ්ඪ-
තෙය්‍යහත්ථං**" යනු නො යෙදූ බව ද සලකා ගත හැකියි. මේ සියලු
කරුණුවලින් පෙනී යන්නේ අඳනය උසනින් දෙරියන් හෝ
දෙරියන් වියත් හෝ වන බවයි සෙසු දෙසිවුර දෙරියන් මිට්රියනි
එහෙයින් තෙසිවුර එක් පමණය යන මතය අටුවාටීකාවලින් සිද්ධ
නො වන බව කිව යුතුය.



පශ්චිම ප්‍රමාණ චීවරයෙන් උභය අංශයන් වසා පෙරවිය හැකි
වේ ද යනුත් එක්තරා ප්‍රශ්නයෙකි. එපමණ සිවුරින් උභයාංශ-
යන් වසාලිය නො හැකි නම් අටුවාවේ එය නො දැක්වෙන්නේය.
ගෙල වටා සිවුරු ගුලියක් යෙදෙන හෙයිනුත්, දකුණත සපුරා වැසී
යන හෙයිනුත්, අඳනය සතරඟුලක් පමණ වෙන්ව නො පැනෙන
හෙයිනුත් දැන් කැරෙන උභයාංශපාරුපනය පුරාතන පෙරවීමෙන්
තරමක වෙනසක් ගෙන ඇති බව ද සැලකිය හැකියි.

---

## බාහන්තය.

චීවරාඞ්ග දක්වන තන්හි ජඞ්ඝෙය්‍ය ගීවෙය්‍යයන් ද දක්වා
අවසනැ බාහන්ත නම් අවයවයක් ගැන ප්‍රකාශිතයි අනුවිවට්ට
වලින් හෙවත් ඇළඅතුවලින් බැහැර එක් එක් ඛණ්ඩයට ඒ නමැයි
ද කියවිණ. "**බාහන්ත නම් කෙළතු දෙකය**" යනු නිඝණ්ඩුසන්-
නයි. විනය අටුවාහි පසුව දක්වන මතය වැඩියෙන් ආදරනීයයි.
එසේ මහටුවා මතය වශයෙන් පෙන්වා ඇත්තේ "**සුප්පමාණචීවරං
පාරුපන්තෙන සංහරිත්වා බාහාය උපරි ඨපිතා උභො අන්තා
බහිමුඛා තිට්ඨන්ති තෙසං එතං නාමං**" යනුයි. විනයවිනිච්ඡය
ටීකාවෙහි:–

"**බාහන්තන්ති චීසු පරියන්තෙසු සිබ්බිතං බාහිර ඛණ්ඩ-
මයං, තං ච සඞ්ඝාටිත්වා බාහාමත්ථකෙ ඨපීයමානත්තා මඤ්චා
උක්කුට්ඨිංකරොන්ති'ති ආදිසු විය ආධෙය්‍ය ආධාරොපචාර-
වසෙන බාහා'ති ච චීවරස්ස පරියන්තාවයවත්තා අන්තන්ති ච
වුච්චති**" යනුවෙන් සිවුරු දෙකොනේ මසන කඩ දෙකකට
බාහන්තයයි කියනු ලබන බව ප්‍රකාශිතයි. මෙහි පමණ දිගින් තුන්
වියත් පමණයයි ද, පළලින් දෙවියත් පමණයයි ද ඇතැම් ආචාර්
වරු පවසති. බාහුව මත තැබීමක් නො වන බැවින් නිවාසනයෙහි
මේ අඞ්ගය නො ලැබේ. අටුවාහි කී සුප්පමාණචීවරයේ සවභාවය
මෙබඳු දැයි සලකා බැලිය යුතුය.

ඇතුළු ගමැ සුපිළිසත් විය යුතු යනු කී බැවින් අද්ධානමාර්ගී-
යෙහි ද, ගමක් හමු වූව එම සංඥවෙන් එහි ද සුපිළිසත් නො ව යා
හැකියි. රාත්‍රිවාසය සඳහා ගම් වැදුණහුට දැවල් ද රෑ ද එකස් කොට
විසිය හැකියි.

---

**320. සුසංවුතො.**

අත් පා නො වනමින් මනා ව සන්සුන් ව ගම තුළ යාම හිඳීම
කටයුතු.

**321. ඔක්ඛිත්තචක්ඛු.**

යට බැලූ ඇස් ඇතිව, සිවුරියත් පමණ ඉදිරිය බලමින් ඇත්ගමැ යාම හිඳීම කළයුතු. මේ කිවේ බෙල්ල නමා ගෙන සිටීම නො වේ. සිකයට අනදර කෙරෙමින් ඔබමොබ බලමින් යන්නහුට දුකුළායි. ඇත් අස් ඈ උවදුරු වේදැයි ඔබමොබ බැලුව වරද නැති. වාසූපගතයාත් සුසංවුත ව ඔක්ඛිත්තචක්ඛු ව සිටිය යුතු බව **විමති විනොදනියෙහි** එයි.

**322. උක්ඛිත්තකාය.** (ඉහළිම්ගුනයි.)

ගමට ඇතුළු වන තැන සිට කටියෙන් උඩ කාබාන ඈ පෙනෙන සේ එක් පසින් හෝ දෙපසින් හෝ සිවුර නො නගාලිය යුතු. වාසූපගතයාට වරද නැත.

**323. උජ්ජග්ඝිකාය.**

මහසිනා සෙමින් ගමේ යාම හිඳීම නො කළ යුතු. සිනාසිය යුතු තැනදී සතුටු පමණක් දැක්වුව වරද නැති.

**324. අප්පසද්දෝ.**

දෙළොස් රියන් දුර සිටියහුට ශබ්දය ඇසුණත් කථාව නිශ්චය කොට ගත නො හැකි නම් අල්පශබ්දත්වය වේ. තේරුම් ගත හැකි නම් මහා ශබ්දත්වය වේ. දම් දෙසීමාදියට හැර වාසූපගතයාත් මහසිනා මහහඬ නො නගා විසිය යුතු.

**325. උක්කුටිකාය.**

උක්කුටිකාව හෙවත් ඔසවා යාම අග්ගපාදගමන පණ්හිගමන විසින් ද්විප්‍රකාරයි. විළුම් ඔසවා අක්පසින් ද, අක්පය ඔසවා විළුඹින් ද යාම සිටීම නො වටී.

**326. පල්ලත්ථිකාය.**

අතින් හෝ සිවුරින් හෝ අකවටු ගන්වා ගෙන සිටීමයි. **"උක්කුටිකා නිසීදිත්වා හත්ථෙහි ජණ්ණුනං බන්ධනං හත්ථපල්ලත්ථිකා, තථා දුස්සෙන පිට්ඨිකණ්ඨකාස ජණ්ණුනං ච බන්ධනං දුස්සපල්ලත්ථිකා"** යනු ටීකා යොජනායි.

**327. සක්කච්චං.**

ඉවත ලන රිසි ඇත්තකු සේ නො වී පිණ්ඩපාතයක් පිළිගනිමි යන කල්පනාව ඇතිව ගතයුතු. **පත්තසඤ්ඤී**-පිණ්ඩපාතය දෙන විට අනාදරයෙන් ඔබමොබ නො බලා පාත්‍රය ගැන ආභොග සංඥා ඇති ව සිටීමයි. **සමසූපකං**-මුග්ග මාස කුලත්ථවලින් කළ සූපයයි.



අන් ව්‍යඤ්ජන කොපමණ ගත ද මෙයින් වරද නැත. **සමතිත්තිකං**- අධිට්ඨානුපග පාත්‍රයේ මුවවිටින් යට සිටින සේ යව්කැලි අහර ගතයුතු.

**328. සූපං වා ඔදනං වා.**

**පණීත**භොජනවලින් බැහැර සෙසු බොජුන් සූප සඳින් ගැනේ. නො ගිලන් ව මේවා ඉල්ලා ගත නොහේ. මුව තුළට ගත් පසු විපිළිසර ව නො ගිලින රිසි වුවත් වහා ගිලී ගිය ද, විඤ්ඤත්ත අවිඤ්ඤත්ත දෙකොටසක් තුබුණු තැතින් අභ්‍යවිහිත ම ගත්තහුට ද, අනෙකකු සඳහා ඉල්ලා ගත්තහුට ද ඇවැත් නැත. අනුන් සඳහා ඉල්ලීමෙන් මෙයින් ඇවැත් නැත ද, පස්සහදූමියන් උදෙසා නො නැ නො පැවරුවන්ගෙන් ඉල්ලා ගැනීමෙන් **අඤ්ඤාත-විඤ්ඤත්ති දුකුලා වේ**. දූත වැළඳීමෙන් තමාට ද අනුනට ද මිච්ඡාජීවය වේ.

—:(○):—

## අධිකරණ සමථ.

**"සමථෙහි සමනවසෙන අධිකරීයන්ති වූපසමියන්තී'ති අධිකරණං"** සමථයන්ගෙන් සංසිඳවිය යුත්ත අධිකරණ නම්. විවාදාදි විසින් අධිකරණ සතරෙකි. ඒ අධිකරණයන් සංසිඳුවන ක්‍රම සතෙකි. ඒ **අධිකරණසමථ** නම්.

**1. විවාදාධිකරණය.**

**"විවාදො'යෙ'ව අධිකරණං - විවාදාධිකරණං"** අටළොස් භෙදකර වස්තුන්ගෙන් යමක් නිසා උපන් විවාදයයි. මෙය සංසිඳවීමට **සම්මුඛාවිනය, යෙභුය්‍යසිකා** යයි ක්‍රම දෙකෙක් වේ.

**"සඞ්ඝ-ධම්ම-විනය-පුග්ගලානං සම්මුඛා දාතබ්බො විනයො සම්මුඛාවිනයො"** යි යූ බැවින් කරුණු සතරක් එක්තැන් වීමෙන් කැරෙන සමථය සම්මුඛාවිනය නම් වේ. කම්මප්පත්ත සඞ්ඝයාගේ පැමිණීම, ඡන්දාහරණය, හමු වූවන් කම්යට බාධා නො කිරීම යන මේවා සුදුසු පරිදි යෙදීමෙන් **සඞ්ඝසම්මුඛතාව** සිද්ධ වේ. සංසිඳවිය යුතු කාරුණ සත්‍ය වීම **ධම්මසම්මුඛතාව** යි. ඒ ඒ අධිකරණය සංසිඳවීමට බුදුන් වදාළ ක්‍රමය **විනයසම්මුඛතාව** යි. විවාද කරන්නවුන් වෙසෙසින් චොදක චුදිතකයන් ඉදිරිපිට සිටීම **පුග්ගලසම්මුඛතාවයි**. මේ සම්මුඛාවිනය සතර අධිකරණයෙහි ම යෙදේ.

සංසිඳවීමට නො හැකි අධිකරණය උබ්බාහිකාවෙන් **සම්මත** භික්ෂූන් විසින් සෙස්සනට කථා තහනම් කොට විසඳිය යුතු. එයි-නුදු නො හැකි නම් යෙභුය්‍යසිකාවෙන් විසඳන්නේය. ලහපත් බෙදා ධර්මවාදීන්ගේ බොහෝ බව නිසා එයින් සංසිඳවාලීම **යෙභුය්‍යසිකා** නම්.

**2. අනුවාදාධිකරණය.**

සීලවිපත්ති ආදි සිවු විපත් නිසා ඇතිවුණු ආක්‍රොශ පරිභව චෝදනාසි. **සම්මුඛාවිනය, සතිවිනය, අමූළ්හවිනය, තස්සපාපිය-සිකා** යයි එය සංසිඳුවන ක්‍රම සතරෙකි.

අනුවාදකයන්ගේ ද අනුවාද ලද්දවුන්ගේ ද බස් අසා ඇවැත් නිශ්චය කිරීමේ දී හුදු සම්මුඛාවිනය යෙදේ. අමූලක සීලවිපත්ති යෙන් චෝදනා ලත් රහතුනට, යැදි කල ඤත්තිචතුත්ථ කම් වැකි කියා **සතිවිනය** දෙනු ලැබේ ඉන් පසු නැඟෙන චෝදනා ගණනට ගනු නො ලැබේ උමතු ව සිට බොහෝ වරද කළ මහණුනට සුවපත් පසු වරද පවරතොත් **අමූළ්හවිනය** දෙනු ලැබේ.

චෝදනා ලැබ, විමසන විට අනත් මනත් කියන පාපී මහණ හට "මහණකම වතොත් මිනාව පැවත ඔසාරණය ලබා වා. නො වතොත් මෙය ම නැස්ම වේ වා"යි කැරෙන කර්මය **තස්සපාපිය සිකා** නම්. තජ්ජනීයාදිය සේ නිග්‍රහකර්මයක් වූ මෙය කළ පසු නැවත සුද්ධිය පතා සඟමැදට ඉය නො හේ. වත් පුරා ඔසාරණය ලැබිය හැකියි. මේවාහි ද සම්මුඛාවිනය යෙදේ.

**3. ආපත්තාධිකරණය.**

සත් ඇවැත් ම ආපත්තාධිකරණයයි. **සම්මුඛාවිනය, පටි-ඤ්ඤාතකරණ, තිණවත්ථාරක** යන තුනින් සංසිඳේ.

වස්තු-ආපත්තීන් පිළිත කිරීම **පටිඤ්ඤාවයි**. ඒ ප්‍රතිඥාව කරණ කොට කළයුතු ක්‍රියාව **පටිඤ්ඤාතකරණයයි**. ඇවැත් දෙසීමේ දී "**ආපත්තිං ආපන්නො; ආම පස්සාමි**" යනුවෙන් පිළිත කළ විට "**ආයතිං සංවරෙය්‍යාසි**" යි පැවති වාක්කර්මය පටිඤ්ඤාත කරණයයි. වත් මානත් ඉල්ලීමේ දී ඇවැත් පිළිත කිරීම ද, පරිවාසදානාදියෙන් පටිඤ්ඤාතකරණය ද සිදු වේ. මෙහිලා සම්මුඛා විනය ද යෙදී ඇත.

දෙපසක් ව බොහෝ වරද කළ **භික්ෂූහු** පසු ව ලජ්ජිධර්මයෙහි පිහිටා, මේ ඇවැත් ඔවුනොවුනට ආරෝපනය කොට පිරිසිදු කරන්නට ගිය හොත් අධිකරණය චණ්ඩ වෙතියි සලකා වෙන්



වෙන් ඤත්ති තබා **තිණවත්ථාරක** නම් කර්මය කරත්. මෙහි දී සියලු දෙන එක්තැන් වියයුතු ඡන්දහරණය නො කොට ගිලනා පවා ගෙනා යුතුය. පරිජ් ද සඟවෙසෙස් ද ගිහියනට නුගුණ කීම් ආදියෙන් සිදුවූ ඇවැත් ද හැර උපසපත් වූ දිනයේ සිට පත් සෙසු සියලු ඇවැත් සමථයට පැමිණේ. ඡන්දය දී බැහැර සිටියවුන්ගේත්, අපට මෙය රුචි නැතැයි දිට්ඨාවිකම්මකළවුන්ගේත් ඇවැත් සමථයට පත් නො වේ

**4. කිච්චාධිකරණය.**

ඤත්තිකම්මාදි සිවු විනයකම් කිරීමයි. මෙහි සම්මුඛාවිනය පමණෙක් යෙදේ.

## පාතිමොක්ඛ දීපිකාව
## සමාප්තයි.

# අනුක්‍රමණිකා.


| | පිට. |
|---|---|
| අකාලසාවන | 96 |
| අකාලචීවර | 170 |
| අකිරියතො | 102, 168 |
| අග්ගබීජ | 213 |
| අග්ගිපරිජිත | 214 |
| අග්ඝසමොධාන | 151 |
| අඝටිතනිමිත්තතා | 75 |
| අඞ්ගකුට | 111 |
| අඞ්ගජාතාභිනිසීදක | 125 |
| අචිත්තකාපත්ති | 103 |
| අජාතපක්ඛි | 211 |
| අජානන්තස්ස | 131 |
| අටලොස්වත් | 149 |
| අටාකාර දුකූලා | 240 |
| අට්ඨවත්ථුකා | 124 |
| අට්ඨවාචිකූපසම්පදා | 91 |
| අතිබුද්ධිකා | 75 |
| අතිමහතී | 75 |
| අත්පස | 74, 162 |
| අත්ථසාධක | 109 |
| අත්ථපුරෙක්ඛාර | 132 |
| අද්ධාපච්චුප්පන්න | 117 |
| අධිකරණ | 142, 143 |
| අධිකරණසමථ | 283 |
| අධිට්ඨාන | 162 |
| අධිට්ඨානුපොසථ | 85 |
| අධිපඤ්ඤ | 97 |
| අධිප්පාය | 142 |
| අධිමාන | 122 |
| අධිසීල | 97 |
| අනාමන්තචාර | 158 |
| අනාමාසදුක්කට | 240 |
| අනාරොචන | 152 |
| අනිමිත්තතා | 76 |

| | පිට. |
|---|---|
| අනිමිත්තා | 131 |
| අනිමිත්තුපග නිමිත්තතා | 75 |
| අනියතවල ප්‍රයෝජන | 155 |
| අනුපද | 206 |
| අනුපඤ්ඤත්ති | 100, 105 |
| අනුප්පන්නපඤ්ඤත්ති | 100 |
| අනුබ්‍යඤ්ජන | 206 |
| අනුභූතපූර්ව | 127 |
| අනුද්දිස්ස | 117, 118 |
| අනුලොම්පරිජ් | 125 |
| අනුවාදාධිකරණ | 142, 284 |
| අනුසාවනසම්පත්ති | 95 |
| අනුසාසනිපුරෙක්ඛාර | 132 |
| අන්තග්ගාහිකා දිට්ඨි | 101 |
| අන්තරුබ්භාර | 160 |
| අන්වක්ඛර | 206 |
| අපලොකනකම්ම | 265 |
| අබද්ධසීමා | 81 |
| අභබ්බපුග්ගලයෝ | 91, 124 |
| අමූළ්හවිනය | 284 |
| අරහන්තඝාතක | 94, 118, 124 |
| අලජ්ජිතා | 87 |
| අලමරියඤාණදස්සන | 121 |
| අලොහිතා | 131 |
| අවණ්ණභණනය | 131 |
| අවලිත්තා | 137 |
| අවහරෙය්‍ය | 108 |
| අවිප්පවාසසීමා | 80 |
| අෂ්ටගුරුධර්ම | 90 |
| අසඤ්චිච්ච | 130 |
| අසනියා | 130 |
| අසමාදානචාර | 159 |
| අසාදියන්තස්ස | 131 |
| අසාධාරණ පඤ්ඤත්ති | 100 |

පිට.
අසාධාරණ පරිජ් 124
ආචාරවිපත්ති 101
ආචාරවිපත්ති චොදනා 141
ආජීවවිපත්ති 101
ආණත්තික 108, 118
ආණාපාතිමොක්ඛ 83
ආණාවිතික්කමන්තරාය 256
ආදියෙය්‍ය 107
ආනන්තරිය 91, 118
ආපත්තාධිකරණ 142, 284
ආපත්තිසභාග 74
ආපත්තිසන්දස්සනා 141
ආමිසසම්භොග 258
ආසාවච්ඡෙදිකා 160
ඇවැත් දෙසීම 256
ඉටත්බිදීම 164
ඉද්ධිමය 119
ඉත්ථිපණ්ඩකා 132
ඉරියාපථ 118
ඉරියාපථං විකොපෙය්‍ය 108
උක්ඛිත්තානුවත්තිකා 124
උත්තරිමනුස්සධම්ම 121
උදකනිමිත්ත 79
උදකුක්ඛෙපසීමා 82
උපවාදන්තරාය 256
උපසම්පදා 90
උපොසථ 72, 83,
උබ්භජාණු මණ්ඩලිකා 124
උභතො පඤ්ඤත්ති 100
උභතො බ්‍යඤ්ජනක
94, 124, 132
උභයත්ථෙනක 93
උම්මත්තක 105
උල්ලිත්ත 137
එකකම්ම 99
එකතො පඤ්ඤත්ති 100
එකභණ්ඩපඤ්චක 108

පිට.
එකාදශරංග 126
එකුද්දෙස 99
එහිභික්ඛූපසම්පදා 90
ඔකාස 118
ඔකාසපරිකප්ප 111
ඔධානසමොධාන 151
ඔවාදපාතිමොක්ඛ 83
ඔවාදපටිග්ගහණූපසම්පදා 90
ඔසාරණ 265, 266
කඨිනය ඇතිරීම 158
කඨිනානිසංස 159
කඨිනුද්ධාර 159
කණ්ඩුපටිච්ඡාදි 164, 273
කණ්ඩුති 127
කපිමිද්ධ 128
කම්මවාචාසම්පත්ති 79
කම්මස්සකතාඥාණ 97
කම්මන්තරාය 255
කම්මලක්ඛණ 265, 266
කලලරූපය 116
කංසකූට 111
කාල 98, 118, 125
කැපකරුවෝ 179
කිරියතො 102
කිරියාකිරියතො 102
කිච්චාධිකරණ 142, 285
කිලෙසන්තරාය 255
කුච්ඡිසමය 195
කුසලත්තික 104
කුසාවහාර 112
කුලදූසක 148
කූටකහාපණ 111
ක්‍රියාවිශෙෂ 118
ඛණපච්චුප්පන්න 117
ඛණ්ඩනිමිත්තතා 75
ඛණ්ඩසීමා 79
ඛණ්ඩබීජ 213



පිට.
ඛිත්තචිත්ත 105
ගණභොජන 159
ගරු භණ්ඩ 268
ගහණකූට 111
ගරුධම්ම පටිග්ගහණූප
සම්පදා 90
ගණ්ඨුපොසථ 84
ගාම 106, 169
ගාමසීමා 86
ගාමූපචාර 106
ගුහා 159
ගෙහසිතපෙම 127
චතුසමුට්ඨාන 102
චතුර්විධකර්ම 265
චිත්ත 97, 103, 106
චීවරවිප්පවාස 8 , 168
චීවරප්‍රමාණය 162, 279
චීවරුප්පාද 159
චූලසුද්ධන්ත 151
චොදනාභෙද 141
ඡ සමුට්ඨාන 102
ඡන්දපාරිසුද්ධි 85, 86
ඡන්දපාරිවාසිය 86
ජාතපඨවි 211
ජීවිතින්ද්‍රිය 116
ඤත්තිඅපරාමසන 95
ඤත්තිකම්ම 266
ඤත්තිචතුත්ථකම්ම 266
ඤත්තිචතුත්ථූපසම්පදා 91
ඤත්තිදුතියකම්ම 266
ඤත්තිසම්පත්ති 95
ඤත්තදුක්කට 241
ඨානාචාවෙය්‍ය 108
තස්සපාපියසිකා 284
තාවකාලිකො 115
තිණවත්ථාරක 86, 285
තිපිය පක්ඛන්තක 93, 124

පිට.
තිරච්ඡානගත 93, 124
තිරච්ඡානපරිග්ගහෙ 115
තුලාකූට 110
තෙචීවරික 164
ත්‍රිවිධසම්පත්ති 78
ථාවර 118
ථෙය්‍යසංවාසක 92, 124
ථෙය්‍යාවහාර පඤ්චක 110
දක්ඛිණෙය්‍ය සඞ්ඝ 72
දණ්ඩකම්මනාසනා 259
දශභායසිංචෝ 135
දශසත්‍රිහු 135
දශආක්‍රොශවස්තු 204
දශඅන්තරායයෝ 84
දසකැපකරුවෝ 179
දසසෙය්‍යා 218
දසලෙස 143
දස්සනස්සාද 127
ද්විසමුට්ඨාන 102
දිට්ඨිවිපත්ති 101
දුබ්බච 146
දුරුච්චාරණ 95
දුරූපචිණ්ණදුක්කට 241
දූතෙනඋපසම්පදා 91
දෙවතොපසංහාර 127
ධම්මපුරෙක්ඛාර 132
ධම්මසම්භොග 258
ධර්මනිර්මාණ 175
ධුරනික්ඛෙප 109
ධුවචොළා 131
ධුවලොහිතා 131
නදීනිමිත්ත 78
නව පාත්‍ර 193
නවචීවර 161
නානාභණ්ඩපඤ්චක 107
නාසනන්තිකා 160
නිට්ඨානන්තිකා 159

| | පිට |
|---|---|
| නිමිත්තකම්ම | 110 |
| නිමිත්තමත්තා | 131 |
| නිමිත්තසම්පත්ති | 78 |
| නිසජ්ජස්සාද | 127 |
| නිසීදන | 163, 183, 273 |
| නිස්සයමුච්චනක | 223 |
| නිස්සග්ගිය | 108, 117 |
| නිස්සාරණා | 265, 266 |
| නීලකහාපණ | 112 |
| නොසඤ්ඤාවිමොක්ඛ | 103, 168 |
| පකතත්ත | 74 |
| පක්කමන්තන්තිකා | 159 |
| පග්ගරන්ති | 131 |
| පච්චත්ථරණ | 160 |
| පච්චුද්ධරණ | 161, 251 |
| පච්ඡාසඤ්ඤාතිට්ඨපන | 95 |
| පඤ්ඤත්තිවිධි | 100 |
| පඤ්හාබ්‍යාකරණූපසම්පදා | 90 |
| පටිච්ඡන්නකූට | 111 |
| පටිච්ඡන්නපරිවාස | 151 |
| පටිච්ඡාදන | 150 |
| පටිඤ්ඤාතකරණ | 284 |
| පටිස්සව දුක්කට | 241 |
| පණ්ඩක | 91, 124 |
| පණ්ණත්තිවජ්ජ | 103 |
| පත්තකාලඞ්ග | 74 |
| පද | 206 |
| පරම්මුඛකප්පියකාර | 180 |
| පරිකප්පාවහාර | 111 |
| පරිකප්පිතොකාස | 109 |
| පරික්ඛාරචෝළ | 164 |
| පරිවාස | 150 |
| පරිසසම්පත්ති | 79, 96 |
| පරිසුපට්ඨාක | 223 |
| පසය්හාවහාර | 111, 197 |
| පවාරණා | 73, 82, 85, 132 |
| පංසුකූලිකසඤ්ඤිස්ස | 115 |

| | පිට |
|---|---|
| පාණාතිපාත | 116 |
| පාණාතිපාතපයොග | 117 |
| පාතිමොක්ඛ | 84 |
| පාත්‍රචතුෂ්ටය | 189 |
| පාදය | 113 |
| පාරාජිකා | 99 |
| පාරිසුද්ධිඋපෝසථ | 84 |
| පාසාණනිමිත්ත | 78 |
| පිටකසමය | 195 |
| පිතුඝාතක | 94, 124 |
| පිත්තුම්මත්තක | 105 |
| පුග්ගල | 98, 99 105 |
| පුබ්බකිච්ච | 71, 85 |
| පුබ්බනිමිත්ත | 127 |
| පුබ්බපයොග දුක්කට | 240 |
| පෙතපරිග්ගහෙ | 115 |
| ඵස්සස්සාදය | 127 |
| ඵලබීජ | 213 |
| බද්ධසීමා | 75 |
| බහිසීමට්ඨිත සම්මතා | 76 |
| බාහන්තය | 281 |
| බීජබීජ | 213 |
| බ්‍රහ්මදණ්ඩ | 265 |
| භණ්ඩදෙය | 111 |
| භණ්ඩපරිකප්ප | 111 |
| භණ්ඩුකම්ම | 265 |
| භික්ඛුනිදූසක | 94, 124 |
| භික්ඛුනොවාද | 86, 223, 225 |
| මග්ගනිමිත්ත | 78 |
| මහාසීමා | 80 |
| මහාසුද්ධන්ත | 131 |
| මාතුඝාතක | 94, 124 |
| මානකූට | 111 |
| මානත්ත | 152 |
| මාසක | 113 |
| මිච්ඡාදිට්ඨි | 101 |
| මිස්සපක්ඛි | 211 |



| | පිට. |
|---|---|
| මිස්සකසමෝධාන | 151 |
| මුඛගාහි | 124 |
| මුඛප්පුඤ්ඡන | 161 |
| මුඛවෙවටික කප්පියකාර | 180 |
| මුච්චනස්සාද | 126 |
| මුත්තස්සාද | 126 |
| මුදුපිට්ඨික | 124 |
| මූලබීජ | 213 |
| මෙථුනස්සාද | 127 |
| මොචනස්සාද | 124 |
| යක්ඛුම්මත්තක | 105 |
| යාවකාලික | 194, 239 |
| යාවජීවික | 194, 240 |
| යාවදත්ථචීවර | 159 |
| යෙභුය්‍යසිකා | 159 |
| රජ්ජුභෙද | 111 |
| රත්තිපාරිවාසිය | 73 |
| රුක්ඛනිමිත්ත | 78 |
| ලම්බී | 124 |
| ලහුකාපත්ති | 74 |
| ලිඞ්ගත්ථෙනක | 92 |
| ලිඞ්ගනාසනා | 259 |
| ලොකවජ්ජ | 103 |
| ලොහිතුප්පාදක | 94, 124 |
| වජ්ජපටිච්ඡාදිකා | 126 |
| වත්ථුසන්දස්සනා | 141 |
| වත්ථුසම්පත්ති | 91 |
| වනභඞ්ගස්සාද | 127 |
| වනනිමිත්ත | 78 |
| වම්මිකනිමිත්ත | 78 |
| වවත්ථිත | 95 |
| වත්ථුසභාග | 74 |
| වත්ථුව | 99, 114, 118, 126 |
| වස්සිකසාටිකා | 163, 195 |
| වස්විසූව | 156 |
| වාචස්සාද | 127 |
| විකප්පන | 162, 165 |

| | පිට. |
|---|---|
| විජ්ජාමය | 119 |
| විප්පවාස | 82, 152, 170, 202 |
| විමුත්ත | 96 |
| විවාදාධිකරණ | 142, 283 |
| විස්සාසගාහ | 114 |
| විසුංගාමසීමා | 81 |
| වේදනත්තික | 104 |
| වේපුරිසිකා | 132 |
| සකාසඤ්ඤිස්ස | 114 |
| සඞ්ඝ | 72 |
| සඞ්ඝභේදක | 94, 124, 145 |
| සඞ්ඝඅපරාමසන | 95 |
| සඞ්ඝාතකම්ම | 110 |
| සඤ්ඤා | 103 |
| සඤ්ඤාවිමොක්ඛ | 103 |
| සතිවිනය | 284 |
| සත්තබ්භන්තරසීමා | 81 |
| සත්තාහකරණීය | 156 |
| සත්තාහකාලික | 194, 240 |
| සත්තු | 231, 232 |
| සත්ථපරිජිත | 214 |
| සන්තතිපච්චුප්පන්න | 117 |
| සන්තති මරණ | 117 |
| සන්නිධානනත්තිකා | 159 |
| සබ්බනාසනා | 259 |
| සමසික්ඛතා | 99 |
| සමානසංවාසක | 144 |
| සමානසංවාසසීමා | 79, 80 |
| සමුට්ඨාන | 101 |
| සමෝධාන පරිවාස | 151 |
| සම්භින්නා | 132 |
| සම්මුඛාවිනය | 283 |
| සරණගමනූපසම්පදා | 90 |
| සහනත්තිකා | 160 |
| සහපයොග | 110 |
| සභාග | 152 |
| සහපයොග දුක්කට | 240 |

# ශුද්ධිපත්‍රය.

| පිටුව | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 17 | 4 | අවිවදමානෙ | අවිවදමානො |
| 24 | 31 | අනික්කායමතො | අනික්කාමයතො |
| 30 | 20 | නෙ තිපදවා | නො තිපදවා |
| 31 | 20 | සඤ්ඤතයක් | සඤ් තයක් |
| 36 | 21 | නො පැමිණෙ ලද | නො පැමිණෙන ලද |
| 49 | 30 | බිට | බිමට |
| 57 | 2 | පැවිත්තියං | පාවිත්තියං |
| 57 | 19 | තස්ස කෙ | තස්ස තෙ |
| 59 | 2 | අති න්තරාජකෙ | අතික්ඛන්තරාජකෙ |
| 61 | 6 | සුගතදත්ථියා | සුගතවිදත්ථියා |
| 61 | 31 | විතින් | වියතින් |
| 62 | 5 | අ ගච්ඡන්ති | ආගච්ඡන්ති |
| 65 | 18 | න සක්කච්චං | සක්කච්චං |
| 74 | 10 | සමග්ගි | සාමග්ගි |
| 76 | 31 | වඃක්ෂලතාදි | වෘක්ෂලතාදි |
| 76 | 31 | සමභින්දය | සමභින්දනය |
| 79 | 20 | සී ාවක් | සීමාවක් |
| 84 | 24 | ඤුතනි | ඤුතති |
| 89 | 3 | ප්‍රථධ්‍යානාදීන්ගේ | ප්‍රථමධ්‍යානාදීන් ගේ |
| 127 | 16 | මිදී යාසි | මිදී යාමයි |
| 170 | 3 | ආයසමතෙ | ආයසමතො |
| 170 | 28 | සඞ්ඝ   වා | සඞ්ඝස්සවා |
| 176 | 29 | පටිලාහො | පටිලාභො |
| 190 | 10 | ආරාමි— | ආරාමිකා- |
| 196 | 5 | නො පවර | නො පවරා |
| 199 | | පිටු නොම්මරය 196 වී ඇත. | |
| 199 | 16 | සුවිලෙඩිත | සුවිලෙබිත |
| 200 | 24 | පනිස්ස | උපනිස්ස |
| 217 | 18 | රූහනයා | රූහනය |
| 217 | 19 | තබ | තබා |
| 223 | 24 | දෛපොත | දෙපොත |
| 264 | 21 | පස්සුති | උපස්සුති |
| 270 | 6 | හෙසින් | ගෙසින් |
| 283 | 1 | සමතානීකං | සමතික්ඛන්තං |

# ආශ්‍රිත ග්‍රන්ථ


කඞ්ඛාවිතරණී
කඞ්ඛාවිතරණී ටීකා
කඞ්ඛාවිතරණී පිටපොත
කඞ්ඛාවිතරණී යොජනා
කඞ්ඛාවිතරණී සන්නය
කල්‍යාණී ප්‍රකරණය
ඛුද්දසික්ඛා ව්‍යාඛ්‍යා
ඛුද්දසික්ඛා ටීකා
ගරු භාණ්ඩ විනිශ්චය
පරිවාර ගැටපදය
පාතිමොක්ඛ ගණ්ඨිදීපනී
පාතිමොක්ඛ පදත්ථ අනුවණ්ණනා
පාළිමුත්තක විනය
පාළිමුත්තක විනය ටීකා
බද්ධසීමා විනිශ්චය
භික්ෂු ශීලය
මූලසික්ඛා
වජිරබුද්ධි ටීකා
විනය විනිච්ඡය
විනය විනිච්ඡය ටීකා
විනය නීතිය
විනය මුෂ්ටිය
විනයත්ථ සමුච්චය
විනයාලඞ්කාර ටීකා
විමතිවිනොදනී ටීකා
විසුංගාමසීමා විනිශ්චය
සමන්තපාසාදිකා
සමන්තපාසාදිකා අත්ථයොජනා
සාරත්ථදීපනී ටීකා
සාධුපත්ථ පූරණී
සිඛවලඳ විනිස
සීමාලඞ්කාර සඞ්ග්‍රහ
සුගත විදත්ථි විධානය
භෙරණ්ණසිඛ විනිස